# 13
# පර්සි

**දුම් තිරය අමතක කර ලියෝවෙතින් සිහින ප්‍රතිරෝධී හිස්වැස්මක් නිපදවා ගැනීමට පර්සිට වුවමනා විය.**

එය ඔහුට බියකරු සිහිනවලින් පිරුණු රැයක් විය. පළමුවෙන්ම ඔහු දුටු සිහිනය වූයේ ලෙජියන් හි රාජාලින් ගවේෂණයට ඇලස්කාවට ගිය ගමනයි. හුදෙකලාව කඳුකර මාර්ගයක ඇවිද යද්දී ඔහු උරහිස් දක්වා හැලක ගිලී ගියේය. හේසාල් එය හැඳින්වූයේ මස්කෙග් කියාය. මඩින් නැහැවී ගිය පර්සිට සෙලවීමට තබා හුස්ම ගැනීමටවත් නොහැකි විය. ඔහුගේ ජීවිතයේ පළමු වතාවට ගිලී මියයාම කොයි ආකාරයේ අත්දැකීමක්දැයි ඔහුට තේරුම් ගියේය.

*ඒක හීනයක් විතරයි,* ඔහු තමාටම කියා ගත්තේය. *මම අවදිවෙන්න ඕනේ.*

එහෙත් කිසිලෙසකින්වත් එයින් බිය අඩු වූයේ නැත.

පර්සි කිසිවිටෙක වතුරට බිය වූයේ නැත. ඒ ඔහුගේ පියාගේ මූලධාතුවයි. එහෙත් හෙලේ වැටීමේ අත්දැකීමෙන් පසු ඔහු තුළ බියක් වර්ධනය වන්නට විය. ඔහු කිසිවකු සමඟ මේ ගැන නොපැවසුවත්, එයින් පසු ජලයේ ගමන් කිරීම පවා ඔහුව බියට පත් කරවන්නක් බවට පත් විය. එය මෝඩකමක් බව ඔහු දැන සිටියේය. ඔහුට ගිලී මිය යාමට නොහැකිය. එහෙත් තමාගේ බිය පාලනය කර නොගත්තොත්, එය තමාව පාලනය කිරීමට පටන් ගනු ඇතැයි ඔහු සැක කළේය.

ඔහුට තම මිතුරියක වූ තාලියා සිහිපත් විය. අහස් දෙවිඳුන්ගේ දියණිය වුවත්, ඇය උස් ස්ථානවලට බියක් දක්වූවාය. ඇගේ සොයුරු ජේසන්ට පියාපත් මවාගෙන ඉගිලීමේ හැකියාව තිබිණි. උත්සාහ කර බැලීමට පවා තිබූ බිය නිසාදෝ තාලියාට ඒ හැකියාව නොතිබිණි. තමා ගිලී මියයනු ඇතැයි පර්සි විශ්වාස කිරීමට පටන්ගත හොත්...

ඔහුගේ ළඟ හැල තුළ සිරවී තිබිණි. ඔහුගේ පෙනහලු පුපුරා යාමට ආසන්න විය.

*විකාර හිතන එක නවත්තගන්න*, ඔහු තමාටම කියා ගත්තේය. මේක ඇත්තක් නෙමෙයි.

තව දුරටත් ඔහුට තම හුස්ම රඳවා ගැනීමට නොහැකි තැනදී, සිහිනය වෙනස් විය.

භූගත රථගාලක් වැනි විශාල අඳුරු අවකාශයක ඔහු සිටගෙන සිටියේය. සැම අතකම දක්නට ලැබුණේ අඩි විස්සක් පමණ ඉහළින් පිහිටි සිවිලිම දක්වා නැගුණු ගල් කුලුණු පේළිය. ආධාරකයක් නොමැතිව රැඳී තිබූ අඟුරු කබල්වලින් නැගුණු මලානික රත් පැහැය ගෙබිම මත විසිරී තිබිණි.

වඩාත් දුරින් තිබූ දර්ශන පැහැදිලිව දැක ගැනීමට නොහැකිවුවත්, සිවිලිමේ එල්ලී තිබූ කප්පි පද්ධතියද, වැලි බෑග සහ අඳුරු නෘත්‍යශාලාවල විදුලි පහන් පේළිද දැක ගැනීමට ලැබිණි. කුටිය වටා වූ කුලුණු සහ දැව පෙට්ටි මත, 'ආධාර, ආයුධ සහ ඇඳුම්' යනුවෙන් ලේබල් සවිකර තිබුණේය. එකක 'මිශ්‍රිත රොකට් විදින' ලෙස සටහන් විය.

අඳුර තුළින් පර්සිට යාන්ත්‍රික හඬක් සහ විශාල ගියර හැරෙන හඬද නළ තුළින් ජලය ගලා යන හඬ ද අසන්නට ලැබිණි.

එවිට ඔහු යෝධයා දුටුවේය... නැතිනම් අඩුම වශයෙන් ඒ යෝධයෙක් වන්නට ඇතැයි පර්සි සිතුවේය.

ඔහු අඩි දොළහක් පමණ උසින් යුක්ත විය. එකැස් යෝධයෙකුට එය සැලකිය යුතු තරමේ උසකි. එහෙත් පර්සි හැප්පී තිබුණු අනෙක් යෝධයන් සමඟ බැලූ විට ඔහුගේ උස ඉන් අඩක් පමණ විය. එසේම ඔහු අනෙක් යෝධයන්ට වඩා මනුෂ්‍ය පෙනුමකින් යුක්ත විය. ඔහුගේ විශාල ඥාතීන්ට මෙන් මකර පාද නොතිබිණි. එසේ වුවත් ඔහුගේ කෙස්වැටිය පෝනිටේලයක් සේ තද කොට ගැටගසා තිබිණි. ඒ රන්

හා රිදී කාසිද සමඟය. ඔහු සතුව අඩි දහයක් පමණ උසැති හෙල්ලයක් විය. *යෝධ අවියක්.*

පර්සි මෙතෙක් දැක තිබූ විශාලතම කොළරය ඔහු පැළඳ සිටියේ ය. එය කළු පැහැතිය. කළු කලිසමත්, කළු සම් සපත්තු යුගලත් ඔහුගේ අනෙක් ආයිත්තම් විය. කළු සම් සපත්තුවල තුඩු බෙහෙවින් දිගු වූ අතර ඒවා වක් වී තිබිණි. එසවුණු වේදිකාව ඉදිරිපිට එහාටත් මෙහාටත් සක්මන් කරමින් ඔහු ප්‍රමාණයෙන් පර්සි තරම් වූ ලෝකඩ බඳුන පරීක්ෂා කළේය.

''නෑ, නෑ, නෑ'' යෝධයා තමාටම මුමුණා ගත්තේය. ''කොහේද වැගිරීම? කොහෙද වටිනාකම?'' ඔහු අඳුරට ගෑ ගැසුවේය. ''ඔටිස්!''

ඈතින් යමක් ඇදෙන හඬ පර්සිට ඇසිණි. අඳුර තුළින් තවත් යෝධයකු මතු විය. ඔහුත් අනෙකාට සමාන ලෙසම සැරසී සිටියේය. යෝධයන් දෙදෙනා අතර වූ එකම වෙනස වූයේ දෙවැන්නාගේ කොණ්ඩය දම් පැහැය වෙනුවට කොළ පැහැයක් ගෙන තිබීමයි.

පළමු යෝධයා ශාප කළේය. ''ඔටිස්, ඇයි උඹ *හැමදාම* මට මේක කරන්නේ? මම උඹට කිව්වනෙ මම අද අඳින්නෙ කළුපාට කොලරයක් කියලා. උඹට *ඕනේ* දෙයක් අඳින්න පුළුවන්. ඒත් කළු පාට කොලරයක්!''

මේ දැන් අවදි වුවාක් මෙන් ඔටිස් ඇයි පිය ගැසුවේය.

''මම හිතුවේ උඹ අද කහපාට ටෝගාව අඳීයි කියලා''

''ඒ ඊයේ! උඹ කහපාට ටෝගාව පෙන්නන කොට!''

''ආහ්, හරි. සමාවෙන්න, එපී.''

ඔහුගේ සොහොයුරා ගෙරවීය. ඔවුන්ගේ මුහුණු එක සමානවම අවලස්සන වූ නිසා ඔවුන් නිවුන්නන් විය යුතුය.

''ඒ වගේම මට එපී, කියන එක නතර කරපං,'' එපී විරෝධය පෑවේය. මට එපියාල්ටිස් කියපං. ඒක තමයි මගේ නම. එහෙම නැත්නම් උඹ මගේ වේදිකා නාමය කියපං. මහා එෆ්!''

ඔටිස්ගේ මුහුණ පුළුටු විය. ''මට තවමත් ඒ වේදිකා නාමය ගැන විශ්වාසයක් නැහැ.''

''විකාර. ඒක මරු. දැන්, කොහොමද ලකලෑස්තිය?''

''නියමයි.'' ඔටිස්ගේ හඬෙහි එතරම් උද්යෝගිමත් බවක් නොතිබිණි.

''මිනීකන ව්‍යාඝ්‍රයෝ, කරකැවෙන තල.... ඒත් මම තවමත් හිතන්නේ බැලේ නාටිකාංගනාවෝ කීපදෙනෙකුත් හිටියනම් නියමයි කියලා.''

''උන්ව ඕනේ නෑ.'' එපියාල්ටිස් ගෙරවීය. ''ඒ වගේම මේකත්.'' ඔහු ලෝකඩ බඳුන දෙස බලා පිළිකුලෙන් අත වැනුවේය.

''ඒකෙන් මොනවා කරන්නද? ඒකෙන් තෑතිගැන්මක් ඇති වෙන්නේ නෑ.''

''ඒත් ඒක තමයි සංදර්ශනයේ ප්‍රධානම දේ. අනෙක් අය බේර ගත්තෙ නැත්නම් ඔහු මැරෙයි. කාලසටහනට අනුව එයාලා ආවොත්...''

''ආහා, එයාලට හොඳක්ම වෙයි!'' එපියාල්ටිස් පැවසුවේය. ''ජූලි පළවෙනිදා, ජූලි හි කාලෙන්ඩ්[1], ජුනෝට පූජාකරන්න. අම්මට ඕනේ වෙලා තියෙන්නේ මේ මෝඩ උපදෙවිවරු විනාශ කරලා ජුනෝගේ මුණේ අතුල්ලන්න. අනෙක් අතට මම මේ මල්ලවපොර භූතයන්ට අතිකාල ගෙවන්නේ නෑ.''

''හොඳයි, එහෙනම්, එයාලා හැමෝම මැරෙයි,'' ඔටිස් පැවසුවේය. ''ඒ වගේම අපි රෝමය විනාශ කිරීම පටන් ගන්නවා. හරියටම අම්මගේ කැමැත්ත විදිහටම. ඒක නියමෙට තියෙයි. සෙනඟ ඒකට කැමති වෙයි. රෝම භූතයෝ මේ වගේ දේවල් අගය කරනවා.''

එපියාල්ටිස් එය විශ්වාස නොකරන බවක් පෙනී ගියේය. ''ඒත් භාජනය තවමත් එතන තියෙනවා. අපිට ඒක ගින්නට ඉහළින් එල්ලන්න බැරිද, එහෙම නැත්නම් ඒක අම්ල හෝ ඒ වගේ දෙයක දියකරන්න බැරිද?''

''අපිට තව ටික දවසකට එයාව පණ පිටින් තියාගන්න ඕනෑ,'' ඔටිස් තම සොහොයුරාට සිහිපත් කළේය. ''එහෙම නැති වුණොත් හත් දෙනා ඇම කාල, එයාව බේරගන්න එන එකක් නෑ.

''හ්ම්, මමත් හිතනවා. මම තවමත් කැමතියි තවටිකක් කෑ ගහනවට. මේ හෙමින් මරණය හරිම නීරසයි. ආහ්, හොඳයි, අපේ දක්ෂ මිත්‍රයා කොහොමද? ඇය ලෑස්තිද ඇගේ අමුත්තාව එවන්න?''

1 ජූලි මාසයේ පළමු දිනයයි. එය ජුනෝ වෙනුවෙන් පුදකර තිබේ.

ඔටිස්ගේ මුහුණ ඇඹුල් විය. ''මම ඇත්තටම ඇයත් එක්ක කතා කරන්න කැමති නැහැ. එයා මාව අපහසුවට පත් කරනවා.''

''ඒත් එයා ලැස්තිද?''

''ඔව්,'' ඔටිස් තැකීමක් නොකර පැවසුවේය. ''එයා ලැස්ති වුණේ ශතවර්ෂ ගාණක ඉඳලා. කිසිම කෙනෙක් ඒ ප්‍රතිමාව ඉවත් කරන එකක් නෑ.''

''විශිෂ්ටයි,'' එපියාල්ටිස් අපේක්ෂා සහගතව තම දෑත් පිරි මැද්දේය. ''මේක අපිට ලොකු අවස්ථාවක්, මගේ සහෝදරයා.''

''අපිව අන්තිමට රැවටෙන කොටත් ඔයා කිව්වේ ඔහොම තමයි,'' ඔටිස් කෙදිරුවේය. ''මාව ලේත් ගංගාවේ පාවෙන අයිස් කුට්ටියක මාස හයක් එල්ලලා තිබුණා. කිසිම මාධ්‍යයක් පවා අපි ගැන අවධානයක් දැක්වුවේ නෑ.''

''මේක වෙනස්,'' එපියාල්ටිස් විරෝධය පෑවේය. ''අපි විනෝදවෙන්න අලුත් ප්‍රමිතියක් හදමු! අම්මා සතුටු වෙනව නම්, අපේ කීර්තිය සහ වාසනාව අපිටම ලියාගන්න පුළුවන්.''

''ඔයා එහෙම කියනව නම්,'' ඔටිස් සුසුමක් හෙළුවේය. ''මේ හංස විලෙන් ගෙනාව බැලේ ඇඳුම් බොහොම අපූරුයි කියල මට තවමත් හිතෙනව වුණත්.''

''බැලේ එපා!''

''සමාවෙන්න.''

''එන්න.'' එපියාල්ටිස් පැවසුවේය. ''අපි ව්‍යාඝ්‍රයින්ව පරීක්ෂා කරමු. උන් ඉන්නේ කුසගින්නෙද කියලා මට සැක හැර ගන්න ඕනේ.''

යෝධයෝ ගාටමින් අඳුර තුළට වැදුණ අතර පර්සි, බඳුන දෙසට හැරිණි.

මම ඇතුළ බලන්න ඕනේ, ඔහු සිතුවේය.

තම සිහිනය ඉදිරියට ගෙන යාමට ඔහු කැමති විය. *හරියටම බඳුනේ මතුපිටට.* ඉන්පසු ඔහු ඇතුළට රිංගුවේය.

බඳුන ඇතුළේ වූ වාතය පිලුණු ගන්ධයකින් යුක්ත විය. එසේම ආලෝකය අඩු විය. ලැබුණු එකම ආලෝකය වූයේ අඳුරු අසිපතෙන් ලැබුණු මලානික දම් පැහැති දීප්තිය පමණි. එහි අඳුරු යකඩ තලය, බහාලුමේ එක් පැත්තකට හේත්තු කර තිබුණේය. එය

අසල ගුලි ගැසී සිටියේ, ඉරුණු ජීන්සයක් හැඳ ගත් දුර්වල පෙනුමකින් යුත් කොලුවෙකි. කළු කමිසයක් හැඳ සිටි ඔහු ඒ මතින් ගගනයාත්‍රික ජැකට්ටුවක් දමා ගෙන සිටියේය. ඔහුගේ දකුණු අතේ, රිදී හිස්කබලක් සහිත මුදුවක් දිලිසෙමින් තිබිණි.

''නිකෝ,'' පර්සි පැවසුවේය. එහෙත් හේඩිස්ගේ[1] පුත්‍රයාට ඔහුව නොඇසිණි.

බහාලුම සම්පූර්ණයෙන්ම මුද්‍රා තබා තිබුණේය. වාතය විෂ සහිත වෙමින් තිබිණි. නිකෝගේ දෑස් පියවී තිබූ අතර, ඔහුගේ හුස්ම ගැනීමද අඩාල විය. ඔහු භාවනාවක නිරත වන සෙයක් පෙනී ගියේය. ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබූ අතර, පර්සිගේ මතකයේ තිබුණටත් වඩා ඔහු කෘෂ වී සිටියේය.

බඳුනේ ඇතුළත බිත්තිය මත, නිකෝ විසින් කඩුවෙන් සූරා දැමූ සලකුණු තුනක් විය. සමහරවිට ඔහු මෙහි සිරකර දින තුනක් වන්න ඇත.

ප්‍රමාණවත් වාතය නොමැතිව ඔහුට වැඩිකළක් ජීවත් වීමට නොහැකි බව පෙනී ගියේය. සිහිනයේදී පවා, පර්සිට දනටමත් උමතුවක් දනී තිබුණු අතර, ප්‍රමාණවත් තරම් ඔක්සිජන් ලබා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දරුවේය.

එවිට නිකෝගේ දෙපා අතර තිබූ යමක් පර්සිගේ අවධානයට ලක් විය. *ළදරු දත්වලට වඩා විශාල නොවූ දිලිසෙන වස්තූන් සමූහයක්.*

බීජ, පර්සිට අවබෝධ වූයේය. දෙළුම් බීජ තුනක් කෑමෙන් පසු ඉවත දමා තිබිණි. පහක් තවමත් තද රතු පල්පයේ ගැලී තිබිණි.

''නිකෝ,'' පර්සි පැවසුවේය. ''මේ කොහෙද, අපි ඔයාව බේරගන්නම්.''

රූපය වියැකී ගොස්, ගැහැනු කටහඬක් කොඳුරනු ඇසිනි, ''පර්සි,''

මුලින් පර්සිට සිතුණේ තමා තවමත් නින්දේ පසුවන බවකි. ඔහුගේ මතකය අහිමි වූ විට, අතීතයේ තමාට මතක තිබූ එකම පුද්ගලයා වූ ඇනබෙත් ගැන සිතමින් ඔහු සති ගණන් හීන දක්කේය. ඔහුගේ දෑස් විවර වී, දර්ශනය පැහැදිලි වූ විට, ඇය සැබෑවටම එතැන සිටින බව ඔහු අවබෝධ කරගත්තේය.

1 ධනවත් බවට හා මරණයට අධිපති ග්‍රීක දෙවියා ය. රෝම ස්වරූපය වන්නේ ප්ලූටෝය.

ඔහුගේ හුස්ම වැදෙන තරම් සමීප ව සිටි ඇය ඔහු දෙස බලා සිනාසෙමින් සිටියාය.

ඇගේ දුඹුරු පැහැති කෙස් වැටිය උරහිස් මත විසිරී තිබිණි. කුණාටු අළු පැහැති ඇගේ දෑස් ප්‍රමෝදයෙන් දීප්තිමත්ව තිබිණි. අර්ධ ලෝහිත කඳවුරේ පළමු දිනය ඔහුගේ සිහියට නැගුණේයි. වසර පහකට පෙර, ඔහු සිහිය ලබන විට ඇනබෙත් ඔහු අසල සිටගෙන සිටියාය. ''නිදාගෙන ඉන්නකොට ඔයාගෙ කටෙන් කෙළ වැගිරුණා .'' ඇය පැවසුවාය.

ඇය ඒ ආකාරයේ හැඟීම්බර එකියක වූවාය.

''මොනවද සිද්ධවෙන්නේ?'' ඔහු විමසුවේය. ''අපි එහෙට ඇවිත්ද?''

''නෑ,'' ඇය පැවසුවාය. ඇගේ හඬ පහත් වී තිබිණි. ''දැන් මධ්‍යම රාත්‍රිය.''

''ඔයා කියන්නේ... '' පර්සිගේ හදවත සැලෙන්නට විය. තමා පිජාමාව පිටින් යහන මත සිටින බව ඔහුට අවබෝධ විය. සමහරවිට සිහින දකිද්දී ඔහු කෙළ වගුරන්නට හෝ අඩුම වශයෙන් යම් අමුතු ශබ්දයක් පිටකරන්නට හෝ ඇත. ''ඔයා මගෙ කුටියට හොරෙන් ආවද?''

ඇනබෙත් දෑස් නැටවූවාය. ''පර්සි, මාස දෙකකින් ඔයාට දා හතයි. කෝච් හෙජ්ගෙන් ප්‍රශ්නයක් ඇතිවෙන එක ගැන ඔයා බරපතල විදිහට කරදර වෙන්න එපා.''

''ආහ්, ඔයා එයාගෙ බේස් බෝල් පිත්ත දැකලා. තියෙනවද?''

''අනිත් එක, මට නිකම් හිතුණා අපිට ටිකක් ඇවිදින්න පුළුවන් වෙයි කියලා. අපිට කොයිවෙලාවකවත් තනියෙම ඉන්න ලැබුණේ නැතේ. මට ඔයාට පෙන්නන්න ඕනේ දෙයක් තියෙනවා... නැව ඇතුළේ මම කැමතිම තැන.''

පර්සිගේ හෘද ස්පන්දනය තවමත් වේගවත් වුවත්, ඒ බිය නිසා ඇති වුවක් නොවීය. ''මුලින්ම මට මගේ දත්තික මැදගන්න පුළුවන්ද?''

''ඒක හොඳයි,'' ඇනබෙත් පැවසුවාය. ''මොකද එහෙම කරනකම් මම ඔයාව සිපගන්න නැති නිසා. ඒ වගේම ඔය කොණ්ඩෙත් පීරගන්න.''

තට්ටු තුනේ හබල් නැව බෙහෙවින් විශාල වුවත්, තවමත් එය පර්සිට ප්‍රියජනක ලෙස හැඟිණි. ඇනබෙත් ඔහු සමඟම පහළ තට්ටුවට පිවිසියාය. පර්සි එහි රෝගී වාට්ටුව හැර අන් තැනක් දක නොතිබිණි.

ඇය පර්සිව එන්ජින් කාමරය පසුකර කැඳවාගෙන ගියාය. එය ඉතා බියකරු, යාන්ත්‍රික වනගත හරඹ ශාලාවක් සේ පෙනිණි. නළ, පිස්ටන් රැසක් මධ්‍යයේ වූ ගෝලයකට සවි වී තිබුණේය. යෝධ ලෝහමය නූල්ඩිස් මෙන් වූ රැහැන් බිමත්, බිත්ති පුරාත් ඇදී ගොස් තිබිණි.

''ඒක වැඩ කරන්නේ කොහොමද?'' පර්සි විමසුවේය.

''මමත් දන්නේ නෑ.'' ඇනබෙත් පැවසුවාය. ''ඒත් ඒක ක්‍රියාත්මක කරන්න ලියෝට හැරුණාම මට විතරයි පුළුවන්.''

''ඒක සැනසීමට කාරණයක්.''

ඔවුහු ආයුධ ගබඩාව සහ සැපයුම් කාමරයද පසු කළහ. නැවේ අවරය දෙසින්, ඔවුහු විශාල ඉස්තාලයකට විවෘත වන දෑවැන්ත දෑව දොරක් අසලට පැමිණියහ. කාමරය තුළින් නැවුම් පිදුරුවල සහ ලෝම පොරෝණවල ගන්ධයක් හමා ආවේය. වම් පස බිත්තියේ එක පෙළට වූයේ හිස් වූ අශ්ව ගාල් තුනකි. කඳවුරේදී ඔවුන් පෙගාසි සඳහා යොදා ගත්තේද එවැනි අශ්ව ගාලකි. දකුණු පස බිත්තියේ, සත්වෝද්‍යානයක විශාල සතුන් දැමිය හැකි තරමේ විශාල කූඩු දෙකක් විය. ඒවා හිස්ව තිබිණි.

පොළොව මධ්‍යයේ වූයේ අඩි විස්සක පමණ චතුරශ්‍රාකාර ජනේලයකි. ඒවා අතරින් පහත දැකීමට හැකි විය. පහතින් රාත්‍රී භූ දර්ශනය දකගැනීමට ලැබිණි. සැතපුම් ගණනක් පහළින් භූමියෙන් ඒ මැදින් ජාලයක් සේ දිවෙන මහා මාර්ගයක් පෙනිණි.

''වීදුරු පතුලක් සහිත බෝට්ටුවක්ද?'' පර්සි විමසුවේය.

අසල තිබූ පොරෝණයක් ගත් ඇනබෙත් එය වීදුරු පතුල මත ඇතිරුවාය. ''මා ළඟින් ඉඳ ගන්න.''

පොරෝණය මත හිඳගත් ඔවුහු, පහළින් දිස්වන ලෝකය දෙස බලා සිටියහ.

''ලියෝ ඉස්තාලය ඉදි කරපු නිසා පෙගාසිට ලේසියෙන්ම එන්න යන්න පුළුවන්,'' ඇනබෙත් පැවසුවාය. ''එයා තේරුම් නොගත්ත

එකම දේ තමයි, පෙගාසි නිදහසේ ඉන්න කැමතියි කියන එක. ඉතිං අශ්ව ගාල හැම තිස්සෙම තියෙන්නේ හිස් වෙලා.''

බ්ලැක්ජැක් කොහේ ඇත්දැයි පර්සි කල්පනා කළේය. අහසේ කොහේ හෝ සැරිසරනවා ඇත. බ්ලැක්ජැක්ගේ පා පහර තවමත් රිදුම් දෙමින් තිබුණත්, ඔහු එහි වරද අශ්වයා මත පැටවීමට අකමැති විය.

''ඔයා මොකක්ද අදහස් කළේ, පහසුවෙන් එන්න යන්න පුළුවන්?'' ඔහු විමසුවේය. ''මෙතෙන්ට එන්න පෙගාසස්ට තට්ටු දෙකක් පහළට එන්න ඕනේ නේද?''

ඇනබෙත් ඇගේ මිට මෙලවූ අත වීදුරුවට තද කළාය. ''මේවා ප්‍රවේශ දොරවල්. හරියට බෝම්බ දාන ගුවන් යානයක වගේ.''

පර්සිගේ කෙළ සිඳුනේය. ''ඔයා කියන්නේ අපි ඉඳගෙන ඉන්නේ දොරවල් උඩ කියලද? ඒවා ඇරුණොත් මොකද වෙන්නේ? ''මම හිතන්නේ අපි බිමට වැටිල මැරෙයි. ඒත් ඒවා විවෘත වෙන්නේ නෑ.''

''ඒක හොඳයි.''

ඇනබෙත් සිනා නැගුවාය. ''ඔයා දන්නවද මම මෙතෙන්ට කැමති ඇයි කියලා? මේ පේන දර්ශනය නිසාම නෙමෙයි. මෙතනදී ඔයාට මොනවද මතක් වෙන්නේ?''

පර්සි වටපිට බැලුවේය. කූඩු සහ අශ්වගාල්, බාල්කයේ එල්ලෙන ලෝකඩ පහන, නැවුම් පිදුරු ගන්ධය, සැබැවින්ම ඇනබෙත් ඔහු අසල සිටීම. මලානික ආලෝකයෙන් ඇගේ මුහුණේ රූමත්බව වැඩි වී තිබුණි.

''අර සත්වෝද්‍යාන ට්‍රක් රථය,'' පර්සි පැවසුවේය. ''අපිව ලාස් වේගාස් අරන් ගිය එක.

ඔහුගේ පිළිතුරු නිවැරදි බව ඇගේ සිනාවෙන් හැඟී ගියේය. ''ඒ ගොඩක් කාලෙකට කලින්,'' පර්සි පැවසුවේය. 'අපි නරක හැඩයකින් ඉන්න කොට, අර මෝඩ අකුණු පහර හොයන්න රට හරහා යද්දී, ට්‍රක් එකේ හිරවුණා. නිකම්ම නෙමෙයි එපා කරපු සත්තු රංචුවක් එක්ක. ඔයා ඒ ගැන එච්චර හිතන්නේ ඇයි?''

''පාසි මොළයෝ, ඒ අපි දෙන්නා ඇත්තටම කතා කරපු මුල් වතාව වුණ නිසා. මම ඔයාට මගේ පවුල ගැන කිව්වා. ඒ වගේම...'' ඇය තම කඳවුරු ගෙල පළඳනාව පිටතට ගත්තාය. එයට ඇගේ

පියාගේ පාසල් මුදුද සවි වී තිබුණු අතර අර්ධ ලෝහිත කඳවුරේ ගත කළ එක් එක් වසර සඳහා වර්ණවත් මැටි පබළු ද දක්නට ලැබිණි. ඒ ඔවුන්ගේ සම්බන්ධය පටන් ගත් දිනවල පර්සි විසින් ලබා දුන් රතු කොරල් පෙන්ඩනයයි. ඔහු එය ගෙන ආවේ මුහුදු පතුලේ පිහිටි ඔහුගේ පියාගේ මාළිගයෙනි.

''ඒ වගේම,'' ඇනබෙත් නැවත පැවසුවාය. ''අපි කොච්චර කාලෙක ඉඳන් එකිනෙකාව දැනගෙන හිටියද කියලා මට එකෙන් මතක් කරල දෙනවා. අපිට එතකොට දොළහයි පර්සි. ඔයාට ඒක විශ්වාස කරන්න පුළුවන්ද?''

''බෑ,'' ඔහු පැවසුවේය. ''ඉතිං... මුල ඉඳන්ම ඔයා මට කැමැත්තෙන් හිටියාද?''

ඇය බොරු සිනාවක් නැගුවාය. ''මුලදි මට ඔයාව පේන්න බැහැ. ඔයා මට කරදර කළා. ඊට පස්සේ අවුරුදු කීපයක් මම ඔයා ගැන ඉවසගෙන හිටියා. ඊට පස්සේ.''

''හරි, අපූරුයි.''

ඉදිරියට නැවුණු ඇය ඔහුව සිපගත්තේය. එය කිසිවෙකුට නොපෙනුණ අපූරු හාදුවකි. එහි කිසිදු තැනක රෝමවරු නොසිටියෝය. බෙරිහන්දෙන නරාශ්ව භාරකාරයෝ නොසිටියහ.

''ඇය පසෙකට වූවාය. ''මට ඔයාව නැතිවුණා, පර්සි.''

ඇයටත් ඒ දේම පැවසීමට පර්සිට වුවමනා වුණත්, එය වර්ණනාවක් සඳහා තරම් නොවන බව පෙනී ගියේය. රෝම පාර්ශවයේ සිටිද්දී, ඔහු තම දිවි රැකගත්තේ තනිකරම ඇනබෙත් ගැන සිතීමෙනි. ''මට ඔයාව නැතිවුණා'' යනුවෙන් පැවසීම එවැන්නකට ප්‍රමාණවත් නොවීය.

රාත්‍රිය එළඹෙද්දී, පිපර් ඔහුගේ මනසට අරක් ගත් ආත්මය ඉවත් කළ අයුරු ඔහුගේ මතකයට නැගිණි. ඇය තම වශී කතාව පටන්ගන්නා තෙක්ම පර්සි ඔහු තුළ සිටි ආත්මය ගැන දැනුවත් ව නොසිටියේය. එයිඩෝලොන් පිටවූ පසු, ඔහුට දැනුණේ තම නළලේ ඇනුණු කටුවක් ඉවත් කළ ආකාරයේ හැඟීමකි. ආත්මය පිටව යනතුරු ඔහු විඳි වේදනාව කොතෙක්ද යන්න පිළිබඳ ඔහුට අවබෝධයක් නොතිබිණි. ඉන්පසු ඔහුගේ සිතිවිලි පැහැදිලි වන්නට විය. ඔහුගේ ආත්මය නැවත සුපුරුදු ලෙස ඔහුගේ සිරුර තුළ තැන්පත් විය.

මෙහි ඇනබෙත් සමග හිඳගෙන සිටීමත්, ඔහු තුළ ඇති කළේ මේ ආත්මයේ හැඟීමකි. ගෙවුණු මාස කීපය ඔහුගේ අද්භූත සිහින සමග ගෙවී ගියේය. අරක්ගත් ආත්මයන්ගේ පාලනයට නතු වීමෙන් පසු, ඔහු හා ජේසන් අතර ඇතිවූ සටනත් සමග ජුපිටර් කඳවුරේ අවස්ථා, වියැකුණු, මනඃකල්පිත ඒවා බවට පත් විය.

තවමත් ජුපිටර් කඳවුරේ ගතකළ කාලය ගැන ඔහු තුළ පසුතැවිල්ලක් නොතිබිණි. එය බොහෝ ආකාරවලින් ඔහුගේ දෑස් විවර කිරීමට සමත් විය.

''ඇනබෙත්,'' ඔහු පැකිළෙමින් පැවසුවේය,'' නව රෝමය ඇතුළේ, උප දෙවිවරරුන්ට මුළු ජීවිත කාලෙම සාමයෙන් ජීවත් වෙන්න පුළුවන්.''

ඇගේ ඉරියව් ආරක්ෂාකාරී විය. ''රෙයිනා මට ඒක පැහැදිලි කළා, ඒත්, පර්සි, ඔයා අයිති අර්ධ ලෝහිත කඳවුරට. ඒක වෙනම ජීවිතයක්...''

''මම දන්නවා,'' පර්සි පැවසුවේය. ''ඒත් මම එතන ඉන්නකොට, ගොඩක් උපදෙවිවරු භයක් නැතිව ජීවත් වෙන හැටි දැක්කා. ළමයි පාඨශාලාවලට ගියා. ආදරවන්තයෝ විවාහ වෙලා පවුල් ගොඩනගා ගත්තා. එහෙම දේවල් අර්ධ ලෝහිත කඳවුරේ තිබුණේ නැහැ. මම, ඔයයි මමයි ගැන හිතමින් හිටියා... ඒ වගේම කවදාහරි දවසක යෝධයෝ එක්ක තියෙන මේ යුද්දේ ඉවර වුණාම...''

රන් පැහැ ආලෝකය තුළ එය හරියටම පැවසීම අසීරු වුවත්, ඇනබෙත්ගේ මුහුණ රතුවන්නට ඇතැයි ඔහු සිතුවේය. ''ඕහ්,'' ඇය පැවසුවාය.

තමා පමණට වඩා කතා කළේ දැයි පර්සි බියට පත්විය. සමහරවිට අනාගතය ගැන ඔහුගේ ලොකු හීනවලින් ඔහු ඇයව බියපත් කළා විය හැකිය. ඇය සාමාන්‍යයෙන් සැලසුම් සහගත කෙනෙකි. පර්සි නිහඬව තමාට ශාප කර ගත්තේය.

ඔහු ඇනබෙත් ගැන දැන සිටි තරමටම, ඔහුට දැනුණේ තමාට තවමත් ඇයව තේරුම් ගැනීමට හැකි වී ඇත්තේ සුළු ප්‍රමාණයකින් බවයි. මාස කීපයක් ඔවුන් එකට ගත කිරීමෙන් පසුව පවා, ඔවුන්ගේ සම්බන්ධතාව වීදුරු මූර්තියක් මෙන් නිරන්තරයෙන්ම අලුත් සහ දුර්වල විය. යම් වැරැද්දකින් එය බිඳ වැටේයැයි ඔහු බියට පත් විය.

''මට සමාවෙන්න,'' ඔහු පැවසුවේය. ''මම නිකම්... මම හිතන්නේ මේක දිගටම ගෙනියන්න මට බලාපොරොත්තුවක් දෙන්න. මතකද මම සඳහන් කළා...''

''නෑ!'' ඇය පැවසුවාය. ''නෑ, පර්සි. දෙවියනේ, ඒක කොච්චර රසවත්ද, ඒක හරියට... අපිට ඒ පාලම පුළුස්සලා දාන්න පුළුවන් වෙයි. රෝමවරු එක්ක තියෙන ප්‍රශ්න අපිට හදාගන්න බැරි වුණොත්-හොඳයි, උප දෙවිවරු දෙපක්ෂය කවදාවත් තනිවෙන එකක් නැහැ. අන්න ඒක නිසා තමයි දෙවියෝ අපිව වෙන් කරලා තිබ්බේ. අපිට කවදාවත් එහෙට අයිති අයවෙන්න පුළුවන් වුණාද කියලා මම දන්නේ නෑ.''

පර්සිට වාද කිරීමට වුවමනාවක් නොතිබුණත්, බලාපොරොත්තු අත්හැර දැමීමටද ඔහුගේ කැමැත්තක් නොවීය. ඔහුට සහ ඇනබෙත් පමණක් නොව අනෙක් උපදෙවිරුන්ටත් එය වැදගත් වනු ඇතැයි ඔහුට හැඟී ගියේය. එකිනෙකාට වෙනස් ලෝක දෙකක් එකට එක්වීම සිදුවිය හැක්කකි. සේරටමත් වඩා, උපදෙවිවරුන් කළ යුත්තේද එයයි. ඔලිම්පස් කන්දට හෝ මනුෂ්‍ය ලෝකයට අයත් නොවී, දෙපසේම සාමය පවත්වාගැනීමට උත්සාහ දැරීමය.

අවාසනාවකට, දෙවිවරුන් පිළිබඳ සිතිවිල්ල ඔහුට, ඔවුන් මුහුණ දී සිටින යුද්ධයත්, එපියාල්ටිස් සහ ඔටිස් ගැන ඔහු දුටු සිහිනයත් සිහිපත් කළේය.

''ඔයා මාව ඇහැරවන කොට, මම නපුරු හීනයක් දකිමින් හිටියේ,'' ඔහු පැවසුවේය.

ඔහු ඇනබෙත්ට තමා දුටු දෙය පැවසුවේය.

එහි වඩාත් ගැටලුකාරී කොටස්වලදී පවා ඇය වෙතින් කිසිදු පුදුමයක් පළ නොවීය. ලෝකඩ බඳුන තුළ නිකෝගේ සිරගත වීම ගැන ඔහු විස්තර කරන විට ඇය කනගාටුවෙන් හිස සැලුවාය. ආරම්භයේදීම ඔවුන්ගේ වේදනාත්මක මරණයන් සමඟ රෝමය විනාශ කිරීමේ යෝධයින් තුළ වූ යම් ආකාරයක සැලසුම ගැන ඇයට පවසන විට ඇගේ දෙනෙත්වල කෝපයක සේයාවක් සටහන් විය.

''නිකෝ ඇමක්,'' ඇය කෙඳිරුවාය. ''ගයියාගේ හමුදාව කොයි විදියකින් හරි එයාව අල්ලගෙන තියෙනවා. ඒත් එයාව තියාගෙන ඉන්නේ කොහෙද කියලා අපි හරියටම දන්නේ නැහැ.''

''රෝමයේ කොහේ හරි තැනක,'' පර්සි පැවසුවේය. ''කොහේ හරි භූගත තැනක. එයාලා කියපු විදියට නිකෝ්ට තව ටික දවසක් ජීවත් වෙන්න පුළුවන් වුණත්, ඔක්සිජන් නැතුව එච්චර කාලයක් එයා කොහොම අල්ලගෙන ඉන්නද කියලා මට හිතාගන්න බැහැ.''

''නෙම්සිස්ට අනුව නම් දවස් පහක්,'' ඇනබෙත් පැවසුවාය.

'' ජූල හි කාලෙන්ඩ්ස් . අඩුගානේ දැන් අවසන් කාලය ගැන හරි අදහසක් තියෙනවා.''

''මොකක්ද කාලෙන්ඩ්ස් කියන්නේ?''

ඔවුන්ගේ හුරුපුරුදු රටාවට පැමිණීම ගැන සතුට පළ කිරීමට මෙන් ඇනබෙත් බොරු සිනාවක් පෑවාය. පර්සිව නොතකා ඇය, පැහැදිලි කරන්නට වූවාය. ''ඒක මේ මාසයක මුල හඳුන්වන්න යොදන රෝම වචනයක්. එතනින් තමයි අපි දින දර්ශනය කියන වචනය ගත්තේ. ඒත් නිකෝ කොහොමද එච්චරකල් පණ බේරගන්නේ? අපි හේසාල් එක්ක කතා කරන්න ඕනෑ.''

''දැන්ම?''

ඇය පැකිලුනාය. ''නෑ. ඒකට උදේ වෙනකම් ඉමු. මේ මහ රෑ මේ ප්‍රවෘත්තියෙන් එයාට දමලා ගහන්න මට ඕනේ නැහැ.''

''යෝධයෝ ප්‍රතිමාවක් ගැන සඳහන් කළා,'' පර්සි මතකය ආවර්ජනය කළේය. ''ඒ වගේම ඒක ආරක්ෂා කරන දක්ෂ මිත්‍රයෙක් ගැනත් යමක් සඳහන් කළා. මේ යාළුවා කවුරු වුණත්, ඔටිස් ඇයට බය වුණා. ඒ කවුරු වුණත් එයා යෝධයින්ව බය කරන්න පුළුවන් කෙනෙක්.''

ඇනබෙත් පහළින් දිස්වන අඳුරු කඳුගැට අතරින් වංගු ගසමින් දිවෙන මහා මාර්ගය දෙස බැලුවාය. ''පර්සි, ඔයා පස්සේ පොසිඩන්ව දැක්කද? එහෙම නැත්නම එයාගෙන් මොකක් හරි සංඥාවක් ලැබුණද?
''

ඔහු තම හිස සැලුවේය. ''එදා ඉඳන්... වාව්. මම ඒ ගැන හිතුවෙම නෑ. ටයිටන් යුද්දයෙන් පස්සෙම මට එයාව හමු වුණේ නැහැ. අර්ධ ලෝහිත කඳවුරේදි මම එයාව දැක්කා. ඒත් ඒ පහුගිය අගෝස්තුවේ.'' ඔහු තුළ බියකරු හැඟීමක් ඇති විය.

''ඇයි? ඔයා ඇතීනව දැකලා තියෙනවද?''

ඇය ඔහුගේ දෑස් දෙස නොබැලුවාය.

''සති කීපෙකට කළින්,'' ඇය පැවසුවාය. ''ඒක... ඒක හොඳ දෙයක් වුණේ නැහැ. ඇයව පෙනුණෙ ඇය වගේ නෙමෙයි. සමහරවිට ඒ නෙම්සිස් විස්තර කරපු හින්නොන්මාදය වෙන්න ඇති. මට හරියටම කියන්න බැහැ. එයා හිත රිදවන යම් දේවල් කිව්වා. එයා කිව්වා මම එයාව අසමත් කරලා කියලා.''

''ඇයව අසමත් කරල.'' තමාට ඇසුණේ ඇය කියූ දේම දැයි පර්සිට සිතාගත නොහැකි විය. ඇනබෙත් පරිපූර්ණ උපදෙවි දැරියක වූවාය. ඇතීනාගේ දියණියක සතු විය යුතු සියල්ල ඇය සතුව තිබිණි. ''ඔයා කොහොමද කවදාවත්...?''

''මම දන්නේ නැහැ,'' ඇය කනගාටුවෙන් පැවසුවාය. ''ඒ සේරමටත් වඩා, මටත් රෑට නපුරු හීන පේනවා. ඔයාගේ ඒවා වගේම ඒවායේනුත් එච්චර තේරුමක් ගන්න බැහැ.''

පර්සි බලාසිටි නමුත්, ඇනබෙත් ඒ ගැන වැඩිදුර විස්තර නොපැවසුවාය. ඇයගේ හැඟීම් යහපත් කිරීමටත්, සියල්ල හොඳින් සිදුවනු ඇති බවටත් පැවසීමට ඔහුට අවැසි වුවත්, එය එසේ සිදු නොවන බව ඔහු දැන සිටියේය. ඔවුන් දෙදෙනා වෙනුවෙන්ම සියල්ල හොඳින් තහවුරු කර ගැනීමට ඔහුට අවශ්‍ය විය. එවිට ඔවුන්ට සතුටුදායක අවසානයක් උදාවනු ඇත.

එහෙත් මේ වතාවේ ඇනබෙත්ගේ සහාය පිණිස එහි ඔහේ සිටීම හැර තමාට කළ හැකි කිසිවක් නොමැති බව ඔහුට හැඟී ගියේය.

*ප්‍රඥාවේ දියණිය හුදකලාව ඇවිද යයි.*

ඇනබෙත් දුර්වල සිනාවක් පෑවාය.. ''හරිම ආදරණීය සන්ධ්‍යාවක් නේද? උදේ වෙනකම් වෙන කිසිම නරක දෙයක් වෙන්නේ නෑ.'' ඇය නැවත ඔහුව සිප ගත්තාය. ''අපි හැම දෙයක් ගැනම හොයලා බලන්න ඕනේ. මම ආයේ ඔයා හමුවෙන්නම්. දැනට, ඒ ප්‍රශ්න එච්චරයි.''

''හරි,'' පර්සි පැවසුවේය. ''ගයියාගේ නැගිටීම ගැන වෙන කතා එපා, නිකෝ ලෝකාවසානය වෙනකම් ප්‍රාණ ඇපකාරයෙක් විදිහට ඉඳියි, යෝධයෝ...''

''කටවහගන්න, පාසි මොළයෝ,'' ඇය නියෝග කළාය. ''ටික වෙලාවක් මාව අල්ල ගන්න.''

ඔවුහු තුරුලු වී හිඳගෙන එකිනෙකාගේ උණුසුම විඳගත්හ. පර්සි එය දැනීමටත් පෙර, නෞකා එන්ජිමේ ගුමු ගුමු නාදයත්, මඳ

ආලෝකයත්, ඇනබෙත්ගේ උණුසුම පිළිබඳ සුවදායී හැඟීමත් ඔහුගේ දෑස් බර කිරීමට සමත් විය. ඔහු නින්දට වැටුණේය.

ඔහු අවදිවන විට, වීදුරු ගෙබිම තුළින් දිවා ආලෝකය පතිත වෙමින් තිබිණි.

''ආහ්..., ඔයා ඉන්නේ ලොකු ප්‍රශ්නෙක.'' එවිටම කොලුවෙකුගේ හඬක් පැවසුවේය.

# 14
# පර්සි

**ෆ්‍රෑන්ක් මිනීකන රාක්ෂයන්ට මැදිව සිටින අයුරුත්** අමරණීය යෝධයන්ට මුහුණ දී සිටි අයුරු පමණක් නොව, මරණයේ දෙවියා වූ තනාටෝස්ගෙන් පවා මිදුණු අයුරු පර්සි දැක තිබිණි. එහෙත් ඒ කිසිදු විටෙක දුන් තරමට බියපත් පෙනුමක් පර්සි ඔහු වෙතින් දැක නොතිබිණි. ඔවුන් දෙදෙනා ඉස්තාලයෙන් පිටව යනවිට ෆ්‍රෑන්ක් බිරාන්තව බලා සිටියේය.

''මොකද?'' පර්සි දෑස් පිස දැමුවේය. ''ආහ්, අපි ටිකක් නිදාගත්තා විතරයි.''

ෆ්‍රෑන්ක් කිසිවක් නොපැවසුවේය. ඔහු ධාවක පාවහන් පැළඳ, වැන්කුවර් වින්ටන් ඔලිම්පික් ටී ෂර්ටයකින් සැරසී සිටියේය. ඔහු තම දෑස් ඔවුන් වෙතින් ඉවතට ගත්තේ, ඔවුන්ගේ බැල්මෙන් තමා දැවී අළු වී යතැයි සිතා මෙනි.

''හැමෝම හිතාගෙන ඉන්නේ ඔයාලා පැහැරගෙන කියලා,'' ඔහු පැවසුවේය. ''අපි නැව පුරාම හෙව්වා. කෝච් හෙජ් ඔයාලව හොයා ගන්නකොට... අනේ දෙවියනේ, ඔයාල මුළු රෑම මෙතනද හිටියේ?''

''ෆ්‍රෑන්ක්!'' ඇනබෙත්ගේ කන් ස්ට්‍රෝබෙරි මෙන් රතු වී තිබිණි. ''අපි මේ පහළට ආවේ කතාකරන්න විතරයි. අපිට නින්ද ගියා. එකපාරටම. එච්චරයි.''

''සිපගත්තෙ දෙතුන්පාරයි,'' පර්සි පැවසුවේය.

ඇනබෙත් ඕහු දෙස බැලුවාය. ''ඒකෙන් වැඩක් නෑ.''

''වැඩිය හොඳයි අපි...'' ෆ්‍රෑන්ක් ඉස්තාලයේ දොරටුව පෙන්නුවේය. ''ආහ්, අපි උදේ කෑමවෙලාවෙදි හමුවෙමු. ඔයාල මොනවද කළේ කියලා පැහැදිලි කරන්න පුළුවන් වෙයි. මම අදහස් කළේ මොනවද නොකළේ කියන එක. මම කියන්නේ... මට ඇත්තටම ඕනේ නෑ අර ෆවුන්ට, මම අදහස් කළේ නරාශ්වයාට මාව මරන්න ඉඩ දෙන්න.''

ෆ්‍රෑන්ක් දිව ගියේය.

අවසානයේදී සියල්ලෝම භෝජනාගාරයට රැස්වූ විට, එය ෆ්‍රෑන්ක් බියපත් වූ තරමට අයහපත් නොවීය. ජේසන් සහ පිපර් බොහෝ සැහැල්ලුවෙන් සිටියහ. ලියෝට විරිත්තීම සහ කෙඳිරීම නවත්වාගත නොහැකි විය. 1940 ගණන් වලට අයත් වූ බැවින් දෝ හේසාල් පමණක් කලකිරුණු අයුරින් සිටින බව පෙනී ගියේය. පර්සිගේ දෑස් හමුනොවන අයුරින් ඇය තම මුහුණ ඉවතට හරවා ගත්තාය.

සුපුරුදු ආකාරයෙන්ම, කෝච් හෙජ් බැලස්ටායි වෙත ගියේය. එහෙත් හුදෙක් අඩි පහක් පමණ උසැති වූ නරාශ්වයාට එය ක්‍රියාත්මක කළ හැකි දැයි පර්සි සැක කළේය.

''මගේ ජීවිතේ දී කවදාවත් වෙලා නෑ,'' කෝච් තම පිත්තෙන් ඇපල් බන්දේසියට පහරක් ගසමින් ගිගිරුවේය. ''නීතියට විරුද්ධව, වගකීමක් නැතිව!''

''කෝච්,'' ඇනබෙත් පැවසුවේය. ''ඒක අහම්බයක්. අපි කතා කරමින් ඉන්න අතරේ නින්ද ගියා.''

''අනෙක් අතට,'' පර්සි පැවසුවේය. ''ඔයා ටර්මිනස් වගේනෙ පටන් ගත්තේ.''

හෙජ් දෑස් පටු කළේය. ''එක අපහාසයක්ද, ජැක්සන්? මොකද මම, මම ඔයාව ඉවකරනවා, හාදයෝ.''

පර්සි සිනාව නවතා ගැනීමට උත්සාහ කළේය. ''ඒක ආයේ වෙන එකක් නෑ. කෝච් මම පොරොන්දු වෙනවා. දැන්, අපිට කතා කරන්න වෙන දේවල් නැද්ද?''

හෙජ් කෝපයට පත්විය. ''අපූරුයි! ඒත් මම ඔයා ගැන බලාගෙන ඉන්නේ, ජැක්සන්. ඒ වගේම ඔයා ගැනත් ඇනබෙත් චේසි. මම හිතුවේ ඔයාට මීට වඩා හැඟීමක්...''

ජැක්සන් උගුර පෑදුවේය. ''ඉතිං හැමෝම කෑම බෙදාගන්න. අපි පටන් ගමු.''

රැස්වීම ඩෝනට් සමග යුද මණ්ඩලයක සිරිය ගත්තේය. ඊළඟට නැවත වතාවක්, අර්ධ ලෝහිත කඳවුරේදී පිං පොං මේසය වටා බිස්කට් සහ චීස් වීස් සමඟ ඔවුන්ගේ වඩාත් බරපතල සාකච්ඡාවන් සිදුකෙරුණු ආකාරයටම සිදුවූ බැවින් පර්සිට තම නිවෙස මෙන් හැඟී ගියේය.

ඔහු ඔවුන්ට තම සිහිනය ගැන පැවසුවේය. යෝධයින් දෙදෙනා භූගත රථ ගාලෙදී රොකට් විදිනවලින් ඔවුන්ව පිළිගැනීමට බලා සිටින අයුරුත්, ලෝකඩ බඳුනක දෙළුම් ඇට සමග සිරකර සිටින නිකෝ ඩි ආන්ජලෝ වාතය නොමැතිව සෙමින් මිය යමින් සිටින අයුරුත් ඔහු විස්තර කළේය.

හේසාල් ශෝකයට පත් වූවාය. ''නිකෝ... අනේ දෙවියනේ. දෙළුම් ඇට.''

''ඔයා දන්නවද ඒවා මොනවද කියලා?'' ඇනබෙත් විමසුවාය. හේසාල් හිස සැලුවාය. ''වතාවක් එයා මට ඒවා පෙන්නුවා. ඒවා ලැබුණේ අපේ කුඩම්මගේ ගෙවත්තෙන්.''

''ඔයාගේ කුඩම්මා... ආහ්,'' පර්සි පැවසුවේය. ''ඔයා කියන්නේ පර්සිපෝන්[1].''

පර්සිට වරක් හේඩිස්ගේ බිරිඳ හමු වී තිබිණි. ඇය සැබෑ ලෙසම උණුසුම් අයකු නොවූවාය. එසේම ඔහු ඇගේ පාතාලයේ උද්‍යානයට ද ගොස් තිබිණි. ස්ඵටිකමය ගස්ද, ලේ රත් පැහැති සහ භූත ධවල පැහැති මල් වලින් යුත් එය බියකරු ස්ථානයක් වූයේය.

''ඒ ඇට... ආහාරයක්,'' හේසාල් පැවසුවාය. මේසය මත තිබූ සියලු රිදීමය දෑ ඇය දෙසට ඇදෙන්නට වූ බැවින් ඇය කලබල වී සිටින අයුරු පර්සිට පෙනී ගියේය. ''හේඩිස්ගෙ දරුවන්ට විතරයි ඒවා කන්න පුළුවන්. නිකෝ කොහේ හරි යන හැමවෙලාවෙම ඒවායින් ටිකක් ළඟ තියාගත්තා. ඒත් එයා ඇත්තටම සිරවෙලානම්-''

''යෝධයෝ අපට ඇමක් දාන්න හදන්නේ,'' ඇනබෙත් පැවසුවේය. ''අපි නිකෝව බේරගන්න උත්සාහ කරයි කියලා එයාලා හිතනවා.''

1 පාතාල ලෝකයේ ග්‍රීක රැජින යි. හේඩිස්ගේ බිරිඳ ය. සියුස්ගේ සහ ඩෙමිටර්ගේ දියණිය යි. රෝම ස්වරූපය ප්‍රොසර්පයින් ය.

''එයාලා හරි!'' හේසාල් මේසය වටා බලමින් පැවසුවාය. ඇගේ ආත්ම විශ්වාසය වැඩෙමින් තිබිණි. ''අපි ඒක කරනවා නේද?''

''ඔව්!'' අත්පිස්නාව මුවේ සිරකරගෙන හෙජ් කෑ ගැසුවේය. ''ඒකෙන් සටනකට සම්බන්ධ වෙන්න පුළුවන් නේද?''

''හේසාල්, ඇත්තවශයෙන්ම අපි එහෙම උදව් කරනවා.'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''ඒත් අපි ඒක කරන්න කලින්, කොච්චර කාලයක්... මම කියන්නේ, නිකෝට කොයි තරම් කාලයක් අල්ලගෙන ඉන්න පුළුවන් වෙයිද?''

''එක දවසකට එක ඇටයක්,'' හේසාල් පැවසුවේය. ''එහෙමයි එයාව මරණයේ දෑහැනට වැටෙන්නේ.''

''මරණයේ දෑහැන?'' ඇනබෙත් මුහුණ හැකිලුවාය. ''ඒක නම් හොඳ දෙයක් වෙන්න බෑ.''

''ඒකෙන් එයාට වාතය සේරම ඕනේ කරන එක නවතිනවා,'' හේසාල් පැවසුවාය. ''හරියට ශිශිරතරණය හෝ කොමා තත්ත්වයක් වගේ. සාමාන්‍යයෙන් එක ඇටයකට එයාව එක දවසක් ජීවත් කරන්න පුළුවන්.''

''එයා ළඟ ඇට පහක් ඉතුරුවෙලා තිබුණා.'' පර්සි පැවසුවේය. ''ඒ කියන්නේ අදත් එක්ක දවස් පහයි. යෝධයෝ සැලසුම් කරලා තියෙන්නේ ඒ විදියට. අපි ජූලි පළවෙනිදා පැමිණෙයි කියලා. නිකෝ රෝමයේ කොහේ හරි හංගලා ඉන්නවා කියලා හිතුවොත්...''

''ඒකට වැඩි කාලයක් නැහැ.'' පිපර් පැවසුවාය. ඇය තම අත හේසාල්ගේ උරහිස මත තැබුවාය. ''අපි එයාව හොයා ගමු. අඩුගානේ අනාවැකියෙන් කියවෙන්නේ මොකක්ද කියලවත් අපි දන්නවනේ.'' නිමක් නැති මරණයේ යතුර දරා සිටින, දෙවඟනගේ සුසුමින් නිවුන්නෝ නික්මෙති.''

''ඔයාගේ සහෝදරයාගේ නමේ අවසන් කොටස ඩි ආන්ජලෝ. ආන්ජලෝ කියන්නේ ඉතාලි භාෂාවෙන් දෙවඟන.''

''අනේ දෙවියනේ, හේසාල් පැවසුවාය. නිකෝ...

පර්සි ඔහුගේ ජෑම් ඩෝනටය දෙස බලා සිටියේය. නිකෝ ඩි ආන්ජලෝ සමඟ ඔහුට දැඩි ඉතිහාසයක් තිබිණි. ඔහු වරක් උපක්‍රමයකින් හේඩීස්ගේ මන්දිරයට කැඳවාගෙන ගියේය. එහිදී පර්සිට සිරගත වීමට සිදුවිය. එහෙත් බොහෝ අවස්ථාවල නිකෝ සිටියේ යහපත් අපගේ

පක්ෂයේය. නිසැකවම ඔහු ලෝකඩ බඳුනක් තුළ හුස්ම සිර වී මිය යාමට සුදුසු අයෙකු නොවේ. එසේම හේසාල් වේදනාවෙන් සිටිනු දැකීමට ද ඔහු කැමති වූයේ නැත.

''අපි එයාව බේර ගන්නවා,'' ඔහු ඇයට පොරොන්දු විය''

''අපි ඒක කරනවා. අනාවැකියෙන් කියන්නේ එයා නොනිමි මරණයේ යතුර දරාගෙන සිටින බවයි.''

''ඒක හරි.'' පිපර් ධෛර්යවන්තව පැවසුවාය. ''හේසාල්, ඔයාගේ සහෝදරයා මරණයේ දොරටු හොයාගෙන පාතාලයට ගියා, නේද? එයාට ඒවා හමුවෙන්න ඇති.''

''ඒ දොරටු කොහෙද තියෙන්නේ කියලා එයා අපිට කියයි,'' පර්සි පැවසුවේය. ''ඒ වගේම ඒවා වහන විදිහත්.''

හේසාල් ගැඹුරු හුස්මක් ගත්තාය. ''ඔව්. හොඳයි.''

''ආහ්...'' ලියෝ තම අසුනට තට්ටු කළේය. ''එක දෙයක්.

''අපි මේක කරයි කියලා යෝධයෝ බලාපොරොත්තු වෙනවා නේද? ඉතිං අපි උගුලකට නෙමෙයි ද යන්නේ?''

දුෂ්ටයෙකු දෙස බලන අයුරින් හේසාල් ලියෝ දෙස බැලුවාය. ''අපිට වෙන විකල්පයක් නැහැ.''

''මාව වැරදි විදිහට තේරුම් ගන්න එපා, හේසාල්. ඔයාගේ සහෝදරයා, නිකෝ... එයා කඳවුරු දෙකම ගැන දන්නවා නේද?''

''ඔව්,'' හේසාල් පැවසූවා.

''එයා එහාටයි මෙහාටයි යනවා.'' ලියෝ පැවසුවාය. ''එයා එක පැත්තකවත් නෑ.''

ජේසන් ඉදිරියට නැවුණේය. ඔහුගේ ඉරියව් වික්ෂිප්ත බවක් ගෙන තිබිණි. ''ඔයා කියන්නේ අපිට ඒ හාදයාව විශ්වාස කරන්න බෑ කියලනේ. ඉතිං මම.''

හේසාල් නැගිට්ටාය. ''මම මේක විශ්වාස කරන්නේ නැහැ. එයා මගේ සහෝදරයා. එයයි මාව ආපසු පාතාල ලෝකයෙන් අරන් ආවේ. ඔයාලට වුවමනාවක් නැද්ද එයාට උදව් කරන්න?''

ෆ්‍රෑන්ක් තම අත ඇගේ උරහිස මත තැබුවේය. ''කවුරුවත් එහෙම කියන්නේ නෑ.'' ඔහු ලියෝ දෙස බැලුවේය. ''කවුරුවත් එහෙම නොකියන එකත් හොඳයි.''

ලියෝ ඇසිපිය සැලුවේය. ''බලන්න, හාදයිනේ, මම මේ කිව්වේ...''

''හේසාල්.'' ජේසන් පැවසුවේය. ''ලියෝ ගෙනාවේ හොඳ තර්කයක්. මට මතකයි නිකෝ ජුපිටර් කඳවුරේ හිටියා. දැන් මට පේනවා එයා අර්ධ ලෝහිත කඳවුරෙන් ඉඳලා තියෙන බව. අපි ඇත්තටම දන්නවද එයාගේ පක්ෂපාතීත්වය කොයි පැත්තටද කියලා අපි ටිකක් ප්‍රවේසම් වෙන්න ඕනේ.''

හේසාල්ගේ දෑත් වෙවුලන්නට විය. රිදී බන්දේසිය ඇය දෙසට ඇදී ගොස්, ඇගේ වම් පස වූ බිත්තියේ වැදිණි. ''ඔයා... මහා ජේසන් ග්‍රේස්... මම බලාගෙන හිටපු රෝමයේ මහේස්ත්‍රාත්. ඒ වගේ හොඳ නායකයෙක්, එච්චර පහත් විදිහට හිතනවා. දැන් ඔයා...'' නැගී සිටි හේසාල් වේගයෙන් භෝජනාගාරයෙන් පිටවූවාය.

''හේසාල්!'' ලියෝ කෑ ගැසුවේය. ''ආහ්, මම...''

''ඔයා කරපු ටික ඇති.'' ෆ්‍රෑන්ක් ගෙරවූයේය. ඔහු ඇය පසුපස යාමට සූදානම් වුවත්, පිපර්ගේ බැල්මෙහි වූයේ ඔහුට නැවතීමට කළ සංඥාවකි.

''එයාට කාලය දෙන්න,'' පිපර් උපදෙස් දුන්නාය. ඉන්පසු ඇය ලියෝ සහ ජේසන් දෙස රවා බැලුවාය. ''ඔය දෙන්නා කරපු දේ අන්තිමයි.''

''ඇත්තමයි?'' ජේසන් කම්පනයට පත් අයුරින් විමසුවේය. ''මම ටිකක් විපරම් කළා විතරයි.''

''එයාගේ සහෝදරයා මිය යමින් ඉන්නේ,'' පිපර් පැවසුවාය.

''මම ගිහින් එයාට කතා කරන්නම්,'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

''නෑ,'' පිපර් පැවසුවාය. ''මුලින්ම එයාගේ කේන්තිය අඩුවෙන්න දෙන්න. මෙතනදී මාව විශ්වාස කරන්න. මිනිත්තු කීපයක් මම ගිහින් එයාව බලන්නම්.''

''ඒත්...'' ෆ්‍රෑන්ක් තම වදන් ගිල ගත්තේය. ''හරි, මම ඉන්නම්.'' විශාල විදුම් යන්ත්‍රයකින් මෙන් ඉහළින් විදුම් හඬක් නික්මිනි.

''ඒ ෆෙස්ටස්,'' ලියෝ පැවසුවේය. ''මම ස්වංක්‍රීය නියමුවා විදිහට එයාව ගත්තා, ඒත් අපි ඇට්ලැන්ටා වලට කිට්ටු වෙලා වෙන්න ඕනේ. මම එතෙන්ට යන්න ඕනේ... ආහ්, අපි දන්නවනේ'' සැවොම පර්සි දෙසට හැරුණාහ.

ජේසන් දෙබැම එසවීය. ''ඔබ කපිතාන් සෝල්ට් වෝටර්- විශේෂඥයාගේ මොනවහරි අදහසක් තියෙනවද?''

''මට හරියටම කියන්න බැහැ.'' ඔහු පැවසුවේය. ''මැද කොහේ හරි උස තැනකට ගොඩබසිමු. එතකොට අපිට නගරය හොඳින් බලාගන්න පුළුවන්. සමහරවිට වන ලැහැබකට ගොඩ බාන්න පුළුවන් වෙයි. අපිට යුධ නැව පහළ නගරයේ මැදට බස්සන්න වුවමනාවක් නැනේ. මිස්ට්වලට[1] මෙච්චර විශාල දෙයක් සඟවන්න පුළුවන් වෙයි ද කියලා මට සැකයි.''

ලියෝ හිස සැලුවේය. ''එහෙම කරමු.'' ඔහු හැල්මේ පියගැට පෙළ දෙසට ගියේය.

ෆ්‍රෑන්ක් නැවත අපහසුවෙන් තම අසුනේ හිඳ ගත්තේය. පර්සිට ඔහු ගැන ඇත් වූයේ එතරම් යහපත් හැඟීමක් නොවේ. ඇලස්කා ගමනේදී, හේසාල් සහ ෆ්‍රෑන්ක් අතර සමීප සබඳතාවක් වැඩෙනු ඔහු බලා සිටියේය. ඇයට ෆ්‍රෑන්ක් කෙතරම් ආරක්ෂිත හැඟීමක් ඇති වීමට සැලැස්වූයේ දැයි පර්සි දැන සිටියේය. ෆ්‍රෑන්ක් ලියෝ වෙත හෙලූ බියකරු බැල්මද පර්සිගේ අවධානයට ලක් විය. මොහොතකට ෆ්‍රෑන්ක්ව නැවෙන් පිටතට රැගෙන යාම හොඳ අදහසක් වනු ඇතැයි ඔහු සිතුවේය.

''අපි ගොස් බැස්සම, මම ඇට්ලැන්ටා වටේ රවුමක් දාලා බලන්නම්.'' පර්සි පැවසුවේය. ''ෆ්‍රෑන්ක්, මට ඔයාගේ උදව් ඕනේ වෙයි.''

''ඔයා කියන්නේ ආයෙත් මකරෙක් බවට හැරෙන්න කියලද? කාරුණාකරලා, පර්සි, මේ ගවේෂණය පුරාම කාහෙ හරි කුලී රථයක් විදිහට ගෙවලා දාන්න නම් මට ඕනේ නැහැ.''

''නෑ,'' පර්සි පැවසුවේය. ''මට ඕනේ ඔයා මාත් එක්ක එන්න විතරයි. මොකද ඔයාට පොසිඩන්ගේ රුධිරය ලැබිලා තියෙනවා. සමහරවිට ඔයාට පුළුවන් වෙයි, ලුණු වතුර හොයාගන්න මට උදව් කරන්න. අනිත් එක ඔයා සටන්වලටත් හොඳයි.''

එයින් ෆ්‍රෑන්ක්ගේ ඉරියව් මඳක් පැහැපත් වූ බව පෙනිණි. ''සත්තකින්ම, මම එහෙම හිතනවා.''

''නියමයි,'' පර්සි පැවසුවේය. ''අපි තව කෙනෙක් එක්ක යන්න ඕනේ. ඇනබෙත්.''

1 මනුෂ්‍යයන්ගෙන් යමක් සඟවා තැබෙන ඉන්ද්‍රජාලික බලය

''ආහ්, නෑ!'' කෝච් හෙජ් බෙරිහන් දුන්නේය. ''තරුණ නෝනා, ඔයා මෙතනම ඉන්න.''

ඔහු විදේශීය භාෂාවකින් කතා කළා වැනි බැල්මකින් ඇය ඔහු දෙස බලා සිටියාය. ''මට සමාටවන්න.''

''ඔයයි, ජැක්සනුයි එකට කොහෙවත් යන්නේ නෑ.'' හෙජ් විරෝධය පෑවේය. ඔහු පර්සි දෙස බලා සිටි ආකාරයට, පර්සි කට ඇරීමට නිර්භීත වූයේ නැත. ''මම යන්නම් ෆ්‍රෑන්ක් සහ ජැක්සන් මහත්මයා එක්ක. අනෙක් කට්ටිය නැව ආරක්ෂා කරන අතරෙම ඇනබෙත් තවදුරටත් නීති කඩනවද කියන එක ගැනත් ඇහැ ගහගෙන ඉන්න ඕනේ.''

මාරයිනේ, පර්සි සිතුවේය. ගොඩබිමින් වට වූ නගරයේ ලුණු වතුර සොයා යන කොලුවාට ෆ්‍රෑන්ක් සමඟ ලේ පිපාසිත නරාශ්වයාද එක්වන්නේය.

''මේක,'' ඔහු පැවසුවේය, ''හරිම විනෝද ජනක වෙයි.''

# 15
# පර්සි

**''නියමයි,'' නැව් තට්ටුවෙන් පහළට බැස පර්සි පැවසුවේය.**

ඔවුන් ගොඩබැස තිබුණේ වනයෙන් වැසුණු කඳු ගැටයක් මුදුනටය. වම් පසට වන්නට වූ පයින් ගස් අරඹක කෞතුකාගාරයක් හෝ විශ්ව විද්‍යාලයක් වැනි වූ ධවල පැහැති ගොඩනැගිලි සංකීර්ණයක් පිහිටා තිබිණි. ඔවුන්ට පහළින් විසිරී තිබුණේ ඇට්ලැන්ටා නගරයයි. පහළ නගරයේ සැතපුම් දෙකක පමණ දුරට දුඹුරු හා රිදී පැහැයෙන් යුත් දැවැන්ත ගොඩනැගිලි විසිරී තිබුණු අතර, ඒවා අතරින් නිමක් නැති මහා මාර්ග, දුම්රිය මාර්ග, නිවාස සහ හරිත පැහැ වන බිම් දක්කට ලැබුණි.

''ආහ්, අපූරු තැනක්,'' කෝච් හෙජ් උදෑසන වාතය ආඝ්‍රාණය කළේය. ''හොඳ තේරීමක්, වැල්ඩෙස්.''

ලියෝ දෙවුර සැලුවේය. ''මම තේරුවේ උස කන්දක් විතරයි. අර පේන්නේ පුස්තකාලය හෝ මොකක් හරි වෙන්න ඇති. අඩුගානේ ෆෙස්ටස් කිව්වේ එහෙමයි.''

''මම ඒ ගැන දන්නේ නෑ!'' හෙජ් ගිගිරුවේය. ''ඒත් ඔයාට තේරුණාද මේ කන්දෙදී මොකද වුණේ කියලා? ෆ්‍රෑන්ක් ෂෑන්ග් ඔයා දැන ගන්න ඕනේ!''

ෆ්‍රෑන්ක් පැකිලුනේය. ''මම දන්නවා!''

''ඒරිස්ගේ පුත්‍රයා මෙතන හිටගෙන හිටියා!'' හෙජ් කෝපයෙන් කෑ ගැසුවේය.

''මම රෝම කෙනෙක්... ඉතිං ඇත්තටම ඒ මාර්ස්[1] වෙන්න ඕනේ.''

''මොකක් වුණත්! අමෙරිකානු සිවිල් යුද්ධයෙත් ප්‍රසිද්ධ තැනක්!''

''ඇත්තටම, මම කැනේඩියානුවෙක්.''

''මොකක් වුණත්! ජෙනරාල් ෂර්මන්, ඒකාබද්ධ නායකයා. එයා මේ කඳු ගැටයේ හිටගෙන ඇට්ලැන්ටා නගරය දැවෙනවා බලා ගෙන හිටියා. මෙතන ඉඳලා මුහුදට යනකම් විනාශයේ මාර්ගය විවර කළා. දැවීම්, කොල්ලකෑම්, පැහැරගැනීම්. දැන් එතන උපදෙවියෙක්. ෆ්‍රෑන්ක් නරාශ්වයා වෙතින් අඟල් කීපයක් ඈත් විය, ''ආහ්, හරි.''

පර්සි ඉතිහාසය ගැන එතරම් තැකීමක් නොකළත්, මෙහි ගොඩබෑම අශුභ පෙරනිමිත්තක් වේදැයි සැක කළේය. මිනිසුන්ගේ සිවිල් යුද්ධ බොහොමයක් ආරම්භ වූයේ ග්‍රීක හා රෝම උප දෙවිවරු අතර සටන් වලින් බව ඔහු අසා තිබුණේය. දැන් ඔවුන් සිටින්නේ එවැනි සංග්‍රාම භූමියක් මත ය. ඔවුන්ට පහළින් තිබූ මුළු නගරයම ඒරිස්ගේ දරුවාගේ නියෝග අනුව මට්ටම් වී තිබිණි.

අර්ධ ලෝහිත කඳවුරේදී සමහර දරුවන්ට එවැනි නියෝග ලැබුණු බව ඔහුගේ මතකයේ තිබිණි. උදාහරණයක් ලෙස ක්ලැරිසි ලා රූ එවැන්නෙකි. එහෙත් ෆ්‍රෑන්ක් එතරම් දැඩි යැයි ඔහුට සිතාගත නොහැකි විය.

''කොහොමවුණත්,'' පර්සි පැවසුවේය. ''මේ වතාවේ නගරය පුච්චල නොදා ඉන්න අපි උත්සාහ කරමු.''

කෝච් බලාපොරොත්තු සුන් වූ අයුරින් බලා සිටියේය. ''සේරම හරි. ඒත් කොහොමද යන්නේ.''

පාවී යාම ඔවුන් සිතුවාට වඩා පහසු විය. ඔවුන් තිදෙනා නගර පුස්තකාලය දෙසට ගමන් ගත්හ. එහිදි ඔවුන්ට කුලී රථයක් කැඳවා දීම හෝ ළඟම පිහිටි බස් නැවතුමට යන දිශාව පෙන්විය හැකි දැයි කාර්ය මණ්ඩලයෙන් විමසා සිටියහ. පර්සිට බ්ලැක්ජැක්ව කැඳවීමට හැකියාව

1 යුද්ධයට අධිපති රෝම දෙවියාය. මාර්ස් උල්ටෝර් ලෙසද හඳුන්වයි. අධිරාජ්‍යයේ ආරක්ෂකයාය. රොමියුලස් හා රීමස් ගේ දිව්‍යමය පියාය. ග්‍රීක ස්වරූපය ඒරිස් ය.

තිබුණත්, අන්තිමට සිදුවූ ව්‍යසනය හේතුවෙන් පියාපත් සහිත අශ්වයා කැඳවීමට ඔහු පැකිලුනේය. කිසිවකට පරිවර්තනය වීමට ෆ්‍රැන්ක් කැමති වූයේ නැත. එසේම, අනෙක් අතට, වෙනසකට මෙන් සාමාන්‍ය ක්‍රමයට ගමන් කිරීමට පර්සි කැමැත්තක් දක්වීය.

පුස්තකාලයාධිපතීන්ගෙන් අයෙකු වූ ඊස්ටර් ඔවුන් තනිව ගමන් කිරීම ගැන සතුටු නොවූවාය. ඇගේ අපූරු බව නිසා ඇය විසින් වෙස් ගත් රාක්ෂයෙකු වන්නට ඇතැයි පර්සි සිතූ නමුත් ඔහුව පසෙකට ඇදගෙන ගිය හෙජ් ඇගෙන් මිනිස් ඉව දැනෙන බව සහතික කළේය.

ඊස්ටර්ගේ විශාල කළු පැහැති කැඩිලැක් රථයට නැගුණු ඔවුහු පහළ නගරය දෙසට ගමන් ගත්හ. බෙහෙවින් කුඩා අයකු වූ ඊස්ටර්ට සුක්කානම මතින් දැකගත හැකි වූයේ යාන්තමිනි. එහෙත් ඇය ඒ ගැන කරදර වන බවක් නොපෙනුණි. ඇට්ලැන්ටාවේ අමුතු පවුල් ගැන කතා කරමින් ඇය වාහන තදබදය අතරින් රිය පැදවූවාය. පැරණි ඉඩම් හිමියන්, කොකා- කෝලා සමාරම්භකයන්, ක්‍රීඩාතරු සහ CNN ප්‍රවෘත්ති වාර්තාකරුවන් ඇගේ මාතෘකාව විය. ඇය දැනුමින් පිරි කාන්තාවක් බව පෙනී ගිය බැවින් පර්සි වාසනාව උරගා බැලීමට තිරණය කළේය.

''ඉතිං, ඊස්ටර්,'' ඔහු පැවසුවේය. ''ඔයාට අමාරු ප්‍රශ්නයක් තියෙනවා. ඇට්ලැන්ටාවේ ලුණු වතුර. එතකොට මුළින්ම මතකටය එන්නේ මොකක්ද?''

මහලු කත සිනාසුණාය. ''ආහ්, ඒක ලේසියි. තල්මස් මෝරු.''

ෆ්‍රැන්ක් පර්සි දෙසත්, පර්සි ෆ්‍රැන්ක් දෙසත් බැලුවේය.

''තල්මස් මෝරු?'' ෆ්‍රැන්ක් අපහසුවෙන් විමසුවේය. 'ඇට්ලැන්ටා වල උන් ඉන්නවද?''

''මින්මැදුරේ ඉන්නවා,'' ඊස්ටර් පැවසුවාය. ''හරිම ප්‍රසිද්ධයි! හරියටම පහළ නගරේ. ඔයාලට යන්න ඕනේ එහෙටද?''

*මින් මැදුර.* පර්සි ඒ ගැන සලකා බැලුවේය. පැරණි ග්‍රීක මුහුදු දෙවියතු ජෝර්ජියාවේ මින් මැදුරක කුමක් කරන්නේ දැයි ඔහු දැන නොසිටි නමුත්, ඔහු සතුව වෙනත් හොඳ අදහස් නොතිබිණි.

''ඔව්,'' පර්සි පැවසුවේය. ''අපි එහෙට තමයි යන්නේ.''

ඊස්ටර් ඔවුන්ව ප්‍රධාන පිවිසුම අසලින් බැස්ස වූවාය. එහි ඒ වනවිටත් පෝලිම සැදෙමින් තිබිණි. ඇගේ දුරකථන අංකය ලබා ගන්න ලෙසත්, නැවත කාටර් මධ්‍යස්ථානයට පැමිණීම සඳහා කුලී

රථ ගාස්තුව ලබා ගන්නා ලෙසත්, යම් හේතුවක් නිසා ඇගේ රථයේ පෙට්ටියක බහා තිබූ නිවසේ සාදන ලද පීච් දෝසි බඳුන ලබාගන්නා ලෙසත් බලකර සිටියාය. දෝසි බඳුන තම පිටේ එල්ලගෙන සිටි බෑගයට දමා ගත් ෆ්‍රෑන්ක්, ඊස්ටර්ට ස්තුති කළේය.

''ඇට්ලැන්ටාවල හැම මිනිහෙක්ම ඒවාගේ හොඳ අයද?'' ඇය ඉවත්ව යත්ම ෆ්‍රෑන්ක් විමසුවේය.

හෙජ් ගෙරවූයේය. ''එහෙම නෑ කියලා හිතමු. එයාලා හොඳ අය නම් මට සටන් කරන්න බැරි වෙනවා. අපි යමු තල්මස් මොරුන්ට දෙකක අනින්න. කියන විදිහට උන් භයානකයි.''

''ආහ්, විශේෂ අමුත්තනි,'' වල ගැසෙන කම්මුල් සහිත තරුණියක් පැවසුවාය. ඝන රාමුවකින් යුත් උපැස් යුවළක් පැළඳ සිටි ඇය කෙස්වැටිය උඟුරු වලිගයක් සේ පිටුපසින් ගැට ගසා ගෙන සිටියාය. විසි වැනි දශකයේ අග භාගයේ යැයි සිතෙන පාසල් දැරියකගේ පෙනුමින් යුත් ඇය යම් ආකාරයක රුවැත්තියක් වුවත්, තවත් ආකාරයකින් අද්භූත බවක් පෙන්නුම් කළාය. ඇගේ ජෝර්ජියා මින් මැදුරු පෝලෝ කමිසයට අමතරව ඇය තද පැහැති ලිහිල් කලිසමකින් සැරසී සිටියාය. කේට් ලෙස සඳහන් නාම පුවරුවක් ඇගේ ළය මත එල්ලා තිබිණි.

''ඔයාලා ළඟ සල්ලි තියෙනවා,'' ඇය පැවසුවාය. ''නියමයි.''

''මොකක්ද?'' පර්සි විමසුවේය.

ඇය ෆ්‍රෑන්ක් අතවූ මුදල් පෙන්වූවාය. ''ඔව්, ඒක හොඳයි., මේ පැත්තෙන් එන්න.''

ආපසු හැරුණු ඇය ප්‍රධාන පිවිසුමෙන් ඇතුළු වූවාය.

පර්සි, ෆ්‍රෑන්ක් සහ කොච් හෙජ් දෙස බැලුවේය. ''උගුලක් ද?''

''වෙන්න පුළුවන්.'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

''එයා මනුෂ්‍යයෙක් නෙමෙයි,'' වාතය ඉව කරමින් හෙජ් පැවසුවේය. ''සමහරවිට එළුවෝ කන, උපදෙවියන් විනාශ කරන, ටාටරස්[1] එවපු යක්ෂයෙක් වෙන්න ඇති.''

''සැකයක් නෑ,'' පර්සි එකඟවිය.

''භයානකයි.'' හෙජ් විරිත්තුවේය. ''අපි යමු.''

1 ගයියාගේ ස්වාමියාය. ආගාධයේ ආත්මයයි. යෝධයන්ගේ පියා ය.

කිසිදු ගැටලුවක් නොමැතිව කේට් ඔවුන්ව ප්‍රවේශපත්‍ර පෝලිම පසුකර මින්මැදුර තුළට කැඳවාගෙන ගියාය.

''මේ පැත්තෙන්,'' ඇය පර්සි දෙස බලා පැවසුවාය. ''ඒක පුදුම ප්‍රදර්ශන භාණ්ඩයක්. ඔයාලා කලකිරෙන එකක් නෑ. ඉතිං අපි කලාතුරකින් විශේෂ අමුත්තන්ව ගන්නේ.''

''ආහ්, ඔයා කියන්නේ උප දෙවිවරුන්ද?'' ෆ්‍රැන්ක් විමසුවේය.

ඔහු දෙස බලා ඇසක් ගැසූ ඇය, ඇඟිල්ලක් ඇගේ මුව මත තබා ගත්තාය. ''අතන සීත ජල අත්දැකීම පෙන්ගුයින්ලා සහ බෙලුගා තල්මසුන් සමඟ. ඒ වගේම අතන... නිසැකවම සමහර මත්ස්‍යයෝ එතන ඉන්නේ.''

කුඩා මසුන් පිළබඳ ඇය එතරම් තැකීමක් නොකළාය. ඔවුහු නිවර්තන විශේෂ සහිත එක් විශාල ටැංකියක් පසු කළහ. එක් විශේෂිත මත්ස්‍යයෙක් පෙන්වා ඌ කවුරුන්දැයි ෆ්‍රැන්ක් විමසූ වේය,

''ආ... ඒ කහපාට උන්.'' යැයි කේට් පිළිතුරු දුන්නාය.

ඔවුහු සිහිවටන අලෙවි සැල පසු කළහ. ඇඳුම් සහ කෙළි බඩු මේසය අසල දී ෆ්‍රැන්ක්ගේ වේගය අඩාල විය.

''ඔයාලට ඕනේ දෙයක් ගන්න.'' කේට් ඔවුන්ට පැවසුවාය.

ෆ්‍රැන්ක් පුදුම විය. ''ඇත්තටම.''

''ඇත්තටම. ඔයාලා විශේෂ අමුත්තෝ.''

ෆ්‍රැන්ක් පැකිලුනේය. ඉන්පසුව ඔහු ටී ෂර්ට් කීපයක් ඔහුගේ මල්ලේ ඔබා ගත්තේය. ''ජේත්තුකාරයා,''පර්සි පැවසුවේය.

''ඔයා මොනවද කරන්නේ?''

''එයා කිව්වේ ගන්න කියලා,'' ෆ්‍රැන්ක් කෙඳිරුවේය. ''අනෙක් අතට අපිට තව ඇඳුම් ඕනේ. දීර්ඝ ගමනකට මගේ ළඟ ඇඳුම් නැහැ.''

රහසිගතව තැනක ඔහු හිම බෝලයක්ද දමා ගත්තේය. ඉන්පසු ෆ්‍රැන්ක් අතට ගත්තේ සිලින්ඩරාකාර ගෙත්තමකි. ඔහු එය මිරිකුවේය. ''මොකක්ද?''

''චීන මාංචුවක්,'' පර්සි පැවසුවේය.

චීන කැනේඩියානුවකු වූ ෆ්‍රැන්ක් එය පිළිගත්තේ නැත. ''මේක කොහොමද චීන වෙන්නේ.''

''මම දන්නේ නෑ,'' පර්සි පැවසුවේය. ''ඒක හරියටම මම කියපු දේ වගේ තමයි. මුකවාඩම් තෑග්ගක් වගේ.''

''එන්න කොල්ලනේ,'' ශාලාවේ අනෙක් පස පිහිටි කේට් හඬ නැගුවාය.

''මම ඔයාට පස්සේ පෙන්වන්නම්.'' පර්සි පොරොන්දු විය.

ෆ්‍රැන්ක් එය තම මල්ලේ දමාගත්තේය. ඔවුහු ඉදිරියට ඇදුණාහ.

ඔවුහු ඇක්‍රලික් උමගක් තුළින් ගමන් ගත්හ. ඔවුන්ගේ හිස්වලට ඉහළින් මසුන් පිහිනා ගියහ. අහේතුක බියකින් තම උගුර හිරවෙන්නා සේ පර්සිට හැගුණේය.

*මේක අගේතුක බියක්, ඔහු තමාටම පවසාගත්තේය. මම දශලක්ෂ වාරයක් දිය යට ඉඳලා තියෙනවා. ඒ වගේම මම ඉන්නෙත් වතුරෙ නෙමෙයි.*

සැබෑ අනතුර වන්නේ කේට් බව ඔහුට සිහිපත් විය. ඇය මනුෂ්‍යයකු නොවන බව හෙජ් දැනටමත් හඳුනාගෙන තිබිණි. ඕනෑම මොහොතක ඇය මේ බියකරු සත්ත්වයකු බවට පත් වී ඔවුන්ට පහර දීමට ඉඩ ඇත. එහෙත් මුහුදු දෙවියා වූ පෝසයිස්[1] හමුවන තුරු විශේෂ අමුත්තන් සේ ඇය සමඟ ගමන් කිරීම හැර වෙනත් විකල්පයක් ගැන පර්සිට සිතාගැනීමට නොහැකි විය. උගුලේ පතුලටම ඇවිද ගියත් ඔවුන්ට වෙනත් විකල්පයක් නොතිබිණි.

ඔවුහු නිල් ආලෝකයෙන් නැහැවුණු දර්ශන කාමරයට පැමිණියහ. වීදුරු බිත්තියට අනෙක් පැත්තේ වූයේ පර්සි මෙතෙක් දැක තිබූ විශාලතම මාළු ටැංකියයි. තිත් සහිත මෝරුන් දෙදෙනෙක්ද ඇතුළුව මත්ස්‍ය රූප දුසිම් ගණනක් එහි පිහිනමින් සිටියහ. එක් මෝරකු පර්සි මෙන් දෙගුණයක් තරම් විශාල විය. ඔවුන් තරබාරුය. මන්දගාමීය. විවර වූ මුව තුළ දත් නොතිබිණි.

''තල්මස් මෝරු,'' හෙජ් පැවසුවේය. ''දැන් අපට මරණය දක්වා සටන් කරන්න වෙයි.''

කේට් සිනාසුණාය. ''මෝඩ නරාශ්වයා. තල්මස් මෝරු සාමකාමී අය. එයාලා ආහාරයට ගන්නේ ප්ලාවාංග විතරයි.''

පර්සි මුහුණ හැකිළුවේය. කෝච් නරාශ්වයකු බව කේට් දන්නේ කෙසේ දැයි ඔහු පුදුමයට පත් විය. කලිසමක් හැඳ සිටි හෙජ්

1 ග්‍රීක මිත්‍යා කතාවලට අනුව මුහුදේ අනතුරුවලට අධිපති ආදිකාලීන දෙවියෙකි. ගයියාගේ පුත්‍රයෙකි. කේටෝගේ ස්වාමියා සහ සොහොයුරා ය.

තම කුර වැසෙන සේ සපත්තු පැළඳ සිටියේය. ඒ සාමාන්‍යයෙන් නරාශ්වයින් මනුෂ්‍යයන් හා මිශ්‍ර වන ආකාරයයි. ඔහුගේ අං බේස්බෝල් තොප්පියෙන් වැසී තිබිණි. මිත්‍රශීලී බව ඇඟවීමට කේට් වැඩිපුර සිනාසෙන තරමට, පර්සිට ඇය අප්‍රිය වුවත්, කෝච් හෙජ් සසල වූ බවක් නොපෙනුණි.

''සාමකාමී මෝරු?'' කෝච් අප්‍රසන්න ලෙස විමසුවේය.'' මොකක්ද ඒකට තර්කය.''

ෆ්‍රෑන්ක් ටැංකියට යාබඳව පිහිටුවා තිබූ ඵලයක කියැවූයේය. ''ලෝකයෙන් අල්ලා ගත් එකම තල්මස් මොරුන්,'' ඔහු සෙමින් පැවසුවේය. ''ඒක පුදුම වර්ගයක්.''

''ඔව්, ඒ වගේම මෙයාලා පොඩියි,'' කේට් පැවසුවේය. 'ඔයා දකින්න ඕනේ කැලේ ඉන්න මගේ අනෙක් පැටවු.''

''ඔයාගේ පැටවු?'' ෆ්‍රෑන්ක් විමසුවේය.

කේට්ගේ පැටවුන් හමුවීමේ වුවමනාවක් නොමැති බව පර්සිට දැනිණි. මාතෘකාවට එළඹීමට කාලය පැමිණ ඇති බව ඔහු තීරණය කළේය. මීටත් වඩා එපිටට මේ මින් මැදුර තුළ තවත් දුර ගමන් කිරීමට ඔහුට අවශ්‍ය නොවීය.

''ඉතිං, කේට්.'' ඔහු පැවසුවේය. ''අපි මේ හාදයෙක්ව හොයනවා. මම අදහස් කළේ දෙවියෙක්ව, නම පෝසයිස්. ඔයා එයාව දන්නවද?''

කේට් ගෙරවූයේය. ''එයාව දන්නවද? එයා මගේ සහෝදරයා. එහෙට තමයි අපි යන්නේ, මෝඩයිනේ. නියම ප්‍රදර්ශන භාණ්ඩ තියෙන්නේ එතනයි.''

ඇය ඈතින් පෙනෙන බිත්තිය දෙස බැලුවාය. කළු පැහැති ඝන බිත්තිය රැළි නැංවී තවත් උමඟකට විවෘත විය. ඉන් එපිට දිස්වූයේ දීප්තිමත් දම් පැහැති ටැංකියකි.

කේට් ඇතුළට ගැටුවාය. පර්සිට වුවමනා අවසන් දෙය වූයේ ඇය පසුපස යාමයි. එහෙත් පෝසයිස් සැබැවින්ම සිටින්නේ අනෙක් පැත්තේ නම් සහ ඔවුන්ගේ ගවේෂණයට උපකාරී වන තොරතුරු සැබැවින්ම ඔහු සතුව පවතින්නේ නම්... දිගු හුස්මක් ගත් පර්සි තම මිතුරියන් සමඟ උමඟට ඇතුළු විය.

ඔවුන් ඇතුළු වූ සැනින්ම කෝච් හෙජ් විසිල් කළේය. ''දැන් නම් ඒක සිත් ඇදගන්නා සුලුයි.''

කසල බඳුන් තරම් විශාල වූ, විවිධ වර්ණවලින් යුත් ජල්ලි මසුන් ඔවුන්ට ඉහළින් පාවෙමින් සිටියහ. එක් එක් ජල්ලි මසකුගේ සිරුරේ සේද රැහැන් මෙන් කශිකා සිය ගණනක් විහිදී තිබිණි. එක් ජල්ලි මසකුගේ කශිකා ග්‍රහණය අතර වූයේ අඩපණ වූ අඩි දහයක් පමණ දිග අසිපත් මසෙකි. ජල්ලි මත්ස්‍යයා ක්‍රමයෙන් උගේ අඩු සිර කරමින් සිටියේය.

කේට් කෝච් හෙජ් දෙස දැඩි බැල්මක් හෙලුවාය. ''ඔයා දැක්කද? තල්මස් මොරු ගැන අමතක කරන්න. මෙහෙ ඊට වඩා ඉන්නවා.

කේට් ඔවුන්ට ඊටත් වඩා විශාල කුටියකට කැඳවාගෙන ගියාය. එතුළ ද තවත් බොහෝ මත්ස්‍ය ටැංකි පිහිටා තිබුණි. *''ගැඹුරු මුහුදේ මරණය- අනුග්‍රහය රාක්ෂ ඩෝනට් විසිනි.''* යනුවෙන් එහි එක් බිත්තියක දිලිසෙන රතු පැහැයෙන් සටහන් කර තිබිණි. තම පාඨන විකලතාව නිසා පර්සිට එය දෙවරක් කියවීමට සිදු විය. එසේම පණිවුඩය හරිහැටි තේරුම් ගැනීමට එය තවත් දෙවතාවක් කියවීමට සිදුවිය. ''රාක්ෂ ඩෝනට්?''

''අහ්, ඔව්.'' කේට් පැවසුවේය. ''අපේ සහයෝගී අනුග්‍රාහකයන්ගෙන් කෙනෙක්.''

පර්සිගේ උගුර වියැලිණි. රාක්ෂ ඩෝනට් සමඟ ඔහුගේ අවසන් අත්දැකීම එතරම් ප්‍රසන්න වූවක් නොවීය. ඌට අම්ල විදිය හැකි සර්ප හිස් පිහිටා තිබූ අතර කාලතුවක්කුවක් සේ ප්‍රහාරාත්මක විය. එක් මින් මැදුරක හිපෝකැම්පියන්[1] අරමුණකින් තොරව පාවෙමින් සිටියහ. පර්සි වනයේදී හිපෝකැම්පියන් බොහෝ ගණනක් දැක තිබිණි. ඔහු කීපදෙනෙකු නිදහස් කර පවා තිබුණත්, මින් මැදුරක් තුළ ඔහු කෙදිනකවත් ඔවුන්ව දැක තිබුණේ නැත. ඔහු ඔවුන් සමඟ කතා කිරීමට උත්සාහ කළත්, ඔවුහු ඔහේ පාවෙමින් සිටියහ. කලාතුරකින් එකකු විත් වීදුරුවේ හැප්පුණේය. ඔවුන්ගේ සිහිය විකල් වී ඇති බව පෙනිණි.

''මේක හරියි කියන්න බැහැ,'' පර්සි පැවසුවේය.

1 ඉනෙන් ඉහළ කොටස අශ්වයකු ලෙසද, ඉනෙන් පහළ කොටස රිදී පැහැති මාළුවකු ලෙසද සිටින සත්ත්ව විශේෂයකි. මොවුන් දිලිසෙන කොරපොතු සහ දේදුණු වලිග වරල් සහිතය. පොසිඩන්ගේ රථය ඇදගෙන යාම සඳහා මොවුන් යොදා ගැනිණි. මොවුන්ගේ චලනයෙන් මුහුදේ පෙණ නිර්මාණය වෙතැයි පැවසෙයි.

ඔහු ආපසු හැරෙන විට දුටුවේ ඊටත් වඩා නරක දෙයකි. කුඩා ටැංකියක පතුලේ, නෙරිඩ්ලා[1] දෙදෙනෙක් එකිනෙකාට මුහුණලා එරමිණියා ගොතා ගෙන ගෝ ෆිෂ් ක්‍රීඩාව කරමින් සිටියහ. ඔවුන්ගේ පෙනුම පුදුම සහගත ලෙස අප්‍රසන්න විය. ඔවුන්ගේ කොළ පැහැති දිගු කෙස් මුහුණ වටා ඔහේ පාවෙමින් තිබිණි. දෑස අඩවන්ව තිබිණි.

අධික කෝපය හේතුවෙන් පර්සිට හුස්ම ගැනීම පවා අසීරු විය. ඔහු කේට් දෙස බැලුවේය. ''ඔයා කොහොමද එයාලව මෙතන තියාගෙන ඉන්නේ?''

''මම දන්නවා,'' කේට් සුසුමක් හෙලුවාය. ''එයාලා එච්චර සිත් ගන්නා සුළු නැහැ. අපි එයාලට යම් උපක්‍රම උගන්වන්න උත්සාහ කළා. ඒත් කියන්න කණගාටුයි, ඒකට වාසනාවක් නැහැ. මම හිතන්නේ අතන තියෙන වැංකියට ඔයා ඊට වඩා කැමති වෙයි.''

පර්සි විරෝධය පෑමට සූදානම් වුවත්, කේට් එදෙසට ගමන් කරමින් සිටියාය.

''එළුවන්ගේ ශුද්ධ වූ මාතාවනි!''කෝච් හෙජ් කෑ ගැසුවේය. ''මේ සුන්දරියෝ දිහා බලන්න.''

ඔහු බලා සිටියේ මුහුදු සර්පයෝ දෙදෙනකු දෙසය. අඩි තිහක් පමණ දිගින් යුක්ත වූ ඔවුන්ගේ කොරපොතු දීප්තිමත් නිල් පැහැති විය. ඔවුන්ගේ හණු තල්මස් මෝරකුගෙන් අඩක් කා දැමීමට තරම් විශාල විය. තවත් ටැංකියක වූ සිමෙන්තියෙන් කළ ගුහාවකින් රෝද දහ අටේ රථයක් තරම් විශාල දැල්ලෙක් පිටතට නික්මිණි. උගේ හොටය යෝධ ඇණ කපන යන්ත්‍රයකට සමාන විය.

තුන්වන ටැංකියේ වූයේ මනුෂ්‍යයන් වැනි සත්ත්වයින් දුසිම් ගණනකි. සීල් මසුන්ගේ මෙන් සුමුදු සමකින් යුත් ඔවුන්ගේ මුහුණ සුනඛයන් මෙන් ද අත් මිනිසුන්ගේ මෙන් විය. ටැංකිය පතුලේ වූ වැල්ල මත හිඳගෙන ලෙගෝ වලින් යම් යම් දෑ තනමින් සිටියත්, ඔවුන් ද නෙරිඩ්ලා මෙන් අසිහියෙන් සිටින බව පෙනිණි.

''එයාලා?'' පර්සි ප්‍රශ්නය ගලපා ගැනීමට උත්සාහ කළේය.

''ටෙල්ක්හයින්ස්ල[2]?'' කේට් පැවසුවේය. ''ඔව්, ටැංකියක රඳවා ඉන්න එකම පිරිස.''

1 මුහුදු ආත්මයන් ය. නාවුකයන්ගේ සහ ධීවරයන්ගේ ආරක්ෂකයින් ලෙස සැලකෙයි.

2 අභිරහස් මුහුදු රාක්ෂයන් පිරිසකි. එසේම කම්මල්කරුවන් ය. කාඕස් සහ රෝඩ්ස් යනදූපත්වල ජීවත් වේ. තලාසා සහ පොන්ටොස්ගේ දරුවන් ය. අත්

''ඒත් අන්තිම යුද්දෙදි ක්‍රෝනොස්[1] වෙනුවෙන් එයාලා සටන් කළා!'' පර්සි පැවසුවේය. ''එයාලා භයානකයි.''

කේට් දෑස් නැටවූවාය. හොඳයි, අපිට ඒකට ''ගැඹුරු මුහුදේ මරණය'' කියලා කියන්න බැහැනේ මේ ප්‍රදර්ශන භාණ්ඩ භයානක නැත්නම්. කරදර වෙන්න එපා. අපි එයාලව බොහෝම සන්සුන්ව තියාගෙන ඉන්නේ.''

''සන්සුන්ව?'' ෆ්‍රෑන්ක් විමසුවේය. ''ඒක නීත්‍යානුකූලද?''

කේට් එය නෑසුණ බවක් පෙන්නුවාය. ඇය අනෙක් ප්‍රදර්ශන භාණ්ඩ පෙන්වමින් ඉදිරියට ඇදුණාය. පර්සි ආපසු හැරී ටෙල්ක් හයින්ස්ලා දෙස බැලුවේය. එකකු නිසැකවම කුඩා වියේ එකෙකි. ඔහු ලෙගෝ වලින් කඩුවක් තැනීමට උත්සාහ දැමින් සිටියත්, එම කැබලි එකට සවි කිරීමට නොහැකි තරමට ඔහු දුර්වල බව පෙනිණි. පර්සි කිසිවිටෙක මුහුදු රාක්ෂයන් ප්‍රිය නොකළ නමුත් මේ මොහොතේ ඔහුට ඔවුන් පිළිබඳ ඇති වූයේ කනගාටුවකි.

''ඒ වගේම මේ මුහුදු රාක්ෂයන්ට.'' කේට් ඉදිරියට අවධානය යොමු කළාය, ගැඹුරු සාගරයේදී අඩි පන්සීයක් දිගට වැඩෙන්න පුළුවන් එයාලට දත් දාහකට වඩා තියෙනවා. ඒ වගේම මේක? එයාලගේ ප්‍රියතම ආහාරය තමයි උපදෙවිවරු.''

''උපදෙවිවරු?'' ෆ්‍රෑන්ක් බියෙන් විමසුවේය.

''ඒත් එයාලා තල්මස්සු හෝ කුඩා බෝට්ටු එහෙමත් කනවා.'' කේට් පර්සි දෙසට හැරුණාය. ''සමාවෙන්න... මමත් ඒ වගේ රාක්ෂයෙක් මෝඩයෝ! හෙසිඩන්ගේ පුත්‍රයා වූ ඔබ මේ හැම දෙයක්ම දන්න බව මට විශ්වාසයි.''

අනතුරු හැඟවීමේ සීනු හඬ වැනි හඬකින් පර්සිගේ දෙසවන් පිරී ගියේය. කේට් ඔහු ගැන දැන සිටි තරම ඔහුගේ නොසතුටට හේතු විය.

''ඔයා කවුද?'' ඔහු දැඩි හඬින් විමසුවේය. ''කේට් මොනවාහරි දේකට ලෑස්ති වෙන්න ද හදන්නේ?''

---

වෙනුවට ඔවුන්ට ඇත්තේ අවල් ය. සුනඛ හිස් සහිතය. මත්ස්‍ය දරුවන් ලෙසද හඳුන්වයි.

1 කෘෂිකර්මාන්තයට අධිපති ග්‍රීක දෙවියන් වේ. ගයියාගේ සහ යුරේනස්ගේ පුත්‍රයාය. සියුස්ගේ පියා ය. රෝම ස්වරූපය සැටර්න් ය.

''කේට්?'' ඇය මොහොතක් වික්ෂිප්ත වූ බවක් පෙන්වූවාය. ඉන්පසු ඇය ඇගේ නම සඳහන් පුවරුව දෙස බැලුවාය. ''ආහ්...'' ඇය සිනාසුණාය. ''නෑ ඒක -''

''හලෝ,'' මින් මැදුර තුළින් අලුත් හඬක් ගුගුරා හැලුණේය.

කුඩා මිනිසෙක් අඳුර තුළින් මැතට ගැටුවේය. කකුළුවකුගේ වැනි බකල් පාද හේතුවෙන් ඔහු ඇවිද්දේ දෙපසට වැනෙමිනි. ඔහුගේ කොන්ද වකුටු වී තිබිණි. අදිසි එලකයක් ඔසවා සිටින්නාක් මෙන් ඔහු දෑත් දෙපසින් ඉහළට එසවී තිබිණි.

ඔහු හැඳ සිටි තෙත් ඇඳුමේ කොළ පැහැති බියකරු පැල්ලම් කීපයක් විය. එහි පැත්තක දිලිසෙන රිදී පැහැයෙන් PORKY'S FOLLIES යනුවෙන් සටහන් කර තිබිණි. හිසේ පළඳින මයික්‍රෝෆෝනයක් ඔහුගේ හිස කෙස් මත රැඳී තිබිණි. ඔහුගේ දෑස් නිල් පැහැති වූ අතර ඇසක් අනෙකට ඉහළින් පිහිටා තිබුණේය. සිනාසෙමින් සිටියත් ඔහු එතරම් මිත්‍රශීලී අයකු නොවන බව පෙනී ගියේය.

''අමුත්තෝ!'' මිනිසා පැවසුවේය. එම වදන මයික්‍රොෆෝනය තුළින් ගිගුම් දුන්නේය. ඔහුට තිබුණේ **DJ** හඬකි. එය ගැඹුරු සහ අනුනාදී ස්වරයකින් යුක්ත විය. එසේම ඒ හඬ ඔහුගේ පෙනුමට කිසිසේත්ම නොගැලපිණි. ''පෝසයිස්ගේ විනෝදයට සාදරයෙන් පිළිගන්නවා!''

ඔවුන්ගේ අවධානය පිපිරුමක් දෙසට යොමු කිරීමට මෙන් ඔහු තම අත් එක් දිශාවකට වැනුවේය. කිසිවක් සිදු නොවිණි.

''ශාප වේවා!'' මිනිසා ගිගිරුවේය. ''ටෙල්ක්හයින්ස්, ඒ ඔබේ ඉඟියයි! මම අත වනනකොට ඔබලා ටැංකිය ඇතුළේ පැන ගොස් දෙපාරක් කැරකිලා, පතුලේ පිරිමීඩයක් හදන්න ඕනේ. අපි ඒක පුහුණු වුණා.''

මුහුදු රාක්ෂයෝ ඔහුට අවධානය යොමු කරන බවක් නොපෙනුණි.

කකුළු මිනිසා දෙසට නැඹුරු වූ කෝච් හෙජ් ඔහුගේ දිලිසෙන තෙත් ඇඳුම ඉව කළේය. ''අපූරු ඇඳුමක්.''

ඔහුගේ ස්වරූපයෙන් ඔහු විහිලුවක් කළ බවක් නොපෙනුණී. සැබැවින්ම නරාශ්වයා හැඳ සිටියේද ක්‍රීඩාගාර ඇඳුමකි. ඒ විනෝදයටය. ''ස්තූතියි!'' මිනිසා පැවසුවේය. ''මම තමයි පෝසයිස්.''

ෆ්‍රැන්ක් දෙපාවලට බර දුන්නේය. ''ඇයි ඔයාගේ ඇඳුමේ *මසින් පිරුණු* කියලා ගහලා තියෙන්නේ?''

පෝසයිස් ගෙරවූයේය. ''මෝඩ නිල ඇඳුම් කම්හල! උන්ට කිසිදෙයක් හරියට කරන්න බැහැ.''

කේට් ඇගේ නම සඳහන් කළ පුවරුවට තට්ටු කළාය. ''මම එයාලට කිව්වා මගේ නම කේටෝ[1] කියලා. එයාලා කේට් කියලා වැරදි විදිහට උච්ජාරණය කළේ. මගේ සහෝදරයා... හොඳයි, දැන් එයා මසින් පිරුණු කෙනෙක්.''

''මම එහෙම නෑ.'' මිනිසා ගිගිරුවේය. ''මම පොඩ්ඩක්වත් මසින් පිරුණු කෙනෙක් නෙමෙයි. අනික ඒක විනෝදය කියන නමත් එක්ක ගැලපෙන්නේ නෑ. Porky's Follies කියන්නේ මොන විදිහේ සංදර්ශනයක්ද? ඒත් මිනිස්සුන්ට අපි ගැන මැසිවිලි නගන්න වුවමනා නැහැ. බලන්න, මාරක යෝධ දැල්ලන්ගේ පුදුම සහගත මහේශාක්‍ය බව.''

ක්‍රමයෙන් ඔහුගේ බැල්ම දැල්ලන්ගේ ටැංකිය වෙතට යොමු විය. මේ වතාවේ දැන්වීම් පුවරුවට දකුණු පැත්තේ වීදුරුව ඉදිරියෙන් ගිනි දළු නික්මිණි. ශබ්ද විකාශන තුළින් නැගුණු සංගීත හඬ මහේශාඛ්‍ය බවක් විදහා පෑවේය.

දැල්ලා නැවත උගේ ගුහාව තුළට ඇදී ගොස් තිබිණි.

''ශාප වේවා!'' පෝසයිස් නැවත කෑ ගැසුවේය. ඔහු තම සොයුරිය දෙසට ගෑටුවේය. ''කේටෝ, දැල්ලව පුහුණු කරන එක ඔයාට අයිති වැඩක්. මම කිව්වේ විජ්ජාව ගැන. සමහරවිට අවසානයෙදී ටිකක් මස් ඉරා දාන්න වෙයි. ඒක ඕනෙවටත් වඩා කියන්න ඕනේද?''

''එයා කුලෑටියි.'' කේටෝ ආරක්ෂිතව පැවසුවාය. ''අනිත් එක, එයාගේ එක් එක් ග්‍රාහිකා වල තියෙන රේසර් වගේ අංකුර හැම එකක්ම දවස ගානේ මුවහත් කරන්න ඕනේ.'' ඇය ෆ්‍රැන්ක් දෙසට හැරුණාය. ''ඔයා දන්නවානේ, උපදෙවියෙක්ව සම්පූර්ණයෙන්ම කාල දාන්න පුළුවන් එකම සත්ත්වයා වෙන්නේ රාක්ෂ දැල්ලා බව. කිසිම අජීර්ණයක් නැතුව සන්නාහය ඇතුළු හැම දෙයක්ම ගිල දාන්න පුළුවන්. ඒක ඇත්තක්.''

1 මුහුදු රාක්ෂයන්ටත්, තල්මසුන් හා මෝරුන් වැනි විශාල මුහුදු සත්ත්වයින්ටත් අධිපති දෙවඟන ය. ඇය ගයියාගේ දියණිය වන අතර පෝසයිස්ගේ සොයුරිය හා බිරිඳ වේ.

ෆ්‍රෑන්ක් ඇය වෙතින් ඉවතට ගැටුවේය.

''කේටෝ'' පෝකි කෑ ගැසුවේය. ඔහු කකුළු අඩුවක් මෙන් විටින් විට ඔහුගේ ඇඟිලි වලින් මාපට ඇඟිල්ලට තට්ටු කළේය. ''ඔයාගේ ඔය ඕනෑවට වැඩි විස්තර, අපේ අමුත්තන්ට කරච්චලයක් වෙයි. අඩු දැනුම, වැඩි විනෝදය! අපි ඒ ගැන කතාවෙලා තියෙනවා.''

''ඒත්.''

''ඒත් මේත් ඕනේ නෑ! අපි මෙතන ඉන්නේ *ගැඹුරු මුහුදේ මරණය* ඉදිරිපත් කරන්න. රාක්‍ෂ ඩෝනට්ගේ අනුග්‍රහයෙන්.''

අවසන් වදන් කාමරය පුරා ගිගුම් දුන්නේ අමතර දෝංකාරයක්ද සමගිනි. විදුලි පහන් නිවී දැල්විණි. පොළොවෙන් දුමාරයක් නිකුත් විය. ඩෝනට් හැඩයේ ඒ දුම් වළලු, සැබෑ ඩෝනට්වල සුවඳින් යුක්ත විය.

''ඔයා මුහුදු දෙවියා නේද?'' පර්සි විමසුවේය. ''ගයියාගේ පුත්‍රයා?''

මිනිසා සුසුමක් හෙලුවේය. ''අවුරුදු පන්දාහක් වුණා. තවමත් මාව දන්නේ ගයියාගේ පොඩි කොලුවා විදිහට. මම දැනට ඉන්න පැරණිම මුහුදු දෙවියන්ගෙන් කෙනෙක් කියන එක අමතක කරලා. සැඟවුණු ගැඹුරේ දෙවියා මමයි! ජලයේ භීෂණයේ නායකයා! දහසක් රාක්‍ෂයන්ගේ පියා! ඒත් නෑ... කවුරුවත් මාව දන්නෙවත් නැහැ. ටයිටන්ලට එයාලගේ යුද්ධයේදී උදව් කරල මම පොඩි වැරැද්දක් කළා. මාව සාගරයෙන් ඇට්ලැන්ටාවලට පිටුවහල් කළා.''

''අපි හිතුවේ ඔලිම්පියන්ස්ලා අත්ලාන්තික් කියලා කියපු බවයි.'' කේටෝ පැහැදිලි කළාය. ''එයාලගේ විහිලු අදහසක්, මම හිතන්නේ, ඒ වෙනුවට අපිව මෙහෙ එව්වා කියලයි.''

පර්සි තම දෑස් පටු කළේය. ''එතකොට ඔයා දෙවඟනක්ද?''

''ඔව් කේටෝ!'' ඇය සතුටින් සිනාසුණාය. ''මුහුදු රාක්‍ෂයන්ගේ මව! තල්මසුන්, මොරුන්, දැල්ලන් සහ අනෙක් මුහුදු ජීවීන්ට, ඒත් මම හැමවෙලාවෙම හදවතින්ම අයිති රාක්‍ෂයන්ට. ඔයාලා දන්නවද මුහුදු සර්පයන්ට එයාලගේ ගොදුරෙ මස් වමාරලා ඒ ආහාරයම අවුරුදු හයක් යනකම් තියාගන්න පුළුවන් බව? ඒක ඇත්ත.''

ෆ්‍රෑන්ක්ගේ බඩ දඟලන්නට විය.

කෝච් හෙජ් විසිල් හඬක් නැගුවේය. ''අවුරුදු හයක්? ඒක හරිම අපූරුයිනේ.''

''මම දන්නවා.'' කේටෝ පැවසුවාය.

''ඒ වගේම, ඇත්තටම කොහොමද මාරක දැල්ලා උගේ ගොදුර ඉරා දාන්නේ?'' හෙජ් විමසුවවේය. ''මම ස්වභාවධර්මයට කැමතියි.''

''ආහ්, හොඳයි.''

''නවත්තගන්න,''පෝසයිස් විරෝධය පෑවේය. ''ඔයා සංදර්ශනය පවත්වමින් ඉන්නේ. දැන්, අපේ නෙරිඩ් රණ ශූරයන්ගේ මාරාන්තික සටනේ සාක්ෂිකාරයෝ වෙන්න.''

වීදුරු ඩිස්කෝ බෝලයක් නෙරිඩ්ලා සිටි ටැංකියට පහත් විය. ජල තරංග විවිධ වර්ණයන්ගෙන් ආලෝකමත් විය. පහතට වැටුණු කඩු දෙකක්, පතුලේ එරී ගියේය. ඒවා ගැන තැකීමක් නොකළ නෙරිඩ්ලා දිගටම ඔවුන්ගේ ක්‍රීඩාවේ නිරත වූහ.

''ශාප වේවා!'' පෝසයිස් කෝපයෙන් තම පාද පසෙකට ගත්තේය. කේටෝ මුහුණ පුළුටු කරගෙන කෝච් හෙජ් දෙස බැලුවාය.

''එයාව ගණන් ගන්න එපා. මාත් එක්ක එන්න. මගේ අපූරු නරාශ්වයෝ, මම ඔයාට පෙන්වන්නම් රාක්ෂයන්ගේ දඩයම් පුරුදු ගැන වර්ණවත් සටහනක්.''

''නියමයි!''

පර්සි විරෝධය පෑමටත් පෙර, කේටෝ කෝච් හෙජ් සමඟ මින් මැදුරේ වීදුරු වංකගිරිය තුළ නොපෙනී ගියාය. ඔහු සහ ෆ්‍රෑන්ක් පමණක් කකුළු මුහුදු දෙවියා සමඟ ඉතිරි විය.

දහදිය බිඳු පර්සිගේ ගෙල දෙපසින් ගලා ගියේය.

ඔහු ෆ්‍රෑන්ක් වෙත බියපත් බැල්මක් හෙලුවේය. මෙය බෙදුණු- ජයග්‍රාහී උපක්‍රමයක් ලෙස හැඟී ගියේය. සටන හොඳ අවසානයකට ගෙන ඒමට වෙනත් මාර්ගයක් ඔහුට නොපෙනුණි. ඔහුගේ එක් කොටසකින් දැන් පෝසයිස්ට පහර දිය යුතු බව පැවසූවත්, තවමත් ඔවුන්ට ප්‍රයෝජනවත් තොරතුරු කිසිවක් සොයා ගැනීමට නොහැකි වී තිබිණි. කෝච් හෙජ්ව නැවත සොයාගැනීමට හැකි වේදැයි යන්න ගැන පර්සිට විශ්වාසයක් නොතිබිණි. ඔහුට පිටවීම පවා සොයාගත හැකි වේදැයි යන්න ගැන පර්සිට වූයේ දෙගිඩියාවකි.

පෝසයිස්ට ඔහුගේ හැඟීම් වටහා ගත හැකි වූ බව පෙනිණි. ''ආහ්! ඒක හොඳින් වෙයි!'' දෙවියා ඔහුට සහතික විය. ''කේටෝ තරමක

කරච්චලයක් බව ඇත්ත. ඒත් එයා ඔයාලගේ යාලුව හොඳින් බලාග නී. ඒ වගේම මේ සංචාරයේ හොඳම හරිය තියෙන්නේ ඉස්සරහට.''

පර්සි සිනීමට උත්සාහ කළත්, එය ඔහුට හිසරදය ඇති කරවන්නක් විය. ඒ පෙරදින හිසේ සිදුවූ තුවාලය නිසාද පෝසයිස්ගේ විශේෂ ප්‍රයෝගයක් නිසාද හෝ මුහුදු රාක්ෂයන් ගැන කේටෝ පැවසූ අප්‍රසන්න දෑ නිසාද යන්න පිළිබඳ ඔහුට සිතාගත නොහැකි විය. ''ඉතිං...'' ඔහු කතාවට මුල පිරුවේය.

''ඩයෝනීසස් තමයි අපිව මෙහෙට එව්වේ.''

''බැචස්,'' ෆ්‍රෑන්ක් ඔහුව නිවැරදි කළේය.

''හරි.'' පර්සි තම කෝපය සඟවා ගැනීමට උත්සාහ කළේය.

ඔහුට දෙවිවරුන්ගේ එක නමකට වඩා මතක තබා ගැනීම අපහසු විය. ''වයින් දෙවියා. මොකෙක් හරි.'' ඔහු පෝසයිස් දෙස බැලුවේය. ''ඔයාගේ අම්මා ගයියා සහ මේ ඔයාගේ නිවුන් සහෝදරයෝ- එපියාල්ටිස් සහ ඔටිස්- මොනවද කරන්න හදන්නේ කියලා ඔයා දන්නා ඇති කියලයි බැචස් කිව්වේ. ඒ වගේම ඇතීනාගේ සලකුණ ගැනත් ඔයා මොනවා හරි දන්නවා නම් -''

''බැචස් හිතුවේ මම ඔයාලට උදව් කරයි කියලද?'' පෝසයිස් විමසුවේය.

''ඔව්.'' පර්සි පැවසුවේය. ''මම අදහස් කළේ, ඔයා ගැනයි පෝසයිස්. හැමෝම ඔයා ගැන කතා කරනවා.''

නොගැලපෙන දෑස් එකපෙළට සිටින සේ පෝසයිස් තම හිස ඇල කළේය. ''එයාලා එහෙම කරනවද?''

''ඇත්ත වශයෙන්ම, එහෙම නේද, ෆ්‍රෑන්ක්?''

''ආහ්... සත්තකින්ම!'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''හැම වෙලාවකම මිනිස්සු ඔයා ගැන කතා කරනවා.''

''මොනවද එයාලා කියන්නේ?'' දෙවියා විමසුවේය.

ෆ්‍රෑන්ක් අපහසුවෙන් වටපිට බැලුවේය. ''ඔයාගේ ගිනිකෙළි තැනීමේ හැකියාව, හොඳ හඬ, වගේම ඩිස්කෝ බෝල ගැන.''

''ඒක ඇත්ත!'' පෝසයිස් තම ඇඟිලි එකිනෙක ඇතිල්ලුවේය.

''ලෝකයේ අල්ලා ගත් මුහුදු රාක්ෂයන්ගේ ලොකුම එකතුව තියෙන්නෙත් මටයි!''

''ඒ වගේම ඔයා යමක් දන්නවා,'' පර්සි පැවසුවේය. ''නිවුන් සහෝදරයෝ ගැන සහ එයාලා කරන්න හදන දේ ගැන.''

''නිවුන්නෝ!'' පෝසයිස්ගේ හඬ දෝංකාර දුන්නේය. ''ඔව්, එපියාල්ටිස් සහ ඔටිස් ගැන හැම දෙයක්ම මම දන්නවා. උන් වැඩකට නැති එවුන්! උන්ව කවදාවත් අනෙක් යෝධයන්ට සමාන කරන්න බැහැ. බොහෝම දුර්වලයි. ඒ වගේම අර කකුලට දාන සර්පයෝ.''

''කකුලට දාන සර්පයෝ?'' ඔවුන් පැළඳ සිටියේ දිගු, වක් වූ පාවහන් බව තමා සිහිනයේදී දුටු අයුරු පර්සිගේ මතකයට නැගිණි.

''ඔව්, ඔව්, පෝසයිස් නොඉවසිලිමත්ව පැවසුවේය. ''එයාලගේ ශක්තියෙන් වැඩක් කරන්න බැරිබව එයාලා දන්නවා. ඉතිං එයාලා තීරණය කළා නාට්‍යයක් පෙන්වන්න. දෘෂ්ටි මායාවල්, වේදිකා උපක්‍රම වගේ දේවල්. ඔයා දන්නවනේ ගයියා එයාගේ යෝධ දරුවන්ව හැඩ ගස්වන්නේ ඇයගේ මනසේ ඉන්න විශේෂිත සතුරන් ආකාරයටයි. එක් යෝධයෙකු උපදින්නේ නිශ්චිත දෙවියෙක් මරා දැමීම සඳහා. එපියාල්ටිස් සහ ඔටිස්... හොඳයි දෙන්නා එකට ගත්තාම එයාලා ඩියෝනීසස් විරෝධියො.''

පර්සි ඒ අදහස හිතේ ධාරණය කර ගැනීමට උත්සාහ කළේය. ''ඉතිං... එයාලට ඕනේ කරලා තියෙන්නේ වයින් සේරම ඉවත් කරලා ඒ වෙනුවට ක්‍රැන්බෙරි යුෂ හරි මොනවහරි ගේන්නද?''

මුහුදු දෙවියා ගෙරවූයේය. ''එහෙම දෙයක් නෙමෙයි! එපියාල්ටිස්ට සහ ඔටිස්ට හැමවෙලාවෙම ඕනේ වුණේ දෙයක් වඩා හොඳින්, වඩා විශේෂිත ආකාරයට කරන්න. ඇත්ත වශයෙන්ම එයාලට ඕනේ වුණේ ඩියෝනීසස්ව මරන්න. ඒත් මුළින්ම එයාලට ඕනේ වුණේ ඔහුගේ උත්සව නීරස වෙන්න සලස්වලා එයාට අවමන් කරන්නයි.''

ෆ්‍රෑන්ක් ගිනිකෙළි දෙස බැලුවේය. ''ගිනිකෙළි සහ ඩිස්කෝ බෝල වගේ ඒවා යොදාගෙන?''

පෝසයිස්ට පුළුල් සිනාවක් නැගිණි.

''නිසැකවම!'' එයාලා දැනගන්න ඕනේ හැම දෙයක්ම මම නිවුන්නන්ට ඉගැන්නුවා. එහෙම නැත්නම් අඩුගානේ ඒකට උත්සාහ කළා. එයාලා කවදාවත් ඇහුම්කන් දුන්නේ නැහැ. එයාලගේ පළවෙනි ලොකුම ප්‍රයෝගය? එයාලා උත්සාහ කළා කඳු එක මත එක තියලා ඔලිම්පස් වලට ළඟා වෙන්න. ඒක දෘශ්‍ය මායාවක් විතරයි. මම උන්ට කිව්වා ඒක විහිළුවක් කියලා. මම කිව්වා.'' උඹලා පොඩි දේකින් පටන්

ගන්න ඕනේ.'' කියලා. ඒ කියන්නේ තොප්පියකින් හාවෙක් ගන්නවා වගේ පොඩි දේවල් වලින්. උන්ට ඕනේ වුණේ අර වගේ ඒවා.''

''හොඳ උපදේශයක්,'' පර්සි එකඟ විය. ''ඒ වගේම දූන් නිවුන්නෝ -''

''ආහ්, එයාලා රෝමයේ එයාලගේ ලෝක විනාශ දින සංදර්ශනය ලෑස්ති කරනවා,'' පෝසයිස් පැවසුවේය. ''ඒකත් අම්මාගෙ මෝඩ අදහස් වලින් එකක්. එයාලා එක සිරකරුවෙක්ව විශාල ලෝකඩ බඳුනක තියාගෙන ඉන්නවා.'' ඔහු ෆ්‍රෑන්ක් දෙසට හැරුණේය. ''ඔයා ඒරිස්ගේ පුත්‍රයා නේද? ඔයාට ඒ ගන්ධය දැනෙයි. වරක් උන් ඔයාගේ තාත්තවත් ඒ විදියටම සිර කරගෙන හිටියා.''

''මාර්ස්ගේ (අඟහරුගේ) පුත්‍රයා,'' ෆ්‍රෑන්ක් නිවැරදි කළේය. ''ටිකක් ඉන්න. මේ යෝධයො මගේ තාත්තවත් ලෝකඩ බඳුනක හිර කළාද?''

''ඔව්, තවත් තකතීරු වැඩක්,'' මුහුදු දෙවියා පැවසුවේය. ''ඔයාගේ හිරකාරයෙක් ලෝකඩ බඳුනක් ඇතුළේ නම්, එයා කොහොමද එයාව පෙන්නන්නේ? ඒකේ කිසිම විනෝදාත්මක වටිනාකමක් නැහැ. මගේ ආදරණීය ආදර්ශ වගේ නැහැ.''

පර්සි සිතීමට උත්සාහ කළේය. ''ඔයා කියන්නේ මේ... මේ ලෝක විනාශ දින සංදර්ශනය ගයියාගේ අදහසක් කියලද?''

''හොඳයි... අම්මගේ සැලසුම් නිරතම ස්ථර ගොඩකින් යුක්තයි.'' ඔහු සිනාසුණි. ''පෘථිවියටත් ස්ථර තියෙනවා! මම හිතන්නේ ඒකෙන් අදහසක් ලැබෙයි.''

''ආහ්, ඔව්.'' පර්සි පැවසුවේය. ''ඉතිං එයාගේ සැලසුම...'' ආහ්, එයාට යම් උපදෙවිවරු කණ්ඩායමක් ගැන සිත් වේදනාවක් ඇති වෙලා.'' පෝසයිස් පැවසුවේය.'' ඔවුන්ගෙන් කවුරු මැරෙනවද කියන එක ගැන ඇත්තටම එයාගේ තැකීමක් නැහැ. විශේෂයෙන්ම දෙන්නෙක්ව නොමරන්න ඕනේ කියලා ඇය හිතනවා. ඒ ඇයි කියන එක දන්නේ ටාටරස් විතරයි. කිසිම සැකයක් නැහැ, නිවුන්නෝ එයාගේ සංදර්ශනය පවත්වන්නේ මේ උප දෙවිවරු රෝමයට ගෙන්න ගන්න ඇමක් විදිහට. මම හිතනවා බඳුනේ ඉන්න සිරකරුවා එයාලගේ මිත්‍රයෙක් හෝ ඒ වගේ කෙනෙක් වෙන්න ඇති කියලා. ඒ හින්දා සමහරවිට ඔවුන් හිතනවා මේ උපදෙවිවරු කණ්ඩායම ඇතීනාගේ

සලකුණ හොයාගෙන එයාගේ බල ප්‍රදේශයට එයි කියලා.'' පෝසයිස් ෆ්‍රැන්ක්ගේ ඉලයට වැලමිටෙන් ඇන්නේය. ''ඒක වාසනාවක් නේද?''

ෆ්‍රැන්ක් අපහසුවෙන් සිනාසිණි. ''ඔව්. ඒක ඇත්තටම වැඩක් නැතිවෙයි මොකද...''

පෝසයිස් දෑස් පටු කළේය.

පර්සි සාක්කුවට තම අත දැමුවේය.

ඔවුන් තුළ පෙනෙන උදාරත්වය, පෝසයිස්ට ඔවුන් උපදෙවිවරුන් යැයි වටහා ගැනීමට ප්‍රමාණවත් විය.

එහෙත් පෝසයිස් නැවත ෆ්‍රැන්ක්ගේ ඉලයට වැලමිටෙන් ඇන්නේය. ''හා... හා... හොඳ එකා, අගහරුගේ පුත්‍රයා. ඔයා හරි ඇති කියලා මම හිතනවා. ඒ ගැන කතා කිරීමෙන් ඵලක් නැහැ. උප දෙවිවරුන්ට චාල්ස්ටන්වල සිතියම හමු වුණත්, එයාලට කවදාවත් පණපිටින් රෝමයට යන්න ලැබෙන්නේ නැහැ.''

''ඔව්, චාල්ස්ටන් සිතියම.'' ෆ්‍රැන්ක් හඬ නගා පවසමින් පර්සි දෙස බැලුවේ ඔහුට තොරතුරු මඟ නොහැරුණු බවට සැක හැර දැන ගැනීම සඳහාය. ''සාක්ෂි'' යනුවෙන් සටහන් කර තිබූ විශාල පුවරුව ඔහුගේ මතකයේ නොතිබුණා නම් නිසැකවම එය ඔහුගෙන් මඟ හැරීමට ඉඩ තිබිණි.

''ඒත් මේ නීරස අධ්‍යාපනික දේවල් දැන් ඇති.'' පෝසයිස් පැවසුවේය. ''ඔයාලා සලකන්නේ විශේෂිත අමුත්තෝ විදිහට. ඔයලා කරුණාකරලා මට සංචාරය අවසන් කරන්න ඉඩ දෙනවද? පිවිසීමේ ගාස්තුව ආපසු ගෙවන්නේ නෑ කියලා ඔයාලා දන්නවනේ?''

පර්සිට තවදුරටත් මින් මැදුර නැරඹීමේ වුවමනාවක් නොතිබිණි. එහෙත් පැරණි මුහුදු දෙවියාට අවනත වීමට තීරණය කරමින් ඔහු ෆ්‍රැන්ක් දෙස බැලුවේය. අඩුම වශයෙන් කෝච් හෙජ්ව සොයාගෙන, ආරක්ෂිතව පිටව යාම දක්වාවත් ඔහුට අවනත විය යුතු විය. අනෙක් අතට, පෝසයිස් වෙතින් ඔවුන්ට තවත් තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබිණි.

''ඊටපස්සේ,'' පර්සි පැවසුවේය. ''අපිට ප්‍රශ්න අහන්න පුළුවන්ද?''

''ඇත්තවශයෙන්ම! ඔයාලට දැනගන්න ඕනේ හැම දෙයක්ම මම කියන්නම්.'' පෝසයිස් දෙවරක් අත්පුඩි ගැසුවේය. දිලිසෙන රතු

සංඥා පුවරුව යටින් තිබූ බිත්තියෙන් අලුත් උමඟක් මතුවිය. එය තවමත් ටැංකියට යොමු වී තිබිණි.

''මේ මාර්ගයෙන් එන්න.'' පෝසයිස් උමඟ දෙසට ඇවිද ගියේය.

ෆ්‍රැන්ක් හිස සැලුවේය. 'අපි මේක කරන්න...?'' ඔහු පැති මාර්ගය දෙසට හැරුණේය.

''ඒක නිකම් කතා කරන්න ඕනාවට විතරයි, මිතිහෝ.'' පර්සි පැවසුවේය.

''එන්න.''

අතීතයේ සලකුණු

# 16
# පර්සි

කාය වර්ධනාගාරයක් තරම් විශාල ටැංකියක පොළොව මතින් උමඟ විහිදී තිබිණි. සමහර බාල සැරසිලි සහ ජලය හැරුණු විට, එය හිස්ව තිබෙන බව පෙනී ගියේය. තම හිස මත ජලය ගැලුම් පණස් දහසක්වත් ඇතැයි පර්සි අනුමාන කළේය. යම් හේතුවක් නිසා උමඟ බිඳී ගියොත්...

*ඒක එච්චර දෙයක් නෙමෙයි..* පර්සි සිතුවේය. *දහස් වාරයක් මම වතුරේ ඉඳලා තියෙනවා. මේ මගේ නිවාස බලකොටුව.*

එහෙත් ඔහුගේ හදවත ගැහෙමින් තිබිණි. සීත ඇලස්කාවේ වලක ගිලෙමින් සිටි අයුරු ඔහුගේ මතකයේ තිබිණි. කළු මඩ වලින් ඔහුගේ දෑස්, මුව හා නාසය වැසී තිබිණි.

උමඟේ මැද හරියේදී නතර වූ පෝසයිස් ආඩම්බරයෙන් තම දෑත් විදහාලීය. ''ලස්සන ප්‍රදර්ශනයක් නේද?''

එම විස්තරයට හිත යොමු කරමින් තම සිතේ වූ වියවුල් ස්වභාවය පලවා හැරීමට පර්සි උත්සාහ කළේය. ටැංකියේ කෙළවරක, ව්‍යාජ මුහුදු පැළෑටි වලින් යුතු වනාන්තරයක් විය. සැබෑ ප්‍රමාණයේ, ප්ලාස්ටික් වලින් නිර්මිත කුටියේ වූ දුම් කවුළුවෙන් දිය බුබුළු ඉහළ නැගිණි. එයට ප්‍රතිවිරුද්ධ පැත්තේ, පැරණි පන්නයේ කිමිදුම් ඇඳුමින් සැරසුණු හාදයකුගේ අනුරුවකි. ඔහු නිධන් පෙට්ටගමක් අසල දණ ගසා ගෙන සිටි අතර, සෑම තත්තපරයක් පාසා එම පෙට්ටගමේ පියන විවෘත වීම හා වැසීම සිදු විය. ධවල පැහැති කිරිගරුඬ පොළොව

පුරා වීදුරු බෝල සහ ආයුධ වැනි ත්‍රිශූල හා හෙලි විදින අවි විසිරී තිබිණි. ටැංකියේ දර්ශන බිත්තියට පිටතින් වූ ප්‍රේක්ෂකාගාරයේ සිය ගණනකට අසුන් පනවා තිබිණි.

''ඔයා මොනවද මෙහෙ තියාගෙන ඉන්නේ?'' ෆ්‍රැන්ක් විමසුවේය. ''යෝධ මාරක රන් මාලුවෙක් ද?''

පෝසයිස් තම දෙබැම එසැවීය. ''ආහ්, එහෙම වුණානම් හොඳයි! ඒත්, නෑ, ෆ්‍රැන්ක් ෂැංග්, පොසිඩන්ගෙන් පැවත එන්නා. මේ ටැංකිය රන් මාලුවන්ට නෙමෙයි.''

පොසිඩන්ගේ පැවත එන්නා කියූ තැනදී, ෆ්‍රැන්ක් හැකිළී ගියේය. පියවරක් පසුපසට වූ ඔහු, වැනීමට සූදානම් කළ මුගුරක් සේ තම පිටේ එල්ලගත් මල්ල තද කර ගත්තේය.

සෙම්ප්‍රතිශ්‍යා පැණියක් ගිලුණු කළෙක මෙන් පර්සිගේ උගුරට අමුතු හැඟීමක් දැනිණි. අවාසනාවකට ඒ ඔහුට දැනී තිබුණු හැඟීමක් විය.

'ඔයා කොහොමද ෆ්‍රැන්ක්ගේ අන්තිම නම දන්නේ? ඔහු විමසුවේය. ''එයා පොසිඩන්ගෙන් පැවත එන කෙනෙක් බව ඔයා කොහොමද දන්නේ?''

''හොඳයි...'' විනීත පෙනුමක් නගා ගැනීමට උත්සාහ දරමින් පෝසයිස් දෙවුර සැලුවේය. ''ඒ සමහර විට ගයියා දීපු විස්තර නිසා වෙන්න ඇති. ඔයා දන්නවනේ, පර්සි ජැක්සන්.''

පර්සි තම පෑන් කොපුව ගැලවූයේය. ක්ෂණිකව රිප්ටයිඩය ඔහුගේ අතට පැමිණියේය. ''මාව අන්දන්න හදන්න එපා, පෝසයිස්. උත්තර දෙන බවට ඔයා මට පොරොන්දු වුණා.''

''ඔව්, විශේෂ අමුත්තන්ගේ සත්කාරයෙන් පස්සේ,'' පෝසයිස් එකඟ වූයේය. ''ඔයාලා දැනගන්න ඕනේ හැමදෙයක්ම ඔයාලට කියන බව මම පොරොන්දු වුණා. කොහොම වුණත්, මේකයි කතන්දරේ, ඇත්තටම ඔයාලට හැම දෙයක්ම දැන ගන්න ඕනේ වෙන්නේ නෑ.'' ඔහුගේ අස්වාභාවික සිනහව තවත් පුළුල් විය. ''ඔයාලට රෝමයට යන්න ලැබුණත්, ටිකක් අවාසනාවන්ත විදිහට, ඔයාලට කවදාවත් දෙවියෝ ඔයාලගේ පැත්තට සටන් නොකර, මගේ යෝධ නිවුන් සහෝදරයන්ව පරාජය කරන්න ලැබෙන්නේ නැහැ. ඒ වගේම මොන දෙවියද ඔයාලට උදව් කරන්නේ? ඉතිං මගේ ළඟ ඊට වඩා හොඳ

සැලැස්මක් තියෙනවා. ඔයාලා මෙහෙන් යන්නේ නෑ. ඔයාලා විශේෂ අමුත්තෝ. ඉතා වැදගත් සිරකරුවෝ!''

පර්සිගේ හුස්ම සිරවිය. ෆ්‍රෑන්ක් තම ගමන් මල්ලෙන් පෝසයිස්ගේ හිසට දමා ගැසුවේය. පෝසයිස් ක්ෂණිකව අතුරුදහන් විය.

මින් මැදුරේ ශබ්ද විකාශන පද්ධතිය තුළින් දෙවියන්ගේ ගැඹුරු හඬ දෝංකාර දෙන්නට විය. ''ඔව්, හොඳයි! සටන් කිරීම හොඳයි! ඔයාල දන්නවද, ලොකු පැවරුම් වලදී අම්මා කවදාවත් මාව විශ්වාස කළේ නෑ, ඒත් මම අල්ල ගන්න ඕනෙම දෙයක් මට තියාගන්න පුළුවන් කියන එකට නම් එයත් එකඟ වෙනවා. ඔය දෙන්නා විශිෂ්ට ප්‍රදර්ශන භාණ්ඩ දෙකක් වෙයි. සිරකරන ලද, පොසිඩන්ගෙන් බිහිවූ එකම උප දෙවිවරු දෙදෙනා. ''උපදෙවි භීෂකයෝ'' ඔව්, මම එකට කැමතියි! අපිට දැනටමත් බාගේන් මාට් එකෙන් අනුග්‍රහකත්වය ලැබිල තියෙන්නේ. ඔය දෙන්නට හැමදාම උදේ එකොළහටයි, දවල් එකටයි සටන් කරන්න පුළුවන්. සවස දර්ශනය රෑ හතට.''

''උඹට පිස්සු!'' ෆ්‍රෑන්ක් කෑ ගැසුවේය.''

''ඔයාම අඩුවට විකිණෙන්න එපා!'' පෝසයිස් පැවසුවේය. ''ඔයා තමයි අපේ ලෝකුම ලොතරැයිය වෙන්නේ.''

ෆ්‍රෑන්ක් පිටවීමේ දොරටුව සොයා දිව යන්නට වූ නමුත් වීදුරු බිත්තියේ හැපීම හැර අන් දෙයක් සිදු නොවීය. පර්සි අනෙක් දිශාවට දිව ගියත්, ඒ ආකාරයෙන්ම ඒ පැත්ත ද අවහිර වී තිබිණි. ඔවුන්ගේ උමඟින් බුබුළු නැගෙන්නට පටන් ගත්තේය. ඔහු තම අත් වීදුරුවට තබා තද කළේය. එය මෘදු වී අයිස් මෙන් දියවන බව එවිට ඔහුට අවබෝධ විය. ඉක්මණින්ම එය බිඳ හෙලමින් ජලය කඩා වදිනු ඇත.

''අපිට එකතු වෙන්න ඕනේ නෑ, පෝසයිස්!'' ඔහු කෑ ගැසුවේය.

''ආහ්, මම ශුභවාදීව හිතනවා,'' මුහුදු දෙවියන්ගේ හඬ දෝංකාර දුන්නේය. ''මුලදී ඔයාලට එකිනෙකා සමඟ සටන් කරන්න ඕනේ වෙන එකක් නැහැ, ඒකට කමක් නෑ, මට පුළුවන් හැමදාම අලුත්ම මුහුදු රාක්ෂයෝ එවන්න. ඔයාලා මෙතන තියෙන කෑම ටික කාල දාලා ඉවර වුණාම, නියමෙට හීලෑවෙලා, උපදෙස් පිළිපදියි. මාව විශ්වාස කරන්න. ඔයාලා, ඔයාලගේ අලුත් නිවසට කැමති වෙයි.''

පර්සිගේ හිසට ඉහළින්, වීදුරු අර්ධ ගෝලය ඉරිතලා ගොස් ජලය කාන්දු වීමට පටන් ගත්තේය.

''මම පොසිඩන්ගේ පුත්‍රයා!'' පර්සි තම හඬෙහි වූ බිය සඟවා ගැනීමට උත්සාහ කළේය. ''උඹට මාව වතුරේ හිරකලා තියාගන්න බැහැ. මම ප්‍රබලම තැන තමයි ජලය.''

පෝසයිස්ගේ සිනහව ඔවුන් වටා සෑම අතෙකින්ම නැගී එන්නා සේ පෙනිණි. ''මොනතරම් අහම්බයක්ද! මමත් ප්‍රබලම එතැනදියි. මේ ටැංකිය උප දෙවිවරුන් සඳහා විශේෂයෙන්ම හදපු එකක්. දූන්, ඔය දෙන්නම විනෝද වෙන්න. කෑම වෙලාවෙදී මම ඔයාලව හමු වෙන්නම්.''

වීදුරු අර්ධ ගෝලය පුපුරා ගොස්, ජලය ඇතුළට කඩා හැළිණි.

ජල ප්‍රවාහයට ඔරොත්තු දීමට හැකිවන තුරු පර්සි හුස්ම සිරකරගෙන සිටියේය. අවසානයේ ඔහුගේ පෙනහළු ජලයෙන් පිරීයත්ම ඔහුට සාමාන්‍ය ආකාරයෙන් හුස්ම ගන්නවා වැනි හැඟීමක් දැණිනි. ජලයේ පීඩනය ගැන ඔහු කරදර වූයේ නැත. ඔහුගේ ඇඳුම් පවා ජලයෙන් තෙත් නොවුණි. ඔහුගේ දියයට හැකියාවන් වෙනදාමෙන්ම හොඳින් පැවතිණි.

*ඒක මහ මෝඩ හයක්.* ඔහු තනිව සිතුවේය. *මම ගිලෙන්නේ නැහැ.*

ඉන්පසු ඔහුට ෆ්‍රෑන්ක්ව සිහිපත් විය. සැනෙකින් භීතිය හා වරදකාරී හැඟීමක් ඔහුව වෙලා ගත්තේය. පර්සි තමා පිළිබඳ කරදර වෙමින් සිටියදී තම මිත්‍රයා පොසිඩන්ගෙන් පැවත එන්නකු බව ඔහුට අමතකව තිබිණි. ෆ්‍රෑන්ක්ට දිය යට හුස්ම ගත නොහැකිය. *ඒත් ඔහු කොහේද?*

පර්සි සම්පූර්ණ වටයක් කරකැවුණේය. කිසිවක් නැත. ඉන්පසු ඔහු උඩ බැලුවේය. ඔහුට ඉහළින් පිහිනමින් සිටියේ යෝධ රන් මත්ස්‍යයෙකි. ෆ්‍රෑන්ක් තම ඇඳුම් සහිත ගමන් මල්ල ඇතුළු සියල්ල සමඟ තරුණ කොලුවකු තරමේ කෝයි කෙනෙකු බවට පරිවර්තනය වී සිටියේය.

*ජේත්තුකාරයා.* පර්සි අනෙකුත් මුහුදු සත්ත්වයින් සමඟ කතා කරන ආකාරයට ජලය තුළින් සිතිවිල්ලක් මුදා හැරියේය. *රන් මත්ස්‍යයෙක්?*

ෆ්‍රෑන්ක්ගේ පිළිතුර ඔහු වෙත ලැබිණි. *මාව විකාරයක් වෙලා. අපි රන් මත්ස්‍යා ගැන කරපු කතාව මගේ හිතේ තිබුණා.*

*මම යෝධ කෝයි කෙනෙක් එක්ක ටෙලිපති වලින් කතා කරනවා.* පර්සි පැවසුවේය. *අපූරුයි. ඔයාට තව කවුරු හරි කෙනෙක් බවට පරිවර්තනය වෙන්න පුළුවන්ද... ප්‍රයෝජනවත් කෙනෙක්?* නිහඬතාවයකි. සමහරවිට ෆ්‍රෑන්ක් කල්පනා කරනවා විය හැකිය. කෝයිගේ ඉරියව් එතරම් ප්‍රකට නොවන බැවින් එය කියැවීමට අපහසු දෙයක් විය.

*කනගාටුයි.* ෆ්‍රෑන්ක්ගේ හඬ ඇදී ආවේය. *මාව ගල්වෙලා. මාව භය වුණාම සමහර වෙලාවට එහෙම වෙනවා.*

*නියමයි.* පර්සි විරිත්තුවේය. *අපි පැනගන්න විදිහක් බලමු.*

ටැංකිය වටා පිහිනා ගිය ෆ්‍රෑන්ක් පිටවීමේ මඟක් නොමැති බව දැනුම් දුන්නේය. එහි මුදුන දිව්‍යමය ලෝකඩ දැලකින් වසා තිබිණි. පර්සි රිප්ටයිඩයෙන් එය කපා දැමීමට උත්සාහ කළත් එයට සිරීමක්වත් සිදු කිරීමට ඔහු අපොහොසත් විය. තම කඩුවේ තුඩෙන් වීදුරුව සිදුරු කිරීමට ඔහු උත්සාහ කළේය. නැවතත්, වාසනාව ඔහුගේ පැත්තට නොතිබිණි. ඉන්පසු ටැංකිය පතුලේ තිබුණු විවිධ අවි වලින් එය කිරීමට උත්සාහ දැරුවේය.  ත්‍රිශූල තුනකිනුත්, කඩුවකින් සහ හෙල්ලයකින් දැරූ සියලු උත්සාහයන් ව්‍යාර්ථ විය.

අවසානයේ ඔහු ජලය පාලනය කිරීමට උත්සාහ කළේය. ජලය ප්‍රසාරණය කර වීදුරුව බිඳ දැමීමට හෝ මුදුන පුපුරවා හැරීමට ඔහු ට වුවමනා විය. එහෙත් ජලය ඔහුට අවනත නොවීය. *සමහරවිට ඒවට මතුරල ඇති, එහෙම නැත්නම් පෝසයිස්ගේ බලයට යටත් ඇති.* තම කන් විහිදෙන තෙක් පර්සි කල්පනා කළේය. එහෙත් ඔහුට කළ හැකි වූ එකම දෙය වූයේ නිදන් පෙට්ටගමේ පියන ගලවා දැමීම පමණකි.

*ඔච්චරයි,* ඔහු අධෛර්යමත්ව සිතුවේය. මට මගේ මුළු ජීවිත කාලෙම යෝධ රන් මත්ස්‍ය මිත්‍රයා එක්ක සටන් කර කර, කෑම වෙලාව එනකම් ඇඟිලි ගැන ගැන, අර ප්ලාස්ටික් ඉඟුරුපාන් ගෙදරට වෙලා ඉන්න වෙයි.

ඔවුන් එයට ප්‍රියකරනු ඇතැයි පෝසයිස් සහතික විය. පර්සිට ටෙල්ක්හයින්ලාත්, නෙරිඩ්ලා සහ හිපොකැම්පියන් සිහිපත් විය. ඒ සියල්ලෝම අලසව, පිහිනමින් සිටියහ.

*පෝසයිස් නිවැරදි නම්,* ඔහුට සිතුණේය. ඔවුන්ට පලායාමට හැකි වුවත්, සියලු දෙවිවරුන්ගේ බලය නැතිනම් යෝධයන්ව පරාජය කරන්නේ කෙසේද? බැචස්ට උදව් කිරීමට හැකි වනු ඇත.

පෙරවතාවකදීත් ඔහු නිවුන් යෝධයින් දෙදෙනාව මරා දමා තිබිණි. එහෙත් ඔහු සටනට එකතුවනු ඇත්තේ, ඔහුට කළ නොහැකි තරම් ගුණ වර්ණනාවක් කළහොත් පමණකි. එහෙත් බැචස්ගේ ගුණ වර්ණනා කිරීමේ අදහස පර්සිට විකාරයක් විය.

*බලන්න!* ෆ්‍රැන්ක් පැවසුවේය.

වීදුරුවෙන් එහා පැත්තේ කේටෝ, කෝච් සමඟ ප්‍රේක්ෂකාගාරය දෙසට ගමන් කරමින් සිටියාය. ඇය ඔහුට යම් දේශනයක් සිදුකරන අයුරුත්, කෝච් හිසවනමින් එය අසා සිටින අයුරුත් දක්නට ලැබිණි.

*කෝච්!* පර්සි කෑ ගැසුවේය. එය ඵලරහිත බව එවිටම ඔහුට අවබෝධ විය. කෝච්ට ටෙලිපත් ක්‍රමයට කරන කතා ඇසෙන්නේ නැත.

ෆ්‍රැන්ක් තම හිසෙන් වීදුරුවට ඇන්නේය.

හෙජ් එය දුටු බවක් නොපෙනුණි. කේටෝ ඔහුව ප්‍රේක්ෂකාගාරය හරහා කැඳවාගෙන ගියාය. ටැංකිය තවමත් හිස්ව ඇතැයි සිතා සිටි නිසාදෝ කේටෝට පවා වීදුරුව පිළිබඳ අවධානයක් නොතිබිණි. කතාකරමින්ම ඇය කාමරයේ දුරස්ථ අන්තය දෙසට අත දිගු කළාය. *එන්න, වඩාත් භයානක මුහුදු රාක්ෂයෝ ඉන්නේ මේ පැත්තේ,* ඇය එසේ කියන්නට ඇත.

තමාට ඉතිරිව ඇත්තේ තත්පර කීපයක් බව පර්සිට අවබෝධ විය. කෝච් පිටව යාමට සූදානම්ව සිටියේය. ඔහු ඔවුන් දෙසට පිහිනා ගියේය. එහෙත් සාමාන්‍යයෙන් ජලය ඔහුට වෙනදා දක්වන උපකාරය මෙවර දක්නට නොලැබිණි. ඒ වෙනුවට ජලය ඔහුව පසුපසට අදින බවක් පෙනී ගියේය. රිප්ටයිඩය බිම දමූ ඔහු දෑතම උපකාර කරගනිමින් පිහිනන්නට විය.

කෝච් හෙජ් සහ කේටෝ පිටවීමේ දොරටුවට අඩි පහක් පමණ සමීපව සිටියහ.

බලාපොරොත්තු සුන් වූ ලෙසින්, පර්සි යෝධ කිරිගරුඬ බෝලයක් ගෙන වේගයෙන් දමා ගැසුවේය.

හඬක් නඟමින් එය වීදුරුවේ ගැටිණි. එහෙත් අවධානයක් ගැනීමට තරම් ඒ හඬ ප්‍රමාණවත් වූයේ නැත.

පර්සිගේ හදවත නැවතිණි.

එහෙත් කෝච් හෙජ්ට තිබුණේ නරාශ්වයකුගේ කන් යුගලයකි. ඔහු තම උරහිසට ඉහළින් පිටුපස බැලුවේය. ඔහු පර්සිව දකින විට, මිලි තත්පර කීපයක් තුළ ඔහුගේ මුහුණ ඉරියව් කීපයකට මාරුවිය. වික්ෂිප්ත බව, පුදුමය, කෲරබව අවසානයේ මවාගත් සන්සුන් බවකට පරිවර්තනය විය.

කේටෝගේ අවධානයට ලක්වීමට පෙර, හෙජ්, ප්‍රේක්ෂකාගාරයේ මුදුන දෙසට අත දිගු කළේය. *ඔලිම්පස්හි දෙවියනේ, අර මොකක්ද?* ඔහු එසේ කෑගසන බවක් පෙනී ගියේය.

කේටෝ හැරුණාය. ව්‍යාජ පාදය එසවූ කෝච් හෙජ් ඔහුගේ එළු කුරයෙන් කේටෝගේ හිසේ පිටුපසට නින්ජා මාදිලියේ පා පහරක් දුන්නේය. කේටෝ පොළොව මත ඇද වැටුණාය.

පර්සි ඇසක් ගැසුවේය.

හෙජ් වීදුරුව දෙසට දිව ආවේය. ඔහු දෑත් විදහාගෙන සිටියේ, *ඔයා මොනවද මෙතන කරන්නේ, ජැක්සන්?* යයි කියන්නාක් මෙනි. තම අත මිට මෙලවූ පර්සි එය වීදුරුවට තබා තද කළේය. *ඒක බිඳින්න.*

හෙජ් ඇසිය යුතුව තිබූ ප්‍රශ්නය ඇසුවේය. *ෆ්‍රෑන්ක් කොහෙද?*

පර්සි යෝධ රන් මත්ස්‍යයා පෙන්වීය.

ෆ්‍රෑන්ක් ඔහුගේ වම් වරල සැලුවේය.

හෙජ්ට පිටුපසින්, මුහුදු දෙවඟන සෙලවෙමින් සිටියාය. පර්සි උමතුවෙන් මෙන් ඇයට පෙන්වීය.

හෙජ් තම කුර පාදය පෙන්වූ නමුත් පර්සි තම අත් වැනුවේය. *එපා.* ඔවුන්ට කේටෝව සදාකාලිකව සිහිසුන්ව තැබීමට නොහැකිය. ඇය දිව්‍යමය බලය ඇත්තියක බැවින් ඔවුන්ට ඇයව බිම හෙළා සිටිය නොහැකිය. එසේම එයින් ඔවුන්ට මේ ටැංකියෙන් පිටවීමට ද නොහැකිය. පෝසයිඩ් ආපසු ඔවුන් බැලීමට එනු ඇත. දැන් ඇත්තේ කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි.

*තුන්දෙනාම,* ඇඟිලි තුනක් ඔසවා පර්සි පැවසුවේය. *අපි තුන්දෙනා එක සැරේට විදුරුවට පහර දෙමු.*

පර්සි කිසිවිටෙකත් සංඥා භාෂාවට දක්ෂයෙකු නොවූ නමුත් කෝච් හෙජ් එය තේරුම් ගත්තේය. පහර දීම නරාශ්වයන්ට හොඳින්ම තේරුම් ගත හැකි භාෂාවක් විය.

පර්සි තවත් යෝධ කිරිගරුඬ බෝලයක් ඔසවා ගත්තේය.

*ෆ්‍රෑන්ක්, අපිට ඔයාවත් ඕනේ. ඔයාට තවමත් වෙනස් වෙන්න බැරිද? සමහරවිට මනුෂයෙක් වෙන්න පුළුවන් වෙයි.*

මනුෂ්‍යයෙක් වෙන එක හොඳයි. ටිකක් හුස්ම තද කරගන්න. මේක වැඩ කළොත්...

කේටෝ දණින් නැගී සිටියාය. නාස්ති කිරීමට කාලයක් නොවීය. පර්සි ඇඟිලි ඔසවමින් ගණන් කළේය. *එකායි, දෙකායි, තුනායි!*

මනුෂ්‍ය ස්වරූපයට පැමිණි ෆ්‍රෑන්ක් තම උරහිසෙන් බිත්තියට ඇන්නේය. හෙජ් වටයක් කරකැවී තම පාදයෙන් චක් නොරිස්ගේ පා පහරක් දුන්නේය. පර්සි තම මුළු වෙර යෙදා කිරිගරුඬ බෝලයෙන් වීදුරුවට දමා ගැසුවේය. එහෙත් ඔහු එයට වඩා යමක් කළේය. ඔහු ජලයට තමාට අවනත වන ලෙස නියෝග කළ අතර මේ වතාවේ ''නැත'' යන්න පිළිතුරු ලෙස බාර ගැනීම ඔහු ප්‍රතික්ෂේප කළේය. ටැංකිය තුළ පීඩනය වැඩි වන බව ඔහුට දැණිනි. ජලය නිදහස්වන බව පෙනී ගියේය. අවස්ථාවක් ලද විගස ජලය නැවැත්වීමට කිසිදු බාධකයකට නොහැකි අතරම, පර්සිසේම ජලයද සිරවී සිටීමට ද අකමැතිය. නැවත ඇනබෙත් වෙත යන අයුරු පර්සි සිතුවේය. මුහුදු සත්ත්වයින් සඳහා වූ මේ බියකරු සිරගෙය විනාශ කිරීම ගැන සිතුවේය. පෝසයිඩ්ස්ගේ මයික්‍රොෆෝනය ඔහුගේ උගුරේ සිරකරවන අන්දම ගැන සිතුවේය. ගැලුම් පණස් දහසක ජලය ඔහුගේ කෝපයට ප්‍රතිචාර දැක්වූවේය.

වීදුරු බිත්තිය ඉරි තැලුවේය. ඉරි තැලුම් වීදුරුව පුරා පැතිර යමින් එක්විටම ටැංකිය පුපුරා ගියේය. ජල ප්‍රවාහනය සමඟ පර්සි එළියට විසිවිය. විශාල කිරුගරුඬ කැබලිත්, ප්ලාස්ටික් මුහුදු පැළෑටි සහ ෆ්‍රෑන්ක් ද සමඟ ඔහු ප්‍රේක්ෂකාගාරයේ ගෙබිම මත පතිත විය. කිම්දෙන පිළිරුව පාවී අවුත් වැළඳගන්නා විට කෙටෝ නැගීමට වෙර දරමින් සිටියාය.

කෝච් හෙජ් ලුණු වතුර වමනය කළේය. ''ජැක්සන්! ඔයාලා මොනවද එතන කළේ?''

''පෝසයිඩ්ස්!'' පර්සි පැවසුවේය. ''උගුලක්! දුවමු!''

ඔවුන් මින් මැදුර අතරින් දිවයන විට අනතුරු හඟවන සංඥා හඬ නාද දෙන්නට විය. ඔවුහු නෙරිඩ්ලාගේ ටැංකියත්, අනතුරුව ටෙල්ක්හයින්ලාගේ ටැංකියත් පසු කළහ. පර්සිට ඔවුන්ව නිදහස්

කිරීමට අවශ්‍ය විය. *එහෙත් ඒ කෙසේද?* ඔවුන් මත් කර තිබිණි. එසේම ඔවුන් මුහුදු සත්ත්වයන්ය. ඔවුන්ව සාගරයට ගෙන යාමේ ක්‍රමයක් නොමැතිව ඔහුට ඔවුන්ගේ දිවි රැකීමට නොහැකිය.

අනෙක් අතට, පෝසයිඩ්ස් ඔවුන්ව අල්ලා ගතහොත්, මුහුදු දෙවියාගේ බලය තමා මත පතිතවන බව පර්සි හොඳින්ම දැන සිටියේය. එසේම තම මුහුදු රාක්ෂයන්ට කෑමක් ලෙස කේටෝද ඔවුන්ව අල්ලා ගැනීමට හඹා එනු ඇත.

*මම ආපසු එනවා.* පර්සි පොරොන්දු වුවත්, ටැංකි තුළ සිටි සත්ත්වයින්ට ඔහුව ඇසුණු බවක් නොපෙනුණි.

ශබ්ද විකාශන පද්ධතිය තුළින් පෝසයිඩ්ස්ගේ ගෙරවුම් හඬ නැගී ආවේය. ''පර්සි ජැක්සන්!''

පර්සි, කෝච් හෙජ් සහ ෆ්‍රෑන්ක් ගාටමින් වීදුරු උමගෙන් පිටතට පැමිණියහ. ඔවුන් නැවත තල්මස් මෝරුන්ගේ ශාලාවට පැමිණ ඇති බව ඔවුන්ට පෙනී ගියේය. මින් මැදුරේ මනුෂ්‍ය කොටස, කෑ ගසන සෙනඟින් පිරී තිබිණි. පවුල් සහ දිවා කඳවුරු කණ්ඩායම් සෑම අතකම දිව යමින් සිටි අතර කාර්ය මණ්ඩලය ඔවුන් පසුපස දුවමින් එය ව්‍යාජ අනතුරු ඇඟවීමක් බව පැහැදිළි කිරීමට උත්සාහ දරමින් සිටියහ.

පර්සි එය හොඳින් දැන සිටියේය. ඔහු තම මිතුරන් සමඟ මිනිසුන් අතරටම එක්ව පිටවීමේ දොරටුව දෙසට දිව ගියේය.

# 17
# ඇනබෙත්

**පර්සිගේ පාසි මොළයේ විශිෂ්ට අවස්ථා සිහිපත් කරමින්** හේසාල්ගේ දොම්නස පහ කර දැමීමට ඇනබෙත් උත්සාහ දරමින් සිටියාය. ඒ මොහොතේම පහළ ශාලාවට දිව ආ ෆ්‍රැන්ක්, ඇගේ කුටියට කඩා වැදුණේය.

''ලියෝ කොහෙද?'' ඔහු හති දමමින් විමසුවේය. ''නැව උඩට ගන්න! උඩට ගන්න!''

කෙල්ලන් දෙදෙනා නැගී සිටියහ.

''පර්සි කොහේද?'' ඇනබෙත් විමසුවාය. ''එතකොට එළුවා?'' දණහිස්වල දෑත් තබාගෙන ෆ්‍රැන්ක් හති දැම්මේය. ඔහුගේ කමිසය තෙත් වී තිබුණේ, අලුතින් කැඳ දැමුවාක් මෙනි. ''තට්ටුව උඩ එයාල හොඳින්. අපිව ලුහුබඳිනවා.''

ඔහුව තල්ලු කර පසෙකට දමා දිවගිය ඇනබෙත් තෙවතාවක්ම පියගැට පෙළ දෙස බැලුවාය. ඇයගේ පිටුපසින් හේසාල් සිටි අතර, හති දමමින් ෆ්‍රැන්ක්ද ඔවුන්ට එකතු විය. පර්සි සහ හෙජ් නැව් තට්ටුව තුළ හිස් බැල්මෙන් බලා සිටියහ. හෙජ්ගේ සපත්තුවක්ද අහිමි වී තිබිණි. ''භයානකයි. භයානකයි.'' අහස දෙස බලමින් ඔහු මුමුණමින් සිටියේය. ජනෙල් වීදුරුවක් අතරින් පැන්නාක් මෙන් පර්සිගේ ගත කැපීම් සහ සීරීම්වලින් වැසී තිබිණි. ඔහු කිසිවක් නොපැවසූ නමුත්, *'ඔයා ළඟ ඉන්නකොට ලෝකය කැරකෙන එකත් නවතිනවා'* වැනි බැල්මකින් ඔහු මෘදු ලෙස ඇනබෙත්ගේ අත අල්ලා ගත්තේය.

කෑම ගන්නා ශාලාවේ ආහාර ගනිමින් සිටි ලියෝ, පිපර් සහ ජේසන් ද හනිකට නැව් තට්ටුව වෙත දිව ආහ.

''මොකද? මොකද?'' අඩක් කෑ චීස් සැන්ඩ්විචය අතේ තබාගෙන ලියෝ කෑගැසුවේය. ''අපිට කන්නවත් වෙලාවක් දෙන්නෙ නැද්ද හාදයිනේ? මොකක්ද වෙලා තියෙන්නේ?''

''ලුහුබඳිනවා!'' ෆ්‍රෑන්ක් නැවත බෙරිහන් දුන්නේය.

''ලුහුබඳිනවා? මොකාද?'' ජේසන් විමසුවේය. ''මම දන්නෙ නෑ!'' ෆ්‍රෑන්ක් හති ඇරියේය. ''තල්මස්සු? මුහුදු රාක්ෂයො? සමහර විට කේට් සහ පෝකි වෙන්නත් පුළුවන්!''

ඇනබෙත්ට ඔහුගේ ගෙල සිරකිරීමට වුවමනා වුවත්, ඔහුගේ ගෙල සිරකිරීමට තම දෑත් ප්‍රමාණවත් වේදැයි යන්න ගැන ඇයට වූයේ සැකයකි. ''ඒකෙන් කිසිම දෙයක් පැහැදිලි වෙන්නෙ නෑ. ලියෝ, ඔයා අපිව මෙහෙන් ගෙනියනව නම් හොඳයි.''

සැන්ඩ්විචය දත් අතර සිරකරගත් ලියෝ, සුක්කානම වෙත දිව ගියේය.

ඉක්මනින්ම ආගෝ II අහසට එසැවෙන්නට විය. ඇනබෙත් අවරයේ වූ හරස් දුන්න වෙත ගියාය. තල්මසුන්ගේ හෝ වෙනත් කිසිවකුගේ ලුහුබැඳීමක් ඇයට දැකගැනීමට නොලැබුණත්, ඇට්ලන්ටා අහස් රේඛාව මීදුමක් සේ බොඳව ඈතට යන තුරුම පර්සි, ෆ්‍රෑන්ක් හෝ හෙජ් යන තිදෙනාගෙන් කිසිවකු නැවත ප්‍රකෘති තත්ත්වයට පත් වූයේ නැත.

''චාල්ස්ටන්.'' මහලු මිනිසකු ලෙස නැව් තට්ටුව මත ගාටමින් පර්සි පැවසුවේය. තවමත් ඔහුගේ හඬ ගැහෙමින් තිබිණි. ''චාල්ස්ටන්වලට යානය ගෙනයන්න.''

''චාල්ස්ටන්?'' බියකරු මතකයන් නැවත අවදි වූ කලෙක මෙන් ජේසන් විමසුවේය.

තම ගමන් මල්ල විවෘත කළ ෆ්‍රෑන්ක් ඔහු සිහිවටන ලෙස ගත් දෑ පිටතට ගත්තේය. ''සමහර ඒවා ආරක්ෂා වෙලා තියෙනවා. ටී ෂර්ට් කීපයක්, හිම ගෝලය ඒ වගේම, ඇත්තටම මේක චීන මාංචු කුට්ටමක් නෙමෙයි.''

ඇනබෙත් සන්සුන්ව සිටීමට උත්සාහ දැරුවාය. ''මුලින්ම ඔයාලගෙ කතාව කියල හිටියනම් නරකද-මේ මල්ල අදිනවට වඩා.''

ඔවුහු නැව් අවරයේ උඩ තට්ටුවට රැස්වී සිටි බැවින් ලියෝට, නෞකාව ගෙන යන අතරේම සංවාදයට සවන්දීමට හැකි විය. පර්සි සහ ෆ්‍රෑන්ක් මාරුවෙන් මාරුවට ජෝර්ජියා මින් මැදුරේදී සිදුවූ සියල්ල පැවසූ අතර, කෝච් හෙජ් විටින් විට එයට උත්ප්‍රේරක සැපයුවේය. ''ඒක හරිම භයානකයි!'' නැතහොත් ''ඊට පස්සෙ මම ඒකිගෙ ඔලුවටම පයින් ගැහුවා!'' වැනි වැකියකින් හෙජ් සංවාදයේ මැද්දට පැන්නේය.

අඩුම වශයෙන් රැයකට පෙර පර්සි සහ ඇනබෙත් ඉස්තාලය තුළ නින්දට වැටී සිටි අන්දමවත් ඔහුගේ මතකයේ නොතිබිණි. එහෙත්, පර්සිගේ කතාව විනිශ්චය කරමින් ඇනබෙත් සිතුවේ ඒ ගැන වදවීමට වඩා බරපතල ප්‍රශ්න ඇති බවයි.

සිරකර සිටින මුහුදු සත්ත්වයන් ගැන පර්සි පවසන විට, ඔහු මෙතරම් සිත්තැවුලෙන් සිටින්නේ ඇයිදැයි යන්න ඇයට වැටහිණි.

''ඒක හරිම භයානකයි.'' ඇය පැවසුවාය. ''අපි එයාලට උදව් කරන්න ඕනෙ.''

''අපි එහෙම කරමු.'' පර්සි පොරොන්දු විය. ''නියම වෙලාවට. ඒත් ඒක කරන්නෙ කොහොමද කියල මම හිතන්න ඕනෙ. මම ප්‍රාර්ථනා කරනවා...'' ඔහු හිස සැලුවේය. ''එක්කො ඕනෙ නැහැ. මුලින්ම අපි මේ අපේ ඉහට කඩා පාත් වුණ පරිත්‍යාගය ගැන බලමු. අපි දැනටමත් රාක්ෂයින්ව ඇති තරමට ආකර්ෂණය කරගෙන තියෙන්නේ.''

''අපිට 'අවශ්‍යයි' කියල පෝස්ටර් ඕනෙ වෙයිද?'' ලියෝ විමසුවේය. ''ඒ වගේම එයාල ළඟ අපේ දීමනා තියෙනවද, මිල දර්ශකයක් වගේ.''

හේසල් නහය හැකිලුවාය. ''ඔයා මොනව ගැනද කියන්නේ?''

''මේ දවස්වල මම කොච්චර වටිනවද කියන කුතුහලය ගැනයි!'' ලියෝ පැවසුවේය. ''මම අදහස් කළේ පර්සි හෝ ජේසන් තරමට වටින්නෙ නැති එක මට තේරුම්ගන්න පුළුවන්... ඒත් මම ෆ්‍රෑන්ක්ල දෙන්නෙක් හෝ තුන් දෙනෙක් තරමට වටිනවා නේද?''

''ඒයි!'' ෆ්‍රෑන්ක් මැසිවිලි නැගුවේය.

''ඒක පැත්තකට දාන්න.'' ඇනබෙත් පැවසුවාය. ''අඩුගානේ සිතියම සෙවීමේ අපේ ඊළඟ පියවර චාල්ස්ටන් කියලවත් අපි දැන් දන්නවා.''

පිපර් පාලක පුවරුවට නැවීගෙන සිටියාය. අද ඇය සුදු පැහැති පිහාටු සමග කොණ්ඩය ගොතාගෙන සිටි බැවින් ඇගේ දුඹුරු පැහැති කෙස් වැටිය වඩාත් අලංකාරව පෙනිණි. මේවාට ඇය කෙසේ නම් කාලය සොයාගන්නේදැයි ඇනබෙත් පුදුම වූවාය. තමා කොණ්ඩය පීරූ දිනයක් ඇනබෙත්ට මතකයට නගාගැනීම අසීරු විය.

''සිතියම.'' පිපර් පැවසුවාය.''ඒත් මොකක් ගැන සිතියමක්ද?''

''ඇතීනාගේ සලකුණ ගැන.'' තමා පමණට වැඩි යමක් පැවසූවාදැයි යන සැකය නිසා පර්සි ප්‍රවේසමෙන් ඇනබෙත් දෙස බැලුවේය. *මට ඒ ගැන කතා කරන්න වුවමනාවක් නැතැයි* පැවසෙන බැල්මක් ඇගේ මුහුණෙහි වූයේය.

''ඒක මොකක් වුණත්.'' ඔහු නැවත පැවසුවේය. ''අපි දන්නවා ඒකෙන් රෝමයේ යම් වැදගත් තැනකට මග පෙන්වනවා කියලා. රෝමවරු සහ ග්‍රීකයො අතරෙ තියෙන භේදය සුව කරන යම් දෙයකට.''

''යෝධයන්ගේ නපුර.'' හේසල් පැවසුවාය.

පර්සි හිස සැලුවේය. ''ඒ වගේම මගෙ හීනෙදි, නිවුන් යෝධයො ප්‍රතිමාව ගැනත් යමක් කිව්වා.''

''ම්...'' හරියටම චීන මාංචු කුට්ටමක් යැයි පැවසිය නොහැකි උපකරණය තම ඇඟිලි මත රඳවාගනිමින් ෆ්‍රෑන්ක් පැවසුවේය.

''පෝසයිඩ්ට අනුව, අපි ඉක්මනින් ඒක හොයන්න උත්සාහ කරන්න ඕනෙ. ඒත් මොකක්ද ඒක?''

සියල්ලෝම ඇනබෙත් දෙස බැලූහ. ඇය දැඩි කල්පනාවක ගැලී සිටින බව පෙනිණි. ප්‍රතිමාව... ඇතීනා... ග්‍රීකයන් සහ රෝමවරු, ඇගේ බියකරු රෑ සිහින සහ ඇගේ මව සමග පැවති වාදය. මේ කැබලි එකට එකතු වන්නේ කෙසේදැයි ඇයට පෙනී ගියේය. එහෙත් එය සැබෑවක් ලෙස විශ්වාස කිරීමට ඇයට නුපුළුවන් විය. පිළිතුර බෙහෙවින් විශාල, බෙහෙවින් වැදගත් එකක් වූවා පමණක් නොව ඊටත් වඩා බියකරු විය.

ඇය සිතමින් සිටින්නේ කුමක්දැයි යන්න හරියට දන සිටියාක් මෙන් ජේසන් ඇය දෙස බලා සිටින අයුරු ඇයට පෙනිණි. නැවතත් පුදුමය ඇගේ සිතට ඒම වළකාගත නොහැකි විය. ඇයි මේ හාදයා මෙච්චරට මාව අපහසුවට පත් කරන්නේ? එයා ඇත්තටම ඉන්නේ මගෙ පැත්තෙද? එසේත් නැතිනම් සමහර විට ඇගේ මව පැවසූ ලෙස...

''මම පිළිතුරට ආසන්නයි.'' ඇය පැවසුවාය. ''අපිට මේ සිතියම හොයගන්න පුළුවන් වුණොත් මට තවත් දේවල් දැනගන්න පුළුවන්. ජේසන්, ඔයා චාල්ස්ටන් කියන නමට ප්‍රතිචාර දක්වපු විදිහට... ඔයා මීට කලින් එහෙට ගිහින් තියෙනවද?''

ජේසන් අපහසුවෙන් මෙන් පිපර් දෙස බැලුවත්, ඒ ඇයිදැයි යන්න හරියටම කීමට ඇනබෙත්ට අපහසු විය.

''ඔව්.'' ඔහු පැවසුවේය. ''අවුරුද්දකට කලින් මමයි, රෙයිනායි එහෙ ගවේෂණයක් කළා. අපි එහෙදි CSS හන්ලේ එකෙන් රාජකීය රන්[1] ආයුධ ගොඩගත්තා.''

''මොකක්?'' පිපර් විමසුවාය.

''ඔහෝ!'' ලියෝ පැවසුවේය. ''ඒ තමයි පළමු සාර්ථක යුද සබ්මැරීනය. සිවිල් යුද්දෙ ඉඳලම. මටත් හැම වෙලාවෙම ඒක දැකගන්න ඕනා වුණා.''

''ඒක සැලසුම් කළේ රෝම උපදෙව්වරු.'' ජේසන් පැවසුවේය. ''ඒකෙ රාජකීය රන් ටෝපිඩෝ රහසිගතව සඟවා තිබුණ-අපි ඒවා ගලවගෙන ජුපිටර් කඳවුරට රැගෙන එනතුරුම.''

හේසාල් දැත් බැඳගත්තාය. ''එහෙනම් රෝමවරු සටන් කළේ සන්ධානය පැත්තටද? ආච්චි අම්ම වහලෙක් වුණ කෙල්ලක් විදිහට මට කියන්න පුළුවන්ද... ඒක එච්චර හොඳ දෙයක් නෙමෙයි කියලා?''

ජේසන් තම අත්ල විදහා පෑවේය. ''මම පෞද්ගලිකව ඒකට සම්බන්ධ වුණේ නෑ. ඒ වගේම හැම ග්‍රීකයෙක්ම එක පැත්තකත්, හැම රෝමවරයෙක්ම අනිත් පැත්තට හිටියෙත් නෑ. ඒත්, ඔව්, ඒක හොඳ දෙයක් නෙමෙයි. සමහර වෙලාවට උපදෙව්වරුන්ට නරක තේරීම් කරන්න වුණා.'' ඔහු හේසාල් දෙස බැලුවේය. ''සමහර වෙලාවට අපි ඕනැවට වඩා සැක කළා වගේම හිතන්නෙ නැතුව කතා කළා.''

හේසාල් ඔහු දෙස බැලුවාය. ඔහු සමාව අයැදින විට ඇගේ මුහුණ ක්‍රමයෙන් පැහැපත් විය.

ජේසන් ලියෝට වැලමිටෙන් ඇන්නේය.

''ඌයි.'' ලියෝ කෑගැසුවේය. ''මම අදහස් කළේ... ඔව්... වැරදි තේරීම්.''

1 රාක්ෂයන්ට මාරාන්තික දුර්ලභ ලෝහයකි. පාතිනොන්වලදී අභිෂේක කරන ලද්දකි. එහි පැවැත්ම අධිරාජයා විසින් රහසිගතව ආරක්ෂා කෙරිණි.

හේසාල් තොල් සපා ගත්තාය. ''හරි. ආපහු චාල්ස්ටන්වලට එමු. ඔයා කියන්නෙ අපි ආයෙත් සබ්මැරීනය පරීක්ෂා කරන්න ඕනෙ කියලද?''

ජේසන් දෙවුර සැලුවේය. ''හොඳයි... මම හිතන්නෙ අපි චාල්ස්ටන්වල පරීක්ෂා කළ යුතු තැන් දෙකක් තියෙනවා. ඒ අතරින් එකක් තමයි හන්ලේ එක කියල තියෙන කෞතුකාගාරය. සිවිල් යුද්දයට අයත් කෞතුක භාණ්ඩ ගොඩාක් ඒකෙ තියල තියෙනවා. ඒ එකක සිතියම හංගලා තියෙන්න පුළුවන්. මම ඒකෙ සැලැස්ම දන්නවා. මට කණ්ඩායම ඇතුළට ගෙනියන්න පුළුවන්.''

''මම යන්නම්.'' ලියෝ පැවසුවේය. ''කියන විදිහටම ඒකෙ පොඩි ගතියක් තියෙනවා.''

ජේසන් හිස සැලුවේය. ඔහු ෆ්‍රෑන්ක් දෙසට හැරුණේය. ෆ්‍රෑන්ක් චීන මාංචු කූට්ටමෙන් තම ඇඟිලි මුදවා ගැනීමට උත්සාහ දරමින් සිටියේය. ''ඔයත් එන්න ඕනා, ෆ්‍රෑන්ක්. අපිට ඔයාව ඕනා වෙන්න පුළුවන්.''

ෆ්‍රෑන්ක් පුදුමයෙන් බැලුවේය. ''ඇයි? මින් මැදුරෙදි නම් මම එච්චර හොඳට වැඩේ කළේ නෑ.''

''ඔයා හොඳට කළා.'' පර්සි ඔහුට සහතික විය. ''වීදුරුව බිඳින්න අපි තුන්දෙනාම ඕනෙ වුණානෙ.''

''අනිත් අතට ඔයා අඟහරුගේ දරුවෙක්.'' ජේසන් පැවසුවේය.

''පරාජයේ භූතයෝ ඔයාට සේවය කරන්න බැඳිල ඉන්නවා. ඒ වගේම චාල්ස්ටන්වල කෞතුකාගාරයත් සෑහෙන තරම් සන්ධානගත භූතයො ඉන්න තැනක්. එයාලව එකට තියාගන්න අපිට ඔයාව ඕනෙ වෙයි.''

ෆ්‍රෑන්ක් ගැස්සුණේය. ෆ්‍රෑන්ක් රන් මසකු බවට පත්වීම පර්සි විස්තර කළ අයුරු ඇනබෙත් ගේ මතකයට නැගිණි. ඔහු නැවත යෝධ මත්ස්‍යයකු වනු දැකීමට ඇය කොහෙත්ම කැමති නොවූවාය.

''හරි.'' ෆ්‍රෑන්ක් එකඟ විය. ''සත්තකින්ම.'' ඔහු මාංචු කූට්ටමෙන් නිදහස් වීමට දඟලන තම ඇඟිලි දෙස බැලුවේය.

''ආහ්. ඔයා කොහොමද -?''

ලියෝ සිනාසුණේය. ''මනුස්සයො, ඔයා මීට කලින් කවදාවත් මේව දැකල නැද්ද? ඕකෙන් නිදහස් වෙන්න බොහොම සරල උපක්‍රමයක් තියෙනවා.''

ෆ්‍රෑන්ක් නැවත උත්සාහ කළත් වාසනාව ඔහුගේ පැත්තේ නොතිබිණි. හේසාල් පවා සිනාව මැඩගැනීමට උත්සාහ දරමින් සිටියාය. ෆ්‍රෑන්ක් මඳක් නිහඬව සිතුවේය. එක් විටම ඔහු අතුරුදන් විය. නැව් තට්ටුවේ ඔහු සිටගෙන සිටි තැන, බිම වැටී තිබූ හිස් මාංචු කුට්ටමෙන්, කොළ පැහැති කටුස්සකු බඩගාමින් සිටියේය.

''නියමෙට කළා ෆ්‍රෑන්ක් ෂෑංග්.'' ලියෝ පැවසුවේය. ''මේක තමයි මිනිස්සු චීන මාංචුවලින් ගැලවෙන්න කරන්නේ. එයාලා කටුස්සෙක් බවට පත්වෙනවා.''

සියල්ලෝම හඬ නගා සිනාසුණහ. නැවත මිනිස් ස්වරූපයට පැමිණි ෆ්‍රෑන්ක් මාංචු යුගල ගෙන තම ගමන් මල්ලේ රුවා ගත්තේය. ඔහු ආඩම්බරයෙන් සිනාවක් නැගුවේය.

''කොහොම වුණත්.'' මාතෘකාව වෙනත් පැත්තකට යොමු කරමින් ඔහු පැවසුවේය. ''පරීක්ෂා කරන්න ඕනෙ එක තැනක් තමයි කෞතුකාගාරය. ඒත්, ජේසන්, ඔයා කිව්වා එහෙ තැන් දෙකක් තියෙනවා කියලා.''

ජේසන්ගේ සිනාව වියැකී ගියේය. ඔහු සිතමින් සිටින්නේ කුමක් ගැන වුවත්, එය එතරම් සතුටුදායක දෙයක් නොවන බව ඇනබෙත්ට වැටහිණි.

''ඔව්.'' ඔහු පැවසුවේය. ''අනෙක් තැනට කියන්නේ බැට්රි කියලා-ඒක වරායට දකුණින් තියෙන උද්‍යානයක්. මම එතනට ගිය අන්තිම සැරේදි... රෙයිනාත් එක්ක...'' පිපර් දෙස හැරී බැලූ ඔහු නැවත කතාව පටන්ගත්තේය. ''අපි උද්‍යානයෙදි යමක් දැක්කා. භූතයෙක් හෝ යම් ආකාරයක ආත්මයක්, හරියට සිවිල් යුද්ධයේ හිටපු දකුණු දිග රූප සුන්දරියක් වගේ, දිලිසෙමින්, තනියම පාවෙමින් හිටියා. අපි ඒකට ළං වෙන්න උත්සාහ කළත්, අපි ළඟට යන හැම වතාවකම ඒක අතුරුදහන් වුණා. එතකොට රෙයිනාට මෙහෙම හැඟීමක් ආවා. එයා කිව්වා එයා තනියම උත්සාහ කරල බලන්නම් කියලා. සමහර විට ඒක කතා කරන්න කැමති වුණේ කෙල්ලෙක් එක්ක විතරයි වෙන්න ඇති. එයා තනියම ආත්මය ළඟට ගියා වගේම ඇය එක්ක කතා කරන්නත් පුළුවන් වුණා.'' සියල්ලෝම නිහඬව බලා සිටියහ.

''එයා මොනවද කිව්වෙ?'' ඇනබෙත් විමසුවාය.

''රෙයිනා මට කිව්වෙ නැහැ.'' ජේසන් පැවසුවේය. ''ඒත් ඒක වැදගත්. එයා තැතිගැන්විලා හිටපු බව පෙනුණා. සමහර විට එයාට යම් අනාවැකියක් හෝ යම් නරක ප්‍රවෘත්තියක් අහන්න ලැබෙන්න ඇති. රෙයිනා ඊට පස්සෙ කවදාවත් මම ළඟදි එහෙම පෙන්නුවේ නැහැ.''

ඇනබෙත් ඒ ගැන සැලකිලිමත් වූවාය. එයිඩෝලන්ලා සමඟ ඔවුන් ලද අත්දැකීමෙන් පසු, භූතයන් ළඟට, විශේෂයෙන්ම නරක ප්‍රවෘත්ති හෝ අනාවැකි පවසන භූතයන් ළඟට යාමේ අදහසට ඇය කැමති වූයේ නැත. අනෙක් පැත්තෙන්, ඇගේ මව දැනුමේ දෙවඟන වූවාය. එසේම දැනුම යනු වඩාත් ප්‍රබලතම අවියයි. සිදුවිය හැකි කිසිදු තොරතුරු මූලාශ්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට ඇනබෙත්ට නොහැකිය.

''එහෙමනම් කෙල්ලන්ගෙ වික්‍රමයක්,'' ඇනබෙත් පැවසුවාය. ''පිපර්ටයි සහ හේසාල්ටයි මාත් එක්ක එන්න පුළුවන්.''

දෙදෙනාම හිස සැලුවත්, හේසාල් මඳක් කැළඹී සිටින බව පෙනිණි. පාතාල ලෝකයේ ඇය ගෙවූ කාලය තුළ ජීවිත කාල දෙකකට සෑහෙන තරම් ඇය භූත අත්දැකීම් ලබා ඇතුවාට සැකයක් නැත.

ඔවුන් සය දෙනා මේ ගවේෂණ දෙකට යන්නේ නම් පර්සිට කෝච් හෙජ් සමඟ නැවතීමට සිදුවන බව ඇනබෙත් අවබෝධ කර ගත්තාය. තම පෙම්වතිය නැවත අහිමි කර ගැනීමට පර්සි කැමති නොවනු ඇත. විශේෂයෙන්ම මාස ගණනක් වෙන්ව සිට නැවත එක් වූ පසු එසේ වෙන්වීමට ඔහු කැමති වන්නේ නැත. එහෙත් අනෙක් අතට සිරකර සිටින මුහුදු සත්ත්වයන් ගැන බෙහෙවින් දුකට පත්වී සිටින ඔහුට මේ මොහොතේ විවේකය අවශ්‍ය බව ඇය කල්පනා කළාය. ඇය ඔහුගේ දෑස් දෙස බලමින් නිහඬ පැනයක් විමසුවාය. *''ඔව් ඒක හොඳයි,''* යනුවෙන් පවසන්නාක් මෙන් ඔහු හිස සැලුවේය.

''එහෙමනම් ඒක විසඳුනා,'' ඇය පාලන පුවරුව පරීක්ෂා කරමින් සිටින ලියෝ දෙසට හැරුණේය. ''ලියෝ, අපිට චාල්ස්ටන් වලට ළඟා වෙන්න කොච්චර වෙලාවක් යයිද?'' ''හොඳ ප්‍රශ්නයක්, ''ඔහු මිමිණුවේය.'' ෆෙස්ටස්ට අහුවෙලා තියෙනවා විශාල රාජාලි රංචුවක් අපි පස්සෙන් එනවා. දිගු දුර රේඩාරයක්. තවමත් පෙනෙන්න ඇවිත් නැහැ.''

පිපර් පාලන පුවරුවට එබුණාය. ''ඔයාට විශ්වාසද එයාල රෝමවරු කියලා?''

ලියෝ දෑස් නැටවූවේය. ''නෑ, පිපර්. එයාල නියම ආකාරයෙන් පියාඹන අහඹු රාජාලි රංචුවක් වෙන්නත් පුළුවන්. ඇත්තවශයෙන්ම එයාල රෝමවරු! මම හිතන්නෙ අපි නැව හරවාගෙන වටෙන් යන්න ඕනේ.''

''නරකම අදහස වෙන්න පුළුවන් කොයි එකද?,'' ජේසන් පැවසුවේය. ''ඒ වගේම අපි රෝමයේ සතුරෝ කියලා හිතෙන ඕනෙම සැකයක් ඉවත් කරන්න පුළුවන් එක.''

''එහෙම නැත්නම් මට තවත් අදහසක් තියෙනවා.'' ලියෝ පැවසුවේය. ''අපි කෙළින්ම චාල්ස්ටන් පැත්තට ගියොත්, පැය කීපෙකින් අපට එහෙට යන්න පුළුවන්. ඒත් රාජාලියෝ අපිව පහුකළොත්, වැඩේ සංකීර්ණ වෙනවා. ඒ වෙනුවට අපි අපේ උපාය යවමු උන්ව රවට්ටන්න. අපි දුර පාරකින් නැව අරන් යමු. එහෙම ගිහින් හෙට උදේ වෙද්දි චාල්ස්ටන් වලට යමු.

හේසාල් විරෝධය පෑමට සැරසුණත්, ලියෝ අත ඔසවා ඇයව නිහඬ කළේය. ''මම දන්නවා. මම දන්නවා. නිකෝ ඉන්නෙ ප්‍රශ්නෙක. ඒ වගේම අපි ඉක්මන් කළ යුතුයි. හරිනෙ?''

''අද ජුනි 27.'' හේසාල් පැවසුවාය. ''අද ඇරුණම තව දවස් හතරයි තියෙන්නේ. ඊට පස්සෙ එයා මැරෙනවා.''

''මම දන්නවා! ඒත් රෝමවරු අපෙන් ඉවත් කරන්න නම් මේක කරන්නම වෙනවා. අපිට රෝමයට ළඟා වෙන්න තව ඕනෑ තරම් කාලය තියෙනවා.''

හේසාල් රැව්වාය. ''ඕනෑ තරම් කාලය...?''

ලියෝ දෙවුර සැලුවේය. ''තරමක කාලයක් තියෙනවා කිව්වොත් හරි යයිද?''

තම දෑත් දෙස බැලූ හේසාල් තුන දක්වා ඇඟිලි ගැන්නේය. ''අපට එච්චර කාලයක් නැහැ.'' එය කොළ එළියක් බව ඇනබෙත් තීරණය කළාය. ''හරි, ලියෝ, අපි මොනවිදිහෙ උපායක්ද යොදන්නෙ?''

''එහෙම අහනවට මම හරි කැමතියි.'' වේගයෙන් පාලන පුවරුවේ බොත්තම් කීපයක් එබූ ඔහු අවසානයේ A අකුර සහිත

බොත්තමක් එබුවේය. ඉන්පසු ඔහු අභ්‍යන්තර ඇමතුමෙන් කතා කළේය. ''බියුෆෝඩ්? කරුණාකරල සේවයට වාර්තා කරන්න.''

ෆ්‍රැන්ක් පියවරක් පිටුපසට ගියේය. ''තවත් කවුරු හරි මේ නැවේ ඉන්නවද? කවුද බියුෆෝඩ් කියන්නේ?''

පියගැට පෙළ දෙසින් දුම් කඳක් පිටකරමින් ලියෝගේ ස්වයංක්‍රීය මේසය නැව් තට්ටුව මතට පැමිණියේය.

සංචාරය අතරතුරදී ඇනබෙත් එතරම් බියුෆෝඩ්ව දැක නොතිබිණි. ඔහු වැඩිවශයෙන් සිටියේ එන්ජින් කමරයේය. බියුෆෝඩ් යනු මහෝගනී මුදුනක් සහිත පාද තුනේ මේසයක් විය. ඔහුගේ ලෝකඩ පාදමේ ලාච්චු කීපයක්ද, භ්‍රමණ ගියර හා දුම් පහර නිතුත් කරන ස්ථාන කීපයක්ද විය. බියුෆෝඩ්ගේ පාදවල කුඩා බෑගයක් වැනි මල්ලක් විය. සුක්කානම අසලට ගැටු ඔහු දුම්රිය නලාවක් මෙන් හඬ නැඟුවේය.

''මේ තමයි බියුෆෝඩ්,'' ලියෝ පැවසුවේය.

''ඔයාගේ මේසෙටත් නමක් තියෙනවද?'' ෆ්‍රැන්ක් විසමුවේය. ලියෝ ගෙරවීය. ''මනුස්සයෝ, මේ වගේ මේසයක් අයිත් කරගන්න ප්‍රාර්ථනා කරන්න ඕනෙ. බියුෆෝඩ්, ඔයා ලෑස්තිද එන්ඩ් ටේබල් මෙහෙයුමට?''

බියුෆෝඩ් වාෂ්ප කදම්භයක් විද්දේය. ඔහු අත් වැට අසලට පියවර තැබුවේය. ඔහුගේ මැහෝගනී මුදුන කොටස් හතරකට වෙන්වී දැව තල බවට පත්විය. ඒවා භ්‍රමණය වත්ම බියුෆෝඩ් ඉහළට එසවිණි.

''හෙලිකොප්ටර් මේසයක්,'' පර්සි කෙඳිරුවේය. ''ඒක නියමයි. මලුවල මොනවද තියෙන්නේ?''

''අපිරිසිදු උපදෙව් ඇඳුම්,'' ලියෝ පැවසුවේය. ''මම හිතනවා ඔයා මොකුත් හිතන එකක් නෑ කියලා ෆ්‍රැන්ක්.''

ෆ්‍රැන්ක් පුදුම විය. ''මොකක්?''

''අපේ ගන්ධයෙන් මම රාජාලින්ව වෙන පැත්තකට යවනවා.''

''ඒ මට තිබුණු එකම අමතර කලිසම් ටික!''

ලියෝ දෙවුර සැලුවේය. ''මට බියුෆෝඩ්ට කිව්වා එයා එළියෙ ඉන්න ටිකේ ඒවා හෝදලා නවල තියන්න කියලා. එයා එහෙම කරයි කියලා හිතමු.'' දැත් පිරිමදිමින් ඔහු විරිත්තුවේය. ''හොඳයි! මම

දැන් අපේ ගමනෙ දුර ගණනය කරල බලන්නම්. හැමෝම රෑ කෑම වෙලාවෙදී හමුවෙමු.''

පර්සි වේලාසනින්ම නින්දට ගිය අතර, තම පරිගණකය දෙස බලා සිටිනු හැර සන්ධ්‍යාවේ ඇනබෙත්ට කිරීමට වෙනත් කටයුත්තක් නොතිබිණි.

ඇත්තෙන්ම ඇය ඩායිඩාලූස්ගේ ලැප්ටොප් පරිගණකය රැගෙන විත් තිබිණි. වසර දෙකකට පෙර, මෙතෙක් පහළ වූ විශිෂ්ටතම නිපැයුම්කරුවාගේ එම යන්ත්‍රය ඇයට උරුම විය. එසේම එහි නව නිපැයුම් පිළිබඳ අදහස්, ක්‍රමාණුරූප සහ රූප සටහන් ඇතුළත් වී තිබිණි. ඇනබෙත් තවමත් ඒවායින් බොහෝමයක් තේරුම් ගැනීමට උත්සාහ දරමින් සිටියාය. වසර දෙකකට පසු, සාමාන්‍ය ලැප්ටොප් පරිගණකයක් යනු කල් ඉකුත් වූ වස්තුවක් වන නමුත්, ඩායිඩාලූස්ගේ යන්ත්‍රය තවමත් එහි කාලයට වඩා වසර පණහක් පමණ ඉදිරියෙන් සිටින බව ඇනබෙත් විශ්වාස කළාය. එය පූර්ණ ප්‍රමාණයේ ලැප්ටොප් පරිගණකයක් තරමට හැකිලීමේ හෝ ජංගම දුරකථනයකටත් වඩා කුඩා, ලෝහ පතුරක් තරමට නැවීමේ හැකියාව තිබිණි. ඇය මෙතෙක් පාවිච්චි කර තිබූ සියලු පරිගණකවලට වඩා එය වේගවත් විය. එයින් චන්ද්‍රිකාවලට සහ ඔලිම්පස් කන්දේ සිට විකාශන වූ හෙපියාස්ටස් TV විකාශය සමඟද සම්බන්ධ වීමට හැකි විය. එසේම සපත්තු ලේස් ගැට ගැසීම හැර අන් ඕනෑම දෙයක් සිදු කළ හැකි ආකාරයේ වැඩසටහන් සකසා ගැනීමටද හැකි විය. ඒ සඳහා වූ යෙදවුමක්ද එහි තිබිය හැකි වුවත්, ඇනබෙත්ට තවම එවැන්නක් හමු වී නොතිබිණි.

බංකුව මත හිඳගෙන ඇය, ඩායිඩාලුස්ගේ[1] ත්‍රිමාණ පරිවර්තන වැඩසටහන් වලින් එකක් යොදාගෙන ඇතන්ස්වල පිහිටි පාතිනොන් මැදුරේ ආකෘතිය අධ්‍යයනය කළාය. කරුණු දෙකක් නිසා ඇය නිතරම එහි යාමට ප්‍රාර්ථනා කළාය. එකක් වූයේ එහි ගෘහ නිර්මාණ ශිල්පයට ඇය ආප්‍රිය කිරීමයි. දෙවැන්න වූයේ ඇගේ මවට කැපකළ වඩාත් ප්‍රකටම දෙව් මැඳුර එය වීමයි.

ග්‍රීසියට ළඟාවන තෙක් ඔවුන්ගේ දිවි රැකී තිබුණොත්, දැන් ඇයට තම ප්‍රාර්ථනාව ඉෂ්ට කර ගැනීමට හැකි වනු ඇත. එහෙත් ඇතීනාගේ සලකුණ ගැනත්, රෙයිනා සඳහන් කළ පැරණි රෝම

1 ග්‍රීක පුරාවෘත්තවලට අනුව දක්ෂ අත්කම් ශිල්පියෙකි. අර්ධ මිනිස්, අර්ධ ගව සිරුරකින් යුත් මිනෝටර්ව රඳවා සිටි ක්‍රීට්වල වංකගිරිය නිර්මාණය කර ඇත්තේ ඩායිඩාලුස් ය.

පුරාවෘත්තය ගැනත් වැඩි වැඩියෙන් සිතත්ම ඇය තව තවත් බියට පත් වූවාය.

ඇයට අවශ්‍ය නොවූ නමුත්, ඇය තම මව සමඟ වූ වාදය නැවත සිහිපත් කළාය. සති ගණනාවක් ගත වීමෙන් පසුවත්, ඒ වදන් තවමත් වේදනා දුන්නේය.

පර්සිගේ මව හමුවී ආපසු එන ගමනේදී ඇනබෙත්ට ඉහළ නැගෙනහිර පැත්තේ උප වීථිකින් පැමිණීමට සිදුවිය පර්සි අතුරුදහන් වූ දිගු මාස ගණනාව තුළ, සැලී ජැක්සන්ට සහ ඇගේ සැමියා පෝල්ට, සෙවීම් කටයුතු පිළිබඳ දැන්වීමටත්, පර්සි හොඳින් සිටිනු ඇතැයි යන සිතුවිල්ල එකිනෙකා අතර බෙදා ගනිමින් සැලීට ශක්තියක් වීමටත්, සතියකට වරක්වත් ඇනබෙත්ට එම ගමන යාමට සිදුවිය.

විශේෂයෙන්ම වසන්තය දුෂ්කර කාලයක් විය. එතැන් සිට, ඔහුව රෝම පාර්ශවය වෙත යැවීමේ කටයුත්තට සම්බන්ධ වීම හේරාගේ සැලසුම බව පෙනී ගිය විට පර්සි ජීවතුන් අතර සිටින බවට බලාපොරොත්තු තබා ගැනීමට ඇනබෙත්ට හේතුවක් ලැබිණි. එහෙත් ඔහු කොහේ සිටින්නේ දැයි ඇයට සහතික කර කීමට නොහැකි විය. ජේසන්ට තම පරණ කඳවුර ගැන අතනින් මෙතනින් මතකයක් තිබුණත්, සියලු ග්‍රීක මැජික්වලට- හෙකාටිගේ කුටියේ සිටි අයට පවා- පර්සි එහි සිටින්නේද හෝ වෙනත් තැනක සිටින්නේද යන්න තහවුරු කිරීමට නොහැකි විය. ඔහු මේ ග්‍රහලෝකයෙන්ම අතුරුදහන්ව ගොස් ඇති බව පෙනුණි. රේචල් සහ ඔරකල් අනාගතය කියැවීමට උත්සාහ දැරූ අතර, ඇයට එතරම් දෙයක් දැනගත නොහැකි විය. ඔවුන්ට රෝමවරු සම්බන්ධ කරගැනිමට හැකි වීමට පෙර, ලියෝ ආගෝ II නිමකළ යුතු බව ඇයට හැඟී ගියාය.

එසේ නොවුණ හොත්, පර්සි පිළිබඳ එන සෑම කටකතාවකම මුලාශ්‍ර සොයමින් ඇනබෙත් ඇගේ කාලය ගෙවනු ඇත. ඇය ස්වභාවික ආත්මයන්ට කතාකර තිබුණාය, රෝමය ගැන පුරාවෘත්ත කියවා, ඩායිඩාලුස්ගේ සටහන් පොතින් සාක්ෂි අහුලාගෙන ඒ අතරම සෑම මිත්‍රශීලී ආත්මයකින්ම ඇයට හමුවන උප දෙවියන් හෝ රාක්ෂයන්ගෙන් ලැබෙන අයිරිස්[1] පණිවුඩ වලට රන් ඩ්‍රැච්මා[2] සියග ණනක් වියදම් කළාය. එහෙත් ඒ කිසිවකින් පලක් නොවීය.

1 ග්‍රීක දේදුණු දෙවඟන හා දෙවියන්ගේ පණිවුඩකරුවාය. තාවුමස් සහ ඉලෙක්ට්‍රාගේ දියණියයි. රෝම ස්වරූපයද අයිරිස් මය.

2 පැරණි ග්‍රීසියේ රිදී කාසියකි.

ඒ විශේෂිත සන්ධ්‍යාවේ, සැලී හමු වී ආපසු එමින් සිටියදී ඇනබෙත්ට වෙනදාට වඩා අමුතු හැඟීමක් දැනිණි. ඇයත්, සැලීත් මුලින් හැඬුහ. ඉන්පසු එකිනෙකා වැළඳ ගත්හ. අවසානයේ ඇනබෙත් ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් වෙත යන ලෙක්ෂින්ටන් මාර්ගයට පිවිසියාය.

ඉහළ නැගෙනහිර පැත්තේ සිටි ඇගේ උසස් පාසලට යාමට තවත් මාර්ග තිබිණි. එහෙත් ඇනබෙත් ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් පර්යන්තය අතරින් යාමට ප්‍රිය කළාය. අලංකාර සැලසුම සහ විශාල විවෘත අවකාශය ඇයට ඔලිම්පස් කන්ද සිහිපත් කරවීය. දැවැන්ත ගොඩනැගිලි ඇයට සුවදායී හැඟීමක් ගෙන ආවේය.

ඇය අමෙරිකානු රසකැවිලි හල පසුකළා පමණි. පර්සිගේ මව සේවය කළේ ඒ රසකැවිලි සාප්පුවේය. රස කැවිලි මිලදී ගැනීමට එතුළට යාමට සිතමින් සිටින විට, ඇතීනා බිත්තියේ තිබූ මාර්ග සිතියම පරීක්ෂා කරන අයුරු ඇයට දැකගැනිමට ලැබිණි.

''අම්මා!'' ඇනබෙත්ට එය විශ්වාස කළ නොහැකි විය. ඇය මාස ගණනකින් තම මව දැක නොතිබිණි- සියුස් විසින් ඔලිම්පස්හි ගේට්ටු වසා සියලු උපදෙවිවරුන්ට එය තහනම් කළ පසු ඇයට තම මව දැකගැනිමට නොලැබිණි.

බොහෝ වාරයක්, ඇනබෙත් තම මව ඇමතීමට උත්සාහ කළාය. ඇගේ මඟ පෙන්වීම අයැදිමින්, කඳවුර තුළ ගත් සෑම ආහාර වේලකදීම පිළිස්සූ පුද යවමින් ඇය තම මව ඇමතීමට උත්සාහ කළත් ඇයට කිසිදු ප්‍රතිචාරයක් නොලැබිණි. කලිසමකින් සැරසී කඳු නඟින පාවහන් පැළඳ, රතු පැනල් කමිසයක් හැඳ දැන් ඇතීනා මෙහි සිටී. ඇගේ කළු කෙස්වැටිය උරහිස් මතින් විහිදා තිබිණි. දිගු සංචාරයකට සූදානමින් මෙන් ඇය ගමන් මල්ලක් පිටේ එල්ලාගෙන, සැරයටියක් සුරත දරා සිටියාය.

''මම ආපසු ගෙදර යන්න ඕනෙ,'' සිතියම අධ්‍යයනය කරමින් ඇතීනා පැවසුවාය. ''මාර්ගය සංකීර්ණයි. ඔඩිසියස් මෙතන හිටියනම් කියල මම ප්‍රාර්ථනා කරනවා. එයාට තේරුම් ගන්න පුළුවන් වෙයි.''

''අම්මා!'' ඇනබෙත් පැවසුවාය. ''ඇතීනා!''

දෙවඟන ඇය දෙසට හැරුණාය. ඇය ඇනබෙත්ව හඳුනාගත් බවක් නොපෙනුණි.

''ඒක මගේ නම වෙලා තිබුණා,'' දෙවඟන පැවසුවාය. ''ඒ ඔවුන් මාව මගෙ නගරයෙන් පිටමං කරන්න කළින්. මගේ අනන්‍යතාවය

ගන්න කලින්, මාට මෙහෙම කරන්න කලින්.'' ඇය පිළිකුලෙන් මෙන් ඇය හැඳ සිටි ඇඳුම් දෙස බැලුවාය. ''මම ආපහු ගෙදර යන්න ඕනෙ.''

කම්පනයට පත් ඇනබෙත් පිටුපසට විසි වූවාය. ''ඔයා... ඔයා... මිනර්වාද?''

''මට එහෙම කතා කරන්න එපා! දෙවඟනගේ අළු පැහැති දෑස් කෝපයෙන් දිලිසිණි. ''මම හෙල්ලකුයි, පළිහකුයි ගෙන යන්න පුරුදු වෙලා හිටියා. ජයග්‍රහණය මගේ අතේ රඳවාගෙන හිටියා. මම මීට වඩා ගොඩක් ඉහළ තැනක හිටියෙ.''

''අම්මා.'' ඇනබෙත්ගේ හඬ වෙව්ලන්නට විය. ''මේ මම, ඇනබෙත්, ඔයාගෙ දුව.''

''මගෙ දුව...'' ඇතීනා එය පුනරුච්ජාරණය කළාය. ''ඔව්, මගේ දරුවෝ පලිය ගනී. එයාලා රෝමවරු විනාශ කළ යුතුයි. බියකරු, නින්දිත, අනුන් කරන දේ කරන රෝමවරු. කඳවුරු දෙක වෙන්ව තැබිය යුතුයි කියලා හේරා වාද කළා. මම කිව්වා ''නෑ, එයාලට සටන් කරන්න දෙන්න, මගෙ දරුවන්ට කොල්ලකරුවන්ව විනාශ කරන්න දෙන්න කියලා.''

තම කන් වලට ඇසෙන තරමට ඇනබෙත්ගේ හදගැස්ම අධික විය. ''ඔයාට ඒක ඕනෙ වුණාද? ඒත් ඔයා බුද්ධිමත්. ඔයා තේරුම් ගත්තා රණකාමය හොඳයි අනිත් හැම-''

''එකවරක්!'' දෙවඟන පැවසුවාය. ''හිලව් කළා. පහකළා. කුසලානයක් වගේ කොල්ල කාලා මගේ ආදරණීය මව් භූමියෙන් රැගෙන ගියා. මම ගොඩක් පරාජය වුණා. මම දිවුරුවා මම කවදාවත් සමාව දෙන එකක් නෑ කියලා. මගෙ දරුවන්ටවත්.'' ඇය වඩාත් ළංව ඇනබෙත් දෙස බැලුවාය. ''ඔයා මගෙ දුවද?''

''ඔව්,''

දෙවඟන තම කමිස සාක්කුවෙන් යමක් පිටතට ගත්තාය. එය පැරණි පන්නයේ උමං මාර්ග ටෝකනයකි. ඇය එය ඇනබෙත්ගේ අතේ තැබුවාය.

''ඇතීනාගේ සලකුණ අනුගමනය කරන්න,'' දෙවඟන පැවසුවාය.

''මගේ පළිය ගන්න.''

ඇනබෙත් කාසිය දෙස බැලුවාය. ඇය එදෙස බලා සිටිද්දී නිව්යෝක් උමං මාර්ග ටෝකනය, පැරණි රිදී ඩ්‍රැච්මාවක් බවට පත්විය. ඒ අත්ලාන්තික්වරු පාවිච්චි කළ වර්ගයේ කාසියකි. එහි බකමූණකු දක්නට ලැබිණි. ඒ ඇතීනාගේ පූජනීය සත්ත්වයාය. එසේම එහි එක් පැත්තක ඔලිව් අත්තක්ද අනෙක් පැත්තේ ග්‍රීක අක්ෂරද කොටා තිබිණි.

*ඇතීනාගේ සලකුණ.*

ඒ මොහොතේදී එහි අර්ථය පිළිබඳ ඇනබෙත්ට කිසිදු අදහසක් නොතිබිණි. තම මව මෙසේ හැසිරෙන්නේ ඇයි දැයි ඇයට තේරුම් ගැනීමට නොහැකි විය. මිනර්වා වුවත් නැතත් ඇය මෙතරම් අවුල් නොවිය යුතුව තිබිණි.

''අම්මා...'' ඇය තම හඬ සෑහෙන තරමට අඩු කරගැනීමට උත්සාහ දැරුවාය. ''පර්සි අතුරුදහන් වෙලා. මට ඔයාගෙ උදව් ඕනෙ.'' ගයියා සහ යෝධයන් සමඟ සටනට කඳවුරු දෙක එකතු කිරීමට හේරා සැලසුම් කරන බව ඇය පැහැදිලි කළාය. එහෙත් දෙවඟන ඇගේ සැරයටියෙන් කිරි ගරුඬ පොළොවට ඇන්නාය.

''කොහෙත්ම නෑ,'' ඇය පැවසුවාය. ''රෝමයට උදව් කරන ඕනෙම කෙනෙක් විනාශ විය යුතුයි. ඔයා එයාලට එකතු වෙනවා නම්, ඔයා මගෙ දරුවෙකුත් නෙමෙයි. ඔයා දැනටමත් මාව අසමත් කරලා තියෙන්නෙ.''

''අම්මේ!''

''මට මේ පර්සිගෙන් ඇති වැඩක් නැහැ. එයා රෝමවරු එක්ක යනව නම්, එයාට විනාශ වෙන්න ඉඩහරින්න. ඔහුව මරා දමන්න. හැම රෝමවරයෙක්ම මරන්න. සලකුණ හොයා ගන්න. ඒකෙ මූලාශ්‍රය අනුගමනය කරන්න. රෝමය මට කොච්චර නින්දා කළාද කියන එකට සාක්ෂිකාරයෙක් වෙන්න, ඒ වගේම පළිගැනීමට ප්‍රතිඥා දෙන්න.''

''ඇතීනා කියන්න පළිගැනීමේ දෙවඟන නෙමෙයි.'' ඇනබෙත් පැවසුවාය. ඇගේ අත මිට මෙලවිණි. රිදී කාසියේ උණුසුම වැඩිවන බව ඇගේ අතට දැනිණි. ''පර්සි තමයි මට හැමදෙයක්ම.''

''ඒ වගේම පළිගැනීම තමයි මට හැමදෙයක්ම,'' දෙවඟන ගෙරවූවාය. ''අපි අතරින් කවුද නුවණැතිම?''

''ඔයාට මොකක්හරි වෙලා තියෙනවා. මොකක්ද වුණේ?''

''රෝමයයි වුණේ!'' දෙවඟන දැඩිව පැවසුවාය. ''බලන්න එයාල මොනවද කළේ කියලා, මගෙන් රෝම කෙනෙක් හැදුවා. එයාලා මාව රෝම දෙවඟනක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවද? එහෙමනම් එයාලට එයාලගෙම යක්ෂ රසය බලන්න ඉඩ දෙන්න. ඔවුන්ව මරා දමන්න, දරුවා.''

''නෑ!''

''එහෙනම් ඔයාගෙන් වැඩක් නැහැ.'' දෙවඟන උමං මාර්ගයේ සිතියම දෙසට හැරුණාය. ඇගේ ඉරියව් මෘදු වී, ව්‍යාකූල සහ අවධානයෙන් තොර වූවක් බවට පත්විය. ''මට මාර්ගය හොයාගන්න පුළුවන් වුණොත්, ගෙදරට යන පාර, එහෙනම් සමහරවිට, ඒත් නෑ. මම වෙනුවෙන් පළිගන්න, නැත්නම් පිටවෙන්න. ඔයා මගෙ දරුවෙක් නෙමෙයි.''

ඇනබෙත්ගේ ඇසිපිය ගැසීම නැවතිණි. බියකරු දේ දහසක් සිතට නැගුණත්, ඇයට ඒවා පැවසීමට වුවමනා වුවත්, එය කළ නොහැකි විය. ආපසු හැරුණු ඇය එතැනින් ඉවතට ඇදුණාය.

ඇය රිදී කාසිය විසිකර දැමීමට උත්සාහ කළත්, පර්සිගේ රිප්ටයිඩය මෙන් ඉබේටම එය ඇගේ සාක්කුවේ රැඳිණි. අවාසනාවකට, ඇනබෙත්ගේ ඩ්‍රැච්මාවට ඉන්ද්‍රජාලික බලයක් නොතිබිණි. අවමවශයෙන් එයින් කිසිදු ප්‍රයෝජනයක් ද නොවීය.

එයින් වූයේ ඇයට බියකරු සිහින පෙනීම පමණි. ඇය කොතරම් උත්සාහ කළත් ඇයට ඉන් ගැලවී ගත නොහැකි විය.

දැන්, ආගෝ II හි ඇගේ කුටියේ හිඳගෙන සිටින විට ඇගේ සාක්කුවේ ඇති රිදී කාසිය උණුසුම් වන බව ඇයට දැනුණේය. පරිගණක තිරයේ දිස්වන පාතිනොන් හි ආකෘතිය දෙස බලාගෙන ඇය ඇතීනා සමඟ වූ වාදය ගැන සිතන්නට වූවාය. ගෙවුණු දින කීපයේ ඇයට අසන්නට ලැබුණේ වාක්‍ය ඛණ්ඩ ඇගේ හිස තුළ කරකැවෙන්නට විය. *අති දක්ෂ මිත්‍රයෙක්, ඇගේ අමුත්තා සඳහා සූදානම, කිසිවෙකුට ඒ ප්‍රතිමාව සොයාගැනීමට නොහැකි වනු ඇත. නුවණේ දියණිය හුදෙකලාව ඇවිදියි.*

අවසානයේ ඒ සියල්ලේ අරුත තේරුම්ගත් විට ඇය බියට පත් වූවාය. ඇය නිවැරදි නොවේවායි ඇය දෙවියන්ට යාච්ඤා කළාය. ඇගේ දොරට තට්ටු කරන හඬින් ඇය නැගිට්ටවිණි.

ඒ පර්සි වන්නට ඇතැයි ඇය බලාපොරොත්තු වූ නමුත්, ඒ වෙනුවට ෆ්‍රෑන්ක් ෂැන්ග්ගේ හිස ඇතුළට එබුණේය.

''මි... සමාවෙන්න,'' ඔහු පැවසුවේය. ''මට -?''

ඔහුව දැකීම ඇය පුදුමයට පත්කරවන්නක් වූ අතර, ඔහුට කුටිය තුළට පැමිණීමට අවශ්‍ය වී ඇති බව අවබෝධ කරගැනීමට ඇයට මොහොතක් ගත විය.

''සත්තකින්ම,'' ඇය පැවසුවාය, ''ඔව්,''

ඇතුළට පිවිසි ඔහු කුටිය හාත්පස දෙනෙත් යැව්වේය. එහි දැකීමට තරම් දෙයක් නොතිබිණි. ඇගේ මේසය මත වූයේ පොත් රාක්කයක්, ලේඛනයක්, පෑනක් සහ ඇගේ පියා සොප්විත් කැමල් ද්විත්ව තටු සහිත ගුවන්යානයේ පියාසර කරන ඡායාරූපයකි. ඇනබෙත් ඒ ඡායාරූපයට ප්‍රිය කළාය. ඔහුට සමීපව සිටි කාලය ඒ ඡායාරූපයෙන් ඇගේ මතකයට නැංවිය. ඒ ඔහු දිව්‍යමය ලෝකඩ මැෂින් තුවක්කු වලින් රාක්ෂ සේනාංකයට එරෙහිව සටන් වැදී කාලයේය.

බිත්තියේ සවිකළ කොක්ක ඇගේ නිව්යෝක් යැංකි හිස්වැස්ම රඳවා තිබිණි. ඒ ඇයට මවගෙන් ලැබුණු ඇය සන්තකයේ තිබූ වටිනාම දෙය විය. කලෙක එම හිස්වැස්මට එය පැළඳි පුද්ගලයාව අදෘශ්‍යමාන කිරීමේ හැකියාව පැවතිණි. ඇනබෙත් ඇතීනා සමඟ වාදකළ දිනයේ සිට, හිස් වැස්මට එහි ඉන්ද්‍රජාලික බලය අහිමි විය. ඒ ඇයි දැයි යන්න හරිහැටි පැවසීමට ඇනබෙත්ට නොහැකි වුවත්, ඇය ගවේෂණයේදී එය රැගෙන ගියාය. සෑම උදෑසනකම එය හිසේ දමා ඇය උත්සාහ කළේ, එය නැවත ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂාවෙනි. එහෙත් තවදුරටත් එය ඇගේ මවගෙන් ලද සිහිවටනයක් පමණක් විය.

ඒ හැර ඇගේ කුටිය හිස්ව පැවතිණි. ඇය එය පිරිසිදුවටත්, සරලවත් තබා ගත්තේ එය ඇයට සිතීමට උපකාර වන බැවිණි. ඇය නිතරම ඉහළ තරාතිරමක සිටි බැවින් පර්සි කිසිවිටෙකත් එය විශ්වාස නොකළේය. එහෙත් බොහෝ උප දෙවිවරුන් මෙන්, ඇයත් ADHD වලින් පෙලුණාය. ඇගේ පෞද්ගලික අවකාශයේ පමණට වැඩි විකර්ෂණ තිබෙනවිට ඇයට සිත එකඟ කර ගැනීමට නොහැකි විය.

''ඉතිං... ෆ්‍රෑන්ක්,'' ඇය විමසුවාය, ''මොනවද මගෙන් කෙරෙන්න ඕනෙ.''

නෞකාවේ වූ අනෙක් පිරිස අතුරින් ඇයව හමුවීමට අඩුවෙන්ම පැමිණෙන තැනැත්තා වූයේ ෆ්‍රෑන්ක්ය. ඔහු තම සාක්කුවෙන් චීන මාංචු යුගල අතට ගන්නා විටත් ඇගේ ව්‍යාකූල බවෙහි අඩුවක් නොතිබිණි.

''මම මේ ගැන නොදන තියාගන්න කැමති නෑ. ''ඔහු මිමිනුවේය. ''ඔයාට පුළුවන්ද මට ප්‍රයෝගය පෙන්වන්න? මට මේක වෙන කෙනෙක්ගෙන් අහන්න හිතෙන්නෙ නෑ.''

ඇනබෙත්ට අමුතු ගෞරවණීය හැඟීමක් දැනිණි. ෆ්‍රෑන්ක්ට ඇය ගැන විශ්වාසයක් ඇති වී තිබිණි. අනෙක් අතට දැනුම සොයන කාහට වුවත් උදව් කිරීමට ඇය පැකිලුනේ නැත- චීන මාංචු යුගලක් වැනි සරල දෙයක් ගැන පවා කියා දීමට ඇය පැකිලුනේ නැත.

ඇය හිඳගෙන සිටි බංකුවේ පැත්තකට තට්ටු කළාය. ''ඉඳගන්න.''

සැනෙකින් පැන යාමට සූදානමින් මෙන් ෆ්‍රෑන්ක් මෙට්ටයේ දාරයෙන් හිඳ ගත්තේය. චීන මාංචු කුට්ටම අතට ගත් ඇනබෙත් එය පරිගණකයේ පසෙකින් ඔසවා ගත්තාය.

අධෝරක්ත පරිලෝකනය සඳහා ඇය එහි යතුරක් එබුවාය. තත්පර කීපයකට පසු චීන මාංචු කුට්ටමේ ත්‍රිමාණ ආකෘතියක් තිරයේ දිස්විය. ෆ්‍රෑන්ක්ට දැකගත හැකි පරිදි ඇය පරිගණක තිරය ඔහු දෙසට හැරවූවාය.

''ඔයා කොහොමද ඒක කළේ?'' ඔහු පුදුමයෙන් විමසුවේය.

''කැපුම්- දාර පැරණි ග්‍රීක තාක්ෂණය,'' ඇය පැවසුවාය. ''හරි බලන්න. මේක සිලින්ඩරාකාර ද්වි අක්ෂ ගෙත්තමක්, ඉතිං ඒකට විශිෂ්ට ප්‍රත්‍යාස්ථ බවක් තියෙනවා.'' ඇය රූපයට විධානයක් දුන් විට එය එකෝඩියන් එකක් මෙන් පිටතටත් ඇතුළටත් මිරිකෙන්නට විය. ''ඔයාගෙ ඇඟිලි ඇතුළට දැම්මම, ඒක ඉහිල් වෙනවා. ඒත් ඔයා ඇඟිලි එළියට ගන්න උත්සාහ කරන කොට පරිධිය ඇකිලෙනවත් එක්කම ගෙත්තම ඇඟිලි අල්ලගෙන හිරකර ගන්නවා. එතකොට ඇඟිලි එළියට ඇදල නිදහස් කරන්න දැඟලුවට වැඩක් නැහැ.''

ෆ්‍රෑන්ක් ඇසිපිය නොහෙලා ඇය දෙස බලා සිටියේය. ''ඒත් මොකක්ද පිළිතුර?''

''හොඳයි...'' ඇය තම ගණනය කිරීම්වලින් කීපයක් ඔහුට පෙන්වූවාය. වියමන සඳහා යොදාගත් ද්‍රව්‍ය අනුව එය ඇදහිය නොහැකි ආතතියකදී පවා ඉරී නොයන අන්දම ඇය පෙන්වා දුන්නාය. ''වියන

ලද දෙයක් සම්බන්ධයෙන් තරමක් පුදුම සහගතයි නේද? වෛද්‍යවරු ඒවා සංකර්ෂක සහ විදුලි සංකෝචක විදියට යොදා ගන්නවා.

''ආහ්, ඒත් පිළිතුර?''

ඇනබෙත් සිනාසුණාය. ''ඔයා මාංචුවලට එරෙහිව සටන් කරන්න එපා. ඔයාගෙ ඇඟිලි ඇතුළට තල්ලු කරන්න. එළියට නෙමෙයි. ඒකෙන් වියමන ලිහිල් වෙනවා.''

''ආහ්,'' ෆ්‍රැන්ක් එය උත්සාහ කර බැලුවේය. එය වැඩ කළේය. '''ස්තුතියි, ඒත්... ඔයාට ඒක මට ත්‍රිමාණ වැඩසටහන් සහ ගණනය කිරීම් නැතුව පෙන්වන්න බැරිද?''

ඇනබෙත් පැකිලුනාය. සමහර විටෙක දැනුම පැමිණෙන්නේ අද්භූත ස්ථානවල සිටිය. ''මම හිතනවා ඔයා හරි කියලා. ඒක මෝඩකම. මමත් දෙයක් ඉගෙනගත්තා.''

ෆ්‍රැන්ක් නැවත වරක් මාංචු කුට්ටම උත්සාහ කළේය. ''ඔයා වියමන දැනගෙන ඉන්නවානම් ඒක ලේසියි.''

''හොඳම උගුල්වලින් බොහොමයක් සරලයි,'' ඇනබෙත් පැවසුවාය. ''ඔයා ඒ ගැන හිතන්න ඕනෙ, ඒ වගේම ඔයාගේ ගොදුර ඒක නොහිතයි කියලා බලාපොරොත්තු වෙන්න ඕනෙ.''

ෆ්‍රැන්ක් හිස සැලුවේය. ඔහු පිටව යාමට අකැමැති බව පෙනිණි. ''ඔයා දන්නවනෙ.'' ඇනබෙත් පැවසුවාය. ''ලියෝ හිතල මතල දෙයක් කියන කෙනෙක් නෙමෙයි. එයාට තියෙන්නෙ ලොකු කටක්. මිනිස්සු එයාව අවුල් කරන කොට එයා ආරක්‍ෂාවට කවටකම පාවිච්චි කරනවා.''

ෆ්‍රැන්ක් මුහුණ හැකිළුවේය. '' මම මොකටද එයාව අවුල් කරන්නේ?''

''ඔයා එයා වගේ දෙකක් විතර ඇති. ඔයාට මකරෙක් බවට පත් වෙන්න පුළුවන්. ඒ වගේම හේසාල් ඔයාට කැමතියි.'' ඇනබෙත් එසේ සිතුවත් ඇය එය නොපැවසීමට ප්‍රවේසම් වූවාය.

ෆ්‍රැන්ක් එය ඒත්තු ගත් බවක් නොපෙනුණි. ''ලියෝට ගින්දර කැඳවන්න පුළුවන්.'' ඔහු මාංචුව නැමුවේය. ''ඇනබෙත්, සමහරවිට, එච්චර සරල නොවන වෙන ප්‍රශ්නෙකදී ඔයාට මට උදව් කරන්න වෙයි. මම හිතන්නේ ඔයා ඒකට කියන්නේ ඇචිලස්ගේ අඩිය කියලයි.

තමා රෝමවරුන්ගේ උණුසුම් චොකලට් පානය කළා වැනි හැඟීමක් ඇනබෙත්ට දැනිණි. ''මට ඒ ගැන සතුටුයි.'' ඇය පැවසුවාය. ''වෙන කවුරුහරි මේ ඇචිලස්ගේ අඩිය ගැන දන්නවද?''

''පර්සි සහ හේසාල්,'' ඔහු පැවසුවේය. ''එච්චරයි. පර්සි... එයා ඇත්තටම හොඳ හාදයෙක්. මම ඕනෙ තැනකදි එයාව අනුගමනය කරනවා.''

ඇනබෙත් ඔහුගේ අතට තට්ටුවක් දැමුවාය. ''පර්සි හොඳ යාලුවො හොයා ගන්න දක්ෂයි. ඔයා වගේ. ඒත් ෆ්‍රෑන්ක්, ඔයාට මේ නැවේ ඉන්න ඕනෙම කෙනෙක්ව විශ්වාස කරන්න පුළුවන්. ලියෝ වුණත්. අපි හැමෝම කණ්ඩායමක්. අපි එකිනෙකාව විශ්වාස කළ යුතුයි.''

''ම... මම එහෙම හිතනවා.''

''එහෙනම් මොකක්ද ඔයා කරදර වෙන්න හේතුව?''

රාත්‍රී ආහාරයට සීනුව නාද විය. ෆ්‍රෑන්ක් නැගී සිටියේය.

''සමහරවිට... සමහරවිට පසුව,'' ඔහු පැවසුවේය. ''ඒක කියන්න අමාරුයි. ඒත් ස්තූතියි ඇනබෙත්.'' ඔහු චීන මාංචුව එසවීය. ''ඒක සරල කළාට.''

# 18
# ඇනබෙත්

ඒ රාත්‍රියේ බියකරු සිහිනවලින් තොරව ඇනබෙත් නිදාගත්තාය. එහෙත් කුණාටුවකට පෙර ඇතිවන නිශ්චලබව වැනි වූ ඒ නින්ද ඇය අවදි වූ පසු සිත නොසන්සුන් කරවන්නක් විය.

ලියෝ චාල්ස්ටන් වරායේ, මුහුදු ප්‍රාකාරයට හරියටම දකුණින් පිහිටි ජැටියේ නෞකාව නැංගුරම් ලෑවේය. වෙරළ තීරය ඔස්සේ වූ ඓතිහාසික ප්‍රදේශයේ උසැති දෙව් මැදුරු, පාම් ගස් සහ පිරිසිදු යකඩයෙන් කළ වැටවල් දැක ගැනීමට ලැබිණි. පෞරාණික කාලතුවක්කු මුහුද දෙසට යොමු වී තිබිණි.

මේ වනවිට ඇනබෙත් නැව් තට්ටුව මතට පැමිණ සිටියාය. ජේසන්, ෆ්‍රෑන්ක් සහ ලියෝ දූනටමත් කෞතුකාගාරය බලා පිටත්ව ගොස් සිටියහ. කෝච් හෙජ්ට අනුව, ඔවුන් හිරු බැස යද්දී නැවත පැමිණීමට පොරොන්දු වී සිටියහ. පිපර් සහ හේසාල් ගමනට සූදානම්ව සිටියත්, මුලින්ම ඇනබෙත් වැටට වාරු වී මුහුදු බොක්ක දෙස බලා සිටි පර්සි දෙසට හැරුණාය.

ඇනබෙත් ඔහුගේ අත අල්ලා ගත්තාය. ''අපි ගියාම ඔයා මොනවද කරන්න හිතාගෙන ඉන්නෙ?''

''වරායට පැනගන්නවා,'' ඔහු සැහැල්ලුවෙන් පිළිතුරු දුන්නේය. ''මට දේශීය නෙරීඩ්ලා එක්ක කතා කරන්න ඕනෙ. සමහර විට එයාලට පුළුවන්වෙයි ඇට්ලැන්ටාවල හිරකරගෙන ඉන්න අයව බේරගන්නෙ කොහොමද කියලා උපදේශයක් දෙන්න. අනිත් අතට,

මුහුද මට හොඳ තැනක් වෙයි. අර මින්මැදුර මාව අපිරිසිදු කළා වගේ හැඟීමක් දැනෙන්නෙ.''

ඇනබෙත් ඔහුව සිපගත්තාය. ''සුබ පැතුම් පාසි මොළයෝ. ඉක්මනට මා ළඟට එන්න. හරිනේ?''

''මම එනවා,'' ඔහු පොරොන්දු විය. ''ඔයත් එහෙම කරන්න.'' ඇනබෙත් ඇය තුළ වූ ව්‍යාකූල බව සඟවා ගැනීමට උත්සාහ කළාය. ඇය පිපර් සහ හේසාල් දෙසට හැරුණාය. ''හරි, කෙල්ලනේ, අපි බැටරිවල භූතයව හොයා ගමු.''

ඉන්පසු, ඇනබෙත් ප්‍රාර්ථනා කළේ තමන්ටත් පර්සි සමඟ වරායට යාමට හැකි වුවා නම් කියාය. භූතයන්ගෙන් පිරි කෞතුගාරයටද ඇය ප්‍රිය කළාය.

හේසාල් සහ පිපර් සමඟ කාලය ගත කිරීම ගැන ඇය තැකීමක් නොකළාය. මුළදී ඔවුන්ට සුළු වේලාවක් තුළ බැටරි දෙසට ඇවිද යාමට හැකිවිය. සංඥා පුවරුවලට අනුව, මුහුද පැත්තේ වූ උද්‍යානය වයිට් පොයින්ට් උද්‍යානය ලෙස හැඳින්විණි. මුහුදු සුළඟින් ග්‍රීෂ්ම සන්ධ්‍යාවේ දාහය පළවා හැරි අතර, කුඩා පාම් ගසක සෙවණේ සුවදායී සිසිලසක් පැවතිණි. මාර්ගයේ පෙළට පැරණි සිවිල් යුද්ධයේ කාලතුවක්කු සහ ඓතිහාසික විරුවන්ගේ ලෝකඩ ප්‍රතිමා පිහිටුවා තිබිණි. එය ඇනබෙත්ව වෙව්ලුවාලීමට සමත් විය. ටයිටන් යුද්ධ සමයේ නිව්යෝක් නගරයේ වූ ප්‍රතිමා ඇගෙ සිහියට නැගිණි. ඩායිඩාලුස්ගේ නියෝග අනුක්‍රම 23 ට පින්සිදු වන්නට ඒවාට ප්‍රාණය ලැබිණි. රට පුරා තවත් ප්‍රතිමා කොපමණ ප්‍රමාණයක් ක්‍රියාත්මක වීමේ බලාපොරොත්තුවෙන් නිහඬව සිටිනවා දැයි ඇය නොදැන සිටියාය.

චාල්ස්ටන් වරාය හිරුගේ දීප්තියෙන් බබලමින් තිබිණි. උතුරටත්, දකුණටත් දෑත් විදහා ලූ කලෙක මෙන් මුහුදු බොක්කට සමීපයෙන් භූමි තීරය පැතිර ගියේය. සැතපුමක් පමණ ඈතින් වූයේ පාෂාණ බලකොටුවක් සහිත දූපතකි. සිවිල් යුද්ධයේදී මේ බලකොටුව බෙහෙවින් වැදගත් තැනක් වූ බවට අනුමාන මතකයක් ඇනබෙත් තුළ තිබුණත්, ඇය ඒ ගැන සිතීමට වැඩි කාලයක් වැය නොකළාය.

මුහුදු සුළඟ වැඩියෙන් ආඝ්‍රාණය වනවිට ඇයට පර්සිව මතකයට නැගිණි. මුහුදු ප්‍රාකාරයෙන් ඉවතට හැරී ගොඩබිම තුළට වන්නට පිහිටි උද්‍යානය ගවේෂණය කිරීමට පටන් ගත්විට ඇයට මඳ අස්වැසිල්ලක් දැනුණි.

උද්‍යානයේ ජනාකීර්ණ වී නොතිබිණි. නගරවැසියන් බොහෝ දෙනෙක් ග්‍රීෂ්ක නිවාඩුවට ගොස් ඇතැයි ඇනබෙත් සිතුවාය. ඔවුහු දකුණු බැටරි වීථිය ඔස්සේ ගැටූහ. එහි එක පෙළට තට්ටු හතරේ යටත් විජිත දෙව්මැදුරු පිහිටා තිබිණි. ඒවායේ ගඩොල් බිත්ති වැල්වලින් වැසී තිබුණේය. ගොඩනැගිලි වල ඉදිරිපස රෝම දේවස්ථානවල මෙන් සුදු පැහැති කුලුනු විය. ඉදිරිපස උද්‍යානවල රෝස පඳුරු, බෝගන්විලා වැනි මල්වර්ග වැඩී තිබුණි. දශක කීපයකට පෙර මල් වැවීමට ඩෙමිටර් විසින් කාලගණකයක් පිහිටුවා පසුව පැමිණ එය පරීක්‍ෂා කිරීමට අමතන වූ ආකාරයෙන් ඒවා දිස්විය.

''මට නව රෝමය මතක් වෙනවා,'' හේසාල් පැවසුවාය. ''මේ දැවැන්ත දෙව්මැදුරු සහ උද්‍යාන සේරම. කුලුනු සහ ආරුක්කු.''

ඇනබෙත් හිස සැලුවාය. ඇයට ඇමෙරිකාවේ දකුණ සිහිපත් විය. සිවිල් යුද්ධයට පෙර එය නිතරම සංසන්දනය කළේ රෝමය සමඟය. අතීතයේදී ඔවුන්ගේ සමාජය ගෘහනිර්මාණය, ගෞරවය සහ නයිට්වරුන්ගේ ව්‍යවස්ථාව ගැන උදම් ඇනූහ. එසේම අයහපත් පැත්ත වූයේ වහල් ක්‍රමයයි. රෝමයට වහලුන් ඉන්නවා, සමහර දකුණේ අය වාද කළහ. එහෙමනම් ඇයි අපිට බැරි?

ඇනබෙත් වෙව්ලා ගියාය. ඇය මෙහි ගෘහනිර්මාණයට ප්‍රිය කළාය. මන්දිර සහ උද්‍යාන අතිශය අලංකාර විය. සැබැවින්ම රෝම ලක්‍ෂණ ඒවායේ තිබිණි. එහෙත් ඒ අලංකාරය දුෂ්ට ඉතිහාසයකින් වසා තිබෙන්නේ ඇයි දැයි ඇය පුදුම වූවාය. එසේත් නැතිනම් සමහරවිට වෙනත් විදිහක් වන්නට ඇත. සමහරවිට දුෂ්ඨ ඉතිහාසයට ඒ අලංකාර දේවල් ඉදිකිරීම අවශ්‍ය වන්නට ඇත. ඒ ඔවුන්ගේ අඳුරු ආකාරයන් වසා දමන වෙස්මුහුණක් ලෙසය.

ඇය හිස සැලුවාය. ඇය එතරම් දාර්ශනික වීම පර්සි ප්‍රිය නොකරන්නක් වනු ඇත. ඇය එවැන්නක් ඔහු සමඟ කතා කිරීමට උත්සාහ කළේ නම් ඔහුගේ දෑස් වැසී යන්නේය.

අනෙක් කෙල්ලන් වැඩි දෙයක් කතා කළේ නැත.

වටකිරීමක් අපේක්‍ෂා කළාක් මෙන් පිපර් වටපිට බැලුවාය. තම පිහිතලයෙන් ඇය මෙම උද්‍යානය දුටු බව ඇය පවසා තිබුණත්, ඇය එය විස්තරාත්මකව පැවසූවේ නැත. ඇය බියපත් වන්නට ඇතැයි ඇනබෙත් අනුමාන කළාය. සේරටමත් වඩා, පිපර් තම පිහියෙන්

දුටු දර්ශනය තේරුම් කර දීමට උත්සාහ දරද්දී, පර්සි සහ ජේසන් කන්සාස්වල එකිනෙකා මරා ගන්නා සටනක පැටලී සිටියහ.

හෙසාල් වෙනත් කල්පනාවක ගැලී සිටින බව පෙනිණි. සමහර විට ඇය අවට විපරම් කරමින් සිටිනවා විය යුතුය. එසේත් නැතිනම් තම සොහොයුරා ගැන සිත් තැවුලෙන් පසුවනවා විය හැකිය. දින හතරකට අඩු කාලයකදී ඔවුන්ට ඔහුව සොයා ගෙන නිදහස් කර ගැනිමට නොහැකි වුවහොත්, නිකෝ මිය යනු ඇත.

ඇනබෙත්ටත් මේ කාලසීමාව ගැන වැටහීමක් තිබුණාය. ඇයට නිතරම නිකෝ ඩි ආන්ජලො ගැන තිබුණේ මිශ්‍ර හැඟීමකි. ඔවුන් මායිනෙවල හමුදා ඇකඩමියෙන් ඔහුත් ඔහුගේ සොයුරිය බියන්කාත් ගලවාගත් දා සිට ඔහු තමාව මිරිකා දමූ බව ඇය සැක කළාය. එහෙත් ඇනබෙත්ට කිසිදා නිකෝ කෙරෙහි කිසිදු ආකර්ෂණයක් නොතිබිණි. ඔහු බෙහෙවින් ලාබාල වූ අතරම ඉක්මනින් නොසන්සුන් වන තැනැත්තෙක් විය. ඔහු තුළ ඇති මේ අන්ධකාරය ඇයව අපහසුතාවයට පත් කළේය.

තවමත්, ඔහු වෙනුවෙන් වගකිව යුතුය යන හැඟීමක් ඇය තුළ පැවතිණි. එකළ ඔවුන් හමු වූ විට දෙදෙනාගෙන් එක් අයෙකුවත් ඔහුගේ අර්ධ සොහොයුරිය හේසාල් ගැන නොදැන සිටියහ. ඒ කාලයේ නිකෝගේ ජීවතුන් අතර සිටි එකම පවුල වූයේ බියන්කා පමණි. ඇය මියගිය විට, නිකෝ උන්හැටිතැන් අහිමි වූ අනාථයකු බවට පත්වී ලොව පුරා අවිනිශ්චිතව ඇවිද ගියේය. ඇනබෙත්ට එය අදාළ වුවක් විය.

සදාකාලයේම උද්‍යානයේ ඇවිදිමින් සිටින තරමට ඇය ගැඹුරු කල්පනාවක ගැලී සිටියාය. පිපර් ඇගේ අතින් ඇද්දාය. ''අතන,'' ඇය වරාය පැත්ත පෙන්නුවාය. යාර සියයක් පමණ ඈතින් දිලිසෙන සුදු පැහැති රූපයක් ජලයට ඉහළින් පා වෙමින් සිටියේය. මුළදී එය බෝයාවක් හෝ, ජලය තුළින් දිස්වන බෝට්ටුවක පරාවර්තනයක් යැයි ඇනබෙත් සිතුවත්, පැහැදිලිවම එය දිලිසෙමින් සහ බෝට්ටුවකට වඩා මෘදු ලෙස චලනය වෙමින් ඔවුන් දෙසට එක එල්ලේ පැමිණෙමින් තිබුණේය. එය සමීපවත්ම, එය කාන්තාවකගේ රූපයක් බව ඇනබෙත්ට පෙනී ගියේය.

''භූතයා,'' ඇය පැවසුවාය.

''ඒ භූතයෙක් නෙමෙයි,'' හේසාල් පැවසුවාය. ''එච්චර දීප්තිමත්ව බබලන ආත්ම නැහැ.''

ඇනබෙත් ඇගේ වචනය පිළිගත්තාය. මෙතරම් තරුණ වියේ දී මරණයට පත් ව, යළි පාතාල ලෝකයෙන් පැමිණි හේසාල් ජීවත් වන්නවුන්ට වඩා මළවුන් ගැන දන්නා බව ඇනබෙත් දැන සිටියාය.

දැහැනකට සම වැදුණාක් මෙන්, වීරිය හරහා ගිය පිපර් සමුද්‍ර වැටියේ කෙළවරට සේන්දු වූවාය. අශ්ව කරත්තයක් ඇගේ ඇගේ ගැවී නොගැවී ඇදී ගියේය.

''පිපර්!'' ඇනබෙත් කෑ ගැසුවාය.

''අපි එයා පස්සෙන් යන එක හොඳයි,'' හේසාල් පැවසුවාය.

ටික වේලාවකින් ඇනබෙත්ට සහ හේසාල්ට ඇයව දැක ගැනීමට හැකි විය. භූතමය දර්ශනය යාර කීපයක් ඔබ්බෙන් පෙනිණි.

පිපර් ඒ දෙස බැලුවේ අමනාපයෙන් මෙනි.

''ඒ ඇයයි,'' ඇය මිමිණුවාය.

ඇනබෙත් ඇය අසලට ගැටුවාය. එහෙත් ඇගේ රූපය හඳුනා ගැනීමට නොහැකි තරමට එය දීප්තිමත් විය. ඉන්පසු එය සමුද්‍ර වැටිය මතට පාවී ගොස් ඔවුන් ඉදිරිපිට නැවතිණ.

ඇනබෙත් ගැස්සුණාය. කාන්තාව හදවත නවතින තරමට රූමත් වූවා පමණක් නොව පුදුමාකාර හුරුපුරුදු බවකින් ද යුක්ත විය. ඇගේ මුහුණ විස්තර කිරීමට අපහසු විය. ජනකාන්ත සිනමා තාරකාවකට සමාන රූප ලක්ෂණ ඇය කෙරෙන් දිස් විය. ඇගේ දෑස්වල පැහැය ක්ෂණයකින් වෙනස් විය. විටෙක කොළ පැහැති වූ ඒවා තවත් විටෙක නිල් පැහැති විය. නැතහොත් දුම්වල පැහැති විය. ඇගේ දිගු කෙස් වැටිය දුඹුරු පැහැයේ සිට තද චොක්ලට් පැහැය දක්වා වර්ණයන්ගෙන් යුක්ත විය.

ඇනබෙත්ට ක්ෂණික ඊර්ෂ්‍යාවක් ඇති විය. තමාටත් තද පැහැති කෙස්වැටියක් තිබුණේ නම් යැයි ඇය නිතර ප්‍රාර්ථනා කළාය. ඇගේ දුඹුරු කෙස් වැටිය කිසිවකු එතරම් ගණන් නොගන්නා හැඟීමක් ඇයට ඇති වී තිබිණි.

ජේසන් විස්තර කළ ආකාරයට ඇය දකුණුදිග රූප සුන්දරියක් මෙන් සැරසී සිටියාය. කෙසේවෙතත් තමාගේ ඊර්ෂ්‍යාව අහේතුක බව ඇනබෙත්ට වැටහුණේය. කාන්තාව මේ ආකාරයට ඇගේ හැඟීම්

සකසමින් සිටියාය. ඇය මීට පෙර ද එම අත්දැකීම ලබා තිබුණි. තත්පරයෙන් තත්පරය මුහුණ වෙනස් වෙමින් වඩ වඩාත් රූමත් වුවත්, ඇය මේ කාන්තාව හඳුනාගත්තාය.

''ඇප්‍රොඩයිට්,'' ඇය පැවසුවාය.

''වීනස් ද?'' හේසාල් පුදුමයෙන් විමසුවාය.

''අම්මේ,'' පිපර් උද්යෝගයකින් තොරව පැවසුවාය.

''කෙල්ලනේ!'' සියල්ලෝම එකට වැළඳ ගැනීමට මෙන් දෑත් විදහාලමින් දෙවඟන පැවසුවාය.

උප දෙවඟනන් තිදෙනා එයට අනුග්‍රහයක් නොදක් වූහ. හේසාල් නැවත පැල්මෙටෝ ගස අසලට ගියාය.

''ඔයාල මෙහෙ ආව එක ගැන මට හරිම සතුටුයි.'' ඇප්‍රොඩයිට් පැවසුවාය. ''යුද්ධය පැමිණෙනවා. ලේ හැලීමකට ආරාධනා කරනවා. ඉතිං, ඇත්තටම කරන්න තියෙන්නෙ එක දෙයයි.''

''ආහ්... ඒක?'' ඇනබෙත් ගොතගැසුවාය.

''ඇයි, නිසැකවම තේ එකක් බොන ගමන් කතා කරමු. එන්න මා එක්ක.''

ඇප්‍රොඩයිට් තේ හදන අයුරු දන සිටියාය.

උද්‍යානයේ මධ්‍යම කොටසේ පිහිටා තිබූ. ගිම්හාන කුටියට ඇය ඔවුන්ව කැඳවාගෙන ගියාය. එහි වූ මේසය මත රිදී ආලේපිත චීන කෝප්ප සහ දුම් දමන තේ බඳුනක් විය. ඇප්‍රොඩයිට් එයට ප්‍රවේශවත්ම විවිධ සුගන්ධයන් හමා ගියේය. විටෙක කුරුඳු සුවඳත්, එසේත් නැතිනම් සමන් පිච්ච සුවඳ හෝ මින්ට් සුවඳ කුටිය පුරා හමා ගියේය. එහි වූ තසිම් මත කේක්, බිස්කට් සහ රොටී වර්ග තබා තිබිණි. නැවුම් බටර් සහ ජෑම් ද එහි විය.

ඇප්‍රොඩයිට් මොණරකු හැඩැති පුටුවක අසුන් ගත්තාය. ඇය කෝප්ප වලට තේ දමා, රස කැවිලි වලින් සංග්‍රහ කළේ බිඳුවක් හෝ ඇගේ ඇඳුමේ නොවැටෙන පරිදිය.

ඔවුන් හිඳගෙන සිටි කාලය පුරාම ඇනබෙත්ගේ ඊර්ෂ්‍යාව තව තවත් වර්ධනය විය.

''ආහ්, මගේ ආදරණීය කෙල්ලනේ,'' දෙවඟන පැවසුවාය. ''මම චාල්ස්ටන්වලට ආදරෙයි! මේ ගිම්හාන කුටියේ දී විවාහ මංගල්‍ය

වලට සහභාගී වුණා. එයාලා මගේ ඇස්වලට කඳුළු ගෙනාවා. එයාලා හරිම ආදරණීයයි. මේ දෙව්මැදුරු වලින් බොහොමයක තවමත් මම වෙනුවෙන් එයාල ප්‍රතිමාවක් තියලා තියෙනවා, ඒත් එයාලා මට කියන්නෙ වීනස් කියලා.''

''ඔයා දෙන්නගෙන් කොයි එක්කෙනාද?'' ඇනබෙත් විමසුවාය.

''වීනස් ද, ඇප්‍රොඩයිට් ද?''

දෙවඟන තේ උගුරක් බිව්වාය. ඇගේ දෑස් දුෂ්ට ලෙස දිලිසිණි. ''ඇනබෙත් චේසි, ඔයා තරමක් රූමත් කෙල්ලක් විදිහට වැඩෙනවා. ඔයා ඇත්තටම ඔයාගෙ කොණ්ඩෙට මොනවහරි කරන්න ඕනෙ. ඒ වගේම හේසාල් ලෙවෙස්කි. ඔයාගේ ඇඳුම්.''

''මගේ ඇඳුම්?'' හේසාල් ඇගේ රැළි ගැසුණු ඩෙනිම දෙස බැලුවාය. ඒවායේ ඇති වරද කිමෙක්දැයි ඇයට වටහා ගත නොහැකි විය.

''අම්මා!'' පිපර් පැවසුවාය. ''ඔයා මට ලැජ්ජා කරනවා.''

''හොඳයි, ඒ ඇයි කියලා මට තේරෙන්නෙ නෑ.'' දෙවඟන පැවසුවාය.

''මොකද ඔයා මගෙ විලාසිතා ඉගි පිළිගන්නෙ නැති නිසා, පිපර්, ඒකෙන් කියවෙන්නෙ නෑ අනිත් අයට ඒව කරන්න එපා කියන එක. මට පුළුවන් ඇනබෙත් සහ හේසාල් වෙනුවෙන් ඉක්මන් පිරිනැමීමක් කරන්න. සමහරවිට මගෙ වගේ සේද ගවුමක්.''

''අම්මා!''

''අපූරුයි,'' ඇප්‍රොඩයිට් සුසුමක් හෙලුවාය. ''ඔයාගෙ ප්‍රශ්නෙට උත්තරේ තමයි, ඇනබෙත්, මම ඇප්‍රොඩයිට් සහ මිනර්වා දෙන්නම. මගේ බෙහෝ ඔලිම්පියානු සගයන් වගේ නෙමෙයි, එක වයසක ඉඳලා තව එකකට වෙනස්වෙන එක මට හරි අමාරුයි. අනික, මම කැමතියි මම වයසට ගිහින් නෑ කියල හිතන්න!'' ඇගේ අතැඟිලි ඇගේ මුහුණ පුරා සෙමින් දිව ගියේය. ''ආදරය කියන්නෙ ආදරය, අන්තිමට ඔයා ග්‍රීක වුණත් රෝම වුණත් එකයි. අනෙක් අයට තරම් මේ සිවිල් යුද්ධයෙන් මට බලපෑමක් වුණේ නෑ.''

*පුදුමයි,* ඇනබෙත් සිතුවාය. වඩාත් බුද්ධිමත්ම ඔලිම්පියානුවා වූ ඇගේ මව, උමං මාර්ගවල දුෂ්ට මෝඩයන්ගේ සෝෂාව සමඟ ඇවිද යන තරමට තත්ත්වයෙන් පහත හෙලුවාය. එසේම ඔවුන්ට උදව් කළ

සියලු දෙවිවරුන්ගෙන් ග්‍රීක රෝම අසමගියේ බලපෑම ඇති නොවූ කීපදෙනෙකු විය. ඒ ඇප්‍රොඩයිට්, නෙමිසිස් හා ඩියෝනීසස්ය. එනම් ආදරය, පළිගැනීම සහ වයින් ය.

හේසාල් සීනි විස්කෝතුවක් කෑවාය. ''අපි තවම යුද්ධයට ගියේ නැහැ, ආර්යාවනි.''

''ඕ... ආදරණීය හේසාල්.'' ඇප්‍රොඩයිට් ඇගේ අවාන හැකිලුවාය. ''එච්චර සර්ව ශුභවාදයක්, හදවත දෙදරවන දවස් ඔයාලට තවම පැමිණියේ නැහැ. ඒව තියෙන්නේ තව ඉස්සරහට. ඇත්ත වශයෙන්ම යුද්ධය පැමිණෙමින් තිබෙනවා. ආදරය සහ යුද්ධය නිතරම යන්නෙ එකට. ඒවා තමයි මානුෂීය හැඟීම්වල උපරිමය. අයහපත සහ යහපත, ලස්සන සහ කැත.''

ඕල්ඩ් සවුත් ගැන මුලින් ඇනබෙත් සිතමින් සිටියේ කුමක් දැයි දන්නා බව පෙන්වීමට මෙන් දෙවඟන ඇනබෙත් දෙස බලා සිනා නැගුවාය.

හේසාල් ඇගේ විස්කෝතුව කමින් සිටියාය. හේසාල් නොදැන සිටීම හෝ ඒ ගැන අවධානයක් නොදැක්වීම ගැන ඇනබෙත් සතුටු වූවාය.

''ඔයා මොකක්ද අදහස් කළේ?'' හේසාල් විමසුවාය. ''හද දෙදරවන දවස්?''

හේසාල් පුංචි බලු පැටියකු ලෙස සිතා දෙවඟන සිනාසුණාය. ''හොඳයි, ඇනබෙත්ට පුළුවන් ඔයාලට යම් අදහසක් දෙන්න. මම වතාවක් එයාට පොරොන්දු වුණා එයාගෙ ආදර ජීවිතය ප්‍රීතිමත් කරන බවට. එහෙම නේද?''

ඇනබෙත්ගේ අතින් තේ කෝප්පය ලිස්සා යාමට ආසන්න විය. වසර ගණනක්, ඇගේ හදවත බිඳී ගොස් තිබිණි. මුලින්ම ලූක් කැස්ටෙලාන් ය. ඒ ඇගේ ප්‍රථම ප්‍රේමය වුවත්, ඔහුට ඇයව පෙනුණේ කුඩා සහෝදරියක් ලෙසින් පමණකි. ඉන්පසු දුෂ්ටයකු බවට පත්වූ ඔහු මිය යාමට පෙර ඇයව මරා දැමීට තීරණය කළේය. ඊළඟට පැමිණියේ කෝපාවිෂ්ඨ නමුත් ප්‍රිය උපදවන පර්සිය. තවමත් ඔහු රේචල් නැමැති කෙල්ලට වහ වැටී ඇති බව පෙනුණ නමුත් කීපවරක්ම මැරෙන්න හැදුවේය. අවසානයේදී ඇනබෙත්ට පර්සි දිනාගත හැකි වූයේය. ඔහුව අහිමිව සිටියේ මාස හයක පමණ කාලයක් පමණක් වූ අතර ඒ කාලය පිළිබඳ ඔහුගේ මතකයද අහිමි වී තිබිණි.

''හොඳයි, මට ඔයාලගේ හැම ප්‍රශ්නෙකම වගකීම ගන්න බැහැ.'' දෙවඟන පැවසුවාය. ''ඒත් මම ආදර කතාව අගය කරනවා. ඔයාල හැම දෙනාටම අපූරු කතාවල් තියෙනවා. කෙල්ලන්නේ, ඔයාල මාව ආඩම්බර කරනවා.''

''අම්මා,'' පිපර් පැවසුවාය. ''ඔයා මෙහෙ ඉන්න එකට හේතුවක් තියෙනවද?''

''හ්ම්ම්? ආහ්, ඔයා කියන්නේ තේ හැරුණාමද? මම නිතරම මෙහෙට එනවා. මම මේ දර්ශනයට කැමතියි. මේ කැම වලට, මේ වාතයට- ඔයාලටත් පුළුවන් චමත්කාරජනක, හද බිඳින වාතයේ ගන්ධය විඳින්න. එහෙම නේද? ශතවර්ෂ ගාණක් වුණත්.''

ඇය ආසන්නයේ පිහිටි දෙව් මැඳුර පෙන්නුවාය. ''ඔයාලට පේනවද වහල මුදුනෙ තියෙන බැල්කනිය. ඇමෙරිකානු සිවිල් යුද්ධය පටන් ගත්ත දවසේ අපි එතෙන සම්භාෂණයක් තිබ්බා. *සම්ටර් කොටුවේ වෙඩි තැබීම.*''

''ඒක තමයි,'' ඇනබෙත්ගේ මතකයට නැගිණි. ''වරායේ තියෙන දූපත. සිවිල් යුද්ධයේ පළවෙනි සටන පටන් ගත්තේ එතැනින්. සන්ධාන කණ්ඩායම එක්සත් හමුදාවට වෙඩි තියල බලකොටුව අල්ලගත්තා.''

''ආහ්, ඒ වගේ සම්භාෂණයක්!'' ඇෆ්‍රොඩයිට් පැවසුවාය. ''හැමෝම තමන්ගේ නිල ඇඳුම් වලින් සැරසිලා හිටියා. කාන්තාවොත් එහෙමයි. ඔයාල ඒක දකින්නයි තිබුණේ! මම ඒරිස් එක්ක නැටුවා- එහෙම නැත්නම් මාර්ස්? මම ටිකක් තෝන්තු වෙලා හිටියෙ. ඒ වගේම ලස්සන විදුලි පහන් වරාය පුරාම දල්වලා තිබුණා.''

ඇනබෙත්ගේ තේ එක සීතල වී තිබිණි. ඇය කිසිවක් කෑවේ නැතත්, විසිකර දැමීමට සිතක් ඇතිවිය. ''ඔයා කියමින් ඉන්නේ එක්සත් ජනපද ඉතිහාසයේ ලේ වැකුණු යුද්දය ගැනයි. මිනිස්සු හය ලක්ෂයකට වඩා මැරුණා. පළවෙනි සහ දෙවැනි ලෝක යුද්ධ දෙකේදීම මැරුණටත් වඩා වැඩි ඇමෙරිකානුවන් ප්‍රමාණයක්.''

''ආහ්, එයාල දිව්‍යමය අය බවට පත් වුණා, ''ඇෆ්‍රොඩයිට් පැවසුවාය. ජෙනරාල් බියුරේගාඩ් පෙනී සිටියා. ඔහු ඇත්තටම අධමයෙක්. ඒ වෙනකොට හිටියෙ එයාගෙ දෙවෙනි බිරිඳ. ඒත් ඔයාල දකින්න තිබුණෙ එයා ලිස්බෙත් කූපර් දිහා බලපු විදිහ.''

''අම්මා!'' පිපර් තම කේක් කැබැල්ල පරෙවියන්ට විසි කළාය. ''ඔව්, සමාවෙන්න,'' දෙවඟන පැවසුවාය. ''කථාව කෙටි කරන්නම්, මම මෙතන ඉන්නෙ ඔයාලට උදව් කරන්න, කෙල්ලනේ මට සැකයි ඔයාල හේරාව වැඩිය දකල තියෙනවද කියලා. ඔයාලගෙ පුංචි ගවේෂණය එයාව රාජකීය කාමරයට පිළිගැනෙන එක අසීරු කළා. ඒ වගේම ඔයාල දන්න විදියට අනෙක් දෙවිවරු තරමක් අකැමැතියි, රෝම හා ග්‍රීක පැතිවලට බෙදෙන්න.'' ඇප්‍රොඩයිට් ඍජුව ඇනබෙත් දෙස බැලුවාය. ''මම හිතනවා ඔයා, අම්මත් එක්ක වෙච්ච රණ්ඩුව යාළුවන්ට කියලා ඇති කියලා.''

ඇනබෙත්ගේ කම්මුල් රතු වන්නට විය. හේසාල් සහ පිපර් කුතුහලයෙන් ඇය දෙස බලා සිටියහ.

''රණ්ඩුව?'' හේසාල් විමසුවාය.

''වාදය,'' ඇනබෙත් පැවසුවාය. ''ඒකෙ ඇති දෙයක් නැහැ.''

''ඇති දෙයක් නැහැ!'' දෙවඟන පැවසුවාය. ''හොඳයි, මම දන්නෙ නෑ ඒ ගැන. සියලුම දෙවඟනන් අතරින් ඇතීනා තමයි වැඩියෙන්ම ග්‍රීක කෙනා. සේරටම වඩා ඇතන්ස්වල ආරක්ෂකයා. රෝමවරු අත්කර ගත්තාම... ඕහ්, එයාලා ඇතීනාව විලාසිතාවක් විදිහට පිළිගත්තා. එයා අත්කම්වලට සහ දක්ෂකමට අධිපති දෙවඟන මිනර්වා බවට පත්වුණා. ඒත් රෝමවරුන්ට එයාලගෙ රසයට ගැලපෙන වඩාත් විශ්වසනීය වෙනත් දෙවිවරු හිටියා- බෙලෝනා- වගේ.''

''රෙයිනාගේ මව,'' පිපර් මිමිණුවාය.

''ඔව්, ඇත්තටම,'' දෙවඟන එකඟ වූවාය. ''මම ටික කාලෙකට කලින් රෙයිනා එක්ක සුහද කතාබහක් කළා, මේ උද්‍යානයේදීම. ඒ වගේම ඇත්තටම රෝමවරුන්ට මාර්ස් ඉන්නවා. ඒ වගේම පසුව එතන හිටියා මිත්‍රාස්[1]. එයා ඇත්තටම රෝමවත් ග්‍රීකවත් කෙනෙක් නෙමෙයි. ඒත් ලෙජියන්වරු එයාගෙ කල්ලිය ගැන පිස්සු වැටිල හිටියා. මොන අතකින් බැලුවත් රෝමවරු අසරණ ඇතීනාව ටිකක් පැත්තකට කළා. ඔවුන් එයාගෙ හමුදාමය වැදගත් කමෙන් වැඩහරියක් වෙන් කළා. ග්‍රීකවරු කවදාවත් මේ නිග්‍රහයට සමාව දෙන්නෙ නෑ. ඇතීන දෙන්නෙත් නෑ.''

ඇනබෙත්ගේ කන් ගුම් නද දෙන්නට විය.

1 පර්සියානු හිරු දෙවියා ය. රෝම රණශූරයන් විසින් තම ආයුධවල බාරකාරයා සහ සෙබලුන්ගේ ආරක්ෂකයා ලෙස මිත්‍රාස්ට වැඳුම් පිදුම් කළහ.

''ඇතීනාගේ සලකුණ,'' ඇය පැවසුවාය. ''ඒක මඟ පෙන්වන්නෙ ප්‍රතිමාවකට, එහෙම නේද? ඒක මඟ පෙන්වන්නේ... ප්‍රතිමාවකට.''

ඇප්‍රොඩයිට් සිනාසුණාය. ''ඔයා දක්ෂයි. හරියට අම්මා වගේම. ඒත් තේරුම් ගන්න, ඔයාගේ සහෝදර සහෝදරියන්, ඇතීනාගේ දරුවන්, සියවස් ගණනාවක් තිස්සේ ඒක හෙව්වා. කිසිම කෙනෙකුට ප්‍රතිමාව සෙවීම සාර්ථක කර ගන්න බැරිවුණා. මේ අතරෙ ඒ අය රෝමවරු එක්ක තියෙන ආරවුලත් දිගටම අරගෙන යනවා. ගොඩක් ලේ හැලුන, හදවත දෙදරවපු සෑම සිවිල් යුද්ධයක්ම ඇතීනාගේ දරුවන් මෙහෙයවපු ඒවා.''

''ඒක...'' ඇනබෙත්ට පැවසීමට අවශ්‍ය වූයේ 'විය නොහැකි' දෙයක් බවයි. එහෙත් දූවෙන දෑසින් ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් නැවතුමේදී ඇතීනා පැවසූ කටුක වදන් ඇගේ මතකයේ තිබිණි. ''විචිත්‍රයිද? '' ඇප්‍රොඩයිට් එය සම්පූර්ණ කළාය. ''ඔව්, මම හිතනවා එහෙමයි කියලා.''

''ඒත්...'' ඇනබෙත් තම මනස වැසී තිබූ මීදුම ඉවත් කර ගැනීමට උත්සාහ කළාය. ''ඇතීනාගේ සලකුණ, කොහොමද ඒක වැඩ කරන්නේ? ඒක සාක්ෂි ගොඩක්ද, එහෙම නැත්නම් ඇතීනා විසින් පිහිටවපු ඉවක්ද?''

''හ්ම්ම්, ඇප්‍රොඩයිට් විනීත ලෙස පැවසුවාය.'' මට කියන්න බැහැ. මම විශ්වාස කරන්නෙ නැහැ ඇතීනා සවිඤ්ඤානිකව සලකුණක් නිර්මාණය කළා කියලා. ඇගේ ප්‍රතිමාව කොහොමද කියලා එයා දැනගෙන හිටිය නම්, එයා ඔයාලට නිකම්ම කියල දානවා කොහොමද ඒක හොයා ගන්නෙ කියලා. නෑ... මම හිතන්නේ සලකුණ අධ්‍යාත්මික ඉවකටයි වඩාත් සමාන වෙන්නෙ. ප්‍රතිමාව සහ දෙවඟනන්ගේ දරුවන් අතර සම්බන්ධතාවය තමයි සලකුණ. ප්‍රතිමාව සොයාගත යුතුයි. ඒත් ඒක නිදහස් කරගන්න පුළුවන් වඩාත්ම යෝග්‍ය කෙනාට විතරයි.''

''ඒ වගේම අවුරුදු දහස් ගණනක්,'' ඇනබෙත් පැවසුවාය. ''කාටවත් ඒක කරන්න බැරිවුණා.''

''ඔහොම ඉන්න,'' පිපර් පැවසුවාය. ''මොන ප්‍රතිමාව ගැනද අපි මේ කතා කරන්නේ?''

දෙවඟන සිනාසුණාය. ''ආහ්, මට විශ්වාසයි ඇනබෙත්ට පුළුවන් වෙයි ඔයාට කියන්න. මොන විදිහකින් හරි, ඔයාලට ඕනෙ

සාක්ෂි ආසන්නයට ඇවිත් තියෙනවා. සිතියමක් විදිහට. ඒක 1861 දී ඇතීනාගේ දරුවන් ඉතිරි කරපු දෙයක්. මතක තියාගන්න රෝමයට ගියාම, ඔයා ඒ මාර්ගය පටන් ගන්න ඕනෙ. ඒත් ඔයා කියපු විදිහට, ඇනබෙත් චේසි, ඒ අන්තයෙන් ඇතීනාගේ සලකුණ පස්සෙ ගිය කවුරුවත් සාර්ථක වෙලා නැහැ. එහෙදී ඔයාගේ නරකම බියට - ඇතීනාගේ සෑම දරුවෙක්ම බියට- මුහුණ දෙන්න ඔයාට සිද්ධ වෙයි. ඔයාගෙ ජීවිතේ බේරුණත්, ඔයා කොහොමද ඔයාගෙ තිළිණය පාවිච්චි කරන්නෙ. යුද්දයටද, සාමයටද?

මේසයට ඇතිරිල්ලක් දමා තිබීම ගැන ඇනබෙත් සතුටු වූවාය. මක්නිසාද යත් ඇගේ දෙපා වෙව්ලමින් තිබුණ බැවිණි. ''මේ සිතියම,'' ඇය පැවසුවාය. ''ඒක කොහෙද?''

''හාදයිනේ!'' හේසාල් අහසට අත දිගු කළාය.

පැල්මෙටෝ ගස වටා කරකැවෙමින් සිටියේ විශාල රාජාලින් දෙදෙනෙකි. ඊට ඉහළින් පෙගාසි විසින් ඇදගෙන එනු ලබන පියාඹන අස් රියක් වේගයෙන් පහත බසිමින් තිබිණි. පෙනී යන විලස බියුෆෝඩ් යොදාගෙන ලියෝ කළ එන්ඩ්ටේබල් මෙහෙයුම සාර්ථක වී නැත- අඩුම වශයෙන් එතරම් වේලාවක් එය වැඩකර නැත.

ඇප්‍රොඩයිට් රොටිය මත තිබූ බටර් විසුරුවා හැරියාය. ''ආහ්, සිතියම තියෙන්නෙ සම්ටර් බලකොටුවෙ, ඇත්තටම.'' ඇය බටර් පිහිය වරායේ දූපත දෙසට දිගු කරමින් පැවසුවාය. ''පේන විදිහට ඔයාලව ඇත් කරන්න රෝමවරු ඇවිත්. මම ඔයාල වුණානම් කරන්නෙ ඉක්මනටම ආපහු නැවට යන එකයි.''

# 19
# ඇනබෙත්

ඔවුන්ට නැවට යාමට නොහැකි විය.

නැව් තටාකයට අඩ දුරක් තිබියදී යෝධ රාජාලීන් තිදෙනෙක් ඔවුන් ඉදිරිපිටට පහත් වූහ. එක් එක් රාජාලියා මත දම් පැහැති ඇඳුමින් සැරසුණු රෝම කමාන්ඩෝ සෙබලෙකු විය. ඔවුන්ගේ ඩෙනිම්වල රන් සන්නාහය දිලිසෙමින් තිබිණි. ඔවුහු කඩුවකින් සහ පලිහකින් සන්නද්ධ වී සිටියහ. රාජාලීන් ඉවතට පියඹා ගිය අතර මැද සිටි රෝමවරයා තම වයිසරය එසවීය. ඔහු අනෙක් දෙදෙනාට වඩා කෙසඟ පුද්ගලයෙකි.

''රෝමයට යටත්වෙනු!'' ඔක්ටේවියන් විධාන කළේය.

හේසාල් තම සන්නද්ධ බලකා අසිපත ඇදගත්තාය. ''හොඳ අවස්ථාවක්, ඔක්ටේවියන්.''

ඇනබෙත් හුස්ම නොහෙලා බලා සිටියාය. කෙසඟ තැනැත්තා ගැන ඇයට කරදර වීමට දෙයක් නොතිබුණ නමුත්, අනෙක් භාදයින් දෙදෙනා රණ ශූරයන් බව පෙනී ගියේය. ඇනබෙත්ට ගනුදෙනු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා ඔවුන් බෙහෙවින් විශාල හා ශක්තිමත් බව පෙනිණ. විශේෂයෙන් පිපර්ට සහ ඇයට සටන් කිරීමට තිබුණේ කිණිසි දෙකක් පමණකි.

විරෝධය මඟ හරවා ගන්නා ඉරියව්වකින් පිපර් දෑත් එසවූවාය. ''ඔක්ටේවියන්, කඳවුරේදී මොකද වුණේ කියල අපිට පැහැදිලි කරන්න පුළුවන්.''

''ඔයා කියන දේ ඇහෙන්නෙ නෑ.'' ඔක්ටේවියන් කෑ ගැසුවේය.

''අපේ කන්වල ඉටි- දුෂ්ට ග්‍රීක අප්සරාවියන්ට එරෙහිව සටන් කරන කොට ඒක තමයි ක්‍රමය. දැන්, ඔයාලගෙ ආයුධ විසි කරල හිමිහිට අනිත් පැත්තට හැරෙන්න. එතකොට මට ඔයාලගෙ අත් බඳින්න පුළුවන්.''

''මට උඹට අනින්න දෙන්න.'' හේසාල් මිමිණුවාය. ''කරුණාකරලා.''

නෞකාව නැංගුරම් ලා තිබුණේ අඩි පණහක් පමණ ඈතින් වුවත්, කෝච් හෙජ් නැව් තට්ටුව මත සිටින බවට සලකුණක්වත් ඇනබෙත්ට දැක ගැනීමට නොහැකි විය. සමහරවිට ඔහු පහළට වී ඔහුගේ මෝඩ ආත්මාරක්ෂක සටන් නරඹනවා විය යුතුය. ජේසන්ගේ කණ්ඩායම හිරු බසින තුරු පැමිණෙන්නේ නැත. ආක්‍රමණය නොදැන පර්සි ඇත්තේ දිය යටය. ඇනබෙත්ට නැව තට්ටුවට යෑමට හැකි වුණොත්, ඇයට බැලිස්ටාව පාවිච්චි කිරීමට හැකි වනු ඇත. එහෙත් තමා වටකොට සිටින රෝම සෙබලුන් තිදෙනා පසුකර යාමට කිසිදු ක්‍රමයක් නොතිබිණි.

ඇය කාලයට එරෙහිව දිවයමින් සිටියාය. තම සහෝදරයන්ට අනතුරු ඇඟවීමට මෙන් කෑගසමින් රාජාලියෝ ඔවුන්ට ඉහළින් කරකැවෙමින් සිටියහ. 'හේයි, රසවත් ග්‍රීක උප දෙවඟනන් කීපදෙනෙක් මෙතන ඉන්නවා.' පියාඹන අශ්ව රථය ඇනබෙත්ට තවදුරටත් දැක ගැනීමට නොලැබිණි. එහෙත් එය ආසන්නයේම ඇතැයි ඇය අනුමාන කළාය. තවත් රෝමවරු පැමිණීමට පෙර ඇය යම් දෙයක් සැලසුම් කළ යුතු විය.

ඇයට උදව් අවශ්‍ය වී තිබිණි... කෝච් හෙජ් වෙත යම් ආකාරයක අනතුරු ඇඟවීමේ සංඥාවක් හෝ ... *ඊටත් වඩා හොඳයි පර්සිට.*

''හොඳයි? ඔක්ටේවියන් පැවසුවේය. ඔහුගේ මිතුරන් දෙදෙනා ඔවුන්ගේ අසිපත් ලෙලවමින් සිටියහ.

ඉතාම සෙමින්, ඇඟිලි දෙකක් පමණක් යොදා ගනිමින්, ඇනබෙත් ඇගේ කිණිස්ස ඇද ගත්තාය. එය බිම දමනු වෙනුවට, ඇය තමාට හැකි පමණ වෙර යොදා එය ඈත ජලයට විසිකර දැමුවාය.

ඔක්ටේවියන් හීන් හඬක් නැගුවේය. ''ඒ මොකටද? මම කිව්වේ නෑ ඒක විසිකරන්න කියලා! ඒක සාක්ෂියක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් යුද්දයේ අනවශ්‍ය ද්‍රව්‍යයක්.''

ඇනබෙත් නිහඬ සිනාවක් පෑවාය. ''උඹ මෝඩයෙක්'' වැනි අර්ථයක් එහි ගැබ්ව තිබිණි.

ඇය ගැන දන්නා කිසිවෙක් මෝඩ නොවනු ඇත. එහෙත් ඔක්ටේවියන් එසේ වූ බව පෙනිණි. ඔහු බලවත් සේ කෝපයට පත්විය.

''උඹලා අනිත් දෙන්නා...'' ඔහු තම අසිපත හේසාල් සහ පිපර් දෙසට වැනුවේය. ''උඹලගෙ ආයුධ බිමට දාපල්ලා, සෙල්ලම් කරන්න - ''

රෝමවරු වටා පිහිටි, චාල්ස්ටන් වරාය ලාස් වේගාස් ජල මල් සංදර්ශනයක දී මෙන් විදාරණය විය. ප්‍රාකාරයක් සේ නැගුණු මුහුදු රළ පහර බැස යත්ම, රෝමවරුන් තිදෙනාම මුහුදු බොක්කට ඇදී ගොස් තිබිණි. ඔවුහු උමතුවෙන් මෙන් සන්නාහය සමඟ නොගිලී සිටීමට උත්සාහ දරමින් සිටියහ. ඇනබෙත්ගේ කිනිස්ස අතැතිව පර්සි ජටිය මත සිටගෙන සිටියේය.

''ඔයා මේක විසි කළාද?'' විසුළු මූණක් මවාගෙන ඔහු විමසුවේය. ඇනබෙත් ඔහුගේ ගෙලවටා අත් යවා ඔහුව වැළඳ ගත්තාය. ''මම ඔයාට ආදරෙයි.''

''හාදයිනේ,'' හේසාල් බාධා කළාය. ඇගේ මුහුණේ මඳ සිනාවක් රැඳී තිබිණි. ''අපි ඉක්මන් කරන්න ඕනෙ.''

ජලයේ සිට ඔක්ටේවියන් කෑ කැසුවේය. ''මාව මෙතනින් ගනින්, මම උඹව මරනවා.''

''ආකර්ෂණීයයි,'' පර්සි පිළිතුරු දුන්නේය.

''මොකක්?'' ඔක්ටේවියන් කෑ ගැසුවේය. ඔහු තම ආරක්ෂයන්ගෙන් කෙනෙක්ව අල්ලාගෙන සිටියේය. එබැවින් ආරක්ෂකයන්ටත් නොගිලී සිටීමට මහත් ආයාසයක් දැරීමට සිදුවී තිබිණි.

''මොකුත් නෑ!'' පර්සි නැවත කෑ ගසා පැවසුවේය. ''අපි යමු.'' හේසාල් මුහුණ හැකිලුවාය. ''අපිට එයාලව ගිලෙන්න අරින්න බැහැ නේද?''

''එයාල ගිලෙන්නෙ නෑ,'' පර්සි සහතික විය. ''මම එයාලගේ පතුල් වටා ජලය කරකැවෙන්න සැලැස්සුවා. අපි ආරක්ෂිත දුරකට ගිය ගමන්, මම එයාලව වෙරළට ගේන්නම්.''

පිපර් විරිත්තුවාය. ''අපූරුයි.''

ඔවුහු ආගෝ II මතට පිවිසියහ. ඇනබෙත් සුක්කානම වෙත දිව ගියාය. ''පිපර්, පහළට යන්න. අයිරිස් පණිවුඩයට ගැලියෙ තියෙන ගිල්වනය පාවිච්චි කරන්න. ආපසු මෙහෙට එන්න කියලා ජේසන්ට දැනුම් දෙන්න!''

හිස සැලූ පිපර් දිව ගියාය.

''හේසාල්, ගිහින් කෝච් හෙජ්ව හොයාගන්න. ගිහින් එයාට කියන්න එයාගෙ පස්ස ගාත් දෙක නැව් තට්ටුවට ගේන්න කියලා.''

''හරි.''

''ඒ වගේම, පර්සි- ඔයයි මමයි මේ නැව සම්ටර් බලකොටුවට අරන් යන්න ඕනෙ.''

හිස සැලූ පර්සි ඇණියට දිව ගියේය. ඇනබෙත් සුක්කානම අතට ගත්තාය. ඇගේ දෑත් පාලන පුවරුව මත එහෙ මෙහෙ ගියේය. ඒවා ක්‍රියාත්මක කිරීමට තමා දන්නා තරම ප්‍රමාණවත් වෙතැයි ඇය බලාපොරොත්තු වූවාය.

පර්සි තම සම්මති බලයෙන් පමණක් සම්පූර්ණ ප්‍රමාණයේ රුවල් නැව් පාලනය කරන අයුරු ඇනබෙත් මීට පෙර දැක තිබුණාය. මේ වතාවේ, ඔහු අපේක්ෂා භංගත්වයට පත්ව නොතිබිණි. කඹ ඉබේටම පියාඹා ගොස් ජැටියේ ගැට ගැලවී නැංගුරම නිදහස් විය. රුවල් දිග හැරී සුළං හසු කර ගත්තේය. මේ අතර ඇනබෙත් එන්ජිම ක්‍රියාත්මක කළාය. මැෂින් තුවක්කු හඬක් මෙන් හබල් දිගු විය. ආගෝ II ජැටියෙන් හැරී ඈතින් පෙනෙන දූපත බලා යාත්‍රා කරන්නට විය.

රාජාලීන් තිදෙනා තවමත් ඉහළ කරකැවෙමින් සිටියහ. එහෙත් උන් නෞකාව මතට ගොඩ බැසීමට උත්සාහ නොකළහ. සමහරවිට සමීපයට පැමිණෙන ඕනෑම දෙයකට ෆෙස්ටස් ගිනි විදින නිසා විය හැකිය. තවත් රාජාලීන් සම්ටර් බලකොටුව දෙසට පියාඹා යමින් සිටියහ. අවම වශයෙන් එහි උන් දුසිමක්වත් සිටින්නට ඇත. ඒ එක එකා මත ඔවුන් රෝම උපදෙවියකු රැගෙන ගියොත්... එතැන සතුරන් බොහෝ ගණනකි.

කෝච් හෙජ් හේසාල් සමග නැව් තට්ටුව මතට පැමිණියේය. ''එයාල කොහෙද?'' ඔහු කෑ ගැසුවේය. ''මම කාවද මරන්න ඕනෙ?''

''කාවවත් මරන්නේ නෑ..'' ඇනබෙත් නියෝග කළාය. ''නැව ආරක්ෂා කළාම ඇති.''

''ඒත් උන් චක් නොරිස්ගෙ චිත්‍රපටිය බලන එකට බාධා කළා.'' පිපර් පහළ සිට නික්මිණි. ''ජේසන්ට පණිවුඩයක් යැව්වා. අපැහැදිලි එකක්. ඒත් එයා දැනටමත් මඟ එනවා. එයා- ආහ්! අන්න!''

නගරයට ඉහළ අහසේ, රෝමවරුන්ගේ පක්ෂින්ට සමාන නොවූ යෝධ තට්ට රාජාලියෙක් ඔවුන්ගේ දිශාවට පැමිණෙමින් තිබිණි. ''ෆ්‍රෑන්ක්!'' හේසාල් පැවසුවාය.

ලියෝ රාජාලියාගේ පාදයක එල්ලී සිටියේය. නැවේ සිට පවා ඇනබෙත්ට ඔහුගේ බෙරිහන් දීම සහ සාප කිරීම අසන්නට හැකිවිය. ඔවුන්ට පිටුපසින් ජේසන් සුළඟේ පා වෙමින් පැමිණියේය.

''මීට කලින් කවදාවත් ජේසන් පියාඹනව දැකල නහැ,'' පර්සි පැවසුවේය. ''එයා හරියට තඹපාට සුපර් මෑන් කෙනෙක් වගේ.'' ''මේක නෙමෙයි වෙලාව,'' පිපර් ඔහුට දොස් පැවරුවාය. ''බලන්න, එයාල ප්‍රශ්නෙක ඉන්නෙ.''

පැහැදිලි ලෙසම වළාකුලකින් බැසි රෝම පියාඹන අස්රියක් කෙළින්ම ඔවුන් දෙසට එමින් තිබුණේය. ජේසන් සහ ෆ්‍රෑන්ක් තම මාර්ගය වෙනස් කිරීමට උත්සාහ කළහ. අශ්වාරෝහකයෝ ඊ ප්‍රහාර එල්ල කළහ. ලියෝගේ දෙපා යටින් ඊතල ඇදී ගියේය. එයින් වූයේ ඔහුගේ විලාපයත්, සාප කිරීමත් තව තවත් වැඩි වීමය. ජේසන් සහ ෆ්‍රෑන්ක් ආගෝ II ඉලක්ක කරනු වෙනුවට, එය ඉක්මවා සම්ටර් බලකොටුව බලා පියාසර කරන්නට වූහ.

''මම උන්ව අල්ල ගන්නම්,'' කෝච් හෙජ් පැවසුවේය.

ඔහු බැලිස්ටාව කරකැවූයේය. ''මෝඩ වෙන්න එපා!'' ඇනබෙත් එසේ කෑ ගැසීමටත් පෙර ඔහු එය ක්‍රියාත්මක කළේය. ගිනි දැවෙන හෙල්ලය රොකට්ටුවක් මෙන් අස් රිය වෙත ඇදී ගියේය.

ඇනබෙත් භීතියෙන් බලා සිටිද්දී ජේසන්- නිසැකවම වේදනා වෙන් සිටිමින්- ලියෝ වෙත පහත් වී ඔහුව අල්ලා ගත්තේය. ඉන්පසු ඔහු තම සමබරතාවය රැක ගැනීමේ අරගලයක යෙදිණි. ඔහුට කළහැකි වූයේ ඔවුන්ගේ ඇද වැටීමේ වේගය පාලනය කර ගැනීම පමණකි. බලකොටුවේ කොටු බැම්ම පිටුපසින් ඔවූහු අතුරුදන් වූහ.

ෆ්‍රෑන්ක් ඔවුන්ට පසු පහතට බැස්සේය. ඊටත් පසු අස්රිය ඇතුළත යම් තැනකට ඇද වැටුණේ ඇටකටු සෙලවෙන හඬක් නගමිණි. කැඩී ගිය එක රෝදයක් ගුවනට විසිවනු පෙනිණි.

''කෝච්,'' පිපර් කෑ ගැසුවාය.

''මොකද?'' ඔහු විමසුවේය. ''ඒක නිකම් අනතුරු ඇඟවීමේ ප්‍රහාරයක් විතරයි.''

ඇනබෙත් එන්ජින්වල බලය වැඩි කළාය. නැව් බඳ දෙදරවමින් වේගය වැඩි විය. දැන් දූපතේ ජැටියට තිබුණේ තවත් යාර සියයකක් පමණ දුරකි. එහෙත් තවත් දුසිම් ගණනක් රාජාලින් ඉහළ කරකැවෙමින් සිටියහ. සෑම රාජාලියකු මතට රෝම උප දෙවියකු සිටියේය.

ආගෝ II හි පිරිස ප්‍රමාණවත් නොවීය. එහි එක් අයෙකුට අඩුම වශයෙන් ඔවුන් තුන් දෙනෙක්වත් සිටියහ.

''පර්සි,'' ඇනබෙත් පැවසුවාය. ''අපිට අසීරු අවස්ථාවක් එළැඹෙන්නයි යන්නේ. ඔයා ජලය පාලනය කරන්න ඕනෙ. එතකොට අපිට ජැටිය පොඩිකරන්න වෙන්නෙ නැහැ. අපි එතනට ගියාම ඔයා ගිහින් ප්‍රහාරයකයින්ව නවත්තන්න. අනිත් සේරම අය එයාට නැව ආරක්ෂා කරන්න උදව් කරන්න.''

''ඒත්- ජේසන්!'' පිපර් පැවසුවාය.

''මම එයාලව හොයා ගන්නම්.'' ඇනබෙත් පොරොන්දු වූවාය.

''සිතියම තියෙන්නෙ කොහෙද කියල මට හොයාගන්න පුළුවන්. මට හොඳටම විශ්වාසයි ඒක කරන්න පුළුවන් එකම කෙනා මමවිතරයි කියලා.''

''බලකොටුව රෝමවරුන්ගෙන් පිරිලා,'' පර්සි අනතුරු ඇඟ වූයේය.

''ඔයාට අපේ මිත්‍රයෝ හොයාගන්න ඔයාගෙ ක්‍රමයට සටන් කරන්න වෙයි. එයාල හොඳින්ද කියලා බලන්න. මේ සිතියම හොයාගෙන හැමෝම පණපිටින් ආපසු ගේන්න. මේ සේරම ඔයාට තනියම කරන්න පුළුවන්ද?''

''සාමාන්‍ය දවසක් පමණයි,'' ඇනබෙත් ඔහුව සිප ගත්තාය. ''ඔයා මොනව කළත්, උන්ට නැව අල්ල ගන්න දෙන්න එපා!''

# 20
# ඇනබෙත්

**නව සිවිල් යුද්ධය ඇරඹුණේය.**

ලියෝ කෙසේ හෝ ඇද වැටීමෙන් හානියක් නොමැතිව දිවි ගලවා ගැනීමට සමත් විය. යෝධ රාජාලියන්ගේ අග්නි ප්‍රහාරයෙන් බේරීමට වක ගසාගෙන පෝටිකෝවෙන් පෝටිකෝවට පනින ඔහුව ඇනබෙත්ට දැක ගැනීමට ලැබිණි. රෝම උපදෙව්වරු ඔහුව ලුහු බැඳීමට උත්සාහ කළහ. කාලතුවක්කු උණ්ඩවලින් භීතියට පත් සංචාරකයෝ විලාප නඟමින් හතර අතේ දිව යන්නට වූහ.

සංචාරක මාර්ගෝපදේශකයෝ බෙරිහන් දුන්හ. ''ඒක ප්‍රති පැනවුමක් විතරයි.'' එහෙත් ඔවුන්ට ශබ්දය ගැන විශ්වාසයක් නොතිබිණි.

ගෙළයන මධ්‍යයේ, හොඳින් වැඩුණු හස්තියෙක්. ඒ ෆෑන්ක් විය හැකිද? -කොඩි කණු අතර දිව යමින් රෝම රණ ශූරයින්ව විසුරුවා දැමුවේය. යාර පණහක් පමණ ඈතින් ජේසන් සිටගෙන සිටියේය. ඔහු ලේ රත් පැහැති තොල්වලින් යුත් තරබාරු සේනාංකයක ප්‍රධානියකු සමඟ කඩු සටනක නියැළී සිටියේය. *වැම්පයරයෙක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සමහරවිට විකෘතියක් වෙන්නත් පුළුවන්.*

ඇනබෙත් බලා සිටිද්දී, ජේසන් කෑ ගැසුවේය. ''මේ ඩෙකොටා ගැන කනගාටුයි!''

ජිම්නාස්ටික් ක්‍රීඩකයකු මෙන් කරණමක් ගසා රෝම ප්‍රධානියාගේ හිසට ඉහළින් රැඳුණු ඔහු ඔහුගේ ග්ලැඩියස්[1] අසිපතේ මිටෙන් රෝමවරයාගේ හිස පිටුපසට පහර දුන්නේය. ඩැකොටා සිහිසුන්ව ඇද වැටුණේය.

''ජේසන්,'' ඇනබෙත් හඬ නැගුවාය.

ඇයව නෙතට හසුවන තුරුම ඔහු සංග්‍රාම භූමිය සිසාරා නෙත් යැව්වේය. ආගෝ II නැංගුරම් ලා ඇති දිශාව ඇය අත දිගුකර පෙන්නුවාය. ''අනෙක් අයව නැවට නංවන්න. පසු බසින්න.''

''එතකොට ඔයා?'' ඔහු කෑ ගැසුවේය.

''මම වෙනුවෙන් බලා ඉන්න එපා!'' ඔහු විරෝධය පෑමට පෙර ඇය එතැනින් ඉවත් වූවාය.

කලහකාරීන් අතුරින් සංචාරකයන් හඳුනා ගැනීමට ඇයට තරමක කාලයක් ගතවිය. දහදිය දාන ග්‍රීෂ්ම දවසක ඇයි මෙච්චර මිනිස්සුන්ට සම්ටර් බලකොටුව බලන්න ඕනෙ වුණේ? එහෙත් සෙනඟ හේතුවෙන් තමන්ගේ දිවි රැකුන බව ඇනබෙත්ට ඉක්මනින්ම අවබෝධ වූවාය. මේ උමතු වූ මිනිසුන්ගේ ව්‍යාකූලත්වය නොතිබුණා නම්, රෝමවරු මෙලහටත් ඇගේ සුළු පිරිස වටකොට හමාරය.

ඇනබෙත් නගරාරක්ෂක හමුදාවේ කොටසක් ලෙස පෙනුණු කුඩා කමරයකට පිවිසියාය. ඇය තම හති වැටීම පාලනය කර ගැනීමට උත්සාහ කළාය. 1861 දී මේ දූපතේ එක්සත් හමුදා සෙබලුන් කෙසේ සිටින්නට ඇත්දැයි ඇයට මැවී පෙනිණි. සතුරන් වටකොට සිටියදී, ආහාර හා සැපයුම් නොමැතිව අමතර යුද සහයක්ද නොමැතිව ඔවුහු මෙතුල කල්ගෙවන්නට ඇත.

එක්සත් හමුදාවේ සමහර ආරක්ෂකයින් ඇතීනාගේ දරුවෝ වූහ. ඔවුහු වැදගත් සිතියම මෙහි සඟවා තැබූහ. එය සතුරන්ගේ අතට පත්වනු දැකීමට ඔවුන්ට වුවමනා නොවීය. ඇනබෙත් මේ උප දෙවිවරුන් අතරින් කෙනෙකු වූවා නම්, ඇය එය කොහි තබනු ඇත්ද?

එක්විටම බිත්තිය දිලිසෙන්නට විය. වාතය උණුසුම් වන්නට විය. එය තම සිතේ මැවුණු දෙයක් වන්නට ඇතැයි ඇනබෙත් සිතුවාය. දොර හඬ නගා වැසෙන විට ඇය පිටවීමේ දොරටුව වෙත දිව ගියාය. පාෂාණ අතර වූ බදාම දිලිසෙන්නට විය. බුබුළු නැගෙමින් දහස් ගණනක් කළු මකුළුවෝ මතුපිටට පැමිණෙමින් සිටියහ.

1 කෙටි කඩුව

ඇනබෙත්ට සෙලවීමට නොහැකි විය. ඇගේ හදවත නැවතුණු සෙයක් පෙනිණි. බිත්ති වසා ගනිමින්, එකාපිට එකා නැගෙමින්, ගෙබිම පුරා විසිරුණු මකුළුවෝ ක්‍රමයෙන් ඇයව වටකොට ගත්හ. එය විය නොහැක්කකි. එය සැබෑවක් විය නොහැකිය.

භීතිය ඇගේ මතයන් අලුත් කළේය. එවකට ඇය එකොළොස් හැවිදිරි වූ අතර, ඇය වර්ජිනියාවේ, රිච්මන්ඩ්වල ඇගේ නිදන කාමරයට වී සිටියාය. රාත්‍රියේදී මකුළුවෝ පැමිණියහ. ඇගේ කුටියට වැදුණු ඔවුහු, සෙවණැලි තුළ සැඟවී බලා සිටියාය.

ඇය තම පියාට හඬ ගැසූ මුත්, ඔහු වැඩට පිටත්ව ගොස් තිබිණි. ඔහු නිතරම රාජකාරිය සඳහා බැහැර ගියේය.

ඒ වෙනුවට පැමිණියේ ඇගේ කුඩම්මාය.

මම නරක පොලිස්කාරයෙක් වෙන්න හිතන්නෙ නෑ. ඇය වරක් ඇනබෙත්ගේ පියාට පවසා තිබිණි. ඇනබෙත්ට එය ඇසෙන්නට ඇතැයි ඇය නොසිතුවාය.

ඒක ඔයාගේ මනස්ගාතයක් විතරයි,'' ඇගේ කුඩම්මා මකුළුවන් ගැන එසේ පැවසුවාය. ඔයා ඔයාගෙ පුංචි මල්ලිලාව බය කරනවා.

එයාල මගෙ මල්ලිලා නෙමෙයි, ඇනබෙත් වාද කළාය. එය ඇගේ කුඩම්මාගේ පෙනුම දැඩි කරවීමට සමත් විය. ඇගේ දෑස් මුළුමනින්ම මකුළුවන්ගේ තරමටම බියකරු විය.

දැන් ගිහින් නිදාගන්න, ඇගේ කුඩම්මා පැවසුවාය. තවත් බෙරිහන් දෙන්න එපා.

ඇගේ කුඩම්මා කාමරයෙන් පිටවූ වහාම මකුළුවෝ නැවත පැමිණියහ. ඇනබෙත් ආවරණ යට සැඟවීමට උත්සාහ කළාය. එහෙත් එය හොඳ දෙයක් වූයේ නැත. අවසානයේ ඇය අධික වෙහෙසින් නින්දට වැටුණාය. ඇය උදෑසන අවදි වූයේ දශ්ඨන සලකුණු, ඇස් මුව සහ නාසය වැසී ගත් මකුළු දැල් ද සහිතවය.

ඇඳුම් හැඳ ගැනීමටත් පෙර, දශ්ඨන සලකුණු වියැකී ගිය බැවින් මකුළු දැල් හැර ඇගේ කුඩම්මාට පෙන්වීමට ඇයට වෙනත් යමක් නොතිබිණි. එය යම් ආකාරයක දක්ෂ උපායක් බව කුඩම්මා සිතනු ඇත.

''මකුළුවො ගැන තවත් කතා කරන්න එපා, කුඩම්මා දැඩිව පැවසුවාය. ඔයා දැන් ලොකු ළමයෙක්.''

දෙවැනි රාත්‍රියේ, මකුළුවෝ නැවත පැමිණියහ. ඇගේ කුඩම්මා දිගටම නරක පොලිස්කාරයෙක්ගේ චරිතය රඟ දැක්වූවාය. ඇනබෙත්ට තම පියාට දුරකතන ඇමතුමක් ගැනීමට පවා ඉඩ නොලැබිණි. එසේ වූවා නම් ඔහුට මේ විකාරය ගැන පැවසීමට හැකි වනු ඇත. නැත, ඔහු වේලාසන නිවෙසට නොපැමිණෙනු ඇත.

තුන්වැනි රාත්‍රියේදී, නිවෙසින් පිටතට දිව ගියාය.

පසුව, අර්ධ ලෝහිත කඳවුරේදී, ඇතීනාගේ දරුවන් සියල්ලෝම මකුළුවන්ට බිය බව ඇයට ඉගෙන ගැනීමට හැකි විය. දීර්ඝ කාලයකට පෙර, ඇතීනා මනුෂ්‍ය වියන්නියකු වූ ඇරක්නිට හොඳ පාඩමක් උගැන්වූවාය. ඇයගේ අහංකාරය හේතුවෙන් ඇයව ප්‍රථම මකුළුවා බවට පත්වීමට සාප කළාය. එදා සිට, මකුළුවෝ ඇතීනාගේ දරුවන්ට වෛර කළහ.

එහෙත් ඇයට ඒ බිය පහකර දැමීම පහසු වූයේ නැත. වරක්, කොනර් ස්ටෝල් හි කඳවුරේදී ඇගේ පණ යාමට ආසන්නව තිබුණේ ඇගේ බංකුව මත දිවි මකුළුවෙකු තබා තිබීම නිසාය. වසර ගණනකට පසු, ඇයත් පර්සිත් ඩෙන්වර්වල ජල උද්‍යානයේදී යාන්ත්‍රික මකුළුවන්ගේ උමතු ප්‍රහාරයකට ලක් වූහ. එසේම පසුගිය සති කීපය පුරාම ඇනබෙත් මකුළුවන් සිහිනෙන් දුටුවාය.

දැන් සම්ටර් කොටුවේ බැරැක්කය තුළ සිටින ඇයව, මකුළුවන් විසින් වටකොට තිබේ. ඇගේ බියකරු රාත්‍රී සිහින සැබෑවක් බවට පත්ව තිබේ.

සිහින් හඬක් ඇගේ හිස තුළට මුමුණන්නට විය. *ඉක්මනට මගේ පැටියෝ, ඔයාට ඉක්මනින් වියන්නියව හමුවෙයි.*

''ගයියා?'' ඇනබෙත් මිමිණුවාය. ඇය පිළිතුරට බිය වුවත්, ප්‍රශ්නය නැගුවාය. ''කවුද- කවුද වියන්නිය?''

මකුළුවෝ කලබලයට පත් වූහ. ඔවුහු බිත්ති දිගේ බඩගාමින්, ඇනබෙත්ගේ දෙපා අසල දිය සුළියක් සේ කැරකැවෙමින් දඟලන්න වූහ. එකම බලාපොරොත්තුව වූයේ ඇනබෙත් බියෙන් මිදීම පමණකි.

*මම බලාපොරොත්තු වෙනවා නුඹේ දිවි ගැලවෙයි කියලා, දරුවා.* ගැහැනු හඬකින් පැවසුණි. *මම කැමතියි නුඹ මගේ බිල්ල වෙනවනම්. ඒත් අපි වියන්නියට ඇගේ පළිගැනීමට ඉඩ දිය යුතුයි.*

ගයියාගේ හඬ වියැකී ගියේය. ඇතින් පිහිටි බිත්තියේ, කරකැවෙන මකුළු රැන මධ්‍යයේ, රතු සලකුණක් ජීවය ලබමින් තිබිණි.

රිදී ඩ්‍රැච්මාවක සිටි බකුසු රුවක් මෙන් එය කෙළින්ම බලා සිටියේ ඇනබෙත් දෙසය. ඉන්පසු, හරියටම ඇගේ රාත්‍රී සිහිනයේ මෙන්, ඇතීනාගේ සලකුණ බිත්ති පුරා ගිනි දැල් විහිදුවන්නට වීය. කාමරය තුළ කුඩා අළු අංශු පමණක් ඉතිරිවන තෙක්, මකුළුවන්ගෙන් කාමරය හිස්වන තෙක් ගින්න පැතිරිණි.

*යන්න...* අලුත් හඬක් පැවසුවේය. ඒ ඇනබෙත්ගේ මවය. *මා වෙනුවෙන් පළිගන්න. සලකුණ අනුගමනය කරන්න.*

ඇවිලෙන බකුසු සලකුණ වියැකී ගියේය. බැරැක්කයේ දොර හඬ නගමින් විවර විය. තමා දකින්නේ මායාවක්ද, සැබෑවක්ද සිතාගත නොහැකිව ඇනබෙත් කාමරයේ මැද ගල් ගැසී සිටියාය.

පිපිරුමකින් ගොඩනැගිල්ල දෙදරුම් කෑවේය. තම මිතුරන් අනතුරේ බව ඇනබෙත්ට සිහිපත් විය. ඇය පමණට වැඩි වේලාවක් කමරයේ ගතකර තිබිණි.

බලෙන්ම පිටව යාමට තමාව මෙහෙයවූවාය. තවමත් ගැහෙමින් සිටි ඇය කාමරයෙන් පිටතට ගැටුවාය. සාගර සුළඟ ඇගේ සිතිවිලි පැහැදිළි කරවීමට සමත් විය. ඇය උද්‍යානය දෙසට බැල්මක් හෙලුවාය. උමතුවෙන් සිටි සංචාරකයන් සහ සටන් වදින උප දෙවිවරුන්ට එපිටින්- ආරක්ෂක ප්‍රාකාරය අද්දර වූයේ සයුර දෙසට මානා තිබූ විශාල මෝටාරයකි.

එය ඇනබෙත්ගේ සිතේ ඇති වූ රූපයක් විය හැකි නමුත් පැරණි ආයුධ කැබලි රත් පැහැයෙන් දිලිසෙන බව පෙනිණි. ඇය වේගයෙන් ඒ දෙසට ගියාය. රාජාලියෙකු ඇය ඩැහැගැනීමට වේගයෙන් පැමිණියත්, බිමට පහත් වූ ඇය දිගටම දිව ගියාය. මකුළුවන්ට තරම් වෙනත් කිසිවකට ඇයව බිය ගැන්වීමට නොහැකි විය.

රෝම උප දෙවිවරු පෙළ සැදී ආගෝ II දෙසට ගමන් කරමින් සිටියහ. එහෙත් කුඩා කුණාටුවක් ඔවුන්ගේ හිස්වලට ඉහළින් රැස් වෙමින් තිබිණි. ඔවුන් අවට පැහැදිලි දිවා කාලයක් දක්නට ලැබුණත්, ගෙරවීම් හඬ සමඟ රෝමවරුන්ට ඉහළින් විදුලි රේඛා ඇඳී ගියේය. වර්ෂාව සහ සුළඟ ඔවුනට පසු බැස්සවීමට සමත් විය.

ඇනබෙත් ඒ ගැන සිතීමට නොනැවතුණාය.

මෝටාරය වෙත ළං වූ ඇය එහි නොසලයට අත තැබුවාය. පේනුවකින් විවරය අවහිර කර තිබිණි. ඇතීනාගේ සලකුණ

දිලිසෙන්නට පටන් ගත්තේය. බස්සෙකුගේ හැඩයේ රේඛාවක් ලෙස එය දිලිසෙන්නට විය.

*''ඇත්තටම, මෝටාරය,''* ඇය පැවසුවාය.

ඇය තම ඇඟිලිවලින් පේනුව ඇද්දාය. කිසිවක් සිදු නොවුණි. සාප කරමින් ඇය තම කිණිස්ස ඇද්දාය. දිව්‍යමය ලෝහය පේනුවේ ස්පර්ශ වූ සැනින්, පේනුව ගිලී ලිහිල් විය. ඇනබෙත් එය ඇද දමා, ඇගේ අත කාලතුවක්කුව තුළට දැමුවාය.

සිසිල් මෘදු ලෝහ යමක ඇගේ අත දැවටිණි. ඇය පීරිසියක් තරම් කුඩා ලෝහ තැටියක් පිටතට ගත්තාය. එහි අලංකාර අක්ෂර සහ රූප සටහන් කර තිබිණි. එය පසුව පරීක්ෂා කිරීමට ඇය තීරණය කළා ඇය එය තම මල්ලට දමාගෙන ආපසු හැරුණාය.

''හරි කලබලයි නේද?'' රෙයිනා විමසුවාය.

පූර්ණ යුද සන්නාහයෙන් සැරසුණු රෝම විනිසුරුවරිය රන් හෙල්ලක් අතැතිව අඩි දහයක් පමණ ඈතින් සිටගෙන සිටියාය. ඇගේ ලෝහ දඩයම් බල්ලන් දෙදෙනා ඇගේ දෙපසින් සිට ගොරවන්නට වූහ.

ඇනබෙත් අවට පරීක්ෂා කළාය. ඔවුහු අඩු වැඩි වශයෙන් හුදෙකලා වී සිටියහ. සටනේ වැඩි කොටසක් ජැටිය දෙසින් සිදුවිය. නැවේ සිටින තම මිතුරන්, සියල්ල හොඳින් කරතැයි අපේක්ෂාවෙන් පසුවුවත්, ඔවුන්ට ඉතා ඉක්මනින් යාත්‍රා කිරීමට සිදුවී තිබිණි. නැතහොත් නිසැකවම ඔවුන්ව අසුවීමේ අවදානමක් පැවතිණි. ඇනබෙත් ඉක්මන් කළ යුතු විය.

''රෙයිනා,'' ඇය පැවසුවාය. ''ජුපිටර් කඳවුරේදී වුණ දේ ගයියාගේ වැරැද්දෙන් වුණ දෙයක්. එයිඩෝලන්ලා නිසා.''

''ඔයාගේ පැහැදිලි කිරීම් පරෙස්සම් කරගන්න.'' රෙයිනා පැවසුවාය. ''ඔයාට ඒවා ඕනෙ වෙයි.''

බල්ලන් දෙදෙනා ගොරවමින්, අඟලක් සමීප වූහ. මේ වතාවේ, ඇනබෙත් සත්‍යය පැවසුවත් එය ඔවුන්ට ප්‍රශ්නයක් නොවන බව පෙනී ගියේය. ඇය පළායාමේ සැලසුමක් සිතීමට උත්සාහ කළාය. මුහුණට මුහුණ සටනකින් ඇයට රෙයිනාව පරාජය කළ හැකි වේද යන්න ගැන ඇති වූයේ සැකයකි. මේ ලෝහ බල්ලන් සමඟ, කිසිදු අවස්ථාවක් නොලැබ ඇය බලාගෙන සිටියාය.

''ඔයා අපේ කඳවුර වෙන් කරන්න ගයියාට ඉඩ දුන්න නම්,'' ඇනබෙත් පැවසුවේය. ''යෝධයෝ දැනටමත් දිනුම්. එයාල රෝමවරුන් විනාශ කරයි, ග්‍රීකයන්ව, දෙවියන්ව, මුළු මනුෂ්‍ය ලෝකයම විනාශ කරයි.''

''ඔයා හිතන්නේ මම ඒක දන්නෙ නෑ කියලද?'' රෙයිනාගේ හඬ යකඩ මෙන් දැඩි විය. ''ඔයා මොකක්ද මට ඉතුරු කරපු විකල්පය? ඔක්ටේවියන් ලේ ඉව කරනවා. එයා ලෙජියන් එක ආවේගයෙන් හසුරුවනවා. මට ඒක නවත්තන්න බැහැ. මට යටත් වෙන්න. මම ඔයාව ආපහු නඩු විභාගයට නව රෝමයට අරන් යන්නම්. ඒක හොඳ වෙන එකක් නැහැ. ඔයාට වේදනාකාරී මරණයක් අත්වෙයි. ඒත් ඒක ඉදිරි ප්‍රචණ්ඩකාරීත්වය නවත්වන්න ප්‍රමාණවත් වෙයි. ඇත්තටම, ඔක්ටේවියන් සෑහීමකට පත්වෙන එකක් නෑ, ඒත් මම හිතන්නේ අනිත් අයට ඒත්තු ගන්වලා නවත්තගන්න මට පුළුවන් වෙයි.''

''ඒ මම නෙමෙයි!''

''ඒක ප්‍රශ්නයක් නෑ!'' රෙයිනා පැවසුවාය. ''සිද්ධවෙච්ච දේට කවුරු හරි වන්දි ගෙවන්න ඕනෙ. ඒ ඔයා වෙන්න ඉඩ හරින්න. ඒක තමයි හොඳම විකල්පය.

ඇනබෙත් ගල් ගැසුණාය. ''මොකේට වඩා හොඳද?''

''ඔයාගෙ නුවණ පාවිච්චි කරන්න,'' රෙයිනා පැවසුවාය. ''අද ඔයා පැනල ගියොත්, අපිට ලුහුබඳින්න ඕනෙ නෑ. මම ඔයාට කිව්වා. පිස්සෙක්වත් මුහුද හරහා පැරණි භූමියට යන එකක් නැහැ. ඔක්ටේවියන්ට නැවේදි එයාලගෙ පලිය ගන්න බැරි වුණොත්, එයාගෙ අවධානය අර්ධ ලෝහිත කඳවුරට යොමුවෙයි. ලෙජියන් එක ඔයාලගෙ ප්‍රදේශයේ ගමන් කරයි. අපි ඒක පෘථිවියෙන් මකල දානවා.

*රෝමවරුන්ව මරන්න,* ''ඇයට තම මවගේ අයාචනය ඇසිණි. *එයාලට කවදාවත් ඔයාලගේ පැත්තට එන්න බැහැ.*

ඇනබෙත්ට ඉකි බිඳීමට වුවමනා විය. ඇය මෙතෙක් දැන සිටි එකම නිවහන වූයේ අර්ධ ලෝහිත කඳවුර පමණකි. එසේම මිතුරුකම ලංසුවට තබමින් ඇය රෙයිනාට එය තිබෙන තැන හරියටම පැවසුවාය. එය රෝමවරුන්ගේ ක්ෂමාව මත තබා ලොව වටා අඩක් සංචාරය කිරීමට ඇයට නොහැකිය.

එහෙත් ඔවුන්ගේ ගවේෂණයට සහ පර්සිව නැවත ලබා ගැනීමට ඇය සෑම දෙයක්ම විඳගත්තාය. ඇයට පැරණි භූමියට

යාමට නොහැකි නම්, සියලු දේවල්වල තේරුමක් නැති වනු ඇත. අනෙක් අතට, ඇතීනාගේ සලකුණ පළිගැනීමට මඟ පෙන්වන්නක් නොවේ. *මට මාර්ගය හොයාගන්න පුළුවන් වුණොත්, ඇගේ මව එසේ පැවසුවාය. ගෙදරට යන විදිහ...*

ඔයා කොහොමද ඔයාගෙ තිළිණය පාවිච්චි කරන්නේ? ඇප්‍රොඩයිට් විමසුවාය. සාමයටද. යුද්ධයටද?

එයට පිළිතුරක් නොතිබිණි. ඇය ජීවතුන් අතර සිටියොත්, ඇතීනාගේ සලකුණ එයට මඟ පෙන්වනු ඇත.

''මම යනවා,'' ඇය රෙයිනාට පැවසුවාය. ''මම ඇතීනාගේ සලකුණ අනුව රෝමයට යනවා.''

විනිසුරුවරිය හිස සැලුවාය. ''ඔයා මොනවද බලාපොරොත්තු වෙන්නෙ කියල ඔයාට කිසිම අදහසක් නැහැ.''

''ඔව්.'' ඇනබෙත් පැවසුවාය. ''අපේ කඳවුරු අතරෙ තියෙන මේ එදිරිවාදීකම... මට ඒක හදන්න පුළුවන්.''

''අපේ එදිරිවාදිකමට අවුරුදු දහස් ගාණක් වයසයි. එක පුද්ගලයෙක් කොහොමද ඒක හදන්නේ?''

තමා සතුව ඒත්තු ගැන්විය හැකි පිළිතුරක් තිබුණේ නම් හොඳ බව ඇනබෙත්ට සිතිණි. රෙයිනාට ත්‍රිමාණ රූ සටහන හෝ දීප්තිමත් ක්‍රමාණුරූපය පෙන්විය හැකිව තිබුණා නම් හොඳ වුවත්, ඇයට එසේ කිරීමට නොහැකිය. තමා උත්සාහ කළ යුතු බව පමණක් ඇය දැන සිටියාය. ඇගේ මවගේ මුහුණේ තිබූ පරාජිත පෙනුම ඇගේ මතකයේ තිබිණ. මම ආපසු ගෙදර යන්න ඕනෙ.

''ගවේෂණය සාර්ථකයි.'' ඇය පැවසුවාය. ''ඔයාට මාව නවත්තන්න උත්සාහ කරන්න පුළුවන්, එහෙම වුණොත් අපිට මරණය දක්වාම සටන් කරන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් ඔයාට පුළුවන් මට යන්න අරින්න. ඒ වගේම මම අපේ කඳවුරු දෙකම බේරගන්න උත්සාහ කරනවා. ඔයා අර්ධ ලෝහිත කඳවුරට යනවා නම් , අඩුග ානෙ ඒක ප්‍රමාද කරන්නවත් උත්සාහ කරන්න. හෙමින් ඔක්ටේවියන්ව නවත්තන්න.''

රෙයිනාගේ දෑස් පටුවිය. ''යුද දෙවඟනගෙ එක දියණියකගෙන් අනෙකාට, මම ඔයාගෙ නිර්භීතකමට ගරු කරනවා. ඒත් ඔයා දැන් පිටවෙලා යනව නම් ඔයා ඔයාගෙ කඳවුරේ විනාශය තීන්දු කරනවා.''

''අර්ධ ලෝහිත කඳවුර අවතක්සේරු කරන්න එපා.'' ඈනබෙත් අනතුරු ඇඟවූවාය.

''ඔයා කවදාවත් යුද්දයෙදී රෝම සේනාංකයක් දැකලා නෑ.'' රෙයිනා පැවසුවාය.

ජැටියට ඉහළින් හුරුපුරුදු හඬක් සුළඟේ ඇදී ආවේය. ''උන්ව මරන්න! උන් හැමෝම මරන්න!''

වරායේ පිහිනමින් සිටි ඔක්ටේවියන් තම දිවි ගලවා ගැනීමට සමත් වී තිබේ. ඔහු තම ආරක්ෂකයන් පිටුපසට වී නැව දෙසට යාමට උත්සාහ දරණ උප දෙවිවරුන් දිරි ගැන්වීමට කෑ ගසමින් සිටියි. කුණාටුවෙන් ගැලවීමට ඔවුහු සියල්ලෝම තම පලිහ හිසට ඉහළින් ඔසවාගෙන සිටියහ.

ආගෝ II හි නැව් තට්ටුව මත, පර්සි සහ ජේසන් තම අසිපත් හරස් කරගෙන සිටියහ. ඔවුන් දෙදෙනාම එකවර අහසත්, මුහුදත් තම අණසකට නතු කරගෙන සිටින බව ඈනබෙත්ට පෙනී ගියාය. ජල තරංග වේගයෙන් ආරක්ෂක පවුරේ වැදිණි. විදුලි රේඛාවලින් අහස්කුස ආලෝකමත් විය. යෝධ රාජාලීන් අහසේ පෙනෙන්නට නොසිටියහ. පියාඹන අස්රියේ සුන්බුන් ජලයට යට වී ගියේය. නෞකාවට ඉහළින් පියාඹන වාරයක් පාසා කෝච් හෙජ් හරස් දුන්නෙන් පක්ෂීන්ට ප්‍රහාර එල්ල කළේය.

''ඔයා දැක්කනෙ?'' රෙයිනා දරදඬු ලෙස පැවසුවාය. ''හෙලි විසිවෙනවා. අපේ මිනිස්සු යුද්ද කරනවා.''

''මම සාර්ථක නොවුණොත්,'' ඈනබෙත් පැවසුවාය.

ජේසන්ට වෙනත් කෙල්ලක හමු වී ඇති බව ජුපිටර් කඳවුරේදී අවබෝධ වූ විට රෙයිනාගේ මුහුණේ පැවති ඉරියව් මේ අවස්ථාවේදීත් ඇගේ මුහුණේ දක්නට ලැබිණි. ඈනබෙත් ඇගේ ප්‍රහාරය බලාපොරොත්තුවෙන් පසු වූවාය.

ඒ වෙනුවට රෙයිනා ඇගේ අත වැනුවාය. ලෝහ බල්ලන්ගේ ගෙරවීම නැවතිණි. ''ඈනබෙත් චේස්.'' ඇය පැවසුවාය. ''අපි ආයෙ හමුවුණාම, අපි සටන් බිමේ සතුරන් වෙයි.''

ආපසු හැරුණු විනිසුරුවරිය ආරක්ෂක පවුර දෙසට ඇවිද ගියාය. ඇගේ දඩයම් බල්ලෝද ඇය පසුපසින් ගියහ.

එය යම් ආකාරයක කපටිකමක් දැයි ඇනබෙත් බියට පත් වූවාය. එහෙත් ඇයට පුදුමවෙමින් සිටීමට කාලයක් නොතිබිණි. ඇය නැව දෙසට දිව ගියාය.

රෝමවරුන්ට පහර දුන් මාරුතයෙන් ඇයට බලපෑමක් වන බවක් නොපෙනුණි.

ඇනබෙත් ඔවුන් අතරින් වේගයෙන් දිව ගියාය. ඔක්ටේවියන් කෑගැසුවේය. ''ඇයව නවත්වනු!''

හෙල්ලයක් ඇගේ කන අසලින්ම ඇදී ගියේය. ආගෝ II දැනටමත් ජැටියෙන් ඉවතට ඇදෙමින් තිබිණි. පාරු මඟෙහි සිටි පිපර් අත දිගුකරගෙන සිටියාය.

ඇනබෙත් ඉදිරියට පැන පිපර්ගේ අත අල්ලා ගත්තාය. පාරු මඟ සයුරට වැටිණි. කෙල්ලන් දෙදෙනා නැව් තට්ටුවට ගොඩ වූහ.

''යමු!'' ඇනබෙත් කෑ ගැසුවාය. ''යමු, යමු, යමු!''

එන්ජින්වල ඝෝෂාව වැඩි විය. හබල් දිගු විය. ජේසන් සුළඟේ දිශාව වෙනස් කළේය. පර්සි දැවැන්ත රළ තරංගයක් කැඳවීය. එයින් නෞකාව බලකොටුවේ ප්‍රාකාරවලටත් වඩා ඉහළට එසැවී සයුරට පතිත විය. මේ වනවිට ආගෝ II එහි උපරිම වේගයට ළඟා වී තිබිණි. සම්ටර් බලකොටුව ඈතින් තිතක් ලෙස දිස්විය. ඔවුහු රළ මතින් පැරණි භූමිය බලා යාත්‍රා කරමින් සිටියහ.

# 21
# ලියෝ

**සන්ධාන භූතයන්ගෙන් පිරුණු කෞතුගාරයේ ඇවිදීමෙන් පසු** තමාගේ දවස නරක් නොවනු ඇතැයි ලියෝ සිතුවේය. එහෙත් ඔහුට වැරදිණි.

සිවිල් යුද්ධයට අදාළ කිසිම දෙයක් ඔවුන්ට සොයා ගැනීමට නොහැකි විය. එසේත් නැතිනම් ඒවා පිහිටා තිබුණේ කෞතුකාගාරයේ වෙනත් තැනකය. වැඩිහිටි සංචාරකයන් කීප දෙනෙකුත්, ආරක්ෂක නිලධාරීන් සහ අළු පැහැති නිල ඇඳුමින් සැරසුණු මුළු පිසාච සේනාංකයම ඔවුහු කෞතුක භාණ්ඩ පරීක්ෂා කිරීමට උත්සාහ කරද්දී එහි රැඳී සිටියහ.

ෆ්‍රැන්ක්ට ආත්මයන් පාලනය කිරීමට හැකි වෙතැයි යන අදහසට කුමක් සිදුවීද? ඔව්... එය බොහෝ දුරට අසාර්ථක විය. ඒ වනවිට පිපර් ඇගේ අයිරිස් පණිවුඩයෙන් රෝමන්වරුන්ගේ ප්‍රහාරය පිළිබඳ අනතුරු ඇඟවීම එවා තිබුණාය. ඔවුහු ඒ වනවිටත් නැවට ආපසු පැමිණීමේ අඩ දුරක් ගෙවා දමා සිටියහ. චාල්ස්ටන් පහළ නගරයේදී ඔවුන්ට මළගිය සන්ධානකරුවන් කණ්ඩායමක කෝපයට මුහුණ දීමට සිදුවිය.

ඉන්පසු අහෝ, අසරණ කොලුවා! ඔහුට මිත්‍රශීලී රාජාලියකු බවට පත්වූ ෆ්‍රැන්ක්ගේ පාදවල එල්ලී ගමන් කිරීමට සිදුවිය. එබැවින් ඔවුන්ට රෝමන්වරු රොත්ත සමඟ සටන් කිරීමට ද හැකි විය. කටකතා පැතිරගොස් තිබුණේ, ලියෝ විසින් ඔවුන්ගේ කුඩා නගරය ගිනි තැබූ

බවටයි. එම නිසා රෝමවරුන්ට ඔහුව මරා දැමීම සඳහා විශේෂිත උනන්දුවක් පැවතිණි.

එහෙත් මඳක් සිටින්න! එහි ඊට වඩා දෙයක් තිබිණි. කෝච් හෙජ් අහසේදී ඔවුන්ට ප්‍රහාර එල්ල කළේය. ෆ්‍රෑන්ක් ඔහුව අතහැරි (එය අනතුරක් නොවේ) අතර ඔවූහු සම්ටර් කොටුවට පතිත වූහ.

දැන්, ආගෝ II දිය රැළි මතින් වේගයෙන් යාත්‍රා කරද්දී මුළු නැවම එකට තබා ගැනීමට ලියෝට ඔහුගේ සියලු දක්ෂතාවයන් යොදා ගැනීමට සිදුවිය. දැවැන්ත කුණාටුවකදී ඉවුම් පිහුම් සඳහා ජේසන් සහ පර්සි එතරම් දක්ෂයෝ නොවූහ.

එක් තැනකදී, ඇනබෙත් ඔහු සමීපයෙන් හිඳගෙන්, සුළගේ ගර්ජනය පරයන හඬින් කෑ ගැසුවාය. ''චාල්ස්ටන් වරායෙ නෙරිඩ්කෙනෙකුට කතා කළා කියලා පර්සි කිව්වා.''

''ඒක හොඳයි,'' ලියෝ පිළිතුරු දුන්නේය.

''නෙරිඩ් කියල තියෙන්නේ අපි චිරොන්ගේ සහෝදරයන්ගෙන් උදව් ලබාගත යුතුයි කියලයි.''

''මොකක්ද ඒකෙ තේරුම? සම්භාෂණ පෝනියෝද?'' චිරොන්ගේ උන්මත්තක නරාශ්ව ඥාතීන් ලියෝට කිසිදා මුණ ගැසී නොතිබිණි. එහෙත් ඔහු නර්ෆ් කඩු සටන්, මූල බීර සහ පීඩනයට ලක්කළ ක්‍රීම්වලින් යුත් සුපර් සෝකර් ගැන කටකතා අසා තිබිණි.

''හරියටම කියන්න බැහැ,'' ඇනබෙත් පැවසුවාය. ''ඒත් මම දිශාව ලබාගත්තා, ඔයාට මේකෙ අක්ෂාංශ දේශාංශ ලබා ගන්න පුළුවන්ද?''

''මට පුළුවන් තාරකා සටහන ඇතුළත් කරන්න. ඒ වගේම ඔයාට ඕන්නම් මෘදුව අණ දෙන්න. ඇත්තටම මට අක්ෂාංශ දේශාංශ හොයාගන්න පුළුවන්.''

ඇනබෙත් අංක පැවසුවාය. කෙසේ හෝ එක් අතකින් සුක්කානම අල්ලා ගනිමින් ඒවා අතුළත් කිරීමට ලියෝ සමත් විය. ලෝකඩ දර්ශන තීරයේ රතු පැහැති තිතක් දර්ශනය විය.

''ඒ තැන තියෙන්නෙ අත්ලාන්තික් වල මැද.'' ඔහු පැවසුවේය.

''සම්භාෂණ පෝනීන්ට යාත්‍රාවක් තියෙනවද?''

ඇනබෙත් දෙවුර සැලුවාය. ''අපි චාල්ස්ටන්වලින් ඈතට යනකම් නැව එකට තියාගන්න. ජේසන් සහ පර්සි සුළං තියාගනී.

''අපූරු සතුටු වෙලාවක්!''

එය සදාකාලයටම ඇතිවන්නක් බව පෙනී ගියත්, අවසානයේ මුහුද නිසල වී සුළඟ වියැකී ගියේය.

''වැල්ඩේස්,'' පුදුමාකාර මහත්මා ලීලාවකින් කෝච් හෙජ් පැවසුවේය. ''මට සුක්කානම දෙන්න. ඔයා පැය දෙකක් විතර නැව අරන් ගියා.''

''පැය දෙකක්?''

''ඔව්, මට සුක්කානම දෙන්න.''

''කෝච්?''

''ඔව්, දරුවා?''

''මට අත් දිග  හරින්න බැහැ.''

එය සැබෑවක් විය. ලියෝගේ ඇඟිලි වලට දැනුණේ ඒවා ගල් වී ඇති සෙයකි. ක්ෂිතිජය දෙස බලා සිට ඔහුගේ දෑස් දූවෙමින් තිබිණි. ඔහුගේ දණහිස් ගැහෙමින් තිබිණි. කෝච් හෙජ් ඔහුව සුක්කානමෙන් මුදවා ගැනීමට සමත් විය.

ලියෝ අවසන් වතාවට එක වරක් පාලන පුවරුව දෙස බලා. ෆෙස්ටස්ගේ කියවීමට සවන් දුන්නේය. තත්ත්ව වාර්තාව පරීක්ෂා කළේය. ඔහුට දැනුණේ යමක් අමතක වූ හැඟීමකි. පාලන පුවරුව දෙස බලාගෙන, ඔහු සිතීමට උත්සාහ කළත් එයින් පලක් වූයේ නැත. ඔහුගේ දෙනෙත් නාභිගත කර ගැනීම අසීරු විය. ''රාක්ෂයෝ ගැන ඇහැ ගහගෙන ඉන්න.'' ඔහු කෝච්ට පැවසුවේය. ''ඒ වගේම හානි වුණ ස්ටැබිලයිසරය ගැනත් ප්‍රවේසම් වෙන්න. ඒ වගේම.''

''මම ඒක හැදුවා.'' කෝච් හෙජ් සහතික විය. ''දැන්, අහකට යන්න.''

ලියෝ අසීරුවෙන් හිස සැලුවේය. ඔහු නැව් තට්ටුව දිගේ තම මිතුරන් වෙත ගියේය.

පර්සි සහ ජේසන් ඇණිය මත හිඳගෙන සිටියහ. වෙහෙස හේතුවෙන් ඔවුන්ගේ හිස් පහත් වී තිබිණි. ඇනබෙත් සහ පිපර් ඔවුන්ට වතුර දිමට උත්සාහ කළහ.

කන වැකෙන මානයේ හේසාල් සහ ෆ්‍රෑන්ක් රැඳී සිටියහ. දෑත් විසිවෙන සහ හිස් වැනෙන ආකාරයෙන් ඔවුන් කුමක් හෝ වාදයක

පැටලී සිටින බව පෙනී ගියේය. ලියෝට ඒ ගැන දැනුණේ එතරම් ප්‍රසන්න හැඟීමක නොවේ. එහෙත් මොළයේ තවත් අර්ධයක් එය ඉවසුවේය.

හේසාල්, ලියෝ දුටු වහාම වාදය නැවතුවාය. සැවොම ඇණියට රොක් වූහ.

බල්ලකු බවට පත්වීමට දැඩි උත්සාහයක් දරූ කළෙක මෙන් ෆ්‍රැන්ක් රවාගෙන සිටියේය. ''ලුහුබඳින සලකුණක්වත් නැහැ.'' ඔහු පැවසුවේය.

''එහෙම නැත්නම් ගොඩබිමක්වත්,'' හේසාල් පැවසුවාය. ඇය කොළ පැහැ ගැන්වී ඇති බවක් පෙනුණත්, ඒ බෝට්ටුවේ ගැස්සීම නිසාද, නැතිනම් වාදය නිසාද යන්න ලියෝට පැහැදිලි නොවීය.

ලියෝ ක්ෂිතිජය පරීක්ෂා කළේය. සැම අතින්ම සාගරය හැර වෙනත් කිසිවක් දැක ගැනීමට නොලැබිණි. ඔහුට එය පුදුමයට කරුණක් නොවීය. අත්ලාන්තික් සයුර තරණය කිරීමට සිදුවන බව දැන සිටි ඔහු මාස හයක්ම නෞකාව ඉදිකිරීමට වැය කළේය. එහෙත් අද වනතුරු, ඔවුන් පැරණි භූමිය සොයා නැව් නගින තුරු එය යථාර්ථයක් වනබව නොපෙනුණි. ලියෝ මින් පෙර කෙදිනකවත් එක්සත් ජනපදයෙන් පිටතට - මකර වෙසින් ක්විබෙක් දක්වා ඉක්මන් ගමනක් හැර- ගොස් තිබුණේ නැත. දැන් ඔවුන් සිටින්නේ විවෘත සයුර මැදය. මුළුමනින්නම තම උත්සාහයෙන් බියකරු රාක්ෂයන් සහ නපුරු යෝධයන් එන මාරි නොස්ට්‍රම් බලා යාත්‍රා කිරීමට සිදුව තිබේ. රෝමන්වරු ඔවුන්ව ලුහු බැඳීමක් සිදු නොකරනු ඇතත්, අර්ධ ලෝහිත කඳවුරෙනුත් ඔවුන්ට කිසිදු ආකාරයක සහායක් නොලැබෙනු ඇත.

තම උපකරණ සහිත ඉන පටිය තවමත් තිබේදැයි සැකහැර ගැනීමට ලියෝ තම ඉන පෙදෙසට තට්ටුවක් දැම්මේය. අවාසනාවකට එයින් ඔහුට නෙමිසිස්ගේ වාසනාවේ විස්කෝතු (එහි එක් සාක්කුවක තිබූ) ගැන සිහිපත් විය.

*ඔබ සැමවිටම පිටස්තරයෙක් වෙයි.* දෙවඟනගේ වචන තවමත් ඔහුගේ හිසේ නාද දුන්නේය. *හත්වෙනි රෝදය.*

*එයාව අමතක කරන්න.* ලියෝ තමාටම පවසා ගත්තේය. *ඔයාට කරන්න තියෙන දේ ගැන අවධානය යොමු කරන්න.*

ඔහු ඇනබෙත් දෙසට හැරුණේය. ''ඔයාට ඕනෙ කරපු සිතියම හොයා ගත්තද?''

හිස සැලූ මුත් ඇය මලානික වී සිටියාය. මෙතරම් නරක ලෙස ඇයව සසල කිරීමට තරම් ඇය සම්ටර් බලකොටුවේදී කුමක් දකින්නට ඇත්දැයි ඔහු පුදුමයට පත් විය.

''මම ඒක අධ්‍යයනය කරන්න ඕනෙ.'' මාතෘකාව අවසන් කිරීමට මෙන් ඇය පැවසුවාය. ''අපි අර ස්ථානයට කොච්චර දුරින්ද ඉන්නෙ?''

''උපරිම වේගෙන් ගියොත්, පැයක දුරින්.'' ලියෝ පැවසුවේය. ''අපි මොනවද හොයන්නෙ කියලා මොනවහරි අදහසක් තියෙනවද?''

''නෑ.'' ඇය පැවසුවාය. ''පර්සි?''

පර්සි හිස එසවූයේය. ඔහුගේ කොළ පැහැති ඇස් රත් පැහැ වී තිබිණි. ''නෙරිඩ් කිව්වේ චිරොන් සහෝදරයෝ එහෙ ඉන්නව කියලයි. ඇට්ලාන්ටාවල තියෙන මින් මැදුර ගැන එයාලට අහන්න ඕනෙලු. මම දන්නෙ නෑ ඇය ඒකෙන් මොකක්ද අදහස් කළේ කියලා. ''ඒත්...'' ඒ ටික පැවසීමට තම සියලු ශක්තිය වැය කළා සේ ඔහු නැවතිණි. ''ඒ වගේම එයා ප්‍රවේසම් වෙන්න කියලත් මට අවවාද කළා. කේටෝ, මින් මැදුරේ දෙවඟන. එයා තමයි මුහුදු රාක්ෂයන්ගේ මව, එයා ඇට්ලන්ටාවල නැවතිලා වෙන්න පුළුවන්. ඒත් එයාට තවමත් පුළුවන් එයාගෙ දරුවෝ අපි පස්සේ එවන්න. අපි ප්‍රහාරයක් බලාපොරොත්තු විය යුතු බවයි නෙරිඩ් කිව්වේ.''

''පුදුමයක්,'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

හොඳ අදහසක් නොවුණත්, ජේසන් නැගිටීමට උත්සාහ කළේය. වැටෙන්නට යා නොදී වලක්වා ගැනීමට පිපර් ඔහුව අල්ලා ගත්තාය. ඔහු නැවත ඇණියට ගියේය.

''අපිට නැව ඉහළට ගන්න බැරිද?'' ඔහු විමසුවේය. ''අපිට පියාසර කරන්න පුළුවන් නම්.''

''ෆෙස්ටස් මට කිව්වෙ නැත්නම් නැව සම්ටර් බලකොටුවෙ ජැටියට කඩාවදින කොට ඒකෙ ගගන ස්ථායිකාරකය කුඩු පට්ටම් වුණා කියලා. ෆෙස්ටස් එහෙම නොකිව්වනම් ඕක නියම අදහසක් වෙන්න තිබුණ තමයි.'' ලියෝ පැවසුවේය.

''අපි ඉක්මන් කළා,''ඇනබෙත් පැවසුවාය. ''ඔයාලව බේර ගන්නයි උත්සාහ කළේ.''

''ඒ වගේම මාව බේරගැනීම බොහොම උදාර වැඩක්.'' ලියෝ එකඟ විය. ''මම මේ කිච්චෙ ඒක හදන්න යම් කාලයක් ගතවෙයි කියලයි. එතකම්, අපිට කොහෙවත් පියාසර කරන්න බැහැ.''

පර්සි තම දෙවුර නැටවුවේය. ''මට නම් හොඳයි. මුහුද හොඳයි.''

''ඔයා ගැන කියවනවා,'' සම්පූර්ණයෙන්ම වාගේ ක්ෂතිජය දෙසට වන්නට තිබූ සන්ධ්‍යා හිරු දෙස බලමින් හේසාල් පැවසුවාය. ''අපිට වේගයෙන් යන්න වෙනවා. අපි තවත් දවසක් නාස්ති කළා. නිකෝට තියෙන්නෙ තව දවස් තුනයි.''

''අපිට ඒක කරන්න පුළුවන්.'' ලියෝ සහතික විය. තම සොහොයුරාව විශ්වාස නොකිරීම ගැන හේසාල් තමාට සමාව දෙනු ඇතැයි ලියෝ බලාපොරොත්තු විය. (එය ලියෝ වෙත තිබූ සාධාරණ සැකයක් බව පෙනිණ) එහෙත් ඔහුට තුවාලය නැවත පෑරවීමට අවශ්‍ය නොවීය. ''සහතික වෙන්න පුළුවන්, අනපේක්ෂිත දෙයක් සිද්ධ නොවුණොත් අපිට දවස් තුනකින් රෝමයට යන්න පුළුවන්.''

ෆ්‍රෑන්ක් ගෙරවූයේය. ඔහු තවමත් බල්ලකු බවට පත්වීමේ කාර්යයේ යෙදී සිටින බව පෙනී ගියේය. ''මොනවහරි හොඳ ප්‍රවෘත්තියක් තියෙනවද?''

''ඇත්තටම, ඔව්.'' ලියෝ පැවසුවේය. ''ෆෙස්ටස්ට අනුව, අපේ පියාඹන මේසය, බියුෆෝඩ්, අපි චාල්ස්ටන් ඉන්න අතරේ ආරක්ෂිතව ආපහු ඇවිත්. ඉතිං අර රාජාලියන්ට එයාව අහුවෙලා. නෑ. අවාසනාවකට, ඔයාගෙ ඇඳුම් තිබුණ බෑගය නැතිවෙලා.''

ෆ්‍රෑන්ක්ගේ මුවින් සාප කිරීම් රැසක් පිටවිය. පර්සි ඔහුව අස්වැසුවේය.

''ලෝකය උඩුයටිකුරු වෙලාද?'' ඔහු විමසුවේය.

ජේසන් හිසේ දෑත් තබා ගත්තේය. ''ඔව්, ඒක කැරකෙනවා. හැම දෙයක්ම කහ පාටයි. ඒක කහ පාට වෙන්න යනවද?''

ඇනබෙත් සහ පිපර් බැරෑරුම් බැල්මක් හුවමාරු කරගත්හ. ''අර කුණාටුව කැඳවීමේදී ඇත්තටම ඔයාලගෙ ශක්තිය වැයවුණා.'' පිපර් පැවසුවාය. ''ඔයාල විවේකයක් ගන්න ඕනෙ.''

ඇනබෙත් එය අනුමත කරමින් හිස සැලුවාය. ''ෆ්‍රෑන්ක්, මේ හාදයො දෙන්නව පහළ තට්ටුවට ගෙනියන්න උදව් කරනවද?''

ෆ්‍රෑන්ක් ලියෝ දෙස බැලුවේය. සැක නැතිවම ඔහුව හේසාල් සමඟ තනිකර යාමට ඇති අකැමැත්ත එහි දක්නට ලැබිණි. ''ඒක හොඳයි, මනුස්සයෝ,'' ලියෝ පැවසුවේය. ''පඩිපෙළෙන් පහළ බහින කොට එයාලව බිම වට්ටන්න එහෙම එපා.''

අනෙක් පිරිස පහළට ගිය පසු, හේසාල් සහ ලියෝ නුහුරු ලෙස එකිනෙකා දෙස බැලූහ.

පෝකිමෝන් තේමා ගීතය ගයමින් නැව් අවරයේ උඩ තට්ටුවට වී සිටි කෝච් හෙජ් හැරුණු විට එහි ඉතිරිව සිටියෙ ඔවුන් දෙදෙනා පමණි.

ගීතයෙන් හේසාල්ගේ පිළිකුල පහව නොයන බව පෙනී ගියේය.

''ආහ්...'' ඇය වැටට උඩින් වාරු වූවාය.

''උඩින් එබෙන්න එපා.'' ඔහු පැවසුවේය. ''ඔයාගෙ ඇස් වහ ගන්න එපා. ඒකෙන් අප්‍රිය බව තවත් වැඩිවෙයි.''

''එහෙමද? ඔයාට මුහුදු අසනීපෙ හැදිල තියෙනවද?''

''මුහුදු අසනීපෙ නෙමෙයි. ඒත් කාර් නම් මාව අසනීප කරනවා. ඒ වගේම...''

ඔහු නැවතිණි. ඔහුට වුවමනා වූයේ කෙල්ලන් සමඟ කථා කිරීම කියා කියන්නටය. එහෙත් ඔහු එය පැවසූවේ නැත. ''කාර්?'' හේසාල් අසීරුවෙන් විමසුවාය. ''ඔයාට පුළුවන් නැවක් යාත්‍රා කරවන්න. එහෙම නැත්නම් මකරෙක් පියාසර කරවන්න. ඒත් කාර්වලින් ඔයාව අසනීප වෙනවද?''

''මම දන්නවා හරිද?'' ලියෝ දෙවුර සැලුවේය. ''ඒ පැත්තෙන් මම විශේෂයි. බලන්න . ඔයාගෙ ඇස් ක්ෂිතිජය දිහාට යොමු කරන්න. ඒක තමයි ප්‍රතිකර්මය. ඒකෙන් උදව්වක් වෙයි.''

දිගු හුස්මක් ගත් හේසාල්, ඈත බැලුවාය. ඇගේ දෑස් රන්වන් පැහැති විය. ඒවා දිස්වූයේ හරියට ෆෙස්ටස්ගේ යාන්ත්‍රික හිස තුළ තිබෙන තඹ සහ ලෝකඩ තැටි මෙනි.

''මොනවහරි ගුණයක් තියෙනවද?'' ඔහු විමසුවේය.

''සමහරවිට ටිකක් විතර.'' ඇය තරමක් විනීත ලෙස පැවසුවාය. ඇය තම දෑස් ක්ෂිතිජය දෙසට යොමා සිටියත්, ලියෝට හැඟී ගියේ ඇය කුමක් පවසන්න දැයි සිතමින් තමාගේ මනෝභාවය මනින බවය.

''ෆ්‍රැන්ක් හිතාමතා ඔයාව පහළට දැම්මේ නෑ.'' ඇය පැවසුවාය.

''එයා එහෙම කෙනෙක් නෙමෙයි. සමහර වෙලාවට එයා ටිකක් අශෝභනයි.''

''අපොයි.'' ලියෝ පැවසුවේය. ''ලියෝව සතුරු සෙබල සේනාංකය මැදට අතහැරියා.''

හේසාල් සිනාවක් නඟා ගැනීමට උත්සාහ කළාය.

''එයා ගැන එච්චර හිතන්න එපා.'' හේසාල් පැවසුවාය. ''ඔයයි ඔයාගේ ගිනි බෝලයි එයාව කලබල කළා.''

''අලියෙක් බවට පත්වෙන්න පුළුවන් හාදයෙක්ව මම කලබල කළා?''

හේසාල් ඇගේ දෑස් ක්ෂිතිජය දෙස රඳවාගෙන සිටියාය. ඇයට සුවයක් නොදැනිණි. සුක්කානම අසල සිටි කෝච්ගේ ගායනය ඇයට ඔක්කාර ඇති කරවීමට හේතු විය.

''ලියෝ.'' ඇය පැවසුවාය. ''මහා ලවණ විලේදී මොනව සිදු වුණත්...''

*මෙන්න ඒක එනවා.* ලියෝ සිතුවේය.

පළිගැනීමේ දෙවඟන නෙම්සිස් සමඟ ඔවුන්ගේ රැස්වීම ඔහුගේ මතකයට නැගුණේය. ඔහුගේ ඉන පටියේ වූ වාසනාවන්ත විස්කෝතුව බරින් වැඩි වන බවක් දැනිණ. පෙරදින රැයේදී, ඔවුන් ඇට්ලන්ටාවලින් එද්දී, තම කුටිය තුළට වී ලියෝ කල්පනා කළේ හේසාල්ව කොතරම් කෝප ගැන්වූයේ ද යන්නයි. එය නිවැරදි කළ හැකි විධි ගැනද ඔහු කල්පනා කළේය.

*ඉක්මනින්ම, ඔබට විසඳිය නොහැකි ප්‍රශ්නවලට මුහුණ දීමට ඔබට සිදුවනු ඇත. නෙම්සිස් පවසා තිබුණාය. ඒත් මම ඔයාලට උදව් කරන්නම්.... මිලකට."*

ලියෝ තම උපකරණ පටියේ තිබූ වාසනාවේ විස්කෝතුව අතට ගෙන පෙරලා බැලුවේය. එය කඩා විවෘත කළේ නම් තමාට කුමන මිලක් ගෙවීමට සිදුවනු ඇත්දැයි ඔහුට සිතා ගැනීමට නොහැකි විය.

සමහරවිට ඒ මොහොත දැන් විය හැකිය.

''මම එකඟ වෙන්නම්.'' ඔහු හේසාල්ට පැවසුවේය. ''මට ඔයාගෙ සහෝදරයව හොයාගන්න වාසනාවේ විස්කෝතුව පාවිච්චි කරන්න පුළුවන්.''

හේසාල් ගල් ගැසී බලාසිටියාය. ''මොකක්ද? නෑ! මම කිව්වෙ... මම කොහෙත්ම එහෙම කරන්න කිව්වෙ නැහැ. නෙම්සිස් කියපු භයානක මිලෙන් පස්සෙ මට එහෙම කියන්න බෑ. අපි එකිනෙකා ගැන දන්නෙ බොහොම ටිකයි.''

එකිනෙකා ගැන දන්නෙ ටිකයි යන සඳහන හිත රිදවන ආකාරයේ එකක් වුවත්, එය සැබෑවක් බව ලියෝ දැන සිටියේය.

''ඉතිං... ඔයාට කතාකරන්න ඕනෙ වුණේ ඒ ගැන නෙමෙයිද?'' ඔහු විමසුවේය. ''ආහ්, ඔයාට කතා කරන්න ඕනෙ වුණේ ගල් ගැහෙන වෙලාවල් වල අත් අල්ලාගෙන ඉන්න එක ගැනද? මොකද...''

''නෑ!'' ඇය පැවසුවාය. ''නෑ. මම හිතමින් හිටියේ අර නාර්සිසස්ට සහ අප්සරාවියන්ට ඔයා ප්‍රයෝගයක් කරපු විදිහ ගැන.''

''ආහ්, හරි.'' ලියෝ සවිඥානිකව ඔහුගේ අත දෙස බැලුවේය. උණුසුම් ද්‍රව්‍යයේ පච්චය සහමුළින්ම වියැකී ගොස් තිබිණි. ''ඒ වෙලාවෙ තිබුණ හොඳම අදහස.''

''ඔයා පුදුමාකාරයි.'' හේසාල් පැවසුවාය. ''ඔයා මට කොච්චර මතක් කරනවද?''

''සැමී.'' ලියෝ අනුමාන කළේය. ''මම කැමති එයා කවුද කියලා ඔයා මට කිව්ව නම්.''

''කවුද එයා.''හේසාල් නිවැරදි කළාය. සන්ධ්‍යාවේ වාතය උණුසුම් වූ නමුත් ඇය වෙව්ලුවාය. ''මම හිතමින් හිටියේ... මට පුළුවන් වෙයි ඔයාට පෙන්වන්න.''

''ඔයා කියන්නෙ ඡායාරූපයකින් වගේ දේකින්ද?''

''නෑ. මට අතීතාවලෝකනයක් වගේ දෙයක් සිද්ධ වුණා. මට එක දෙයක් දීර්ඝ කාලයක් තිබිල නෑ. ඒ වගේම මම කවදාවත් හිතාමතා දෙයක් සිද්ධ වෙන්න ඉඩ හැරල නෑ. ඒත් එක පාරක් මම එකක් ෆ්‍රෑන්ක් එක්ක හුවමාරු කරගත්තා. ඉතිං මම හිතුවේ.''

හේසාල් ඔහුගේ දෑස් දෙස බලාගෙන සිටියාය. ලියෝට දැනුණේ කෝපිවලින් මත්වුවා වැනි හැඟීමකි. මේ අතීතාවලෝකනය ෆ්‍රෑන්ක් හේසාල් සමඟ හුවමාරු කරගත් දෙයක් නම්, ලියෝට කෙහෙත්ම එහි

කොටස්කරුවකු විමට අවැසි නොවීය. එසේත් නැතිනම් ඔහු නිසැකවම ඒ සඳහා උත්සාහ දරණු ඇත. එයින් කොයිකදැයි ඔහුට පැවසීමට හැකියාවක් නොතිබිණි. ''ඔයා අතීතාවලෝකනය ගැන තියනකොට...'' ඔහු වචන ගිල්ලේය. ''ඇත්තටම අපි කතා කරමින් ඉන්නෙ මොනව ගැනද? ඒක ආරක්ෂිතද?''

හේසාල් අත එසවූවාය. ''මම ඔයාට මේක කරන්න කියන එකක් නැහැ, ඒත් මට විශ්වාසයි ඒක වැදගත් කියලා. අපි හමුවුණ එක අහම්බයක් වෙන්න බැහැ. මේක වැඩ කළොත්, සමහරවිට අපිට අන්තිමට තේරුම් ගන්න පුළුවන් වෙයි අපි කොහොමද සම්බන්ධ වුණේ කියලා.''

ලියෝ සුක්කානම දෙස හැරී බැලුවේය. ඔහුට තවමත් යමක් අමතක වී ඇති බවට සැකයක් ඔහු තුළ පැවතිණි. එහෙත් කෝච් හෙජ් වැඩේ හොඳින් කරගෙන යන බව පෙනී ගියේය. ඉහළ අහස පැහැදිලි විය. ප්‍රශ්නයක ලකුණක්වත් දක්නට නොලැබිණි.

අනෙක් අතට, අතීතාවර්ජනයේ කතාව තරමක් ලුහුඬු දෙයක් බව පෙනිණි. තවත් මිනිත්තු කීපයකට කෝච් හෙජ්ව ප්‍රධානියා කිරීමට එයින් බාධාවක් බව නොපෙනුණි.

''හරි.'' ඔහු එකඟවිය. ''මට පෙන්වන්න.''

ඔහු හේසාල්ගේ අත අල්ලා ගත්තේය. ලෝකය දිය වී ගියේය.

# 22
# ලියෝ

**ආශ්‍රමයක් වැනි ස්ථානයක, අංගනයේ ඔවුහු සිටගෙන සිටියහ.** රතු ගඩොල් බිත්ති වැලි වලින් වැසී ගොස් තිබිණි. භූමිය පුරා විශාල මැග්නෝලියා ගස් වැඩී තිබිණි. හිරු රශ්මිය අඩු වී තිබූ අතර තෙතමනය සියයට දෙසීයද ඉක්මවමින් හුස්ටන් වලටත් වඩා දුෂ්කර වී තිබිණි. අසල යම් තැනකින්, ලියෝට මාළු බදින සුවඳක් හමා ආවේය. ඉහළින් වූ වළාකුළු අළු පැහැති තීරුවෙන් දිස්වූයේ ව්‍යාඝ්‍ර සමක් සිහිගන්වමිනි.

අංගනය පැසි පන්දු පිටියක් තරම් විශාල එකක් විය. හුළං ගිය පරණ පා පන්දුවක් කෙළවරක වූ, කන්‍යා මරියතුමියගේ ප්‍රතිමාව පාමුල තබා තිබිණි.

ගොඩනැගිල්ල පුරාම වූ ජනේල විවෘතව තිබුණේය. ඇතුළත මඳ දීප්තියක් ලියෝට දක ගැනීමට හැකි වුවත්, එහි වූයේ මූසල නිහැඬියාවකි. වායු සමීකරණයක සලකුණක්වත් දක ගැනීමට ඔහුට නොහැකි විය. එහි අර්ථය වූයේ ඇතුළත අධික උෂ්ණත්වයක් පවතින බවයි.

''අපි කොහෙද ඉන්නෙ?'' ඔහු විමසුවේය.

''මගෙ පරණ ඉස්කෝලෙ.'' ඔහු අසල සිටි හේසාල් පැවසුවාය. යුරෝපීය නොවූ දරුවන් සහ ඉන්දියානුවන් සඳහා වූ ශාන්ත ඇග්නස් ඇකඩමිය.''

''මොන විදිහෙ නමක්ද -?''

හේසාල් දෙසට හැරුණු ඔහු වේදනාකාරී හඬක් නැගුවේය. ඇය භූතයෙක් වී සිටියාය. උණුසුම් වාතයේ වාෂ්ප වූ ඇගේ ඡායාව පමණක් දැකගත හැකි විය. පහළ බලන විට තමන්ගේ සිරුරද ඒ ආකාරයෙන් ඡායාවක් වී ඇති බව ඔහුට අවබෝධ විය.

ඔහු අවට සෑම දෙයක්ම ඝනව සහ සැබෑ ඒවා ලෙස පෙනිණි. එහෙත් ඔහු ආත්මයන් බවට පත්ව සිටියේය. දින දෙකකට පෙර එයිඩෝලන් විසින් අත්කර ගැනීමෙන් පසු, ඔහු ඒ හැඟීමට සතුටු වූයේ නැත.

ඔහු ප්‍රශ්න නැගීමට පෙර, ඇතුළත සීනුවක් නාද විය. එය නූතන විද්‍යුත් සීනුවක හඬක් නොව, පැරණි පත්තයේ මිටියකින් තලන සීනුවකි.

''මේක මතකයක්.'' හේසාල් පැවසුවාය. ''ඒ නිසා කාටවත් අපිව පේන්නෙ නෑ. බලන්න. මෙන්න අපි එනවා.''

''අපි?''

සෑම දොරටුවකින්ම ළමෝ දුසිම් ගණනක් කෑ ගසමින්, එකිනෙකා තල්ලු කරමින් අංගනයට පැමිණියහ. එහි වැඩිපුර වූයේ හිස්පැනික් පෙනුමින් යුත් දරුවන් සමඟ අප්‍රිකානු අමෙරිකානු දරුවන්ය. පෙර පාසල් වියේ සිට උසස් පාසල් සිසුන් දක්වා වයස්වල දරුවෝ එතැන සිටියහ. මේ අතීතය බව ලියෝට කිව හැකි විය. ඒ දැරියන් සියල්ලෝම ගවුම් හැඳ, ගාංචු සහිත සම් සපත්තු පැළඳ සිටි නිසාය. පිරිමි ළමෝ සුදු කොළරය සහිත කමිස සහ කලිසම් හැඳ කලිසම් පටි උරහිස්වල එල්ලගෙන සිටියහ. බොහෝ දෙනෙක් අශ්ව ජොකියන් මෙන් කැප් තොප්පි පැළඳ සිටියහ. සමහර දරුවෝ දිවා ආහාරය රැගෙන ආවෝය. බොහෝ දෙනෙකුට ආහාර නොතිබිණි. ඔවුන්ගේ ඇඳුම් පිරිසිදු වුවත් ඉරී හා දුර්වර්ණ වී තිබිණි. සමහරුන්ගේ කලිසම් දණහිස් අසලින් සිදුරු වී තිබිණි. එසේත් නැතිනම් සපත්තුවල අඩි ගැලවී ගොස් තිබිණි.

සමහර දැරියෝ ලණු පැනීමේ ක්‍රීඩාවේ නිරත වීමට පටන් ගත් අතර, වැඩිහිටි ළමුන් කුඩා බේස්බෝල් පිත්තක් ඉදිරියටත් පසුපසටත් විසි කිරීමටත් පටන් ගත්හ. දිවා ආහාරය ගෙනා ළමෝ එකට එක්වී කයිවාරු ගසමින් ආහාර ගත්හ.

කිසිවකුට භූත ලියෝ හෝ හේසාල් ගැන අවධානයක් නොවීය.

ඉන්පසු හේසාල්- අතීතයෙන් පැමිණි හේසාල් - අංගනයට පිවිසියාය. කිසිදු අසීරුවකින් තොරව ලියෝට ඇයව හඳුනා ගැනීමට හැකි වුවත්, ඇය දැන් සිටිනවාට වඩා වසර දෙකකින් පමණ ලාබාල පෙනුමකින් යුක්ත විය. ඇගේ කොණ්ඩය පිටුපසට කර බැඳ කටු ගසා තිබිණි. ඇගේ රන් පැහැති දෑස් අපහසුවෙන් මෙන් අංගනය සිසාරා දිව යන්නට විය. අනෙක් ගැහැනු ළමුන් මෙන් සුදු පැහැති හෝ මල් වැටුණු ඇඳුම් නොව ඇය හැඳ සිටියේ තද පැහැති ඇඳුමකි. විවාහ උත්සවයක ශෝක වන්නකු ලෙස ඇය සිටගෙන සිටියාය.

අවධානයට ලක්වීම වළක්වා ගැනීමට උත්සාහ කරන්නාක් මෙන් ඇය කැන්වස් ආහාර බෑගය දෑඩිව සිර කරගෙන බිත්ති අසලට ගෑටුවාය.

එහෙත් ඇගේ උත්සාහය අසාර්ථක විය. කොල්ලෙක් කෑ ගැසුවේය. ''මායාකාරි කෙල්ල!'' ඔහු ඇය අසලට සමීප වෙද්දී ඇය කොණකට ගෑටුවාය. කොලුවාට වයස දාහතරක් හෝ දහනවයක් පමණ වන්නට ඇත. ඔහු විශාල හා උසැති අයකු වූ බැවින් එය හරියටම පැවසීම අසීරු විය. ඔහු ක්‍රීඩාපිටියේ සිටි ලොකුම හාදයා බව පැහැදිලිව කිව හැකි වූයේය. ඔහු හැඳ සිටියේ ග්‍රීස් පැහැති අපිරිසිදු කමිසයකි. නූල් ඉලිප්පුණු ලෝම කලිසම මෙවැනි උෂ්ණත්වයකදී කිසිසේත් සුව පහසුව ඇති කරවන්නක් නොවීය. දෙපයේ පාවහන් නොතිබිණි. සමහරවිට මේ කොලුවා සපත්තු නොපැළඳීම ගැන විරෝධය පළ කරන්නට ගුරුවරු බිය වූවා විය හැකිය. එසේත් නැතිනම් ඔහුට කිසිදු සපත්තු කුට්ටමක් නොතිබුණා විය හැකිය.

''ඒ රූෆස්.'' භූත හේසාල් පිළිකුලෙන් පැවසුවාය.

''ඇත්තටමද? එයාගෙ නම රූෆස් වෙන්න විදිහක් නෑ.'' ලියෝ පැවසුවේය.

''එන්න.'' භූත හේසාල් පැවසුවාය. ඇය ගැටුම ඇති දෙසට ගියාය. ලියෝ ඇය පසුපස ගියේය.

රූෆස් ලොකු කොලුවාට තිබුණේ පැතලි මුහුණකි. ඔහුගේ කොණ්ඩය මුදුනින් පැතලි වන සේ කපා තිබිණි. එබැවින් කුඩා ප්‍රමාණයේ ගුවන් යානයක් පවා ඒ මත ගොඩබෑමේ හැකියාව තිබිණි.

රූෆස් තම අත විසිකළේය. ''දවල් කෑම.''

අතීතයෙන් පැමිණි හේසාල් විරෝධය නොපෑවාය. දිනපතා සිදුවන්නක් ලෙසින් ඇය තම කැනවස් බෑගය ඔහු අත තැබුවාය.

වැඩිමහල් දූරියන් කීපදෙනෙක් විනෝදජනක සිදුවීම නැරඹීමට රොක් වූහ. එකියක් රෑෆස්ට සිනාසුණාය. ''ඔයාට ඕක කන්න ඕනෙ නැහැ,'' ඇය අනතුරු ඇඟවූවාය. ''සමහරවිට ඕකෙ වස ඇති.''

''ඔයා හරි,'' රෑෆස් පැවසුවේය. ''ඔයාගෙ මායාකාර අම්මද මේව හැදුවෙ? ලෙවෙස්කි?''

''එයා මායාකාරියෙක් නෙමෙයි.'' හේසාල් මිමිණුවාය.

බෑගය බිම දැමූ රෑෆස් එය පාගා දැමුවේය. එහි අඩංගු දෑ ඔහුගේ නිරුවත් පාදයට පොඩි වී ගියේය. ''ඔයාට ඒක ආපහු ගන්න පුළුවන්. ඒත් මට දියමන්තියක් ඕනෙ. නිකම්ම අවකාශයෙන් ඔයාගෙ අම්මා ඒව මවනවා කියල මම අහල තියෙනවා. මට දියමන්තියක් දෙන්න.''

''මගෙ ළඟ ඇති දියමන්තියක් නෑ.'' හේසාල් පැවසුවාය. ''අහකට යනවා.''

රෑෆස් මිට මෙළ වූයේය. වැඩේ නරක අතට හැරෙමින් පවතින බව තේරුම් ගැනීමට ප්‍රමාණවත් තරමට ලියෝ රළු පාසල් වල සහ කැපකරු නිවාසවල ගත කර තිබුණේය. ඔහුට ඉදිරියට ගොස් හේසාල්ට උදව්වීමට වුවමනා වූ නමුත්, ඔහු භූතයෙක් විය. අනෙක් අතට මේ සියල්ල සිදු වී තිබුණේද දශක ගණනාවකට පෙරදීය.

ඉන්පසු තවත් ළමයෙක් පිටත හිරු එළියට පැමිණියේය. ලියෝගේ හුස්ම නැවතිණි. කොලුවා සෑම අතින්ම ඔහුට සමාන පෙනුමකින් යුක්ත විය.

''ඔයා දන්නවද?'' භූත හේසාල් විමසුවාය.

ව්‍යාජ ලියෝ, සැබෑ ලියෝ තරමටම උසින් යුක්ත විය. එනම් කොට විය. ඔහු තුළත් ඒ කලබල ගතියම දක්නට ලැබිණි. කලිසමට ඇඟිලි වලින් තට්ටු කරමින්, සුදු කොළරය සහිත කමිසය පිසදමමින්, දුඹුරු බොකුටු කොණ්ඩය මත වූ ජොකියන්ගේ කැප් තොප්පිය සකසමින් ඔහු සිටියේ කලබලකාරී ඉරියව්වකිනි. (ඇත්තටම ලියෝ සිතුවේ ජොකියන් නොවේ නම් කොට මිනිසුන් ජොකියන්ගේ හිස්වැසුම් නොපැළඳිය යුතු බවයි.) සැබෑ ලියෝ කණ්ණාඩියෙන් දකින ආකාරයෙන්ම ව්‍යාජ ලියෝගෙන්ද ඒ යක්ෂ හිනාවම දක්නට ලැබිණි. එසේම ඒ ඉරියව්ව ගුරුවරුන් කෑ ගැස්සවීමට සමත් වූවකි.

ව්‍යාජ ලියෝ වැඩේට අවතීර්ණ වනවිට සමහර ළමෝ පසුපසට වූහ. අනෙක් අය එකිනෙකා තල්ලු කරමින් ඔහු දෙසට ගියේ යම් සංදර්ශනයක් අපේක්ෂාවෙන් මෙනි.

මේ අතර, පැතලි හිසැති රූෆස් තවමත් හේසාල්ගෙන් දියමන්තියක් ලබා ගැනීමේ උත්සාහයේ යෙදී සිටියේය. ඒ ව්‍යාජ ලියෝගේ පැමිණීම නිසැකවම දනගෙනය.

''එන්න, කෙල්ලේ.'' රූෆස් මිට මෙලවූ අතින් හේසාල්ව බිය ගන්වමින් පැවසුවේය. ''ඒක දෙන්න.''

හේසාල් බිත්තියට හේත්තු වූවාය. එක්විටම අතු රිකිල්ලක් කැඩෙනවා වැනි හඬක් ඇගේ දෙපතුල් අසලින් ඇසිණි. පිස්ටාචියෝ ගෙඩියක් තරම් දියමන්තියක් ඇගේ දෙපා මුල දිලිසෙමින් තිබිණි.

''හා!'' එය දුටු විගස රූෆස් පසුපසට පැන්නේය. ඔහු එය අහුලා ගැනීමට සූදානම් වූවත්, හේසාල් කෑ ගැසුවාය. ''එපා, කරුණාකරලා.'' විශාල මෝඩයා ගැන කනගාටුවන බවත් පෙන්වමින් හේසාල් පැවසුවාය.

ව්‍යාජ ලියෝ එවිට එතැනට පැමිණියේය.

මෙන්න ඌ එනවා. ලියෝ සිතුවේය. ව්‍යාජ ලියෝ පැමිණ කෝච් හෙජ්ගේ ජිජිට්සු වර්ගයේ පහරකින් වැඩේ ඉවර කරනු ඇත.

ඒ වෙනුවට, හිස්වැසුමේ මුදුන මෙගාෆෝනයක් මෙන් තම මුව අසලට ගෙන කෑ ගැසුවේය. ''කට්!''

ඔහු එය කෙතරම් ප්‍රබල ලෙස පැවසූවේද යත්, අනෙක් ළමෝ සියල්ලෝම මොහොතකට ගල් ගැසුණාය. රූෆස් පවා ඍජු කයින් සහ ව්‍යාකූල ලෙසින් පසුපසට විය.

කුඩා ළමුන් අතරින් අයෙක් ඇසෙන නෑසෙන ගාණට සෙමින් යමක් පැවසුවේය. ''හැමී සැමී.''

*සැමී... ලියෝ වෙව්ලා ගියේය. මොන විකාරයක්ද මේ කෙල්ල කියන්නේ?*

කෝපයෙන් යුතුව, සැමී / ව්‍යාජ ලියෝ තම කැප් තොප්පියද අතැතිව රූෆස් වෙත කඩා පැන්නේය. ''නෑ, නෑ, නෑ.'' ඔහු අනෙක් ළමුන් දෙසට තම නිදහස් අත වනමින් නිවේදනය කළේය. ළමුන් විනෝද ජවනිකාව නැරඹීමට රොක් වෙමින් සිටියහ.

සැමී හේසාල් දෙසට හැරුණේය. ''ලමාර් මෙනවිය. ඔයාගෙ කොටස...'' සැමී බලවත් කෝපයෙන් වටපිට බැලුවේය. ''තිර රචනය! මොකක්ද හෙඩී ලමාර්ගේ කොටස?''

*''කරුණාකරලා එපා, උඹ අධමයෙක්.''* කොලුවෝ අතුරින් එකෙක් කෑ ගැසුවේය.

''ස්තුතියි.'' සැමී පැවසුවේය. ''ලමාර් මෙනවිය, ඔයාට කියන්න තියෙන්නෙ, *කරුණාකරලා, එපා, උඹ අධමයෙක්!* කියලා. ඒ වගේම ඔයා, ක්ලාක් ගැබෙල්-''

මුළු අංගනයම සිනා හඬින් පිරී ගියේය. ක්ලාක් ගැබෙල් පැරණි නළුවකු බව ලියෝ යාන්තමින් දන සිටියේය. එහෙත් ඔහු වෙනත් වැඩි දෙයක් නොදත්තේය. එහෙත්, පෙනෙන ලෙසට පැතලි හිසැති රූෆස් ක්ලාක් ගැබෙල් වීම දරුවන්ට සිනා උපදවන්නක් වී තිබිණි.

''ගැබෙල් මහත්මයා.''

''නෑ!'' එක් දැරියක් කෑ ගැසුවාය. ''එයාව ග්‍රේ කූපර් කරන්න.''

සිනාව තවත් වැඩිවිය. රූෆස් පුපුරා ගිය වැල්වයක් මෙන් විය. කාට හෝ පහර දීමට අවශ්‍ය වූ කලෙක මෙන් ඔහු අත මිට මෙළ වූයේය. එහෙත් ඔහුට මුළු පාසලටම පහර දීමට නොහැකිය. සිනාවට ලක්වීම ඔහුට පෙන්වන්නට බැරි දෙයක් වුවත්, ඔහුගේ මන්දගාමී මනසට සැමී කරන්නේ කුමක්දැයි වටහා ගැනීමට නොහැකි විය.

ලියෝ එය අගය කිරීමට හිස සැලුවේය. සැමී ඔහු වැනිය. ලියෝද දාමරිකයන්ට වසර ගණනක් එවැනි දෑ කර තිබේ.

''හරි!'' සැමී උදාරම් ලෙස කෑ ගැසුවේය. ''කූපර් මහත්මයා, ඔයා කියන්න, ඕහ්, ඒත් දියමන්තිය මගෙයි, මගේ ද්‍රෝහී ආදරිය! ඊට පස්සෙ ඔයා මේ විදිහට දියමන්තිය අහුල ගන්න.''

''සැමී, එපා!'' හේසාල් විරෝධය පෑවාය. එහෙත් එය අහුලාගත් සැමී මෘදු චලනයකින් එය ඔහුගේ සාක්කුවට ලිස්සා යැව්වේය.

ඔහු රූෆස් දෙසට හැරුණේය. ''මට උද්වේගය අවශ්‍යයි! ප්‍රේක්ෂකාගාරෙ ඉන්න නෝනලට සිහිනැතිවෙනව දකින්න මට අවශ්‍යයි! නෝනාවරුනි, කූපර් මහත්මයා දැන් ඔයාලට සිහි නැති කළාද?''

''නෑ.'' ඔවුන්ගෙන් කීපදෙනෙක් පිළිතුරු දුන්හ.

''අන්න, දක්කනෙ?'' සැමී පැවසුවේය. ''දැන් මුල ඉඳලා!'' ඔහු තම කැප් තොප්පිය මුවට තබා කෑ ගැසුවේය. ''ඇක්ෂන්!''

රූෆස් නැවත ව්‍යාකුල විය. සැමී දෙසට අඩි කීපයක් පැමිණි ඔහු මෙසේ පැවසුවේය. ''වැල්ඩේස්, මම.''

සීනුව නාද විය. ළමෝ දොරටු දෙසට දිව යන්නට වූහ. සැමී කුඩා දරුවන් දිවයන මාර්ගයෙන් හේසාල්ව ඉවතට ඇද්දේය. රූෆස් කුඩා දරුවන්ගේ රැනට එකතු වී එතැනින් ඉවත් විය.

ඉක්මනින්ම එතැන භූතයන් සමඟ සැමී හා හේසාල් තනිවූහ.

හේසාල්ගේ පොඩි වී ගිය ආහාර බෑගය අතට ගත් සැමී එය පිස දමා ඇය අතට දුන්නේ සිරස නමා ආචාරයක්ද සමගිනි. ''ලමාර් මෙනෙවිය.''

අතීතයෙන් පැමිණි හේසාල් පොඩි වී ගිය ඇගේ ආහාර බෑගය අතට ගත්තාය. හඬන්නට ආසන්නව සිටි බව පෙනුණත්, ඒ අස්වැසිල්ල නිසාද, දුක නිසාද, එසේත් නැතිනම් අගය කිරීම සඳහාද යන්න ලියෝට පැහැදිලි නොවීය. ''සැමී... රූෆස් ඔයාව මරන්නයි යන්නෙ.''

''ආහ්, මාත් එක්ක පැටලෙන එක හොඳ නැති බව එයා දන්නවා.'' සැමී තම හිස්වැස්ම පැළඳ ගත්තේය.

හේසාල් සිනාසුණාය. ''ඔයා විහිළුකාරයෙක්.''

''ඇයි, ස්තූතියි, ලමාර් මෙනවිය.''

''ස්තූතියි, මගෙ ද්‍රෝහී ආදරිය.''

සැමීගේ සිනාව පුළුල් විය. වාතය දැරීමට අපහසු තරමට වේගවත් විය. හේසාල් බිම බලාගෙන සිටියාය. ''ඔයා ඒ දියමන්තිය අල්ලන්න එපා. ඒක භයානකයි.''

''ආහ්, ගණන් ගන්න එපා.'' සැමී පැවසුවේය. ''මට නෙමෙයි.''

ඇයට එය විශ්වාස කිරීමට වුවමනා වූවා සේ ඇය අමුතු ලෙසකින් ඔහුව අධ්‍යයනය කළාය.

''නරක දේවල් වෙන්න පුළුවන්. ඔයා ඒක-''

''මම ඒක විකුණන්නෙ නෑ.'' සැමී පැවසුවේය. ''මම පොරොන්දු වෙනවා. ඔයාගෙ සිහිවටනයක් විදිහට ඒක තියාගන්නවා විතරයි.''

''එහෙම කරන්න. අපි යන්න ඕනෙ. දැන් අපේ ඊළඟ ජවනිකාවට වෙලාව. හෙඩ් ලමාර් ඉංග්‍රීසි පන්තියේ කරදරෙන් මැරෙන්න ළඟයි.

සැමී මහත්මයකු සේ තම වැලමිට දිගු කළේය. එහෙත් හේසාල් සෙල්ලක්කාර ලෙසින් ඔහුව තල්ලු කළාය. ''මෙතෙන්ට ආවට ස්තුතියි. සැමී.''

''ලමාර් මෙනවිය. ඔයාට ඕනෙ වෙන හැමවෙලාවකම මම එතන ඉඳියි.'' ඔහු පැවසුවේය. ඔවුහු දෙදෙනා නැවත පාසල් ගොඩනැගිල්ල දෙසට ගියහ.

ලියෝට අන් කවරදාකටත් වඩා භූතයකු වැනි හැඟීමක් දැනුණේය. මේ දරුවා සැබෑ ලියෝ ලෙස පෙනෙන බැවින්, සමහර විට ඔහු තම මුළු ජීවිතයම එයිඩෝලන් කෙනෙකු ලෙස ගෙවන්නට ඇත. ඔහු දක්ෂය, අපූරුය. හේසාල් සමඟ ඔහුගේ අඟර දඟර පෑම හොඳ තත්ත්වයේ තිබුණ බැවින් නිසැකවම ඔහුට ඇයගේ හදවත සොරා ගැනීමට හැකි විය.

ඔවුන්ගේ ප්‍රථම හමුවීමේදී හේසාල් ලියෝ දෙස එතරම අමුතු ආකාරයෙන් බලාසිටීමට පුදුමයක් නොවීය. එතරම් හැඟීමකින් ඇය සැමී ගැන පැවසීමේ පුදුමයක් නොතිබිණි. එහෙත් පැතලි හිසැති රූෆස් තවදුරටත් ක්ලාක් ගැබෙල් වුණත්, ලියෝ සැමී වූයේ නැත.

''හේසාල්,'' ඔහු පැවසුවේය. ''ම- මට බැහැ.''

පාසල් අංගනය වෙනත් දර්ශනයකට මාරු විය.

හේසාල් සහ ලියෝ තවමත් භූතයන්ව සිටි නමුත්, දැන් ඔවුන් සිටගෙන සිටින්නේ වල් පැළෑටි වලින් වැසී ගිය ජලාපවාහන වලක් අසල තිබූ ගරාවැටුණු නිවෙසක් ඉදිරිපිටය. මිදුලේ මැරී ගිය කෙසෙල් පඳුරකි. පියගැට පෙළ මත තිබුණු පැරණි පන්නයේ රේඩියෝවකින් කොන්ජුන්ටෝ සංගීතයක් වාදනය වෙමින් තිබිණි. පෝටිකෝව මත තිබූ පැද්දෙන පුටුවක හිඳගත් හම ඇඟට ඇලුණු මහලු මිනිසෙක් ක්ෂිතිජය දෙස බලාගෙන සිටියේය. ''අපි කොහෙද ඉන්නෙ?''හේසාල් විමසුවාය. ඇය තවමත් මීදුමක් වූ නමුත් ඇගේ හඬෙහි අනතුරක සේයාවක් රැඳී තිබිණි. ''මේක මගෙ ජීවිතයට අයිති දෙයක් නෙමෙයි.''

එම භූත ආත්මය ඝන වී සැබෑ ස්වරූපයට පත් වෙමින් තිබෙන හැඟීමක් ලියෝට ඇති විය.

''ඒ හුස්ටන්,'' ඔහුට අවබෝධ විය. ''මම දන්නවා මේ දර්ශනය. අර ජලාපවාහන වල... මේ මගෙ අම්මගෙ පැරණි වටපිටාව. එයා හැදුණු වැඩුණු තැන. හොබි ගුවන් තොටුපල තියෙන්නෙ අර පැත්තේ.''

''මේ ඔයාගෙ ජීවිතයද?'' හේසාල් විමසුවාය. ''මට තේරෙන්නෙ නැහැ! කොහොමද -?''

''ඔයා මගෙන්ද අහන්නෙ?'' ලියෝ විමසුවේය.

එක්විටම මහලු මිනිසා මුමුණන්නට විය. ''ආහ්, හේසාල්.''

ලියෝගේ කොන්ද සීතල විය. මහලු මිනිසාගේ දෑස් තවමත් යොමු වී තිබුණේ ක්ෂිතිජය දෙසටය. ඔවුන් මෙතැන සිටින බව ඔහු දැනගත්තේ කෙසේද?

''මම හිතන්නේ අපි කාලයට එරෙහිව යනවා.'' මහලු මිනිසා නැවත දුර්වල ලෙස පැවසුවේය. ''හොඳයි..''

ඔහු සිතීම නතර නොකළේය.

හේසාල් සහ ලියෝ නිසොල්මන්ව බලා සිටියහ. ඔවුන්ව දුටු බවක් හෝ ඔවුන්ව ඇසුණු බවට සලකුණක් මහලු මිනිසා වෙතින් තවදුරටත් දක්නට නොවීය. ඒ අනුව ඔහු තමා සමගම කතාකරමින් සිටින්නට ඇති බව ලියෝට පැහැදිලි විය. *එහෙත් ඇයි එහෙනම් එයා හේසාල්ගේ නම කිව්වේ?*

ඔහුගේ සම රැළි වැටී තිබිණි. හිසකෙස් සුදු වූ අතර, කරගැට සහිත අත්වලින් ඔහු ජීවිත කාලයම යන්ත්‍රාගාරයක වැඩ කර ඇති බව පෙනී ගියේය. ඔහු හැඳ සිටියේ දුර්වර්ණ කහ පැහැති කමිසයකි. අළු පැහැති කලිසමේ කලිසම් පටි උරහිසේ එල්ලී තිබිණි. එසේම ඔහු හොඳින් ඔප දැමූ කළු පැහැති සපත්තු පැළඳ සිටියේය.

බෙහෙවින් වයස්ගත වුවත් ඔහුගේ දෑස් තියුණු සහ පැහැදිලි විය. ඔහු හිඳගෙන සිටියේද තරමක උදාරම් ලීලාවකිනි. සාමකාමී සහ විනෝදකාමී පෙනුමක් ඔහුගෙන් දිස් වූ අතර *මම මෙච්චර කල් ජීවත් වුණා නේද? අපූරුයි* වැන්නක් සිතමින් සිටින බව පෙනිණි.

මේ මිනිසා මින්පෙර කිසිදාක දැක නැති බව ලියෝට හොඳටම විශ්වාසය. එසේ නම් ඇයි ඔහු මෙතරම් හුරු පුරුදු බවක් දැනෙන්නේ? ඊළඟට ඔහුට දක්නට ලැබුණේ මිනිසා තම ඇඟිලිවලින් පුටුවට තට්ටු කරන ආකාරයයි, එහෙත් ඒ තට්ටුකිරීමේ අහඹුවක් නොතිබිණි. ඔහු මෝස් සංඥාවක් යොදා ගනිමින් සිටියේය. ලියෝගේ මවද ඔහු සමග එය කිරීමට පුරුදුව සිටියාය. එසේම මහලු මිනිසා තට්ටු කරන්නේ එම පණිවුඩමය. *මම ඔයාට ආදරෙයි.*

දොර ලෙස පැවති තිරය විවෘත විය. තරුණ කාන්තාවක් පිටතට පැමිණියාය. ඇය සැරසී සිටියේ ජීන්සයකින් සහ නිල් පැහැති බ්ලවුසයකිනි. ඇය රූමත් වුවත්, සියුමැලි නොවූවාය. ඇයට තිබුණේ හොඳින් මාංශ පේශි වැඩුණු බාහු සහ රළු දෑත්ය. මහලු මිනිසාගේ මෙන් ඇගේ දෑස්ද විනෝදශීලීව දිලිසිණි. ඇගේ අතෙහි වූයේ නිල් පොරෝණයක ඔතන ලද බිළිඳෙකි.

''බලන්න. මිජෝ.'' ඇය ළදරුවාට පැවසුවාය. මේ තමයි ඔයාගෙ බිසාබියුලෝ, බිසාබියුලෝ. ඔයාට එයාව වඩාගන්න ඕනෙද?''

ලියෝට ඇගේ හඬ ඇසෙත්ම, ඔහුට ඉකිගැසිණි.

ඒ ඔහුගේ මවයි. ඔහුගේ මතකයේ තිබුණාට වඩා ඇය තරුණව සිටි නමුත්, බෙහෙවින් සජීවීව සිටියාය. එහි ආර්ථය නම්, ඇගේ අතේ සිටින දරුවා...

මහලු මිනිසා විරිත්තුවේය. ඔහුට තිබුණේ ඔහුගේ කොණ්ඩය තරමටම සුදු පැහැති නියම දත් පෙළකි. සිනාවක් සමඟ ඔහුගේ මුහුණේ රැළි ඇඳී ගියේය. ''ආ කොල්ලෝ, මගෙ බෙබිටෝ, ලියෝ!''

''ලියෝ?'' හේසාල් කෙඳිරුවාය. ''ඒ- ඒ ඔයාද? මොකක්ද? බිසාබියුලෝ කියන්නෙ?

ලියෝට කතාකර ගැනීමට නොහැකි විය. *''ලොකු සීයා.''* ඔහුට වුවමනා වූයේ එසේ පැවසීමටය.

මහලු මිනිසා ළදරු ලියෝව තම අතට ගත්තේය. තමා දකිමින් සිටින්නේ කුමක්ද යන්න අවසානයේදී භූත ලියෝට අවබෝධ විය.

කෙසේ හෝ, හේසාල්ගේ බලය අතීතයේ ඔවුන් දෙදෙනාගේම ජීවිත සම්බන්ධ කෙරෙන එක් අවස්ථාවක් මුණ ගැස්සවීමට සමත් විය.

ඒ ලියෝගේ ජීවන ගමනේ හේසාල් සම්බන්ධවන තැනයි. මේ *මහලු මිනිසා...*

''ඕහ්...'' ඒ මොහොතේදීම හේසාල්ට ඔහු කවුරුන්දැයි අවබෝධ වූ බව පෙනී ගියේය. ඇගේ හඬ බෙහෙවින් දුර්වල විය. කඳුළු කඩා හැලිණි. ''ඕහ්, සැමී, නෑ...''

''අහ්, පුංචි ලියෝ,'' සැමී වැල්ඩේස් පැවසුවේය. ඔහු හැත්තෑව දශකය ගෙවමින් සිටියේය. ''ඔයා මගෙ සූත්තරය වේවි නේද? එහෙම තමයි එයාල ඒකට කියන්නෙ. මම වෙනුවෙන් ඇයට කියන්න. මම

හිතනවා, මම ජීවතුන් අතර ඉඳියි කියලා. ඒත්, සාපය එහෙම වෙන්න දෙන එකක් නෑ.''

හේසාල්ට ඉකිගැසිණි. ''ගයියා... ගයියා මට කිව්වා 1960 ගණන්වලදී එයා හෘදයාබාධයකින් මැරුණා කියලා. ඒත් මේක නෙමෙයි- මේක වෙන්න බෑ...''

සැමී වැල්ඩේස් දරුවා සමග කතා කරමින් සිටිය අතර, මව, එස්පෙරන්සා, ශෝකී සිනාවකින් බලා සිටියාය. සමහරවිට ලියෝගේ සීයා වැල්වටාරම් දොඩවමින්, විකාර කියවීම ගැන සුළු කනගාටුවක් තිබෙන්නට ඇත.

''අර ආර්යාව, ඩෝනා කැලීඩා, ඇය මට අනතුරු ඇඟෙව්වා.'' සැමී දුක්මුසුව තම හිස සැලුවේය. ''ඇය කිව්වේ හේසාල්ගේ භයානක අනතුර මගෙ ජීවිත කාලෙදි වෙන එකක් නෑ කියලයි. ඒත් මම පොරොන්දු වුණා ඇය වෙනුවෙන් මම එතන ඉන්නවා කියලා. ඔයා එයාට කියන්න ඕනෙ මම සමාවෙන්න කිව්වා කියලා ලියෝ. ඔයාට පුළුවන් නම් එයාට උදව් වෙන්න.''

''බිසාබියුලෝ,'' එස්පෙරන්සා පැවසුවාය. ''ඔයාට මහන්සියි වගේ.''

ඇය දරුවා ආපසු ගැනීමට දෑත් දිගුකළත් මහලු මිනිසා මොහොතක් බලා සිටියේය. ළදරු ලියෝ ඔහු තුරුලේ හොඳින් සිටින බව පෙනිණි.

''එයාට කියන්න මම සමාවෙන්න කිව්ව කියලා. මම දියමන්තිය විකුණපු එකට, හරිද?'' සැමී පැවසූවේය. ''මම මගෙ පොරොන්දුව කැඩුවා. ඇය ඇලස්කාවේ අතුරුදන් වුණාම... ආහ්, කොච්චර කාලෙකට ඉස්සරද, මම අන්තිමට ඒ දියමන්තිය පාවිච්චි කළා, මම නිතරම හීන දැකපු විදිහට ටෙක්සාස්වලට ආවා. මම මගෙ යාන්ත්‍රික වැඩපළ පටන් ගත්තා. පවුලක් වුණා. ඒක හොඳ ජීවිතයක් වුණත්, හේසාල් නිවැරැදියි. දියමන්තිය සාප ලද්දක්. මම ආයෙ කවදාවත් එයාව දැක්කෙ නෑ.''

''ආහ්, සැමී.'' හේසාල් පැවසුවාය.. ''නෑ, මාව ඇත් කළේ සාපය නිසා නෙමෙයි. මට ආපහු එන්න ඕනා වුණා. මම මියගියා.''

මහලු මිනිසාට ඇසුණු බවක් නොපෙනුණි. ඔහු දරුවා දෙස බලා සිනාසී ඔහුගේ හිස සිප ගත්තේය. ''මම ඔයාට මගෙ ආශිර්වාදය දෙනවා, ලියෝ. පළවෙනි පිරිමි දරුවා විශිෂ්ට මුණුබුරෙක් මට දැනෙනවා, හේසාල් වගේම ඔයත් විශේෂ කෙනෙක් බව. ඔයා සාමාන්‍ය

ළඳරුවෙකුට වඩා වැඩි කෙනෙක් නේද? ඔයා මම වෙනුවෙන් ඒක කරගෙන යයි. ඔයාට දවසක එයාව දකින්න ලැබෙයි. මම වෙනුවෙන් එයාට කතා කරන්න.''

''බිසාබියුලෝ.'' එස්පෙරන්සා තරමක විරෝධයකින් පැවසුවාය.

''ඔව්, ඔව්,'' සැමී කොක්හඬලා සිනාසුණේය. ''මට මහන්සියි එස්පෙරන්සා. ඔයා හරි. ඒත් මම ඉක්මනට සැතපෙයි. ඒක හොඳ ජීවිතයක් වෙයි. එයාව හොඳින් උස්මහත් කරන්න.'' දර්ශනය වියැකී ගියේය.

ලියෝ හේසාල්ගේ අත් අල්ලාගෙන ආගෝ II නැව් තට්ටුව මත සිටියේය. හිරු බැස ගොස් තිබිණි. නෞකාවේ එක් ලෝකඩ ලන්තෑරුමක් පමණක් දැල්වෙමින් තිබිණි. හැඬීම නිසා හේසාල්ගේ දෑස් ඉදිමී තිබිණි.

ඔවුන් දුටු දෙය කුමක් වුවත් එය ඕනෑවටත් වැඩි විය. ඔවුන්ට යටින් සාගරයේ උස් රැළි නැගෙමින් තිබිණි. දුන් පළමු වරට, ඔවුන් සම්පූර්ණයෙන් නිදහස් හැඟීමක් ලියෝට දනෙමින් තිබිණි.

''හෙලෝ, හේසාල් ලෙවිස්කි.'' වියළි හඬින් ඔහු පැවසුවේය.

ඇගේ නිකට සැලෙමින් තිබිණි. ඇය ඉවතට හැරී කතා කිරීමට මුව විවර කළාය. එහෙත් ඇය කතා කිරීමට පෙර නැව එක් පසෙකට ඇලවී ගියේය.

''ලියෝ!'' කෝච් හෙජ් කෑ ගැසුවේය.

අනතුරු හැඟවීමේ සංඥා නිකුත් කරමින් ෆෙස්ටස් අහසට ගිනි අළු විදින්නට විය. නෞකාවේ සීනු නාද විය.

''ඔයා කරදර වුණු අර රාක්ෂයෝ ද?'' හෙජ් කෑ ගැසුවේය. ''උන්ගෙන් එකෙක් අපිව හොයාගෙන.''

# 23
# ලියෝ

**ලියෝ මොට්ටයාගේ තොප්පියට සුදුස්සකුව සිටියේය.**

ඔහු ඍජුව සිතා තිබුණා නම්, ඔහුට චාල්ස්ටන් වරායෙන් පිටවූ වහාම නෞකාවේ අනාවරක පද්ධතිය රේඩාර්වලින්, සෝනාර්වලට මාරු කිරීමේ ස්විචය ක්‍රියාත්මක කළ යුතුව තිබිණි. ඔහුට අමතක වූයේ ද එයයි. සෑම තත්පර කීපයකටම වරක් කුඹය අනුනාද වෙමින් වාතය හරහා ෆෙස්ටස්ට තරංග යැවීමේ ක්‍රමයක් ඔහු සැලසුම් කර තිබිණි. එයින් සමීපයේ සිටින ඕනෑම රාක්ෂයකු ගැන ෆෙස්ටස්ට දැන ගැනීමේ හැකියාව ලැබුණේය. එහෙත් එය එක් වරකට ක්‍රියාත්මක වූයේ එක් ආකාරයකින් පමණකි. එනම් ජලයට හෝ වාතයටය.

රෝමන්වරුත්, ඊළඟට කුණාටුවත්, ඊටත් පසු හේසාල් විසිනුත් ඔහුව කලබලයට පත් කර තිබිණි. එබැවින් ඔහුට එය මුළුමනින්ම අමතකව ගියේය. දැන් රාක්ෂයා හරියටම ඔවුන්ගේ කටට පැමිණ තිබේ.

නැව දකුණු පැත්තට ඇලවී ගියේය. හේසාල් නැවේ රුවල් අල්ලා ගත්තේය. හෙජ් කෑ ගැසුවේය. ''වැල්ඩේස්, රාක්ෂයාව පුපුරවල දාන්නෙ මොන බොත්තමෙන්ද? සුක්කානම ගන්න.''

ඇලවුණු නැව් තට්ටුවට පැමිණි ලියෝ, අත් වැට අල්ලා ගැනීමට සමත් වූයේය. ඔහු පැත්තකින් සුක්කානම දෙසට නැගීමට උත්සාහ කළත්, රාක්ෂයාගේ මතුපිට දුටුවිට ඔහුට සෙලවෙන්නේ කෙසේද යන්න පවා අමතකව ගියේය. රාක්ෂයා නැව තරමටම දිගින් යුක්ත විය. සඳ එළියෙන්, උගේ පෙනුම, යෝධ කුණිස්සකු හා

කැරපොත්තකු එක්වීමෙන් සෑදුණු ආකාරයක් දිස්විය. උගේ කයිටිනීය ආවරණය රෝස පැහැයෙන් යුක්ත විය. වලිගය පොකිරිස්සකුගේ මෙන් විය. ආගෝ II හි බඳට පහර දෙන විට හැකරැල්ලකුගේ වැනි උගේ පාද ඉබේටම සැලෙන්නට විය.

අවසානයේ උගේ හිස මතුපිටට පැමිණියේය. තෙත් සහිත රෝස පැහැති මුහුණ බළල් මත්ස්‍යයකුට සමාන වූ අතර එහි තිබුණේ වීදුරු වැනි අප්‍රාණික දෑසකි. මුවෙහි දත් නොමැති වූ අතර, සෑම නාස් පුඩුවකින්ම ග්‍රාහිකා රැසක් විහිදී තිබිණි.

හුස්ටන්වල දේශීය මුහුදු ආහාර අවන්හලේදී තම මවත් සමඟ සිකුරාදා විශේෂ රාත්‍රී කෑමට සහභාගී වූ අන්දම ලියෝ ගේ මතකයට නැගිණි. ඔවුන්ට කුණිස්සන් සහ බළල් මසුන් කෑමට ලැබිණි. දැන් ඔහුට වුවමනා වූයේ ඒ අදහස ඉවත දැමීමටය.

''එන්න, වැල්ඩේස්!'' හෙජ් කෑ ගැසුවේය. ''සුක්කානම ගන්න, එතකොට මට මගේ බේස් බෝල් පිත්ත ගන්න පුළුවන්.''

''පිතිවලින් වැඩක් වෙන්නෙ නෑ.'' ලියෝ කෑ ගැසුවේය. එහෙත් ඔහුගේ පිටුපසින්, ඔහුගේ ඉතිරි මිතුරන් සියල්ලෝම පියගැට පෙළෙ ඔස්සේ උඩට නගිමින් සිටියහ.

පර්සි කෑ ගැසුවේය. ''මොනවද වෙන්නෙ! ශ්‍රිම්ප්සිලා!''

ෆ්‍රෑන්ක් හේසාල් සිටි පැත්තට දිව ගියේය. අතීතානුස්මරණයෙන් තවමත් තෝන්තු වී සිටි ඇය රුවලේ එල්ලී සිටියාය. එහෙත් තමා හොඳින් බව පෙන්වීමට ඇය උත්සාහ කළාය.

රාක්ෂයා නැවත නෞකාවට පහර දුන්නේය. බඳ දෙදරා ගියේය. දකුණු පසට ඇළ වූ ඇනබෙත්, පිපර් සහ ජේසන් යාත්‍රාවෙන් පිටතට විසිවී යාමට ආසන්නව සිටියහ.

ලියෝ සුක්කානමට ළං විය. ඔහුගේ දෑත් කඩිසර ලෙස පාලන පුවරුව හරහා ගමන් කළේය. අභ්‍යන්තර ඇමතුම හරහා ෆෙස්ටස් පහළ තට්ටුවේ කාන්දුවීම් ගැන වාර්තා කළත්, නැවට මේ මොහොතේ ගිලී යාමේ අවදානමක් නොමැති බව පෙනී ගියේය.

ලියෝ හබල් ක්‍රියාත්මක කළේය. ඒවා හෙලි බවට හැරවීමේ හැකියාව තිබුණු අතර, එය සත්ත්වයා පළවා හැරීමට ප්‍රමාණවත් විය. අවාසානාවකට, ඒවා අවහිර වී තිබුණේය. ශ්‍රිම්ප්සිලා ඒවායේ පෙළගැන්නුම අවුල් කර ඇත. එසේම රාක්ෂයා සිටිනුයේ අතිශයින්

සමීප දුරකිනි. එබැවින් ලියෝට නෞකාවට හානි නොවී බැලිස්ටාව ක්‍රියාත්මක කිරීමටද නොහැකිය.

''ඌ කොහොමද මෙච්චර ළඟට ආවෙ?'' වැටීම වළක්වා ගැනීමට උත්සාහ දරමින් ඇනබෙත් කෑ ගැසුවාය.

''මම දන්නෙ නෑ,'' හෙජ් ගෙරවූයේය. ඔහු වටපිට බලමින් තම පිත්ත සෙව්වේය. එහෙත් එය නැව් තට්ටුවේ මඳක් දුරට පෙරළී ගොස් තිබිණි.

''මම මෝඩවුණා.'' ලියෝ තමාටම දොස් පවරා ගත්තේය. ''මෝඩයා, මෝඩයා. මම සෝනාර් ගැන අමතක කළා.''

නැව තවතවත් දකුණට ඇලෙවෙන්නට විය. එක්කෝ රාක්ෂයා උත්සාහ දරන්නේ ඔවුන්ව වැළඳ ගැනීමටය. නැතිනම් පෙරළා දැමීමටය.

''සෝනාර්?'' හෙජ් විරෝධය පෑවේය. ''වැල්ඩේස්, සමහරවිට, ඔයා හේසාල්ගෙ අත් අල්ලාගෙන, අච්චර වෙලා එයාගෙ ඇස් දෙක දිහා බලාගෙන නොහිටියනම්-''

''මොකක්?'' ෆ්‍රෑන්ක් ගෙරවූයේය.

''ඒක එහෙම දෙයක් නෙමෙයි,'' හේසාල් විරෝධය පෑවාය.

''ඒක ප්‍රශ්නයක් නෙමෙයි.'' පිපර් පැවසුවාය. ''ජේසන්, ඔයාට පුළුවන්ද අකුණු කැඳවන්න.''

ජේසන් කෙළින් සිටීමට පොරබදමින් සිටියේය. ''මම-'' ඔහුට හැකිවූයේ හිස සැලීමට පමණකි. පෙරදී කුණාටුව කැඳවීම හේතුවෙන් ඔහුගේ ශක්තිය බෙහෙවින් වැය වී තිබිණි.

''පර්සි,'' ඇනබෙත් පැවසුවාය. ''ඔයාට ඌ එක්ක කතාකරන්න පුළුවන්ද? ඌ මොකෙක්ද කියල ඔයා දන්නවද?''

මුහුදු දෙවියන්ගේ පුත්‍රයා හිස සැලුවේය. ඔහු පැහැදිලිවම අවුල් වී සිටියේය. ''සමහරවිට ඌට නැව ගැන කුතුහලයක් ඇති. සමහරවිට-''

රාක්ෂයාගේ අත් පහුරු නැව් තට්ටුව හරහා කසපහරක් මෙන් ඇදී ගියේය. එය කෙතරම් වේගවත් වූයේද යත් ලියෝට කෑ ගැසීමටවත් කාලයක් නොතිබිණි. *බලාගෙන!*

එකක් පර්සිගේ ළයේ ගැටුණේයි. ඒ පහර ඔහුව පඩිපෙළේ පහළට විසිකර දැමීමට සමත් විය. තවෙකක් පිපර්ගේ පාදයේ එතිණි.

ඇය බෙරිහන් දීගෙන අත් වැට දෙසට ඇදී ගියාය. තවත් අත් පහුරු දුසිම් ගණනක් ඇණිය අවට නලියමින්, නැවේ ආම්පන්න විසුරුවා දමමින් තිබුණේය.

''මුහුණට මුහුණ සටනක්,'' තම පිත්ත අහුලාගත් හෙජ් ක්‍රියාන්විතයට අවතීර්ණ වුවත්, ඔහුගේ පහරවල් අත්පහුරුවල වැදුණා හැර එය රක්ෂයන්ට දැනුණු බවක් නොපෙනුණි.

ජේසන් තම අසිපත ඇද ගත්තේය. ඔහු පිපර්ව නිදහස් කර ගැනීමට උත්සාහ කළත්, ඔහු තවමත් දුර්වලව සිටියේය. ඔහුගේ රන් අසිපතින් කිසිදු ගැටලුවක් නොමැතිව අත් පහුරු කපා දැමීමට හැකිවුවත්, ඔහු ඒවා කපා දමන පරක්කුවෙන්, ඒ අඩුව පිරවීමට තවත් ඒවා පැමිණියේය.

ඇනබෙත් ඇගේ කිණිස්ස අතට ගත්තාය. ඇය අත් පහුරු ගොන්න වෙත දිවගොස්, නළියන දඟලන සෑම දෙයක්ම ඉලක්ක කරමින් පහර දෙන්නට වූවාය. ෆ්‍රෑන්ක් ඔහුගේ දුන්න ගත්තේය. ඔහු සත්ත්වයාගේ සිරුරට ප්‍රහාර එල්ල කළේය. එහෙත් එය රාක්ෂයාව කෝප කරවන්නක් පමණක් බව පෙනී ගියේය. ඌ ගුගුරමින් නැවට පහර දුන්නේය. බිඳී යාමට ආසන්න වූවා සේ බඳ දෙදරා ගියේය.

ඔවුන්ට තවත් අග්නි බලය අවශ්‍ය වී තිබිණි. එහෙත් ඔවුන්ට බැලිස්ටාව යොදා ගැනීමට නොහැකිය. නැව විනාශ නොවන ආකාරයේ පිපිරීමක් ඔවුන්ට අවශ්‍ය වී තිබිණි. *ඒත් ඒ කෙසේද?*

හේසාල්ගේ දෙපා මුල තිබූ සැපයුම් පෙට්ටියට ලියෝගේ දෑස් යොමු විය.

''හේසාල්!'' ඔහු කෑ ගැසුවේය. ''අර පෙට්ටිය! ඒක අරින්න.''

ඇය පැකිළුණාය. ඊළඟ මොහොතේදී ඔහු පැවසූ පෙට්ටිය ඇයට දැකගැනීමට ලැබිණි. *'අවවාදයයි. විවෘත නොකරන්න.'* යනුවෙන් එහි සටහන් කර තිබිණි.

''ඒක අරින්න!'' ලියෝ නැවත කෑ ගැසුවාය. ''කෝච්! සුක්කානම ගන්න! අපිව රාක්ෂයා පැත්තට හරවන්න. නැත්නම් අපිව පෙරළෙයි.

ඔහු තම වේගවත් එළු පාදවලින් රාක්ෂයාගේ අත් පහුරු සමඟ සටනක පැටලී සිටියේය. සුක්නානම දෙසට පිම්මක් පැන, ඔහු පාලනය අතට ගත්තේය.

''ඔයාට සැලසුමක් තියෙනවද?'' ඔහු කෑ ගැසුවේය.

''නරක එකක්.'' ලියෝ ඇණිය වෙත ළඟා විය.

රාක්ෂයා ආගෝ II තල්ලු කරමින් සිටියේය. නැව් තට්ටුව අංශක හතලිස් පහකට ඇළ වී තිබිණි. සියල්ලන්ගේම උත්සාහය නිෂ්ඵල කරමින්, සටන සඳහා තව තවත් අත්පහුරු එක් වෙමින් තිබිණි. ඒවාට, තමන්ට අවශ්‍ය පමණට දිගු වීමේ හැකියාව තිබෙන බව පෙනිණි. ඉක්මනින්ම ඒවා ආගෝ II මුළුමනින්ම වෙලාගනු ඇත. පහතට වැටුණු පර්සි දක්නට නොසිටියේය. අනෙක් සියල්ලෝම තම ජීවිතාරක්ෂාව උදෙසා රාක්ෂයා සමඟ සටන් වැදී සිටියහ.

''ෆ්‍රෑන්ක්!'' හේසාල් දෙසට දිව යන අතර ලියෝ කෑ ගැසුවේය. ''අපිට ටික වෙලාවක් අරගන්න. ඔයාට මෝරෙක් වගේ මොකෙක් හරි වෙන්න පුළුවන්ද?''

ෆ්‍රෑන්ක් තරහෙන් රවා බැලුවේය. මේ මොහොතේදී රාක්ෂයාගේ අත්පහුරු ප්‍රහාරය ෆ්‍රෑන්ක්ට එල්ල විය. ඔහු යාත්‍රාවෙන් පිටතට විසි වී ගියේය.

හේසාල් විලාප දුන්නාය. සැපයුම් පෙට්ටිය විවෘත කළ ඇය එතුළින් කුඩා වීදුරු කුප්පි දෙකක් අතට ගත්තාය. තිගැස්සීම ඇය අතින් වීදුරු කුප්පි දෙක බිම වැටීමට ආසන්න වන තරමට ප්‍රබල විය.

ලියෝ ඒවා අල්ලා ගත්තේය. එක් කුප්පියක් ඇපල් ගෙඩියක් තරම් විශාල වූ අතර එතුළ වූ දියරය විෂ සහිත කොළ පැහැයකින් දිලිසිණි. වීදුරු ස්පර්ශ වන විට උණුසුමක් දැනිණි. ඒවා තම හදවත තුළ පිපිරෙන්නාක් වැනි වරදකාරී හැඟීමක් ලියෝ තුළ ඇති විය. ඔහු ෆ්‍රෑන්ක් ගැන සිත් තැවුලෙන් සිටි අතර ඔහු මියයාමට ද ඉඩ තිබිණි. එහෙත් ඔහුට ඒ ගැන සිතීමට නොහැකිය. ඔහු නෞකාව ආරක්ෂා කර ගත යුතු විය.

''එන්න!'' ඔහු එක් කුප්පියක් හේසාල් අත තැබුවේය. ''අපිට රාක්ෂයාව මරල ෆ්‍රෑන්ක්ව බේරගන්න පුළුවන්!''

තමා බොරුවක් නොපැවසූවේ යැයි ඔහු විශ්වාස කළේය. යාත්‍රාවේ වැට අසලට සේන්දු වීම ඇවිදිනවාට වඩා, පර්වතයකට නැඟීමක් හා සමාන විය. එහෙත් අවසානයේ ඔවුන්ට එය සාර්ථක කර ගත හැකි විය.

''මොනවද මේකෙ තියෙන්නෙ?'' වීදුරු කුප්පිය සොලවමින් හේසාල් විමසුවාය.

*''ග්‍රීක ගින්දර!''*

ඇගේ දෑස් විසල් විය. ''ඔයාට පිස්සුද? මේක බිඳුණොත්, අපිත් එක්ක මුළු නැවම පිච්චිලා යයි.''

''උගේ කටට!'' ලියෝ පැවසුවේය. ''හරියටම කට ඇතුළට දමල ගහන්න.''

එක්විටම ලියෝ හේසාල් මතට විසිවී ගිය අතර ලෝකය පැත්තකට ඇලවිණි. තමන් රාක්‍ෂයාගේ අත්පහුරු වලට සිරවී සිටින බව ඔවුන්ට අවබෝධ වනවිට ඔවූහු ගුවනට එසවෙමින් සිටියහ. ලියෝගේ අත් නිදහස්ව තිබිණි. එහෙත් ඔහුට ඒවායින් කළ හැකි එකම කාර්යය වූයේ *ග්‍රීක ගින්න* කුප්පිය අතේ සිරකර ගෙන සිටීම පමණකි. හේසාල් දෑගලුවාය. ඇගේ දෑත් සිරවී තිබූ කුප්පිය බිඳීයාමට හැකියාව තිබිණි. එසේම එය කොහෙත්ම ඔවුන්ගේ සෞඛ්‍යයට හිතකර තත්ත්වයක් නොවීය.

ඔවූහු රාක්‍ෂයාගෙන් අඩි දහයක්, විස්සක්, තිහක් පමණ යනතෙක් එසවූහ. ලියෝට පරාජිත සටනේ යෙදී සිටින තම මිතුරන්ගේ ජායාවන් දක ගැනීමට හැකි විය. ඔවූහු කෑ ගසමින්, රාක්‍ෂයන්ගේ නාසයේ කෙස්වලට පහර දෙමින් සිටියහ. කෝච් හෙජ් නෞකාව පාලනය කර ගැනීමට දැඩි උත්සාහයක යෙදෙමින් සිටින අයුරු ඔහුට පෙනුණේය. මුහුද අන්ධකාර වුවත් සඳ එළිය තුළින් රාක්‍ෂයාට සමීපව පාවෙන දිලිසෙන වස්තුවක් තමා දුටු බව ඔහුට සිතුණේය. සමහරවිට ඒ ෆ්‍රෑන්ක් ෂැන්ග්ගේ සිහිසුන් සිරුර විය හැකිය.

''ලියෝ.'' හේසාල් කෑ ගැසුවාය. ''මට බැහැ- මගේ අත්.''

''හේසාල්.'' ඔහු පැවසුවේය. ''ඔයාට මාව විශ්වාසද?''

''නෑ.''

''මටත් එහෙමයි.'' ලියෝ පැවසුවේය. ''මේකා අපිව අත අරිනකොට ඔයා හුස්ම අල්ලගන්න. ඔයා මොනව කළත්, ඔයාගෙ අතේ තියෙන කුප්පිය පුළුවන් තරම් නැවෙන් ඈතට විසිකරන්න උත්සාහ කරන්න.''

''ඇයි-ඇයි ඌ අපිව අතහරින්නේ?''

ලියෝ පහළ තිබූ රාක්‍ෂයාගේ හිස දෙස බැලුවේය. මෙය අසීරු පහරක් විය හැකි වුවත්, ඔහුට වෙනත් විකල්පයක් නොතිබිණි. ඔහු තම

වමතේ තිබූ කුප්පිය එසවූයේය. තම දකුණු අත රාක්ෂයාගේ ග්‍රාහිකාවට තද කළ ඔහු එම අත්ලට ගින්දර කැඳවූයේය.

එයට සත්ත්වයාගේ අවධානය යොමු විය. ලියෝගේ ස්පර්ශයෙන් නැගුණු උණුසුම ග්‍රාහිකාව දිගේ පහළට ගලා ගියේය. රාක්ෂයා වේදනාව පිට කිරීමට මුව විවර කළේය. ලියෝ එක එල්ලේම ග්‍රීක ගින්න උගේ මුව තුළට විසිකර දැමුවේය.

ඉන්පසු සිදුවූ දේ අපැහැදිලි විය. ඔවුන් වෙලාගෙන සිටි ග්‍රාහිකා ලිහිල් වන අයුරු ලියෝට දැණිනි. ඔවුහු ඇද වැටුණහ. ඔහුට තරමක පිපිරුම් හඬක් සමඟින් රාක්ෂයාගේ රෝස පැහැති උදරය ඇතුළත කොළ පැහැති ගිනි ජාලාවක් ඇති වනු පෙනිණි. වැලි කඩදාසියක් ගඩොලක අතුල්ලන්නාක් මෙන් ජලය ලියෝගේ මුහුණේ ගැටුණේය. ඔහු අන්ධකාරයේ ගිලී ගියේය. මුව වසාගෙන හුස්ම රඳවා ගැනීමට උත්සාහ කළත්, ඔහුට සිහිය නැතිවීමට ආසන්න බව දැණිනි.

ලුණු වතුරින් දෑස් රිදුම් දුන්නත්, අපැහැදිලි ජායාවක් ලෙස ඉහළින් දිස්වන්නේ නැවේ කුඹය විය යුතු යැයි ඔහුට සිතිණි. අඳුරු ඕවලයක් කොළ පැහැති අග්නි රශ්මියකින් වටවී තිබිණි. එහෙත් සැබැවින්ම නෞකාව ගින්නට හසු වී ඇද්ද යන්න ඔහුට පැවසීමට නුපුළුවන් විය.

*යෝධ කුණිස්සා අපිව මැරුවා,* ලියෝ ශෝක විය. *අඩුගානෙ ආගෝ II වත් ඉතුරු කරන්න. මගෙ යාළුවන්ගෙ පණ බේරගන්න.* ඔහුගෙ දර්ශනය බොඳ වන්නට පටන් ගත්තේය. ඔහුගේ පෙනහලු දැවෙන්නට විය.

උත්සාහය අත් හරිමින් සිටියදී, අත්භූත මුහුණක් ඔහු වටා කරකැවෙන්නට විය. ඒ මුහුණ අර්ධ ලෝහිත කඳවුරේ ඔවුන්ගේ පුහුණුකරු චිරොන්ට සමාන විය. ඔහුට තිබුණේද ඒ ආකාරයේම බොකුටු කොණ්ඩයක්, වැඩුණු රැවුලක් සහ බුද්ධිමත් දෑසකි. හිපියකුගේ සහ බුද්ධිමත් මහාචාර්යවරයකුගේ අතර පෙනුම තිබූ මේ මිනිසාගේ සම ලීමා බීජයක පැහැය ගත්තේය. මිනිසා නිහඬව කිනිස්සක් ඔසවාගෙන සිටියේය. ඔහුගේ ඉරියව් භයානක මෙන්ම අපහාසාත්මක විය. *දැන්, ඔහොමම හිටපන්, එහෙම නැත්නම් මට උඹව හරියට මරාග න්න බැහැ.* කියන්නාක් වැනි පෙනුමක් ඔහු තුළ විය. ලියෝ සිහිසුන් විය.

* * *

ලියෝ අවදි වූ විට, තමා තවත් අතීතාවර්ජනයක භූතයකු වී සිටින්නේ දැයි ඔහු පුදුමයට පත් විය. ඔහු සැහැල්ලුවෙන් පාවෙමින් සිටියේය. ඔහුගේ දෑස් සෙමින් මඳ ආලෝකයට හුරු විය.

''වෙලාව ගැන,'' ප්ලාස්ටික් ආවරණයක ස්ඵර කීපයක් අතරින් කතා කරන්නාක් මෙන් ෆ්‍රෑන්ක්ගේ හඬ ඕනෑවටත් වඩා වැඩියෙන් රැව් දුන්නේය.

ලියෝ නැගිට්ටේය... එසේත් නැතිනම් කය තරමක් එසෙව්වේය. ඔහු සිටියේ මෝටර් රථ දෙකක් නැවැත්විය හැකි ගරාජයක් තරම් වූ දිය යට ගුහාවකය. දීප්තිමතක් පාසිවලින් එහි පියස්ස වැසී තිබුණු අතර, නිල් සහ කොළ පැහැති ආලෝකයකින් ලෙන නැහැවී තිබිණි. ගෙබිම පුරා පලසක් මෙන් මුහුදු ඉකිරියන්ය. එබැවින් එහි ඇවිදයාමට නොහැකි විය. එනිසා පාවෙමින් සිටීමට ලියෝ කැමති විය. වාතය නැති තැනක තමන් හුස්ම ගන්නේ කෙසේදැයි ලියෝට සිතාගත නොහැකි විය.

ආසන්නයේ ෆ්‍රෑන්ක් භාවනානුයෝගී ඉරියව්වකින් ඉහළ පහළ යමින් සිටියේය. ඔහුගේ පිරුණු මුහුණත්, නොඉවසිලිවන්ත ඉරියව්වත් නිසා, ඔහු සත්‍යය අවබෝධ කරගත් බුදුන් වහන්සේ මෙන් දිස්වූ අතර එහි කිසිදු බියපත් බවක් නොතිබිණි.

ලෙනෙන් පිටවීමට ඇති එකම විවරය දැවැන්ත බෙලි කටුවකින් අවහිර කර තිබිණි. එහි මතුපිට මුතු සහ රෝස පැහැයෙන් බැබලිණි. මේ ලෙන සිරකුටියක් නම්, අඩුම ගානෙ එයට තිබුණේ අපූරු දොරකි.

''අපි කොහෙද ඉන්නෙ?'' ලියෝ විමසුවේය. ''අනිත් අය කොහෙද?''

''අනිත් අය?'' ෆ්‍රෑන්ක් විමසුවේය. ''මම දන්නෙ නැහැ. මට කියන්න පුළුවන් තරමට නම් ඔයයි, මමයි හේසාලුයි විතරයි මෙතන පහළ ඉන්නෙ. මත්ස්‍ය අශ්ව හාදයො ඔයාවයි මාවයි මෙතන දාල පැයකට විතර කලින් හේසාල්ව අරන් ගියා.''

ෆ්‍රෑන්ක් එය පැවසූ ආකාරය අනුව, ඔහු එය අනුමත නොකරන බව පැහැදිලිව පෙනී ගියේය. ඔහුට තුවාල සිදුවී තිබුණු බවක් නොපෙනුණත්, ඔහුගේ දුන්න සහ හී කොපුව තවදුරටත් නොමැති බව ලියෝට අවබෝධ විය. උමතුවෙන් මෙන් ලියෝ තම ඉන අතගෑවේය. උපකරණ පටිය අතුරුදන්ව තිබිණි.

''එයාල අපිව පරීක්ෂා කළා.'' ෆ්‍රැන්ක් පැවසුවේය. ''ආයුධයක් කියල හිතපු හැම දෙයක්ම අරගත්තා.''

''කවුද?'' ලියෝ විමසුවේය. ''කවුද මේ මත්ස්‍ය- අශ්වයෝ?''

''මත්ස්‍ය-අශ්ව හාදයෝ,'' එතරම් පැහැදිලි බවක් නොපෙනුණත්, ෆ්‍රැන්ක් පැහැදිලි කරන්නට විය. ''අපි මුහුදට වැටුණම, එයාල අපිව ඇදගෙන එන්න ඇති... කොහෙහරි තියෙන මේ තැනට.

සිහිසුන් වීමට පෙර කිනිස්සක් අතේ දරා සිටි ලිමා ඇටයේ පැහැයෙන් යුත් මුහුණ සහිත මිනිසා අවසානයට පැවසූ දේ ලියෝගේ මතකයට නැගිණි.''කුණිසි රාක්ෂයා. ආගෝ II කියන්නෙ නැවක් හරිද? ''

''මම දන්නෙ නෑ.'' ෆ්‍රැන්ක් දුර්මුඛව පැවසුවේය. ''අනෙක් අය ඉන්නෙ ප්‍රශ්නෙක වෙන්න ඕනෙ. එහෙම නැත්නම් තුවාලවෙලා. එහෙමත් නැත්නම් ඊටත් වඩා නරක තත්ත්වෙක. ඒත් මම හිතනවා ඔයා ඔයාගෙ යාළුවන්ට වඩා නැව ගැන හිතනවා කියලා.''

ලියෝට තම මුහුණට ප්‍රබල ජල පහරක් වැදුණාක් වැනි හැඟීමක් දැනිණි. ''මොන විදිහෙ තකතීරු-?''

ෆ්‍රැන්ක් එතරම් කේන්තියෙන් සිටින්නෙ මන්දැයි එවිට ඔහුට අවබෝධ විය. *අතීතානුස්මරණය.* ලියෝට මුළුමනින්ම අමතකව ගොස් තිබූ වේලාව තුළ රාක්ෂ ප්‍රහාරයත් සමඟ සියල්ල වේගයෙන් සිදු වී තිබිණි. ලියෝ හේසාල්ගේ අත අල්ලාගෙන ඇගේ දෑස් දෙස බලා සිටි බව පැවසූවේ කෝච් හෙජ්ය.

එක්විටම තමාට ෆ්‍රැන්ක්ගේ මුහුණ දෙස බැලීමට අසීරු බවක් ලියෝට දැනිණි.

''බලන්න, මනුස්සයෝ... මට සමාවෙන්න. මම තමයි අපිව මේ කරදරේ දැම්මේ. මම සම්පූර්ණයෙන් අවුල් වෙලා හිටියෙ.'' දිය යට සිටීම ගැන සැලකිල්ලකින් වුවත් ඔහු දිගු හුස්මක් ගත්තේය. ''මමයි, හේසාලුයි අත් අල්ලාගෙන හිටියා... ඒක ඔයා හිතන විදිහෙ දෙයක් නෙමෙයි. එයා මට එයාගෙ අතීතය ගැන අතීතාවර්ජනයක් පෙන්නුවා. එයා උත්සාහ කළේ මට සැමී එක්ක තියෙන සම්බන්ධය පැහැදිලි කරන්න.''

ෆ්‍රැන්ක්ගේ කෝපාන්විත ඉරියව්ව කුතුහලයක් බවට පත්විය. ''එයා එහෙම කළාද... ඔයාට හොයාගන්න පුළුවන් වුණාද?''

''ඔව්.'' ලියෝ පැවසුවේය. ''තරමක් දුරට. ශ්‍රිම්ප්සිලා නිසා අපිට ඊට වඩා අවස්ථාවක් ලැබුණේ නෑ. ඒත් සැමී කියන්නෙ මගේ සීයා.''

ඔවුන් දුටු දේ ඔහු ෆ්‍රෑන්ක්ට පැවසුවේය. අත්භූත බව තවමත් සිතට ඇතුළු වී නොතිබුණත්, දැන්, එය හඬ නඟා පැහැදිලි කිරීමට උත්සාහ දරණ විට ලියෝට එය විශ්වාස කිරීමට අසීරු විය. හේසාල්, ලියෝ ළදරුවකුට සිටියදී මිය ගිය තම සීයාගේ ආදරවන්තිය වී සිටියාය. ඊටපෙර ලියෝට එහි සම්බන්ධය වටහා ගැනීමට නොහැකි වුවත්, ඔහුගේ අපැහැදිලි මතකය තුළ පවුලේ සාමාජිකයන් ඔහුගේ සීයාව කනිෂ්ඨ සැම් ලෙස හැඳින්වූ බව මතකයේ තිබිණි. එහි අර්ථය වූයේ ජ්‍යෙෂ්ඨ සැම් යනු සැමී බවයි. ඒ ලියෝගේ ලොකු සීයාය. සමහර තැනකදී -ටියා කැලීඩා- හේරාම සැමී සමඟ කතා තර තිබුණාය. ඔහුව අස්වසස්සවමින් සහ අනාගතය ගැන බලාපොරොත්තු දෙමින්, ලියෝ ඉපදීමටත් පෙර හේරා ඔහුගේ ජීවන පරපුරේ හැඩරුව සකසා තිබුණාය. හේසාල් 1940 දශකය වනතුරු සිටියා නම්, ඇය සැමී හා විවාහ වූවානම්, ලියෝ ඇයගේ ලොකු මුනුබුරා වීමට ඉඩ තිබිණි.

''ඕහ්, මනුස්සයෝ.'' තම කතාව අවසන් කළ පසු ලියෝ පැවසුවේය.

''මට එච්චර හොඳ බවක් දැනෙන්නෙ නෑ. ඒත් මම දිවුරනවා ඒක තමයි අපි දැක්කෙ කියලා.''

රාක්ෂයාගේ විවර වූ මුව සහ වීදුරු බෝල ඇය දකින විට ෆ්‍රෑන්ක් තුළ පැවතියේත් මේ ඉරියව්වමය. ''හේසාල්... හේසාල් ඔයාගෙ ආච්චි අම්මා වගේද? එහෙනම් ඒකද එයා ඔයාට කැමති?''

''ෆ්‍රෑන්ක්, මම දන්නවා මේක අමුතුයි කියලා. මාව විශ්වාස කරන්න. ඒත් මම හේසාල්ට කැමති නැහැ. ඒ විදිහට මට ඔයාගෙ කෙල්ලව අරගන්න ඕනෙ නැහැ.''

ෆ්‍රෑන්ක් තම දෙබැම එසැවිය. ''නැද්ද?''

සත්තකින්ම, තමාට හේසාල් ගැන ඇත්තේ කුමන ආකාරයේ හැඟීමක් දැයි ලියෝ නොදත්තේය. ඇය බියකරු මෙන්ම ලස්සනද වූවාය. එසේම බිය උපදවන ලස්සන කෙල්ලන් සම්බන්ධයෙන් ලියෝ තුළ දුර්වලතා ද විය. එහෙත් ඔහුගේ අතීතාවර්ජනය ඔහුගේ හැඟීම් බොහෝ සෙයින් සංකීර්ණ කර තිබුණේය.

අනෙක් අතට, ඔහුගේ නැවද ප්‍රශ්නයකට මුහුණ දී ඇත. *මම හිතනවා ඔයා ඔයාගෙ යාළුවන්ට වඩා නැව ගැන හිතනවා කියලා,* ෆ්‍රැන්ක් කළින් එසේ පැවසුවේය.

එය සැබෑවක් නොවේ. ලියෝගේ පියා, හෙපියාස්ටස් වරෙක ඒත්තු ගන්වා තිබුණේ, ඔහු කාබනික ජීව ආකාරයන් සම්බන්ධයෙන් එතරම් හොඳ අයකු නොවන බවයි. එය සැබෑවකි. ලියෝ නිතරම ප්‍රියකළේ මිනිසුන්ට වඩා යන්ත්‍ර සූත්‍ර සමඟ සිටීමටය. එහෙත් ඔහු තම මිතුරන් ගැන සොයා බැලුවේය. පිපර් සහ ජේසන්... ඔහු ඔවුන් දෙදෙනාව දීර්ඝ කාලයක සිට දැන සිටියත්, අනෙක් අයද ඔහුට ඒ තරමටම වැදගත් විය. ෆ්‍රැන්ක් පවා ඔහුට වැදගත් විය. ඔවුන් පවුලක් වැනිය.

එහෙත් ප්‍රශ්නය වූයේ එවැනි හැඟීමක මතකයන් පවා නොමැති තරමට ඔහු පවුල සමඟ ගතකර බොහෝ කාලයක් ගත වී තිබීමය. නිසැකවම, ගෙවුණු සීත ඍතුවේදී ඔහු හෙපියාස්ටස් කුටියේ ජ්‍යෙෂ්ඨ උපදේශකයා බවට පත් විය. එහෙත් ඔහු තම කාලයෙන් වැඩි ප්‍රමාණයක් වැය කළේ නෞකාව ඉදිකිරීම සඳහාය. ඔහු තම කුටියේ සගයන්ට ප්‍රිය කළේය. ඔවුන් සමඟ වැඩ කරන අයුරු ඔහු දැන සිටියේය. එහෙත් ඔහු ඇත්තටම ඔවුන් ගැන දැන සිටියාද?

ලියෝට පවුලක් තිබුණා නම් ඒ ආගෝ II වල උප දෙවිවරුන්ය. සමහරවිට කෝච් හෙජ් ද අයත් වන්නට පුළුවන.

*ඔබ නිතරම පිටස්තරයෙක් වෙයි.* නෙමිසිස්ගේ හඬ අනතුරු හැඟවූවාය. එහෙත් ලියෝ ඒ සිතිවිල්ල පසෙකට දැමීමට උත්සාහ කළේය.

''හරි, එහෙනම්...'' ඔහු අවට බැලුවේය. ''අපි සැලසුමක් හදන්න ඕනෙ. අපි කොහොමද හුස්ම ගන්නේ? අපි ඉන්නෙ මුහුද යටනම්, අපිව ජලයෙ පීඩනයෙන් පොඩිවෙලා යන්න ඕනෙ නේද?''

ෆ්‍රැන්ක් දෙවුර සැලුවේය. ''මත්ස්‍ය- අශ්ව මැජික් එකක්. මම හිතන්නෙ. මට මතකයි කොළ පාට හාදයා කිණිසි තුඩ මගෙ හිසේ තියනවා. ඊට පස්සෙ මට හුස්ම ගන්න පුළුවන් වුණා.''

ලියෝ බෙලි කටු දොර අධ්‍යයනය කළේය. ''ඔයාට මේක බිඳල දාන්න බැරිද? මිටි හිසැති මෝරෙක් හෝ ඒවගේ කෙනෙක් වෙලා?''

ෆ්‍රෑන්ක් හිස සැලුවේය. ''මගේ හැඩය වෙනස්වීම වැඩකරන්නෙ නැහැ. මම දන්නෙ නෑ ඇයි කියලා. සමහරවිට එයාලා මට සාප කරල ඇති. එහෙම නැත්නම් මට හිත එකඟ කරගන්න බැරි තරමට අවුල් වෙලා ඇති.''

''හේසාල් ඉන්නෙ ගැටළුවක වෙන්න ඕනෙ.'' ලියෝ පැවසුවේය.

''අපි මෙතනින් පැනගන්න ඕනෙ.''

දොරටුව අසලට පිහිනා ගිය ඔහු, බෙලි කටුව ඔස්සේ තම ඇඟිලි දිවෙව්වේය. එහි කිසිදු ආකාරයක අගුලක් හෝ යාන්ත්‍රණයක් ඇති බවක් ඔහුට නොපෙනුණි. එක්කෝ දොර විවර වීම මැජික් බලයෙන් සිදුවන්නක් විය යුතුය. නැතහොත් ඍජු බලයක් අවශ්‍ය වනවා විය යුතුය. මේ දෙකින් එකකටවත් ලියෝ විශේෂඥයකු නොවීය.

''මම දැනටමත් උත්සාහ කළා.'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''අපි මෙතනින් පැන ගත්තත්, අපි ළඟ ආයුධ නැහැ.''

''හ්ම්... ලියෝ තම අත එසවීය. ''මම පුදුමවෙනවා.''

ඔහු සිත එකඟ කළේය. ඔහුගේ ඇඟිලි වලින් ගිනි දළු මතුවිය. මොහොතක් ලියෝ තැති ගත්තේ ජලය යටදී එය ක්‍රියා කරතැයි ඔහු අපේක්ෂා නොකළ නිසාය. ඉන්පසු ඔහුගේ සැලැස්ම තරමක හොඳින් වැඩකිරීමට පටන් ගත්තේය. ඇඟිලිවලින් ඇරඹි ගිනි දැල්ල ඔහුව සම්පූර්ණයෙන්ම තුනී ගිනි දළුවකින් වටවෙන තෙක් සිරුර වටා දිව ගියේය. ඔහු හුස්ම ගැනීමට උත්සාහ කළත් ඔහුට ආඝ්‍රාණය වූයේ උණුසුම පමණකි.

''ලියෝ!'' ෆ්‍රෑන්ක් පසුපසට විසිවිය. ලියෝගේ උදව්වට දිව යනු වෙනුවට හැකි තාක් ඈත් වී බිත්තියට හේත්තු විය.

ලියෝ සන්සුන් වීමට උත්සාහ කළේය. කරන්නට යන්නේ කුමක්දැයි යන්න ගැන ඔහු දැනුවත්ව සිටියේය. ගින්නෙන් ඔහුට හානියක් නොවීය. පහට ගණින විට ගින්න අතුරුදන් කිරීමට ඔහුට හැකි විය. ඔහු ගැඹුරු හුස්මක් ගත්තේය. ඔහුට නැවත ඔක්සිජන් ලැබී තිබේ.

ෆ්‍රෑන්ක් බිත්තියට හේත්තු වීගෙනම සිටියේය. ''ඔයා... ඔයා හොඳින්ද?''

''ඔව්.'' ලියෝ පැවසුවේය. ''උදව් කළාට ස්තූතියි.''

''ම, මට සමාවෙන්න.'' ෆ්‍රෑන්ක් බෙහෙවින් බියපත්ව සිටියේය.

''මම... මේ... මොකක්ද වුණේ?''

''දක්ෂ මැජික් එකක්.'' ලියෝ පැවසුවේය. ''අතිරේක සමක් වගේ අපි වටා තුනී ඔක්සිජන් ස්ථරයක් තියෙනවා. ස්වයං- ප්‍රතිජනනයට විය යුතුයි. ඒ විදිහට තමයි අපි හුස්ම ගන්නෙ සහ වියළිව ඉන්නෙ. ඔක්සිජන්වලින් දහන ඉන්ධනය ලැබෙනවා. ගින්නෙන් මට බලපෑමකුත් නැහැ.''

''මම ඇත්තටම කැමති නෑ...'' ෆ්‍රෑන්ක් ගොතගැසුවේය. ''මම ඇත්තටම කැමති නෑ ඔයා ගින්දර කැඳවනවට.'' ඔහු තවතවත් බිත්තියට තුරුලු වෙමින් පැවසුවේය.

ලියෝ ඔහුට සමච්චල් කිරීමට නොසිතුවත්, ඔහුට සිනාව නවතා ගැනීමට නොහැකි විය. ''මිනිහෝ, මම ඔයාට පහර දෙන්නෙ නෑ.''

''ගින්දර.'' එක වචනයෙන් සියල්ලම පැහැදිලි කිරීමට මෙන් ෆ්‍රෑන්ක් නැවත පැවසුවේය.

හේසාල් පැවසූ දෙයක් ලියෝට සිහිපත් විය. ඒ ඔහුගේ ගින්න ෆ්‍රෑන්ක්ව අවුල් කරන බවයි. ෆ්‍රෑන්ක්ගේ මුහුණේ වූ අපහසු ගතිය ඔහු මීට පෙර දැක තිබුණත්, ලියෝ එය එතරම් බැරෑරුම් ලෙස සැලකුවේ නැත. ඒ ලියෝට වඩා ෆ්‍රෑන්ක් බොහෝ බලවත් සහ භයානක බව පෙනී ගිය නිසාය.

ෆ්‍රෑන්ක්ට ගින්දර සමග ඇති නරක අත්දැකීමක් හේතුවෙන් දැන් ඔහුට එය සිදුව තිබේ. ලියෝගේ මව මිය ගියේ යාන්ත්‍රික හලේ සිදු වූ පිපිරීමකිනි. ලියෝට එහි වරද පැටවිණි. ඔහු කෝප වූ ඕනෑම විටෙක දේවල් පිළිස්සී යෑම හේතුවෙන් ඔහු වැඩුණේ විකාරයා, ගිනි තබන්නා වැනි නම්ද සහිතවය.

''සමාවෙන්න, මට හිනා ගියා.'' ඔහු පැවසුවේය. ''මගෙ අම්මා මැරුණේ ගින්නකින්. ඒකට බය වෙන්න ඕනෙ කියලා මම තේරුම් ගත්තා. ඔයාටත් එහෙම දෙයක් වෙලා තියෙනවද?''

කොපමණ කිවයුතුදැයි ෆ්‍රෑන්ක් සිතන බව පෙනිණි. ''මගේ ගෙදර... මගෙ ආච්චි අම්මගෙ ගෙදර. ඒක පිළිස්සුණා. ඒත් ඒකෙ ඊට වඩා දෙයක් තියෙනවා. ''ඔහු ගෙබිම සිටි මුහුදු ඉකිරියන් දෙස බැලුවේය. ''ඇනබෙත් කිව්වා මම නැවේ පිරිස විශ්වාස කරන්න ඕනෙ කියලා. ඔයාව පවා-''

''මාවත්, ඈහ්?'' එය සංවාදයට පැමිණියේ කෙසේදැයි ලියෝ පුදුමයට පත්විය. ''වාව් ලොකු වාර්ණනාවක්.''

''මගෙ දුර්වලකම...'' මුව තුළ වචන සිරවූවාක් මෙන් ෆ්‍රෑන්ක් බලාසිටියේය. ''මේ දර කෑලි-''

බෙලි කටු දොර විවෘත විය.

ලියෝ ආපසු හැරී බලන විට දුටුවේ තමා ලීමා ඇටයේ පැහැති මිනිසාට මුහුණට මුහුණලා සිටින අයුරුය. ඔහු සැබැවින්ම මිනිසකු යැයි කිව නොහැකිය. දැන් ලියෝට ඔහුව පැහැදිලිව දැක ගත හැකි විය. ඒ හාදයා ලියෝ මෙතෙක් දැක තිබූ අද්භූතම සත්ත්වයා වූ අතර ඔහු ගැන පැවසීමට බොහෝ දෑ තිබිණි.

ඉනෙහි සිට ඉහළට අඩු වැඩි වශයෙන් මිනිසෙකි. සිහින්, නිරුවත් ළයක් සහිත ඔහු ඉන පටියේ එල්ලුණු කිණිස්සකින් සන්නද්ධව සිටියේය. මුහුදු බෙල්ලන්ගෙන් සැදුණු පටියක් පතරොම් පටියක් සේ උරහිස හරහා වැටී තිබිණි. ඔහුගේ සම කොළ පැහැති වූ අතර රැවුල තරමක දුඹුරු පැහැයෙන් යුක්ත විය. දිගු කොණ්ඩය මුහුදු පැළෑටි පට ලේන්සුවකින් පිටුපසට කර ගැට ගසා තිබිණි. කකුළු පාද දෙකක් අං දෙකක් මෙන් හිසෙන් දෙපසට විහිදිණි. ඒවා අහඹු ලෙස ඒ මේ අතට චලනය විය.

ඔහුගේ පෙනුම චිරෝන් මෙන් නොවෙතැයි ලියෝ තීරණය කළේය. ඔහු වඩාත් සමාන වූයේ ලියෝගේ මව වැඩපළේ අලවා තිබූ පෝස්ටරයකටය. ඒ මහලු මෙක්සිකානු මංකොල්ලකරුවකු වූ පැන්චෝ විලා ගේය. පැන්චෝට නොතිබුණේ මුහුදු බෙල්ලන්ගෙන් සැදි පටි හා හිසෙන් මතු වූ කකුළු අඬු පමණකි.

හාදයාගේ ඉනෙන් පහළ කොටස වඩාත් සංකීර්ණ විය. ඔහුට තිබුණේ නිල්-කොළ පැහැති අශ්ව පාද හතරකි. යම් තරමකට නරාශ්වයකු මෙනි. එහෙත් පසුපසට යන විට ඔහුගේ අශ්ව සිරුර දේදුණු වර්ණ දිගු මත්ස්‍ය වලිගයක් සමඟ මිශ්‍ර වී තිබිණි. වලිග වරල V හැඩයෙන් යුක්ත විය.

ෆ්‍රෑන්ක් මත්ස්‍ය- අශ්ව හාදයා ගැන පැවසීමේ අර්ථය දැන් ලියෝට අවබෝධ විය.

''මම බයිතොස්.'' කොළ පැහැති මිනිසා පැවසුවේය. මට ෆ්‍රෑන්ක් ෂැන්ග්ගෙන් ප්‍රශ්න කරන්න ඕනෙ.''

ඔහුගේ හඬ සන්සුන් මෙන්ම දැඩි විය. එහි වාදයකට ඉඩක් නොතිබිණි.

''ඇයි ඔයා අපිව අල්ලගත්තේ?'' ලියෝ විමසුවේය. ''හේසාල් කොහෙද?''

බයිතොස් තම දැස් පටු කළේය. *මේ පුංචි ජීවියා මාත් එක්ක කතා කරනවද?* වැනි පෙනුමක් ඔහුගේ මුහුණේ විය. ඔයාට, ලියෝ වැල්ඩේස්, මගේ සහෝදරයාත් එක්ක යන්න වෙයි.''

''ඔයාගෙ සහොදරයා?''

වඩාත් විශාල රූපයක් ඔහුට පිටුපසින් නලියන බව ලියෝට අවබෝධ විය. සෙවණැල්ලට අනුව එහි පළල ලෙන් පිවිසුම තරම්ම විශාල විය.

''ඔව්.'' බයිතොස් වියළි සිනාවකින් පැවසුවේය. ''ඇප්රොස්ව කලබල නොකර ඉන්න උත්සාහ කරන්න.''

# 24
# ලියෝ

**ඇප්රොස් ද පෙනුමෙන් සිය සහෝදරයාට සමාන විය.** අසමාන වූවා නම් ඒ ඔහුගේ කොළ පැහැය වෙනුවට ඇප්රොස් නිල් පැහැති වීමත්, වඩ වඩාත් විශාල වීමත් යන කරුණු වලින් පමණි. ටර්මිනේටර් චිත්‍රපටියේ ආනෝල්ඩ්ගේ පෙනුම සිහිගැන්වූ ඔහු විශාල කඩුවක් පිටේ එල්ලාගෙන සිටියේය.

''ඇයි එයාල ඔයාට ඇප්රොස් කියල නම තිබ්බේ?'' ලෙනෙහි පහළට තිබුණු මාර්ගයේ පාවී යන අතරතුර ලියෝ විමසුවේය.

''ඇෆ්රෝ නිසාද?''

ඇප්රොස් රැව්වේය. ''ඔයා මොනවද කියන්නේ?''

''මොකුත් නෑ.'' ලියෝ ක්ෂණිකව පැවසුවේය. ''එහෙනම් ඇත්තටම ඔයාල කව්ද?''

''ඉක්තියෝසෙන්ටෝරස්ලා[1]'' ඇප්රොස් පැවසූවේ එම ප්‍රශ්නයට පිළිතුරු දීමත් අසීරු ලෙස සලකමිනි.

''ආහ්, ඉක්ති මොකක්?''

''මත්ස්‍ය නරාශ්වයෝ. අපි චිරොන්ගේ අර්ධ සහෝදරයෝ.''

''ආහ්, එයා මගේ යාළුවෙක්.''

1 කවන්ධය හා හිස මිනිසකුගේද, පසුපස කොටස අශ්වයකුගේද, වලිගය මත්ස්‍යයකුගේද වන මත්ස්‍ය-නරාශ්වයෙකි. සමහර අවස්ථාවලදී ඔවුන්ගේ හිස මත කකුළු අඬු වැනි අං දෙකක්ද දක්නට ලැබිණි.

ඇප්රොස් දෑස් පටු කළේය. ''හේසාල් කියන කෙනත් අපිට ඒක කිව්වා. ඒත් අපි ඇත්ත තහවුරු කර ගන්න ඕනෙ. එන්න.''

*ඇත්ත තහවුරු කර ගන්න ඕනෙ* යන්නට ලියෝ එතරම් කැමති වූයේ නැත.

විශාල මුහුදු පැළෑටි වනාන්තරයක් අතරින් ඔහු මත්ස්‍ය නරාශ්වයා පසුපස ගමන් කළේය. ලියෝට පැත්තකට පාවී ගොස් පහසුවෙන් සැඟවීමේ හැකියාව තිබුණත් ඔහු එයට උත්සාහ නොකළේය. ඔහුට පෙනීගිය එක් දෙයක් වූයේ ඇප්රොස්ට ජලය තුළ ඉතා වේගයෙන් ගමන් කළ හැකි බවයි. එසේම මේ හාදයාට ලියෝගේ චලනය සහ හුස්ම ගැනීමේ හැකියාව මැජික් බලයෙන් නැවැත්වීමේ හැකියාව තිබිණි. ලෙනේ ඇතුළත හෝ පිටත වේවා ලියෝ සිරකරුවෙකි.

එසේම තමා සිටින්නේ කොහේද යන්න ගැන ලියෝට කිසිදු අවබෝධයක් නොතිබිණි.

තට්ටු නිවාසයක් තරම් උසැති මුහුදු පැළෑටි අතරින් ඔවුහු පිහිනා ගියහ. හීලියම් පිරවූ බැලුන් පෙළක් මෙන් කොළ සහ කහ පැහැයෙන් යුත් ඒවා ජලය තුළ සැලෙමින් තිබිණි. බොහෝ ඉහළින්, බොඳ වූ සුදු පැහැයක් ලියෝට දක්නට ලැබුණු අතර ඒ හිරු විය යුතුයැයි ඔහු සිතුවේය.

එසේනම් ඔවුන් මුළු රැය පුරාම මෙහි ගතකර ඇතිබව ඔහු අනුමාන කළේය. ආගෝ II හොඳින්ද? ඔවුන් නොමැතිව එය යාත්‍රා කරයිද, නැතිනම් ඔවුන්ගේ මිතුරන් තවමත් ඔවුන්ව සොයමින් සිටින්නේද?

ඔවුන් සිටින ගැඹුර ගැනවත් ලියෝට හරි හැටි වැටහීමක් නොතිබිණි. මෙහි ශාක වැඩී ඇති බැවින් එතරම් ගැඹුරක නොවිය යුතුය. තවමත්, ඔහුට මතුපිටට පිහිනා යාමට නොහැකි බව ඔහු දැන සිටියේය. ඉතා ඉක්මනින් ඉහළට පිහිනීමට උත්සාහ කරන මිනිසුන්ගේ රුධිරයේ නයිට්‍රජන් බුබුළු ඇතිවන බව ඔහු අසා තිබිණි. ලියෝට කාබනීකෘත රුධිරයේ අවශ්‍යතාවක් නොතිබිණි.

ඔවුහු සමහරවිට සැතපුම් භාගයක පමණ දුරක් පාවී ගියහ. ඇප්රොස් තමාව රැගෙන යන්නේ කොහේද යන්න ඇසීමට ඔහුට අවශ්‍ය වුවත්, මත්ස්‍ය නරාශ්වයාගේ පිටෙහි තිබූ දැවැන්ත අසිපත වැඩිදුර සංවාදය ප්‍රතික්ෂේප කිරීමට බල කරන්නක් විය.

අවසානයේදී මුහුදු පැළෑටි වනාන්තරය අවසන් විය. ලියෝ ගැස්සිණි. ඔවුහු පැමිණ තිබුණේ දිය යට තිබූ උසැති කඳු මුදුනක් වෙතය. ඔවුන්ට පහළින් මුහුදු පත්ලේ විහිද තිබුණේ ග්‍රීක ශෛලියේ ගොඩනැගිලි වලින් යුත් නගරයකි.

වහල සෙවිලි කර තිබුණේ මුතු වලිනි. ගෙඋයන් කොරල් සහ මුහුදු ඇනිමනිවලින් පිරී තිබිණි. හිපොකැම්පියන් මුහුදු පැළෑටි වගාවක කෑම ගනිමින් සිටියහ. එකැස් යෝධයින් කණ්ඩායමක් නව දේවස්ථානයක අර්ධ ගෝලාකර වහලය සාදමින් සිටියහ. ඔවූහු දොඹකරය ලෙස යොදාගෙන තිබුණේ නිල් තල්මසෙකි. වීථිවල පිහිනමින්. ගෙමිදුල්වල එල්ලෙමින්, රඟමඩල වල කඩු සහ ත්‍රිශූල සටන් පුහුණු වෙමින් සිටියේ දුසිම් ගණනක් දිය කිඳුරන් හා කිඳුරියන්ය. මත්ස්‍ය මිනිසුන්ය.

ලියෝ විකාර දෑ බොහෝ දක ඇතත්, ඔහු නිතරම සිතා සිටියේ කිඳුරු මිනිසුන් මෝඩ ප්‍රබන්ධමය සත්ත්වයන් බවයි.

මේ කිඳුරු මිනිසුන් තුළ මෝඩ හෝ ලස්සන පෙනුමක් නොතිබිණි. දුරට පවා ඔවුන් බියකරු ලෙස පෙනී ගිය අතර කොහෙත්ම මනුෂ්‍යයන් නොවීය. ඔවුන්ගේ දෑස් කහ පැහැයෙන් දිලිසිණි. ඔවුන්ට මොරුන්ගේ වැනි දත් තිබූ අතර, තෙත් සහිත සම කොරල් රතු පැහැයේ සිට තද කළු පැහැය දක්වා වර්ණයන්ගෙන් යුක්ත විය.

''ඒක පුහුණු කඳවුරක්.'' ලියෝට අවබෝධ විය. ඔහු ගෞරව සම්ප්‍රයුක්තව ඇප්රොස් දෙස බැලුවේය. ''ඔයා වීරයන්ව පුහුණු කරනවද. හරියට චිරෝන් කරනවා වගේම?''

ඇප්රොස් හිස සැලුවේය. ආඩම්බරකාර පෙනුමක් ඔහුගේ දෑස් තුළ විය. ''පුහුණු කරපු සුප්‍රකට කිඳුරු වීරයෝ සේරම ඉන්නෙ අපි ළඟ! නම කිඳුරු- වීරයා නම්, අපි තමයි ඔහු හෝ ඇයව පුහුණු කරල තියෙන්නේ.''

''ආහ්, සත්තකින්ම.'' ලියෝ පැවසුවේය. ''හරියට... ම්... පුංචි කිඳුරිය වගේද?''

ඇප්රොස් මුහුණ හැකිළුවේය. ''කවුද? නෑ! ට්‍රයිටන්, ග්ලැවුකස්, වෙයිස්මුලර් සහ බිල් වගේ අය.''

''ඕහ්.'' මේ මිනිසුන් කවුරුන්දැයි යන්න ගැන ලියෝට කිසිදු අදහසක් නොතිබිණි. ''ඔයාද බිල්ව පුහුණු කළේ? අපූරුයි.''

''ඇත්තවශයෙන්ම,'' ඇප්රොස් පපුවට තට්ටුවක් දැම්මේය. ''මමයි බිල්ව පුහුණු කළේ. විශිෂ්ට කිඳුරෙක්.''

''මම හිතන්නේ ඔයා සටන් කරන්නයි උගන්වන්නෙ.''

ඇප්රොස් බලවත් කෝපයෙන් තම දැත් විදහාලිය. ''හැමෝම ඇයි එහෙම හිතන්නේ?''

ලියෝ මත්ස්‍ය හාදයාගේ පිටේ ඇති දැවැන්ත කඩුව දෙස බැලුවේය. ''ආහ්, මම දන්නෙ නෑ.''

''මම උගන්වන්නෙ සංගීතය සහ කුඹල් කර්මාන්තය!'' ඇප්රොස් පැවසුවේය. ''ජීවන නිපුණතා! ගෘහ අත්කම්. මේවා වීරයන්ට වැදගත්.''

''නිසැකවම,'' ලියෝ මුහුණ ඍජුව තබා ගැනීමට උත්සාහ කළේය.

''මැහුම්, විස්කෝතු හැදීම?''

''ඔව්, මට සතුටුයි ඔයා තේරුම්ගත්ත එකට. සමහර විට පසුව, මට ඔයාව මරන්න වුණේ නැත්නම්, මම ඔයාට මගෙ බ්‍රවුනි වට්ටෝරුව දෙන්නම්.'' ඔහු පැවසුවේය. ''මගේ සහෝදරයා බයිතොස්- එයා තමයි සටන් උගන්වන්නේ.''

ලියෝ ගෘහ ආර්ථික විද්‍යා ගුරුවරයකු සමඟ සිටින අතරතුර ෆ්‍රෑන්ක්ගෙන් ප්‍රශ්න කරන්නේ සටන් පුහුණු කරුවකු වීම තමා තුළ ඇති කරන්නේ සැහැල්ලුවක් ද, නිග්‍රහයක හැඟීමක්ද යන්න ගැන ලියෝට සිතාගත නොහැකි විය. ''ඉතිං විශිෂ්ටයිනෙ. මේක කඳවුරක්. ඔයාල මොකක්ද ඒකට කියන්නෙ? මත්ස්‍ය ලෝහිත කඳවුරද?''

ඇප්රොස් රැව්වේය. ''මම හිතනවා ඒක විහිළුවක් කියලා. මේක...... කඳවුර.'' ඔහු සූ හඬවල් රැසක් කියාගෙන ගියේය.

''මම මෝඩ වුණා.'' ලියෝ පැවසුවේය. ''ඔයා දන්නවද, මට ඇත්තටම අර බ්‍රවුනිවලින් ටිකක් ඕනෙ! ඉතිං අපිට මොනව කරන්න තිබුණත් මාව මරන්නෙ නෑ නේද?''

''ඔයාගෙ කතාව කියන්න.'' ඇප්රොස් පැවසුවේය.

ලියෝ පැකිලුණත්, එය වැඩිවේලාවක් නොතිබිණි. කෙසේ හෝ තමා සත්‍යය පැවසිය යුතු යැයි හැඟීමක් ඔහුට ඇතිවිය. ඔහු මුල සිටම පටන් ගත්තේය- හේරා ඔහුගේ ආයම්මා වූයේ කෙසේද සහ ඔහුව ගින්න මැද තැබුවේ කෙසේද, ලියෝ අනාගත සතුරකු

බවට හඳුනාගත් ගයියා නිසා තම මව මිය ගියේ කෙසේද යන්න ඔහු පැහැදිලි කළේය. අනාථ නිවසක තම ළමා කාලය ගෙවුණු විදිහ ඔහු කතා කළේය. ඉන්පසු ජේසන් හා පිපර් ඔහුව අර්ධ ලෝහිත කඳවුරට රැගෙන ගිය බව ඔහු පැවසුවේය. සත් දෙනාගේ අනාවැකිය ගැන ඔහු පැහැදිලි කළේය. ආගෝ II නිර්මාණය කිරීම සහ ග්‍රීසිය බලා යන ඔවුන්ගේ ගවේෂණය සහ ගයියා අවදිවීමට පෙර යෝධයින් පරාජය කිරීම ගැන ඔහු පැවසුවේය.

ඔහු කතා කරද්දී, ඇප්රොස් ඔහුගේ ඉන පටියෙන් රැඳුරු පෙනුමැති ලෝහ උල්වගයක් ගත්තේය. තමා අතින් යම් වැරදි දෙයක් කියවුණේ දැයි ලියෝ බියට පත් වූ නමුත්, තම පසුම්බියෙන් මුහුදු පැළෑටි නූලක් ගත් ඔහු ගෙත්තමක් කිරීමට පටන් ගත්තේය. ''කියාගෙන යන්න.'' ඔහු පැවසුවේය. ''නවත්තන්න එපා.''

ලියෝ එයිඩෝලන්ලා ගැනත් රෝමන්වරුන් සමඟ ඇති වූ සියලු ප්‍රශ්න ගැනත්, චාල්ස්ටන් වල සිට එද්දී පැමිනුණ ගැහැට ගැනත් පවසන විට ඇප්රොස් සම්පූර්ණ ළදුරු තොප්පියක් ගෙත්තම් කර තිබුණේය.

මත්ස්‍ය සත්ත්වයා තම ආම්පන්න ඉවත් කරන තුරු ලියෝ බලාසිටියේය. ඇප්රොස්ගේ කකුළු තිය අං ඔහුගේ ඝන කොණ්ඩය වටා නලියන්නට විය. ඒවා බේරා දෙන ලෙස අයැද සිටීම ලියෝ වළක්වා ගත්තේය.

''බෙහොම හොඳයි.'' ඇප්රොස් පැවසුවේය. ''මම ඔයාව විශ්වාස කරනවා.''

''ඒ තරම් සරලව?''

''බොරුව තේරුම් ගැනීමේදී මම ටිකක් දක්ෂයි. ඔයාගෙන් කිසිම බොරුවක් මට ඇහුණේ නෑ. හේසාල් ලෙවිස්කි අපට කියපු දේත් එක්ක ඔයාගෙ කතාවත් හරියටම ගැලපෙනවා.''

''ඇය...?''

''ඇත්තවශයෙන්ම.'' ඇප්රොස් පැවසුවේය. ''එයා හොඳින් ඉන්නවා.'' තම මුවට ඇඟිලි දැමූ ඔහු විසිල් හඬක් නැගුවේය. දිය යටදී එහි හඬ ඩොල්පින්ගේ බෙරිහන්දීමක් බඳු අද්භූත බවක් ගත්තේය. ''මගෙ මිනිස්සු ටික වෙලාවකින් එයාව මෙතෙන්ට අරන් එයි. ඔයා තේරුම්ගත යුතුයි... අපේ ස්ථානය ප්‍රවේසමෙන් ආරක්ෂා කරන රහසිගත තැනක්. ඔයයි ඔයාගේ යාළුවොයි යුද නැවේදී දැකපු සත්ත්වයා, ලුහුබැඳගෙන

ආව කේටෝගේ මුහුදු රාක්ෂයන්ගේ කෙනෙක්. අපි දැනගෙන හිටියෙ නෑ ඔයාල කාගෙ පැත්තෙද කියලා.''

''නැව හොඳින්ද?''

''හානිවෙලා,'' ඇප්රොස් පැවසුවේය. ''ඒත් භයානක විදිහට නෙමෙයි.

''කටපුරා ගිනි පුරවගත්තම ස්කොලොපෙන්ඩ්‍රා[1] පසුබැස්සා. නියම ප්‍රහාරය.''

''ස්තුතියි. ස්කොලොපෙන්ඩ්‍රා? කවදාවත් අහල නෑ.''

''ඔයාගෙ වාසනාව කියල හිතන්න. උන් නපුරු සත්තු ටිකක්. කේටෝ ඔයාලට ඇත්තටම වෛර කරනවා ඇති. උඹ ආපහු ගැඹුරට යන්න කලින් උගේ අඬුවලින් අපි ඔයාවයි අනිත් දෙන්නවයි බේරුවා. ඔයාලගෙ යාළුවෝ තවමත් ඉහළ, ඔයාලව හොයනවා. ඒත් අපි එයාලගෙ පෙනීම වළක්වල තියෙන්නෙ. අපිට තහවුරු කරන්න ඕනෙ වුණා ඔයාල තර්ජනයක් නෙමෙයි කියලා. එහෙම නොවුණානම් අපි මිනුම් අරන් ඉවරයි.''

ලියෝ ගැස්සුණේය. මිනුම් ගැනීම යනු අමතර විස්කෝතු පිළිස්සීම නොවන බව ලියෝ වටහා ගත්තේය. මේ හාදයින් කෙතරම් බලවත් දැයි කියතොත්, පොසිඩන්ගේ සියලු ජලයේ බලය සහිත පර්සිගෙන් පවා ඔවුන්ට තම කඳවුර සඟවා ගැනීමට හැකිවිය. ඔවුන් එවැනි අවුල් ඇති කරගන්නා මත්ස්‍ය ජේත්තුකාරයන් නොවේ. ''ඉතිං... අපිට යන්න පුළුවන්ද?''

''ඉක්මනින්ම.'' ඇප්රොස් සහතික විය. මම බයිතොස්ව පරීක්ෂා කරන්න ඕනෙ. එයා එයාගෙ මිත්‍රයා ෆ්‍රෑන්ක් එක්ක කතා කළාම.''

''ෆ්‍රෑන්ක්.''

''ෆ්‍රෑන්ක්. එයාගෙ කතාව ඉවර වුණාම අපි ඔයාලව ආපහු ඔයාලගෙ නැවට යවන්නම්. ඒ වගේම අපෙන් ඔයාලට යම් අනතුරු ඇඟවීම් කීපයකුත් ලැබෙයි.''

''අනතුරු ඇඟවීම්?''

''ආහ්.'' ඇප්රොස් යමක් දෙසට අත දිගු කළේය. දුෂ්ට පෙනුමැති කිඳුරන් දෙදෙනෙක් පිරිවරාගෙන හේසාල් මුහුදු පැළෑටි වනයෙන් නික්මෙමින් සිටියාය. හේසාල් අනතුරක බව ලියෝ

1 ලෝම සහිත නාස්පුඩු ඇති, දැවැන්ත ග්‍රීක රාක්ෂයෙකි.

සිතුවේය. ඊළඟට ඔහුට දක්නට ලැබුණේ ඇය ඉතා සැහැල්ලුවෙන් ඇගේ පරිවාරකයින් සමඟ කථා කරමින් සිටින බවයි. ඔවුන්ගේ උල් දත් පිටතට ඒම සමඟ පිඟීම ඔවුන්ගේ සිනාව නිසා සිදුවන්නක් බව ලියෝට අවබෝධ විය.

''ලියෝ!'' හේසාල් ඔහු දෙසට පැමිණියාය. ''මෙතන හරි පුදුමයි නේද?''

ඔවූහු ගැටියේ තනි වූහ. ඇප්රොස් සැබැවින්ම ඔවුන්ව විශ්වාස කළේය. නරාශ්වයා සහ කිඳුරන් ෆ්‍රැන්ක්ව රැගෙන ඒමට ගිය අතරේ, ලියෝ සහ හේසාල් කන්දට ඉහළින් පාවෙමින් දියයට කඳවුර නැරඹූහ.

කිඳුරන් තමාව ප්‍රබෝධමත් කළේ කෙසේ දැයි හේසාල් ඔහුට පැවසුවාය. ඇප්රොස් සහ බයිතොස් ඇගේ කතාවෙන් වශීකෘත වූ අතර, ඔවුන්ට මින් පෙර කෙදිනකවත් ප්ලුටෝගේ දරුවකු හමු වී නොතිබිණි. ඊටත් වඩා, ඔවූහු ඒරියන් අශ්වයා ගැන බොහෝ පුරාවෘත්ත අසා තිබුණහ. හේසාල් ඔහුට පිහිට වී තිබුණ බව ඇසීම ඔවුන්ගේ පුදුමයට හේතු විය.

ඒරියන් සමඟ නැවත පැමිණෙන බවට හේසාල් පොරොන්දු වී තිබුණාය. කිඳුරන් විසින් ජල අපාරගම්‍ය තීන්ත වලින් ඔවුන්ගේ දුරකථන අංක හේසාල්ගේ අතේ සටහන් කළ බැවින් ඇයට එය මතකයේ තබාගත හැකි වනු ඇත. අත්ලාන්තික් සයුර මැද, කිඳුරන්ට ජංගම දුරකථන සංඥා ලැබෙන්නේ කෙසේද කියාවත් ලියෝට අසන්නට වුවමනාවක් නොතිබිණි.

හේසාල් කතා කරද්දී, ඇගේ කෙස් වැටිය වළාකුලක් මෙන් ඇගේ වත මත වැටුණේ දුඹුරු පෘථිවිය, රන් දූවිල්ලෙන් වැසී යන්නාක් මෙනි.

''අපිට කතාවට එන්න බැරි වුණා.'' ලියෝ පැවසුවේය. ඔහු මාතෘකාවට පැමිණීමට කැමැත්තක් නොදැක් වූ නමුත්, මේ ඔවුන්ට තනිව සිටීමට ලැබෙන එකම අවස්ථාව බව ඔහු දැන සිටියේය. ''මම කිව්වෙ සැමී ගැන.''

ඇගේ සිනාව වියැකී ගියේය. ''මම දන්නවා... මට ඒක වියැකෙන්න හරින්න තව කාලයක් අවශ්‍යයි. ඒක හරි අමුතුයි හිතනකොට, ඔයයි එයයි...''

ඇයට සිතිවිල්ල නිම කිරීමට අවශ්‍ය නොවීය. එය කොතරම් අමුතුදැයි ලියෝ දැන සිටියේය.

''මම හිතන්නේ නෑ මට මේක ෆ්‍රෑන්ක්ට පැහැදිලි කරන්න පුළුවන් වෙයි කියලා.'' ඇය පැවසුවාය. ''ඔයයි මමයි අත් අල්ලාගෙන හිටපු එක ගැන.''

ඇයට ලියෝගේ දෑස් දෙස බැලීමට නොහැකි විය. පහළ නිම්නයේ එකැස් යෝධයෝ ඔල්වරසන් නගණු ඇසිණි. දේවස්ථානයේ වහලය නියමාකාරයෙන් පිහිටුවීමට ඔවූහු සමත් වී සිටියහ.

''මම එයාට කතා කළා.'' ලියෝ පැවසුවේය. ''මම එයාට කිව්වා ඔය දෙන්න අතරෙ ප්‍රශ්නයක් හදන්න මම උත්සාහ කළේ නෑ කියලා.''

''ආහ්. හොඳයි.''

ඇගේ හඬේ ඇත්තේ කලකිරීමක්ද? ලියෝට නිසැකවම පැවසීමට නොහැකි විය. එසේම ඔහුට එය දැන ගැනීමට අවශ්‍යද යන්න ගැනත් ඔහුට නිසැකව පැවසීමට නොහැකි විය. ''ෆ්‍රෑන්ක්, හ්ම්, මම ගින්දර කැඳවද්දී එයා ටිකක් පුදුම වුණා වගේ පෙනුණා.'' ලියෝ ගුහාවේදී සිදු වූ දේ පැහැදිලි කළේය.

හේසාල් ගල් ගැසුණු බව පෙනිණි. ''ආහ්, නෑ, ඒකෙන් එයාව බය වෙන්න ඇති.''

සාක්කුව තුළ වූ යමක් සොයන්නාක් මෙන් ඇගේ අත ඩෙනිම් ජැකට්ටුව තුළට ගියේය. ඇය නිතරම එවැනි ජැකට්ටුවක් හෝ එවැනි ආකාරයේ උඩින් අඳින කමිසයක් ඇන්දාය. උණුසුම් තැනකදී වුවත් ඇයගේ පුරුද්ද වෙනස් නොවීය. ලියෝ සිතුවේ එය අවිනීතකමක් ලෙසිණි. මක්නිසාද යත් ඒවා වඩාත් ගැලපුණේ අසුන් පිට යන්නන් ට හෝ මෝටර් බයිසිකල් පදින අයට බැවිණි. දැන් ඔහු පුදුමයට පත්වී සිටී.

ඔහුගේ මොළය වේගයෙන් ක්‍රියා කළේය. තම දුර්වලතා ගැන ෆ්‍රෑන්ක් පැවසූ දේ ඔහුගේ මතකයට නැගිණි... *ලී කෑල්ලක්.* මේ කොල්ලා ගින්දරට බියක් දක්වන්නෙ ඇයි ද යන්න ගැන ඔහු සිතුවේය. ඇයි හේසාල් මේ හැඟීම් ගැන එච්චර එකඟ වෙන්නෙ. ලියෝ, අර්ධ ලෝහිත කඳවුරේදී තමාට අසන්නට ලැබුණු සමහර කතා ගැන සිතුවේය. ප්‍රත්‍යක්ෂ හේතු නිසා, ඔහු ගින්දර ගැන වූ පුරාවෘත්ත කෙරෙහි අවධානයෙන් පසුවිය. දැන් ඔහුට, ඔහු මාස ගණනකින් සිතා නොසිටි දෙයක් මතකයට නංවා ගැනීමට හැකි විය.

''එක් වීරයෙක් ගැන පරණ පුරාවෘත්තයක්.'' ඔහු මතක් කළේය.

''එයාගෙ ජීවන ගමන ගින්දර එක්ක බැඳිලා තිබුණා. ඒ වගේම ඒ දර කැල්ල දැවුණාම...''

හේසාල්ගේ ඉරියව් අඳුරු විය. තමා සත්‍යයට පහර දුන් බව ලියෝ දැනගත්තේය.

''ෆ්‍රැන්ක්ට තියෙන්නෙත් ඒ ප්‍රශ්නය.'' ඔහු අනුමාන කළේය. ''ඒ වගේම දර කැබැල්ල...'' ඔහු හේසාල්ගේ ජැකට්ටුව පෙන්වීය. ''එයා ආරක්ෂාවට ඒක ඔයාට දුන්න?''

''ලියෝ, කරුණාකරලා එපා... මට ඒ ගැන කතා කරන්න බැහැ.''

ලියෝගේ සහජ බුද්ධිය අවදි විය. දැවවල ගුණ සහ ලවණ ජලයේ විබාදක ගුණ ගැන ඔහු සිතන්නට පටන් ගත්තේය. ''මේ වගේ සාගරයකදී දරවලට ප්‍රශ්නයක් වෙන්නෙ නැද්ද? ඔයා වටා තියෙන වාත ස්ථරය ඒක ආරක්ෂා කරනවද?''

''ඒක හොඳින්.'' හේසාල් පැවසුවාය. ''දර කැල්ල තෙමිලවත් නැහැ. අනෙක් අතට, ඒක රෙදි සහ ප්ලාස්ටික් තට්ටු අධ්‍යයනයඔතල තියෙන්නෙ.'' ඇය ඉච්ඡා භංගත්වයෙන් තොල සපා ගත්තාය. ''ඒ වගේම මම ඒ ගැන කතා කරන්න කැමති නැහැ.''

ලියෝ කාරණේ මේකයි. ෆ්‍රැන්ක් ඔයාට බයවුණා වගේ පෙනුණා නම්, එහෙම නැත්නම් අපහසුවෙන් හිටියානම්, ඔයා ඒක තේරුම් ගන්න ඕනෙ.''

ලියෝ, ෆ්‍රැන්ක්ගේ තැන සිට කල්පනා කර බැලුවේය. ඔහුගේ ජීවිතය බෙහෙවින් දුර්වල එකකි. ඕනෑම මොහොතක දැවී යා හැක්කකි. තවත් පුද්ගලයකු අතට තම ජීවන රේඛාව- ඔහුගේ මුළු ඉරණමම- පත් කිරීමට කෙතරම් විශ්වාසයක් තිබිය යුතුදැයි ඔහු සිතුවේය.

නිසැකවම ෆ්‍රැන්ක් හේසාල්ව තෝරාගෙන තිබිණි. එබැවින් ඔහු, ලියෝ- තම කැමැත්තට ගින්දර කැඳවන- තම පෙම්වතිය දෙසට හැරෙනු දකින විට...

ලියෝ වෙව්ලා ගියේය. ෆ්‍රැන්ක් ඔහුට අකැමැති වීම පුදුමයක් නොවීය. එසේම එක්විටම විවිධ සතුන් බවට පත්වීමේ ෆ්‍රැන්ක් තුළ වූ හැකියාව එතරම් භයානක බව නොපෙනුණි.

සත් දෙනාගේ අනාවැකියේ අඩුම කැමැත්තක් තිබූ වැකිය ගැන ලියෝ සිතුවේය. කුණාටුවට හෝ ගින්නට ලෝකය ඇද වැටිය

යුතුය. දීර්ඝ කාලයක්, ඔහු සිතා සිටියේ කුණාටුව සඳහා සිටින්නේ ජේසන් හෝ පර්සි යැයි කියාය. සමහරවිට දෙදෙනාම එක්ව විය හැකිය. ගින්දර භාදයා වූයේ ලියෝය. කිසිවකු එසේ නොකීවත්, එය හොඳින් පැහැදිලි වුවකි. ලියෝ අව්‍යවස්ථික කෑඩ්වලින් එකක් විය. ඔහු වැරදි දෙයක් කළේ නම්, ලෝකය කඩා වැටෙනු ඇත. නැත... එය කඩා වැටිය යුතුය. ෆ්‍රෑන්ක් සහ ඔහුගේ දර කැබැල්ල එහිදී යමක් කරන්නෙදැයි ලියෝ පුදුමයට පත් විය. ලියෝ දැනටමත් යම් වීර කාව්‍යයක වරදක් සිදුකොට තිබේ. එයින් ඔහුට ෆ්‍රෑන්ක් ෂැන්ග්ව පහසුවෙන්ම ගින්නට යවන්නට හැකි වනු ඇත.

''ඔයාල මෙතන.'' බයිතොස්ගේ හඬින් ලියෝ ප්‍රකෘති සිහියට එළැඹිණි.

ෆ්‍රෑන්ක්ව මැදි කරගෙන බයිතොස් හා ඇප්රොස් පාවී ආවෝය. ෆ්‍රෑන්ක් මලානික වුවත් හොඳින් සිටින බව පෙනිණි. ෆ්‍රෑන්ක් හේසාල් සහ ලියෝව ප්‍රවේසමෙන් අධ්‍යයනය කළේ ඔවුන් දෙදෙනා කුමක් ගැන කතා කරමින් සිටියාද යන්න කියැවීමට උත්සාහ කරන්නාක් මෙනි.

''ඔයාල නිදහස්, යන්න පුළුවන්.'' බයිතොස් පැවසුවේය. ඔහු තම සෑදල බෑගය විවර කර ඔවුන්ට අයත් ආම්පන්න යළි දුන්නේය. තම උපකරණ පටිය ඉන වටා පැළඳීමෙන් ලියෝ කිසිදාක මෙතරම් සතුටක් ලබා නොතිබිණි.

''පර්සි ජැක්සන්ට කරදර වෙන්න එපා කියන්න.'' ඇප්රොස් පැවසුවේය. ''ඇට්ලැන්ටාවල හිරකරගෙන ඉන්න මුහුදු සත්ත්වයො ගැන ඔයාලගෙ කතාව අපට තේරුණා. කේටෝවයි, පෝසයිස්වයි නවත්වන්න ඕනෑ. අපි එයාලව පරද්දන්න කිඳුරු වීරයන්ව යවන්නම්. එයාලගෙ හිරකාරයන්ව නිදහස් කර ගන්නම්. සමහරවිට සයිරස්වත්?''

''එහෙම නැත්නම් බිල්ව.'' බයිතොස් පැවසුවේය.

''ඔව්, බිල් නියමෙට ගැලපෙයි.'' ඇප්රොස් එකඟ විය. ''කොයි පැත්තෙන් බැලුවත්, පර්සි මේක අපේ අවධානයට ලක් කළ එක ගැන අපි සතුටු වෙනවා.''

''ඔයාලා එයාට පෞද්ගලිකව කතා කළ යුතුයි.'' ලියෝ යෝජනා කළේය. ''මම කිව්වෙ පොසිඩන්ගෙ පුතා එක්ක.''

මත්ස්‍ය- අශ්වයින් දෙදෙනාම හිස් සැලූහ. ''සමහරවිට පොසිඩන්ගෙ පැටව් ගාව නොගන්න එක හොඳයි.'' ඇප්රොස්

පැවසුවේය. ''අපි මුහුදු දෙවියන් සමග මිත්‍රශීලියි, ඇත්තටම, ඒත් මුහුද යට දේශපාලනය අපිරිසිදුයි... සංකීර්ණයි. ඒ වගේම අපිට අපේ නිදහස වටිනවා. එහෙම වුණත් පර්සිට ස්තුතියි කිව්ව කියන්න. කේටෝගෙ රාක්ෂයන්ගෙන් ඉදිරියට බාධාවක් නොවී ඔයාලට අත්ලාන්තික් තරණය කරන්න අපි අපිට පුළුවන් දේ කරන්නම්. ඒත් අපි අනතුරු අඟවනවා පැරණි මුහුදෙදී, මාරි නොස්ට්‍රම්වලදි වඩාත් අනතුරු බලාපොරොත්තු වෙන්න.''

ෆ්‍රැන්ක් සුසුම් හෙලුවේය. ''ස්වභාවිකවම.''

බයිතොස් ෆ්‍රැන්ක්ගේ උරහිසට තට්ටුවක් දැමුවේය. ''ඔයා හොඳින් ඉඳියි. ෆ්‍රැන්ක් ෂැන්ග් දිගටම මේ මුහුදු ජීවී පරිවර්තන පුහුණු කරන්න. කෝයි මාළුවා හොඳයි, ඒත් පෘතුග්‍රීසි මෑන් ඔෆ් වෝ වෙන්න උත්සාහ කරන්න. මම ඔයාට පෙන්නපු දේ මතක තියා ගන්න. ඒ හැම දෙයක්ම හුස්ම ගැනීමෙන්.''

ෆ්‍රැන්ක් සතුටට පත් වූ බව පෙනිණි. සිනා නොවීමට උත්සාහ කරමින් ලියෝ තොල සපා ගත්තේය.

''ඒ වගේම හේසාල්, ඔයා.'' ඇප්රොස් පැවසුවේය. ''ආයෙ මෙහෙ එන්න. ඔයාගෙ අශ්වයාවත් අරන් එන්න. මම දන්නවා ඔයා ඔයාට අහිමි වූ කාලය ගැන හිතනවා කියලා. අපේ රාජධානියෙ රැයක් ගත කරන්න. ඔයා ඔයාගෙ සහෝදරයා නිකෝ ගැන කරදර වෙනවා...''

හේසාල් ඇගේ සන්නද්ධ බලකා අසිපත මිරිකා ගත්තාය. ''ඔහු- ඔයාල දන්නවද එයා කොහෙද කියල?''

ඇප්රොස් හිස සැලුවේය. ''හරියටම නෙමෙයි. ඒත් ඔයාල කිට්ටුවට ගියාම, ඔයාට එයා ඉන්න හැඟීම දැනෙයි. කිසිවිටෙක බයවෙන්න එපා! ඔයාල එයාව බේරගන්නවා නම්, අනිද්දට රෝමයට යා යුතුයි, ඒත් තව කාලය තියෙනවා. ඔයාල එයාව බේරගත යුතුයි.''

''ඔව්.'' බයිතොස් එකඟ විය. ''ඔයාලගෙ ගමනට එයාව වටිනවා. ඒ කොහොමද කියන්න මට තේරෙන්න නෑහැ. ඒත් ඒක සැබෑවක් බව මට දැනෙනවා.''

ඇප්රොස් ලියෝගේ උරහිස මත අත තැබුවේය. ''ඔයාට මේ කියන්නෙ, ලියෝ වැල්ඩේස්, ඔයාල රෝමයට ළඟා වුණාම හේසාල්ට සහ ෆ්‍රැන්ක්ට සමීපව ඉන්න. මට දැනෙනවා එයාලට මුහුණ දෙන්න වෙන්නෙ... ආහ්, ඔයාට විතරක් පරාජය කරන්න පුළුවන් යාන්ත්‍රික අසීරුතාවලට.''

''යාන්ත්‍රික අසීරුතා?'' ලියෝ විමසුවේය.

එය සතුටුදායක පුවතක් වූ ලෙසින් ඇප්රොස් සිනාසුණේය. ''ඒ වගේම ඔයා වෙනුවෙන් මා ළඟ තෑග්ගක් තියෙනවා, ආගෝ II හි නිර්භීත යාන්ත්‍රිකයා වෙනුවෙන්.''

''මම කැමතියි මම කපිතාන් කෙනෙක් වගේ හිතන්න,'' ලියෝ පැවසුවේය. ''එහෙම නැත්නම් සුපිරි අණ දෙන්නෙක්.''

''බ්‍රවුනීස්!'' ආඩම්බරයෙන් පැවසූ ඇප්රොස් පැරණි පත්නයේ බඳුනක් ලියෝ අත තැබුවේය. එය වායු බුබුළු වලින් වට වී තිබිණි. ''මේ භාජනයෙන් ඔයාට වට්ටෝරුවත් හොයාගන්න පුළුවන් වෙයි. ඕනෙවට වැඩිය බටර් දාන්න එපා! ඒක උපක්‍රමයක්. ඒ වගේම මම තිබේරිනස්ට හඳුන්වාදීමේ ලිපියක් දෙන්නම්. ඒ තමයි ටයිබර් ගංගාවේ දෙවියා. ඔයාල රෝමයට ළඟා වුණාම, ඔයාලගෙ මිත්‍ර ඇතීනාගේ දියණියට මේක ඕනෙ වෙයි.''

''ඇනබෙත්ට...'' ලියෝ පැවසුවේය. ''හරි. ඒත් ඇයි?''

බයිතොස් සිනාසුණේය. ''එයා ඇතීනාගේ සලකුණ පස්සෙ යවනවා නේද? තිබේරිනස්ට පුළුවන් ඇයගෙ ගවේෂණයට මඟ පෙන්වන්න. එයා නම්ම ගන්න අමාරු පැරණි, ආඩම්බරකාර දෙවියෙක්. ඒත් රෝම ආත්මවලට හඳුන්වාදීමේ ලිපි තමයි හැමදෙයක්ම. මේකෙන් ඇයට උදව් කරන්න ඕනෙ කියලා තිබේරිනස් ඒත්තු ගනී. බලාපොරොත්තු වෙන විදිහටම,'' ලියෝ එය පුනරුච්ජාරණය කළේය.

බයිතොස් තම සෑදල බෑගයෙන් රෝස පැහැති කුඩා මුතු ඇට තුනක් නිපද වූයේය. ''ඒ වගේම දැන්, ඔයාලගෙන් සමුගන්නවා. උප දෙවිවරුනි! හොඳ ගමනක්!''

ඔහු මුතු ඇට තුන, තිදෙනා වෙත විසි කළහ. ඔවුන් වටා රෝස පැහැති බුබුළක් බැගින් නිර්මාණය විය.

ඔවුහු ජලයෙන් ඉහළට එසවෙන්නට පටන් ගත්හ. ලියෝට සිතන්නට කාලය ඉතිරි විය. හැම්ස්ටන් බෝල සෝපානයක්ද? ඉන්පසු ඔහු ඈත ඉහළින් දිස්වන හිරු දෙසට වේගයෙන් ඇදී ගියේය.

# 25
# පිපර්

**පිපර්ට නිරර්ථක හැඟීම් දනෙන වාර ගණන ලෙස ලයිස්තුවේ** ඉහළම දහය අතරට ඇය නව ප්‍රවේශනයක් ඇතුළු කළාය.

ශ්‍රීම්ප්සිලා සමඟ කිණිස්සකින් සටන් කිරීම සහ ලස්සන හඬ? එතරම් ඵලදායක නොවීය. ඉන්පසු රාක්ෂයා ගැඹුරු මුහුදේ ගිලී ගියේ, ඇගේ මිතුරන් තිදෙනෙක් ද අතුරුදහන් කරමිනි. එසේම ඔවුන්ට පිහිට වීමට නොහැකි තරමට ඇගේ බලය හීන වී තිබිණි.

ඉන්පසුව ඇනබෙත්, කෝච් හෙජ් සහ බියුෆෝඩ් මේසය අබලන් වූ කොටස් ඉක්මනින් පිළිසකර කළ නිසා නෞකාව ගිලීයාම වළක්වා ගැනීමට හැකිවිය. වෙහෙස නොතකමින් පර්සි, සාගරය සිසාරා ඔවුන්ගේ නැති වූ මිතුරන් සෙවීමේ නිරතුව සිටියේය. ජේසන් ද එතරම්ම වෙහෙසට පත්ව සිටියත්, ඔහු පීපර් පෑන් සේ රුවල් වටා පියාසර කරමින් ප්‍රධාන කුඹයට ඉහළින් දෙවැනි පිපිරුමක්ද ඇති කර අහස් කුස ආලෝකමත් කළේය.

පිපර්ට කළ හැකි වූයේ, ඇගේ කැටොප්ට්‍රිස් පිහිය දෙස බලාගෙන ලියෝ, හේසාල් සහ ෆ්‍රෑන්ක් සිටින තැන සොයා ගැනීමට උත්සාහ කිරීම පමණකි. ඇයට දකගත හැකි එකම රූප වූයේද ඇයට දකීමට අවශ්‍ය නොවූ ඒවාමය. කළු පැහැති SUV තුනක් චාල්ස්ටන්වල සිට ධාවනය වෙමින් තිබුණේ රෝම උපදෙවිවරු පිරිසක්ද සමඟය. මුළින්ම ගමන් කළ රථය පදවන ලද්දේ රෙයිනා විසිනි. ඉහළින් පියාසර කළ යෝධ රාජාලියෝ ඔවුන්ට අරක්ෂාව

සැපයූහ. නිරන්තරයෙන්ම භූත අශ්වරථවල දම් පැහැයෙන් දිලිසෙන ආත්ම රට ඇතුළෙන් දර්ශනය වී ඔවුන්ට පිටුපසින් ඇද වැටිණි. I- 95 ගිගුම් දෙමින් නිව්යෝක් හා අර්ධ ලෝහිත කඳවුර දෙසට ගමන් ගත්හ.

පිපර් තදින් සිත එකඟ කළාය. ඇය මීට පෙර දැක තිබූ බියකරු සිහින, සිතුවම් ලෙසින් ඇයට දැක ගැනීමට ලැබිණි. මිනිස් හිසක් සහිත ගවයෙක් ජලයෙන් නික්මීම, ඉන්පසු අඳුරු ළිඳක හැඩයේ කාමරය එහි වූ කළු පැහැති ජලයේ ඇයත්, ජේසන් සහ පර්සිත් නොගිලී සිටීමට දරණ උත්සාහය ඇයට දැකගත හැකිවිය.

කැටොප්ට්‍රිස් කිණිස්ස නැවත කොපුවට දමා ගනිමින් ඇය කල්පනා කළේ ට්‍රෝජන යුද්ධයේදී ට්‍රෝයි හි හෙලන්ට තිබූ එකම ප්‍රවෘත්ති මූලාශ්‍රය මේ කිණිස්ස පමණක් නම් ඇය හොඳ සිහියෙන් සිටියේ කෙසේද කියාය. හෙලන් වටා සිටි සියලු දෙනාම ආක්‍රමණික ග්‍රීක හමුදාව විසින්  සමූල ඝාතනය කළ බව එවිට ඇයට සිහිපත් විය. සමහරවිට ඇය හොඳ සිහියෙන් නොසිටින්නට ඇත.

හිරු නැග එන විට, ඔවූහු කිසිවකුත් නින්දක් ලැබ නොසිටියහ. පර්සි මුහුදු පත්ල පුරා සැරිසැරුවත් කිසිවක් හමු නොවීය. ආගෝ II ට තවදුරටත් ගිලී යාමේ අවදානමක් නොතිබිණි. එහෙත් ලියෝ නොමැතිව එය සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීමට නොහැකි වී තිබිණි. නෞකාව යාත්‍රා කිරීමට හැකි තත්ත්වයේ පැවතුණත්, තම අතුරුදහන් වූ මිතුරන් නොමැතිව එම ප්‍රදේශයෙන් පිටවීමට කිසිවකු යෝජනා නොකළහ.

පිපර් සහ ඇනබෙත් අර්ධ ලෝහිත කඳවුරට සිහින දර්ශනයක් යවමින් චිරොන්ට අනතුරු ඇඟවූහ. සම්ටර් කොටුවේදී රෝමවරුන් සමඟ සිදු වූ දෑ ඔවූහු චිරොන්ට පවසා සිටියහ. රෙයිනා සමඟ සිදු වූ වචන හුවමාරුව ඇනබෙත් පැහැදිලි කළාය. උතුරු දෙසට යන SUV වාහන පිළිබඳ තම කිනිසි තලයෙන් දුටු දර්ශන පිපර් විස්තර කළාය. ඔවුන්ගේ සංවාදය අතර අවුරුදු තිහක පමණ පෙනුමින් යුත් කාරුණික නරාශ්වයා කඳවුරේ ආරක්ෂාව තමාට බලාගත හැකි බව පැවසුවේය. ටයිසන්, ඕ' ලෙරි මහත්මිය සහ එලා ආරක්ෂිතව පැමිණ තිබිණි. අවශ්‍ය වුවහොත්, ටයිසන්ට කඳවුරේ ආරක්ෂාව සඳහා එකැස් යෝධයන්ගේ හමුදාවක්  කැඳවීමේ හැකියාව තිබිණි. එසේම එලා සහ රේචල් ඩාරේ දැනටමත් අනාවැකි සසඳමින්, අනාගතයේ කුමක් සිදුවන්නේද යන්න දැනගැනීමට උත්සාහ දරමින් සිටියහ. ආගෝ II මත සිටින උප

දෙවිවරුන් සත් දෙනාගේ කාර්යය ගවේෂණය නිමාකර ආරක්ෂිතව ආපසු පැමිණීම බව චිරොන් ඔවුන්ට සිහිපත් කළේය.

අයිරිස් පණිවුඩයෙන් පසු ජලය දෙස බලමින් උප දෙවිවරු නැව් තට්ටුව මත නිහඬව පියවර තැබුවේ ප්‍රාතිහාර්යයක් බලාපොරොත්තුවෙනි.

අවසානයේ එය පැමිණෙන විට- ජලයෙන් මතු වූ රෝස පැහැති යෝධ දිය බුබුළු තුනකින් විදිනු ලැබූ හේසාල්, ලියෝ සහ ෆ්‍රෑන්ක් ජලය මත පතිත වන විට- පිපර් තරමක් කලබල වූවාය. සැනසීමට පත් හැඬීමක් සමඟ ඇය කෙළින්ම ජලයට පැන්නාය.

ඇය කුමක් සිතමින් සිටියේද? ඇය කඹයක් හෝ ජීවිතාරක්‍ෂක කබායක් හෝ කිසිවක් රැගෙන ගියේ නැත. එහෙත් මේ මොහොතේදී සතුට වලක්වාගත නොහැකි වූ ඇය ලියෝ වෙත පිහිනා ගොස් ඔහුගේ කම්මුල් සිපගත්තේ, ඔහුව පුදුමයට පත් කරමිනි.

''මාව නැතිවුණාද?'' ලියෝ සිනාසුණේය.

පිපර් එක්විටම රෞද්‍ර වූවාය. ''ඔයා කොහෙද හිටියේ? කොහොමද ඔයාගෙ පණ බේරුණේ?''

''දිග කතාවක්,'' ඔහු පැවසුවේය. විනෝද සවාරි භාජනය ඔහු අසල දිය මතුපිට පාවෙමින් තිබුණේය. ''බ්‍රවුනීස් ඕනෙද?''

ඔවුන් නැවට ගොඩ වී තෙත ඇඳුම් මාරු කරගත් පසු, (අසරණ ෆ්‍රෑන්ක්ට ජේසන්ගෙන් ප්‍රමාණයෙන් කුඩා කලිසම් දෙකක් ඉල්ලා ගැනීමට සිදු විය.) සියල්ලෝම අනුස්මරණීය උදෑසන ආහාරය සඳහා රැස්වූහ. කෑමට සුදුසු වටපිටාවක් නොමැතිබව පවසමින් කෝච් හෙජ් පමණක් නැව් බඳේ පහළ පිළිසකර කිරීමට ගියේය. ලියෝ තම සුක්කානම් පාලකය පණ ගන්වන අතරතුර හේසාල් සහ ෆ්‍රෑන්ක් මාරුවෙන් මාරුවට මත්ස්‍ය අශ්වයින්ගේ සහ ඔවුන්ගේ පුහුණු කඳවුරේ කතාව පැවසූහ. ''අදහගන්නත් බෑ.'' ජේසන් පැවසුවේය. ''මේවා ඇත්තටම අනර්ඝ බ්‍රවුනීස්.''

''ඔයාට කියන්න තියෙන්නෙ එච්චරද?'' පිපර් පැවසුවාය. ඔහු පුදුමයෙන් බැලුවේය. ''මොකක්? මම කතාව ඇහුවා. මත්ස්‍ය අශ්වයෝ. කිඳුරු මිනිස්සු. ටයිබර් ගඟේ දෙවියන්ට හඳුන්වාදීමේ ලිපියක්. ඒවා මතකයි. ඒත් මේ බ්‍රවුනීස්.''

''මම දන්නවා,'' කට පුරවාගෙන ෆ්‍රෑන්ක් පැවසුවේය. පර්සිගේ පැත්තෙන්, ඔහුට ජලජ කඳවුර ගැන සෑම විස්තරයක්ම ඇසීමට

වුවමනා විය. ඔහු නැවත එක් වැදගත් තැනකට පැමිණියේය. ''එයාලට මාව හමුවෙන්න ඕනෙ වුණේ නැද්ද?

''ඒක එහෙමම නෙමෙයි.'' හේසාල් පැවසුවාය. ''නිකම් මේ දියයට දේශපාලනය, මම හිතන්නෙ. කිඳුරු මිනිස්සු භෞමිකයි. හොඳ ප්‍රවෘත්තිය තමයි එයාල ඇට්ලැන්ටාවල මින්මැදුර ගැන බලාගන්නනම් කියපු එක. ඒ වගේම අපි අත්ලාන්තික් හරහා යනකම් එයාල අපිට උදව් කරයි.''

පර්සි නිහඬව හිස සැලුවේය. ''ඒත් එයාලට මාව හමුවෙන්න ඕනෙ වුණේ නෑ?''

ඇනබෙත් ඔහුගේ අත අල්ලා ගත්තාය. ''අයියෝ... පාසි මොළයෝ! අපිට කරදර වෙන්න තව ඕනෑතරම් දේවල් තියෙනවා.''

''ඇය නිවැරදියි,'' හේසාල් පැවසුවාය. ''අදින් පස්සෙ, නිකෝට තියෙන්නෙ දවස් දෙකකටත් අඩු කාලයක්. මත්ස්‍ය- නරාශ්වයා කිව්වේ අපි එයාව බේරගන්න ඕනෙ කියලයි. කොයි විදිහකින් හරි එයා අපේ ගවේෂණයට අවශ්‍ය කෙනෙක් ලු.''

කවුරුන් හෝ වාදකයට පැටලෙතැයි අපේක්ෂාවෙන් මෙන් ඇය ආරක්ෂිතව වටපිට බැලුවාය. කිසිවකුත් එසේ නොකළහ. නිකෝ ඩි ආන්ජලෝගේ හැඟීම් වටහා ගැනීමට පිපර් උත්සාහ කළාය. දිවි රැක ගැනීමට දෙළුම් ඇට දෙකක් පමණක් ඉතිරිව, භාජනයක සිරවී සිටින ඔහුව බේරා ගැනීමට හැකි වේදැයි ඇය තුළ වූයේ සැකයකි. තමාගෙම සිරකුටියක්- ජලයෙන් පිරුණු අඳුරු කාමරය- දෙසට යාත්‍රා කරනවා වැනි බියකරු හැඟීමක් දනුණත්, පිපර් රෝමයට ළඟාවන තුරු නොඉවසිලිමත් වූවාය.

''නිකෝ ළඟ මරණයේ දොරටු ගැන තොරතුරු ඇති.'' පිපර් පැවසුවාය. ''අපි එයාව බේරගමු, හේසාල්. අපිට හරි වෙලාවටම ඒක කරන්න පුළුවන් නේද ලියෝ?''

''මොකක්?'' ලියෝ පාලන පුවරුවෙන් තම දෑස් ඉවතට ගෙන විමසුවේය. ''ආහ්, ඔව් අපි හෙට උදේ වෙද්දි මධ්‍යධරණී මුහුදට යන්න ඕනේ. ඊට පස්සේ රෝමෙට යන්න මුළු දවසක්ම යයි. එහෙම නැත්නම් පියාසර කරන්න වෙයි. මට ස්ටැබිලයිසරය හදා ගන්න පුළුවන් වුණොත්, එහෙනම්-''

''නිකෝට ඉතිරිවෙලා තියෙන අන්තිම දවසෙදි, රෝමයෙදි අපිට මොනව කඩා පාත්වෙයිද දන්නෙ නැහැ. එයාව හොයා ගන්න උපරිම පැය විසි හතරයි තියෙන්නෙ.'' ජේසන් පැවසුවේය.

පර්සි පාදයක් පිට පාදයක් දමා ගත්තේය. ''ඒක ප්‍රශ්නෙ කොටසක් විතරයි. එතන ඇතීනාගේ සලකුණත් තියෙනවා.''

මාතෘකාව වෙනස්වීම ගැන ඇනබෙත් සතුටු වන බවක් නොපෙනුණි. ඇය තම පිටේ එල්ලා ගත් මල්ලට අත දැමුවාය. චාල්ස්ටන් වලින් පිට වූ තැන් සිට ඇය නිතරම එය තමා අසලම තබා ගත්තාය.

බෑගය විවෘත කළ ඇය, එතුළින් ඩෝනට් එකක විෂ්කම්භයෙන් යුත් ලෝකඩ තැටියක් පිටතට ගත්තාය. ''මේ තමයි මට සම්ටාර් කොටුවෙන් හමුවුණ සිතියම. ඒක...''

එක්විටම තම කතාව නැවැත්වූ ඇය මෘදු ලෝකඩ මතුපිට දෙස බලාගෙන සිටියාය. ''ඒක හිස්!''

එය අතටගත් පර්සි එහි දෙපැත්තම පරීක්ෂා කළේය. ''මේක කලින් මෙහෙම නෙමෙයිද තිබුණේ?''

''නෑ!'' මම ඒක මගෙ කැබින් එකේදී බැලුවා. ඒ වගේම...'' ඇනබෙත් සෙමින් කොඳුරන්නට වූවාය. ''ඒක ඇතීනාගේ සලකුණ වගේ වෙන්න ඕනෙ. මට ඒක පේන්නෙ මම තනියම ඉන්න කොට විතරයි. ඒක අනිත් උපදෙවිවරුන්ට පේන එක එයින්ම වළක්වනවා.''

තැටිය පුපුරා යතැයි බියෙන් මෙන් ෆ්‍රෑන්ක් පසුපසට පැන්නේය. ''ඒකෙ මොනවද තිබුණේ?'' ෆ්‍රෑන්ක් කලබලයෙන් විමසුවේය. ''මොකක්ද ඇතීනාගේ සලකුණ? මට තවම ඒක හිතාගන්න බැහැ.''

ඇනබෙත් පර්සි අත තිබූ තැටිය ගත්තාය. ඇය එය හිරු එළියට හරවා බැලුවත්, එය හිස්ව පැවතියේය. ''සිතියම කියවන්න අමාරුයි, ඒත් ඒකෙ පෙන්නලා තිබුණ රෝමයේ ටයිබර් ගංගාවේ එක තැනක්. මම හිතන්නෙ මගෙ ගවේෂණය පටන් ගන්නෙ එතනින්... සලකුණ හොයාගෙන යන මාර්ගය විදිහට මම සලකන්නෙ එතන.''

''සමහරවිට ඔයාට එතනදී ගංගා දෙවියා ටයිබේරිනස්ව හමුවෙයි'' පිපර් පැවසුවාය. ''ඒත් මොකක්ද සලකුණ?''

''කාසිය.'' ඇනබෙත් මිමිණුවාය.

පර්සි මුහුණ හැකිළුවේය. ''මොන කාසියද?''

ඇනබෙත් තම සාක්කුව අවුස්සා රිදී ඩ්‍රැච්මාවක් පිටතට ගත්තේය. ''මම ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල්වලදී මගේ අම්මව දැක්ක දවසෙ ඉඳන් හැමදාම මේක අරගෙන ගියා. ඒක ඇතීනාගේ කාසියක්.''

ඇය එය වටේට යැවූවාය. සෑම උපදෙවියකුම එය නරඹන අතරතුර, පිපර් සතුව මූලික පාසලේ සංදර්ශනයක අපැහැදිලි මතකයක් තිබිණි.

''බකමූණා'' ලියෝ අවධානය යොමු කළේය. ''හොඳයි, ඒකෙන් අදහසක් ලැබෙනවා. මම හිතනවා අතු කෑල්ල ඔලිව් අත්තක් කියලා? ඒත් මොකක්ද මේ අක්ෂර සටහන, AθE[1] බලපෑම් ප්‍රදේශයද?''

''ඒ ඇල්පා, තීටා, එප්සයිලොන්,'' ඇනබෙත් පැවසුවාය. ''ග්‍රීක් වලින් ඒකෙ අදහස ඇතීනියානුවන්ගේ... කියන එකයි. එහෙම නැත්නම් ඔයාට ඒක ඇතීනාගේ දරුවන් කියල කියන්න පුළුවන්. ඒක ඇතීනියානු ආදර්ශ පාඨයක්.''

''හරියට රෝමවරුන්ට SPQR[2] වගේ,'' පිපර් පැවසුවාය.

ඇනබෙත් හිස සැලුවාය. ''කොහොම වුණත්, ඇතීනාගේ සලකුණ කියන්නෙ බකමූණා, හරියට අරක වගේ. ඒක පෙන්නුම් කරන්නේ ගිනි රතු පාටින්. ඒක මම මගෙ හීනවලදි දැකල තියෙනවා. ඊට පස්සෙ සම්ටර් කොටුවෙදී දෙපාරක්ම.''

බලකොටුවේ සිදුවීම ඇය විස්තර කළාය. ගයියාගේ හඬ, නගරාරක්ෂක කුටියේ මකුළුවන්, සලකුණ දැවී ඔවුන් පළවා හැරීම ගැන ඇය පැවසුවාය. පිපර් පැවසූවේ එය ඇය කියන තරම් පහසු නොවූ බවයි.

පර්සි ඇනබෙත්ගේ අත අල්ලා ගත්තේය. ''මම ඔයා එක්ක එතන ඉන්නයි තිබුණෙ.''

''ඒත් ඒක තමයි කාරණය.'' ඇනබෙත් පැවසුවාය. ''කාටවත් මම වෙනුවෙන් එතන ඉන්න බැහැ. මම රෝමයට ගියාම, මට තනියම වැඩේ කරන්න වෙනවා. එහෙම නොවුණොත් සලකුණ පෙනෙන එකක් නැහැ. මට ඒක අනුගමනය කරල තමයි මූලාශ්‍රය හොයාගන්න වෙන්නෙ.''

---

1 ඇල්ෆා, තීටා, එප්සයිලන්. ග්‍රීසියේදී එයින් ඇතීනා හෝ ඇතීනාගේ දරුවන් නිරූපණය කරයි.

2 Senates Populusque Romanus - රෝමයේ සෙනේටය සහ ජනතාව යන්න නිරූපණය කරයි.

ෆ්‍රෑන්ක් ලියෝ වෙතින් කාසිය ගත්තේය. ඔහු බකමූණු රුව දෙස බලා සිටියේය. *යෝධයන්ගේ නපුර රනින් නැගී සිට වියැකී යයි, වියන ලද සිරගෙයින් වේදනාව සමඟ ජයග්‍රහණය ලබයි.* ''ඔහු ඇනබෙත් දෙස බැලුවේය. ''ඒ මොකක්ද... මේකද මූලාශ්‍රය?''

ඇනබෙත් පිළිතුරු දීමට පෙර ජේසන් හඬ අවදි කළේය.

''ප්‍රතිමාව.'' ඔහු පැවසුවේය. ''ඇතීනාගේ ප්‍රතිමාව. අඩුමගානෙ මගෙ අනුමානය ඒකයි.''

පිපර් මුහුණ හැකිළුවාය. ''ඔයා කිව්වෙ ඔයා දන්නෙ නෑ කියලද?'

''මම දන්නෙ නෑ. ඒත් මම තවත් ඒ ගැන හිතනවා... පුරාවෘත්තයට ගැලපෙන එකම එක පුරාවස්තුවයි තියෙන්නෙ.'' ඔහු ඇනබෙත් දෙසට හැරුණේය. ''මට සමාවෙන්න. ඔයාට මම අහල තියෙන හැමදෙයක්ම කියන්න තිබුණා. ගොඩාක් කළින් ඒත්, සත්තකින්ම මම බයවුණා. මේ පුරාවෘත්තය ඇත්තක් නම්.''

''මම දන්නවා.'' ඇනබෙත් පැවසුවාය. ''මම ඒක විසඳගත්තා, ජේසන් මම ඔයාට දොස් කියන්නෙ නැහැ. ඒත් අපි ප්‍රතිමාව බේරගන්න වැඩ කරනවනම්, ග්‍රීකවරු සහ රෝමවරුන් එකතුවෙලා... ඔයාට පේන්නෙ නැද්ද? ඒකෙන් භේදය සුවපත් කරන්න පුළුවන් වෙයි කියලා.''

''ඔහොම ඉන්න.'' පර්සි පැවසුවේය. ''මොන ප්‍රතිමාවද?''

රිදී කාසිය දෙස බැලූ ඇනබෙත් එය නැවත තම සාක්කුවට දමා ගත්තාය. ''ඇතීනා පාතිනොස්,'' ඇය පැවසුවාය. ''එතෙක් මෙතෙක් වඩාත් ප්‍රකටම ග්‍රීක ප්‍රතිමාව. ඒක අඩි හතළිහක් උසයි. ඇත්දළ සහ රන් වලින් ආලේප කරල තියෙන්නෙ. ඇතන්ස්වල, පාතිනන් වල මැද්දෙ තමයි ඒක පිහිටුවල තියෙන්නෙ.''

නැව් බඳේ වදින රළ වල හඬ හැරුණු විට නෞකාව පුරා වූයේ නිහැඬියාවකි.

''හරි,'' ලියෝ පැවසුවේය. ''ඒකට මොකද වුණේ?''

''ඒක අතුරුදහන් වෙලා.'' ඇනබෙත් පැවසුවාය.

ලියෝ මුහුණ හැකිලුවේය. ''පාතිනන් දෙව් මැදුර මැද තියෙන අඩි හතළිහක ප්‍රතිමාවක් අතුරුදහන් වෙන්නෙ කොහොමද?''

''ඒක හොඳ ප්‍රශ්නයක්.'' ඇනබෙත් පැවසුවාය. ''ඒක ඉතිහාසයේ ලොකුම අබිරහස් වලින් එකක්. සමහර මිනිස්සු හිතන්නෙ ඒකෙ රත්‍රන් ගන්න උණුකළා කියලා. නැත්නම් ආක්‍රමණිකයන් විසින් විනාශ කළා කියලා. කීපවතාවක්ම ඇතන්ස් අල්ල ගත්තා. සමහරු හිතනවා ප්‍රතිමාව බලෙන් අරන් ගිහින් කියලා.''

''රෝමන්වරු.'' ජේසන් ඇගේ වැකිය නිම කළේය. ''අඩුගානෙ ඒක එක සිද්ධාන්තයක්. ඒ වගේම මට අර්ධ ලෝහිත කඳවුරේදී අහන්න ලැබුණු පුරාවෘත්තයට ඒක ගැලපෙනවා. රෝමන්වරු ඇතන්ස් නගරය අල්ල ගත්තම, ග්‍රීකයන්ගේ ආත්මය බිඳ දමන්න, ඇතීනා පාතිනොන් [1]ප්‍රතිමාව පටවගෙන ගියා. එයාල ඒක රෝමයේ භූගත දේවස්ථානයක හැංගුවා. දිවා කාලයේදී ඒක කොහෙත්ම දකගන්න නොලැබෙන බවට රෝම උප දෙවිවරු සපථ කළා. ඇත්තවශයෙන්ම ඔවුන් ඇතීනාව හොරකම් කළා. ඉතිං ඇය තවදුරටත් ග්‍රීක යුද බලයෙ සංකේතය නෙමෙයි. ඇය, වඩාත් හීලෑවුණු, මිනර්වා දෙවඟන බවට පත්වුණා.''

''ඒ වගේම එදා ඉඳන් ඇතීනාගේ දරුවන් ප්‍රතිමාව සොයමින් සිටිනවා.'' ඇනබෙත් පැවසුවාය. 'ගොඩක් අය පුරාවෘත්තය ගැන දන්නෙ නැහැ. ඒත් එක් එක් පරම්පරාවල ටික දෙනෙක්ව දෙවඟන විසින් තෝර ගත්තා. එයාලටත් මට වගේම කාසියක් ලැබුණා. එයාල ඇතීනාගේ සලකුණ අනුගමනය කළා... ඒක එක්තරා ආකාරයකට ප්‍රතිමාවයි, ඔවුනුයි සම්බන්ධ කරන ඉන්ද්‍රජාලික මාවතක් වගේ... එයාල බලාපොරොත්තු වුණා ඇතීනා පාතිනොන් ප්‍රතිමාව තියෙන තැන හොයාගෙන ඒක ආපහු ගේන්න.''

පිපර් තරමක් පුදුමයෙන් ඔවුන් දෙදෙනා- ඇනබෙත් සහ ජේසන්- දෙස බැලුවාය. ඔවුහු කණ්ඩායමක් ලෙස කිසිදු එදිරිවාදී බවක් හෝ දෝෂාරෝපණයක් නොමැතිව කතා කරති. ඔවුන් දෙදෙනා කිසිවිටෙක එකිනෙකා විශ්වාස නොකළහ. ඒ බව දන්නා තරමටම පිපර් ඔවුන් දෙදෙනාටම සමීපව සිටියාය. එහෙත් දැන්... ඔවුන්ට මෙවැනි විශාල ප්‍රශ්නයක් මෙතරම් සන්සුන්ව කතාබහ කළ හැකි නම් ග්‍රීක/රෝම වෛරයේ පරම ප්‍රභවය වූ කඳවුරු දෙකට යම් බලාපොරොත්තුවක් තැබිය හැකි වනු ඇත.

පර්සිගේ ඉරියව් වලින් ඔහුත් ඒ සමාන සිතිවිල්ලක සිටින බව පෙනී ගියේය. ''ඉතිං අපි- මම කියන්නෙ ප්‍රතිමාව හොයාගන්න

1 ඇතීනාගේ යෝධ ප්‍රතිමාවකි. සැමකල්හිම වඩාත් ප්‍රකටම ග්‍රීක ප්‍රතිමාව එය ලෙස සැලකෙයි.

ඕනෙ ඔයා නම්... අපි ඒකත් එක්ක මොනවා කරන්නද? අපිට ඒක හොලවන්නවත් පුළුවන් වෙයිද?''

''මට හරියටම කියන්න බැහැ,'' ඇනබෙත් පැවසුවාය. ''ඒත් අපි මොනයම් විදිහකින් හරි ඒක බේර ගත්තොත්, ඒකට පුළුවන් වෙයි කඳවුරු දෙක එකතු කරන්න. ඒකට පුළුවන්වෙයි මගේ අම්මගේ හිතේ තියෙන වෛරය සුවපත් කරන්න. ඇය වෙන් වෙන්ව හඳුන්වන ආකාර දෙක නවත්වන්න. ඒ වගේම සමහරවිට... සමහරවිට යෝධයන්ට එරෙහිව අපි කරන සටනට උදව් කරන යම් ආකාරයක බලයක් ඒ ප්‍රතිමාවට තියෙන්න පුළුවන්.''

ගෞරවය මුසු බැල්මකින් පිපර් ඇනබෙත් දෙස බැලුවාය. තම මිතුරිය ගෙන ඇත්තේ සුවිශාල වගකීමක් බව ඇය පිළිගැනීමට පටන් ගෙන තිබුණාය. එසේම ඇනබෙත් එය කළ යුත්තේද තනිවමය.

''මේකෙන් හැමදෙයක්ම වෙනස් වෙන්න පුළුවන්.'' පිපර් පැවසුවාය. ''ඒකෙන් අවුරුදු දහස් ගණනක එදිරිවාදිකම අවසන් වෙයි. ඒක ගයියාව පරාජය කිරීමේ යතුර වෙන්න පුළුවන්. ඒත් අපිට ඔයාට උදව් කරන්න බැරි නම්...?''

ඇය අවසන් නොකළාය. එහෙත් ප්‍රශ්නය වායුගෝලයේ රැඳී ඇති බව පෙනී ගියේය. *ප්‍රතිමාව බේරගැනීම කරන්නවත් පුළුවන්ද?*

ඇනබෙත් උරහිස් සැලුවාය. ඇයගේ අභ්‍යන්තරය බියට පත් වී තිබුණත්, ඇය එය සැඟවීමට හොඳ උත්සාහයක් ගන්නා බව පිපර් දැන සිටියාය.

''මට සාර්ථක වෙන්න වෙනවා.'' ඇනබෙත් සරලව පැවසුවාය. ''අවදානම තමයි ඒකට වටිනාකම.''

හේසාල් ඇගේ කෙස්වැටිය රැළි කළාය. ''ඔයා තනියම ඔයාගෙ ජීවිතේ අවදානමේ දාන අදහසට මම කැමති නැහැ. ඒත් ඔයා නිවැරදියි. මේක මෙතෙක් නිර්මාණය කළ වඩාත් ප්‍රබලතම ඇතීනාගේ සංකේතය නම්-''

''ඒක යම් බරපතල කොල්ලකෑමකට ලක් වෙන්න පුළුවන්.'' ලියෝ පැවසුවේය.

හේසාල් මුහුණ හැකිලුවාය. ''මම ඒක දකින්නෙ ඒ විදිහට නෙමෙයි. ඒත් ඔව්.''

''ඒක හැරුණම.'' පර්සි නැවත ඇනබෙත්ගේ අත අල්ලා ගත්තේය. ''ඇතීනාගේ දරුවන් කිසිවකුට මෙතෙක් ඒක හමු වුණේ නෑ. ඇනබෙත්, මොකක්ද එතන තියෙන්නෙ? මොකක්ද ඒක ආරක්ෂා කරන්නේ? ඒක මකුළුවන්ට සම්බන්ධ නම්?''

''වියන ලද සිරගෙයි වේදනාව අතරින් ජය ලැබෙයි.'' ෆ්‍රෑන්ක් නැවත මතකයට නැංවූයේය. ''වියන ලද දැල් වගේද?''

මුද්‍රණ යන්ත්‍රයක කඩදාසියක් තරමට ඇනබෙත්ගේ මුහුණ සුදුමැලි වූවාය. තමා වෙනුවෙන් බලාසිටින්නේ කුමක්ද කියා ඇනබෙත් දන්නා බවට පිපර් සැක කළාය.. අවමවශයෙන් ඇයට ඉතා හොඳ අදහසක්වත් තිබෙනවා විය හැකිය. බිය සඟවා ගැනීමට ඇය උත්සාහ දරමින් සිටියාය.

''අපි රෝමයට ගියාම ගනුදෙනුව කරමු.'' තම මිතුරන්ගේ වියවුල සමනය කරනු වස් යම් තරමක චාටු ස්වරයකින් පිපර් පැවසුවාය.

''ඒක වැඩ කරනවා. ඇනබෙත් බරපතල මංකොල්ලයක් නවත්තන්නයි යන්නෙ. ඔයාලට බලාගන්න ලැබෙයි.''

''ඔව්,'' පර්සි පැවසුවේය. ''මම බොහොම කාලෙකට කලින් ඉගෙන ගත්ත දෙයක් තමයි, ඇනබෙත්ට එරෙහිව කවදාවත් ඔට්ටු අල්ලන්න එපා කියන එක.''

ඇනබෙත් සතුටු සිනාවකින් ඔවුන් දෙදෙනා දෙස බැලුවාය.

අඩක් අහවර කළ උදෑසන ආහාර වේල් දෙස බැලූ විට අනෙක් අය තවමත් අපහසු හැඟීමකින් සිටින බව පෙනිණි. එහෙත් සියල්ලෝම සලිත කරවමින් ඒ හැඟීමෙන් මුදවාලීමට ලියෝ සමත් විය. හඬක් සමඟ විශාල වාෂ්ප දහරාවක් නිකුත් විය. එයින් සියල්ලෝම උඩ ගොස් බිම වැටුණාහ.

''හොඳයි!'' ඔහු පැවසුවේය. ''හොඳ උනන්දුව ඇත්තටම, ඒත් අපි මධ්‍යධරණීයට යන්න කලින් නැවේ හදාගන්න ඕනෙ දේවල් ටොන් ගාණක් තියෙනවා. කරුණාකරලා ඔයාලගේ උත්තරීතර ගෙදර වැඩ ලැයිස්තුව ලබාගන්න, උත්තරීතර අණදෙන නිලධාරී ලියෝ වෙත වාර්තා කරන්න.''

* * *

පිපර්ට සහ ජේසන්ට පැවරුණේ නැවේ පහළ තට්ටුව පිරිසිදු කිරීමටය. රාක්ෂයාගේ ප්‍රහාරය අතරේ එය අවුල් ජාලාවක් බවට පත්ව තිබිණි. ආරෝග්‍යශාලාව යථාත්ත්වයට පත් කිරීමටත්, ගබඩා ප්‍රදේශය කලම්ප ගසා සැකසීමටත් ඔවුන්ට දවසේ වැඩි කාලයක් වැය විය. එහෙත් පිපර් ඒ ගැන නොතැකුවාය. එයට එක් කාරණයක් වූයේ ඉන් ඇයට ජේසන් සමඟ වැඩි කාලයක් ගත කිරීමට අවකාශ ලැබීමයි. අනෙක් කරුණ වූයේ පෙරදින රැයේ වූ පිපිරුම් වලින් ඇයට ග්‍රීක ගින්න ගැන ගෞරවණීය බවක් ඇති වී තිබීමයි. ඒ ආකාරයේ කිසිදු බුරුල් වූ කුප්පියක් මැදියම් රැයේදී කොරිඩෝරය දිගේ පෙරළී එනු දකීමට ඇය කැමති නොවූවාය.

ඔවුන් ඉස්තාලය පිළිසකර කරන විට, ඇනබෙත් සහ පර්සි රැයක් මෙහි ගත කළ අයුරු ඇයට සිහිපත් විය. තමාටත් ජේසන් සමඟ මුළු රැය පුරා කතා කරමින් සිටින්නට හැකි වූවා නම් යැයි ඇයට සිතිණි. ඉස්තාල පොළොවේ පෙරළෙමින් ඔහු සමඟ විනෝද වීමට තිබිණි. ඇයි එයාලා නීති කැඩුවේ නැත්තේ?''

එහෙත් ජේසන් එයට කැමති වූයේ නැත. නායකයකු ලෙස ඔහු අචල පුද්ගලයකු වූ අතර ඒ සඳහා හොඳ ආදර්ශයක් ද විය. සාමාන්‍යයෙන් නීති කැඩීම ඔහු අතින් සිදුවන්නක් නොවේ.

රෙයිනා ඔහුව අගය කිරීමේ කිසිදු සැකයක් නොතිබිණි. පිපර් ද එය කළාය... *ඊටත් වැඩියෙන්.*

එක් වතාවක් වයිල්ඩර්නස් පාසලේදී ඇය ඔහුව කැරලිකාර වැඩකට පෙළඹවූවාය. උල්කාපාත වර්ෂාවක් නැරඹීමට රාත්‍රියේ වහළට නැගුණු එදින, ඔවුන්ගේ ප්‍රථම හාදුව හුවමාරු විය.

අවාසනාවකට ඒ මතකය තුෂාරයේ ප්‍රයෝගයක් විය. හේරා විසින් ඇගේ හිසට ඇතුළු කළ මායාමය බොරුවක් විය. සැබෑ ජීවිතයේ දැන් පිපර් සහ ජේසන් එකට සිටිති. සැබෑ ජේසන්ව ලබා ගැනීමට පිපර් රාත්‍රියේ ජේසන්ව පිටතට කැඳවූවොත් ඔහු එය කරාවිද?

ඇය පිදුරු එකට ගොඩ ගැසුවාය. ජේසන් ඉස්තාලයේ තිබූ අබලන් දොරක් සැකසුවේය. පහතින් පෙනෙන සාගරයෙන් වීදුරුව දිලිසිණි- ඇය ඉවත බලා ගත්තේ සාගරයෙන් එබෙන රාක්ෂ මුහුණක් හෝ ඇගේ සීයාගේ පැරණි කතාවල සඳහන් ජල ම්ලේච්ඡයකු දකීමට වෙතැයි බියෙනි. එහෙත් ඇයට දකගත හැකි වූයේ කලාතුරකින් ඇදී යන හුරුල්ලන් රංචුවක් පමණකි.

ජේසන් වැඩකරන අයුරු බලා සිටිද්දී, ඕනෑම වැඩක් ඔහු පහසුවෙන් කිරීම ගැන ඔහුව අගය කළාය. දොරක් අලුත්වැඩියා කිරීම හෝ නැතිනම් සැදලවලට තෙල් දැමීම හෝ ඕනෑම දෙයක් ඔහු පහසුවෙන් කළේය. ඒ ඔහුගේ ශක්තිමත් බාහු හෝ නිපුණත්වයෙන් පිරි දෑත් නිසා නොවේ. ඔහු ප්‍රබෝධමත්ව සහ විශ්වාසයකින් යුතුව ක්‍රියා කළේය. මැසිවිලි නැගීමකින් තොරව ඔහු කළ යුත්ත කළේය. ඔහුට පෙම් බැඳීම ගැන ඇය රෙයිනාට දොස් නොපැවරුවාය. වැඩට සහ රාජකාරියට පැමිණිවිට ඔහු හදවතින්ම රෝමානුවකු විය.

පිපර් චාල්ස්ටන්වල පැවති තම මවගේ තේ සාදය ගැන සිතුවාය. දෙවඟන වසරකට පෙර රෙයිනාට කුමක් පැවසුවේද යන්න ඇයට පුදුමයක් විය. එසේම එයින් රෙයිනා ජේසන්ට සලකන විදිහ වෙනස් වූයේ ඇයි? ඇෆ්‍රොඩයිට් ජේසන්ට කැමති හෝ අකමැති වීමට ඇයට අනුබල දුන්නේද?

පිපර්ට එය පැහැදිලි නොවුණත්, තම මව චාල්ස්ටන් වල පෙනී නොසිටීමට ඇය ප්‍රාර්ථනා කළාය. සාමාන්‍ය මවුවරු ඇති පදමට ලැජ්ජාශීලී අය වූහ. *ඔබේ යහළුවන්ට තේ සාදයට ආරාධනා කර, කයිවාරු ගසන දිව්‍යමය මවුවරු අවනම්බුවකි.*

ඇෆ්‍රොඩයිට් ඇනබෙත්ට සහ හේසාල්ට එතරම් අවධානයක් යොමුකිරීම පිපර්ව අපහසුතාවයට පත් කරවන්නක් විය. ඇගේ මව යමෙකුගේ ආදර ජීවිතයට කැමැත්තක් දක්වූ විට සාමාන්‍යයෙන් එය නරක ලකුණකි. එහි අර්ථය වූයේ ප්‍රශ්න පැමිණීමට නියමිත බවයි.

එහෙත් තම මව තමාගේ පෙනුමෙන් නොසිටීම ගැනත් ඇය රහසේ දුක් වූවාය. ඇෆ්‍රොඩයිට් ඇය දෙස බැලුවේ කලාතුරකිනි. ඇය ජේසන් ගැන වචනයක් හෝ නොපැවසුවාය. රෙයිනා සමඟ පැවති සංවාදය ගැන ඇය කොහෙත්ම කරදරයට පත් නොවූවාය.

පිපර්ගේ කැමැත්ත ගැන ඇෆ්‍රොඩයිට් තවදුරටත් අදහසක් නොමැති වූවා සේය. පිපර් ඇගේ හාදයා ලබාගෙන තිබුණි. දැන් එය පවත්වාගෙන යාම ඇගේ කාර්යයකි. පරණ ටැබ්ලොයිඩ් සඟරාවක් විසිකර දමන තරම් පහසුවෙන් ඇෆ්‍රොඩයිට් අලුත් ප්‍රවෘත්ති වලට මාරු වූවාය.

එයාල හැමෝටම විශිෂ්ට කතා තියෙනවා. ඇෆ්‍රොඩයිට් පැවසුවාය. මම කිව්වෙ, කෙල්ලන්ට.

පිපර් එය පිළිනොගත් නමුත්, ඇගේ කොටසක් ඒ ගැන සිතුවේය. අපූරුයි. මම කතාවක් වෙන්න ඕනෙ නැහැ. මට ඕනෙ අපූරු පෙම්වතෙක් එක්ක, අපූර ස්ථාවර ජීවිතයක්.

ඇය වැඩියෙන් දනගෙන සිටියා නම් ඒ සබඳතා ඇති කිරීම ගැන පමණකි. ඇප්‍රොඩයිට් කුටියේ ප්‍රධාන උපදේශිකාව ලෙස ඇය විශේෂඥවරියක ලෙස සැලකිණි. අර්ධ ලෝහිත කඳවුරේ අනෙක් කඳවුරුවාසීන් සැමවිටම ඇගේ උපදෙස පතා පැමිණියහ. පිපර් ඇගේ උපරිමය කිරීමට උත්සාහ කළාය. එහෙත් ඇගේම පෙම්වතා සම්බන්ධයෙන් ඇය දනුම් තේරුම් ඇති එකියක නොවූවාය. ඇය නිතරම දෙවැනි අනුමානයන්ට එළැඹුණාය. පමණට වඩා ජේසන්ගේ ඉරියව් කියවමින්, ඔහුගේ චිත්ත ස්වභාවයත් පරීක්‍ෂා කරමින් කල් යැවූවාය. එය මෙතරම් අසීරු වූයේ ඇයි?

''මොනවද එයා කල්පනා කරන්නෙ?'' ජේසන් විමසුවේය.

තමාගේ මුහුණ ඇඹුල් වී ඇති බව පිපර් වටහා ගත්තාය. වීදුරුවේ පරාවර්තනයෙන් ඇය දුටුවේ ඇගේ පෙනුම මේස ලුණු හැන්දක ගිල් වූ ආකාරයෙන් දිස්වන බවයි.

''මොකුත් නැහැ,'' ඇය පැවසුවාය. ''මම කිව්වෙ... ගොඩක් දේවල්. හැමදෙයක්ම වගේ එක සැරේට.''

ජේසන් සිනාසුණේය. ඔහු සිනාසෙන විට ඔහුගේ තොලෙහි වූ කැළල මුළුමනින්ම පාහේ අතුරුදහන් විය. ඔහුට සිදුවූ සියල්ල සලකා බලන විට ඔහු මෙවැනි හොඳ පෙනුමකින් සිටීමත් පුදුමයට කාරණයක් විය.

''ඒක ව්‍යායාමයක් වෙයි.'' ඔහු පැවසුවේය. ''ඔයාට ඔයා ගැන එහෙම කියන්න පුළුවන්.''

''ඔව්,'' පිපර් එකඟ වූවාය. ''ඇනබෙත්ගේ හැඟීම් යහපත් කරන්න කියල මම කියපු එක හැරුණම.''

ජේසන් දෙවුර සැලුවේය. ''තවමත්, ඒක ඇත්තක්. අපි සම්පූර්ණයෙන්ම වාගේ පැරණි භූමියෙ. අපි රෝමවරුන්ව පසුකළා.''

''ඒ වගේම දන් එයාලා අපේ මිතුරන්ට පහර දෙන්න අර්ධ ලෝහිත කඳවුරට යන ගමන්.''

එයට ධනාත්මක පිළිතුරක් ලබා දීමට අපොහොසත් බව පෙන්වීමට මෙන් ජේසන් හැකිළුණේය. ''ව්රොන් එයාලව නවත්තන්න

විදිහක් හොයා ගනී. ඇත්තටම කඳවුර හොයාගෙන ඒකට පහර දෙන සැලසුමක් හදාගන්න රෝමවරුන්ට සති ගාණක් යයි. අනෙක් අතට ඒ දේවල් සිද්ධවෙන වේගය අඩු කරන්න රෙයිනා එයාට පුළුවන් දේ කරයි. ඇය තවමත් ඉන්නේ අපේ පැත්තේ. මම එයාව දන්නවා.''

''ඔයා එයාව විශ්වාස කරනවද?'' පිපර්ගේ හඬ බිඳිණි.

''බලන්න. පිපර්ඃ මම ඔයාට කිව්වනෙ, ඔයාට ඊර්ෂ්‍යා කරන්න දෙයක් නැහැ කියලා.''

''එයා ලස්සනයි. එයා බලසම්පන්නයි. එයා ඉතිං... රෝම කෙනෙක්.''

ජේසන් තම මිටිය බිම දැමුවේය. ඔහු ඇගේ අත අල්ලා ගත්තේය. ඇයට දැනුණේ විදුලි ආඥකු ස්පර්ශ වූවාක් මෙනි. ''ඔයත් ලස්සනයි වගේම බලසම්පන්නයි.'' ඔහු පැවසුවේය. ''ඒ වගේම මට ඔයාව රෝම කෙනෙක් කරන්න ඕනෙ නැහැ. මට ඕනා ඔයා පිපර් වෙන්න. අනෙක් අතට අපි කණ්ඩායමක්. ඔයයි මමයි.''

ඇයට ඔහුව විශ්වාස කිරීමට වුවමනා විය. ඔවුන් එක්ව දැන් මාස ගණනකි. ඇයට තම සැක දුරු කර ගැනීමට නොහැකිය. ඊටත් වඩා පහසුවෙන් ජේසන්ට තම අතෙහි වූ පච්චය පුළුස්සා දැමීමට හැකියාව තිබිණි.

ඔවුන්ට ඉහළින් රාත්‍රී කෑම සඳහා නෞකාවේ සීනුව නාද විය. ජේසන් ව්‍යාජ සිනාවක් නැගුවේය. ''අපි එහෙට යන එක හොඳයි. අපිට ඕනෙ නැනෙ කෝච් හෙජ් අපේ බෙල්ලෙ සීනු එල්ලනව දකින්න.''

පිපර් වෙව්ලා ගියාය. ඇනබෙත්ගේ හා පර්සිගේ ජරමරයෙන් පසු කෝච් හෙජ් එසේ කරන බවට තර්ජනය කළේය. එවිට යමෙකු රාත්‍රියේ පිටට ගැටුවොත් ඔහුට දැන ගැනීමට හැකි වේ.

''ඔව්.'' ඇය ප්‍රීතිමත් අයුරින් ඔවුන්ට පහළින් වූ වීදුරු දොර දෙස බලාගෙන පැවසුවාය. ''මම හිතන්නෙ අපි රෑ කෑම අරගෙන හොඳ තින්දක් දාන්න ඕනෙ.''

# 26
# පිපර්

**පසුදින උදෑසන** පිපර් අවදි වූයේ වෙනත් නැවක නලා ශබ්දයකිනි- එහි හඬට ඇය ගැස්සී අවදි වූවාය.

එය ලියෝගේ තවත් විහිලුවක් වන්නට ඇතැයි ඇය සිතුවාය. ඉන්පසු නැවතත් නලා හඬ ගිගුම් දුන්නේය. යාර සියයක පමණ දුරකින් තිබෙන නැවක් තරමට එහි හඬ ප්‍රබල විය.

ඇය ඉක්මනින් ඇඳුම් මාරුකර ගත්තාය. ඇය නැව් තට්ටුවට යන විටත් සෙස්සෝ එතැනට රොක් වී සිටියහ. රාත්‍රී මුරයේ නිරතව සිටි කෝච් හෙජ් හැරුණු විට සියල්ලෝම දඩිබිඩියේ ඇඳුම් මරු කරගෙන ඇති බව පෙනී ගියේය.

ෆ්‍රෑන්ක්ගේ වැන්කුවර් වින්ටර් ඔපිම්පස් කමිසය කනපිට ගැසී තිබිණි. පර්සි පහළට පිජාමාවක් හැඳ, උඩට ලෝකඩ ළය එලකයක් හැඳ සිටියේය. ඒ මෝස්තරය නම් සිත් ඇදගන්නා බව නොකියාම බැරිය. සුළි සුළඟකට අසු වූ කලෙක මෙන් හේසාල්ගේ කොණ්ඩය අවුල් වී ගොසිණි. ඒ අතර හදිසියේම ගින්න කැඳවීම නිසා ලියෝ ගේ කමිසයේ තැන් තැන්වලින් සිදුරු වී, ඔහුගේ අත්වලින් දුම් දමමින් තිබුණේය.

වරායට යාර සියයක් පමණ මැතින් විශාල නැවක් එහා මෙහා යාත්‍රා කරමින් තිබුණේය. සඳලුතල පේළි පහළොවක හෝ දහසයක සිටි සංචාරකයින් ඔවුන්ට අත් වැනූහ. පැරණි ග්‍රීක පෙනුමැති තට්ටු තුනේ හබල් නැවක් දැකීම ඔවුන්ගේ පුදුමයට හේතු වී ඇති බව පෙනී

ගියේය. සමහරවිට මීදුම හේතුවෙන් එය ධීවර බෝට්ටුවක් ලෙස පෙනී ගියා විය හැකිය. එසේත් නැතිනම් සංචාරක නෞකාව සිතන්නට ඇත්තේ ආගෝ II සංචාරක ආකර්ෂණයට තැනූ නැවක් ලෙස විය යුතුය.

සංචාරක නෞකාව නැවත නලාව නාද කළේය. ආගෝ II කම්පනයෙන් ගැස්සී ගියේය.

කෝච් හෙජ් තම කන් වසා ගත්තේය. ''උන්ට ඔච්චර හයියෙන් නලාව පිඹින්න ඕනෙද?''

''එයාල මේ 'හායි' කියනවා විතරයි.'' ෆ්‍රැන්ක් පැවසුවේය.

''මොකක්?'' හෙජ් බෙරිහන් දුන්නේය.

ඔවුන්ගේ නැව ආසන්නයෙන්ම අනෙක් නැව මුහුද දෙසට ඇදී ගියේය. සංචාරකයෝ දිගටම අත් වනමින් සිටියහ. ආගෝ II හි සිටින්නේ අඩ නින්දක් ලැබූ, සන්නාහ වලින් සහ පිජාමා වලින් සැරසුණු ළමුන් පිරිසක් සහ එළු පාද සහිත මිනිසෙක් බව ඔවුන් දුටුවානම් කිසිවිටෙකත් එවැන්නක් නොකරනු ඇත.

''සුබ ගමන්!'' ලියෝ තම දුම් දමන අත ඔසවමින් පැවසුවේය.

''මම බැලිස්ටායි එක්ක යවන්නද?'' හෙජ් විමසුවේය.

''එපා.'' ලියෝ සිනාවකින් නමුත් දැඩි හඬකින් පැවසුවේය.

හේසාල් දෑස් පිසදමමින්, දිලිසෙන කොළ පැහැති ජලය දෙස බැලුවාය. ''කොහොමද මේ- ආහ්- නියමයි.''

ඇගේ දෙනෙත් අනුගමනය කළ පිපර් ද තිගැස්මට පත් වූවාය. සංචාරක නැවෙන් අවහිර වී තිබූ ඔවුන්ගේ දර්ශනය දැන් පැහැදිලි වෙමින් තිබිණි. මුහුදේ උතුරට සැතපුම් භාගයක් අඩු දුරකින් ඔවුන්ට කන්දක් දැක ගැනීමට හැකි විය. පිපර් මීට පෙර අලංකාර කඳු පර්වත දැක තිබුණාය. කැලිෆෝනියා වෙරළ තීරයේ අධිවේගී මාර්ග 1 හි ඇය රිය පදවා තිබිණි. ඇය ජේසන් සමඟ ග්‍රෑන්ඩ් කැනියමෙන් පහළට පවා ඇද වැටී නැවත ඉහළට පැමිණ තිබුණාය. එහෙත් අහස් කුසට නැගුණු මේ ධවල කන්ද තරම් අලංකාරය කිසිවක් ඇය දැක තිබුණේ නැත. එක් පැත්තකින් හුණුගල් පර්වතය මුළුමනින්ම බෑවුම් වී අඩි දහස් ගණනක් පහළින් තිබූ මුහුදට යොමු වී තිබිණි. අනෙක් පැත්තෙන්, කඳු බෑවුම ස්ථරවලට බෙදී හරිත වනයෙන් වැසී තිබුණේය. එබැවින් මේ සියල්ලම පර්සිට විශාල ධවල හිසක් සහ ළයක් සහිතව පිට දේග්

එලූ හරිත කබායක් සහිතව සහශ්‍ර ගණනක් පුරා පවතින දැවැන්ත ස්පිනික්ස් ප්‍රතිමාවක් සිහිපත් කරවීය.

''ජිබ්‍රෝල්ටා පර්වත,'' ඇනබෙත් ගෞරව සම්ප්‍රයුක්තව පැවසුවාය. ''ස්පාඤ්ඤයේ කෙළවර. ඒ වගේම අර පැත්ත.'' ඇය දකුණ දෙස පෙන්වූවාය. එහි වූයේ තවත් ඈතට විහිදී ගිය රතු සහ ගුරු පැහැයෙන් යුත් පර්වතයන්ය. ''ඒ අප්‍රිකාව වෙන්න ඕනෙ. අපි ඉන්නෙ මධ්‍යධරණියෙ මුවදොරේ.''

උදෑසන උණුසුම් වූ නමුත් පිපර් වෙව්ලුවාය. ඔවුන් ඉදිරිපිට වූයේ පුළුල්ව විහිදී ගිය මුහුද වුවත්, ඇයට හැඟුණේ තමා තරණය කළ නොහැකි බාධකයක් වෙත පැමිණ ඇතැයි යන හැඟීමකි. මධ්‍යධරණියට පැමිණි පසු ඔවුන්ට පැරණි භූමින් වෙත පැමිණීමට හැකි වනු ඇත. පුරාවෘත්තය සත්‍ය නම්, ඔවුන්ගේ ගවේෂණය තවත් දස ගුණයකින් භයානක වනු ඇත.

''දැන් මොකක්ද කරන්නේ?'' ඇය විමසුවාය. ''අපි ඔහේ යාත්‍රා කරනවද?''

''ඇයි නැත්තේ?'' ලියෝ පැවසුවේය. ''ඒක ලොකු නෞකා මාර්ගයක්. හැම තිස්සෙම යාත්‍රා එළියටයි ඇතුළටයි යනවා.''

*ඒ උපදෙවිවරු පුරවපු තට්ටු තුනේ හබල් නැව් නෙමෙයි,* පිපර් සිතුවාය.

ඇනබෙත් ජිබ්‍රෝල්ටා පාෂාණය දෙස බලාසිටියාය. තම මිතුරියකගේ මුහුණේ වූ කල්පනාකාරී ඉරියව් පිපර්ට හඳුනාගත හැකි විය. ප්‍රශ්නයක් බලාපොරොත්තුවෙන් සිටින විට නිතරම ඇගෙන් මෙවැනි පෙනුමක් දැක ගැනීමට හැකි විය.

''ඉස්සර කාලෙ.'' ඇනබෙත් පැවසුවාය. ''මේ ප්‍රදේශයට ඔවුන් කිව්වෙ *හර්කියුලිස්ගේ කුලුන* කියලයි. පාෂාණය එක කුලුනක් විදිහට සැලකුණා. අනෙක අප්‍රිකානු කඳුවලින් එකක්. කවුරුවත් හරියටම දන්නෙ නෑ ඒ කොයි එකද කියලා.''

''හර්කියුලිස්. ඈ?'' පර්සි මුහුණ හැකිලුවේය. ''ඒ හාදයා පැරණි ග්‍රීසියෙ තරුවක් වගේනෙ. හැරෙන හැරෙන අතේ ඉන්නෙ එයා.''

ගිගිරුම් හඬකින් ආගෝ II දෙදරුම් කෑවේය. එහෙත් මේ වතාවේ එය පැමිණියේ කිනම් පැත්තකින් දැයි පිපර්ට හරි හැටි විශ්වාසයක් නොතිබුණි. ඇයට වෙනත් කිසිදු නෞකාවක් දක්නට නොලැබුණ අතර අහසද පැහැදිලිව තිබිණි.

ඇගේ මුව සැනෙකින් වියළී ගියා සේ ඇයට හැඟිණි. ''ඉතිං... මේ හර්කියුලිස්ගේ කුලුනු භයානකයිද?''

ඇතීනාගේ සලකුණේ කෝපාග්නිය ඇවිලෙන තෙක් බලා සිටින්නාක් මෙන් ඇනබෙත් ධවල පර්වත දෙසම බලා සිටියාය. ''ග්‍රීකයෝ කියන විදිහට ලෝකයේ අවසානය කුලුනු වලින් සලකුණු වෙනවා. රෝමන්වරු කියනවා ඒ කුලුනුවල ලිතින් අනතුරු හැඟවීමක් සටහන් කරල තියෙනවා කියලා.''

නන් ප්ලස් අල්ට්‍රා.'' පර්සි පැවසුවේය.

ඇනබෙත් ගල් ගැසුණාය. ''ඔව්, තවත් ඔබ්බට කිසිවක් නැත. ඔයා කොහොමද දන්නෙ?''

පර්සි අත දිගු කළේය. ''මොකද මම ඒක දිහා බලාගෙන ඉන්න නිසා.''

ඔවුන්ට හරියටම ඉදිරියෙන්, සමුද්‍ර සන්ධියේ මැද දූපතක් දර්ශනය වෙමින් තිබිණි. මීට පෙර එතැන කිසිදු දූපතක් නොතිබුණු බව පිපර්ට සහතිකව කිව හැකි විය. කුඩා කඳුගැටයක් වැනි භූමි ස්කන්ධයක් වූ එය වනයෙන් වැසී තිබුණු අතර දූපත වටා සුදු පැහැති වෙරළක් තිබිණි. ජිබ්‍රෝල්ටා සමඟ සසඳන විට එතරම් චමත්කාරජනක නොවුණත්, දූපත ඉදිරිපිට, වෙරළට යාර සියයක් පමණ ඈතින් රළ අතරින් නෙරා විත් තිබුණේ ආගෝ II හි කුඹ තරම් උසැති සුදු පැහැති ග්‍රේසියානු කුලුනු දෙකකි. කුලුනු අතර, දිය යට දුවැන්ත රිදී වචන කීපයක් දිලිසිණි. සමහරවිට සිතුවමක් හෝ වැල්ලේ කොටන ලද්දක් හෝ විය හැකිය. *නන් ප්ලස් අල්ට්‍රා.*

''හාදයිනේ, මම වටේ යන්න ඕනෙද?'' ලියෝ විමසුවේය. ''නැත්නම්...''

කිසිවකු පිළිතුරු නොදුන්හ. සමහරවිට, පිපර් මෙන් අනෙක් අයත් වැල්ලේ සිටගෙන සිට රුව දුටු නිසා විය හැකිය. නෞකාව කුලුනු වෙත ළඟාවත්ම, දම් පැහැ ලෝගුවකින් සැරසුණු, කළු කෙස් ඇති මිනිසෙක්, දෑත් බැඳ, ඔවුන්ගේ පැමිණීම අපේක්ෂා කළාක් මෙන් ඔවුන්ගේ නැව දෙස බලා සිටින අයුරු දැකගැනීමට ලැබිණි. දුර තියා පිපර්ට ඔහු ගැන වැඩි යමක් පැවසීමට නුපුළුවන් වුවත්, ඔහුගේ ඉරියව් අනුව, ඔහු සතුටින් සිටින බවක් නොපෙනුණි.

ෆ්‍රෑන්ක් මඳ හුස්මක් ගත්තේය. ''ඒක වෙන්න පුළුවන්ද?''

''හර්කියුලිස්,'' ජේසන් පැවසුවේය. ''එතෙක් මෙතෙක් සිටි වඩා බලවත්ම උප දෙවියා.''

''ආගෝ II ට දැන් තිබුණේ කුලුනුවලට යාර සියයක් තරම් දුරක් පමණි.

''පිළිතුරක් අවශ්‍යයි.'' ලියෝ කලබලයෙන් පැවසුවේය. ''මට හරවන්න පුළුවන්. එහෙම නැත්නම් අපිට ගුවන්ගත වෙන්න පුළුවන්. ස්ටැබිලයිසර් ආයෙ වැඩ කරනවා. ඒත් මට ඉක්මනින් දැන ගන්න ඕනෙ.''

''අපිට දිගටම යන්න වෙනවා.'' ඇනබෙත් පැවසුවාය. මම හිතන්නෙ එයා මේ සමුද්‍ර සන්ධිය මුර කරනවා. ඒ ඇත්තටම හර්කියුලිස් නම්, යාත්‍රා කිරීමවත්, පියාසර කිරීමටවත් කිසිම හොඳක් වෙන දෙයක් නෙමෙයි. එයාට ඕනෙ අපිට කතා කරන්න වෙන්න ඇති.''

පිපර් එවැනි චාටු බස්වලට කැමති නොවූවාය. 'පියාසර කරන්න, අපිව මෙතනින් එහාට අරන් යන්න, ඇයට ලියෝට එසේ පැවසීමට වුවමනා විය. අවාසනාවකට, ඇයට හැඟුණේද ඇනබෙත් නිවැරදිය කියාය. මධ්‍යධරණීය පසු කිරීමට අවශ්‍ය නම්, ඔවුන්ට මේ හමුව මග හැරීමට නොහැකිය.

''හර්කියුලිස් අපේ පැත්තෙ නෙමෙයිද?'' ඇය බලාපොරොත්තු සහගතව විමසුවාය. ''මම කිව්වෙ... එයා අපේ කෙනෙක්. එහෙම නේද?''

ජේසන් ගෙරවූවේය. ''එයා සියුස්ගෙ පුත්‍රයා. ඒත් එයා මැරුණම දෙවිකෙනෙක් බවට පත්වුණා. ඔයාට කවදාවත් බැහැ දෙවියන්ව විශ්වාස කරන්න.''

කන්සාස් වලදී බැචස් හමු වූ අයුරු පිපර්ට සිහිපත් විය. ඒ උප දෙවියකුව සිටි තවත් දෙවියෙකි. ඔහු නිසැකවම උපකාර කරන්නකු නොවීය.

''නියමයි.'' පර්සි පැවසුවේය. ''හර්කියුලිස්ට එරෙහිව අපි හත් දෙනයි.''

''ඒ වගේම නරාශ්වයා.'' හෙජ් පැවසුවේය. ''අපිට එයාව පරද්දන්න පුළුවන්.''

''මට ඊට වඩා හොඳ අදහසක් තියෙනවා.'' ඇනබෙත් පැවසුවාය. ''අපි වෙරළට තානාපති කෙනෙක් යවමු. පොඩි

කණ්ඩාමක්- එක්කෙනෙක් දෙන්නෙක් විතර. එයා එක්ක කතා කරන්න උත්සාහ කරමු.''

''මම යන්නම්.'' ජේසන් පැවසුවේය. ''එයා සියුස් ගේ පුත්‍රයා. මම ජුපිටර්ගේ පුත්‍රයා. සමහරවිට එයා මාත් එක්ක මිත්‍රශීලී වෙයි.''

''එහෙම නැත්නම් එයා ඔයාට වෛර කරයි. ''පර්සි යෝජනා කළේය. ''අර්ධ සහෝදරයෝ නිතරම තනිවෙලා ඉන්නෙ නෑ.''

ජේසන් රැව්වේය. ''ස්තුතියි, සර්ව ශුභවාදී මහත්මයා.''

''ඒක හරි.'' ඇනබෙත් පැවසුවාය. ''අඩුගානෙ ජේසන්ටයි හර්කියුලිස්ටයි මොනවහරි පොදු දෙයක් තියෙනවා. ඒ වගේම අපිට අපේ හොඳම රාජ්‍ය තාන්ත්‍රිකයා අවශ්‍යයි. හොඳින් වචන හසුරුවන්න පුළුවන් කවුරුහරි.''

දැස් සියල්ලම පිපර් වෙත යොමු විය.

ඇය බෙරිහන් දෙමින්, පැත්තකට පැනීම ආයාසයෙන් වළක්වා ගත්තාය. ඇගේ උදරය සිරවෙන්නක් සේ දැනිණි. එහෙත් ජේසන් වෙරළට යන්නේ නම්, ඇයටත් ඔහු සමඟ එක්වීමට අවැසි විය. සමහර විට මේ අති බලසම්පන්න දෙවියා උපකාර නොකරනු ඇත. මොහොතකට එක වතාවකට ඔවුන්ට වාසනාව අවශ්‍ය වී තිබේ.

''අපූරුයි.'' ඇය පැවසුවාය. ''මම ඇඳුම් මාරු කරගෙන එන්නම්.''

ලියෝ, ආගෝ II කුලුනු අතර නැංගුරම් ලෑ විට, ජේසන් ඔහු සහ පිපර්ව වෙරළට ගෙන යාමට සුළඟ කැඳවූයේය.

දම් පැහැති ලෝගුවෙන් සැරසුණු මිනිසා ඔවුන් වෙනුවෙන් බලා සිටියේය.

පිපර් හර්කියුලිස් ගැන කතා ටොන් ගණනක් අසා තිබුණාය. චිත්‍රපට හා කාටූන් කීපයක්ද නරඹා තිබුණාය. ඒ කොණ්ඩය වවා ගත්, පුළුල් ළයකින් හා දළ හිපි රැවුලකින් යුත්, සිංහ සමකින් හිස වසාගෙන දැවැන්ත මුගුරක අතින් ගත් තිස් ගණන්වල පසු වූ මෝඩ ලෙන් මිනිසකු ලෙසිනි.

මෙය ඇය අපේක්ෂා නොකළ දෙයකි.

ඔහුගේ නිරුවත් දෙපා සුදු වැල්ලෙන් වැසී තිබිණි. දම් පැහැති ලෝගුව නිසා ඔහුගේ පෙනුම පූජකයකු මෙන් විය. ඒ කාදිනල් කෙනෙක්ද? බිෂොප් කෙනෙක්ද? දම් පාටින් කියන්නෙ එයා ග්‍රීක

කෙනෙකුට වඩා රෝම පිටපතක් කියන එකද? ඔහුගේ ඊවුල ඇගේ පියාගේ සහ ඔහුගේ නළු මිතුරන්ගේ තරමටම අශෝභන විය. එයින් කියා පෑවේ, *මට දවස් දෙකකින් විතර ඊවුල කපන්න බැරි වුණා. මගෙ පෙනුම තවමත් කැතයි.* යන්නකි.

ඔහු හොඳින් වැඩුණු දේහයකින් යුක්ත වුවත්, පමණට වැඩි තරබාරු අයකු නොවීය. ඔහුගේ කළු කෙස් රෝම ශෛලියට කොට කර තිබිණි. ඔහුගේ දෑස් ජේසන්ගේ මෙන් නිල් පැහැති වුවත්, ශරීරය මුළු ජීවිත කාලයම තඹ පදම් කරන හැලියක ගිල්වා සිටියාක් මෙන් තඹ පැහැයෙන් යුක්ත විය. වඩාත් පුදුමය වූයේ ඔහු වයස්ගත පෙනුමකින් නොසිටීමයි. ඔහු ගෙන් දිස්වූයේ වයස විස්සක් පමණ පෙනුමකි. ඔහු කඩවසම් වූ අතර කොහෙත්ම ලෙන් මිනිසකු නොවීය.

කෙසේ වෙතත් ඔහුට මුගුරක් තිබිණි. එය ඔහු අසල වැල්ලේ තබා තිබුණේය. එහෙත් එය පෙනුණේ ප්‍රමාණයට වඩා විශාල බේස්බෝල් පිත්තක් ලෙසිනි. අඩි පහක් පමණ දිග, ඔප දැමූ සිලින්ඩරාකාර මැහෝගනී මුගුරක් වූ එහි මිට සම් වලින් සහ ලෝකඩ වලින් සකසා තිබිණි. කෝච් හෙජ් නම් නිසැකවම එයට ඊර්ෂ්‍යා කරනු ඇත.

ජේසන් සහ පිපර් වෙරළ අද්දරට ගොඩ බැස්සාහ. කිසිදු තර්ජනාත්මක චලනයක් නොපෙන්වා, ප්‍රවේසමෙන් ඔවුහු ඔහු දෙසට සමීප වූහ. කිසිදු විශේෂිත හැඟීමක් නොමැතිව හර්කියුලිස් ඔවුන් දෙස බලා සිටියේ, ඔහු මින් පෙර කිසිකලෙක දැක නොතිබූ මුහුදු පක්ෂීන් දෙදෙනකු දෙස බලන්නාක් මෙනි.

''හලෝ.'' පිපර් පැවසුවාය. සැමවිටම හොඳ ආරම්භයකි.

''කොහොමද?'' හර්කියුලිස් පැවසූවේය. ඔහුගේ හඬ ගැඹුරු වුවත් සාමාන්‍ය විය.

''ආහ්, වැඩිය නෙමෙයි.'' පිපර් පැවසුවාය. හොඳයි, ඇත්තටම ගොඩක්. මම පිපර්. මේ ජේසන්. අපි-''

''ඔයාගෙ සිංහ හම කෝ?'' ජේසන් බාධා කළේය.

පිපර්ට ඔහුට වැලමිටෙන් ඇනීමට වුවමනා වුවත්, හර්කියුලිස්ගේ පෙනුමෙහි වූයේ හිරිහැරයකට වඩා විනෝද පෙනුමකි.

''මෙහෙ අංශක අනූවක් විතර රස්නෙයි,'' ඔහු පැවසුවේය. ''මම මොකටද මගෙ සිංහ හම පොරවන්නේ? ඔයාල වෙරළෙදී ලොම් ඇඳුම් අඳිනවද?''

''මම හිතනවා ඒක පැහැදිළි වුණා කියලා,'' ජේසන් කලකිරීමට පත් අයුරින් පැවසුවේය. ''මොකද පින්තූරවල ඔයා නිතරම ඉන්නෙ සිංහ හමක් එක්ක.''

හර්කියුලිස් අහස දෙස බැලුවේ ඔහුට තම පියා වූ සියුස් සමඟ වචන කීපයක් කතා කිරීමට අවැසි වූවාක් මෙනි. ''මම ගැන අහන්න ලැබෙන හැම දෙයක්ම ඔයා විශ්වාස කරන්න එපා. ජනප්‍රිය වෙන එක ඔයා හිතන තරම් අපූරු දෙයක් නෙමෙයි.''

''මට ඒ ගැන කියන්න.'' පිපර් පැවසුවේය.

හර්කියුලිස් ඒ නිල් දෑස් ඇය වෙත යොමු කළේය. ''ඔයා ජනප්‍රියද?''

''මගෙ තාත්තා... එයා චිත්‍රපටිවල ඉන්නවා.''

හර්කියුලිස් ගෙරවූයේය. ''මට චිත්‍රපටි ගැන නම් කියන්න එපා. ඔලිම්පස් හි දෙවිවරු ගැන එයාල කවදාවත් කිසිමදෙයක් හරියට ගන්නෙ නෑ. ඔයා චිත්‍රපටියක් දැකල තියෙනවද, මම මම වගේ ඉන්නෙ? ''

ඔහුගේ තර්කය පිපර්ට පිළිගැනීමට සිදුවිය. ''මට පුදුමයි ඔයා මෙච්චර තරුණ බව දැක්කම.''

''හා! අමරණීය වීමේ උදව්වෙන්. ඒත්, ඔව් මැරෙන කොටත් එච්චර වයසට ගිහින් හිටියෙ නෑ. නූතන මිනුම් අනුව, වීරයෙක් විදිහට හිටපු කාලෙ මම ගොඩක් දේවල් කළා... ඕනවටත් වැඩිය, ඇත්තටම.'' ඔහුගේ දෑස් ජේසන් වෙත යොමු විය. ''සියුස්ගෙ පුතා, නේද?''

''ජුපිටර්ගෙ.'' ජේසන් පැවසුවේය.

''වැඩි වෙනසක් නැහැ.'' හර්කියුලිස් පැවසුවේය. ''තාත්තා ඔය කොයි ආකාරයෙනුත් පීඩා විදිනවා. මට? මට කිව්වෙ හෙරක්ලස් කියලා. ඊට පස්සෙ රෝමවරු ඇවිත් මට හර්කියුලිස් කිව්වා. මම ඇත්තටම ඒ තරමට වෙනස් වුණේ නැහැ. ඒත් පස්සෙ ඒ ගැන හිතලම මට ඔලුවෙ කැක්කුම හැදුණා.''

ඔහුගේ මුහුණේ වම් පැත්ත ගැස්සුණේය. ඔහුගේ ලෝගුව මොහොතකට සුදු පැහැයෙන් දිලිසී, නැවත දම් පැහැවිය.

''මොන විදිහෙන් බැලුවත්,'' හර්කියුලිස් පැවසූවිය. ''ඔයා ජුපිටර්ගෙ පුත්‍රයා නම්, ඔයාට තේරුම් ගන්න පුළුවන් වෙයි. ඒක ලොකු

පීඩනයක්. ඇතිවීම කොහෙත්ම ඇතිවෙන්නෙ නෑ. අන්තිමට ඒකෙන් කෙනෙක්ව පිස්සු වැටෙනවා.''

ඔහු පිපර් දෙසට හැරුණේය. ඇගේ පිට දිගේ කුහුඹුවන් දහස් ගණනක් ඇදී යන්නාක් වැනි හැඟීමක් ඇයට ඇති විය. ඔහුගේ දෑස් තුළ වූයේ දුකත්, අන්ධකාරයත් මිශ්‍රිත පෙනුමකි. එසේම පැහැදිලිව එය ආරක්ෂිත දෙයක් නොවූයේය.

''ඔයා ගැන කියනවනම්, මගෙ කෙල්ලේ.'' හර්කියුලිස් පැවසුවේය. ''ප්‍රවේසම් වෙන්න. සියුස්ගේ පුතුන්... හොඳයි, ඒ ගැන හිතන්න එපා.''

පිපර්ට එහි අර්ථය පැහැදිලි නොවීය. එක්විටම ඇයට අවැසි වූයේ මේ දෙවියන්ගෙන් හැකි තරම් ඈත් වන්නටය. එහෙත් ඇය සන්සුන්ව හැකි තරම් විනීත පෙනුමක් නඟා ගැනීමට උත්සාහ කළාය.

''ඉතිං, හර්කියුලිස් උතුමාණනි,'' ඇය පැවසුවාය. ''අපි ගවේෂණයක යෙදිලා ඉන්නෙ. අපි කැමතියි අපිට මධ්‍යධරණීය පහු කරන්න අවසර ලැබෙනවනම්.''

හර්කියුලිස් දෙවුර සැලුවේය. ''ඒ නිසා තමයි මම මෙතන ඉන්නෙ. මම මැරුණට පස්සෙ, තාත්තා මාව ඔලිම්පස්වල මුරකාරයා බවට පත් කළා. මම කිව්වා නියමයි! තැනක් මුර කරන්න! හැම වෙලාවෙම සම්භාෂණ! එයා කිව්වෙ මාව පැරණි භූමිවල දොරටු ආරක්ෂා කරන්න යවනවා කියල නෙමෙයි. සදාකාලයටම මේ දූපතේ සිරවෙන එක ගැනයි. හරිම විනෝදයි.''

ඔහු රැළි මතින් ඉහළට එසවී තිබුණු කුලුනු පෙන්වූයේය. ''මෝඩ කුලුනු. සමහර මිනිස්සු කියනවා මම කඳු දෙපැත්තට තල්ලු කරල මුළු ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධියම නිර්මාණය කළා කියලා? සමහර මිනිස්සු කියනවා කඳු තමයි කුලුනු කියලා. මොන විකාරයක්ද. කුලුනු කියන්නෙ කුලුනු වලට.''

''හරි.'' පිපර් පැවසුවාය. ''ඉතිං... අපිට යන්න පුළුවන්ද?''

දෙවියා තම රැවුල පිරිමැද්දේය. ''හොඳයි, මට ඔයාලට දෙන්න වෙනවා සම්මත අනතුරු ඇඟවීමක් පැරණි භූමීන් කොච්චර භයානකද කියන එක ගැන. කිසිම උපදෙවියකුට මාරි නොස්ට්‍රම්වල දි ජීවිතේ රැක ගන්න බැහැ. ඒ නිසා, මට ඔයාලට සම්පූර්ණ කරන්න ගවේෂණයක් දෙන්න වෙනවා. ඔයාලගේ සුදුසුකම් තහවුරු කරන්න. ඇත්තටම මම ලොකු දෙයක් කියන්නෙ නෑ. සාමාන්‍යයෙන් මම උපදෙවිවරුන්ට

කියන්නෙ වෙළඳ සවාරියක්, අපූරු සිංදුවක් කියන්න, වගේ සරල දේවල් විතරයි. මගෙ යක්ෂ සහෝදරයා යුරිස්තියස් වෙනුවෙන් මම සම්පූර්ණ කරන්න ඕනෙ දේවල් කළාට පස්සෙ... මට ඒ හාදය ඕනෙ වෙන්නෙ නෑ.''

''පිළිගන්නවා.'' ජේසන් පැවසුවේය.

''හේයි, ප්‍රශ්නයක් නැහැ.'' හර්කියුලිස්ගෙ වදන් බෙහෙවින් සන්සුන් වූ නමුත්, පිපර් තවමත් සිටියේ අවුලෙනි. ඔහුගේ දෑස්වල වූ අඳුරු දිලිසීම ඇයට අඟුරු භූමිතෙල්වල පෙඟවීම සිහිපත් කළේය.

''ඉතිං, කොහොම වුණත්,'' හර්කියුලිස් පැවසුවේය. ''මොකක්ද ඔයාලගෙ ගවේෂණය.''

''යෝධයො,'' ජේසන් පැවසුවේය. ''අපි ග්‍රීසියෙන් පිටත් වුණේ එයාල ගයියාව නැගිටුවන එක නවත්වන්න.''

''යෝධයෝ,'' හර්කියුලිස් මිමිණුවේය. ''මට ඔය හාදයින්ව පේන්න බැහැ. මම උපදෙවි වීරයෙක් වෙලා හිටපු කාලෙ... ආහ්, ඒක ගණන් ගන්න එපා. ඉතිං මොන දෙවියොද ඔයාලට මේක පැවරුවේ. තාත්තද? ඇතීනාද? සමහරවිට ඇප්‍රොඩයිට් වෙන්න ඇති? ඔහු දෙබැම ඔසවා පිපර් දෙස බැලුවේය. ''ඔයත් ඒ තරමට ලස්සනයි. මම හිතන්නෙ ඒ ඔයාගෙ අම්මා.''

පිපර් ඉක්මනින් සිතිය යුතුව තිබිණි. එහෙත් හර්කියුලිස් එයට අවස්ථාවක් නොදුන්නේය. ප්‍රමාද වැඩිය. සංවාදය පිපිරීමකට ආසන්න වෙමින් තිබෙන බව ඇයට අවබෝධ විය.

''අපිව එව්වේ හේරා.'' ජේසන් පැවසුවේය. ''එයා අපි දෙගොල්ලොම එව්වා.''

''හේරා.'' එක්විටම හර්කියුලිස්ගේ ඉරියව් ජිබ්‍රෝල්ටා පර්වත තරම් දැඩි විය.

''අපිත් හේරාට වෛර කරනවා.'' පිපර් ඉක්මනින් පැවසුවාය. ''දෙවියනේ ඇයි ඒක එයාට සිද්ධ නොවුණේ? හේරා හර්කියුලිස්ගේ ප්‍රබල සතුරකුව සිටියාය. ''අපිට වුවමනා නැහැ එයාට උදව් කරන්න. එයා අපිට වෙන විකල්පයක් දුන්නෙ නැහැ. ඒත්-''

''ඒත් ඔයාල මෙහෙ.'' හර්කියුලිස් පැවසුවේය. ඔහුගේ සියලු මිත්‍රශීලිභාවයන් අතුරුදන් වී තිබිණි. ''ඔය දෙන්නම සමාවෙන්න,

ඔයාලගෙ ගවේෂණය කොච්චර වැදගත් වුණත් ඒකෙන් මට වැඩක් නැහැ. හේරාට අවශ්‍ය කිසිම දෙයක් මම කරන්නෙ නැහැ. කවදාවත්.''

ජේසන්ගේ පෙනුම ව්‍යාකුල විය. ''ඒත් මම හිතුවෙ ඔයා දෙවි කෙනෙක් වුණාට පස්සෙ ඇයත් එක්ක ගැටලුවක් නැතුව ඇති කියලා.''

''මම කිව්වා වගේම.'' හර්කියුලිස් ගිගිරුවේය. ''ඔයාලට ඇහෙන හැමදෙයක්ම විශ්වාස කරන්න එපා. ඔයාලට මධ්‍යධරණිය පහු කරන්න ඕනෙ නම්, කනගාටුයි, මට ඔයාලට අමතර, අසීරු ගවේෂණයක් දෙන්න වෙනවා.''

''ඒත් අපි සහෝදරයෝ වගේ,'' ජේසන් විරෝධය පෑවේය. ''හේරා මගේ ජීවිතයත් විනාශ කළා. මට තේරෙනවා.''

''ඔයාට කිසිම දෙයක් තේරෙන්නෙ නැහැ.'' හර්කියුලිස් දැඩිව පැවසුවේය. ''මගෙ පළවෙනි පවුල මියගියා. මගෙ ජීවිතේ විකට ගවේෂණවලට නාස්ති වුණා. මට ප්‍රයෝගයකින් වස දෙන්න ගිහින් මගෙ දෙවැනි බිරිඳ මිය ගියා, මට වේදනාකාරී මතකයක් ඉතිරි කරලා. ඒකට මගෙ වන්දිය? මම අල්පේශාක්‍ය දෙවි කෙනෙක් බවට පත්වුණා. අමරණීය වුණා. ඉතිං කවදාවත් මට මගෙ වේදනාව අමතක කරන්න බැහැ. දොරටු පාලකයෙක් විදිහට ඔලිම්පියන්ස්ලාගේ සේවකයෙක් විදිහට මෙතන හිරවෙලා නෑ. ඔයාලට තේරෙන්නෙ නැහැ. මාව ටිකක් හරි තේරුම් ගත්ත එකම දෙවියා ඩියෝනීසස් විතරයි. අඩුගානේ එයා මොනවහරි ප්‍රයෝජනවත් දෙයක් නිෂ්පාදනය කළා. මගෙ ජීවිතයට සම්බන්ධ නරක චිත්‍රපටයක් හැර මට පෙන්වන්න වෙන කිසිම දෙයක් නැහැ.''

පිපර් චාටුවෙන් කතාව ඇරඹුවාය. ''ඒක හරිම දුක්මුසුයි, හර්කියුලිස් උතුමාණෙනි. ඒත් කරුණාකරලා අපිට පොඩි බුරුලක් දෙන්න. අපි නරක මිනිස්සු නෙමෙයි.''

තමා සාර්ථක යැයි ඇය සිතුවාය. හර්කියුලිස් පැකිළුණේය. ඉන්පසු ඔහුගේ හඬ තද විය. ඔහු හිස සැලුවේය. ''මේ දූපතේ විරුද්ධ පැත්තෙ අර කඳුවලට එපිටින්, ඔයාලට ගංගාවක් හමුවෙයි. ඒ ගංගාවෙ මැද ඇචිලස[1] කියල මහලු දෙවියෙක් ජීවත් වෙනවා.''

තමා ඔවුන්ට දෙන මේ තොරතුරු ඔවුන් බියපත් කරනු ඇතැයි සිතාමෙන් හර්කියුලිස් නැවතුණේය.

''ඉතිං...?'' ජේසන් විමසුවේය.

1 Achelous පොටාමස් හෝ ගංගා දෙවියා

''ඉතිං.'' හර්කියුලිස් පැවසුවේය. ''මට ඕනෙ ඔයාල එයාගෙ අනෙක් අඟ ගලවලා මගෙ ළඟට ගේන්න.''

''එයාට අං තියෙනවද?'' ජේසන් පැවසුවේය. ටිකක් ඉන්න... එයාගෙ අනෙක් අඟ? මොකක්ද?

''ඒක තේරුම් ගන්න.'' දෙවියා පැවසුවේය. ''මෙන්න, මේක උදව්වක් වේවි.''

ඔහු උදව්වක් යන වචනය පැවසුවේ හිරිහැරයක් යන්න හැඟවෙන පරිද්දෙනි. ඔහුගේ කබාය අස්සෙන් කුඩා පොතක් එළියට ගත් හර්කියුලිස් එය පිපර් අතට දුන්නේය. ඇය එය අතට ගත්තාය.

පොතේ දීප්තිමත් කවරයේ ග්‍රීක දේවස්ථාන සහ සිනාසෙමින් සිටින රාක්ෂයන්ගේ සිතුවම් පෙන්නුම් කෙරිණි. මිනෝටර් මහපට ඇඟිල්ල ඉහළට යොමු කරගෙන සිටියේය. *මාරි නොස්ට්‍රම් වෙත හර්කියුලිස්ගේ මාර්ගෝපදේශනය* යනුවෙන් එහි සඳහන් කර තිබිණි. ''ඉර බහින්න කලින් මට ඒ අඟ අරන් එන්න.'' හර්කියුලිස් පැවසුවේය. ''ඔයාල දෙන්න විතරයි. යාළුවොත් එක්ක සම්බන්ධ වෙන්න බැහැ. ඔයාලගෙ නැව දූන් තියෙන තැනම තියෙයි. ඔයාල සාර්ථක වුණොත්, ඔයාලට මධ්‍යධරණිය පහු කරන්න පුළුවන් වෙයි.''

''අපිට බැරිවුණොත්?'' ඇයට පිළිතුර අවැසි නොවුවත් ඇය විමසුවාය.

''හොඳයි, ඇචිලස් ඔයාලව මරල දායි. නිසැකවම.'' හර්කියුලිස් පැවසුවේය. ''ඒ වගේම මම මගෙ අත් දෙකෙන් ඔයාලගෙ නැව දෙකට කඩලා, ඔයාලගෙ යාළුවන්ව කලින්ම සොහොනට යවන්නම්.''

ජේසන් තම අඩිය එසවීය. ''අපිට අපූරු සිංදුවක් කියන්න බැරිද?''

''මම යනවා.'' හර්කියුලිස් උදාසීනව පැවසුවේය. ''ඉරබහින කොට. නැත්නම් ඔයාලගෙ යාළුවො මැරෙයි.

# 27
# පිපර්

**සර්පයන්ට සහ මදුරුවන්ට මාරි නොස්ට්‍රම් වෙත හර්කියුලිස්ගේ මාර්ගෝපදේශනයෙන් එතරම් උදව්වක් නොලැබිණි.**

''මේක මායාමය දූපතක් නම්.'' පිපර් පැවසුවේය. ''ඇයි ඒක අපූරු මායා දූපතක් නොවුණේ?''

කඳු ගැටයට බඩ ගෑ ඔවුහු ගල් මත අව්ව තපින කළු රතු ඉරි සහිත සර්පයන් මග හරිමින් ප්‍රවේසමෙන් වනයෙන් වැසුණු නිම්නයට පිවිසියහ. පහත් ප්‍රදේශවල පිහිටි දිය ගලා නොයන පොකුණුවල මදුරුවෝ අරක් ගෙන සිටියහ. ඔලිව්, සයිප්‍රස් සහ පයින් වැනි ගස් එහි වැඩිපුර දක්නට ලැබිණි. සයිකේඩවල සිහින් හඬත්, පීඩාකාරී තාපයත් පිපර්ට ඔක්ලහෝමාවල ග්‍රීෂ්මය සිහිගැන්වීය.

තවදුරටත් ඔවුන්ට කිසිදු ගංගාවක් හමු නොවීය.

''අපිට මොනවහරි මග ඇරෙන්න ඇති.'' පිපර් පැවසුවාය. ''අනෙක් එක, මට නම් මිත්‍රශීලි නැති දෙවියකු අතට පත්වෙන්න වුවමනාවක් නැහැ. මොකක්ද එයාගෙ නම කිව්වෙ? එච්-අ-ස්කෙච් ද?

''ඇචියෝලස්.'' ජේසන් ඇවිදින අතරම මාර්ගෝපදේශ ග්‍රන්ථය කියවීමට උත්සාහ කළේය. එබැවින් ඔහුව ගස්වල හැප්පුණු අතරම, ගල්වල පැකිලිණි. ''මෙහෙ එයාට කියන්නෙ පොටාමස්.''

''එයා හිපපොටේමස් කෙනෙක්ද?

''නෑ. පොටාමස්. ගංගා දෙවියා. මේ පොතට අනුව එයා ග්‍රීසියේ යම් ගංගාවක ආත්මයක්.''

''අපි ග්‍රීසියේ නැති නිසා, අපි හිතමු එයා ගිහින් කියලා.'' පිපර් පැවසුවාය. මේ පොත කොච්චර ප්‍රයෝජනවත්ද කියලා අනාවැකි කියන්න යන්නෙ නෑ. වෙන මොකුත් තියෙනවද?''

''කියල තියෙනවා, හර්කියුලිස් එකවතාවක් එයා එක්ක සටන් කළා කියලා.'' ජේසන් පැවසුවේය.

''හර්කියුලිස් පැරණි ග්‍රීසියේ තියෙන දේවලින් සියයට අනූනවයක් එක්කම සටන් කරල තියෙනවා.''

''ඔව්, අපි බලමු. හර්කියුලිස්ගේ කුලුනු...'' ජේසන් පිටුවක් පෙරලුවේය. ''මේකෙ කියනවා, මේ දූපතේ හෝටල් නෑ, අවන්හල් නෑ, ප්‍රවාහනයක් නෑ කියලා. ආකර්ෂණීය දේවල් විදිහට කියන්නෙ හර්කියුලිස්ගේ කුලුනු දෙක ගැනයි. අහ්, මේක සිත් ඇදගන්නා සුළුයි. ඩොලර් සලකුණ ගැන හිතන්න. ඔයා දන්නවනෙ S අකුර හරහා යන ඉරි දෙක නේද? ඒක ඇවිත් තියෙන්නෙ ස්පාඤ්ඤ වංශයකින්, ඒකෙන් පෙන්නුම් කළේ හර්කියුලිස්ගෙ කුලුනු දෙකයි ඒ අතරින් වක්‍ර වෙලා තියෙන බැනරයයි.''

නියමයි, පිපර් සිතුවාය. ජේසන් අන්තිමට ඇනබෙත් වගේ වෙලා. ඇගේ ඇගේ බුද්ධිමය නැඹුරුව ඔහුට ලැබීමට පටන්ගෙන තිබේ.

''වෙන ප්‍රයෝජනවත් දෙයක්?'' ඇය විමසුවාය.

''ටිකක් ඉන්න. මෙතන ඇචිලස් ගැන පොඩි විස්තරයක් තියෙනවා. රූමත් ඩයනීරාගේ[1] අත පතා හර්කියුලිස් මේ ගංගා දෙවියා සමඟ සටන් වැදුණේය. සටන අතරතුර, හර්කියුලිස් ගංගා දෙවියාගේ එක් අඟක් කඩා දැමුවේය. එය පළමු සශ්‍රීකත්වයේ සංකේතය විය.

''මොකේ ධාන්‍යවලද?''

''ඒක ප්‍රශංසා කිරීමේ සැරසිල්ලක්,'' ජේසන් පැවසුවේය. ''සියලුම ද්‍රව්‍ය විසුරුවා හරින අඟ? ජුපිටර් කඳවුරේ භෝජන ශාලාවේදී අපිට ටිකක් ලැබුණා. මම දැනගෙන හිටියෙ නෑ, ඇත්තටම සැබෑ එක කවුරු හරි හාදයෙක්ගෙ අඟක් කියලා.''

1 හෙරක්ලස්ගේ දෙවැනි බිරිඳ යි. හෙරක්ලස් සහ ඇචිලස් යන දෙදෙනාගේම සිත් ඇදගන්නා තරමට ඇය රූමත් වූවාය. එබැවින් ඇය දිනා ගැනීමට ඔවුන් අතර තරගයක් ඇති විය.

''ඒ වගේම අපි බලාපොරොත්තු වෙන්නෙ එයාගෙ ඉතුරු එකක් ගලවන්න.'' පිලිපා පැවසුවාය. ''මම හිතන්නේ නෑ ඒක එච්චර ලේසි වෙයි කියලා. කවුද ඩයනීරා?''

''හර්කියුලිස් ඇය සමඟ විවාහ වුණා.'' ජේසන් පැවසුවේය. ''මම හිතන්නෙ... මේකෙ ඒ ගැන කියල නෑ. ඒත් මම හිතනවා ඇයට යම් නරක දෙයක් සිද්ධ වුණා කියලා.''

හර්කියුලිස් ඔවුන්ට පැවසූ දේ ඇගේ මතකයට නැගිණි. ඔහුගේ පළමු පවුල මියගියේය. ඔහුට වස දීමට තැත් කිරීමේ ප්‍රයෝගයකදී දෙවැනි බිරිඳ මරණයට පත් විය. මේ අභියෝගයට ඇය තුළ වූ කැමැත්ත තව තවත් අඩුවිය.

කඳු ගැට දෙකක් අතර තිබූ දෝරුවකට අසීරුවෙන් ඇවිද ආ ඔවූහු සෙවණක නැවතීමට උත්සාහ කළත්, පිපර් දූනටමත් දහදියෙන් පෙඟී සිටියාය. මදුරුවෝ ඇගේ දණහිස්වල අත්වල සහ ගෙලේ කැළැල් ඉතිරි කළහ. එබැවින් ඇය වසූරිය රෝගියකු සේ පෙනී ගියේය.

ඇයට අවසානයේ ජේසන් සමඟ තනිවීමට කාලයක් ලැබී තිබුණ අතර මේ ඔවුන්ට එය ගෙවා දැමීමට සිදු වී ඇති ආකාරයයි.

ජේසන් හේරා ගැන සඳහන් කිරීම පිපර්ව කෝපයට පත් කරවන්නක් වුවත්, ඔහුට දොස් පැවරීමට තමාට නොහැකි බව ඇය දූන සිටියාය. සමහරවිට ඔහු සමඟ කේන්ති ගැනීම සාමාන්‍යයෙන් සිදු වන්නක් විය හැකිය. ජුපිටර් කඳවුරේ සිටිතාක් ඇය අනේක විධ කරදර සහ අමනාපකම් නිසා හඬා වැටී ඇත.

සියුස්ගේ පුතුන් ගැන හර්කියුලිස්ට තමා සමඟ පැවසීමට වුවමනා වූයේ කුමක්දැයි ඇය පුදුමයට පත් වූවාය. ඔවුන් විශ්වාස කළ නොහැකිද? ඔවුන් සිටින්නේ දරාගත නොහැකි තරම් පීඩනයකින්ද? ජේසන් මියගිය විට දෙවියකු බවට පත්වන අයුරු ඇය සිතින් මවා ගත්තාය. සාගරයට පිවිසෙන දොරටුවක් මුර කරමින්, වෙරළේ සිටගෙන සිටීමට ඔහුට සිදුවන අතර, පිපර් සහ අන් සැවොම දූන සිටි ඔහුගේ මනුෂ්‍ය ජීවිතය මිය යනු ඇත.

ඔවූහු පා ගමනින් පහළට බැස ඊළඟ නිම්නයට පිවිසෙද්දී, ආගෝ II හි කුමක් සිදුවෙමින් ඇත්දැයි පිපර් කල්පනා කළාය. ඇයට අයිරිස්- පණිවුඩයක් යැවීමට සිතුණත්, ඔවුන්ගේ මිතුරන් සමඟ සබඳතා නොපවත්වන ලෙස හර්කියුලිස් අනතුරු අඟවා තිබිණි. සිදුවෙමින් පවතින්නේ කුමක්දැයි ඇනබෙත්ට අනුමාන කිරීමට හැකි වෙතැයිද,

වෙරළ වෙත තවත් කණ්ඩායමක් යැවීමට උත්සාහ නොදරණු ඇතැයිද ඇය අනුමාන කළාය. ඔහුට තවදුරටත් කරදර කළොත් හර්කියුලිස් කුමක් කරාවිදැයි ඇයට සිතාගත නොහැකි විය. නොඉවසිලිමත් කෝච් හෙජ් බැලිස්ටාව දම් පැහැති මිනිසාට එල්ල කරයිද, නැතහොත් නැවේ පිරිස එයිඩෝලන්ස්ලා විසින් අත්පත් කරගෙන හර්කියුලිස් විසින් ඔවුන්ව සිය දිවි නසා ගැනීමට බල කරනු ඇතැයිද ඇයට සිතිණි.

පිපර් වෙව්ලා ගියාය. වේලාව කීයදැයි ඇය දැන නොසිටි නමුත්, දැනටමත් හිරු බැස යාමට පටන්ගෙන තිබිණි. මෙච්චර ඉක්මනට දවස ගත වුණේ කොහොමද? උණුසුම අඩුවීම නිසා හිරු බැසයාම ගැන ඇයට ඇති වූයේ සතුටකි. එහෙත් එයම ඔවුන්ගේ අවසානයට තීරණය කරන වෙලාවද වූයේය. අනෙක් අතට හෙට ජුලි පළමුවෙනිදාය. Kalends Of July. ඔවුන්ගේ තොරතුරු නිවැරදි නම්, එය නිකෝ ද ආන්ජලෝගේ ජීවිතයේ අවසන් දවස මෙන්ම රෝමය විනාශවන දිනයද වනු ඇත.

''නවතින්න.'' ජේසන් පැවසුවේය.

වරද කුමක්දැයි පිපර්ට සිතාගත නොහැකි විය. ඉදිරියෙන් ගලන දිය පහරක හඬ තමාට ඇසෙන බව එවිට ඇයට අවබෝධ විය. ගස් අතරින් ඉදිරියට ගිය ඔවුන්ට දැක ගැනීමට ලැබුණේ ඔවුන් ගං ඉවුරක් වෙතට පැමිණ ඇති අන්දමයි. ගංගාව අඩි හතළිහක් පමණ පළලින් යුක්ත වුවත්, ගැඹුර අඟල් කීපයකට වැඩි නොවීය. මෘදු පාෂාණ සහිත ගං පතුල මතින් රිදී පැහැ දිය ගලාගෙන ගියේය. ගඟ පහළට යාර කීපයක් ඇදී යනවිට ජලය තද නිල් පැහැති සිදුරකට ඇද වැටිණි.

ගංගාව පිළිබඳ යම් දෙයක් ඇයව කරදරයට පත් කළේය. ගස්මත වූ සයිකේඩ නිසල වී තිබිණි. කුරුල්ලන්ගේ හඬ නිහඬ වී තිබිණ. ජලය දේශනයක් පවත්වනවා මෙනි. මෙහි ඉඩ ඇත්තේ ජලයේ හඬට පමණක්මය වැනි හැඟීමක් එයින් ඇති විය.

එහෙත් පිපර් තව තවත් කන්දෙන විට ගංගාව තව තවත් ආරාධනා කරන බව පෙනිණි. ඇයට දිය බීමට අවශ්‍ය විය. සමහර විට ඇයට පාවහන් ගැලවීමට සිදුවනු ඇත. ඇගේ දෙපා සැබැවින්ම පෙඟී තිබිණි. ඒ වගේම අර පිහිනුම් සිදුර... ජේසන් සමඟ එයට පැන ගස් සෙවණේ නිදහසේ සිසිල් ජලයේ පාවීමට එතැන කොතරම් අපූරුද. කොතරම් විචිත්‍රවත්ද.

පිපර් ගැස්සුණාය. මේ සිතිවිලි ඇගේ ඒවා නොවේ. යම් වරදක් සිදු වී තිබිණි. ගංගාව වශී කතා කියවන බවට හැඟීමක් ඇයට ඇතිවෙමින් තිබිණි.

''ඕක නවත්වන්න!'' පිපර් ගංගාවට කෑ ගැසුවාය.

ජේසන් පුදුමයෙන් බැලුවේය. ''මොකක් නවත්වන්නද?''

''ඔයාට නෙමෙයි.'' පිපර් පැවසුවාය. ''ඔහුට.''

ගංගාවට අත දිගුකිරීම ගැන මෝඩ හැඟීමක් ඇති වූ නමුත්, එයින් යම් ආකාරයක මායාවක්, ඔවුන්ගේ හැඟීම් වසඟ කිරීම වැන්නක් සිදුවන බව ඇයට නිශ්චිතව කිවහැකි විය.

ඇය එසේ සිතන විට, ඇය එය පරාජය කළ අතර, ජේසන් ඇයට එසේ කියනු ඇත. ගංගාව කතා කරන ලෙසින්: *මට සමාවෙන්න. මට ඉතිරි වී ඇති එක සතුටක් නම් ගීත ගායනයයි.* සෝපානයක් එසවෙන්නාක් මෙන් පිහිනුම් සිදුරෙන් රුවක් මතු විය.

පිපර්ගේ දෙවුර ගැස්සිණි. ඒ ඇය ඇගේ පිහි තලයෙන් දුටු සත්ත්වයාය. මිනිස් මුහුණක් තිබූ ගවයාය. ඔහුගේ සම ජලය තරමට නිල් පැහැති විය. ඔහුගේ කුර ගං මතුපිට ඉහළ පහළ යමින් තිබිණි. ඔහුගේ ගව ගෙලෙහි මුදුනේ වූයේ කළු පැහැති කෙටි බොකුටු කොණ්ඩයක් සහිත මිනිස් හිසකි. පැරණි ග්‍රීක ශෛලීයේ පබළු කන් පළඳනා දෙකක් කන්වල විය. ද්විනාභි කණ්ණාඩිවලට පිටුපසින් වූයේ ගැඹුරු, දුක්මුසු පෙනුමකි. මුව උල්වී තිබිණි. හිසේ වම් පැත්තෙන් දඟර ගැසුණු කළු සහ සුදු පැහැයෙන් යුත් එක් අඟක් ඉහළට නෙරා තිබුණේය. මේ අසමතුලිතබව නිසා ඔහුගේ හිස වම් පැත්තට මඳක් ඇල වී තිබුණු බැවින් ඔහු දිස්වූයේ කනේ සිරවූ ජලය ඉවත් කිරීමට උත්සාහ කරන්නකු ලෙසය.

''හෙලෝ.'' ඔහු දුක්මුසුව පැවසුවේය. ''මම හිතන්නේ, ඇවිත් තියෙන්නෙ මාව මරන්න.''

තම සපත්තු පසෙකින් තැබූ ජේසන් සෙමින් නැඟිට්ටේය. ''ආහ්. හොඳයි.''

''නෑ!'' පිපර් මැද්දට පැන්නාය. ''මට සමාවෙන්න. මේක ලැජ්ජා සහගතයි. අපිට ඔයාට කරදර කරන්න ඕනෙ වුණේ. නැහැ. ඒත් අපිව එව්වෙ හර්කියුලිස්.''

''හර්කියුලිස්!'' ගව මිනිසා සුසුමක් හෙලුවේය. පහරදීමට සුදානමින් මෙන් ඔහුගේ කුර ජලයට පහර දුන්නේය. ''මට නම් එයා හැම වෙලාවෙම හෙරක්ලස්. ඒක තමයි එයාගෙ ග්‍රීක නම, ඔයාල දන්නවනෙ, හේරාගේ තේජස.''

''අපූරු නම.'' ජේසන් පැවසුවේය. ''එදා ඉඳන් ඔහු ඇයට වෛර කරනවා.''

''ඇත්තවශයෙන්ම.'' ගව මිනිසා පැවසුවේය. ''සමහරවිට ඒක වෙන්න ඇති රෝමවරු එයාගෙ නම හර්කියුලිස් කියල වෙනස් කරන කොට එයා විරුද්ධ නොවුණෙ. ඇත්තටම, ගොඩක් මිනිස්සු එයාව දන්නෙ ඒ නමින්... එයාගෙ සලකුණ.''

''ඔයාද ඇචිලස්ද?'' පිපර් විමසුවාය.

ගව මිනිසා තම ඉදිරි පාද නවා හිස පහත් කර ආචාර කළේය. එයින් පිපර්ට ඇතිවූයේ සතුටක් මෙන්ම තරමක කනගාටුවකි. ''ඔබේ සේවයට. අති විශේෂ ගංගා දෙවියා. කාලෙක ග්‍රීසියේ මහා ගංගාවෙ ආත්මය. දැන් මෙහෙට පිටුවහල් කරලා. මගෙ පරණ හතුරගෙ දූපතේ විරුද්ධ පැත්තට. ඕහ්, දෙවිවරු කෲරයි! ඒත් එක්කො එයාල අපිව මෙච්චර ළඟට දැම්මෙ මට නැත්නම් හර්කියුලිස්ට දඬුවම් කරන්න වෙන්න ඇති. මට ඒක කවදාවත් හරියටම කියන්න බැහැ.''

ඔහු කියන්නේ කුමක්දැයි පිපර්ට හරි හැටි අවබෝධයක් නොතිබුණත්, පසුබිමේ වූ ගංගාවේ හඬ නැවත ඇගේ මනස ආක්‍රමණය කරමින් තිබිණි. ඇයට කොතරම් දාහය සහ පිපාසය ඇත්දැයි සහ පිහිණීම කොතරම් අපූරුදැයි ඇගේ මතකයට නැංවෙමින් තිබිණි. ඇය සිත එකඟ කර ගැනීමට උත්සාහ කළාය.

''මම පිපර්.'' ඇය පැවසුවාය. ''මේ ජේසන්. අපිට සටන් කරන්න ඕනෙ නැහැ. ඒක මේ හෙරක්ලස්- හර්කියුලිස්- ඒ කවුරුහරි, අපිව පිස්සු වට්ටලා මෙතෙන්ට එව්වේ.''

ගයියාව අවදි කරවන යෝධයින්ව නැවැත්වීමට පැරණි භූමියට යන ගවේෂණය ගැන ඇය පැහැදිලි කළාය. රෝමන්වරුන් සහ ග්‍රීක්වරු එකට එක්වීමෙන් සෑදුණු තම කණ්ඩායම ගැන ඇය විස්තර කළාය. එසේම ඒ පිටුපස සිටින්නේ හේරා බව දැනගත් විට හර්කියුලිස් අධික කෝපයට පත්වූ ආකාරයද ඇය පැහැදිලි කළාය.

''ආහ්.'' මගේ කෙල්ලේ, පුරාවෘත්ත සත්‍යයක්. ආත්ම, ජල ම්ලේච්ඡයෝ.''

ඇයට නැවත ඉකි බිඳීම සමඟ සටන් කිරීමට සිදුවිය. ඇය ඇචිලස්ට ඒ ගැන සියල්ල පැවසුවේ නැත. ''කො- කොහොමද?''

''ගංගා දෙවිවරු ගොඩක් දේවල් දන්නවා.'' ඔහු පැවසුවේය. ''අපොයි, ඔයාල අවධානය යොමු කරල තියෙන්නෙ වැරදි කතාවකට.

ඔයාල රෝමෙට ගියොත්, ගංවතුර ගැන කතාව හොඳින්ම දැනගන්න පුළුවන් වෙයි.''

''පිපර්?'' ජේසන් විමසුවේය. ''මොනව ගැනද එයා කියවන්නේ?''

ඇගේ සිතුවිලි බහුරූපේක්ෂණ වීදුරුවක් තරමට එක්විටම අවුල් වී ගියේය. ගංවතුර ගැන කතාව... ඔයාලට රෝමයට යන්න ලැබුණොත්.

''ම-මට හරියටම විශ්වාස නැහැ.'' ඇය පැවසුවාය. එහෙත් ගංවතුර කතාව ගැන සඳහන් ඇතින් වූ සීනු හඬක් මෙන් නාද දුන්නේය. ''ඇචිලස්, මට තේරෙන්නේ නැහැ.''

''නෑ. ඔයාට තේරෙන්නේ නෑ.'' ගං දෙවියා අනුකම්පාවෙන් පැවසුවේය.

''අසරණ කෙනා, තවත් කෙල්ලෙක් සියුස්ගෙ පුතාට අහුවෙලා.''

''මිනිත්තුවක් ඉන්න.'' ජේසන් පැවසුවේය. ''ඇත්තටම ඒ ජුපිටර්. ඒ වගේම ඇය කොහොමද අසරණ කෙනෙක් වෙන්නේ?''

ඇචිලස් ඔහුව නොසැලකුවේය. ''මගේ කෙල්ලේ, ඔයා දන්නවද හර්කියුලිස් එක්ක වුණ මගෙ සටනට හේතුව?''

''ඒ කාන්තාවක් නිසා.'' පිපර් පැවසුවාය. ''ඩයනීරා?''

''ඔව්.'' ඇචිලස් සුසුමක් පිට කළේය. ''ඒ වගේම ඔයා දන්නවද එයාට මොකද වුණේ කියලා?''

''ආහ්...'' පිපර් ජේසන් දෙස බැලුවාය.

මාර්ගෝපදේශන පොත අතට ගත් ඔහු එහි පිටු පෙරලන්නට පටන් ගත්තේය. ''ඒක ඇත්තටම-''

ඇචිලස් සෙමින් ගෙරවූයේය. ''ඒ මොකක්ද?''

ජේසන් ඇසිපිය ගැසුවේය. ''මේ... මාරි නොස්ට්‍රම් වෙත හර්කියුලිස්ගේ මාර්ගෝපදේශනය. එයා අපට මාර්ගෝපදේශන පොත දුන්නා ඉතිං.''

''ඒක පොතක් නෙමෙයි.'' ඇචිලස් විරෝධය පෑවේය. ''එයා මගෙ හම ගලවනව වගේ දෙයක් කළේ? එයා දන්නවා මම ඒවට වෛර කරනවා කියලා.''

''ඔයා වෛර කරනවා... පොත්වලට?'' පිපිර් විමසුවාය.

''නැහැ!'' ඇචිලස්ගේ මුහුණ හැකිළුණේය. ඔහුගේ නිල් සම දම් පැහැයට හැරිණි. ''ඒක පොතක් නෙමෙයි.''

ඔහු ගං දියට පාදයෙන් පහරක් දුන්නේය. කුඩා රොකට්ටුවක් මෙන් ඉහළ නැගී පොතක් ඔහු ඉදිරිපිට පතිත විය. ඔහු තම කුරවලින් එය විවෘත කළේය. ජලයට ඔරොත්තු දෙන කහ පැහැති පාච්මන්ට් කැබැල්ල දිග හැරිණි. එහි වූයේ වියැකී ගිය ලතින් අක්ෂර සහ අතින් අඳින ලද සිතුවම් කීපයකි.

''මේකයි පොත.'' ඇචිලස් පැවසුවේය. ''ඕහ්, බැටළු සමේ ගන්ධය. මේක මගේ කුර යට තියෙන එක මට සතුටක්. ඔයාලට ඒක කොපි කරනව වගේ දෙයක් කරන්න බැහැ.''

ඔහු කෝපයෙන් ජේසන් අත තිබූ මාර්ගෝපදේශ පොත දෙස බැලුවේය.

''ඔයාල වගේ අද කාලෙ තරුණයෝ අලුත් යාන්ත්‍රික උපකරණවල හිරවෙලා. පිටු බැඳිලා. අක්ෂරවල පුංචි චතුරශ්‍ර කුර වලට ඔරොත්තු දෙන්නෙ නෑ. ඒක බැඳපු පොතක්. ඒත් ඒක සම්ප්‍රදායික පොතක් නෙමෙයි. ඒ වෙනුවට කවදාවත් පරණ පත්තරයේ ලියවිල්ලක් යොදන්න බැරිවෙයි.''

''හ්ම්, මම දැන් මේක පැත්තකින් තියන්නම්.'' ඔහු පොත නවා තම පිටුපස සාක්කුවට දමා ගත්තේය.

ඇචිලස් මඳක් සන්සුන් වූ බව පෙනිණි. එය පිපර්ට අස්වැසිල්ලක් විය.

''දැන්.'' ඇචිලස් පැවසුවේය. ඔහු තම පොතේ වූ ඡායාරූපයකට තට්ටු කළේය. ''මේ තමයි ඩයනීරා.''

පිපර් දණ නවා පහළ බැලුවාය. අතින් ඇඳි රූපය කුඩා වුවත්, කාන්තාව බෙහෙවින් රූමත්, දිගු කෙස් කළඹක් හා කළු දෑස් ඇති තැනැත්තියක බව ඇයට පෙනී ගියේය. ඇගේ කෙලිලොල් සිනාව මොවුන්ව උමතු කරවන්න ඇත.

''කැලිඩොන්හි කුමරිය.'' ගංගා දෙවියා දුක්මුසුව පැවසුවේය.

''හර්කියුලිස් මැද්දට එනකම් ඇය මට පොරොන්දුවක් දීල හිටියෙ. එයා සටනට බල කළා.''

''එයා ඔයාගෙ අඟ කැඩුවා?'' ජේසන් අනුමාන කළේය.

''ඔව්.'' ඇචිලස් පැවසුවේය. ''මම ඒකට කවදාවත් එයාට සමාව දෙන්නෙ නැහැ. එක අඟක් තියාගෙන ඉන්න එක හරිම අපහසුවක්. ඒත් අසරණ ඩයනීරාගෙ තත්ත්වය ඊටත් වඩා නරක් වුණා. මා සමඟ විවාහ වුණා නම් එයාට ප්‍රීතිමත්, දීර්ඝ ජීවිතයක් ගත කරන්න තිබුණා.''

''මිනිස් හිසක් තියෙන ගවයෙක්.'' පිපර් පැවසුවාය. ''ගංගාවක ජීවත් වෙනවා.''

''නිසැකවම.'' ඇචිලස් එකඟ විය. ''එයා ප්‍රතික්ෂේප කරන්න හේතුව ඒක වෙන්න බෑ. ඒ වෙනුවට, එයා හර්කියුලිස් එක්ක ගියා. එයා කඩවසම්, දේහධාරී වීරයව තෝරගත්තෙ, එයාට හොඳින් සලකන විශ්වාසවන්ත සැමියෙක් වෙයි කියන විශ්වාසයෙන්. හර්කියුලිස් හොඳ සැමියෙක් වෙන්න බැරි තරමට එයාගෙම ප්‍රශ්නවල පැටලිලා හිටියෙ. එයා ඒ වෙනකොටත් එක බිරිඳක්ව මරල දාල තිබුණා. හේරා ඔහුට සාප කළා. ඉතිං ඔහු පළිගන්න ඔහුගේ මුළු පවුලම මරල දැම්මා. භයානක වැඩක්. ඒ නිසා තමයි තපසක් විදිහට ඔහුට අර වැඩ දොළහ කරන්න වුණේ.''

පිපර් තැතිගැන්මට පත් වූවාය. ''පොඩ්ඩක් ඉන්න... හේරා එයාව උමතු කළා වගේම හර්කියුලිස්ට තපසට යන්න වුණා.''

ඇචිලස් දෙවුර සැලුවේය. ''ඔලිම්පියානුවෝ කවදාවත් එයාලගෙ අපරාධවලට ගෙවන්නෙ නෑ. ඒ වගේම නිතරම සියුස්ගේ දරුවන්ට වෛර කළා... එහෙම නැත්නම් ජුපිටර්ගෙ.'' ඔහු අවිශ්වාසයෙන් ජේසන් දෙස බැලුවේය. ''කොයි විදිහකින් හරි මගේ අසරණ ඩයනීරාට ශෝකජනක අවසානයක් අත්වුණා. හර්කියුලිස්ගෙ බොහෝ අනිසි සම්බන්ධකම් ගැන එයා ඊර්ෂ්‍යා කළා. එයා ලෝකෙ පුරාම සෙල්ලක් කාරකමේ ඇවිද්දා. හරියට එයාගෙ සියුස්, එයාට හමුවෙන හැම ගෑනිටම අඟර දඟර පානව වගේ. අන්තිමේදී බලාපොරොත්තු සුන් වූ ඩයනීරා නරක උපදෙස්වලට ඇහුම්කන් දුන්නා. නෙස්සුස් කියන කෛරාටික නරාශ්වයා කිව්වා ඇයට සදාකාලිකව හර්කියුලිස්ගෙ විශ්වාසය දිනා ගන්න ඕනෙ නම්, හර්කියුලිස්ගෙ ප්‍රියතම කමිසයේ යම් නරාශ්වයකුගේ රුධිරය විසුරුවා දැමිය යුතුයි කියලා. අවාසනාවකට නෙස්සුස් කිව්වේ බොරුවක්. එයාට ඕනෙ වුණේ හර්කියුලිස්ගෙන් පළිගන්න. ඩයනීරා ඔහුගේ උපදෙස් පිළිපැද්දා, ඒත් හර්කියුලිස් විශ්වාසයන්ත සැමියෙක් වීම වෙනුවට.''

''නරාශ්ව රුධිරය හරියට අම්ල වගේ.'' ජේසන් පැවසුවේය.

''ඔව්.'' ඇචිලස් පැවසුවේය. ''හර්කියුලිස්ට වේදනාකාරී මරණයක් අත්වුණා. තමන් මොකක්ද කළේ කියන එය ඩයනීරාට අවබෝධ වෙන කොට, ඇය...'' ගංගා දෙවියා තම ගෙල හරහා ඉරක් ඇන්දේය.

''ඒක හරිම භයානකයි.'' පිපර් පැවසුවාය.

''ඒ වගේම සදාචාරාත්මකයිද මගේ කෙල්ලේ?'' ඇචිලස් පැවසුවේය.

''සියුස්ගෙ පුතුන්ගෙන් ප්‍රවේසම් වෙන්න.''

පිපර්ට තම පෙම්වතා දෙස බැලීමට නොහැකි විය. ජේසන් කිසිවිටෙක හර්කියුලිස් මෙන් නොවනු ඇත. එහෙත් ඒ කතාවෙන් ඇගේ සියලු බිය නැති වූයේය. හර්කියුලිස්ව මෙහෙයවූවා සේම, හේරා ඔවුන්ගේ ඥාතිත්වයද මෙහෙයවනු ඇත. ජේසන් කිසිදාක හර්කියුලිස් මෙන් මිනීමරු උමතුවකට පත් නොවනු ඇතැයි ඇය විශ්වාස කළාය. එහෙත් නැවතත්, එයිඩෝලන්ගේ පාලනයට නතු වූ ඔහු පර්සි ජැක්සන් මරා දැමීමට උත්සාහ කර ගත වී තිබුණේ සිව් දිනක් පමණකි.

''හර්කියුලිස් දැන් දෙවි කෙනෙක්.'' ඇචිලස් පැවසුවේය. ඔහු විවාහ වුණේ හෙබි කියන තරුණ දෙවඟන සමඟ ඒත් තවමත් එයා ගෙදර ඉන්නෙ කලාතුරකින්. එයා අර මෝඩ කුලුනු මුර කරමින් මේ දූපතේ ජීවත් වෙනවා. එයා කියනවා මේක කරන්න කිවවේ සියුස් කියලා. මම හිතන්නේ එයා එයාගේ අමරණීය ජීවිතෙ ගැන දුක්වෙන්න මෙතන තෝරගත්ත කියලයි. මගෙ පෙනී සිටීම එයාට එයාගෙ වැරදීම් මතක් කරනවා. විශේෂයෙන් එයා අන්තිමට මරා දමපු කාන්තාව. ඒ වගේම එයාගෙ පෙනී සිටීම මට මගෙ බිරිඳ වෙන්න හිටපු අසරණ ඩයනීරාව මතක් කරවනවා.''

ගව මිනිසා දිග හැරී තිබුණ ලියැවිල්ලට තට්ටු කළේය. එය හැකිලී ජලයේ ගිලී ගියේය.

''හර්කියුලිස්ට මගෙ අනිත් අඟ ඕනෙ වෙලා තියෙන්නෙ මට අවමන් කරන්න.'' ඇචිලස් පැවසුවේය. ''සමහරවිට ඒකෙන් එයාට තමන් ගැන හොඳ හැඟීමක් ඇතිවෙනව ඇති. මමත් දුක්වෙන බව දන්න නිසා. අනෙක් අතට අඟ කෝනුකෝපියාවක්[1] බවට පත්වෙනවා.

1 අඟක හැඩයෙන් යුත් විශාල බහාලුමකි. ආහාර හෝ යම් ආකාරයක වස්තුවක් ලබාගැනීමට හැකිය. හෙරක්ලස් (රෝම - හර්කියුලිස්) ගංගා දෙවි ඇචිලස් සමග වූ සටනේදී හර්කියුලිස් විසින් ඇචිලස්ගේ අඟ ගලවා දැමූ පසු මෙය නිර්මාණය විය.

හොඳ ආහාරයක්. කිසිම සැකයක් නෑ. හර්කියුලිස් කෝනුකෝපියා ව එයා වෙනුවෙන් තියා ගනියි. ඒක ශෝකාන්තයක් වගේම නාස්තියක් වෙයි.''

ගංගා දෙවියාගේ හඬත්, ගංගාවේ හඬත් තවමත් තම සිතිවිලිවලට බලපෑම් කරන්නේ දැයි පිපර්ට ඇති වූයේ සැකයකි. එහෙත් ගංගා දෙවියාට එකඟ නොවී සිටීමට ඇයට නොහැකි විය. ඇය හර්කියුලිස්ට  වෛර කිරීමට පටන් ගත්තාය. මේ අසරණ ගව මිනිසා බෙහෙවින් දුක්වන බවත්, හුදෙකලාව සිටින බවත් පෙනිණි.''

ජේසන් කටහඬ අවදි කළේය. ''මට සමාවෙන්න, ඇචිලස් ඇත්තටම ඔයාට හොඳ ගනුදෙනුවක් තියෙන්නෙ. ඒත් සමහරවිට... අනෙක් අඟ නැති වුණාම ඔයාව පැත්තකට බරවෙන එකක් නෑ. හොඳ සුවපහසු බවක් දැනෙයි.''

''ජේසන්!'' පිපර් විරෝධය පෑවාය.

ජේසන් තම දෑත් එසවූයේය. ''නිකම් සිතුවිල්ලක් විතරයි. අනෙක් අතට, අපිට විකල්ප ගොඩක් තියෙනවා කියලා මට පේන්නෙ නෑ. හර්කියුලිස්ට මේ අඟ නොලැබුණොත්, එයා අපිවයි, අපේ යාලුවොයි මරල දායි.''

''එයා හරි.'' ඇචිලස් පැවසූවේය. ''ඔයාලට විකල්පයක් නැහැ. අන්න ඒකයි, ඔයාල මට සමාව දෙයි කියල මම බලාපොරොත්තු වෙන්නෙ.''

පිපර් මුහුණ හැකිළුවාය. ගංගා දෙවියාගේ කතාව කෙතරම් හද පාරවන්නක් වීද යත් හිස අතගෑමට ඇයට සිතිණි. ''සමාවෙන්නෙ මොකටද?''

''මටත් වෙන විකල්පයක් නෑ.'' ඇචිලස් පැවසුවේය. ''මට ඔයාලට නවත්තන්න වෙනවා.''

ගංගාව පුපුරා හැලිණි. දිය කඳක් පිපර් මත පතිත විය.

# 28
# පිපර්

පිපර්ව ඇදගත් ජල ප්‍රවාහය ඇයව ගැඹුරුට ගෙන ගියේය. බේරීමට දැරී උත්සාහයෙන් ඵලක් නොවිණි. ඇය තම මුව තදින් වසා ගනිමින් හුස්ම නොගෙන සිටීමට උත්සාහ කළත් අධික බිය නිසා ඇයට එය වැඩි වේලාවක් රඳවා ගැනීමට නොහැකි විය. දිය බුබුළු හැරුණුකොට ඇයට වෙනත් කිසිවක් දැක ගැනීමට නොහැකි විය. ඇයට ඇසුණේ ඇගේම දඟලීමේ හඬත්, සැඩපහරේ ගර්ජනයත් පමණකි.

ඉන්පසු එක්විටම වාගේ ඇයව පතුලට ඇධ ගෙන, දිය මතුපිටට විසිකර දැමිණි. තමා දිය සුළියකට මැදිව සිටින බවත්, හුස්ම ගැනීමට හැකි වුවත්, එතැනින් නිදහස් වීමට නොහැකි බවත් ඇයට අවබෝධ විය.

යාර කීපයකට එපිටින්, දියමතුපිටට පැමිණි ජේසන් ගැහෙමින් සිටියේය. එක් අතක ඔහුගේ අසිපත විය. ඔහු අසිපත වැනුවත් එතැන පහර දීමට කිසිවක් නොතිබිණි.

පිපර්ගේ දකුණු පැත්තේ, අඩි විස්සක් පමණ එපිටින්, ඇචිලස් ජලයෙන් මතු වූයේය. ''මට ඇත්තටම මේ ගැන කනගාටුයි.'' ඔහු පැවසුවේය.

තමාව ගංගාවෙන් ඉවතට ගෙන යාමට සුළඟ කැඳවමින්, ජේසන් ඔහු දෙසට ගැටුවේය. එහෙත් ඇචිලස් ක්‍රියාකාරී අයකු මෙන්ම

වඩාත් බලවත් අයකු විය. දිය රැළි ජේසන් මත කඩා හැලුණු අතර ඔහුව නැවතත් දිය යටට ගෙන ගියේය.

''ඒක නවත්තන්න!'' පිපර් බෙරිහන් දුන්නාය.

දිය සුළියකට මැදිව සිටින විට වශී බස් පැවසීම පහසු නොවෙතත්, ඇය ඇචිලස්ගේ අවධානය දිනා ගැනීමට සමත් වූවාය.

''මට කනගාටුයි, මට නවත්වන්න බැහැ.'' ගංගා දෙවියා පැවසුවේය. ''මට බැහැ හර්කියුලිස්ට මගෙ අනෙක් අඟ ගන්න ඉඩ හරින්න. ඒක නිග්‍රහයක් වෙයි.''

''තවත් විදිහක් තියෙනවා!'' පිපර් පැවසුවාය. ''ඔයාට අපිව නොමර ඉන්න වෙනවා.''

ජේසන් නැවතත් මතුපිටට පැමිණීමට සමත් විය. කුඩා කුණාටු වළාවක් ඔහුගේ හිසට ඉහළින් නිර්මාණය විය. ගෙරවීම් හඬ ඇසෙන්නට විය.

''ඒ එකක්වත් කරන්න එපා, ජුපිටර්ගේ පුත්‍රයාණෙනි,'' ඇචිලස් පැවසුවේය. ''ඔයා අකුණට කතා කළොත්, ඔයාගෙ පෙම්වතියටත් විදුලි සැර වදින්න පුළුවන්.''

ජලය නැවතත් ජේසන්ව දිය යටට ගෙන ගියේය.

''එයාට යන්න දෙන්න.'' පිපර් ඇයට හැකි උපරිම තරමට ඔහුව නම්මාගත හැකි අයුරින් තම හඬ පාලනය කර ගත්තාය. ''මම පොරොන්දු වෙනවා, මම හර්කියුලිස්ට අඟ ගන්න ඉඩ දෙන්නෙ නැහැ කියලා.''

ඇචිලස් හැකිළුණේය. ඔහු ඇය දෙස බැලුවේය. ඔහුගේ හිස වම් පැත්තට ඇලවී තිබිණි. ''මම ඔයා කියන දේ විශ්වාස කරනවා.''

''මම එහෙම කරනවා.'' පිපර් පොරොන්දු වූවාය. හර්කියුලිස් අධමයෙක්. ඒත්, කරුණාකරලා, මුළින්ම මගෙ යාලුවට යන්න දෙන්න.''

ජේසන් දියයට ගිලුණු තැන ජලය කැළඹෙන්නට විය. පිපර්ට කෑගැසීමට වුවමනා විය. කොච්චර වෙලාවක් එයාට හුස්ම නොගෙන ඉන්න පුළුවන් වෙයිද?

ඇචිලස් තම උපැස් යුවළ යටින් පිපර් දෙස බැලුවේය. ඔහුගේ ස්වභාවය මෘදු වී තිබිණි. ''එහෙමද. ඔයා මගෙ ධයනීරා වෙයි. මගෙ අඩුව පුරවන මනමාලිය වෙයි.''

''මොකක්?'' ඔහු පැවසූ දේ තමාට හරියට ඇසුණා දැයි පිපර්ට සැක සිතිණි. ''අහ්, ඇත්තටම, මම හිතමින් හිටියෙ-''

''ඔහ්, තේරෙනවා.'' ඇචිලස් පැවසුවේය. ''ඔයාට මේක ඔයාගෙ පෙම්වතා ඉස්සරහ කියාගන්න බැහැ, ලැජ්ජාව නිසා. ඇත්තවශයෙන්ම ඔයා නිවැරදියි. සියුස්ගෙ පුතාට පුළුවන් තරමට වඩා ගොඩක් හොඳින් මම ඔයාට සලකන්නම්. අන්තිමට සියවස් ගණනකට පස්සෙ මට මේ සියලු දේවල් හරිගස්සන්න පුළුවන්. මට ඩයනීරාව ආරක්ෂා කර ගන්න බැරිවුණා. ඒත් මට ඔයාව ආරක්ෂා කරන්න පුළුවන්.''

දැන් තත්පර තිහක් ගෙවී ගොසින්ද? විනාඩියක්ද? ජේසන්ට එතරම් වේලාවක් අල්ලාගෙන සිටිය නොහැකිය.

''ඔයාට ඔයාගෙ මිත්‍රයන්ට මැරෙන්න අරින්න වෙනවා.'' ඇචිලස් කියාගෙන ගියේය. ''හර්කියුලිස් කේන්ති ගනී, ඒත් මට ඔයාව එයාගෙන් ආරක්ෂා කරන්න පුළුවන්. අපිට එකතු වෙලා හොඳ සතුටින් ඉන්න පුළුවන්. අපි මේ ජේසන් හාදයව ගිල්වලා මරණ එක පටන් ගමුද?''

පිපර්ට එය ඉවසා සිටීමට නොහැකි වුවත්, ඇය සිත පාලනය කරගත යුතු විය. ඇය තම කෝපයත්, බියත් සඟවා ගත්තාය. ඇය ඇප්‍රොඩයිට්ගේ දියණිය වූවාය. ඇයට පාවිච්චි කිරීමට මව ලබාදුන් උපකරණ තිබිණි.

ඇය හැකිතරම් විනීත සිනාවක් පා ඇගේ අත් එසවූවාය. ''මාව උඩට උස්සන්න. කරුණාකරලා.''

ඇචිලස්ගේ මුහුණ දීප්තිමත් විය. පිපර්ගේ අත ඩැහැගත් ඇචිලස් ඇයව දිය සුළියෙන් පිටතට ඇද්දේය.

ඇය මින් පෙර කිසිදිනෙක ගවයකුගේ පිටේ නැග තිබුණේ නැත. එහෙත් අර්ධ ලෝහිත කඳවුරේදී සෑදලය නොමැතිව පෙගාසස්ගේ පිටේ යාමට ඇය පුහුණු වූවාය. කළ යුත්ත ඇයට මතක් විය. තම වේගය ප්‍රයෝජනයට ගනිමින් ඇය එක පයක් ඇචිලස්ගේ පිටට තැබුවාය. ඉන්පසු ඇය තම දෙපා ඇචිලස්ගේ ගෙල වටා යවා සිර කර, එක් අතක් උතුරු දණ්ඩ වටා යවා, අනිත් අතින් තම පිහිය ඇද ගත්තාය. ඇය පිහි තලය ගංගා දෙවියාගේ නිකටට තබා තද කළාය. ''ජේසන්ට යන්න අරින්න.'' ඇය නියෝග කළාය. ''දැන්ම!''

තම සැලසුමේ බොහෝ දෝෂ ඇති බව ඇය අවබෝධ කරගෙන සිටියාය. ගංගා දෙවියාට පහසුවෙන්ම ජලයේ ගිලී යාමේ

හැකියාව තිබිණි. නැතිනම් ඇයව තල්ලු කර දමා ඇයව දියේ ගිල්ලවිය හැකිය. එහෙත් ඇයගේ වශී බස් වැඩ කරන බව පෙනිණි. එසේත් නැතිනම් තව දුරටත් සිතීමට නොහැකි තරමට ඇචිලස් පුදුමයට පත් වී සිටියා විය හැකිය. ඔහු ලස්සන කෙල්ලෙකුට තමාගේ ගෙල කැපීමට ඉඩ නොදෙන බව පෙනිණි.

මිනිස් කාලතුවක්කු උණ්ඩයක් මෙන් ජේසන් ජලය තුළින් නික්මුණේය. ඔහු ඔලිව් ගසක අත්තේ එල්ලී තණකොළ ගොඩ මතට ගැටුවේය. ඔහුට එතරම් සුවදායී හැඟීමක් නොදැනුණත්, ඔහු දෙපසින් නැගිටීමට උත්සාහ කළේය. ඔහු තම කඩුව ඔසවන විට අඳුරු වළාකුළු ගංගාවට ඉහළින් රොක් වන්නට විය.

පිපර් ඔහු දෙස අනතුරු ඇඟවීමේ බැල්මක් හෙලුවාය. දැන්ම *නෙමෙයි.* ඇය තවමත් නොගිලී හෝ විදුලි සැරයකට හසු නොවී ගංගාවෙන් පිට විය යුතුය.

ප්‍රයෝගයක් කරන්නාක් මෙන් ඇචිලස් තම පිට නැමුවේය. පිපර් පිහිය ඔහුගේ ගෙලට තබා තවත් තද කළේය.

''හොඳ හරකෙක් වෙන්න.'' ඇය අනතුරු ඇඟවූවාය.

''ඔයා පොරොන්දු වුණා.'' ඇචිලස් දත්මිටි කමින් පැවසුවේය. ''ඔයා පොරොන්දු වුණා හර්කියුලිස්ට මගෙ අඟ දෙන්නෙ නෑ කියලා.''

''එයාට ලැබෙන්නෙ නෑ.'' පිපර් පැවසුවාය. ''ඒත් මම ගන්නවා.''

තම පිහිය එසවූ පිපර් දෙවියාගේ අඟ කපා දැමුවාය. දිව්‍යමය ලෝකඩ තලය තෙත මැටි පිඩක් කපා දමන තරම් පහසුවෙන් අඟ මුලින් කපා දැමුවේය. ඇචිලස් වේදනාවෙන් දඟලුවේය. ඔහු ප්‍රකෘති තත්ත්වයට පත්වීමට පෙර, පිපර් ඔහුගේ පිට මත සිටගත්තාය. එක් අතක පිහියත් අනෙක් අතේ අඟත් සමඟින් ඇය ඉවුරට පැන්නාය.

''ජේසන්.'' ඇය කෑ ගැසුවාය.

දෙවියන්ට ස්තුතිවන්ත වන්නට, ඔහු තේරුම් ගත්තේය. සුළං ප්‍රවාහයකින් ඇයව ආරක්ෂිතව ඉවුරට උඩින් රැගෙන ගියේය. ලෝහමය ගන්ධයකින් වාතය පිරී ගියේය. ඇය ගංගාව දෙස හැරී බැලුවාය.

ජලය මතට හඬ නගමින් අකුණක් පතිත විය. විදුලි රේඛා ගංගාව පුරා ඇදී ගියේය. කහ පැහැති තිත්වලින් ඇසේ දෑස් අවහිර වෙද්දී ඇචිලස් වකුටු වී, දිය යට ගිලී යන අයුරු ඇය බලා සිටියාය.

ජේසන් දුවමු.'' ඇගේ දෑස් තවමත් බොඳ වී තිබුණත්, ගත බියෙන් සලිතව තිබුණත්, ඇය ජේසන් සමඟ වන ලැහැබට වැදුණාහ.

කඳු ගැටයට නගිද්දී, ගවයාගේ අඟ ඇගේ ළයට තුරුළු කරගෙන සිටින විට ඇයට දුකක් දැනෙන බව ඇයට වැටහිණි. එහෙත් ඒ බිය නිසාද, අස්වැසිල්ල නිසාද නැතිනම් මහලු ගංගා දෙවියට ඇය කළ දේ ගැන ලජ්ජාව නිසාද යන්න ඇයට වටහා ගත නොහැකි විය.

කඳු මුදුනට ළඟාවන තෙක්ම ඔවුහු වේගය අඩාල නොකළහ. ඇයට මෝඩ හැඟීමක් දැනුණත්, ඇය නැවතී, හඬමින්, ජේසන් දිය යට දඟලන අවස්ථාවේ සිදු වූ දේ පැහැදිලි කළාය.

''පිපර්, ඔයාට විකල්පයක් තිබුණෙ නෑ.'' ඔහු තම අත ඇගේ උරහිස මත තැබුවේය. ''ඔයා මගෙ ජීවිතේ බේරුවා.''

තම දෑස් පිස දැමූ ඇය, තමාව පාලනය කර ගැනීමට උත්සාහ කළාය. හිරු ක්ෂිතිජය වෙත ළං වෙමින් තිබිණි. ඔවුන් ඉක්මනින්ම හර්කියුලිස් වෙත නොගියොත්, ඔවුන්ගේ මිතුරන් මිය යනු ඇත.

''ඇචිලස් ඔයාට බල කළා.'' ජේසන් පැවසුවේය. ''අනෙක් අතට, අකුණෙන් එයා මැරුණද කියන එක මට සැකයි. එයා පැරණි දෙවි කෙනෙක්. ඔයාට එයාව විනාශ කරන්න ඕනෙ නම් එයාගෙ ගංගාව විනාශ කරන්න වෙනවා. ඒ වගේම අඟ නැතිව එයාට ජීවත් වෙන්න පුළුවන්. හර්කියුලිස්ට අඟ දෙන්නෙ නෑ කියල කිව්වෙ බොරුවක් නම්, හොඳයි.''

''මම බොරු කියන්නෙ නෑ.''

ජේසන් ඇය දෙස බැලුවේය. ''පිපර්... අපිට විකල්පයක් නැහැ. හර්කියුලිස් අපිව මරයි.''

''හර්කියුලිස් මේකට සුදුසු නැහැ.'' මේ කෝපය කෙසේ පැමිණෙන්නේ දැයි පිපර්ටවත් සිතා ගැනීමට නොහැකි විය. එහෙත් ඇගේ ජීවිතයේදී කිසිදු දෙයක් සම්බන්ධයෙන් ඇයට මෙතරම් නිශ්චිත හැඟීමක් ඇති වී නොතිබිණි.

හර්කියුලිස් ආත්මාර්ථකාමියෙකි. ඔහු මිනිසුන් බොහෝමයකට රිදවා තිබිණි. එසේම ඔහුට දිගටම ඔවුන්ව දඬයම් කිරීමට අවශ්‍ය විය. සමහරවිට ඔහුට අයහපත් විකෘතියක් තිබුණා විය හැකිය. සමහරවිට දෙවියන් ඔහුට පයින් ගැසුවා විය හැකිය. එහෙත් එය සමාවට කරුණක් නොවීය. වීරයාට දෙවියන් පාලනය කිරීමට නොහැකි වුවත්, ඔහුට ඔහුව පාලනය කර ගැනීමට හැකි විය යුතුය.

ජේසන් කිසිවිටෙකත් එවැන්නකු නොවනු ඇත. ඔහු කිසිවිටෙකත් තම ප්‍රශ්නවලට අනුන්ට දොස් පවරන්නකු නොවන අතර, එඩිරිවාදිකම් වලට වඩා හරිදේ කරන්නකු වනු ඇත.

''මට සැලැස්මක් තියෙනවා.'' පිපර් පැවසුවාය.

කළ යුතු දේ ඇය ජේසන්ට පැවසුවාය.

''ඔයා කියන ඕනෙ දෙයක්.'' ඔහු පොරොන්දු විය. ඉන්පසු ඔහු කීපවාරයක් ඇසි පිය ගැසුවේය. ''අපි මැරෙන්න යන්නෙ, ඒත් මමත් ඉන්නවා.''

හර්කියුලිස් ඔවුන් පිටත්ව යන විට සිටි තැන ඔවුන් බලාපොරොත්තුවෙන් රැඳී සිටියේය. ඔහු කුලුනු දෙක මැදින් පෙනෙන ආගෝ II දෙස බලාගෙන සිටියේය. එයට පිටුපසින් හිරු බැස යමින් තිබිණි. නෞකාව හොඳින් තිබුණත්, පිපර්ගේ සැලසුම ඇයට අමුතු හැඟීමක් ඇති කරවමින් තිබිණි.

නැවත සලකා බැලීමට ප්‍රමාද වැඩිය. ඇය දැනටමත් ලියෝට අයිරිස් පණිවුඩයක් යවා තිබුණාය. එසේම හර්කියුලිස් දකිත්ම, ඔහුට අවශ්‍ය දෑ නොදෙමියි යන නිශ්චිත හැඟීමක් වෙන කවර දාටවත් වඩා ඇය තුළ ඇතිවෙමින් තිබිණි.

ඇය ගවයාගේ අඟ රැගෙන එන විට හර්කියුලිස් වෙතින් කිසිදු දීප්තිමත් බවක් දක්නට නොලැබුණත් ඔහුගේ රවා බැලීම අඩු වී ගියේය.

''හොඳයි.'' ඔහු පැවසුවේය. ''ඔයාල ඒක ගෙනාවා. ඒ නිසා ඔයාලට නිදහසේ යන්න පුළුවන්.''

පිපර් ජේසන් දෙස බැලුවාය. ''ඔයාට ඇහුණනෙ. එයා අපිට අවසර දුන්නා.'' ඇය නැවත දෙවියා දෙසට හැරුණාය. ''ඒ කියන්නෙ අපේ නැවට මධ්‍යධරණීය පහුකරන්න පුළුවන්?''

''ඔව්, ඔව්.'' හර්කියුලිස් තම ඇඟිලි පිරිමැද්දේය. ''දැන්, අඟ.''

''නෑ.'' පිපර් පැවසුවාය.

දෙවියා රැව්වේය. ''සමාවෙන්න?''

ඇය කෝනුකෝපියාව එසවූවාය. ඇය එය ඇචිලස්ගෙන් කපා ගත් පසු, අඟෙහි කුහරය නැතිවී ගොස්, ඇතුළත මෘදු හා අඳුරු බවට පත්වී තිබිණි. එය මායා බලයකින් වූවක් නොව, එහි බලය හේතුවෙන් සිදු වූවකි.

''ඇචිලස් නිවැරදියි.'' ඇය පැවසුවාය. ''ඔහු ඔබගේ වන තරමට ඔබ ඔහුට සාපයක්. වීරයෙක් විදිහට ඔයා සමාව ගන්න ඕනෙ.''

ඇය ජපන් බස කතා කරනවාක් මෙන් හර්කියුලිස් ඇය දෙස බලා සිටියේය. ''ඔයා තේරුම් ගන්න ඕනෙ මට මගෙ ඇඟිලි වලින් ඔයාලව මරන්න පුළුවන් කියලා.'' ඔහු පැවසුවේය. ''මට පුළුවන් ඔයාලගෙ නැව දෙකට කැඩෙන්න මගෙ මුගුර විසි කරන්න. මට පුළුවන්-''

''ඔයාට පුළුවන් කට වහගන්න.'' ජේසන් පැවසුවේය. ඔහු තම අසිපත ඇද්දේය. ''සමහරවිට සියුස් ජුපිටර්ගෙන් වෙනස් ඇති. මොකද ඔයා වගේ හැසිරෙන කිසිම සහෝදරයෙක් එක්ක මගෙ සම්බන්ධයක් තියෙන එකක් නෑ.'' හර්කියුලිස්ගේ ගෙලෙහි වූ නහර ඔහුගේ ලෝගුව තරමටම දම් පැහැති විය.

''මම මරල දාපු පළවෙනි උප දෙවියා ඔයා නෙමෙයි.''

''ජේසන් ඔයාට වඩා හොඳයි.'' පිපර් පැවසුවාය. ''ඒත් කරදර වෙන්න එපා. අපි ඔයා එක්ක සටන් කරන්නෙ නෑ. අපි අඟත් අරගෙන මේ දූපතෙන් පිට වෙන්න යන්නෙ. ඒක ත්‍යාගයක් විදිහට භාරදෙන්න ඔයා සුදුසු කෙනෙක් නෙමෙයි. මම ඒක මගෙ ළඟ තියාගන්නවා. ඒකෙන් මට අසරණ ඇචිලස්වයි, ඩයනීරාවයි මතක් වෙයි.''

දෙවියාගේ නාස්පුඩු රතු විය. ''ඒ නම කියන්න එපා! ඔයා බරපතලව හිතුවෙ නෑ , මම ඔයාගෙ පෙම්වතා ගැන කරදර වෙන බව. කවුරුවත් මම තරම් ශක්තිමත් නැහැ.''

''මම ශක්තියක් ගැන කිව්වෙ නැහැ.'' පිපර් පැවසුවාය. ''මම කිව්වේ එයා තමයි හොඳම කියලයි.''

පිපර් අඟෙහි මුව හර්කියුලිස් දෙසට යොමු කළාය. ජුපිටර් කඳවුරේ සිටි කාලයේ සිට ඇය තුළ පැවති අමනාපය, සැක සහ කෝපය ඉවත් කළාය. ජේසන් ග්‍රේස් සමඟ තමා හුවමාරු කරගත් හොඳ දේවල් සියල්ල- ග්‍රෑන්ඩ් කැනියමෙන් ඉහළට පැමිණීම, අර්ධ ලෝහිත කඳවුරේ වෙරළේ ඇවිදීම, තරු දෙස බලමින්, අත් අල්ලාගෙන ගී ගැයීම කෙරෙහි ඇය සිත යොමු කළාය.

ඇය අනාගතය ගැන සිතුවාය. යෝධයන් පරාජය වූ විට, ගයියා නිදනු ඇත. ඔවුන්ට එක්ව සතුටින් ජීවත් වීමට හැකිවනු ඇත. ඇය මේ සිතිවිලි වලින් තම සිත පුරවා ගත්තාය. කෝනුකෝපියාව උණුසුම් වන බව ඇයට දැනිණි.

ඇචිලස්ගේ ගංගාව තරම් ප්‍රබලත්වයකින් අඟ පුපුරා ගොස් ආහාර ගංගාවක් විසිරී ගියේය. නැවුම් පළතුරු, බදින ලද ආහාර, දුම් දමන හැම් වලින් හර්කියුලිස් සම්පූර්ණයෙන්ම යටවී ගියේය. මේ සියලු දෑ අඟෙහි මුවවිටේ කෙසේ සිරවී තිබුණේ දැයි පිපර්ට සිතා ගැනීමට නොහැකි විය.

නිවෙසක් පිරවීමට තරම් කෑම වර්ග විසිරවීමෙන් පසු අඟ තම කාර්යය නතර කළේය. ඒවාට යටවූ යම් තැනක සිට හර්කියුලිස් කෑ ගසමින් නිදහස් වීමට දඟලන හඬ ඇයට ඇසිණි.

''යන්න!'' ඇය ජේසන්ට පැවසූාය. සැලැස්මේ තම කොටස අමතක කර ඔහු පුදුමයෙන් පළතුරු ගොඩ දෙස බලාගෙන සිටියේය. ''යන්න.!''

පිපර්ගේ ඉන වටා ඇත දෑමු ඔහු සුළඟ කැඳවූයේය. ඔවුහු ඉහළට ඇදී ගොස් දූපතෙන් ඉවත් වූහ.

දූපත දර්ශනයෙන් මැකී යද්දී, කෑම ගොඩ මැදින් හර්කියුලිස්ගේ හිස මතුවිය. පොල් බෑයක්, යුද හිස් වැසුමක් සේ ඔහුගේ හිස මත රැඳී තිබිණි. ''මරන්න!'' ඔහු නියෝග කළේ ඔහුට එවැනි විධානයක් ගැන බොහෝ පළපුරුද්ද ඇතිවාක් මෙනි.

ජේසන් ආගෝ II හි තට්ටුව මතට ගොඩබැස්සේය. ලියෝ තමන්ගේ කොටස ඉටු කර තිබිණි. නැවේ හබල් ඒ වනවිටත් ගුවන්ගත වීමේ අවස්ථාවට පරිවර්තනය වී තිබිණි. නැංගුරම එසවිණි. ජේසන් ඔවුන්ට අහසට එසවීමට තරම් ප්‍රබල සැඩ සුළඟක් කැඳවූයේය. ඒ අතර පර්සි අඩි දහයක් පමණ උසැති රළ තරංග වෙරළ කරා යැව්වේය. මුහුදු වතුර හා අන්නාසි වැස්සට යටවූ හර්කියුලිස් දෙවැනි වරටද ඇද වැටුණේය.

දෙවියා දෙපයින් නැගී සිට, පොල් ගෙඩිවලින් දමා ගසන විට, ආගෝ II මධ්‍යධරණියට ඉහළ වළාකුළු අතරින් යාත්‍රා කරමින් සිටියේය.

# 29
# පර්සි

**පර්සිට ආදර හැඟීමක් නොතිබිණි.**

දුෂ්ඨ මුහුදු දෙවියන් විසින් ඔහුව ඇට්ලැන්ටාවල අඩපණ කරන තරමට තත්ත්වය නරක් වී තිබුණේය. ඉන්පසු ආගෝ II ට පහර දුන් යෝධ කුණිස්සාව නැවැත්වීමේදී ද ඔහු අසාර්ථක විය. ඊළඟට, චිරොන්ගේ සහෝදරයන් වූ ඉක්තියෝසෙන්ටෝරයන්ට ඔහුව මුණ ගැසීමට පවා වුවමනාවක් නොතිබිණි.

ඒ සේරටම පසු, ඔවුහු හර්කියුලිස් කුලුනු අභියසට පැමිණියහ. ජේසන් තම අර්ධ සොහොයුරා වූත් සෑම කාලයේදීම වඩාත් ප්‍රකටම උප දෙවියා වූත් හර්කියුලිස් හමුවන තුරු ඔහුට නෞකාවේ රැඳී සිටීමට සිදු විය. පර්සිට ඔහුව හමුවීමටවත් නොහැකි විය.

*හරි, සත්තකින්ම.* පිපර් පසුව පැවසූ දේ අනුව හර්කියුලිස් අධමයෙකි. එහෙත් තවමත්... පර්සිට නැව් තට්ටුව මතට වී පියවර තැබීම වෙහෙසකර කටයුත්තක් විය.

විවෘත මුහුදු ඔහුගේ බල ප්‍රදේශ ලෙස සැලකිණි. සියලු දෙනාගේ ආරක්ෂාව වෙනුවෙන් පියවර ගැනීමට පර්සි කල්පනා කළේය. අත්ලාන්තික් සයුර පුරා ඔහේ පැමිණි ගමනේදී මෝරුන් සමඟ පුංචි කතාබහක නියැළීම සහ කෝච් හෙජ්ගේ රූපවාහිනී තේමා ගීතයට සවන් දීම හැර වෙනත් යමක් නොකළේය.

ප්‍රශ්න තවත් නරක අතට හරවමින්, චාල්ස්ටන් වලින් පිටත් වූ තැන් සිට ඇනබෙත් අන් කවරදාටත් වඩා ඔහුගෙන් දුරස් වී සිටියාය. ඇය වැඩි කාලයක් ඇගේ කුටියට වී, ඇය සම්ටාර් කොටුවෙන් අහුලා ගත් ලෝකඩ සිතියම අධ්‍යයනය කිරීමට කාලය වැය කළාය. එසේත් නැතිනම් ඩායාඩාලුස්ගේ ලැප්ටොප් පරිගණකයෙන් තොරතුරු විමසුවාය.

පර්සිට ඇය හමු වූ ඕනෑම විටෙක ඔවුන්ගේ සංවාදය මේ ආකාරයෙන් පැවතිණි.

පර්සි- ''හේයි, කොහොමද ඒක කෙරෙන්නෙ?''

ඇනබෙත්- ''ආහ්, නෑ ස්තුතියි.''

පර්සි -''හරි... අද ඔයා මොකුත් කෑවද?''

ඇනබෙත්- ''මම හිතන්නෙ අද ලියෝ තමයි රාජකාරියෙ ඉන්නෙ. එයාගෙන් අහන්න.''

ඇය සමහර අවස්ථාවල හැසිරුණේ මේ ආකාරයෙනි. එය ඇතීනා කෙල්ලන්ට ඔසප් සමයේ මුහුණ පෑමට වන අභියෝගයක් වූයේය. තවමත්, ඇගේ අවධානය දිනා ගැනීමට තමා කුමක් කළ යුතුදැයි ඔහුට සිතා ගැනීමට නොහැකි විය. සම්ටාර් කොටුවේදී ඇයට මකුළුවන්ගේ එදිරිවාදිකමට මුහුණ පෑමට සිදුවීමෙන් පසු, පර්සි ඇය ගැන කරදරයෙන් පසු වූයේය. එසේම ඇයට උදව් කරන්නේ කෙසේද කියා ඔහු නොදත්තේය. විශේෂයෙන් ඇය ඔහුව මඟහරින විටෙක...

හර්කියුලිස් කුලුනු වලින් පිටත් වීමෙන් පසු නෞකාව ගවනේ සැතපුම් සියයක් පමණ යාත්‍රා කර තිබිණි.

ඔවුන් අසා තිබූ තරමට පැරණි භූමීන් නරක නොවෙතැයි පර්සි අපේක්ෂා කළේය. එහෙත් එය සම්පූර්ණයෙන්ම වෙළෙඳ දැන්වීමක් මෙන් විය. ඔබට ඉක්මනින්ම වෙනස පෙනී යනු ඇත.

පැයකදී කීපවතාවක්ම, යමෙකින් නෞකාවට පහර එල්ල විය. මාංශ භක්ෂක ස්ටිම්පලියන් පක්ෂි රෑනක් රෑ අහසේ සැරිසැරූ අතර ෆෙස්ටස් ඔවුන් වෙත ගිනි දලු විද්දේය. කුණාටු ආත්ම නැව් බඳ අවට කරකැවෙන්නට විය. ජේසන් අකුණකින් ඔවුන් පුපුරවා හැරියේය. කෝච් හෙජ් නැව් තට්ටුවේ රාත්‍රී ආහාරය ගන්නා අතරතුර, කැලෑ පෙගාසසයෙක් කොහේ හෝ සිට පැමිණ, කෝච්ගේ පාදයකට පයින් ඇන නැවත ඉගිල ගියේ, උගේ කුර සලකුණු නැව් තට්ටුවේ ඉතිරි කරමිනි.

''මොන විකාරයක්ද ඒ?'' කෝච් කෑ ගැසුවේය.

පෙගාසස්ගේ දර්ශනයක් සමඟ බ්ලැක්ජැක් මෙහි ඇතැයි පර්සිට සිතිණි. ඔහුට දින ගණනකින් තම මිතුරාව දැක ගැනීමට නොලැබිණි. ටෙම්පෙස්ට් හා ඒරියන්ද පෙනෙන්නට නොසිටියේය. සමහරවිට මධ්‍යධරණියේ ගමන් කිරීමට ඔවුන්ට වුවමනා නැතිවා විය හැකිය. එය එසේ නම්, පර්සිට ඔවුන්ට වරද පැටවීමට නොහැකිය.

අවසානයේ මධ්‍යම රාත්‍රිය ආසන්නයේදී, ගුවන් ප්‍රහාර නවයකට හෝ දහයකට පසුව, ජේසන් ඔහු දෙසට හැරුණේය. ''ඔයා ටිකක් නිදා ගත්ත නම් හොඳ නැද්ද? මට පුළුවන් තරම් වෙලාවක් මම දිගටම අරුන්ව අහසෙන් පන්නල දාන්නම්. ඊට පස්සෙ ඉක්මනින්ම අපිට මුහුදට යන්න පුළුවන්. ඔයාට තැන හොයාගන්න පුළුවන්.''

සුළං ආත්ම කෝපයෙන් පහර දෙමින් යාත්‍රාව සොලවද්දී තමාට නිදාගත හැකිවේදැයි පර්සිට වූයේ සැකයකි. එහෙත් ජේසන්ගේ අදහසේද ගත යුත්තක් තිබිණි. පහළ තට්ටුවට ගිය ඔහු තම බංකුවේ දිගෑදුනේය.

ඇත්තවශයෙන්ම, ඔහුට බියකරු රෑ සිහින නොමැති සාමකාමී නින්දක් නොලැබිණි.

සිහිනයේ ඔහු සිටියේ අඳුරු ලෙනක් තුළය. ඔහුට දැකගත හැකි වූයේ ඉදිරියේ අඩි කීපයක් පමණක් වුවත්, අවකාශය බෙහෙවින් විශාල විය. යාබද කොහේ හෝ තැනක ජලය ගලා ගියේය. ඈත බිත්තිවලින් ශබ්දය දෝංකාර දුන්නේය. වාතයේ චලනය අනුව ලෙනෙහි පියස්ස බෙහෙවින් උස් විය යුතු යැයි පර්සි සැක කළේය.

ඔහුට බරතී අඩි ශබ්දයක් ඇසිණි. එපියාල්ටිස් සහ ඔටිස් නිවුන් යෝධයෝ අඳුර තුළින් නික්මුණහ. පර්සිට ඔවුන්ව පිළිකුල් වීමට ඔවුන්ගේ කොණ්ඩය පමණක් ප්‍රමාණවත් විය. එපියාල්ටිස්ගේ කොණ්ඩය ගොතා රිදී සහ රන් කාසි එල්ලා තිබිණි. ඔටිස්ට තිබුණේ ගොතන ලද පෝනි ටේලයකි. එහි... *ඒවා රතිඤ්ඤාද?*

ඔවුන්ගේ ඇඳුම් සමාන වුවා සේම, නියතවම රාත්‍රී සිහිනයකට ගැලපුණේය. ඔවුහු හැඳ සිටියේ සමාන සුදු පැහැති බුරුල් කලිසම් සහ V හැඩයේ ගෙලක් සහිත රන් පැහැති මුහුදු කොල්ලකරුවන්ගේ කමිසය. ඒවායින් ඔවුන්ගේ පපුවේ රෝම ඕනෑවටත් වඩා ඉලිප්පී පෙනිණි. දිලිසෙන ගල් ඇල්ලූ ඉන පටිවල කිනිසි කොප්පු දුසිම් ගණනක් එල්ලී තිබිණි. ඔවුන්ගේ පාවහන් වූයේ විවෘත ඇඟිලි සහිත

සෙරෙප්පුය. එයින් තහවුරු වූයේ ඔවුන් පාදවල සර්පයන් ගැටගසා ගෙන සිටින බවයි. සෙරෙප්පු පටි සර්පයන්ගේ බෙල්ලට ගැට ගසා තිබුණේය. ඇඟිලි තිබෙන තැන්වල වූයේ සර්පයන්ගේ හිස්ය. තැතිගත් සර්පයෝ ඔවුන්ගේ දිව එළියට අදිමින්, ඔවුන්ගේ රන් පැහැති දෑස් සෑම අතකටම යොමු කළහ.

යෝධයෝ පර්සි ඉදිරිපිට සිට ගත්හ. එහෙත් ඔවුහු ඔහු කෙරෙහි අවධානයක් නොදැක්වූහ. ඒ වෙනුවට ඔවුහු බලා සිටියේ අන්ධකාරය දෙසය. ''අපි මෙතන.'' එපියාල්ටිස් පැවසුවේය. ඔහුගේ ගුගුරන හඬ ලෙනෙහි බිත්තිවල වැදී දෝංකාර දුන්නේය.

ඇතින් යමෙකු පිළිතුරු දුන්නේය. ''ඔව්. මට ඒක පේනවා. ඔය ඇඳුම් අඳුරගන්න අමාරු නැහැ.''

ඒ හඬ පර්සිගේ උදරය අඟල් හයක් පහතට ඇද දැමීමට සමත් විය. එය පැහැදිලිවම ගැහැනු හඬක් වුවත් කිසිසේත්ම මනුෂ්‍යයකුගේ නොවිණි. සෑම වචනයක් සමඟම විවිධ තාන සහිත පිඟීමක් විය. එය හරියට අප්‍රිකානු මාරක මී මැස්සකු ඉංග්‍රීසි කතා කිරීමට ඉගෙන ගන්නවා වැනිය.

ඒ ගයියා නොවේ. පර්සිට එය සහතිකය. එහෙත්, ඒ කුමක්වුවත්, නිවුන් යෝධයෝ කලබලයට පත් වූහ. තම සර්පයන් මත නැගී ඔවුහු ගෞරව සම්ප්‍රයුක්තව හිස් පහත් කළහ.

''ඇත්තවශයෙන්ම, ස්වාමි දියණියනි, එපියාල්ටිස් පැවසුවේය. ''අපි ගෙනාවා ප්‍රවෘත්තියක්.''

''ඇයි නුඹලා ඔය විදිහට ඇඳුම් ඇඳගෙන ඉන්නේ?'' අඳුරේ සිටි දෙස විමසුවේය. ඇය කිසිවිටෙක සමීපයට එන බවක් නොපෙනුණි. එය පර්සිට අස්වැසිල්ලක් විය.

එපියාල්ටිස් තම සොහොයුරා වෙත නොරිස්සුම් බැල්මක් හෙලුවේය. ''මගේ සහෝදරයා තමයි යම් වෙනස් දෙයක් අඳිමු කිව්වේ. අවාසනාවකට-''

''ඔයා කිව්වා අද පිහිය විසි කරන්නෙ මමයි කියලා.'' ඔටිස් විරෝධය පෑවේය.

''මම කිව්වේ මමයි පිහි විසිකරන්නා කියලයි. ඔයා මැජික්කාරයා. ආහ්, මට සමාවෙන්න, ස්වාමි දියණියන, ඔයාට අපේ වාදය අහන්න ඕනෙ නැහැ. ඔබේ ඉල්ලීම පරිදි අපි පැමිණියා. ඔබට ප්‍රවෘත්තියක් අරගෙන. නෞකාව ළඟා වෙනවා.''

ස්වාමි දියණිය, ඇය කුමක් වුවත්, වේගවත් පිඹීම් මාලාවක් පිට කර හැරියාය. දෙදරීමත් සමඟ, ඇය සිනාසෙන බව පර්සිට අවබෝධ විය.

''කොච්චර දුරද?'' ඇය විමසුවාය.

''දවල් කෑමෙන් ටික වෙලාවකට පස්සෙ එයාල රෝමයට ගොඩබැසිය යුතුයි, මම හිතන්නේ.'' එපියාල්ටිස් පැවසුවේය. ''ඇත්තවශයෙන්ම, එයාල රන් කොලුවා හොයාගෙන එයි.''

රන් කොලුවා ඔහුගේ ප්‍රියතම පුද්ගලයා නොවූ සේ ඔහු විරිත්තුවේය.

''මම අපේක්ෂා කරනවා එයාල ආරක්ෂිතව පැමිණේවි කියලා.'' ස්වාමි දියණිය පැවසුවාය. ''එයාලව ගොඩක් ඉක්මනින් අහුවෙන එක අපේ විනෝදය නැති කිරීමක් වෙයි. නුඹලා සේරම සූදානම් කළාද?''

''එහෙමයි, ස්වාමි දියණියනි.'' ඔටිස් පියවරක් ඉදිරියට තබත්ම, ගුහාව දෙදරුවේය. ඔටිස්ගේ වම් පතුල යටින් පැල්මක් මතු විය.

''ප්‍රවේසමෙන්, මෝඩයා.'' ස්වාමි දියණිය ගිගිරුවාය. ''අමාරු විදිහකට ආපහු ටාටරස් ළඟට යන්න උඹට ඕනෙද?''

ඔටිස් පිටුපසට ගැටුවේය. ඔහුගේ මුහුණ බියෙන් හැකිලී තිබිණි. ඝන පාෂාණයක් මෙන් දිස් වූ ඒ පොළොව, ඔහු ඇලස්කාවේ දී ඇවිද ගිය ග්ලැසිරයකට බෙහෙවින් සමාන බව පර්සිට අවබෝධ විය. එහි සමහර තැන් ඝන වූ අතර, අනෙක් තැන් එසේ නොවීය. සිහිනය තුළදී ඔහුට බරෙන් ගැටලුවක් නොවීම ගැන ඔහු සතුටු විය.

''මෙතැන අල්ලගෙන ඉන්නෙ තව ටිකයි.'' ස්වාමි දියණිය පැවසුවාය. ඇත්තටම මගෙ කුසලතාව හැරුණාම සියවස් ගාණක ඇතීනාගෙ කෝපයට විතරයි හොඳින් අල්ලගන්න පුළුවන්. ඒ වගේම ශ්‍රේෂ්ඨ පෘථිවි මාතාව පහළ ඇගේ නිද්දෙ සිට අපව කළඹනවා. මේ බලවේග දෙක මැද, හොඳයි... මගෙ කැඳැල්ල තරමක් බාදනය වෙලා. අපි බලාපොරොත්තු වෙමු මේ ඇතීනාගේ දරුවා අපිට වැඩක් ඇති ගොදුරක් බව ඔප්පු කරයි කියලා. ඇය වෙන්න පුළුවන් මගේ අවසන් කෙළිබඩුව.''

එපියාල්ටිස් අමාරුවෙන් වචන ගිල්ලේය. ඔහු පොළොවේ වූ පැල්ම දෙස බැලුවේය. ''ඉක්මනින්ම. ඒක ප්‍රශ්නයක් වෙන එකක් නෑ. ස්වාමි දියණියනි. ගයියා අවදි වෙයි. ඒ වගේම අපි හැමෝම ත්‍යාගලාභීන් වෙයි. ඔබට තවදුරටත් මෙතැන ආරක්ෂා කරන්න වෙන

එකක් නෑ. ඒ වගේම ඔබේ වැඩ සැඟවිලා කරන්න ඕනෙ වෙන්නෙත් නෑ.''

''සමහරවිට.'' අඳුරේ සිටි හඬ පැවසුවේය. ''ඒත් මගෙ පළිගැනීමේ රසය මට නැතිවුණා. අපි සියවස් ගාණක් එකතු වෙලා වැඩ කළා. එහෙම නේද?''

නිවුන්නෝ හිස නමා ආචාර කළහ. එපියාල්ටිස්ගේ හිසේ වූ කාසි දිලිසිණි. එයින් සමහරක් ඒවා රිදී ඩ්‍රැච්මා බව පර්සිට අවබෝධ විය. ඒවා ඇනබෙත්ට ඇගේ මවගෙන් ලැබුණු කාසියට හරියටම සමාන විය.

සෑම පරම්පරාවකම ඇතීනාගේ දරුවන් කීප දෙනෙක් සැඟවුණු පාතිනන් ප්‍රතිමාව සෙවීමේ ගවේෂණයට යැවූ බව ඇනබෙත් ඔහුට පවසා තිබුණාය. කිසිවකුට කිසිදා සාර්ථක වීමට නොහැකි විය.

*සියවස් ගණනාවක් අපි එකතුවෙලා වැඩකළා...*

යෝධ එපියාල්ටිස් තම කොණ්ඩය සරසාගෙන තිබුණේ සියවස් ගණනාවක් තිස්සේ උපයාගත් කාසි වලිනි- *කුසලාන සිය ගණනක්.* ඇනබෙත් මේ අඳුරු ස්ථානයේ තනිව සිටගෙන සිටිය අයුරු පර්සිට මැවී පෙනිණි. යෝධයා ඇය රැගෙන එන කාසිය ගෙන ඔහුගේ එකතුවට එක් කරන අයුරු ඔහුට මැවී පෙනුණේය. තම අසිපත ඇද, යෝධයාගේ කෙස්වැටිය ගෙල ළඟින්ම කපා දමන්නට පර්සිට වුවමනා වුණත්, එය ක්‍රියාත්මක කිරීමට බලයක් ඔහුට නොතිබිණි. ඔහුට කළ හැක්කේ බලා සිටීම පමණකි.

''ආහ්, ස්වාමි දියණියනි.'' එපියාල්ටිස් කලබලයෙන් පැවසුවේය. ''මම ඔබට මතක් කරන්න කැමතියි, ගයියා බලාපොරොත්තු වෙන්නේ කෙල්ලව පණ පිටින් රැගෙන ඒමයි. ඔයාට පුළුවන් එයාට වධ දෙන්න. එයාව උමතු කරන්න. ඇත්තවශයෙන්ම, ඔයා ප්‍රාර්ථනා කරන ඕනෙම දෙයක්. ඒත් ඇගේ රුධිරය වැහෙන්න ඕනෙ පැරණි පාෂාණ මතයි.''

ස්වාමි දියණිය පිම්බාය. ''ඒ වෙනුවෙන් අනෙක් අයව යොදාගන්න පුළුවන් වෙයි.''

''ඔ-ඔව්.'' එපියාල්ටිස් පැවසුවේය. ''ඒත් මේ කෙල්ල තමයි තෝරාගත් කෙනා. ඒ වගේම කොල්ල- පොසිඩන්ගේ පුත්‍රයා. මේ දෙන්න වැඩේට වැඩියෙන්ම ගැලපෙන්නෙ ඇයි කියලා ඔබට බලා ගන්න පුළුවන්.''

එහි තේරුම කුමක්ද යන්න පර්සිට පැහැදිලි නොවීය. එහෙත් පොළොව පාගා මේ තකතීරු රන් කම්සකාරයන් දෙදෙනා පහළට ඇද දමන්නට ඔහුට අවැසි විය. කුමන කාර්යයකටවත් තමන්ගේ ලේ වැගිරවීමට ඔහු ගයියාට ඉඩ දෙන්නේ නැත. එසේම ඇනබෙත්ට රිදවීමට ද ඔහු කිසිවකුට ඉඩ දෙන්නෙ නැත.

''අපි බලමු.'' ස්වාමි දියණිය ගිගිරුවාය. ''දැන් යන්න. ඔයාලගෙ වැඩක් බලාගන්න. ඔයාලට ඔයාලගේ කණ්ණාඩි ඇති. මම අන්ධකාරයේ වැඩ කරන්නම්.''

සිහිනය වියැකී ගියේය. පර්සි අවදි වීමට පටන් ගත්තේය.

ජේසන් ඔහුගේ විවෘත දොරට තට්ටු කළේය.

''අපි වතුරට ගොඩබානවා.'' වෙහෙසට පත්ව සිටි ජේසන් පැවසුවේය.

''ඔයාගෙ වාරේ.''

---

පර්සිට ඇනබෙත්ව අවදි කරවීමට අවශ්‍ය නොවුණත්, ඔහු එසේ කළේය. කෝච් හෙජ් පවා ඔවුන්ගේ සංවාදය ගැන තැකීමක් නොකරන බව පෙනී ගියේය. එබැවින් ඇයට තොරතුරු ලබාදීම ඇගේ ජීවිතය ආරක්ෂා කර ගැනීමට හේතුවක් වනු ඇත.

තවමත් සුක්කානම හසුරුවන ලියෝ හැර නැව් තට්ටුව මත වෙනත් කිසිවකු නොවූ බැවින් ඔවුන්ට එතැන හුදෙකලා වීමට හැකි විය. ලියෝ වෙහෙසට පත්ව සිටින බව පෙනුණත්, ඔහු නින්දට යාම ප්‍රතික්ෂේප කළේය.

''මට තවත් ග්‍රිම්ප්සිලාගේ පුදුම කිරීම් ඕනෙ නැහැ.'' ඔහු පැවසුවේය.

ස්කොලොපෙන්ඩ්‍රාගේ ප්‍රහාරය තනිකරම ඔහුගේ වරදින් සිදු නොවූවක් බව සෑම දෙනාම ලියෝට ඒත්තු ගැන්වීමට උත්සාහ කළහ. එහෙත් ඔහු ඒවාට ඇහුම්කන් නොදුන්නේය. ඔහුගේ හැඟීම් පර්සිට වටහා ගැනීමට හැකිවිය. තම වැරදිවලට සමාව නොදීම පර්සිගේ ද පැවති සුවිශේෂ ගුණයක් විය.

ඒ වනවිට පාන්දර හතර පමණ වී තිබිණි. කාලගුණය සතුටු දායක නොවීය. මීදුම කෙතරම් ඝන වීද යත්, පර්සිට ඇණියේ කෙළවර

සිටි ෆෙස්ටස්ව පවා දැකගත නොහැකි විය. පබළු තිර රෙද්දක් මෙන් උණුසුම් සිරිපොද කඩා හැලුණේය. අඩි විස්සක් පමණ උසැති රළ අතරින් ඔවුන් යාත්‍රා කරද්දී, අසරණ හේසාල් ඇගේ කුටියට වී ඔක්කාර කරන හඬ ද පර්සිට ඇසුණේය.

මේ සියල්ල පසෙක තැබූ විට, නැවත ජලයට පැමිණීම පර්සිගේ සතුටට හේතු විය. කුණාටු වළාකුළු අතරින්, මිනී කන පක්ෂීන්ගේ ප්‍රහාරයන්ට මුහුණ දෙමින් පියාසර කරනවාට වඩා ඔහු මෙයට ප්‍රිය කළේය.

ඔහු ඇනබෙත් සමඟ නැව් තට්ටුව මත සිටින අතරතුර තම සිහිනය ගැන ඇයට පැවසුවේය.

ඇය එම ප්‍රවෘත්තිය කෙසේ බාර ගනීවිදැයි ඔහුට සිතා ගැනීමට නොහැකි විය. ඔහු බලාපොරොත්තු වූවාටත් වඩා ප්‍රශ්නකාරී වනු ඇත. එහෙත් ඇය පුදුම වූ බවක් නෙපෙනුණි.

ඇය මීදුම දෙස බැලුවාය. ''පර්සි, ඔයා මට දෙයක් ගැන පොරොන්දු වෙන්න ඕනෙ. මේ සිහිනය ගැන අනිත් අයට කියන්න එපා.''

''මොකක්, එපා? ඇනබෙත්.''

''ඔයා ඇතීනාගේ සලකුණ ගැන දැකපු දේ.'' ඇය පැවසුවාය. අනෙක් අය ඒක දැනගන්න එකෙන් වැඩක් වෙන්නෙ නෑ. ඒකෙන් වෙන්නෙ එයාල කලබල වෙන එක විතරයි. ඒ වගේම ඒකෙන් මට තනියම මේ වැඬේ කරන්න අමාරු වෙනවා.''

''ඇනබෙත්, ඔයා මේක බරපතලව හිතල නැහැ, අර අඳුරෙ හිටපු දෙය. කැබලි වෙන විශාල ගුහාව.''

''මම දන්නවා.'' ඇගේ මුහුණ අසාමාන්‍ය ලෙස සුදුමැලි පෙනුමක් ගත්තේය. ඒ මීදුම නිසා නොවන බව පර්සි වටහා ගත්තේය. ''ඒත් මට මේක තනියම කරන්න වෙනවා.''

පර්සි තම කෝපය මැඩ ගත්තේය. ඔහු ඇනබෙත් කෙරෙහි උමතු වී ඇත්ද, නැතිනම් තම සිහිනය ගැන උමතු වී ඇත්දැයි පර්සිට සිතාගත නොහැකි විය. එකම ජයග්‍රහණයක් සිතේ තබාගෙන වසර පන්දහසක් නොනැසී පැවතුණ ග්‍රීක/රෝම ලෝකය පර්සි ජැක්සන්ග් ජීවිතය එයට හැකි තරම් උරාගෙන දැයි ඔහුට සිතාගැනීමට නොහැකි විය.

''ඔයා දන්නවා ගුහාව ඇතුළෙ මොනවද තියෙන්නෙ කියලා.'' ඔහු අනුමාන කළේය. ''ඒක මකුළුවන්ට සම්බන්ධ දෙයක්ද?''

''ඔව්.'' ඇය සිහින් හඬකින් පැවසුවාය.

''එහෙනම් ඔයා කොහොමද අඩුගානෙ...?'' ඔහු කියන්නට ආ දේ ගිල ගත්තේය.

ඇනබෙත් සිත හදාගත් පසු, ඇය සමඟ වාද කිරීමෙන් කිසිදු ඵලක් නැත. වසර තුනහමාරකට පෙර එක් රාත්‍රියක් ඔහුට සිහිපත් විය. ඒ ඔවුන් නිකෝ සහ බියන්කා ඩි ආන්ජලෝව බේරා ගත් දිනයයි. ටයිටන් ඇට්ලස් විසින් ඇනබෙත්ව අල්ලා ගත්තේය. ටික කළක් ගතවන තුරු ඇය මිය ගොසින්ද, පණ පිටින්ද යන්න ගැනවත් පර්සිට විශ්වාසයක් නොතිබිණි. ඇයව ටයිටන්ගෙන් බේරා ගැනීම සඳහා ඔහු රට පුරාම ඇවිද්දේය. ඒ ඔහුගේ ජීවිතයේ අසීරුතම දින කීපය විය. රාක්ෂයන් සමඟ පමණක් නොව සිත්තැවුල සමඟද ඔහුට සටන් වැදීමට සිදුවිය.

ඊටත් වඩා භයානක දෙයකට ඇයට මුහුණ දීමට සිදුවන බව දැන දැනම, ඔහු සිතාමතාම ඇයට යන්න හරින්නේ කෙසේද?

එවිට ඔහුට යමක් අවබෝධ විය. දින කීපයකට ඔහුට එය එපමණ දැනුණා නම් ඔහු අතීතය අමතකව සය මසක් අතුරුදන්ව සිටීම ඇනබෙත්ට කෙසේ දැනෙන්ට ඇතිද?

එය ඔහුට වරදකාරී මෙන්ම ආත්මාර්ථකාමී හැඟීමක් ඇති කළේය. ඇය මේ ගවේෂණයට යා යුතුව තිබේ. ලෝකයේ ඉරණම එය මත රඳා පවතිනු ඇත. එහෙත් ඔහුගේ අනෙක් පසින් පැවසුවේ, ලෝකය අමතක කරන්න යයි කියාය. ඇය නැති ලොවක් ඔහුට අවශ්‍ය වූයේ නැත.

පර්සි මීදුම දෙස බලා සිටියේය. ඔවුන් අවට කිසිවක් ඔහුට දැකීමට නොලැබුණත්, මුහුදේ දී ඔහුට මනා ඉවසීමක් තිබිණි. ඔවුන්ගේ අක්ෂාංශ හා දේශාංශ ගැන ඔහු හොඳින් දැන සිටියේය. සාගරයේ ගැඹුරත්, දියවැල් ගලන දිශාවත් ඔහු දැන සිටියේය. නැවේ වේගය ඔහු දැන සිටියේය. ඔවුන්ගේ ගමන් මාර්ගයේ ඇති පර්වත වැලි පර හෝ වෙනත් ස්වභාවික අනතුරු ඔහු දැන සිටියේය. තවමත් අන්ධකාරය පහව ගොස් නොතිබිණි.

ජලයට ප්‍රවේශ වූ මොහොතේ පටන් ඔවුන්ට ප්‍රහාරයක් එල්ල නොවුණත්, මුහුදේ වෙනසක් දක්නට ලැබිණි. පර්සි අත්ලාන්තික්, පැසිපික් සාගරවල පමණක් නොව ඇලස්කා බොක්කේ ද සිට

තිබුණත්, මේ මුහුද වඩාත් පැරණි සහ බලවත් හැඟීමක් ඇති කළේය. හර්කියුලිස්ගේ සිට එයිනියාස් දක්වා සෑම ග්‍රීක හෝ රෝම වීරයෙක්ම මේ දියඹේ යාත්‍රා කර තිබිණි. තවමත් ගැඹුරේ වාසය කරන රාක්ෂයෝ ඝන මීදුමේ එතී වැඩි කාලයක් නිද්‍රාවේ ගැලී සිටියහ. එහෙත් ග්‍රීක නෞකාවේ දිව්‍යමය ලෝකඩ බඳට ඔවුන් ප්‍රතිචාර දක්වන බව පර්සි දැන සිටියේය. උප දෙවිවරුන්ගේ රුධිරය ඔවුන්ට දැනෙනු ඇත.

*එයාල ආපහු එනවා, රාක්ෂයන් කියනු ඇත. අන්තිමේදී නැවුම් රුධිරය.*

''අපි ඉතාලි වෙරළට කිට්ටුවෙන් ඉන්නෙ.'' නිහඬතාවය බිඳ දමන අටියෙන් පර්සි පැවසුවේය. ''සමහරවිට ටයිබර් මුවදොරට ඇත්තෙ නාවුක සැතපුම් සීයක් විතර වෙන්න ඇති.''

''හොඳයි.'' ඇනබෙත් පැවසුවාය. ''දවල් වෙද්දී, අපි-''

''නවතින්න.'' පර්සිගේ සම අයිස් වතුරින් නැහැවුණාක් මෙන් දැනිණි. ''අපිට නවතින්න වෙනවා.''

''ඇයි?'' ඇනබෙත් විමසුවාය.

''ලියෝ! නවතින්න.'' ඔහු කෑ ගැසුවේය.

ප්‍රමාද වැඩිය. මීදුම අතරින් මතු වූ තවත් බෝට්ටුවක් ඔවුන් දෙසට ඇදී එන්නට විය. තත්පරයක ප්‍රමාදයෙන් පර්සි ඉක්මන් තොරතුරු ලබා ගත්තේය. තවද යුද නැවක්. කළු රුවල්වල ගෝගන්ගේ හිස සිත්තම් කර තිබිණි. තඩි රණශූරයෝ, මනුෂ්‍යයෝ නොවූහ. ඔවුහු ග්‍රීක සන්නාහ, අසිපත් සහ හෙලි වලින් සන්නද්ධව බෝට්ටුවේ ඉදිරියට රොක් වී සූදානමින් පසු වූහ. ජල මට්ටමේ තිබූ ලෝකඩ තලනය ආගෝ II හි බඳට පහර දුන්නේය.

ඇනබෙත් සහ පර්සි නෞකාවෙන් පෙරලී යාමට ආසන්නව සිටියහ.

ෆෙස්ටස් ගිනි විද්දේය. පිට පිට එල්ල වූ අග්නි ප්‍රහාරයෙක් රණශූරයන්ව මුහුදට ඇද දැමීමට සමත් වුවත්, බොහෝ දෙනෙක් කඹවල එල්ලෙමින් ආගෝ II මතට නැග ගැනීමට සමත් වූහ.

පර්සි යථාතත්ත්වයට පත්වන විට, සතුරෝ සෑම අතකින්ම වටකොට සිටියහ. මීදුම සහ අඳුර තුළින් ඔහුට හොඳින් දැක ගැනීමට නොහැකි වුවත්, ආක්‍රමණිකයෝ මිනිසුන් වැනි ඩොල්පින්ලා හෝ ඩොල්පින්ලා වැනි මිනිසුන් බව පෙනී ගියේය. සමහරුන්ට අළු පැහැති

හොම්බක් තිබිණි. අනෙක් අය තම අවල්පත් වල අසිපත් රඳවාගෙන සිටියහ. සමහරු අර්ධව ශයෙන් එක් වූ පාද වලින් ගැටූහ. ඒ අතර සමහරුන්ට පාද ලෙස අවල්පත් තිබිණි.

ලියෝ අනතුරු ඇඟවීමේ සීනුව නාද කළේය. ඔහු ළඟම පිහිටි බැලිස්ටාවට පැන ගැනීමට උත්සාහ කළත් ඩොල්පින් රණ ශූරයෝ එය වැළැක්වූහ.

ඇනබෙත් සහ පර්සි එකිනෙකාට පිට දී සිටගත්හ. ඔවුන් මීට පෙර බොහෝ වතාවක් කර තිබුණ ආකාරයටම ඔවුන්ගේ අවි අතට ගත්හ. නෞකාව ඉවතට තල්ලු කිරීමේ හෝ සතුරු යාත්‍රාව පෙරලා දැමීමේ බලාපොරොත්තුවෙන් පර්සි රළ කැඳවීමට උත්සාහ කළත් කිසිවක් සිදු නොවිණි. යමෙක් ඔහුගේ කැමැත්තට සම්පූර්ණයෙන් එරෙහි වී මුහුද ඔහුගේ පාලනයෙන් ඈත් කිරීමට උත්සාහ දරන බව පෙනී ගියේය.

සටනට සූදානමින්, ඔහු රිප්ටයිඩය ඔසවා ගත්තත්, ඔවුන්ගේ ගණන අපේක්ෂා කළාටත් වඩා වැඩි විය. දුසිම් ගණනක් රණ ශූරයෝ ඔවුන්ගේ හෙලි පහත් කර කරගෙන, ඔවුන් වටා වළල්ලක් සෑදුණේ, පර්සිගේ අසිපත් පහර නොවදින තරම් දුරක පරතරයක් තබා ගනිමිනි. ඩොල්පින් මිනිසුන් ඔවුන්ගේ හොම්බ විවර කර විසිල් හඬක් නගන්නට වූහ. ඩොල්පින්ලාගේ දත් කෙතරම් දරුණුද යන්න පර්සි මීට පෙර සිතා තිබුණේ නැත.

ඔහු සිතීමට උත්සාහ කළේය. සමහරවිට ඔහුට වළල්ල බිඳ දමා ආක්‍රමණිකයන් කීප දෙනෙකු මරා දැමීමට හැකි වුවත්, අනෙක් අය සහ ඇනබෙත් නොමැතිව ඔහු එය කළ නොහැකිය.

අඩුම වශයෙන් රණ ශූරයන්ට ඔවුන්ව ඉක්මනින් මරා දැමීමේ වුවමනාවක් හෝ ඇති බවක් නොපෙනුණි. ඔවූහු දිගටම පර්සි සහ ඇනබෙත් වටකොට සිටින අතර ඔවුන්ගේ පිරිසෙන් වැඩි දෙනෙක් පහළ තට්ටුව සහ නැව් බඳ ආරක්ෂාවේ යෙදුණහ. තම මිතුරන් අල්ලා ගැනීමට ඔවූහු කුටිවල දොරටු බිඳ දමන හඬ පර්සිට ඇසිණි. අනෙක් උප දෙවිවරුන්ට ඉක්මනින් අවදි වීමට නොහැකි වූයේ නම්, ඔවුන්ට මෙතරම් පිරිසකට එරෙහිව සටන් වැදීමට නොහැකි වනු ඇත.

හෙලි වළල්ලේ එක් පැත්තක, රණ ශූරයන් දෙපසට වෙත්ම, යමෙක් ඇතුළට පිවිසියේය. ඔහු සම්පූර්ණ මිනිසකු ලෙස පෙනුණත්, ඩොල්පින්ලා ඔහු ඉදිරිපිටදී පසුපසට වූ ආකාරය අනුව ඔහු නායකයා

බව පැහැදිලි විය. ඔහු ග්‍රීක සටන්වලදී පළඳින සන්නාහයක් පැළඳ සිටියේය. ළය ඵලකය මුහුදු රාක්ෂයන්ගෙන් අලංකාර කර තිබිණි. එසේම ඔහු සැරසී සිටි සියල්ල රත්‍රන් විය. රිප්ටයිඩය වැනි ග්‍රීක තලයක් වූ ඔහුගේ අසිපත පවා ලෝකඩ වෙනුවට රනින් නිමවා තිබුණේය.

*රත්තරන් කොලුවා.* තමා දුටු සිහිනය මතකයට නැගුණු පර්සි සිතුවේය. *එයාලට රත්තරන් කොල්ලව පහු කරන්න වෙයි.*

සැබැවින්ම පර්සිව අවුලට පත් කළේ කොලුවාගේ හිස් වැස්මයි. එහි මුහුණු ආවරණය ගෝගන්ගේ හිස හැඩයට තනා තිබුණු අතර එයින් මුළු මුහුණම වැසී තිබිණි. පර්සිට පෙර වතාවකදී ගෝග න්ව මුණ ගැසී තිබිණි.

ඇනබෙත් හැරී ඇගේ උරහිස පර්සිගේ උරහිසට හේත්තු කළාය. ආරක්ෂාකාරී ලෙස ඇගේ බඳ වටා අතක් දමා ගැනීමට ඔහුට වුවමනා වුවත්, ඒ ඉරියව්ව ඇය පිළිගනී දැයි ඔහුට වූයේ සැකයකි. එසේම ඇනබෙත් තම පෙම්වතිය බවට කිසිදු සංඥාවක් රත්තරන් හාදයාට ලබා දීමට පර්සිට අවැසි වූයේ නැත.

''උඹ කවුද?'' පර්සි විමසුවේය. ''මොනවද උඹලට ඕනෙ?''

රන් රණශූරයා හඬ නගා සිනාසුණේය. ඔහුගේ කඩු පහරේ වේගය පර්සිට සිතාගැනීමටවත් නොහැකි තරමට වේගවත් විය. ඔහු රිප්ටයිඩය පර්සි අතින් ගිලිහී ගොස් මුහුදට වැටෙන සේ පහරක් එල්ල කළේය.

එක්විටම පර්සිට හුස්ම ගැනීමට නොහැකි වූ නිසා, තම පෙනහලු ඔහු මුහුදට විසිකර දමා ඇතැයි පර්සිට සිතුණේය. ඔහු මින් පෙර කිසි කළෙක මෙතරම් පහසුවෙන් නිරායුධ වී නොතිබිණි.

''හලෝ, සහෝදරයා.'' රන් රණශූරයාගේ හඬ විදේශීය උච්චාරණයක් ගත්තේය. *සමහරවිට මැද පෙරදිග වන්නට පුළුවන.* එය බෙහෙවින්ම හුරු පුරුදු හඬක් විය. ''පොසිඩන්ගේ පුත්‍රයාව කොල්ලකන එක නිතරම සතුටට කාරණයක්. මම චෙරිසෝර්[1], ස්වර්ණ අසිපත. මට ඕනෙ විදිහට...'' ඔහු තම ලෝහ මුහුදු ආවරණය ඇනබෙත් දෙසට හැරවූයේය. ''හොඳයි, ඒත් ලේසියි. මට ඔයාල ළඟ තියෙන හැම දෙයක්ම ඕනෙ.''

1 පෙගාසස් ගේ සොහොයුරාය. මොඩුසාගේ සහ පොසිඩන් දෙවියන්ගේ පුත්‍රයෙකි. 'රන් අසිපත' යනුවෙන් ප්‍රකටය.

# 30
# පර්සි

**තෑගි ලැබුණු ගවයකු පරීක්ෂා කරන්නාක් මෙන්** ඔවුන් දෙස බලමින් වෙරිසෝර් එහාටත් මෙහාටත් යන අතරේ පර්සිගේ හදවත එළියට පැනීමට ආසන්නව තිබිණි. ඔහුගේ ඩොල්පින් මිනිසුන් දුසිම් ගණනක් පර්සිගේ ළයට හෙලි මානාගෙන වළල්ලක් සෑදී සිටින අතර, තවත් දුසිම් ගණනක් නැව අවුස්සමින්, පහළ තට්ටුවල කලබල කරමින් සිටියහ. එකෙක් අමෘතය පෙට්ටිය උඩට රැගෙන ආවේය. තවත් එකෙක් බැලිස්ටා අකුණු ගෙනැවිත් ග්‍රීක ගින්න නිපදවූයේය.

''ඕකෙන් ප්‍රවේසම් වෙන්න.'' ඇනබෙත් අනතුරු ඇඟවූවාය. ''ඒකෙන් අපේ නැව් දෙකම පුපුරලා යාවි.''

''හා!'' වෙරිසෝර් පැවසුවේය. ''අපි ග්‍රීක ගින්න ගැන හැම දෙයක්ම දන්නවා, කෙල්ලෙ. කරදර වෙන්න එපා. අපි මාරි නොස්ට්‍රම්වල නැව් කොල්ලකන්නෙ, පැහැර ගන්නෙ යුග ගාණක ඉඳලයි.''

''ඔයාගෙ කටහඬ මට හුරුයි.'' පර්සි පැවසුවේය. ''අපි හමුවෙලා තියෙනවද?''

''මට කැමැත්තක් තිබුණේ නෑ.'' වෙරිසෝර් තම රන් මුහුණ ආවරණය යටින් පැවසුවේය. එහෙත් එයට යටින් තිබෙන ඔහුගේ සැබෑ ඉරියව් කුමක් දැයි හඳුනා ගැනීම දුෂ්කර විය. ''ඒත්, මම ඔයා ගැන හැම දෙයක්ම අහල තියෙනවා. පර්සි ජැක්සන්. ආහ්, ඔව් ඔලිම්පස් බේරගත්ත තරුණයා. ඒ වගේම එයාගෙ විශ්වාසවන්ත මිතුරිය, ඇනබෙත් චේසි.''

''මම කාගෙවත් මිතුරියක් නෙමෙයි.'' ඇනබෙත් ගෙරවූවාය. ''ඒ වගේම පර්සි, එයාගෙ කතාව අපිට හුරුයි වගේ දැනෙන්නෙ එයාගෙ හඬ එයාගෙ අම්මගෙ වගේ නිසා. අපි නිව් ජර්සිවලදි එයාව මරල දැම්මා.''

පර්සි මුහුණ හැකිළුවේය. ''මට හොඳටම විශ්වාසයි ඒ උච්චාරණය නිව් ජර්සිවල එකක් නෙමෙයි කියලා. කවුද එයාගෙ? අහ්-''

සියල්ලම පැහැදිලි විය. එම් නැන්දාගේ බහිරව උද්‍යාන වෙළෙඳ මධ්‍යස්ථානය- මෙඩූසාගේ[1] ගුහාව. ඇය කතා කළේද ඒ විදිහටමය. - අඩුගානෙ පර්සි ඇගේ හිස සිඳින තුරු. ''මෙඩූසා ඔයාගෙ අම්මද?'' ඔහු විමසුවේය. ''ජේත්තුකාරයෝ, ඔයාට ඒක එහෙමම තියෙනවනෙ.''

''ඔයා පළමු පර්සියස් තරමටම අහංකාරයි.'' චෙරිසෝර් පැවසුවේය. ''ඒත්, ඔව් පර්සි ජැක්සන්. පොසිඩන් මගේ තාත්තා. මෙඩූසා මගේ අම්මා. අර නුවණේ දෙවඟන කියල හඳුන්වන කෙනා එයාව රාක්ෂයෙක් විදිහට වෙනස් කළාට පස්සෙ...'' ඔහුගේ රන් මුහුණු ආවරණය ඇනබෙත් දෙසට හැරිණි. ''ඒ ඔයාගෙ අම්ම වෙන්න ඇති කියල මම හිතනවා... මෙඩූසාගේ දරුවෝ දෙන්නෙක් ඇගේ සිරුර තුළ සිරවෙලා උපදින්නට නොහැකිව හිටියා. සැබෑ පර්සියස් මෙඩූසාගේ හිස සිඳින කොට-''

''දරුවො දෙන්නා ඉපදුණා.'' ඇනබෙත් සිහිපත් කළාය. ''පෙගාසස් සහ ඔබ.''

පර්සි ඇසිපිය ගැසුවේය. ''එහෙනම් ඔයාගෙ සහෝදරය පියාපත් තියෙන අශ්වයෙක්. ඒත් ඔයත් මගෙ අර්ධ සහෝදරයෙක්, ඒ කියන්නෙ ලෝකෙ ඉන්න පියාඹන අශ්වයා සේරම මගෙ... ඔයා දන්නවනෙ ඒක? අපි ඒක අමතක කරමු.'' යම් දෙයක දිව්‍යමය පැත්තක් ඇති ඥාතියකු සමඟ ඕනෑවට වඩා වාසය යහපත් නොවන බව වසර ගණනකට පෙර ඔහු ඉගෙනගෙන තිබිණි. ටයිසන් එකැස් යෝධයා ඔහුව සහෝදරයකු ලෙසට හදාගත් පසු, තම පවුල හැකි තරම් පුළුල් කළ යුතු බව පර්සි තීරණය කළේය.

''ඒත් ඔයා මෙඩූසාගේ දරුවෙක් නම්,'' ඔහු පැවසුවේය. ''ඇයි ඔයා ගැන මට කවදාවත් අහන්න ලැබුණෙ නැත්තෙ?''

1 ගොගොන් ලෙස හැඳින්වෙන , කෙස් ලෙස විෂ සහිත සර්පයන් සිටින රාක්ෂමය සොයුරියන් තිදෙනෙකි. මොවුන් අතරින් වඩාත්ම ප්‍රකට තම ඇස්වලින් කෙනෙකුව ගල් කිරීමට සමත් මෙඩූසාය.

චෙරිසෝර් බලවත් කෝපයෙන් සුසුමක් හෙලුවේය. ''ඔයාගෙ සහෝදරය පෙගාසස් වෙනකොට, ඔයාට අමතක වෙන්න පටන් ගත්තා. අහ්. බලන්න. පියාපත් තියෙන අශ්වයා! කවුරුවත් මාව ගණන් ගත්තද? නෑ! ඔහු තම කඩුවේ කුඩ පර්සිගේ ඇසට ළං කළේය. ''ඒත් මාව අවතක්සේරු කරන්න එපා. මගෙ නම ස්වර්ණ අසිපත වෙලා තියෙන්නෙ හේතුවක් ඇතුවයි.''

''මහේශාක්‍ය රන්ද?'' පර්සි අනුමාන කළේය.

''නෑ! ජප කළ රන්, ඔව්. පස්සෙ කාලෙක රෝමවරු ඒකට මහේශාක්‍ය රන් කියල කිව්වා. ඒත් ඒ වගේ අසිපතක් මුළින්ම හැසිරවුවේ මමයි. එතෙක් මෙතෙක් බිහිවූ ජනප්‍රියම වීරයා මම වෙන්න ඕනෙ! පුරාවෘත්ත කියන්නෙ මාව නොසලකා හැරපු නිසා, ඒ වෙනුවට මම සහාසිකයෙක් වුණා. මම අධිෂ්ඨාන කළා මගේ උරුමය ලබාගන්න. මෙඩුසාගේ පුත්‍රයා විදිහට, මම භීෂණයට පොළඹවනවා. පොසිඩන්ගේ පුත්‍රයා විදිහට, මම මුහුදු පාලනය කරනවා.''

''ඔයා මුහුදු කොල්ලකාරයෙක් වෙලා.'' ඇනබෙත් පැවසුවාය.

චෙරිසෝර් දැත් විහිදාලුයේය. ඔහුගේ අසිපත තම ඇසෙන් ඉවත් වීම පර්සිගේ ඇස්වැසිල්ලට හේතු විය.

''හොඳම මුහුදු කොල්ලකාරයා,'' චෙරිසොර් පැවසුවේය. මම ශතවර්ෂ ගණනක් මේ දියඹේ යාත්‍රා කළා. මාරි නොස්ට්‍රම් ගවේෂණය කරන්න තරම් මෝඩ වෙන උප දෙවිවරුන්ව කොල්ලකමින්. දැන් මේක මගේ බල ප්‍රදේශය. ඔයාල සන්තක සියලු දේ මගෙයි.''

එක් ඩොල්පින් රණ ශූරයෙක් පහළ සිටි කෝච් හෙජ්ව ඇදගෙන උඩට පැමිණියේය.

''මාව අත ඇරපන්, බල මාළුවෝ.'' හෙජ් මොර දුන්නේය. ඔහු රණ ශූරයාට පා පහර දීමට උත්සාහ දැරුවත්, ඔහුගේ කුර රණ ශූරයාගේ සන්නාහයේ වැදී හඬ නැගුවා විනා අන් යමක් සිදු නොවිණි. ඩොල්පින් රණ ශූරයාගේ ළය ආවරණයේ ඇති කුර සටහන් දෙස බලන විට කෝච් හෙජ් දැනටමත් උත්සාහයන් කීපයක්ම ගෙන තිබුණු බව පෙනී ගියේය.

''අහ්, නරාශ්වයා.'' චෙරිසෝර් පැවසුවේය. ''ටිකක් නාකි, ලොම් හැළුණු එකෙක්, ඒත් මේ වගේ එකෙකුට හොඳට ගෙවයි. එයාව බැඳල දාන්න''

''මම කාගෙවත් එළු මසක් නෙමෙයි.'' හෙජ් විරෝධය පෑවේය.

''උගෙ කටත් බැඳපන්.'' චෙරිසෝර් නියෝග කළේය.

''ඇයි උඹ හෙමින් ලිස්සල යන්නෙ.'' ඩොල්පින් මිනිසෙක් තෙල් සහිත කැන්වස් ගුලියක් ඔහුගේ කටට එබූ විට හෙජ්ගේ නිග්‍රහ කිරීම නැවතුණේය. ඉක්මනින්ම, බැඳ දැමූ හෙජ් ආහාර පෙට්ටි, අමතර ආයුධ සහ මායාමය අයිස් පෙට්ටි තිබූ භෝජන ශාලාවේ හිඳුවනු ලැබිණි.

''ඔයාට මෙහෙම කරන්න බෑ.'' ඇනබෙත් කෑ ගැසුවාය.

රන් මුහුණු ආවරණය තුළින් චෙරිසෝර්ගේ සිනා හඬ ඇසිණි. මුහුණු ආවරණයට පිටුපසින් ඇති ඔහුගේ මුහුණ බියකරු ලෙස විරූප වී ඇතැයි පර්සි සිතුවේය. නැතහොත්, ඔහුගේ මවට කළ හැකි ආකාරයට ඔහුගේ බැල්මට මිනිසුන් ගල් කිරීමේ හැකියාවක් තිබෙන්නටද පුළුවන.

''මට ඕනෙ දෙයක් මට කරන්න පුළුවන්.'' චෙරිසෝර් පැවසුවේය. ''මගෙ සටන් කරුවන්ට පරිපූර්ණ විදිහට පුහුණු කරල තියෙනවා. එයාල දුෂ්ට බෙලි කපන...''

''ඩොල්පින්ල.'' පර්සි පැවසුවේය.

චෙරිසෝර් දෙවුර සැලුවේය. ''ඔව්. ඉතිං? එයාලට සහශ්‍ර ගණකට කලින් අවාසනාව උදා වුණා, වැරදි පුද්ගලයෙක් පැහැර ගෙන. එයාලගෙ පිරිසෙන් සමහරු සම්පූර්ණයෙන්ම ඩොල්පින්ලා බවට පත්වුණා. අනෙක් අය පිස්සු වැටුණා. ඒත් මේ... මේ අය දෙමුහුන් සතුන් විදිහට නොමැරී බේරුණා. මුහුද යටදී මට මෙයාල හමුවුණාම, එයාලට අලුත් ජීවිතයක් ලබා දුන්නා. එයාල මගෙ පක්ෂපාතී කණ්ඩායම බවට පත් වුණා. එයාල කිසිදේකට බය නැහැ.''

එක් රණ ශූරයකු කලබලයෙන් ඔහුට යමක් පැවසුවේය.

''ඔව්, ඔව්.'' චෙරිසෝර් පැවසුවේය. ''එයාල එක දේකට බයයි. ඒත් ඒක අමාරු ප්‍රශ්නයක්. එයා මෙතන නැහැ.''

අදහසක් පර්සිගේ හිස් කබල තුළ නළියන්නට පටන් ගත්තේය. ඔහු ඒ ගැන තවත් සිතීමට පෙර, තවත් ඩොල්පින් රණ ශූරයින් ඔවුන්ගේ අනෙක් මිතුරන්ද රැගෙන ඉහළට පැමිණියහ. ජේසන් සිහිසුන්ව සිටියේය. ඔහුගේ මුහුණේ තිබූ තැළුම් තුවාල දෙස බලන විට, ඔහුට සටන් කිරීමට උත්සාහ කර ඇති බව පෙනිණි. හේසල්ගේ සහ පිපර්ගේ දෑත් දෙපා බැඳ තිබිණි. පිපර්ගේ කටට මුකවාඩම් යොදා තිබූ බැවින්, ඩොල්පින්ලා ඇගේ වශී කතා විලාසය ගැන දැන සිටි

බව පෙනී ගියේය. අතුරුදන්ව සිටි එකම පුද්ගලයා ෆ්‍රෑන්ක්ය. එහෙත් ඩොල්පින්ලා දෙදෙනෙකුගේ මුහුණු මී මැසි කුඩුවලින් වැසී තිබිණි.

ෆ්‍රෑන්ක්ට ඇත්තටම මීමැසි රංචුවක් බවට පත් වීමට හැකි වී තිබුණේද? එසේ වේවායි පර්සි බලාපොරොත්තු විය. නෞකාවේ කොහේ හෝ තැනක ඔහු නිදහස්ව සිටී නම්, එය වාසියක් වනු ඇත. එසේ වුවහොත් පර්සිට ඔහු සමඟ සන්නිවේදනය කරන ආකාරය සොයාගත හැකි වනු ඇත.

''විශිෂ්ටයි.'' චෙරිසෝර් පැවසුවේය. ජේසන්ව හරස් දුණු ඇති තැන දමන ලෙස ඔහු ඩොල්පින් රණ ශූරයන්ට පැවසුවේය. ඉන්පසුව ඔහු කෙල්ලන් දෙස බැලුවේ ඔවුන් නත්තල් තෑගිය යන හැඟීමෙනි. පර්සිට දත් මිටි කෑමට එය ප්‍රමාණවත් විය.

''කොල්ලගෙන් මට වැඩක් නෑ.'' චෙරිසෝර් පැවසුවේය. ''ඒත් අපිට සර්සි යක්දෙස්සිය එක්ක එකඟතාවක් තියෙනවා. ඇය කෙල්ලන්ව මිලට ගනී. වහලුන් හෝ පුහුණු කරන්නන් විදිහට, ඒක තීරණය වෙන්නෙ එයාලගෙ කුසලතාවය අනුව. ඒත් ඔයා නෙමෙයි, ආදරණීය ඇනබෙත්.''

ඇනබෙත් පස්සට වූවාය. ''ඔයාට මාව කොහෙවත් අරන් යන්න බැහැ.''

පර්සිගේ අත ඔහුගේ සාක්කුවට ගියේය. ඔහුගේ පිටුපස කලිසම් සාක්කුවෙන් පෑන එළියට ආවේය. ඔහුට අවශ්‍ය වූයේ චොරිසෝර්ගේ අවධානය මොහොතකට ඔහුගේ අසිපතින් ඈත්වීම පමණකි. සමහරවිට ඔහුට චෙරිසෝර්ව ඉක්මනින් යටත් කරගත හැකි වුවහොත්, ඔහුගේ පිරිස කලබල වනු ඇත.

චෙරිසෝර්ගේ යම් දුර්වලතාවක් තමා දන්නා බව පර්සි සිතුවේය. සාමාන්‍යයෙන් ඇනබෙත් ඔහුට එවැනි තොරතුරු සපයන නමුත්, චෙරිසෝර් කිසිදු පුරාවෘත්තයක පෙනෙන්නට නොසිටි නිසා, ඔවුන් දෙදෙනාම ඔහු සම්බන්ධයෙන් සිටියේ අඳුරේය.

ස්වර්ණ රණ ශූරයා කතා කළේය. ''ඔහ්, කනගාටුයි, ඇනබෙත් ඔයාට මා එක්ක ඉන්න ලැබෙන එකක් නැහැ. මම ඒකට කැමතියි. ඒත් ඔයයි ඔයාගේ මිත්‍රයා පර්සියි වෙන් කරපු අය. දෙවඟනක් ඔයාලගෙ අල්ලා ගැනීම වෙනුවෙන් ඉහළ මිලක් ගෙවන්න ලෑස්තියි. පණ පිටින්, හැකිනම්, ඒත් එයා කිව්වෙ නෑ ඔයාලට රිද්දන්න එපා කියලා.''

ඒ මොහොතේදී, පිපර් ඔවුන්ට අවශ්‍ය තිබූ බාධාව සිදු කළාය. ඇය මහා හඬින් කිවිසුමක් පිට කළ අතර එය ඇගේ මුකවාඩම තුළින්ද අසන්නට ලැබිණි. ඉන්පසු ඇය ක්ලාන්තව අසල සිටි ආරක්ෂකයා මතට ඇද වැටුණාය. ඔහු පසෙකට විසි වී ගියේය. හේසාල්ට අදහසක් පහළ විය. ඇය බිම වැටී පාද ගසමින් අපස්මාරය වැළඳුන අයකු සේ දඟලන්නට වූවාය.

රිප්ටයිඩය ඇද ගත් පර්සි එය වේගයෙන් දමා ගැසුවේය. තලය කෙළින්ම චෙරිසෝර්ගේ ගෙල හරහා යා යුතු වුවත් ස්වර්ණ රණ ශූරයා ඇදහිය නොහැකි තරම් වේගවත් විය. ඔහු ඉවතට පනින අතර, අනෙක් රණ ශූරයෝ අත් අඬංගුවේ පසු වූ ඉතිරි පිරිස වටා රොක් වූයේ ඔවුන්ගේ නායකයාට සටන සඳහා ඉඩ ලබා දෙමිනි. ඔවූහු ජය ඝෝෂා නගමින් චෙරිසෝර්ව ධෛර්යමත් කළහ. ඔවුන්ගේ නායකයා කිසිදු ආකාරයක අවදානමකට ලක්ව තිබෙන බවට හැඟීමක් ඔවුන් කෙරෙන් දක ගැනීමට නොලැබිණි. මේ වනතෙක්, යුද දෙවියා වූ ඒරිස් සමඟ සටන් වැදුණු දින සිට, පර්සිට සතුරකුගේ කඩු ප්‍රහාර වලට මුහුණ දීමට සිදු වී තිබුණේ නැත. චෙරිසෝර් එයට දක්ෂයෙකි. පර්සිගේ බලයන් බොහෝමයක් වසර ගණනක් තිස්සේ තවත් ශක්තිමත් වී තිබිණි. එහෙත් දැන්, ප්‍රමාද වැඩිය. කඩු සටන් ඒවායින් එකක් නොවන බව පර්සි අවබෝධ කරගෙන සිටියේය. ඔහු දුර්වලය- අඩුම වශයෙන් චෙරිසෝර් වැනි ප්‍රතිවාදීයකුට එරෙහිව සටන් කරද්දී ඔහු දුර්වලය.

ඔවූහු ඉදිරියටත් පසුපසටත් යමින්, තල්ලු කරමින් සටන් කළහ. අර්ථ විරහිත වහසිබස් දෙඩූහ. පර්සිට ලූක් කැස්ටෙලාන් වැනි හඬක් ඇසිණි. ඒ අර්ධ ලෝහිත කඳවුරේ දී ඔහුගේ ප්‍රථම කඩු සටන් උපදේශකයාය. ඔහුගෙන් යෝජනා රැසක් ලැබුණත්, ඒ එකකින්වත් සහයක් නොලැබිණි.

රන් මුහුණු ආවරණයත් ඔහුව අවුලට පත් කළේය. උණුසුම් මීදුම, ලිස්සන නැව් තට්ටුව සහ රණ ශූරයන්ගේ කෑ ගැසීම යන කිසිවක් ඔහුගේ යහපත පිණිස නොවීය. එක් ඩොල්පින් මිනිසකු ඇනබෙත්ගේ ගෙලට පිහියක් තබාගෙන සිටිය අයුරු පර්සි ඇස් කොණකින් දුටුවේය. ඇය යම් ප්‍රයෝගයකට උත්සාහ කළොත් ඇගේ ගෙල කැපී යනු ඇත.

ඔහු ඉදිරියට පැන චෙරිසෝර්ගේ උදරයට කඩු පහර එල්ල කළේය. එහෙත් චෙරිසෝර් පහර වලකා ගත්තේය. ඔහු නැවත

වතාවක් පර්සිගේ කඩුව මුහුදට විසිවන සේ පහරක් එල්ල කළේය. තවත් වතාවක් රිප්ටයිඩය මුහුදට ඇදී ගියේය.

චෙරිසෝර් සිනාසුණේය. ඔහුට වෙහෙසක් පවා නොතිබිණි. ඔහු පර්සිගේ ළයට අසිපත් තුඩ තබා තද කළේය.

''හොඳ උත්සාහයක්.'' මුහුදු කොල්ලකරුවා පැවසුවේය. ''ඒත් දැන් උඹව බැඳල දාලා, ගයියාගේ වල්ලභයා ළඟට යවනවා. එයාලට උඹේ ලේ හලල ගයියාව නැගිට්ටවන්න ටිකක් හදිස්සියි.''

# 31
# පර්සි

**විශිෂ්ට අදහස් උත්පාදනය සම්පූර්ණයෙන් අසාර්ථක වීම තරම් අසාර්ථක කිසිවක් නැත.**

පර්සි එතැන නිරායුදව සිටගෙන සිටියදී, ඔහුගේ හිස තුළ සැලසුම සටහන් විය. ඇනබෙත් ඔහුට ග්‍රීක පුරාවෘත්තවල තොරතුරු සැපයීමට පුරුදුව සිටි අතර, පර්සි ප්‍රයෝජනවත් යමක් මතකයේ තබා ගන්නා ආකාරයේ පුද්ගලයකු විය. එහෙත් ඔහු වේගයෙන් ක්‍රියාත්මක විය යුතුය. තම මිතුරන්ට කිසිත් සිදුවීමට ඉඩ හැරීමට ඔහුට නොහැකිය. ඔහු නැවත වරක් ඇනබෙත්ව අහිමි කර නොගනු ඇත.

චෙරිසෝර්ව පරාජය කළ නොහැකි වීමට පුළුවන. අවමවශයෙන් ද්වන්ධ සටනකින් ඔහු පරාජය කළ නොහැක. එහෙත් ඔහුගේ පිරිස නොමැතිව... සමහරවිට එකවර උපදෙවිවරුන් පිරිසක්ම ඔහුට පහර දුන්නොත් එවිට ඔහුව යහපත් කර දැමීමට හැකිවනු ඇත.

චෙරිසෝර්ගේ පිරිස සමඟ ගනුදෙනු කරන්නේ කෙසේද? පර්සි ප්‍රහේලිකාව විසඳීමට තැත් කළේය. වැරදි පුද්ගලයකු පැහැර ගැනීම නිසා මුහුදු කොල්ලකරුවෝ ඩොල්පින්- මිනිසුන් බවට පත් වූයේ සහශ්‍රයකට පෙරදීය. පර්සි ඒ කතාව දන සිටියේය. එබැවින් වැරදි පුද්ගලයාගේ ප්‍රශ්නය ඩොල්පින්ලාට බිය ගැන්වීමට ප්‍රමාණවත්ය. එසේම තම පිරිස කිසිවකට බිය නැති බව චෙරිසෝර් පැවසූ විට. එක් ඩොල්පින් මිනිසෙක් කලබල වී ඔහුව නිවැරදි කළේය. *ඔව්*, චෙරිසෝර් පැවසුවේය. එහෙත් ඔහු මෙතැන නැත.

පර්සි ඇණිය දෙස බලන විට, ෆ්‍රැන්ක් මිනිස් ස්වරූපයෙන් බැලිස්ටාව පිටුපසට වී එබිකම් කරන අයුරු දුටුවේය. පර්සි සිනාසීම වළකා ගත්තේය. මහත හාදයා අදක්ෂ, වැඩකට නැති අයෙකු බව ප්‍රකාශ වුවත්, පර්සිට අවශ්‍ය මොහොතේදී ඔහු සැමවිටම නිවැරදි තැන සිටින බව පෙනී ගියේය.

කෙල්ලන්... ෆ්‍රැන්ක්... අයිස් පෙට්ටිය.

එය පිස්සු අදහසක් විය. සුපුරුදු ලෙසම ඒ පර්සිට හැකි දේය. ''අපූරුයි!'' පර්සි කෑ ගැසුවේය. ඔහුගේ හඬ සියල්ලොගේම අවධානය දිනා ගැනීමට සමත් විය. ''අපේ කපිතාන් උඹලට ඉඩ දෙනව නම්, අපිව අරගෙන පලයල්ලා.''

චෙරිසෝර් ඔහුගේ රන් මුහුණු ආවරණය හරවා අවට බැලුවේය. ''මොන කපිතාන්ද? මගෙ මිනිස්සු නැව පරීක්ෂා කළා. මේකෙ වෙන කවුරුවත් නැහැ.''

පර්සි තම දෑස් එසවූයේය. ''දෙවියා පෙනී සිටින්නේ එයා කැමති වෙලාවට විතරයි. ඒත් එයා අපේ නායකයා. එයා තමයි උප දෙවිවරු වෙනුවෙන් අපේ කඳවුර පවත්වගෙන යන්නෙ. එහෙම නේද, ඇනබෙත්?''

ඇනබෙත් ඉක්මන් වූවාය. ''ඔව්!'' ඇය සතුටින් හිස වැනුවාය. ''ඩී මහත්මයා! මහා ඩියෝනීසස්!''

සසල බවේ රැල්ලක් ඩොල්පින් මිනිසුන් අතර පැතිර ගියේය. එකකු තම අසිපත බිම දැමුවේය.

''උඹලා බය වෙන්න ඇති.'' පර්සි අනුකම්පාවෙන් ඩොල්පින් මිනිසුන් දෙස බැලුවේය. ''උඹලා අපේ ගමන පමා කිරීම ගැන ඩියෝනීසස් කැමති වෙන එකක් නැහැ. එයා උඹල හැමෝටම දඬුවම් කරයි. සුළං දෙවියන්ගේ උමතුවෙන් කෙල්ලෝ වැටුණු හැටි උඹල දැක්කෙ නැද්ද?''

පිපර් සහ හේසාල් අපස්මාර ගැස්ම නවත්වා නැව් තට්ටුව මත හිඳගෙන පර්සි දෙස බලා සිටියත්, ඔහු නැවත තියුණු ලෙස ඔවුන් දෙස බලත්ම ඔවුහු නැවත දියෙන් ගොඩ දැමූ මසුන් මෙන් ගැහෙන්නට පටන් ගත්හ. තම සිරකරුවන් වෙතින් ඉවත් වීමට උත්සාහ කිරීමේදී ඩොල්පින් මිනිසුන් එකා මත එකා වැටෙන්නට විය.

''බොරුවක්!'' චෙරිසෝර් කෑ ගැසුවේය. ''කටවහපන්, පර්සි ජැක්සන්. උඹේ කඳවුරේ ප්‍රධානියා මෙතන නැහැ. එයා ආපහු ඔලිම්පස් වලට ගියා. මේක සාමාන්‍ය දැනීම.''

''එහෙනම් උඹ පිළිගන්නවා ඩියෝනීසස් අපේ ප්‍රධානියා බව? පර්සි විමසුවේය.

''එයා එහෙම වෙලා හිටියා.'' චෙරිසෝර් නිවැරදි කළේය. ''හැමෝම ඒක දන්නවා.''

තමා තමාවම පාවා දුන් කලෙක මෙන් පර්සි ස්වර්ණ රණ ශූරයා දෙස බැලුවේය. ''උඹ දැක්කනේ? අපිව විනාශකාරී ඉරණමකට ගොදුරු වෙලා. උඹට මාව විශ්වාස නැත්නම්. අපි අයිස් පෙට්ටිය පරීක්ෂා කරමු.''

පර්සි වේගයෙන් මායා ශීතකරණය අසලට ගියේය. කිසිවකු ඔහුව නැවැත්වීමට උත්සාහ නොකළහ. පයින් ගසා එහි පියන විවෘත කළ ඔහු අයිස් කැට අවුස්සන්නට විය. එහි එකක් තිබිය යුතුය. ඔහුට රිදී සහ රතු සෝඩා කෑනයක් ලැබිණි. ඩොල්පින් රණ ශූරයන් දෙසට එය හැරවූ පර්සි එය මිරිකා හැරියේ මකුණු විකර්ෂකයක් විසුරුවා දමන අයුරිනි.

''බලපල්ලා.'' පර්සි කෑ ගැසුවේය. ''දෙවියන්ගේ තෝරා ගත් බීම. ඩයට් කෝක්වල භයානක බවට පෙර වෙව්ලපල්ලා.''

ඩොල්පින් මිනිසුන් කලබල වීමට පටන් ගත්හ. ඔවූහු පසු බැසීමට සුදානමින් පසුවූහ. පර්සිට එය දැනිණි.

''දෙවියන් උඹලාගේ නැව අල්ලා ගනීවි.'' පර්සි අනතුරු ඇඟවූයේය. ''එයා උඹලව ඩොල්පින්ල බවට පත්කරන පරිවර්තනය සම්පූර්ණ කරාවි. එහෙම නැත්නම් උමතු කරාවි. එහෙමත් නැත්නම් උඹලව උමතු ඩොල්පින්ලා බවට පත් කරාවි! උඹලට තියෙන එකම විකල්පය තමයි ඉක්මනින් පීනලා ඈතට යන එක.''

''විකාරයක්!'' චෙරිසෝර්ගේ හඬ වෙව්ලන්නට විය. තම අසිපත පර්සි දෙසට එල්ල කළ යුතුද? නැත්නම් තම පිරිස දෙසට එල්ල කළ යුතු දැයි චෙරිසෝර්ට සිතා ගත නොහැකි විය.

''උඹලගෙ පණ බේරගනිල්ලා.'' පර්සි අනතුරු ඇඟ වූයේය. ''අපි දූන් ප්‍රමාද වැඩියි.''

ඉන්පසු ඔහු ෆ්‍රෑන්ක් සැඟවී සිටි තැන දෙසට අත දිගු කළේය. ''ඕහ්, නෑ!'' ෆ්‍රෑන්ක් උමතු ඩොල්පින් කෙනෙකු බවට හැරෙනවා.''

කිසිවක් සිදු නොවීය.

''මම කිව්වේ.'' පර්සි නැවත පැවසුවේය. ''ෆ්‍රෑන්ක්ව උමතු ඩොල්පින් කෙනෙක් බවට හැරෙනවා.''

සැඟවී සිටි තැනින් ඉදිරියට ගැටූ ෆ්‍රෑන්ක් තම ගෙල අල්ලාගෙන රඟපාන්නට විය. ''ආහ්, නෑ.'' ටෙලිප්‍රොම්ටරයකින් කියවන්නාක් මෙන් ඔහු කියවාගෙන ගියේය. ''මාව උමතු ඩොල්පින් කෙනෙක් වේගෙන යනවා.''

ඔහු වෙනස් වීමට පටන් ගත්තේය. ඔහුගේ නාසය හොම්බක් සේ දිගු වන්නට විය. ඔහුගේ සම ලිස්සන අළු පැහැයකට හැරිණි. ඔහු ඩොල්පින් කෙනෙකු සේ නැව් තට්ටුව මත වැටුණු, අතර, ඔහුගේ වලිගය නැව් තට්ටුවට පහර දෙන්නට විය.

උමතු වූ පිරිස, බියෙන් ත්‍රස්තව, තම ආයුධ පසෙක ලා, තම සිරකරුවන්ද අමතක කර චෙරිසෝර්ගේ නියෝගද නොතකා දිව ගොස් නැවෙන් පිටතට පැන්නාහ. කලබලය මැද සැනෙකින් පිපර් හා හේසාල් වෙත ළඟා වූ ඇනබෙත් ඔවුන් දෙදෙනාගේත් අනතුරුව කෝච් හෙජ්ගේත් බැමි ලිහා දැමුවාය.

තත්පර කිහිපයක් තුළදී හුදෙකලා වූ චෙරිසෝර්ව වටකර තිබිණි. ඇනබෙත්ගේ පිහියත්, කෝච් හෙජ්ගේ කුරත් හැරුණු විට පර්සිට සහ ඔහුගේ මිතුරන්ට වෙනත් ආයුධ නොතිබිණි. එහෙත් ඔවුන්ගේ මුහුණුවල වූ රුදුරු පෙනුම ඒ වනවිටත් චෙරිසෝර්ව යටත් කිරීමට ප්‍රමාණවත් වී තිබිණි.

ඔහු නැවේ අත් වැට දක්වා පසුපසට ගැටුවේය.

''මේක ඉවර නෑ. ජැක්සන්.'' චෙරිසෝර් ගෙරවීය. ''මම මගෙ පළිය ගන්නම්.''

නැවත තම ස්වරූපය වෙනස් කරගෙන සිටි ෆ්‍රෑන්ක් ඔහුගේ වචන කපා හැරියේය. රාත්තල් අටසීයක දුඹුරු වලසාට නිසැකවම සංවාදය බිඳ දැමීමේ හැකියාව පැවතිණි. චෙරිසෝර්ව පැත්තකට විසි කර දැමූ ඔහු, චෙරිසෝර්ගේ හිස්වැසුමට සවිකර තිබූ මුහුණු ආවරණය ගලවා දැමුවේය. බෙරිහන් දෙමින් චෙරිසෝර් තම දෑතින් මුහුණ ආවරණය කරගෙන, ජලයට පැන්නේය.

ඔවුහු අත්වැට දෙසට දිව ගියහ. චෙරිසෝර් අතුරුදහන් වී තිබිණි. පර්සි ඔහුව හඹා යාමට සිතුවත්, ඔහු මේ ජලය ගැන නොදන සිටියේය. එසේම මේ හාදයා සමඟ නැවත තනිව සටන් කිරීමට ඔහුට වුවමනාවක් නොතිබිණි.

''ඒක නියමයි.'' ඇනබෙත් ඔහුව සිප ගනිමින් පැවසුවාය. එයින් ඔහුට තරමක හොඳ හැඟීමක් දැනිණි.

''ඒක හරිම අමාරු වැඩක්.'' පර්සි පැවසුවේය. ''අපි මේ මුහුදු කොල්ලකාරයන්ගේ නැව විනාශ කරන්න ඕනෙ.''

''ඒක ගිනි තියනවද?'' ඇනබෙත් විමසුවාය.

පර්සි තම අතේ තිබූ ඩයට් කෝක් කෑනය දෙස බැලුවේය.

''නෑ මට වෙන අදහසක් ආවා.''

එයට පර්සි බලාපොරොත්තු වුවාට වඩා කාලයක් ගතවිය. ඒවා වැඩ කරද්දී, ඔහු මුහුද දෙසම බලාගෙන සිටියේ චෙරිසෝර් සහ ඔහුගේ මුහුදු කොල්ලකාර ඩොල්පින්ලා නැවත පැමිණෙතැයි යන බලාපොරොත්තුවෙනි. එහෙත් ඔවුහු නොපැමිණියහ.

පැණි ස්වල්පයකට පින් සිදු වන්නට ලියෝ නැවත නැගිට්ටේය. පිපර් ජේසන්ගේ තුවාලවලට ප්‍රතිකාර කළත්, පෙනුණු තරම් තදබල ලෙස ඔහුට තුවාල වී නොතිබිණි. නැවත තම බලය අධික ලෙස යෙදවීම නිසා වැඩියෙන්ම ඔහු තෙහෙට්ටුවට පත්ව සිටියේය.

ඔවුන්ගේ සැපයුම් නැවත නිසි තැන්වල තැන්පත් කිරීමෙන් පසු, කෝච් හෙජ් සතුරු නැවට නැගී ඔහුගේ අතට අසුවූ සියල්ලක්ම තම බේස්බෝල් පිත්තෙන් ගසා පොඩිකර දැමුවේය.

කෝච්ගේ කාර්යය අවසන් වූ පසු, පර්සි සතුරන්ගේ ආයුධ නැවත ඔවුන්ගේ නැවට දැමුවේය. ඔවුන්ගේ ගබඩා කාමරය වස්තු සම්භාරයකින් පිරී තිබුණත්, ඒවා ඇල්ලීමටවත් පර්සි කැමැත්තක් නොදක්විය.

''මට දැනෙන විදිහට ඩොලර් මිලියන හයසීයක් විතර වටින රත්‍රන් නැවේ තියෙනවා.'' හේසාල් පැවසුවාය. ''ඒ වගේම දියමන්ති, මැණික්.''

''මි- මිලියන හයක්?'' ෆ්‍රෑන්ක් ගොත ගැසුවේය. ''කැනේඩියන් ඩොලර්ද ඇමරිකන් ඩොලර්ද?''

''ඒක අතහැරල දාන්න.'' පර්සි පැවසුවේය. ''ඒක කප්පමේ කොටසක්.''

''කප්පමේ.?'' හේසාල් විමසුවාය.

''ඕහ්.'' පිපර් හිස සැලුවාය. ''කන්සාස්.''

ජේසන් විරිත්තුවේය. ඔවුන් වයින් දෙවියා හමුවන විට ඔහුත් එතැන සිටියේය. ''පිස්සුවක්. ඒත් මම ඒකට කැමතියි.''

අවසානයේදී මුහුදු කොල්ලකරුවන්ගේ නැවට ගිය පර්සි එහි ජල ගැලුම් කපාට විවෘත කළේය. නැවේ බඳේ තවත් අමතර සිදුරු කීපයක් ලියෝගේ උපකරණ ආධාරයෙන් ඇති කරන ලෙස ඔහු ලියෝට පැවසූ අතර ලියෝ මහත් සතුටින් එයට එකඟ විය.

අත්වැට අසලට එකතු වූ ආගෝ II හි පිරිස ඇවුළුම් කොකු කපා දැමූහ. තමාට හිමි වූ අලුත් අඟ රැගෙන ආ පිපර් එය පර්සි සිටි දෙසට යොමු කර, ඩයට් කෝක් බැහැර කරන ලෙස ප්‍රාර්ථනා කළාය. ගිනි නිවන නලයකින් ජලය විදින්නාක් මෙන් ඒවා සතුරු නෞකාවේ තට්ටුවට පතිත විය. එයට පැය ගණනක් ගතවනු ඇතැයි පර්සි සිතුවත්, ඩයට් කෝක් සහ මුහුදු ජලයෙන් පිරුණු නැව ඇදගිය නොහැකි තරම් වේගයෙන් ගිලී ගියේය.

''ඩියෝනීසස්.'' චෙරිසෝර්ගේ රන් මුහුදු ආවරණය ඔසවා ගෙන පර්සි පැවසුවේය. ''එහෙම නැත්නම් බැචස්- කවුරු වුණත් ඔබ මෙතන නොසිටියත්, ඔබ මේ ජයග්‍රහණය යථාර්ථයක් කළා. ඔබේ නම ඇසුණු විගස සතුරෝ වෙව්ලන්නට වුණා... එහෙම නැත්නම් ඩයට් කෝක් හෝ වෙන දෙයක් නිසා හරි. ඉතිං, ඔව්, ඔබට ස්තූතියි.''

වචන පිටකිරීම අසීරු වුවත්, පර්සි රැවටීමක් නොකිරීමට වග බලාගත්තේය. ''අපි මේ නැව ඔයාට කප්පමක් විදිහට දෙනවා. අපි හිතනවා ඔයා ඒකට කැමති වෙයි කියලා.''

''මිලියන හයක රත්තරන්.'' ලියෝ මිමිණුවේය. ''එයා ඒකට හොඳටම කැමති වෙයි.''

''ෂ්... ෂ්...'' හේසාල් රැව්වාය. ''වටිනා ලෝහ හැම එකක්ම විශිෂ්ට නැහැ. මාව විශ්වාස කරන්න.''

පර්සි යාත්‍රාවේ තට්ටුවට රන් මුහුණු ආවරණය විසි කළේය. මේ වනවිට නැව වඩාත් වේගයෙන් ගිලී යමින් තිබිණි. එහි හබල් අවට

දුඹුරු පැහැති ද්‍රව පැල්ලමක් දැක ගැනීමට ලැබුණු අතර මුහුදු ජලයද දුඹුරු පැහැයක් ගෙන තිබිණි.

පර්සි රැල්ලක් කැඳවිය. සතුරු නෞකාව දියේ ගිලී ගියේය. සතුරු නැව දියේ ගිලීයත්ම ලියෝ, ආගෝ II ඒ අසලින් ඉවතට ගෙන ගියේය.

''ඒක දූෂකයක් නෙමෙයිද?'' පිපර් විමසුවාය.

''මම නම් ඒ ගැන කරදර වෙන්නෙ නෑ.''ජේසන් ඇයට පැවසුවේය. ''බැචස් ඒකට කැමති නම්, නැව අතුරුදහන් වෙයි.''

එය සිදුවන ඇත්දැයි පර්සි නොදැන සිටියත්, තමා තමාට හැකි සියල්ල කළ බවට හැඟීමක් ඔහු තුළ ඇති විය. ඩියෝනීසස්ට ඔවුන්ව ඇසුණු බව හෝ ඔවුන් පැවසූ දේ ගැන සැලකිලිමත් වූ බව හෝ ගැන ඔහුට විශ්වාසයක් නොතිබිණි. නිවුන් යෝධයන්ට එරෙහි සටනේදීත් ඔහුගෙන් එතරම් උදව්වක් නොලැබිණි. එහෙත් ඔහු උත්සාහ කළ යුතු විය.

මීදුම අතරින් ආගෝ II නැගෙනහිර දෙසට යාත්‍රා කරද්දී, චෙරිසෝර් සමග සිදු වූ කඩු සටනේදී අඩුම වශයෙන් එක් හොඳක් හෝ සිදු වූ බව පර්සි තීරණය කළේය. ඔහුට නිහතමානී හැඟීමක් ඇති වෙමින් තිබිණි. වයින් දෙවියාට කප්පම් ගෙවන තරමට පවා නිහතමානී හැඟීමක්.

මුහුදු කොල්ලකරුවන් සමග ඔවුන්ගේ පොරයෙන් පසු, රෝමයට යන ඉතිරි දුර පියාසර කිරීමට ඔවුහු තීරණය කළහ. තමා කෝච් හෙජ් සමග ආරක්ෂක රාජකාරියේ යෙදීමට හැකි තරමට ශක්තිමත් බවට ජේසන් තර්ක කළේය.

අරුණෝදයට තවත් පැය කීපයක් ඉතිරි වී තිබිණි. එබැවින් පර්සි තවත් පැය කීපයක් නිදාගත යුතු යැයි ජේසන් යෝජනා කළේය. ''මම හොඳින්, මනුස්සයෝ.'' ජේසන් පැවසුවේය. ''වෙන කෙනෙකුටත් නැව ආරක්ෂා කරන්න අවස්ථාව දෙන්න ඕනෙ නේද?''

පර්සි එකඟ වුවත්, කුටිය තුළට ගිය පසු නින්දට යාම ඔහුට ප්‍රශ්නයක් විය.

ඔහු සිවිලිමේ එල්ලා තිබූ ලෝකඩ ලන්තෑරුම දෙස බලාගෙන කල්පනාවට වැටිණි. කඩු සටනේදී චෙරිසෝර් ඔහුව කොතරම් පහසුවෙන් පරාජය කළේ දැයි ඔහුට සිහිපත් විය. දහදිය බිඳුවකටවත් හානියක් නොකර ස්වර්ණ රණ ශූරයාට ඔහුව මරා දැමීමේ හැකියාව

තිබිණි. ඔහු පර්සිව නොමරා ඉතිරි කළේ එකම හේතුවක් නිසාය. ඒ යමෙකුට ඔහුව පසුව මරා දැමීමට අවශ්‍යව තිබෙන නිසාය.

තවමත් ඔහුට ඇචිලස්ගේ ආශිර්වාදය ඇති බවත්, යමෙකු තමන්ගේ දුර්වල තැන හඳුනාගෙන ඇති බවත් පවසන්නා සේ පර්සිට සන්නාහයේ සිදුරකින් හීයක් ඇතුළු වූවා වැනි හැඟීමක් දැනුණේය. වයසින් වැඩෙත්ම අර්ධ ලෝහිතයකු ලෙස ඔහුගේ දිවි රැකෙද්දී, ඔහුගේ මිතුරන් වැඩි දෙනෙක් ඔහු දෙස බලා සිටියහ. ඔවුහු ඔහු මත යැපුණු අතර, ඔහුගේ බලය ගැන විශ්වාස කළහ. රෝමවරු පවා ඔහුගේ ආරක්ෂාවේ පිහිට පැතූ අතර, ඔවුහු පර්සිව දැන හඳුනාගෙන ගත වී තිබුණේ සති කීපයක් වුවත්, ඔහුව රෝම විනිසුරුවකු බවට පත් කළහ.

එහෙත් පර්සිට බල සම්පන්න හැඟීමක් නොදැණිනි. වීර ක්‍රියා වැඩියෙන් කරද්දී, තමා කෙතරම් සීමාකෘත අයෙක්දැයි ඔහුට වැඩියෙන් අවබෝධ විය. තමා වංචාවක් කළා වැනි හැඟීමක් ඔහුට ඇති විය. *මම ඔයාල හිතන තරම් ශ්‍රේෂ්ටයෙක් නෙමෙයි.* ඔහුට තම මිතුරන්ට පැවසීමට අවැසි විය. අද දින මෙන්, ඔහුගේ අසමත්වීම් එය තහවුරු කළේය. සමහරවිට ඔහු බියෙන් හුස්ම හිර වන්නට ඇත්තේ ඒ නිසා විය හැකිය. එය පොළොවේ හෝ මුහුදේ ගිලී යාමක් නොව පමණට වඩා අපේක්ෂාවල ගිලී යාමකි.

වාව්... ඔහුට මෙවැනි දෑ සිතන්නට පටන් ගනිත්ම, තමා ඇනබෙත් සමඟ ඕනෑවටත් වැඩි කාලයක් ගත කර තිබෙන බව ඔහුට අවබෝධ විය.

පර්සිගේ මාරක දුර්වලතාවය ගැන ඇතීනා වරෙක පවසා තිබුණාය. ඔහු මිතුරන්ට පමණට වඩා පක්ෂපාතී අයෙකි. ඔහුට විශාල රූපයක් දැකිය නොහැකිය. ලෝකය විනාශ දමා හෝ ඔහු මිතුරන්ව ආරක්ෂා කරනු ඇත.

ඒ කාලයේ පර්සි දෙවුර සලා එය බැහැර කළේය. නරක දේවල්වලට පක්ෂපාතී වන්නේ කෙසේද? අනෙක් අතට ටයිටන්ලාට එරෙහිව සියල්ල හොඳින් සිදුවිය. ඔහු තම මිතුරන් බේරා ගත් අතර ක්‍රොනොස්ව පරාජය කළේය.

එහෙත්, දැන් ඔහුට පුදුමයක් ඇති කරමින් තිබිණි. තම මිතුරන්ට හානි වීමෙන් වළක්වා ගැනීම සඳහා ඔහුට ඕනෑම රාක්ෂයකුට, දෙවියකුට හෝ යෝධයකුට බිලි වීමට හැකිය. එහෙත් ඔහුට ඒ කාර්යය කිරීමට

නොහැකි වුවොත් කුමක් සිදුවෙයිද? වෙනත් අයකු එය කළොත් කුමක් සිදුවෙයිද? එය ඔහුට පිළිගැනීමට අසීරු දෙයක් විය. ජේසන්ට ආරක්ෂක රාජකාරිය කිරීමට ඉඩදීම වැනි සුළු කරුණක් පවා ඔහුට ප්‍රශ්නයක් වී තිබිණි. වෙනත් අයකු තමන්ව ආරක්ෂා කරතැයි යන්න මත විශ්වාසය තැබීමට ඔහුට වුවමනා නොවීය. ඔහුගේ වරදකට වෙනත් අයකුට රිදවනු දකීමට ඔහුට වුවමනා නොවීය.

පර්සිගේ මව එය ඔහු වෙනුවෙන් කර තිබුණාය. ඇය දැඩි මනුෂ්‍ය හාදයකු සමඟ අයහපත් සබඳතාවක් පවත්වාගෙන ගියේ පර්සිව රාක්ෂයින්ගෙන් ආරක්ෂා කර ගැනීමට හැකිවෙතැයි ඇය සිතූ නිසාය. ඔහුගේ හොඳම මිතුරා වූ ග්‍රෝවර්, පර්සිට තමා උපදෙවියකු බව අවබෝධ වීමට වසරකට පෙර ඔහුව බේරාගෙන තිබිණි. මිනෝටෝර් විසින් ග්‍රෝවර්ව මුළුමනින්ම වාගේ මරා දමා තිබිණි.

තවදුරටත් පර්සි දරුවකු නොවීය. ආදරය කරන කිසිවකු හෝ තමා වෙනුවෙන් අවධානමක් ගනු දකීමට ඔහුට වුවමනා නොවීය. තමාගේ ආරක්ෂාව සලසාගත හැකි තරමට ඔහු බලවත්ව සිටියේය. එහෙත් දැන්, ඇනබෙත් මිය යාමට වුවත් හැකි බව දැන දැනම ඔහු ඇයට ඇතීනාගේ සලකුණ සොයා යාමට ඉඩ දී තිබේ. ඇනබෙත්ව බේරා ගැනී හෝ ගවේෂණය සාර්ථක වීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගැනීමට සිදු වුවහොත්, පර්සිට සැබැවින්ම ගවේෂණය තෝරා ගත හැකි ද?

අවසානයේ තෙහෙට්ටුව ඔහුව වෙලා ගත්තේය. ඔහුගේ බියකරු සිහිනයේදී පෘථිවි දෙවඟන ගයියාගේ සිනහව මේඝ ගර්ජනාවක් සේ පැමිණියේය.

තමා අර්ධ ලෝහිත කඳවුරේ මහා මන්දිරයේ ද්වාර මණ්ඩපය මත සිටින අයුරු ඔහු සිහිනෙන් දුටුවේය. අර්ධ ලෝහිත කඳු ගැටයේ පසෙක ගයියාගේ නිදිබර මුහුණ දර්ශනය විය. තෘණවලින් වැසීගත් බෑවුම්වල සෙවණැලි වලින් ඇගේ දවැන්ත ඉරියව් සැදී තිබේ. ඇගේ දෙතොල් නොසෙල්වුණත්, ඇගේ හඬ නිම්නය පුරා දෝංකාර දුන්නේය.

*එහෙනම් මේ නුඹේ නිවහන. ගයියා මිමිණුවේය. අවසන් වතාවට බලපන්, පර්සි ජැක්සන්. උඹ ආපසු මෙහෙට පැමිණිය යුතුයි. එවිට අඩුම වශයෙන් උඹට රෝමන්වරු ආක්‍රමණය කරද්දී උඹේ යහළුවන් සමඟ මිය යාමට හැකිවනු ඇත. දැන් නුඹේ රුධිරය නිවෙසින් ඈත පැරණි ගල් මත විසිරී යනු ඇත. මා අවදි වනු ඇත.*

පොළොව දෙදරා ගියේය. අර්ධ ලෝහිත කඳු ගැටය මුදුනේ තාලියාගේ පයින් ගස ගිනි ගත්තේය. විදාරණය පහළ නිම්නය හරහා පැතිරී ගොස් තෘණ වැලි බවට පත්විය. වනය දූවිලි බවට පත් විය. ගංගාව සහ පාරු විල වියළී ගියේය. කුටි සහ මහා මන්දිරය ගිනිගෙන අළු බවට පත් විය. වෙව්ලුම නවතින විට, අර්ධ ලෝහිත කඳවුර පරමාණු බෝම්බ ප්‍රහාරයකට හසු වූ මුඩු බිමක් ලෙස දිස්විය. ඉතිරි වී තිබූ එකම දෙය වූයේ පර්සි සිටගෙන සිටි ද්වාර මණ්ඩපය පමණකි.

ඔහුට ආසන්නයේ, දූවිලි වළාවක් කරකැවෙමින් එය ගැහැනියකගේ රූපයකට ඝන වන්නට විය. නින්දෙන් ඇවිදින්නකු සේ ඇගේ දෑස් වැසී තිබිණි. ඇගේ ලෝගුව වනයේ හරිත පැහැය ගත් අතර, අතු අතරින් හිරු එළිය දිලිසෙන්නාක් මෙන් ඒ මත රන් සහ සුදු පැහැති තිත් වැටී තිබිණි. ඇගේ හිසකේ සාරවත් පස් තරමට කළු පැහැති විය. ඇගේ මුහුණ රූමත් වුවත් නිද්‍රාශීලී සිනාවකින් සැරසී තිබියදී පවා දෙතොල් දැඩි ඒවා ලෙස පෙනිණි. උප දෙවියන් මිය ගොස්ද කියා හෝ නගරය දැවී ඇත්දැයි යන්න ඇයට දැක ගැනීමට හැකි බව පර්සිට හැඟුණේය. ඒ සිනාවේ අවිනිශ්චිත බවක් නොතිබිණි.

*''මම නැවත පෘථිවියට පැමිණි විට.''* ගයියා පැවසුවාය. *''නුඹලාගේ වර්ගයා සහ මාව නැවැත්වීමට නොහැකි තරමට නුඹලා කෙතරම් දුබල ද යන්න මතක් වීම සඳහා මා මෙතැන සදාකාලිකවම මුඩු බිමක් ලෙස තිබෙන්නට හරිනවා. උඹේ වැටීම පෝසයිස් අතින් හෝ චෙරිසෝර් අතින් වුණත්, මගේ ආදරණීය නිවුන්නන් අතින් වුණත් ඒක මට ප්‍රශ්නයක් නැහැ. උඹ වැටෙනවාමයි. මම උඹව ගිලදාන්න එතැන ඉඳීවි. දැන් උඹට තියෙන එකම විකල්පය... උඹ වැටෙන්නෙ තනියමද කියන එකයි. කෙල්ලත් අරගෙන කැමැත්තෙන්ම මා ළඟට වරෙන්. සමහරවිට උඹ ආදරය කරපු මේ තැනට මම මොකුත් නොකර ඉඳීයි. එහෙම නැත්නම්...''*

ගයියා ඇගේ දෑස් විවර කළාය. පෘථිවි පෘෂ්ඨය තරම් ගැඹුරට ඒවා කොළ සහ කළු පැහැයෙන් කරකැවෙමින් තිබිණි. ගයියා සියල්ලම දුටුවාය. ඇගේ ඉවසීම අපරිමිත විය. ඇය අවදි වන්නේ සෙමින් වුවත්, වරක් අවදි වූ පසු ඇගේ බලය නැවැත්වීමට නොහැකිය.

පර්සිගේ සම පොපියන්නට විය. ඔහුගේ දැත් හිරි වැටිණි. බිම බලන විට ඔහුට අවබෝධ වූයේ තමා මෙතෙක් පරාජය කළ සියලු රාක්ෂයන් මෙන් ඔහුත් දූවිලි බවට පත්වෙමින් තිබෙන බවය.

''*විනෝද වෙන්න ටාටරස්, මගෙ පුංචි ඉත්තෝ.*'' ගයියා පැවසුවාය. ලෝහ ගැටෙන ක්ලැන්- කැලැන්- ක්ලැන් හඬ පර්සිව සිහිනයෙන් මුදවාලීමට සමත් විය. ඔහුගේ දෑස් සැනෙකින් විවර විය. ඔහුට ඇසුණේ ගොඩබිමේ ගියරය පහත් කරන හඬ බව ඔහුට අවබෝධ විය.

දොරට තට්ටු කරගෙනම, ජේසන් කුටිය තුළට හිස එබුවේය. ඔහුගේ මුහුණේ වූ තැලුම් තුවාල වියැකී ගොස් තිබිණි. ඔහුගේ නීල දෑස් උද්වේගයෙන් දිලිසෙමින් තිබිණි.

''හේයි, මනුස්සයෝ.'' ඔහු පැවසුවේය. ''අපි රෝමයට ගොඩබානවා. ඔයා ඇත්තටම මේක බලන්න ඕනෙ.''

කුණාටු කාලගුණයක් කිසිවිටෙක නොපැවතුණ සේ අහස නිල් පැහැයෙන් දිදුලමින් තිබිණි. ඈත කඳු මතින් හිරු නැගෙමින් තිබූ බැවින් ඔවුන්ට පහළින් තිබූ සියල්ල දැකගත හැකි වූ අතර මුළු රෝම නගරයම දිලිසෙමින් තිබුණේය.

පර්සි මීට පෙර විශාල නගර දැක තිබිණි. සේරටමත් වඩා ඔහු පැමිණියේද නිව්යෝර්ක් වලිනි. එහෙත් රෝම නගරයේ විශාලත්වය ඔහුගේ උගුර සිරකර හුස්ම ගැනීමද අපහසු කරවන තරම් විය. නගරය, භූගෝලීය සීමාවන්වල ඉල්ලීමට අවනත නොවූ බවක් පෙනිණි. එය කඳු සහ නිම්න අතරින් පැතිරී ගොස් පාලම් දුසිම් ගණනකින් ටයිබර් ගංගාවද තරණය කර ක්ෂිතිජය දක්වන විහිදී තිබිණි. වීථි සහ පටුමාර්ග වංගු ගැසෙමින් හේතුවක් හෝ රටාවක් නොමැතිව විහිදී ගියේය. වීදුරුවලින් ආවරණය කළ කාර්යාල ගොඩනැගිලි කැණීම් බිම්වලට යාබදව පිහිටා තිබුණේය. රෝම කුලුනු පෙළක් අසල දේවස්ථානයක්ද, ඒ අසලම නූතන පා පන්දු පිටියක්ද විය. අවට පිහිටි සමහර ප්‍රදේශවල හුණු බදාමයෙන් කළ පැරණි මන්දිර වූ අතර ඒවායේ වහල රතු උළුවලින් සෙවිලි කර තිබුණේය. ඒවායේ මාර්ග බොරළු අතුරා සකස්කර තිබිණි. එබැවින් පර්සිට හැඟී ගියේ තමා අතීතයට ගමන් කර ඇති බවකි. ඔහු බැලූ සෑම අතකම, දක්නට ලැබුණේ ගොඩනැගිලි වලින් වට වූ පුළුල් වීථි සහ රථ වාහන පිරි මාර්ගයන්ය. නගරය හරහා පැවති උද්‍යානවල පාම් ගස්, පයින්, ජුනිපර් සහ ඔලිව් ගස් දක්නට ලැබිණි. එය හරියට රෝමයට තමා ලෝකයේ කොයි කොටසට අයත් දැයි හෝ නැතිනම් මුළු ලෝකයම තවමත් රෝමයට අයත් දැයි තීරණය කර ගැනීමට නොහැකි වූවා වැනි විය.

එය හරියට පර්සි ගයියා ගැන දුටු සිහිනය, නගරය දැන සිටියාක් මෙනි. පෘථිවි දෙවඟන සියලු මානව ශිෂ්ටාචාරයන් මකා දැමීමට අදහස් කරන බව එය දැන සිටියේය. වසර දහස් ගණනක් නැගී සිටි මේ නගරය, ඇයට මෙසේ කියනු ඇත. *නුඹට මේ නගරය දියකර හැරිය නොහැකිය. කැත මූණා? උත්සාහ කරපන්.*

''අපි උද්‍යානයට පහත් කරමු.'' පාම් ගස් අතර තිබූ පුළුල් හරිත අවකාශයක් පෙන්වමින් ලියෝ පැවසුවේය. ''අපි හිතමු, මිස්ට්එක නිසා අපිව ලොකු පරෙවියෙක් වගේ දෙයක් විදිහට දකියි කියලා.''

ජේසන්ගේ සොහොයුරිය තාලියා මෙහි සිටිනු ඇතැයි පර්සි ප්‍රාර්ථනා කළේය. ඇයට අවශ්‍ය දේ ඒ ආකාරයෙන් මිනිසුන්ට දැකීමට හැකි ලෙස මිස්ට් ඇතිකරන විධිය ඇය නිතරම දැන සිටියාය. පර්සිට කිසිදාක ඒ හැකියාව නොතිබිණි. ඔහු සිතන්නට පටන් ගත්තේය. *මා දිහා බලන්න එපා,* එසේම උදෑසන කලබලකාරී වේලාවක තම නගරයට පහත්වන යෝධ යුද නැව පහළ සිටින රෝමන්වරුන්ගේ අවධානයට ලක් නොවනු ඇතැයි ඔහු බලාපොරොත්තු විය.

එය වැඩ කරන බව පෙනිණි. මාර්ගයෙන් ඉවතට ඇදී ගිය වාහන හෝ 'පිටසක්වල ජීවීන්' යයි කෑ ගසමින් අහසට අත් දිගු කරන රෝම වැසියන් ඔහුට දක්නට නොලැබිණි. ආගෝ II තණ බිමට පහත් වූ අතර හබල් ඇතුළට ඇද ගැනිණි.

රථ වාහනවල ඝෝෂාව සෑම අතින්ම ඇසුණත්, උද්‍යානය සාමකාමී මෙන්ම ජන ශූන්‍යව පැවතිණි. ඔවුන්ගේ වම් පසට වන්නට හරිත තණ තිල්ලක් වන ලැහැබක් දෙසට බෑවුම් වී තිබිණි. අඩි තිහ හතළිහක් උස් වූ, කද ඇඹරී ගිය අමුතු පෙනුමැති පයින් ගස් සෙවණක පැරණි නිවෙසක් පිහිටා තිබිණි. පර්සි කුඩා කළ ඔහුගේ මව කියවීමට පුරුදුව සිටි ඩොක්ටර් සෙසස් ගේ පොත්වල තිබූ ගස් ඔහුගේ මතකයට නැගුණේය.

ඔවුන්ගේ දකුණු පැත්තේ, සර්පයකු සේ දඟර ගැසෙමින් දිගු ගඩොල් ප්‍රාකාරයක් කඳු මුදුන දක්වා විහිදී තිබුණේය. එහි දුණුවායන් සඳහා සිදුරු පිහිටා තිබුණ අතර සමහරවිට එය මධ්‍යකාලීන යුගයේ ආරක්ෂිත ප්‍රාකාරයක් වන්නට ඇත. සමහරවිට එය පැරණි රෝම යුගයටද අයත් විය හැකිය. එහෙත් පර්සිට එය හරියටම පැවසීමේ හැකියාවක් නොතිබිණි.

උතුරින්, නගරය මධ්‍යයෙන් සැතපුමක් පමණ ඈතින් ගොඩනැගිලිවල වහලයට ඉහළින් කොලෝසියම[1] දිස්විය. එය හරියටම සංචාරක ජායාරූපවල දිස්වන ආකාරයෙන්ම දර්ශනය විය. ඒ මොහොතේදී පර්සිගේ දෙපා වෙව්ලීමට පටන් ගත්තේය. ඔහු මෙහි සැබැවින්ම සිටියේය. ඔහු තම ඇලස්කාවේ සංචාරය ගැන සිතන විට එහි තරමක විදේශීක ගතියක් තිබිණි. එහෙත් දැන් ඔහු සිටින්නේ පැරණි රෝම අධිරාජ්‍යයේ හදවතේය. එනම් ග්‍රීක උප දෙවිවරුන්ගේ සතුරු බල ප්‍රදේශයකය. එක් අතකින් මේ ස්ථානය නිව්යෝර්ක් තරමටම ඔහුගේ ජීවිතය හැඩගැස්සවීමට සමත් විය.

ජේසන් දුණුවායන්ගේ ප්‍රාකාරයේ පාදමේ එක් ස්ථානයක් පෙන් වූයේය. එතැනින් පහළට විහිදුණු පියගැට පෙළක් යම් ආකාරයක උමඟක් යැයි සිතිය හැකි තැනකට යොමු වී තිබිණි.

''මම හිතනවා, අපි ඉන්නෙ කොහෙද කියල මම දන්නවා කියලා.'' ඔහු පැවසුවේය. ''ඒ ස්සිපියස්ගෙ සොහොන.'' පර්සි මුහුණ හැකිලුවේය. ''ස්සිපියස්... රෙයිනාගේ පෙගාසස්ද?''

''නෑ.'' ඇනබෙත් පැවසුවාය. ''එයාල රදළ රෝම පවුලක් ඒ වගේම... වාව්, මෙතැන හරි අපූරුයිනෙ.''

ජේසන් හිස සැලුවේය. ''මම මීට කලින් රෝමයෙ සිතියම් අධ්‍යයනය කරල තියෙනවා. මට හැමදාම ඕනෙ වුණා මෙතෙන්ට එන්න. ඒත්...''

වාක්‍යය සම්පූර්ණ කිරීමට කිසිවකු කරදර වූයේ නැත. තම මිතුරන්ගේ මුහුණු දෙස බලනවිට, ඔවුන්ද තමා මෙන්ම බිය මුසු ගෞරවයකින් පසුවන බව ඔහුට කිවහැකි විය. ඔවූහු එය කළහ. ඔවූහු රෝමයට ගොඩබැස්සාහ- *රෝමයට.*

''සැලසුම් මොනවද?'' හේසාල් විමසුවාය. ''නිකෝ ඉර බසිනකම් හොඳින් ඉඳියි. ඒ වගේම මේ මුළු නගරයම අද විනාශ වීමට නියමිතයි.''

තම දෑස්වල අඳුර පලවා හැරීමට පර්සි හිස ගැසුවේය. ''ඔයා හරි. ඇනබෙත්... ඔයාගේ ලෝකඩ සිතියමේ ඔයාට ඒ තැන හොයාගන්න බැරි වුණාද?''

---

1 ඉතාලියේ , රෝමය මධ්‍යයේ තිබෙන ඉලිප්සාකාර රංග ශාලාවකි. නරඹන්නන් 50000කට පමණ අසුන් ගත හැකිය. මල්ලවපොර තරඟ, සත්ත්ව දඩයම්, මරණ දඬුවම්දීම වැනි කාර්යයන් සඳහා යොදා ගැනිණි.

ඇගේ දෑවෙන ඇස් ඔහු දෙසට යොමු විය. ඒවාගෙන් කියවුණු දේ ඔහුට තේරුම් ගත හැකිවිය. *මම කිව්ව දේ මතක තියාගන්න. ඒ හීනය ඔයා ළඟම තියාගන්න.*

''ඔව්.'' ඇය ප්‍රවේසමෙන් පැවසුවාය. ''ඒක තියෙන්නෙ ටයිබර් ගංගාවෙ. මම හිතනවා මට ඒක හොයාගන්න පුළුවන් කියලා. ඒත් මම-''

''මාවත් එක්ක යන්න.'' පර්සි ඇගේ වාක්‍යය සම්පූර්ණ කළේය.

''ඔව්. ඔයා හරි.''

ඇනබෙත් ඔහු දෙසට දැඩි බැල්මක් හෙලුවාය. ''ඒක නෙමෙයි.''

''ආරක්ෂාව.'' ඔහු පැවසුවේය. ''එක උපදෙවියෙක් රෝමයෙ තනියම ඇවිදිනවා. ටයිබර් ගංගාව වෙනකම් මම ඔයා එක්ක එන්නම්. අපිට අර හඳුන්වාදීමේ ලිපිය පාවිච්චි කරන්න පුළුවන්. ගංගා දෙවියා ටයිබේරිනස් හමුවෙයි කියලා බලාපොරොත්තු වෙමු. සමහරවිට එයාට පුළුවන්වෙයි ඔයාට උදව්වක් හරි උපදේශයක් හරි දෙන්න. ඊටපස්සේ එතැන ඉඳල ඔයාට තනියම යන්න පුළුවන්.''

ඔවුහු නිහඬව එකනෙකා දෙස බලාසිටියහ. එහෙත් පර්සි තම දෑස් ඉවතට නොගත්තේය.

''අපූරුයි.'' ඇනබෙත් මිමිණුවාය. ''හේසාල්, දැන් අපි ඉන්නෙ රෝමයෙ. ඔයා හිතනවද ඔයාට නිකෝ ඉන්න තැන හොයාගන්න පුළුවන් කියලා?

හේසාල් ඇසිපිය සැලුවාය. ''ම්... බලාපොරොත්තු වුණ විදිහටම, මට ප්‍රමාණවත් තරම් ළං වෙන්න ලැබුණොත්. මට නගරය පුරාම ඇවිදින්න වෙනවා. ෆ්‍රෑන්ක්, ඔයා මාත් එක්ක එනවද?''

ෆ්‍රෑන්ක් ප්‍රාණවත් විය. ''නිසැකයෙන්ම.''

''ඒ වගේම, ආහ්... ලියෝ.'' හේසාල් පැවසුවාය. ''ඔයත් එනවනම් ඒක හොඳ අදහසක් වෙයි. මත්ස්‍ය- නරාශ්වයා කිව්වා මොනවහරි යාන්ත්‍රික දේකදී අපිට ඔයාගෙ උදව් ඕනෙ වෙයි කියලා.''

''ඔව්.'' ලියෝ පැවසුවේය. ''ප්‍රශ්ණයක් නැහැ.''

ෆ්‍රෑන්ක්ගේ සිනාව චෙරිසෝර්ගේ වෙස්මුහුණටත් වඩා වැඩියෙන් විරූපී විය.

සම්බන්ධතා ගැන පර්සි එතරම් බුද්ධිමත් අයකු නොවුණත්, මේ තිදෙනා අතර පැවති ආතතිය පර්සිට ද දැනුණේය. අත්ලාන්තික් සයුරට වැටුණු තැන පටන් ඔවුන් එකම ආකාරයට හැසිරුණු බවක් නොපෙනුණි. ඒ හුදෙක් ඔවුන දෙදෙනා අතර හේසාල් වෙනුවෙන් පැවති තරගය නිසාම නොවේ. ඒ ඔවුන් තිදෙනා යම් ආකාරයක ගුප්ත මරණීය අභිරහසකින් එකිනෙකා බැඳී පැවතුණ බවක් පෙනුණු නිසාය. එහෙත් ඔවුන් අතරින් වින්දිතයා කවුදැයි තවමත් ඔවුන්ට සොයා ගැනීමට නොහැකි වී තිබිණි.

පිහිය ඇදගත් පිපර්, අත් වැටට හේත්තු වූවාය. ''දැන් ඉඳල මටයි ජේසන්ටයි නැව බලාගන්න පුළුවන්. මම බලන්නම් කැටොප්ට්‍රිස් එක මට මොනවද පෙන්නන්නෙ කියලා. ඒත්, හේසාල්, ඔයාගෙ හාදයෝ නිකෝ ඉන්න තැන හොයාගත්තොත්, ඔයාල විතරක් එතෙන්ට යන්න එපා. ආපහු ඇවිත් අපිවත් එක්ක යන්න. එතකොට අපි සේරටම යෝධයෝ එක්ක සටන් කරන්න පුළුවන්.''

ඇය එය ප්‍රත්‍යක්ෂයෙන් පැවසූවක් නොවීය. ඔවුන් සියල්ලෝම එකතු වුවත්, දෙවියකු ඔවුන්ගේ පැත්තට නොමැතිව, එය ප්‍රමාණවත් නොවනු ඇත. එම කරුණ මතු නොකිරීමට පර්සි තීරණය කළේය.

''හොඳ අදහස.'' පර්සි පැවසුවේය. ''කොහොමද අපේ නැවත හමුවීම සැලසුම් කරන්නේ, කීයටද?''

''හවස තුනට?'' ජේසන් යෝජනා කළේය. ''එතකොට අපිට හමුවෙලා කතා කරන්න පුළුවන්, යෝධයොත් එක්ක සටන් කරල නිකෝව බේර ගන්න පුළුවන්ද කියලා. සැලසුම වෙනස් වෙන යමක් වුණොත්, අයිරිස් පණිවුඩයක් එවන්න උත්සාහ කරන්න.''

අනෙක් අය එකඟතාව පළ කිරීමට හිස සැලුවත්, ඔවුන්ගෙන් කීප දෙනෙක් ඇනබෙත් දෙස බලා සිටින බව පර්සි දුටුවේය. කිසිවකුට තවත් දෙයක් පැවසීමේ වුවමනාවක් නොතිබිණි. ඇනබෙත් සිටිනුයේ වෙනත් සැලසුමකය. ඇයට තුන වනවිට පැමිණීමට හැකිවනු ඇත. එසේ නැතිනම් තවත් ප්‍රමාද වනු ඇත. සමහරවිට කොහෙත්ම නොපැමිණෙනු ඇත. එහෙත් ඇය ඇතීනා පාතිනොන් සොයා තනිව යා යුතුය.

කෝච් හෙජ් ගෙරවූයේය. ''එතකොට මට පොල් ටිකක් කන්න වෙලාව ලැබෙයි - මම කිව්වේ අපේ නැවෙන් පොල් ටික විසිකරල දාන්න. පර්සි, ඇනබෙත්... මම කැමති නෑ ඔය දෙන්න තනියම යනවට. හොඳට මතක තියාගන්න, හොඳින් හැසිරෙන්න. මොනවහරි

පෙම් පලහිලව්වක් ගැන මට අහන්න පැබුණොත්, මම ඔයාලව ගල් ගැහෙනකම් වළලනවා.''

''අපි ඉක්මනට එන්නම්.'' ඔහු පොරොන්දු විය. ඔහු තම මිතුරන් දෙස බැලුවේය. මේ ඔවුන් එකට හමුවන අවසන් වතාව යැයි දැනෙන හැඟීම සඟවා ගැනීමට ඔහු උත්සාහ දැරුවේය. ''සුබ පැතුම් හැමෝටම.''

ලියෝ පාරු මඟ පහත් කළේය. පර්සි සහ ඇනබෙත් පළමුවෙන්ම නැවෙන් පිට වූහ.

# 32
# පර්සි

**වෙනස් අවස්ථාවන් යටතේ, රෝමය තුළ ඉබාගාතේ ඇවිදීම** ඇනබෙත්ට බිය උපදවන්නක් විය. දැත් පටලවාගෙන ඔවුහු වංගු ගැසුණු වීථිවල ඇවිද ගියහ. ඇඟට එන වාහන සහ උමතු රියදුරන්ගෙන් බේරී, සංචාරකයන් සහ පරෙවි රැන් අතරින් ඔවුහු නගරයේ ඉදිරියට ඇදුණෝය. දිවා කාලය ඉක්මනින්ම උණුසුම් විය. වරෙක ප්‍රධාන මාර්ග යේ මෝටර් රථයකට ඉඩ දීමට පසෙකට වූ විට වාතය පාන් සුවඳින් සහ මල්වල සුගන්ධයෙන් පිරී ඇති බව දැනිණි.

පහසු බිම් සලකුණක් වූ බැවින් ඔවුන්ගේ ඉලක්කය වූයේ කොලෝසියමයි. එහෙත් එතැනට ළඟා වීම පර්සි සිතුවාටත් වඩා අසීරු විය. නගරයේ විශාලත්වයත්, ව්‍යාකුල බවත් තරමටම ඉහළ ට ගමන් කිරීම අසීරු විය. කීපවරක්ම ඔවුහු අතරමං වූ අතර ගමන් ගත් වීථි අවසන් වී තිබිණි. අහම්බයකින් මෙන් ඔවුන්ට අලංකාර ජල මල් සහ දැවැන්ත ස්මාරකද හමු විය.

ඇනබෙත් ගෘහ නිර්මාණ ගැන කතා කළත්, පර්සිගේ දෑස් යොමු වූයේ වෙනත් දේවල් වලටය. වරෙක ඔහුට දිදුලන දම් පැහැති භූතයකු- ලාර්[1]- දක්නට ලැබිණි. භූතයා ගොඩනැගිලි සංකීර්ණයක ජනේලයෙන් ඔවුන් දෙස බලා සිටියේය. තවත් වතාවක් ඔහු දුටුවේ සුදු ලෝගුවක් හැඳි කාන්තාවකි. සමහරවිට ඇය අප්සරාවියක් හෝ දෙවඟනක් විය හැකිය. රුදුරු පෙනුමැති පිහියක් අතින් දරා ඇය උද්‍යානයක නටඹුන් වූ කුලුනු අතරින් ලිස්සා ගියාය. කිසිවකින් ඔවුන්ට

1 ගෘහ දෙවියා. රෝමයේ පාරම්පරික ආත්මයන්.

ප්‍රහාරයක් එල්ල නොවුණත්, ඔවුන් ගැන ඔත්තු බලමින් සිටින බවත්, ඔත්තුකරුවෝ මිත්‍රශීලී අය නොවන බවත් පර්සිට හැඟී ගියේය.

අවසානයේ ඔවුන්ට කොලෝසියම වෙත ළඟා වීමට හැකි විය. ලාබ මල්ලවපොර ශූරයන්ගේ ඇඳුම් සහ ඔප දැමූ ප්ලාස්ටික් අසිපත් දුසිම් ගණනක් එහි තිබිණි. ඒවා කුමකටදැයි පර්සිට සිතාගත නොහැකි වුවත්, ඔහු ඇනබෙත් සමඟ දිගටම ඇවිද යාමට තීරණය කළේය. සමහර අවස්ථාවල මනුෂ්‍යයෝ, රාක්ෂයන්ටත් වඩා අද්භූත අය වූහ.

ඔවුහු බටහිරට හැරී ගමන් කළ අතර, විටින් විට ගංගාවට යන මාර්ගය අසා ගැනීමට තැන් තැන්වල නැවතුණෝය. ඉතාලියේ මිනිසුන් කතා කරන්නේ ඉතාලි භාෂාව වීම ගැන පර්සි සැලකීමක් නොදැක්විය. එහෙත් ඔහුට ඉතාලි බස නොහැකිය. එහෙත් එය එතරම් ගැටළුවක් වූයේ නැත. කීපවරක්ම යමෙකු ඔවුන් වෙත ළං වී ප්‍රශ්න කළහ. පර්සි ඔවුන් දෙස ව්‍යාකූලව බැලූ අතර ඔවුහු ඉංග්‍රීසියෙන් කතා කළහ.

ඊළඟ සොයා ගැනීම වූයේ ඉතාලියානුවන් යුරෝ භාවිත කරන බවයි. එසේම පර්සි ළඟ එකදු යුරෝවක් හෝ නොතිබිණි. සෝඩා විකුණන සංචාරක සාප්පුවක් දුටු විට ඔහුට ඒ ගැන පසුතැවිලි වීමට සිදුවිය. ඒ වනවිට මධ්‍යහ්නය එළඹ තිබූ අතර, දැඩි උණුසුමක් පැවතිණි. යුද නැව ඩයට් කෝක් වලින් පිරී තිබුණේ නම් කෙතරම් අගනේ දැයි පර්සිට සිතිණි.

ඇනබෙත් ප්‍රශ්නය විසඳුවාය. තම ගමන් මල්ලෙන් ඩායිඩාලුස්ගේ ලැප්ටොප් පරිගණකය ගත් ඇය විධාන කීපයක් ලබා දුන්නාය. එහි එක් සිදුරකින් ප්ලාස්ටික් කාඩ් පතක් නික්මිණි.

ඇනබෙත් ආඩම්බරයෙන් එය වැනුවාය. ''ජාත්‍යන්තර ණයවර පතක්. හදිසි අවස්ථාවන් සඳහා.''

පර්සි ඇය දෙස පුදුමයෙන් බලා සිටියේය. ''ඔයා කොහොමද? නෑ මොකුත් නෑ. මට දැනගන්න ඕනෙ නෑ. ටිකක් බය වුණා විතරයි.''

සෝඩාවලින් සහනයක් ලැබුණත්, ගංගාවට ළඟා වන විටත් උණුසුම පැතිර තිබූ අතර, ඔවුහු වෙහෙසට පත්ව සිටියහ. ගං ඉවුර අද්දර පාෂාණයෙන් කළ කණ්ඩියක් විය. ගංගාව ආසන්නයේ අවන්හල්, වෙළෙඳසැල්, නිවාස හා ගබඩා සංකීර්ණ රැසක් විසිරී තිබිණි.

අලසව ගලා යන මඩ පැහැති දියෙන් යුත් ටයිබර් ගංගාව පළලින් යුක්තය. උසැති සයිප්‍රස් ගස් ස්වල්පයක් ගං ඉවුරේ වැඩී තිබිණි. ආසන්නයේම තිබූ පාලම තරමක් අලුත් පෙනුමක් ගත් අතර යකඩ බාල්කවලින් නිමවා තිබිණි. එහෙත් ඊට යාබදව තිබූ ගල් ආරුක්කු පෙළ ගංගාවේ අඩ දුරක් ගොස් නැවතී තිබිණි. ඒවා සීසර්ගේ යුගයට අයත් නටඹුන් විය හැකිය.

''මෙන්න ඒක.'' ඇනබෙත් පැරණි ගල් පාලම පෙන්වමින් පැවසුවාය. ''මම සිතියමෙන් ඒක අඳුන ගත්තා. ඒත් අපි මොකද කරන්නෙ?'' ඇය අපි යනුවෙන් පැවසීම ගැන පර්සි සතුටට පත් විය. තවමත් ඇයව හැර දමා යාමට ඔහු කැමති වූයේ නැත. අවස්ථාව පැමිණි විට පවා ඔහුට එය කළ හැකිවේදැයි ඔහු තුළ පැවතියේ සැකයකි. ගයියා ගේ වචන ඔහු තුළ දෝංකාර දුන්නේය. *නුඹ තනියමද ඇද වැටෙන්නේ?*

ටයිබේරිනස් දෙවියා සමඟ සම්බන්ධ වන්නේ කෙසේදැයි සිතමින් ඔහු ගංගාව දෙස බලා සිටියේය. සැබැවින්ම ඔහුට ගංගාවට පැනීමට වුවමනාවක් නොතිබිණි. තම මව් බිමේ ඇති නැගෙනහිර ගංගාව තරම් ටයිබර් ගඟ පිරිසිදු බවක් නොපෙනිණි. නැගෙනහිර ගංගාවේදී ඔහුට දුෂ්ට ගංගා ආත්ම සමඟ බොහෝ එදිරිවාදිකම් පැවතිණි.

ගංගාවට ඉහළින් තබා තිබූ මේස සහිත අවන්හල ඔහුගේ දෙනෙතට හසු විය. ''දැන් දවල් කෑම වෙලාව. ආපහු ඔයාගෙ ක්‍රෙඩිට් කාඩ් එකෙන් උත්සාහ කළොත් මොකද?''

එය මධ්‍යහ්නය වුවත්, එතැන හිස්ව පැවතිණි. ඔවුහු ගංගාවට පිටතින් වූ මේසයක් තෝරා ගත්හ. ඉක්මන් කරන ලෙස වේටර්වරායට අණ කළත්, ඔවුහු තමාට දිවා ආහාරය අවැසි බව පවසන විට ඔහු මඳක් පුදුමයෙන් ඔවුන් දෙස බලා සිටියේය.

''අමෙරිකානුවෝද?'' ඔහු මඳ සිනාවකින් විමසුවේය.

''ඔව්.'' ඇනබෙත් පිළිතුරු දුන්නාය.

''මම කැමති පිට්සා වලට.'' පර්සි පැවසුවේය.

වේටර්වරයා යුරෝ කාසියක් ගිලුණු පෙනුමක් ගත්තේය. ''ඇත්ත වශයෙන්ම, ඔයාට ලැබෙයි මහත්මයා. ඒ වගේම මම හිතන්නෙ අයිස් දාපු කොකා කෝලත් ඕනෙ වෙයි.''

''බය හිතෙනවා.'' පර්සි පැවසුවේය. මේ හාදයා මෙතරම් ඇඹුල් වූ මුහුණින් සිටින්නේ ඇයි දැයි පර්සිට සිතා ගත නොහැකි විය.

ඇනබෙත් පනිනි සහ ජලය ඇනවුම් කළාය. වේටර්වරයා පිටව ගිය පසු, පර්සි දෙස බලා සිනාවක් පෑවාය. ''මම හිතන්නෙ ඉතාලිකාරයෝ වැඩිපුර කන්නෙ දවසේ අග හරියෙදී. එයාල බීම වලට අයිස් දාන්නෙ නෑ. ඒ වගේම එයාල පිට්සා හදන්නේ සංචාරකයන්ට විතරයි.''

''ඕහ්.'' පර්සි දෙවුර සැලුවේය.'' හොඳම ඉතාලි ආහාරය, එයාලවත් ඒව කන්නෙ නැහැ.''

''මට ඒක වේටර් ඉස්සරහ කියන්න ඕනෙ වුණේ නැහැ.''

ඔවුහු මේසය මත තබා ගත් දෑත් පටලා ගත්හ. හිරු එළියේ ඇනබෙත් දෙස බලා සිටීම පර්සිගේ සතුටට හේතු විය. එවැනි අවස්ථාවල නිතරම ඇගේ කෙහෙ රැළි දීප්තිමත් සහ උණුසුම් වේ. ඇගේ දෑස් අහසේ සහ බොරළුවල පැහැය ගනිමින් විටින් විට නිල් සහ දුඹුරු පැහැයට වෙනස් වෙයි.

ගයියා අර්ධ ලෝහිත කඳවුර විනාශ කළ සිහිනය ගැන ඇනබෙත්ට පැවසීමට හැකි නම් යැයි පර්සිට සිතුණේය. එහෙත් ඔහු එය නොපැවසීමට තීරණය කළේය. ඇයට මුහුණ දීමට සිදුවන දෙය හැර වෙනත් කිසිවකින් ඇය කරදරයට පත් කිරීම අවශ්‍ය නොවේ.

එහෙත් එයින් ඔහුව තවදුරටත් සිතීමට පෙළඹවීය... ඔවුන්ට චෙරිසෝර්ගේ මුහුදු කොල්ලකරුවන් බිය කර පළවා හැරීමට නොහැකි වූවා නම් කුමක් වනු ඇතිද? පර්සිට සහ ඇනබෙත්ට විලංගු ලා ගයියාගේ සැමියා වෙත ගෙන යනු ඇත. පැරණි පාෂාණ මත ඔවුන්ගේ රුධිරය විසිරී යනු ඇත. ඔවුන් ග්‍රීසිය වෙත ගෙන යන්නේ යම් විශාල බිලී පූජාවකට වන්නට ඇතැයි පර්සි අනුමාන කළේය. එහෙත් ඔහු සහ ඇනබෙත් ඕනෑ තරම් නරක අවස්ථාවලට එක්ව මුහුණ දී තිබුණහ. ඔවුන්ට පළායාමේ සැලසුමක් සකසා ගැනීමට හැකි වනු ඇත. එසේම ඇනබෙත්ට රෝමය තුළ මේ ඒකල ගවේෂණයට මුහුණ දීමට අවශ්‍ය නොවනු ඇත.

*උඹ ඇද වැටෙන විට, එය ප්‍රශ්නයක් නොවනු ඇත.* ගයියා පැවසුවාය. එය බියකරු ප්‍රාර්ථනයක් බව පර්සි දන සිටියත්, ඔවුන්ව මුහුදේදී අල්ලා නොගැනීම ගැන ඔහු පසුතැවීමට පත් විය. එසේ වූවා

නම් අඩුම වශයෙන් ඔවුන් දෙදෙනාට එකට සිටීමට අවස්ථාව ලැබෙනු ඇත.

''ඔයා ලැජ්ජා වෙන්න ඕනෙ නෑ.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයා චෙරිසෝර් ගැන නේද හිතමින් ඉන්නේ? අසිපත්වලින් හැම ප්‍රශ්නයක්ම විසඳන්න බැහැ. අන්තිමේදී ඔයා අපිව බේරගත්තා.''

තමා ගැනම කෝපයෙන්, පර්සි සිනාසුණේය. ''ඔයා කොහොමද ඒක කළේ? ඔයා හැමතිස්සෙම මම හිතන දේ ගැන දන්නවා.''

''මම ඔයාව දන්නවා.'' ඇය පැවසුවාය.

කොහොමවුණත් ඔයා මට කැමතිද? යනුවෙන් ඇසීමට පර්සිට වුවමනා වුණත්, ඔහු එම අදහස මැඩ ගත්තේය.

''පර්සි.'' ඇය පැවසුවාය. ''ඔයාට මේ මුළු ගවේෂණයෙම බර තනියම කරගන්න බැහැ. ඒක කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. ඒකට තමයි අපි හත් දෙනෙක් ඉන්නේ. තනියම ඇතීනා පාතිනන් හොයන වැඩේට මට යන්න දෙන්න ඔයාට සිද්ධ වෙනවා.''

''මට ඔයාව නැතිවුණා.'' ඔහු පැවසුවේය. ''මාස ගාණක්. අපේ ජීවිතවල ලොකු කොටසක් අපතෙ ගියා. ඔයා ආයෙත් නැති වුණොත්.''

දිවා ආහාරය පැමිණියේය. වේටර්වරයා බෙහෙවින් සන්සුන්ව සිටින බව පෙනුණේය. මොවුන් දූනුම් තේරුම් නැති අමෙරිකානුවන්ය යන කරුණ පිළිගැනීමෙන් පසු, ඔවුන්ට සමාව දීමටත්, විනීත ලෙස ඔවුන්ට සත්කාර කිරීමටත් වේටර්වරයා තීරණය කර ඇති බව පෙනුණේය.

''හරිම ලස්සන දර්ශනයක්.'' ගංගාව දෙස බලා හිස සලමින් ඔහු පැවසුවේය. ''විනෝද වෙන්න.''

ඔහු පිටව ගිය පසු, ඔවුහු නිහඬව ආහාර ගත්හ. චතුරශ්‍රාකාර පිට්සාවේ එතරම් චීස් නොතිබිණි. සමහරවිට රෝමන්වරු ඒවා නොකන්නේ ඒ නිසා වන්නට ඇතැයි පර්සි සිතුවේය. *අසරණ රෝමකාරයෝ.*

''ඔයාට මාව විශ්වාස කරන්න වෙනවා.'' ඇනබෙත් පැවසුවාය. පර්සි සිතුවේ ඇය තම සැන්ඩ්විචය ගැන පවසනවා කියාය. මක්නිසාදයත් ඇය ඔහුගේ දෑස් මගහරිමින් කතා කළ බැවිනි. ''මම ආපසු එනව කියන එක ඔයා විශ්වාස කරන්න ඕනෙ.''

ඔහු තවත් පීට්සා කැබැල්ලක් හැපුවේය. ''මම ඔයාව විශ්වාස කරනවා. ඒක නෙමෙයි ප්‍රශ්නෙ. කොහෙ ඉඳලද ආපහු එන්නෙ කියන එකයි.''

වෙස්පාවක හඬ ඔවුන්ට බාධා කළේය. පර්සි ගංගාව දෙස වරක් නොව දෙවරක්ම බැලුවේය. එය විශාල සහ ලා නිල් පාට පැරණි පන්නයේ ආකෘතියට නිම වූ මෝටර් ස්කූටරයකි. පැදවූ හාදයා සිනිඳු අළු පැහැති ඇඳුමක් හැඳ සිටියේය. හිසේ ස්කාෆයක් බැඳි බෙහෙවින් තරුණ ළඳක් එහි පසුපස විය. ඇගේ දෑත් මිනිසාගේ ඉණවටා එතී තිබිණි. අවන්හලේ මේසයට අත වැනූ ඔවූහු පර්සි සහ ඇනබෙත් අසල නැවතුණහ.

''හෙලෝ, ඇයි?'' මිනිසා පැවසුවේය. ඔහුගේ හඬ ගැඹුරු මෙන්ම සිනමාකරුවෙක් මෙන් වලියට බර විය. ඔහුගේ කොණ්ඩය වළවල් සහිත මුහුණට පිටුපසින් ඇලී තිබුණේය. ඔහු 1950 දශකයේ රූපවාහිනී තරුවක් මෙන් කඩවසම්ය. ඔහුගේ ඇඳුම්වල පවා වූයේ පරණ පන්නයේ පෙනුමකි. ඔහු ස්කූටරයෙන් බසින විට, ඔහුගෙ බුරුල් ඉන සාමාන්‍ය ප්‍රමාණයට වඩා උසින් තිබිණි. පර්සිට ඔහුගේ වයස අනුමාන කිරීම ගැටලුවක් විය. සමහරවිට ඔහු තිස් ගණන්වල පසු වනවා විය හැකිය. එහෙත් ඔහුගේ විලාසිතා සීයාගේ කාලයට අයත් විය.

කාන්තාවද ස්කූටරයයෙන් බැස්සාය. ''අපිට හරි ලස්සන උදෑසනක් තිබුණා.'' ඇය හුස්ම නොගෙන පැවසුවාය. ඇගේ වයස විසි එකක් පමණ වන්නට ඇත. ඇයගේද විලාසිතා පැරණි මෝස්තරයේ ඒවා විය. වළලුකර දක්වා දිගු වූ ඇගේ මෙරිගෝල්ඩ් සාය සහ සුදු පැහැති බ්ලවුසය විශාල හම් පටියකින් එකට එක්වී තිබිණි. එයින් ඇගේ ඉග බෙහෙවින් සිහින් ව දිස් වූ අතර පර්සි මෙතෙක් එතරම් සිහින් ඉඟක් දැක නොතිබිණි. ඇය තම ස්කාෆය ඉවත් කළ විට, ඇගේ සැලෙන කෙටි කළු කොණ්ඩය නියම හැඩයට සැකසිණි. ඇයට තිබුණේ තද පැහැති කෙළිලොල් දෑසකි. එසේම දීප්තිමත් සිනාවකි.

ඇනබෙත්ගේ සැන්ඩ්විචය ඇගේ අතින් අත හැරිණි. ''අහ්, දෙවියන් කොහොමද- කොහොමද?''

ඇය ගල් ගැසී ගිය ආකාරයෙන්, ඇය මේ දෙදෙනා හඳුනාගෙන ඇති බව පර්සි වටහා ගත්තේය.

''ඔය දෙන්න දැකල පුරුදුයි වගේ දැනෙනවා.'' ඔහු පැවසුවේය. ඔවුන්ගේ මුහුණු දැක ඇත්තේ රූපවාහිනියෙන් විය යුතුයැයි ඔහු

සිතුවේය. ඔවුන් පරණ චිත්‍රපටයකින් දැක ඇතැයි සිතුණත් එය නිවැරදි විය නොහැකිය. ඔවුන් එතරම් වයස්ගත බවක් නොපෙනේ. එසේ වුවත්, මිනිසා දෙසට අත දිගු කළ ඔහු අනුමාන කළේය. ''ඔයා අර මැඩ් මැන් එකේ හිටපු හාදයාද?''

''පර්සි.'' ඇනබෙත් බියපත්ව ඇති බවක් පෙන්නුම් කළාය.

''මොකක්?'' ඔහු විරෝධය පෑවේය. ''මම වැඩිය රූපවාහිනී බලන්නෙ නැහැ.''

''ඒ ග්‍රෙගරි පෙක්.'' ඇනබෙත්ගේ දෑස් විසල් විය. ඇගේ මුව විවර විය. ''ඒ වගේම... ආහ්, දෙවියනේ! අවුඩ්‍රි හෙප්බර්න්! මම මේ චිත්‍රපටිය දන්නවා. රෝම නිවාඩුව. ඒත් ඒක 1950 ගණන් වලනෙ. කොහොමද?''

''ආහ්, මගේ කෙල්ලේ!'' වායු ආත්මයක් සේ කරකැවුණු කාන්තාව ඔවුන්ගේ අසුනේ හිඳ ගත්තාය. ''මට කනගාටුයි ඔයා මාව වෙන කෙනෙක් කියල වරද්ද ගත්තට. මගෙ නම රෙහා සිල්වියා[1]. රොමියුලස් සහ රීමස්ගේ[2] මව මමයි. අවුරුදු දහස් ගාණකට කළින්. ඒත් ඔයාල හිතන්නෙ මම 1950 ගණන් වල තරමට තරුණයි කියලා. මේ මගේ සැමියා...''

''ටයිබේරිනස්.'' ග්‍රෙගර් පෙක් පැවසුවේය. ඔහු විනීත ආකාරයෙන් පර්සි සහ ඇනබෙත් දෙසට අත දිගු කළේය. ''ටයිබර් ගංගාවේ දෙවියා.''

පර්සි ඔහුට අත දුන්නේය. මේ හාදයා වෙතින් රැවුල බෑමෙන් පසු ගල්වන ආලේපන සුවඳක් හමා ආවේය. ඇත්තවශයෙන්ම, පර්සි ටයිබර් ගංගාවේ සිටියේ නම්, ඔහුට සුවඳ විලවුන් සමඟ මුව ආවරණයක්ද අවශ්‍ය වනු ඇත.

''ආහ්.'' පර්සි පැවසුවේය. ''ඔයාල දෙන්නා හැමවෙලාවෙම පේන්නෙ ඇමරිකානු සිනමා තාරකා වගේද?''

''අපි එහෙමද?'' මුහුණ හැකිලූ ටයිබේරිනස් තම ඇඳුම් දෙස විමසිල්ලෙන් බැලුවේය. ''ඇත්තටම, මට හරියට විශ්වාසයක් නැහැ. ඔයාල දන්නවද, බටහිර ශිෂ්ටාචාරයේ සංක්‍රමණය දෙපැත්තකට ගියා. රෝමය ලෝකයට බලපෑම් කළා වගේම ලෝකයත් රෝමයට බලපෑම්

1 රෝමය ගොඩ නැගූ රොමියුලස්ගේ හා රීමස්ගේ මවයි. පූජකවරියකි.

2 මාර්සගේ සහ රෙහා සිල්වියා පූජකවරියගේ නිවුන් දරු දෙදෙනාය. ඔවුන්ගේ මනුෂ්‍ය පියා වූ අමුලියස් විසින් ඔවුන්ව ටයිබර් ගංගාවට විසිකර දමන ලද අතර , වෘක ධේනුවක විසින් බේරාගෙන රැකබලා ගත්තාය. තරුණ වියට එළඹුණු පසු ඔවුන් විසින් රෝමය ගොඩනැගුහ.

කළා. පස්සේ කාලෙක අමෙරිකානු බලපෑමත් ගොඩක් එල්ල වුණු බව පේනවා. ශත වර්ෂ ගාණක් මට තරමක් දුරට පාර වරදුණා. ''

''හරි.'' පර්සි පැවසුවේය. ''ඒත්... ඔයා මෙහෙට ආවේ උදව් කරන්නද?''

''මගේ ජල දෙවිවරු මට කිව්වා ඔයාල දෙන්න මෙතන කියලා.''

ටයිබේරිනස් ඔහුගේ අඳුරු ඇස් ඇනබෙත් දෙසට යොමු කළේය. ''ඔයා ළඟ සිතියම තියෙනවද, මගෙ කෙල්ලේ? ඒ වගේම ඔයාගෙ හඳුන්වාදීමේ ලිපිය?''

''ආහ්...'' ඇනබෙත් ලිපිය සහ ලෝකඩ තැටිය ඔහු අතට දුන්නේය. ඇය ගංගා දෙවියා දෙස බලා සිටීම පර්සි තුළ ඊර්ෂ්‍යා හැඟීමක් ජනිත කරවීය.

''එහෙනම්...'' ඇය පැවසුවාය. ''ඔයා ඇතීනාගේ අනෙක් දරුවන්ටත් මේ ගවේෂණයෙදි උදව් කරල තියෙනවද?''

''ආහ්. මගෙ කෙල්ලේ.'' රූමත් කත, රෙහා සිල්වියා තම අත ඇනබෙත්ගේ උරහිස මත තැබුවාය. ''ටයිබේරිනස් කවදත් එහෙම උදව් කරන කෙනෙක්. ඔයාල දන්නවද, එයා මගෙ රොමියුලස් සහ රීමස් දරුවෝ බේරගත්තා. ඒ වගේම එයාලව වෘක දෙවඟන ලූපා[1] ළඟට අරන් ගියා. පස්සෙ, මහලු නුමෙන් රජා මාව මරන්න උත්සාහ කරන කොට, ටයිබේරිනස් මට අනුකම්පාවෙන් මාව එයාගෙ බිරිඳ කරගත්තා. එදා ඉඳන් එයාගෙ පැත්තට වෙලා මම ගංගා රාජධානිය පාලනය කරනවා. එයාගෙ එච්චර උනන්දුවක් නැහැ.''

''ස්තූතියි, මගෙ කෙල්ලේ.'' ටයිබේරිනස් කට ඇද කර සිනාසෙමින් පැවසුවේය. ''ඒ වගේම ඔව්, ඇනබෙත් චේසි, මම ඔයාගෙ සහෝදරයො ගොඩක් දෙනෙකුට උදව් කරල තියෙනවා. අඩුගානෙ එයාලගෙ ගමනවත් ආරක්ෂිතව පටන් ගන්න. ලැජ්ජාව තමයි පසුව එයාල සේරටම වේදනාකාරී මරණයක් අත් වුණ එක. හොඳයි, ඔයාගෙ ලේඛන පිළිවෙළට තියෙන බව පේනවා. අපි යා යුතුයි. ඇතීනාගේ සලකුණ බලා සිටිනවා.''

1 රෝමය බිහිකළ රොමියුලස් හා රීමස් හදාගත් වෘක ධේනුවයි. ඇය රෝමයේ පූජනීය සත්ත්වයෙකි.

පර්සි ඇනබෙත්ගේ අත මිරිකා ගත්තේය. සමහරවිට එම ග්‍රහණය තරමක් දැඩි වූවා ද විය හැකිය. ''ටයිබේරිනස්, මටත් එයා එක්ක එන්න ඉඩ දෙන්න, ටිකක් දුරට.''

රෙහා සිල්වියා මිහිරි සිනාවක් නැගුවාය. ''ඒත් ඔයාට බැහැ, මෝඩ කොල්ලෝ. ඔයා ආපහු නැවට ගිහින් ඔයාගෙ අනික් යාලුවෝ එකතු කරගත යුතුයි. යෝධයන් මුණ ගැසිය යුතුයි. ඒක කරන විදිහ ඔයාගෙ මිතුරිය පිපර්ගෙ පිහි තලයෙන් පෙනේවි. ඇනබෙත්ට තියෙන්නෙ වෙනස් මාර්ගයක්. එයා තනිව යා යුතුයි.''

''ඇත්තටම.'' ටයිබේරිනස් පැවසුවේය. ''ඇනබෙත් තමා විසින්ම පූජාසනයේ බාරකරු ඉදිරියේ පෙනී සිටිය යුතුයි. එක තමයි එකම විදිහ. ඒ වගේම පර්සි ජැක්සන්, බඳුනේ සිරවෙලා ඉන්න ඔයාගෙ මිත්‍රයව බේරගන්න තියෙන්නෙ ඔයා හිතාගෙන ඉන්නවට වඩා අඩු කාලයක්. ඔයා ඉක්මන් කරන්න ඕනෙ.''

පර්සිට තම කුස තුළ වූ පීට්සාව සිමෙන්ති කුට්ටියක් සේ දැනිණි. ''ඒත්!''

''ඒ සේරම හරි පර්සි.'' ඇනබෙත් ඔහුගේ අත මිරිකුවාය. ''මම මේක කරන්න ඕනෙ.''

ඔහු විරෝධය පෑමට සැරසුණේය. ඇගේ මුහුණේ ඉරියව් ඔහුව පසුබැස්සවීමට සමත් විය. ඇය බියපත්ව සිටියත් එය සැඟවීමට හැකි උපරිමය කළාය. ඔහු වාද කිරීමට උත්සාහ කළේ නම්, ඔහු කරන්නේ ඇයට තම කටයුත්ත අසීරු කිරීම පමණි. නැතිනම් ඊටත් වඩා නරක දෙය වූයේ, ඔහු ඇයට නවතින ලෙස ඒත්තු ගැන්වීමටද හැකි වීමයි. එසේ වූවා නම් ගයියා නැගිට රෝමය විනාශ කරනු ඇත. ඇයට තම දැනුම පමණක් ඉතිරි කරගෙන ජීවත් වීමට සිදුවනු ඇත. ඇතීනා ප්‍රතිමාව යෝධයන් පැරදවීමේ යතුර දරා සිටියි. ඒ ඇයි හෝ කෙසේද කියා පර්සි නොදත් නමුත්, එය සොයා ගත හැකි එකම තැනැත්තිය ඇනබෙත් පමණි.

''ඔයා හරි.'' ඔහු පැවසුවේය. පරෙස්සම් වෙන්න.''

එය මෝඩ ප්‍රකාශයකැයි හැඟවීමට මෙන් රෙහා සිල්වියා සිනාසුණාය. ''පරිස්සම් වෙන්න? කොහෙත්ම නෑ! ඒත් අවශ්‍යයි. එන්න, ඇනබෙත්, මගේ කෙල්ලේ. අපි ඔයාට පෙන්වන්නම් ඔයාගේ මාර්ගය පටන් ගන්නෙ කොතනින්ද කියලා. ඊට පස්සෙ, ඔයා තනියම යන්න ඕනෙ.

ඇනබෙත් පර්සිව සිප ගත්තාය. තවත් කුමක් පැවසිය යුතු දැයි සිතාගත නොහැකිව පැකිළුණාය. ඉන්පසු තම ගමන් මල්ල උරහිසේ එල්ලාගත් ඇය ස්කූටරයේ පිටුපසට ගොඩ වූවාය.

පර්සි එයට වෛර කළේය. ඔහු ලෝකයේ සිටින ඕනෑම රාක්ෂයකු සමඟ සටන් කිරීමට කැමති වනු ඇත. ඔහු නැවත චෙරිසෝර් සමඟ සටන් කිරීමට කැමති වනු ඇත. එහෙත් ඔහු ආයාසයෙන් සිත පාලනය කරගෙන ඇනෙබෙත්, ග්‍රෙගරි පෙක් සහ අවුඩ්‍රි හෙප්බර්න් සමඟ ස්කූටරයට නැගී රෝමයේ වීථි අතරින් ඇදී යන අයුරු බලා සිටියේය.

# 33
# ඇනබෙත්

එය අන්තිම නරක වනු ඇතැයි ඇනබෙත් සිතා ගත්තාය. ඇය භයානක ඒකල ගවේෂණයට යා යුතු වූවා නම්, අඩුම වශයෙන් ඇයට ටයිබර් ඉවුරේ පර්සි සමඟ දිවා ආහාරයවත් ගැනීමට හැකි විය යුතු විය. දැන් ඇයට ග්‍රෙගරි පෙක් සමඟ ස්කූටර් පැදීමට සිදුවී තිබේ.

ඇය ඒ පැරණි චිත්‍රපටය ගැන දැන සිටියේ ඇගේ පියා නිසා පමණි. ගෙවී ගිය වසර කීපය පුරා, ඔවුන් දෙදෙනා එක්ව ගත කළ අතර, දෙනොට එක්ව ගත කිරීමට වැඩි කාලයක් ද ලැබිණි. සත්තකින්ම, ඔහු යුද ඉතිහාසයට, ආයුධ වලට සහ ද්විත්ව පියාපත් සහිත ගුවන් යානාවලට කැමැත්තක් දැක්විය. එහෙත්, ඔහු පැරණි චිත්‍රපටවලටද -විශේෂයෙන් 1940-50 දශකවල ශෘංගාරාත්මක විකට ඒවාට- ප්‍රිය කළේය. රෝම නිවාඩුව ඔහුගේ ප්‍රියතම චිත්‍රපටවලින් එකක් විය. ඔහු ඇනබෙත්ටද එය නැරඹීමට ඉඩ දුන්නේය.

එහි කතා වස්තුව මෝඩ එකක් බව ඇයට සිතිණි. කුමාරිකාව ඇයව බලාගත් ස්ත්‍රීන් වෙතින් පළා ගොස් රෝමයේ වෙසෙන අමෙරිකානු මාධ්‍යවේදියකු සමඟ පෙමින් බැඳුණාය. එහෙත් ඇගේ පියා එයට කැමති වූයේ දැයි ඇයට වූයේ සැකයකි. මක්නිසාද යත් එයින් ඔහුට ඇතීනා දෙවඟන සමඟ ඔහුගේ ප්‍රේමය සිහිපත් කරවූ නිසාය. ඒ සතුටුදායක අවසානයක් නොලැබූ තවත් යුවළකි. ඇගේ පියා ග්‍රෙගරි පෙක් මෙන් නොවීය. ඇතීනාද නිසැකවම කිසිදු අයුරකින් අවුඩ්‍රි හෙප්බර්න් මෙන් වූයේ නැත. එහෙත් ඒ මිනිසුන් තමන්ට පෙන්වීමට

අවැසි දෙය පෙන්වන බව ඇනබෙත් දැන සිටියාය. ඔවුන්ගේ ප්‍රත්‍යක්ෂ ඥානය මීදුමකින් එතෙනු දැකීමට ඔවුන්ට අවශ්‍ය වූයේ නැත.

ලා නිල් ස්කූටරය රෝමයේ වීථි අතරින් ඇදී යද්දී, රෙහා සිල්වියා සියවස් ගණනක් තුළ රෝම නගරය වෙනස් වූ ආකාරය ගැන වේගවත් විස්තරයක් ඇනබෙත් හමුවේ තැබුවාය.

''අරෙහෙ තමයි සබ්ලීසන් පාලම තියෙන්නේ.'' ඇය ටයිබර් ගංගාවේ වංගුවක් දෙසට අත දිගු කරමින් පැවසුවාය. ''ඔයා දන්නවද, හොරාටියස් සහ ඔහුගේ මිතුරන් දෙදෙනා ආක්‍රමණික හමුදාවෙන් නගරය ආරක්ෂා කරගත් තැන? දැන් එහෙ ඉන්නෙ නිර්භීත රෝමවරු.''

''බලන්න, පැටියෝ.'' ටයිබේරිනස් පැවසුවේය. ''එතැන තමයි රොමියුලස් සහ රීමස් ඇවිත් රැඳුණෙ.''

ගංගාවේ පසෙක කැඩී ගිය ප්ලාස්ටික් බෑග් සහ රසකැවිලි දවටන වලින් තාරාවන් කූඩු සාදමින් සිටියහ. ඔහු කතා කරමින් සිටින්නේ එම ස්ථානය බව පෙනිණි.

''ආහ්, ඔව්.'' රෙහා සිල්වියා සතුටින් සුසුමක් හෙලුවාය. ''ගංගාව පිටාර ගලන්න සලස්වලා, දරුවෝ දෙන්න වෘකයන්ට හොයා ගන්න පුළුවන් විදිහට ඉවුරට ගෙනියන්න තරම් ඔයා කරුණාවන්ත වුණා.''

''ඒක එච්චර දෙයක් නෙමෙයි.'' ටයිබේරිනස් පැවසුවේය.

ඇනබෙත්ගේ හිසට සැහැල්ලු ගතියක් දැනිණි. ගංගා දෙවියා කතා කරමින් සිටින්නේ වසර දහස් ගණනකට පෙර සිදු වූ යමක් ගැනය. එකල මෙම ප්‍රදේශයේ වතුර හැර අන් කිසිවක් නොතිබිණි. ටයිබේරිනස් දරුවන් දෙදෙනා බේරාගත් අතර ඉන් එක් දරුවෙක් ලොව ශ්‍රේෂ්ඨතම අධිරාජ්‍යය ගොඩනැගීය. *ඒක එච්චර දෙයක් නෙමෙයි.*

රෙහා සිල්වියා නූතන ශෛලියේ විශාල නිවාස සංකීර්ණ ගොඩනැගිල්ලක් පෙන්වූවාය. ''ඒක වීනස්ගෙ දේවස්ථානයක් විදිහට භාවිතා කළා. ඊට පස්සෙ පල්ලියක් වුණා. ඊට පස්සෙ මාළිගාවක්. ඊටත් පස්සෙ නිවාස සංකීර්ණයක්. ඒක තුන් වතාවක් ගිනි ගත්තා. දැන් ඒක ආයෙත් නිවාස සංකීර්ණයක් වෙලා. ඒ වගේම එතනට දකුණින් තියෙන තැන.''

''කරුණාකරලා.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයා මට නිදිමත හදනවා.''

රෙහා සිල්වියා සිනාසුණාය. ''මට සමාවෙන්න, පැටියෝ, තට්ටු පිට තට්ටු ගොඩනැගුණු ඉතිහාසයක් මෙහෙ තියෙන්නෙ. ඒත් ඒක ග්‍රීසිය එක්ක සසඳන්න බැහැ. රෝමයේ මඩවලින් මඩු හැදෙන කොට ඇතන්ස් ගොඩක් පරණයි. ඔයාගෙ පණ බේරුණොත් ඔයාට බලාගන්න පුළුවන් වෙයි.''

''වැඩක් වෙන්නෙ නෑ.'' ඇනබෙත් කෙඳිරුවාය.

''මෙන්න අපි ආවා.'' ටයිබේරිනස් පැවසුවේය. ඔහු විශාල කිරිගරුඬ ගොඩනැගිල්ලක් ඉදිරියේ නැවතිණි. එහි ඉදිරිපස, නගරයේ දූළිකුණු වලින් වැසී තිබුණත්, තවමත් එහි අලංකාරය රැඳී පැවතුණේය. වහලය මට්ටමට යනතෙක්ම එය රෝම දෙවිවරුන්ගේ කැටයමින් අලංකාර වී තිබුණේය. දවැන්ත පිවිසුම යකඩ ගේට්ටු වලින් අවහිර වී තිබූ අතර ඒවාට ඉබි යතුරු දමා තිබිණි.

''මම ඒක අස්සෙන්ද යන්නෙ?'' ලියෝ කැඳවාගෙන ආවා නම් මැනවැයි ඇනබෙත්ට සිතිණි. නැතහොත් අඩුම වශයෙන් ඔහුගේ උපකරණ පටියෙන් රැහැන් කපන අඬුවක් හෝ රැගෙන ඒමට තිබිණි.

රෙහා සිල්වියා අතින් මුව වසාගෙන සිනාසුණාය. ''නෑ මගෙ පැටියෝ. ඒක ඇතුළෙන් නෙමෙයි. ඒක යටින්.''

ටයිබේරිනස් ගොඩනැගිල්ලේ පැත්තකට වන්නට තිබූ ගල් පඩිපෙළක් පෙන්වූයේය. මෙය මැන්හැට්න්වල තිබුණේ නම් එය පාදමේ පිහිටි කොටසට යොමු වූ එකක් වනු ඇත.

''රෝමයේ පොළොවෙන් ඉහළ අවුල් සහගතයි.'' ටයිබේරිනස් පැවසුවේය. ''ඒත් ඒක පොළොව යටත් එක්ක සංසන්දනය කරන්න බැහැ. ඔයාට වැළලුණු නගරයට බහින්න වෙනවා. ඇනබෙත් චේසි . විදේශීය දෙවියාගේ අල්තාරය සොයා ගන්න. ඔයාගෙ පූර්වගාමීන්ගේ අසාර්ථකත්වයන් ඔයාට මඟ පෙන්වාවි. ඊට පස්සෙ... මම දන්නෙ නැහැ.''

ඇනබෙත්ට තම පිටේ එල්ලාගෙන තිබූ බෑගය, බර වනු දැනිණි. ඇය මේ වනවිට ලෝකඩ තැටිය දින ගණනාවක් අධ්‍යයනය කර තිබුණාය. ඩායිඩාලුස්ගේ පරිගණකය පීරමින් තොරතුරු සෙව්වාය. අවාසනාවකට, ඇයට ඉගෙන ගැනීමට ලැබුණු ස්වල්පයෙන්, ගවේෂණය කළ නොහැක්කක් බව පෙනිණි. ''මගෙ සහෝදර, සහෝදරියන් කිසිම කෙනෙකුට පූජාසනය වෙත යන ගමන සම්පූර්ණ කරන්න බැරි වුණා.''

ටයිබේරිනස් හිස වැනුවේය. ''ඒත් ඔයා දන්නවා මොන විදිහෙ ත්‍යාගයක්ද රැඳී තිබෙන්නෙ කියලා. ඔයාට ඒක නිදහස් කරගන්න පුළුවන් නම්.''

''ඔව්.'' ඇනබෙත් පැවසුවාය.

''එයින් ග්‍රීසියේ සහ රෝමයේ දරුවන් වෙතට සාමය ගෙන ඒමට හැකිවේවි.'' රෙහා සිල්වියා පැවසුවාය. ''එයින් එළැඹෙමින් තිබෙන යුද්ධයේ මාර්ගය වෙනස් කිරීමට හැකි වේවි.''

''මම ජීවතුන් අතර සිටියොත්.'' ඇනබෙත් පැවසුවාය.

ටයිබේරිනස් දුක්මුසුව හිස් සැලුවේය. ''ඔයාට මුහුණ දෙන්න සිද්ධවෙන භාරකාරයා ගැනත් ඔයාට අවබෝධයක් තියෙන නිසා නේද?''

සම්ටර් කොටුවේ මකුළුවන් සහ පර්සි විස්තර කළ සිහිනය- අඳුරේ පිඟින හඬ- ඇනබෙත්ගේ මතකයට නැගිණි.

''ඔව්.''

රෙහා සිල්වියා තම සැමියා දෙස බැලුවාය. ''ඇය නිර්භීතයි. සමහරවිට එයා අනෙක් අයට වඩා ශක්තිමත් ඇති.''

''මම හිතනවා.'' ගංගා දෙවියා පැවසුවේය. ''සුබ ගමන්. ඇනබෙත් චේසි. ඒ වගේම වාසනාවන්.''

රෙහා සිල්වියා ඉදිරියට පැමිණියාය. ''අපි අපූරු සන්ධ්‍යාවක් සැලසුම් කරල තිබුණා. සාප්පු සවාරියක්.''

ග්‍රෙගරි පෙක් සහ අවුඩ්‍රි හෙප්බර්න් ඔවුන්ගේ ස්කූටරයේ නැගී පිටත් වූහ. ඉන්පසු ඇනබෙත් තනිවම පහළට යොමු වූ පියගැට පෙළ බසින්නට වූවාය.

ඇය ඕනෑතරම් පොළොව යටට ගොස් තිබුණාය.

එහෙත් පියගැට පෙළේ අඩක් බසින විට එය කොතරම් දිග දැයි ඇයට අවබෝධ විය. ඇය ගල් ගැසුණාය.

දෙවිවරුන්... ඇය කුඩා කළ සිටම මෙවැන්නක් කර නොතිබිණි. නිවෙසින් පලාගියා පසු, ඇය සති කීපයක් තනිව ජීවත් වූවාය. තාලියා සහ ලූක් ඇයව ඔවුන්ගේ පියාපත් සෙවණට ගන්නා තුරු ඇය රාක්ෂයන්ගෙන් සැඟවෙමින්, මුඩුක්කුවල ජීවත් වූවාය. ඉන්පසු අර්ධ ලෝහිත කඳවුරට පැමිණි ඇය, දොළොස් හැවිරිදි වන

තුරුම එහි වාසය කළාය. ඉන්පසු, ඇගේ සියලු ගවේෂණ සිදු වූයේ පර්සි හෝ ඇගේ අනෙක් මිතුරන් සමඟය.

අවසන් වතාවට ඇයට මෙවැනි බියන් හා තනිකමක් දැනුණේ හත් හැවිරිදිව සිටියදීය. ඇය තාලියා සහ ලූක් සමඟ බෲක්ලින්වල එකැස් යෝධයාගේ තිත්පෙළට ගිය ඒ දිනය ඇගේ මතකයේ තිබිණි. තාලියා සහ ලූක් ඔවුන්ගේ ග්‍රහණයට හසු වූ අතර ඇනබෙත්ට ඔවුන් මුදා ගැනීමට සිදුවිය. ඇය තවමත් ඒ ජරාවාස වූ නිවහන සිහිපත් කරන්නේ බියෙනි. එහි අඳුරු මුල්ලකට වී, ඇයව පිටතට ගැනීමේ උපායක් ලෙස එකැස් යෝධයා ඇගේ මිතුරන්ගේ හඬින් විහිළු කළ අයුරු ඇයට තවමත් මතකය.

*මේකත් උපායක් නම් මොකද කරන්නෙ?* ඇය සිතුවාය. ඇතීනාගේ අනෙක් දරුවන් මිය ගියේ ටයිබේරිනස් සහ රෙහා සිල්වියා ඔවුන්ව උගුලකට හසු කළ නිසා නම්? ග්‍රෙගරි පෙක් සහ අවුඩ්‍රි හෙප්බර්න් එවැනි අය විය හැකිද?

ඇය දිගටම ගමන් කළාය. ඇයට විකල්පයක් නොතිබිණි. ඇතීනා ප්‍රතිමාව සැබැවින්ම මෙහි පහළ තිබේ නම්, එය යුද්ධයේ ඉරණම තීන්දු කරනු ඇත. වඩාත් වැදගත් දෙය වූයේ, එයින් ඇගේ මවට උපකාරයක් වීමයි. ඇයට ඇතීනා අවශ්‍ය වූවාය.

පියගැට පෙළ අවසානයේදී ඇය යකඩ වළල්ලක් සවිකළ පැරණි දැව දොරක් වෙතට පැමිණියාය. එම යකඩ වළල්ලට ඉහළින් වූ ලෝහ තහඩුවක යතුරු සිදුරක් විය. ඇනබෙත් සැලකිය යුතු ක්‍රමවලින් අගුල හැර ගැනීමට උත්සාහ කළත්, ඇය යකඩ වළල්ල ස්පර්ශ කළ සැණින් දොරේ මැද ගින්නෙන් දිලිසෙන රුවක් මැවිණි. ඒ ඇතීනාගේ බකමූණාය. යතුරු සිදුරෙන් දුමක් නිකුත් විය. දොර ඇතුළට විවෘත විය.

ඇනබෙත් අවසන් වරට උඩ බැලුවාය. පඩිපෙළ මුදුනෙන් අහස නිල් පාටින් දිස්විය. මිනිසුන් උණුසුම් සන්ධ්‍යාවේ විනෝද වනවා ඇත. පෙම්වතුන් අවන්හලේ දෑත් පටලාගෙන සිටිනවා විය හැකිය. සංචාරකයින් කඩ සාප්පුවලත්, කෞතුකාගාරවලත් සැරිසරනවා ඇත. සාමාන්‍ය රෝමන්වරු ඔවුන්ගේ දෛනික වැඩ සඳහා යමින් සිටිනවා ඇත. ඔවුන්ගේ පාදවලට යටින් ඇති වසර දහස් ගණනක ඉතිහාසය ගැන ඔවුන් තැකීමක් නොකරති. නිසැකවම ඔවූහු තවමත් මෙහි වාසය කරන ආත්ම, දෙවියන් හෝ රාක්ෂයන් ගැන නොදනිති. උප දෙවිවරුන්

පිරිසකට යෝධයන් නැවැත්වීම සාර්ථක කර ගැනීමට නොහැකි වුවහොත් අද දින ඔවුන්ගේ නගරය විනාශවන බව ඔවූහු නොදනිති.

ඇනබෙත් දොරෙන් ඇතුළු වූවාය.

තමා ගෘහ නිර්මාණය ශිල්පීය සයිබෝගයක් සහිත බිම් මහලකට පැමිණ ඇති බව ඇය වටහා ගත්තාය. පැරණි ගඩොල් බිත්ති හරහා නූතන විදුලි රැහැන් සහ ජලනල ඇද තිබිණි. සිවිලිම දරා සිටියේ වානේ කුලුනු සහ පැරණි කළු ගලින් කළ රෝම කුලුනු වල එකතුවකිනි.

බිම්මහලේ පළමු අර්ධයේ ඇහුරුම් පෙට්ටි ගොඩ ගසා තිබිණි. කුතුහලය මැඩගත නොහැකි වූ ඇනබෙත් ඒවායින් කීපයක් විවෘත කළාය. සමහර ඒවායේ විවිධ වර්ණවලින් යුත් නූල් රෝද අසුරා තිබුණේ සරුංගල් හෝ කලා සහ අත්කම් ව්‍යාපෘතියක් මෙනි. අනෙක් ඇසුරුම් පෙට්ටි බාල ප්ලාස්ටික්වලින් කළ මල්ලව පොර ශූරයන්ගේ කඩුවලින් පුරවා තිබිණි. සමහරවිට මෙය සංචාරක අලෙවි සැලක ගබඩාවක් වන්නට පුළුවන.

බිම් මහලෙ පිටුපස, පොළොව කැණ තිබූ අතර එතැනින් තවත් පඩිපෙළක්- සුදු පැහැති පාෂාණයෙන් කළ- පොළොවේ ගැඹුරට විහිදී තිබිණි.

ඇනබෙත් එහි අද්දරට පිවිසියාය. ඇගෙ කිණිස්සේ දිස්නයෙන් පවා, පහත දැකීමට බැරි තරම් අඳුරු විය. ඇය බිත්තිය අතගාමින් විදුලි පහනේ ස්විචය සෙව්වාය.

ඇයට එය හමුවිය. සුදු පැහැති ප්‍රතිදීප්ත පහන් වලින් පඩිපෙළ ආලෝකමත් විය. පහළ, මොසැයික් ගෙබිම මුවකුගෙන් සහ ඵවුන් දෙවියාගෙන් සරසා තිබෙන බව පෙනිණි. සමහරවිට පැරණි රෝම මන්දිරයක් වූ මෙතැන, මෙම නූතන බිම්මහල නිසා සැඟවී ගියා විය හැකිය.

ඇය පහළට බැස්සාය. කාමරය අඩි විස්සක පමණ චතුරශ්‍රයක් විය. බිත්ති කලෙක දීප්තිමත් ලෙස වර්ණ ගන්වා තිබුණත් බිතුසිතුවම් බොහෝමයක් ගැලවී හෝ වියැකී ගොස් තිබිණි. පිටවීමට තිබූ එකම ස්ථානය වූයේ මොසැයික සිතුවම තිබූ පොළොවේ එක් කෙළවරක තිබූ සිදුර පමණි. ඇනබෙත් විවරය අසල වකුටු වී හිඳ ගත්තාය. එය කෙළින්ම, පහළ පිහිටි විශාල අඳුරු ගුහාවකට යොමු වී තිබුණත්, ඇනබෙත්ට එහි පතුල දැක ගැනීමට නොහැකි විය.

අඩි තිහක් හෝ හතළිහක් පහළින් ඇයට ජලය ගලා යන හඬක් ඇසිණි. වාතයේ කුණු කාණුවක ගන්ධයක් නොතිබිණි- එයින් හමා ආවේ පැරණි සහ පුස් ගඳකි. එසේම තරමක් මිහිරි මල් සුවඳකි. සමහරවිට එය පැරණි ඇළ මාර්ගයකින් ගලා එන ජලය විය හැකිය. එහි පහළට බැසීමට මඟක් නොතිබිණි.

''මම පනින්නෙ නෑ.'' ඇය තමාටම මුමුණා ගත්තාය.

එයට පිළිතුරක් ලෙස, අඳුරේ යමක් දිලිසිණි. ගුහාව පතුලේ සිට ඇතීනාගේ සලකුණ අග්නි රේඛාවකින් දිදුලමින් අඩි හතළිහක් පහළ තිබූ භූගත ඇළ මාර්ගය ඔස්සේ පිහිටි ගඩොල් බැම්මක් පෙන්වූයේය. දූවෙන බකමූණා ඇයට සරදම් කරන්නා සේ පෙනිණි. *හොඳයි, මේක තමයි මාර්ගය, දරුවා. ඉතිං ඔයා මොනවහරි විසඳුමක් හොයා ගත්තොත් හොඳයි.*

ඇනබෙත් ඇයට ඇති විකල්ප ගැන සලකා බැලුවාය. පැනීම බෙහෙවින් අනතුරුදායකය. එහි ඉනිමං හෝ කඹ නොතිබිණි. ඇය ඉහළ සිට ගිනි දණ්ඩක් ලෙස යොදා ගැනීමට යම් ලෝහ පලංචියක් සොරා ගැනීමට සිතුවාය. එහෙත් ඒවා සියල්ල එතැනට ඇණ වලින් සවිකර තිබිණි. අනෙක් අතට මුළු ගොඩනැගිල්ලම ඇගේ හිසමත කඩා වැටෙන දෙයක් කිරීමට ඇයට වුවමනා නොවීය.

වේයන් රැනක් සේ නොරිස්සුම ඇගේ ගත පුරා පැතිරෙන්නට විය. අනෙක් උපදෙවිවරුන් අත්කර ගත් අරුම පුදුම බලයන් දකිමින් ඇය තම ජීවිතය ගෙවා දැමුවාය. පර්සිට ජලය පාලනය කළ හැකි විය. ඔහු මෙහි සිටියා නම්, ඔහුට ජල මට්ටම ඉහළ නැංවීමට හැකිවනු ඇත. එවිට හෙමිහිට පහළට පාවීමට හැකිවනු ඇත. හේසාල් කියූ ආකාරයට, ඇයට පොළොව යටදී නිවැරදිව මාර්ගය සොයා ගැනීමට පමණක් නොව උමඟක් නිර්මාණය කිරීමට හෝ එහි මාර්ගය වෙනස් කිරීමට හැකිය. ඇයට පහසුවෙන් අලුත් මාර්ගයක් සාදා ගැනීමට හැකි වනු ඇත. ලියෝ තම ඉන පටියෙන් නිවැරදි උපකරණය ගෙන වැඩේට ගැලපෙන යමක් තනනු ඇත. ෆ්‍රෑන්ක්ට කුරුල්ලකු බවට පත්වීමට පුළුවන. ජේසන්ට පහසුවෙන් සුළඟ පාලනය කර පහළට පාවී යාමට හැකිය. වශී කතා ඇති පිපර්ට පවා... ඇයට ටයිබේරිනස්ව සහ රෙහා සිල්වියාව තවත් උපකාර ගැනීමට පොළඹවා ගත හැකිය.

ඇනබෙත්ට තිබෙන්නේ මොනවද? කිසිදු විශේෂත්වයක් නැති ලෝකඩ කිණිස්සක් සහ සාපලත් රිදී කාසියක් පමණකි. ඩායිඩාලුස්ගේ පරිගණකයත්, වතුර බෝතලයක්, හදිසියට ගැනීමට අමෘත ස්වල්පයක්

සහ ගිනිපෙට්ටියක් සහිත ගමන් මල්ලක් ඇය සතුව ඇත. වැඩකට නැති බව පෙනුණත්, ගින්නක් දල්වාගත යුතු මඟක් නිතරම සොයාගත යුතු බව ඇගේ පියා ඇගේ හිසට ඇතුළු කර තිබුණේය.

ඇයට පුදුම උපදවන බලයක් නොතිබිණි. ඇගේ එකම ඉන්ද්‍රජාලික භාණ්ඩය වූ අදෘශ්‍යමානව සිටිය හැකි නිව්යෝර්ක් යැංකි තොප්පිය පවා අක්‍රිය වී තිබිණි. එය තවමත් තිබුණේ ආගෝ II හි ඇගේ කුටිය තුළය. *ඔබ ඔබගේ බුද්ධිය පාවිච්චි කරන්න,* හඬක් පැවසුවේය. ඇතීනා ඇයට කතා කළේ යැයි සිතා ඇය පුදුමයට පත්වූවාය. එහෙත් එය හුදෙක් ඇගේ සිත තුළ ඇති වූ ප්‍රාර්ථනාවක් පමණි.

බුද්ධිය... හරියට ඇතීනාගේ ප්‍රියතම වීරයා ඔඩිසස් වගේ. ඔහු ට්‍රෝජන් යුද්ධය දිනුවේ ශක්තිය නිසා නොව දක්ෂතාවය නිසාය. ඔහුට තම බුද්ධිය නිසා සියලු අකාරයේ රාක්ෂයන් මෙන්ම පීඩාවන් පරාජය කිරීමට හැකි විය. ඇනබෙත් කළ යුත්තේද එයමය.

*නුවණේ දියණිය තනිව ඇවිදියි.*

ඒකෙන් කියවෙන්නෙ අනිත් මිනිස්සු නැතිව කියන එක නෙමෙයි, ඇනබෙත්ට අවබෝධ විය. ඒකෙන් කියන්නෙ කිසිදු විශේෂිත බලයක් නොමැතිව කියන එකයි.

හරි... එහෙනම් කොහොමද එතෙන්ට ආරක්ෂිතව යන්නෙ. ඒ වගේම අවශ්‍ය වුණොත් ඇය ආපහු කොහොමද උඩට එන්නෙ කියන එක සැක හැර ගත යුතුය.

ආපසු බිම් මහලට නැගුණු ඇය විවෘත ඇසුරුම් පෙට්ටි දෙස බැලුවාය. *සරුංගල් නූල් සහ ප්ලාස්ටික් කඩු.* ඇගේ සිතට පැමිණි අදහස කෙතරම් විකාරයක් වීද යත් ඇයට සිනා නැගිණි. එහෙත් කිසිවක්ම නැතිවාට වඩා එය හොඳය.

ඇය වැඩේ පටන් ගත්තාය. කළ යුත්තේ කුමක්දැයි ඇගේ දෑත් හරියටම දැන සිටින බව පෙනිණි. සමහර අවස්ථාවල ඇය නැවේ යාන්ත්‍රික කටයුතු වලදී ලියෝට උදව් වූවාය. නැතහොත් පරිගණකයෙන් ගෘහ නිර්මාණ සැලසුම් ඇන්දාය. ඇය සරුංගල් නූල් සහ ප්ලාස්ටික් කඩු වලින් මින්පෙර කිසිවක් තනා නොතිබූ නමුත්, එය පහසු මෙන්ම තාත්වික බව පෙනී ගියේය. මිනිත්තු ගණනක් තුළදී ඇයට නූල් සහ ප්ලාස්ටික් කඩු යොදාගෙන ලණු ඉණිමඟක් සාදා ගැනීමට හැකි විය. නූල් එකට වියා, ප්ලාස්ටික් කඩු හරහට සිටින සේ ගැට ගැසීමෙන් ඇයට ඉණිමඟ සාදා ගැනීමට හැකි විය.

අත්හදා බැලීමක් ලෙස, ඇය ලණු ඉනිමගේ එක් කෙළවරක් ආධාරක කුලුනක ගැට ගසා ඇගේ මුළු වෙර යොදා ඇද බැලුවාය. ප්ලාස්ටික් කඩු නැවී ගියත්, ඒවාට අතිරේක ගැට කීපයක් යොදා තිබූ බැවින් අඩුම වශයෙන් ඇයට පහසුවෙන් අල්ලා ගැනීමට හෝ හැකියාව තිබිණි.

ඉණිමඟට කිසිම සැලසුම් පිළිබඳ සම්මානයක් නොලැබෙනු ඇති වුවත්, එයින් ඇයට ගුහාවේ පතුලට ආරක්ෂිතව බැසීමට හැකිවනු ඇත. මුලින්ම ඇය තම ගමන් මල්ල ඉතිරි නූල් වලින් පුරවා ගත්තාය. ඒ ඇයිදැයි යන්න ගැන ඇයට අදහසක් නොවුණත් ඒවා අමතර සම්පතක් වූ අතර එතරම් බරක්ද නොතිබිණි.

ඇය නැවතත් මොසැයික පොළොවේ වූ සිදුර වෙත පැමිණියාය. ඇය ඉනිමගේ එක් කෙළවරක් යාබද පලංචියේ ගැට ගැසුවාය. ගුහාව තුළට ලණු ඉනිමඟ දමූ ඇය පහළට බැසීම ඇරඹුවාය.

# 34
# ඇනබෙත්

ඇනබෙත් ගුවනේ එල්ලෙමින්, එහාටත් මෙහාටත් පැද්දෙන වැල් ඉනිමගේ පහළ බසිද්දී, අර්ධ ලෝහිත කඳවුරේ සිටි වසර ගණනාව පුරා, නැගීමේ පුහුණුව ලබා දුන් චිරොන්ට ස්තූති කිරීමට අමතක නොකළාය. එකල ඇය නිතර මැසිවිලි නැගුවේ කඹයක් දිගේ ඉහළ නැගීම කිසිසේත්ම රාක්ෂයන් පරාජය කිරීමට උදව්වක් නොවන බව පවසමිනි. මේ දිනය පැමිණෙන බව දැනසිටි අයුරින් චිරොන් කළේ සිනාසීම පමණි.

අවසානයේ ඇනබෙත් පතුලට ළඟා වීමට සමත් වූවාය. ගඩොල් බැම්මට තැබූ පය වැරදී යාමෙන් ඇය ඇල මාර්ගයට පතිත වුවත්, එහි ගැඹුර අඟල් කීපයකට නොවැඩි බව පෙනී ගියේය. සීතල ජලයෙන් ඇගේ සපත්තු පෙඟී ගියේය.

ඇය තම දිලිසෙන කිණිස්ස ඔසවා ගත්තාය. නොගැඹුරු ඇල මාර්ගය ගඩොල් බැමි උමඟ මැදින් පහළට විහිදී ගොස් තිබිණි. සෑම යාර කීපයකටම වරක්, මැටි නල බිත්ති වලින් නෙරා විත් තිබුණේය. ඒ අපවහන නල විය යුතුයැයි ඇය අනුමාන කළාය. එහෙත් සියවස් ගණනක් තිස්සේ මෙම භූගත නල සුරැකිව තිබීම ඇගේ පුදුමයට හේතු විය.

ජලයේ සීතලටත් වැඩි සීතලකින් එකවරම ඇගේ ගත හිරි වැටී ගියේය. වසර කීපයකට පෙර, ඇයත් පර්සිත් ඩායිඩාලුස්ගේ වංගගිරියේ ගවේෂණයක යෙදුණහ. දැඩි ලෙස බන්ධනය කර සහ උගුල්

වලින් යුත් රහසිගත උමං ජාලයකින් හා කාමර වලින් සමන්විත එය අමෙරිකාවේ සියලු නගර යටින් විහිදී තිබිණි.

වංකගිරියේ සටනේදී ඩායිඩාලුස් මියගිය විට, මුළු වංකගිරියම කඩා වැටිණි. නැතහොත් එසේ වන්නට ඇතැයි ඇනබෙත් සිතුවාය. එහෙත් එය අමෙරිකාවේ පමණක් තිබූ දෙයක් ද? මෙයත් වංකගිරියක පැරණි පිටපතක් විය නොහැකිද? තම වංකගිරියට එයටම අයත් ජීවිතයක් පවතින බව ඩායිඩාලුස් වරෙක ඇයට පවසා තිබුණේය. එය නිරන්තරයෙන් වැඩෙමින් සහ වෙනස් වෙමින් පැවතුණේය. සමහරවිට වංකගිරියට රාක්ෂයන්ට මෙන් ප්‍රතිඋත්පාදනය වීමේ හැකියාවක් පැවතීමට හැකිය. එයින් අදහසක් ජනිත වේ. සමහර දේවල් කිසිදාක සැබෑවට මිය නොයයි යනුවෙන් චිරොන් පවසන අන්දමට එය පුරකෘතික බලයක් විය.

*මෙය වංකගිරියක කොටසක් නම්...*

ඇනබෙත් එහි පදිංචි වීමට තීරණය නොකළත්, ඇගේ දිශාවන් නිවැරදි බව පිළිගැනීමටද ඇය මැලි වූවාය. වංකගිරියක දුර යනු අර්ථවිරහිත දෙයකි. ඇය ප්‍රවේසම් නොවුණොත්, ඇය වැරදි දිශාවට අඩි විස්සක් ඇවිද යාමෙන්, ඇගේ ගමන පෝලන්තයෙන් නවතිනු ඇත.

හුදෙක් ආරක්ෂාව වෙනුවෙන්, ඇය තම අලුත් නූල් බෝලය ඇගේ ලඟු ඉනිමගේ කෙළවරක ගැට ගැසුවාය. මඟ සොයා ගැනීමට ඇයට ඒ නූල් බෝලය ඇගේ පසුපසින් දිග හැරගෙන ඒමට හැකිය. පරණ උපක්‍රමයක් වුවත් හොඳ එකකි.

කොයි පැත්තට යන්නේ දැයි ඇය තුළ වූයේ සැකයකි. දෙපැත්තෙන්ම උමඟ දිස් වූයේ එකම ආකාරයෙනි. ඉන්පසු, ඇයට අඩි පණහක් පමණ වම් පැත්තෙන් බිත්තියේ ඇතීනාගේ සලකුණ දිලිසෙන්නට විය. එහි විශාල ඇස් තමන් වෙතට එල්ල කරගෙන එය දිලිසුණ බව ඇනබෙත්ට සහතික කර කීමට හැකිවිය. ඒ දෑස්වල වූයේ: *මොකක්ද ඔයාගෙ ප්‍රශ්නේ? ඉක්මන් කරන්න!* වැනි බැල්මකි.

ඇය සැබෑවටම ඒ බකමූණාට වෛර කිරීමට පටන් ගත්තාය.

ඇය එතැනට ළඟා වන විට, රූපය වියැකී ගොස් තිබුණු අතර ඇගේ පළමු නූල් බෝලයද අවසන් වී තිබිණි.

ඇය අලුත් නූලක් අමුණන අතර උමඟ පුරා දෑස් යොමු කළාය. එහි ගල් බැම්මේ බිඳුණු කොටසක් තිබිණි. බිත්තියේ සිදුරට

කුළු ගෙඩියකින් පහර දුන්නාක් වැනි පෙනුමක් එහි විය. ඇය කිට්ටුවට පැමිණ එය නැරඹූවාය. ඇගේ කිණිසි තලයේ ආලෝකයෙන් ඇයට දැක ගැනීමට ලැබුණේ දිගු සහ පටු, මොසැයික පොළවකින් යුත්, පහත් කුටියකි. සිතුවම් කළ බිත්තිවලින් යුතු එතුළ දෙපැත්තට වන්නට බංකු පේළි තබා තිබිණි. එහි හැඩය එක්තරා ආකාරයකට උමං මාර්ග රථයක් මෙන් විය.

කිසිවකු හපා නොදමතැයි අපේක්ෂාවෙන් ඇනබෙත් තම හිස සිදුර තුළින් ඇතුළට දැමුවාය. කාමරයේ යාබද අන්තයේ ගඩොල් ගැලවුණු දොරටුවකි. ඈත අන්තයේ වූයේ මේසයකි. සමහරවිට අල්තාරයක් විය හැකිය.

හ්ම්ම්... ජල මාර්ගය දිගටම ගලා ගියමුත්, නියම මාර්ගය මෙය යැයි ඇනබෙත්ට විශ්වාසය. ටයිබේරිනස් පැවසූ වදන් ඇගේ මතකයට නැගිණි. විදේශ දෙවියාගේ අල්තාරය සොයා ගන්න. අල්තාර කාමරයේ කිසිදු පිටවීමේ මඟක් ඇති බව නොපෙනුණි. එහෙත් එහි බංකුවෙන් ආපසු ඉහළට නැගීට හැකිවනු ඇත.

නූල තවමත් අතේ තිබෙද්දී ඇය පහළට බැස්සාය.

කාමරයේ සිවිලිම බැරලයක හැඩයෙන් යුක්ත වූ අතර, ගඩොල් ආරුක්කු වලින් ද සමන්විත විය. එහෙත් ආධාරක වල පෙනුමට ඇනබෙත් කැමති නොවූවාය. ගඩොල් දොරටුවට යාබදව හරියටම ඇගේ හිසට ඉහළින් තිබූ ආරුක්කුවේ මුදුන් ගල් අර්ධ වශයෙන් පුපුරාගොස් තිබිණි. සිවිලිම පුරාම ඉරිතලා ගොසිනි. මේ ස්ථානය වසර දෙදහසක්වත් කිසිවකුගේ ස්පර්ශය නොලබා තිබුණු බව පෙනුණත්, මෙතැන වැඩි වේලාවක් ගත කළ යුතු නැතැයි ඇය තීරණය කළාය. ඇගේ වාසනාවට ඊළඟ මිනිත්තු දෙකේදී එය කඩා වැටෙනු ඇත.

මොසැයික ගෙබිම දිගු සහ පටු විය. කාල රේඛාවක් මෙන් එය පෙළට එහි සිතුවම් හතක් තිබිණි. ඇනබෙත්ගේ පතුල් අසලම සිටියේ කපුටකු වැනි විශාල කළු පක්ෂියෙකි. ඊළඟට සිංහයකි. අනෙක් ඒවා කීපයකම විවිධ ආයුධ රැගත් රෝම රණ ශූරයන් සිටින බව පෙනිණි. ඉතිරි ඒවා ඇනබෙත්ට විස්තරාත්මකව හඳුනා ගැනීමට නොහැකි තරමට හානි වී හෝ දූවිල්ලෙන් වැසී ගොස් තිබිණි. දෙපසේ වූ බංකු මත බිඳී ගිය මැටි බඳුන් කැබලි විසිරී තිබිණි. බිත්ති සිතුවම් කර තිබුණේ භෝජන සංග්‍රහයක ජවනිකා වලිනි. අයිස් ක්‍රීම් හැන්දක් මෙන් වක් වූ හිස්වැස්මක් පැළඳ, ලෝගුවක් හැඳි මිනිසෙක්, හිරු එළිය තපින විශාල

හාදයකු අසල හිඳගෙන සිටියේය. ඔවුන් වටා සිටගෙන සිටියේ පන්දම් දරන්නන් සහ සේවකයන් ය. එසේම කපුටන්, සිංහයන් වැනි විවිධ සතුන් පසුබිමෙහි දකින්ට ලැබිණි. සිතුවමෙන් නිරූපණය කරන්නේ කුමක් දැයි ඇනබෙත්ට වටහා ගැනීමට නොහැකි වුවත්, එයින් ඇයට තමා දන සිටි කිසිදු ග්‍රීක පුරාවෘත්තයක් මතකයට නැගුණේ නැත.

කාමරයේ ඈත අන්තයේ, අල්තාරය තිරස් තීරුවක් ලෙස අලංකාර කැටයමකින් යුක්ත විය. එහි දක්නට ලැබුණේ ගවයකුගේ ගෙලට පිහියක් තබාගන සිටින අයිස්ක්‍රීම් හැන්දක් වැනි හිස් වැසුම පැළඳ ලෝගුකාරයාය. අල්තාරය මත වූයේ ගලින් කළ මිනිස් රුවකි. ඔහුගේ දණහිස් පාෂාණයේ ගිලී තිබුණු අතර, දෙපසට විහිදා ගත් දෑත්වල කිණිස්සක් සහ පන්දමක් විය. නැවතත්, ඇනබෙත්ට මේ සිතුවම්වලින් පැවසෙන අර්ථය වටහා ගැනීමට නොහැකි විය.

ඇය අල්තාරය දෙසට පියවරක් තැබුවාය. ඇගේ පාද වලින් යමක් බිඳී යන හඬ ඇසිණි. පහළ බැලූ විට ඇයට පෙනී ගියේ තම සපත්තුව මිනිසකුගේ ඉළ ඇට කූඩුව අතරට ගොස් ඇති බවය.

ඇනබෙත් බෙරිහන් දීගෙන පිටුපසට පැන්නාය. *මේක ආවේ කොහෙන්ද?* ඇය මොහොතකට පෙර බිම බැලුවාය. ඇයට කිසිදු අස්ථියක් දක ගැනීමට නොලැබිණි. දන් ඒවා ගෙබිම පුරා ඒවා විසිරී තිබිණි. නිසැකවම ඉල ඇට කූඩුව පැරණි එකකි. ඇය තම පය ඉවතට ගන්නා විට එයින් දුවිලි විසිරී ගියේය. ඊට සමීපව ගෙබිම මත ඇගේ කිණිස්සට බෙහෙවින් සමාන මල කෑමට ලක්වූ ලෝකඩ කිණිස්සක් වැටී තිබිණි. එක්කෝ මෙය මියගිය පුද්ගලයා අවියක් ලෙස රැගෙන ආවා විය යුතුය. නැතිනම් ඒ ඔහුට මරණය ගෙන දුන් අවිය විය යුතුය.

තමාගේ ඉදිරිපස දකීමට ඇය තම කිණිසි තලය ඉහළට එසවූවාය. තරමක් ඉදිරියෙන් මොසැයික මාර්ගයේ, වඩාත් සම්පූර්ණ ඇටසැකිල්ලක් වැතිරී තිබිණි. ඒ අසලම පුනරුද යුගයෙන් පැමිණි මිනිසකුගේ වැනි එම්බ්‍රොයිඩර් කළ අංගරකාවකි. ඔහුගේ රැළි වැටුණු කොළරය සහ හිස්කබල තදබල ලෙස පිළිස්සී තිබුණේ, මේ හාදයා ගිනි පන්දමකින් හිස සේදීමට තීරණය කර තිබුණා මෙනි.

*පුදුමයි.* ඇනබෙත් සිතුවාය. ඇය අල්තාරය මත තිබූ පන්දමක් සහ කිණිස්සක් අත දරා සිටි ප්‍රතිමාව දෙස බැලුවාය.

*යම් ආකාරයක පරීක්ෂාවක්,* ඇනබෙත් තීරණය කළාය. මේ හාදයින් දෙදෙනා ඉන් අසමත් වී තිබිණි. නිවැරදි කිරීමක්: හාදයින් දෙදෙනා පමණක් නොවේ. අල්තාරයේ සෑම අතකම තවත් අස්ථි සහ රෙදි කැබලි විසිරී තිබිණි. එතැන ඇටසැකිලි කොපමණ ඇත්දැයි ඇයට අනුමාන කිරීමට නොහැකි වුවත්, ඒ සියල්ලම අතීතයේ මෙහි උප දෙවිවරුන්ගේ හෙවත් එකම ගවේෂණයේ යෙදුණු ඇතීනාගේ දරුවන්ගේ බව ඇයට ප්‍රත්‍යක්ෂවම කිව හැකි විය.

''මම නුඹේ ගෙබිමේ තවත් ඇටසැකිල්ලක් වෙන්නෙ නැහැ.'' තම හඬ නිර්භීත යැයි අපේක්ෂා කරමින් ඇය ප්‍රතිමාවට පැවසුවාය.

*කෙල්ලෙක්,* දියාරු හඬක් පැවසුවේය. එහි හඬ කාමරය පුරා දෝංකාර දුන්නේය. *කෙල්ලන්ට අවසර නැහැ.*

*ගැහැනු උප දෙවියෙක්,* දෙවැනි හඬකින් පැවසිණි. *සමාව දිය නොහැකියි.*

කුටිය කම්පනය විය. පුපුරා ගිය සිවිලිමෙන් දූවිලි කඩා හැලිණි. ඇනබෙත් තමා පැමිණි සිදුර දෙසට දිව ගියත්, එය අතුරුදහන් වී තිබිණි. ඇගේ නූල කැඩී ගොසිණි. බංකුව මතට නැගුණු ඇය සිදුර තිබූ තැන සොයන්නට වූවාය. සිදුර අතුරුදන් වීම තම දෘෂ්ටි මායාවක් වන්නට ඇතැයි ඇය බලාපොරොත්තු වුවත්, බිත්තියේ ඝන බව ඇයට දැනී ගියේය.

ඇය සිර වී සිටියාය.

බංකුවලින් දිලිසෙන භූතයන් දුසිම් ගණනක් දර්ශනය වන්නට විය. ඔවුන් ඇය ජුපිටර් කඳවුරේදී දුටු ලාරෙස් මෙන් ඔවුහු රෝම ටෝගාවලින් සැරසී දම් පාටින් දිලිසෙමින් සිටියහ. ඔවුන්ගේ හමුවට බාධා කළාක් වැනි බැල්මකින් ඔවුහු ඇය දෙස බලාගෙන සිටියහ.

ඇය තමාට හැකි එකම දේ කළාය. බංකුවෙන් බිමට බැසි ඇය ගඩොල් දොරටුවට පිට දී සිටගත්තාය. විශ්වාසවන්ත පෙනුමක් නඟා ගැනීමට උත්සාහ කළත්, දිදුලන් දම් භූතයින් සහ ඇගේ දෙපා මුල වූ උප දෙවිවරුන්ගේ ඇට සැකිලි නිසා ඇයට වුවමනා වූයේ කෑ ගැසීමටය.

''මම ඇතීනාගේ දරුවෙක්.'' ඇයට පෙන්වීමට හැකි තරමට නිර්භීතව ඇය පැවසුවාය.

''ග්‍රීකයෙක්.'' එක් භූතයෙක් පිළිකුලෙන් පැවසුවේය. ''ඒක ඊටත් වඩා නරකයි.''

කුටියේ අනෙක් අන්තයේ, යම් අසීරුතාවකින් මෙන් මහලු පෙනුමැති භූතයකු නැගී සිටියේය (භූතයන්ටත් ආතරයිටිස් තියෙනවද?) අල්තාරය අසල සිටගත් ඔහුගේ අඳුරු දෑස් ඇනබෙත් වෙත යොමු වී තිබිණි. ඇයට මුලින්ම සිතුණේ ඔහු පාප්වරයකුගේ පෙනුමකින් යුතු බවය. දිලිසෙන කබායක් හැඳ සිටි ඔහුගේ හිසේ උල් වූ හිස්වැස්මක් විය. අතෙහි වූයේ එඬේර යෂ්ටියකි.

''මේ මිත්‍රාස්ගේ ගුහාවයි.'' මහලු භූතයා පැවසුවේය. ''නුඹ අපේ පූජනීය යාතුකර්මවලට බාධා කළා. නුඹට අපේ අභිරහස පහත් කොට සලකන්න බැහැ. නුඹට ජීවත් වෙන්න බැහැ.''

''මට ඔබේ අභිරහස්වලට පාච්චල් කරන්න වුවමනාවක් නැහැ.''ඇනබෙත් ඔහුට සහතික වූවාය. ''මම ඇතීනාගේ සලකුණ අනුව යමින් ඉන්නේ. මට පිටවීමේ මාර්ගය පෙන්වන්න. මම මගේ ගමන යන්නම්.''

ඇයටම පුදුමයක් වෙමින් ඇගේ හඬ බෙහෙවින් සන්සුන් විය. මෙයින් පිටවෙන්නේ කෙසේද යන්න ගැන ඇයට අදහසක් නොතිබුණත්, තම සොයුරු සොයුරියන් අසාර්ථක වූ තැන තමා සාර්ථක විය යුතු බව ඇය දැන සිටියාය. ඇගේ මාර්ගය වැටී තිබුණේ රෝමයේ භූගත ස්ථරවල තවත් ගැඹුරටය.

ඔබේ පූර්වගාමීන්ගේ අසාර්ථකත්වය ඔබට මඟ පෙන්වයි. ටයිබේරිනස් පැවසුවේය. ඊට පස්සෙ... මම දන්නෙ නැහැ.

භූතයෝ ලතින් බසින් එකිනෙකා සමඟ කෙඳිරූහ. ගැහැනු උපදෙවියන් සහ ඇතීනා ගැන අකාරුණික වචන කීපයක් ඇයට අහුලා ගත හැකි විය.

අවසානයේ පාප් හිස්වැස්ම පැළඳි භූතයා තම එඬේර යෂ්ටියෙන් පොළොවට ඇන්නේය. අනෙක් භූතයෝ නිහඬ වූහ.

''නුඹේ ග්‍රීක දෙවඟනට මෙහෙදී බලයක් නැහැ.'' පාප්වරයා පැවසුවේය.''මිත්‍රාස් තමයි රෝම රණ ශූරයන්ගේ දෙවියා! ඔහු තමයි ලෙජියන් එකේ දෙවියා. අධිරාජ්‍යයේ දෙවියා!''

''එයා රෝම කෙනෙක්වත් නෙමෙයිනේ.'' ඇනබෙත් එරෙහි වූවාය.

''එයා පර්සියන් හෝ වෙනත් කෙනෙක් නෙමෙයිද?''

''කෙලෙසීමක්!'' මහලු මිනිසා මොර දුන්නේය. ඔහුගේ යෂ්ටිය කීපවරක් ගෙබිම මත පතිත විය. ''මිත්‍රාස් අපව ආරක්ෂා කරනවා!

''පියා.'' ඇනබෙත් පරිවර්තනය කළාය.

''බාධා කරන්න එපා! පැටර්[1] විදිහට, මම අපගේ අභිරහස් ආරක්ෂා කළ යුතුයි.''

''මොන අභිරහස්ද?'' ඇනබෙත් විමසුවාය. ''ලෙනක් ඇතුළෙ ටෝගා ඇඳගත් මැරුණු හාදයො දුසිම් ගණනක් ඉන්න එකද?''

පැටර් විසිල් හඬක් නගමින් පාලනය කරන තුරු අනෙක් භූතයෝ කොඳුරමින් මැසිවිලි නගන්නට වූහ. ''නුඹ පැහැදිලිවම විශ්වාස කළ නොහැකි අයෙක්. අනෙක් අය වගේම, නුඹ මිය යා යුතුයි.''

*අනෙක් අය.* ඇනබෙත් ඇට සැකිලි දෙස නොබලා සිටීමට උත්සාහ දැරුවාය.

මිත්‍රාස් ගැන තමා දන්නා දෙයක් මතකයට නඟා ගැනීමට ඇය වේගයෙන් මොළය වෙහෙසන්නට වූවාය. ඔහුට රණ ශූරයන් සඳහා වූ රහසිගත කල්ලියක් තිබිණි. ලෙජියන් අතර ඔහු ජනප්‍රියව සිටියේය. ඇතීනාව යුද දෙවියකු ලෙස තනතුරෙන් පහ කළ දෙවියන් අතර ඔහුද කෙනෙකු විය. චාල්ස්ටන්වල තේ සාදයේදී ඇප්‍රොඩයිටි ඔහු ගැන සඳහන් කළාය. ඒ හැර ඇනබෙත්ට කිසිදු අදහසක් නොතිබිණි. මිත්‍රාස් අර්ධ ලෝහිත කඳවුරේදී ඔවුන්ගේ කතාවට ලක් වූ දෙවියකු නොවීය. ඩායිඩාලුස්ගේ පරිගණකය ගෙන පරීක්ෂා කරන තුරු භූතන් බලා සිටීවිදැයි ඇයට වූයේ සැකයකි.

ඇය මොසැයික් ගෙබිම දෙස බැලුවාය. එහි පෙළට රූප හතක් විය. ඇය භූතයන්ව අධ්‍යයනය කරන විට ඔවුන්ගේ ටෝගා වේ යම් ආකාරයක ලාංඡනයක් තිබෙන බව ඇයට දක්නට ලැබිණි. ඒවායේ කළු පක්ෂියා හෝ පන්දම හෝ දුන්නක් දක්නට ලැබිණි.

''ඔබලාගේ ස්ථානවල පිළිවෙලක් තියෙනවා.'' ඇය පැවසුවාය. ''සාමාජිකත්වයේ මට්ටම් හතක්. ඉහළම මට්ටම තමයි පැටර්.''

භූතයින් සියල්ලෝම එකවිට ගැස්සී ගියහ. ඉන්පසු ඔවූහු සියල්ලෝම එකවිට කෑ ගසන්නට වූහ.

''එයා කොහොමද ඒක දැන ගත්තේ?'' එකකු පැවසුවේය.

1 පියතුමා යන්නට ලතින් බසින් යෙදේ. එසේම පාතාල ලෝකයේ පැරණි රෝම දෙවියන් හැඳින්වීමට ද යොදා ගැනිණි.

''කෙල්ල අපේ රහස් හොයාගත්තා!''

''නිහඬවෙන්න.'' පැටර් නියෝග කළේය.

''ඒත් එයා දිවුරුම් පරීක්ෂාව ගැන දැන සිටිය යුතුයි.'' තවකෙක් කෑ ගැසුවේය.

''දිවුරුම් පරීක්ෂා.'' ඇනබෙත් පැවසුවාය. ''මම ඒවා ගැන දන්නවා.''

''විකාරයක්!'' පැටර් කෑ ගැසුවේය. ''කෙල්ල බොරු කියනවා! ඇතීනාගේ දියණිය, ඔබ මියයන ආකාරය තෝරගන්න. ඔබ එය තෝරා නොගත්තොත්, දේව කැමැත්ත ඔබ වෙනුවෙන් එය තෝරා ගනියි.''

''ගින්දර හෝ කිණිස්ස.'' ඇනබෙත් අනුමාන කළාය.

පැටර් පවා ගල්ගැසී සිටියේය. අතීතයේ දඬුවමට ගොදුරු වුවෝ මේ පොළොවේ වැතිරී සිටින බව ඔහුට අමතකව ඇති බව පෙනිණි.

''කොහොමද- කොහොමද ඔබ...?'' ඔහු ගොත ගැසුවේය.

''ඔබ කවුද?''

''ඇතීනාගේ දරුවෙක්.'' ඇනබෙත් නැවත පැවසුවාය. ''ඒත් වෙනත් කිසිම දරුවෙක් වගේ නෙමෙයි. මම... ආහ්. මගේ සහෝදරත්වයේ මව. මැග්නා මැටර්. මගේ කිසිම අභිරහසක් නැහැ. මිත්‍රාස්ට මගෙ ඇස්වලින් කිසිම දෙයක් හංගන්න බැහැ.''

''මැග්නා මැටර්.'' භූතයා බලාපොරොත්තු සුන් වූ අයුරින් පැවසුවේය.

''මහා මාතාව.''

''ඇයව මරන්න!'' එක් භූතයකු කෑ ගැසුවේය. ඔහුගේ දෑත් ඇය දෙසට දිගුවී තිබිණි.

''උඹ මැරිලා.'' ඇනබෙත් ඔහුට මතක් කර දුන්නාය. ''ඉඳගනින්.'' වික්ෂිප්ත වූ බව පෙනුණු භූතයා තම අසුනේ හිඳ ගත්තේය.

''අපිට උඹව අපේ අතින් මරන්න ඕනෙ නැහැ'' පැටර් ගෙරවූයේය. ''මිත්‍රාස් අපි වෙනුවෙන් ඒක කරයි.''

අල්තාරය මත වූ ප්‍රතිමාව දිලිසෙන්නට පටන් ගත්තේය.

ඇනබෙත් තම දෑත්, ඇය පිට දීගෙන සිටි බිත්තියට තද කර ගත්තාය. එය පිටවීමේ දොරටුව විය යුතුය. බදාම කැබලි වී තිබුණත්, ප්‍රබල බලයකින්වත් ඇයට බිඳ දැමිය නොහැකි තරමට එය ශක්තිමත් විය.

ඇය අපේක්‍ෂා භංගව කාමරය වටා දෙනෙත් යොමු කළාය. ඉරි තැළුණු සිවිලිම, මොසැයික ගෙබිම, බිතු සිතුවම් සහ කැටයම් කළ අල්තාරය පමණක් එහි දක්නට ලැබිණි. තම හිස තුළ භ්‍රමණය වන හැඟීම් නොසලකමින් ඇය කතා කරන්නට පටන් ගත්තාය.

''ඒක හොඳ දෙයක් නෙමෙයි.'' ඇය පැවසුවාය. ''මම සේරම දන්නවා. ඔබ ඔබේ මුලපිරීම අත්හදා බලන්නේ ගින්දර වලින්. මොකද මිත්‍රාස්ගේ සලකුණ පන්දම නිසා. එයාගෙ අනෙක් සලකුණ තමයි කිණිස්ස. ඒ නිසා තමයි ඔයා කිණිස්සෙනුත් අත්හදා බැලුවේ. ඔයාට මාව මරන්න ඕනෙ වෙලා. තියෙන්නෙ හරියට... ආහ්, මිත්‍රාස් පූජනීය ගවයා මරපු විදිහට.''

එය මුළුමනින්ම අනුමානයක් වූ නමුත් අල්තාරයේ මිත්‍රාස් ගවයා මරන අයුරු පෙන්වා තිබිණි. එබැවින් එය වැදගත් වෙතැයි ඇනබෙත් කල්පනා කළාය. භූතයෝ ඔවුන්ගේ කන් වසාගෙන දඟලන්නට වූහ. සමහරු නරක සිහිනයකින් අවදි කිරීමට මෙන් තම මුහුණු වලට ගසා ගත්හ.

''මහා මාතාව දන්නවා!'' එකකු පැවසුවේය. ''ඒක වෙන්න බැහැ.''

*උඹ කාමරේ අවට බැලුවෙ නැත්නම්,* ඇනබෙත් සිතුවාය. ඇගේ විශ්වාසය වැඩෙමින් තිබිණි.

ඇය කතා කරමින් සිටි භූතයා දෙස බැලුවාය. ඔහුගේ ටෝගාවේ සලකුණ වූයේ කළු පක්‍ෂියාය. ඒ ඇගේ දෙපා මුල වූ මොසැයික පොළොවේ තිබූ සලකුණම ය.

''උඹ කළු පක්‍ෂියෙක් විතරයි.'' ඇය පැවසුවාය. ''ඒක තමයි පහළම පදවිය. කට වහගෙන මට උඹේ පැටර් එක්ක කතා කරන්න ඉඩ දීපන්.'' භූතයා හැකිලී ගියේය. ''අනුකම්පා කරන්න! අනුකම්පා කරන්න!''

කාමරයේ ඉදිරි පිට, පැටර් ගැහෙමින් සිටියේය- එක්කෝ බිය නිසාය. නැතහොත් කෝපය නිසාය. ඒ දෙකෙන් කොයික දැයි ඇනබෙත්ට සිතාගත නොහැකි විය.

''ඇත්තටම, ඔබ ගොඩක් දන්නවා මහා මාතාවනි. ඔබගේ නුවණ විශිෂ්ටයි. ඒත් ඔයාට පිටවෙලා යන්න බැරි එකට තවත් හේතුවක් තමයි ඒක. ඔබගේ පැමිණීම ගැන වියන්නිය අපට අනතුරු අඟවා තිබුණා.''

''වියන්නිය...'' පැටර් කතාකරමින් සිටින්නේ කුමක්දැයි අවබෝධ වීමත් සමඟ ඇනබෙත් හැකිළී ගියාය. ඒ පර්සිගේ සිහිනයේදී අඳුරේ සිටි දෙයයි. පූජාසනයේ භාරකාරිය. තමා පිළිතුරු නොදත් බව දැනුණු පළමු වතාව මෙය වුවත්, ඇය තම සන්සුන් බව තවදුරටත් තබා ගැනීමට උත්සාහ කළාය. ''වියන්නිය මාව බයකරනවා. මම ඇතීනාගේ සලකුණ පසුපස යන එකට ඇය කැමති නැහැ. ඒත් ඔයාලට මට යන්න දෙන්න වෙනවා.''

''ඔබ බිහිසුණු අත්දැකීම තෝරාගත යුතුයි.'' පැටර් විරෝධය පෑවේය. ''ගින්දර හෝ කිණිස්ස! ඒකෙන් බේරන්න, එතකොට සමහරවිට.''

ඇනබෙත් තම සහෝදර සහෝදරියන්ගේ ඇට සැකිලි දෙස බැලුවාය. *ඔබේ පූර්වගාමීන්ගේ අසාර්ථකවීම් ඔබට මග පෙන්වනු ඇත.*

ඔවුහු සියල්ලෝම එකක් හෝ අනෙක තෝරාගෙන තිබුණාහ. *ගින්දර හෝ කිණිස්ස.* සමහරවිට ඔවුන්ට බිහිසුණු අත්දැකීම පරාජය කළ හැකි යැයි ඔවුන් සිතුවා විය හැකිය. එහෙත් සියල්ලෝම මිය ගියහ. ඇනබෙත්ට තුන්වැනි විකල්පයක් අවශ්‍යව තිබිණි.

ඇනබෙත් දෙවැනි වතාවටත් දිලිසෙමින් තිබෙන, අල්තාරයේ ප්‍රතිමාව දෙස බැලුවාය. එහි උණුසුම කාමරය පුරාම පැතිර යන බව ඇයට දැනිණි. ඇගේ සහජ බුද්ධිය කිණිස්සට හෝ පන්දමට නාභිගතව තිබිණි. එහෙත් ඒ වෙනුවට ඇය ප්‍රතිමාවේ පාදමට සිත යොමු කළාය. එහි පාද පාෂාණයේ සිරවී ඇත්තේ ඇයි දැයි ඇය කල්පනා කළාය. එවිට ඇයට එය පැහැදිලි විය. සමහරවිට මිත්‍රාස්ගේ කුඩා ප්‍රතිමාව ගලෙහි සිරවී නැතිවා විය හැකිය. සමහරවිට ඔහු පාෂාණයෙන් නික්මෙනවා විය හැකිය.

''පන්දම හෝ කිණිස්සෙන් එකක්වත් නෙමෙයි.'' ඇනබෙත් දැඩිව පැවසුවාය. ''එතන තුන්වෙන පරීක්ෂාවකුත් තියෙනවා. මම සමත් විය යුතු.''

''තුන්වෙනි පරීක්ෂාවක්?'' පැටර් පුදුමයෙන් පැවසුවේය.

''මිත්‍රාස් ඉපදුණේ පාෂාණයෙන්.'' තමා නිවැරදි යැයි යන බලාපොරොත්තුවෙන් ඇනබෙත් පැවසුවාය. ''එයා සම්පූර්ණයෙන් වැඩිලා පාෂාණයෙන් නික්මුණේ එයාගෙ පන්දමයි කිණිස්සයි එක්ක.''

කෑ ගැසීම හඬ ඇගේ අනුමානය නිවැරදි බව තහවුරු කළේය. ''මහා මාතාව සේරම දන්නවා.'' භූතයෝ කෑ ගැසුහ. ''ඒක තමයි අපි වැඩියෙන් ආරක්ෂා කරපු රහස.''

*එහෙනම් සමහරවිට උඹලා ප්‍රතිමාව අල්තාරය උඩ තියන එකක් නැහැ.* ඇනබෙත් සිතුවාය. එහෙත් ඇය මෝඩ පිරිමි භූතයන්ට ස්තුති කළාය. ඔවුන් ගැහැනු රණ ශූරයන්ට ඔවුන්ගේ කල්ලියට ඒමට ඉඩ හැරියේ නම්, ඔවුන්ට සාමාන්‍ය දැනීමවත් ඉගෙන ගැනීමට හැකිවනු ඇත.

ඇනබෙත් සෙමින් තමා පැමිණි බිත්තිය දෙස බැලුවාය. ''මම ඉපදුනෙත් මිත්‍රාස් වගේම පාෂාණයෙන්! ඒ නිසා මම දැනටමත් උඹලාගේ පරීක්ෂාව සමත් වෙලා ඉන්නෙ.''

''නැහැ!'' පැටර් කෑ ගැසුවේය. ''උඹ ආවේ බිත්තියේ තියෙන සිදුරකින්. ඒක සමාන දෙයක් නෙමෙයි.''

*හරි.* පැටර් මුළුමනින්ම මෝඩයකු නොවන බව පෙනී ගියේය. එහෙත් ඇනබෙත් විශ්වාසය රඳවා ගත්තාය. ඇය සිවිලිම දෙස බැලුවාය. සියලු විස්තර ක්ෂණිකව රැස් කරමින් ඇයට තවත් අදහසක් සිතට නැගුණේය.

''මම පාෂාණ පාලනය කරල තියෙනවා.'' ඇය තම දෑත් එසවූවාය.

''මම ඔප්පු කරල පෙන්වන්නම් මගේ බලය මිත්‍රාස්ට වඩා වැඩියි කියලා. එක පහරකින්, මම මේ කුටිය කුඩු කරල දානවා.''

භූතයෝ වෙව්ලමින් සිවිලිම දෙස බැලූහ. එහෙත් තමා දුටු දෙය ඔවුහු නොදුටු බව ඇනබෙත් දැන සිටියාය. මේ භූතයින් රණ ශූරයන් මිස ඉංජිනේරුවන් නොවීය. ඇතීනාගේ දරුවන්ට සටන් කිරීම පමණක් නොව බොහෝ කුසලතා තිබිණි. ඇනබෙත් වසර ගණනාවක් ගෘහ නිර්මාණ ශිල්පය හැදෑරුවාය. මේ පැරණි කුටිය කඩා වැටීමට ආසන්න බව ඇය දැන සිටියාය. සිවිලිමේ ඇති සියලු ඉරි තැලීම් පටන් ගෙන ඇත්තේ එකම තැනකින් එනම් ඇයට හරියටම ඉහළින් වූ ආරුක්කුව මුදුනේ වූ ගලෙන් බව ඇය දැන සිටියාය. මුදුන්ගල ගෙවී

ගොස් තිබිණි. එය සිදු වූ විට, ඇයට එය නියම වේලාවට කළ හැකි බව ඇය සිතුවාය.''

''ඒක වෙන්න බැහැ.'' පැටර් කෑ ගැසුවේය. ''අපේ පූජාසනයට ඇතුළු වෙන්න නිර්භීත වුණ ඕනෑම ඇතීනාගේ දරුවෙක්ව මරල දාන්න අපිට වියන්නිය හොඳට ගෙවල තියෙන්නෙ. අපි කෙහෙත්ම උඹට යන්න දෙන්නෙ නැහැ. උඹට සමත් වෙන්න අපිට ඉඩ දෙන්න බැහැ.''

''එහෙනම් උඹලා මගේ බලයට බිය වේව්!'' ඇනබෙත් පැවසුවාය. ''මට උඹේ පූජනීය කුටිය විනාශ කරන්න පුළුවන් බව උඹට පිළිගන්න වෙයි.''

පැටර් රැව්වේය. ඔහු අපහසුවෙන් තම හිස්වැස්ම කෙළින් කළේය. තමා ඔහුව අසීරු තැනකට ඇද දැමූ බව ඇනබෙත් දැන සිටියාය. ඔහුට බියගුළුව පසු බැසීමට නොහැකිය.

''ඔබේ නරකම දේ කරන්න, ඇතීනාගේ දරුවෝ.''ඔහු තීරණය කළේය. ''කිසිම කෙනෙකුට මිත්‍රාස්ගේ කුටිය බිමට සමතලා කරන්න බැහැ. විශේෂයෙන්ම තනි පහරකින්. විශේෂයෙන්ම කෙල්ලෙකුට බැහැ.''

ඇනබෙත් තම කිණිස්ස එසවූවාය. සිවිලිම වූයේ පහතිනි. ඇයට පහසුවෙන් මුදුන්ගලට සමීප වීමට හැකි වුවත්, ඇය තම එකම පහර නිවැරදිව එල්ල කළ යුතු විය.

ඇගේ පිටුපසින් වූ දොරටුව අවහිර වී තිබුණත්, සෛද්ධාන්තිකව කාමරය කඩා වැටීමට පටන්ගත් විට, එහි ගඩොල් බුරුල් වී ගැලවී යනු ඇත. සම්පූර්ණ සිවිලිම කඩා වැටීමට පෙර ඇය එතැනින් පිට විය යුතුය. සැබැවින්ම ගඩොල් බිත්තියට එපිටින් ඝන පොළොව හැර යමක් තිබෙනු ඇතැයි ඇය බලාපොරොත්තු වූවාය. ඒ සඳහා ඇයට ප්‍රමාණවත් වේගයත්, ශක්තියත් වාසනාවත් තිබේදැයි ඇය අනුමාන කළාය. එසේ නොවුණොත් ඇයව උපදෙව් පෑන් කේක් එකක් වනු ඇත.

''හොඳයි, කොල්ලනේ.'' ඇය පැවසුවාය. ''ඔයාල වැරදි උප දෙවියෙක්ව තෝරගෙන තියෙන බවයි පේන්නේ.''

ඇය මුදුන් ගලට පහර දුන්නාය. දිව්‍යමය ලෝකඩ තලය සීනි කැටයක් තරම් පහසුවෙන් එය කපා දැමුවේය. මොහොතක් ගතවන තුරු කිසිවක් සිදු නොවීය.

''හා!'' පැටර් සරදම් කළේය. ''ඔයා දැක්කද?'' ඇතීනාට මෙතන බලයක් නැහැ.''

කාමරය දෙදරුවේය. සිවිලිම පුරා බිඳුම් හඬක් පැතිර ගිය අතර පැටර්ව සහ අල්තාරය මිහිදන් කරමින් එහි ඇත අන්තය කඩා වැටිණි. පැලුම් තවත් පැතිර ගියේය. ආරුක්කුවල ගඩොල් ගැලවී වැටෙන්නට විය. භූතයෝ කෑ ගසමින් දිය ගියහ. එහෙත් ඔවුන්ට බිත්තිවලින් පිටතට යාමට හැකි බවක් නොපෙනුණි. මරණයෙන් පසුවත් ඔවුන්ව මෙම කුටිය තුළටම බන්ධනය කර ඇති බව පෙනී ගියේය.

ඇනබෙත් ආපසු හැරුණාය. ඇය තමාට හැකි උපරිම වෙර යොදා ගඩොල් බිත්තියට ගැසුවාය. ගඩොල් ගැලවී ඉවතට විසි විය. මිත්‍රාස්ගේ කුටිය ඇගේ පිටුපසින් කඩා වැටෙද්දී, ඇය අන්ධකාරයට ප්‍රවේශ වූවාය. තමා ඇද වැටෙන බව ඇයට දැනිණි.

# 35
# ඇනබෙත්

ඇනබෙත් සිතුවේ වේදනාව කුමක්දැයි තමා දන්නා බවය. ඇය අර්ධ ලෝහිත කඳවුරේ ලාවා බැම්මෙන් බිමට වැටී තිබුණාය. විලියම්ස්බර්ග් පාලම මතදී විෂ පෙවූ පිහි තලයකින් තුවාල ලැබුවාය. අහසේ බර පවා ඇය තම දෙවුර මත තබාගෙන සිටියාය.

එහෙත් විලුඹ පොළොවේ ගැටෙන සේ බිම පතිත වීම ඒ කිසිවෙක් සමග සැසඳීමට නොහැකි විය.

විලුඹ බිඳී ගිය බව ඇය ඉක්මනින්ම දැන ගත්තාය. උණුසුම් වානේ රැහැනක් ඇගේ දෙපාවල එතු කළෙක මෙන් වේදනාව දැනිණි.

ඇය මුළුමනින්ම ක්ලාන්ත වූවාය. හිස කරකැවෙන්නට විය. ඇගේ හුස්ම ගැනීම කෙටි සහ වේගවත් විය.

නෑ, ඇය තමාටම කියා ගත්තාය. ඔයා කම්පනයට පත් වෙන්න බැහැ.

ඇය තවත් සෙමින් හුස්ම ගැනීමට උත්සාහ කළාය. වේදනාව සමනය වනතුරු ඇය නිසොල්මන්ව වැතිර සිටියාය. ඇයට කෑ ගසා හඬන්නට සිත් විය.

ඇය තම හැඟීම් බලෙන්ම යටපත් කර ගත්තාය. කඳවුරේදී මෙවැනි සියලු ආකාරයේ නරක තත්ත්වයන්ගෙන්, මෙවැනි තුවාලද ඇතුළුව, දිවි රැක ගැනීමට ඇය පුහුණුව ලබා තිබුණාය.

ඇය වටපිට බැලුවාය. ඇගේ කිණිස්ස අඩි කීපයක් ඈතින් බිම වැටී තිබිණි. එහි මන්දාලෝකයෙන් ඇයට තමා සිටි කුටියේ විස්තර හඳුනාගත හැකි විය. ඇය වැතිර සිටියේ හුණුගල් කුට්ටිවලින් සැදුණු සීතල පොළොවකය. සිවිලිම තට්ටු දෙකක් තරම් උස් විය. ඇය ඇද වැටුණු දොරටුව පිහිටා තිබුණේ බිම සිට අඩි දහයක් පමණ ඉහළිනි. අල්තාරය සහිත කුටිය කඩා වැටුණු පසු එහි සුන්බුන්වලින් එම දොරටුව සම්පූර්ණයෙන්ම අවහිර වී තිබිණි. ඇගේ අවට පරණ ලී කැබලි විසිරී තිබිණි. සමහර ඒවා පුපුරා වියළී ගොස් තිබුණු අතර තවත් ඒවා දිරා ගොස් තිබිණි.

*මෝඩි,* ඇය තමාටම දොස් පවරා ගත්තාය. ඇය එම දොරටුවෙන් පැන්නේ ඊට එපිටින් ඒ මට්ටමේම කොරිඩෝවක් හෝ වෙනත් කාමරයක් ඇතැයි සිතමිනි. එහෙත් ඇය බිම පතිත වූවා විනා ඇයට එවැන්නක් හමු වූයේ නැත. දිරා කැබලි කලකට ඉහත විනාශ වී ගිය පිටගැට පෙළක ශේෂ කොටස් බව පෙනී ගියේය.

ඇය තම විලුඹ පරීක්ෂා කර බැලුවාය. ඇගේ පාදයෙහි එතරම් අමුතු නැමීමක් දක්නට නොලැබිණි. ඇගේ පතුල් තිබෙන බව දැනිණි. කිසිදු ආකාරයක ලේ ගැලීමක් ද නොතිබිණි. සියල්ලම හොඳින් තිබුණේය.

ඇය දිරා කැබැල්ලකට සමීප වූවාය. ඒ සුළු චලනය පවා ඇයට කෑ ගසන තරමට වේදනාවක් ගෙන ආවේය.

පළල් දිරා කැබැල්ලක් ඇගේ අතට පත් විය. ඒ දිරාය සියවස් ගණනාවක් හෝ සමහරවිට සහශ්‍රයක් තරම් පැරණි බව පෙනිණි. මේ කුටිය මිත්‍රාස්ගේ පූජාසනය තරම් පැරණි දැයි කියා දැනගැනීමට ක්‍රමයක් ඇයට නොතිබිණි. නැතිනම් වංකගිරිය මෙන්- කාමරත් යුග ගණනාවක් පුරා අහඹු ලෙස අවුල් ජාලයක් බවට පත් වී තිබුණා විය යුතුය.

''හරි.'' තමාටම තම හඬ ඇසෙනු පිණිස ඇය හඬ නඟා පැවසුවාය. ''හිතන්න ඇනබෙත්, ප්‍රමුඛත්වය දෙන්න.''

කඳවුරේදී ග්‍රෝවර් විසින් ඉගැන්වූ වනයේදී දිවි රැක ගැනීමේ මෝඩ පාඨමාලාව ඇගේ මතකයට නැගිණි. අඩුම වශයෙන් ඒ කාලයේ එය පෙනුණේ මෝඩ වැඩක් ලෙසය. පළමු පියවරඃ හදිසි තර්ජනයන් දැන ගැනීමට ඔබේ අවට පරීක්ෂා කරන්න.

මේ කුටියට කඩා වැටීමේ අවදානමක් ඇති බව නොපෙනුණි. පාෂාණ කඩා වැටීම නැවතී තිබිණි. බිත්ති ඝන කළුගලින් නිමවා

තිබු අතර විශාල පැලුම් හෝ ඉරිතැලීම් කිසිවක් ඇයට දක ගැනීමට නොහැකි විය. සිවිලිම එල්ලා වැටෙන්නේ නැත. *හොඳයි.*

එකම පිටවුම් මග වූයේ ඈත බිත්තියේ වූ අඳුරට විවර වූ දොරටුවයි. ඇයත්, දොරටුවත් අතර, ගඩොලින් කළ කුඩා අගලක් පොළොව හරහා කැපී ගොස් තිබිණි. එයින් කාමරයේ වමේ පිට දකුණට ජලය ගලා ගියේය. මේ වතුර බොන්න පුළුවන් නම්, එයත් හොඳ දෙයකි.

එක් කෙළවරක ගොඩ ගසා තිබුණේ බිඳී ගිය මැටි බඳුන්ය. විසිරුනු දුඹුරු පැහැති ඒවා කලෙක පලතුරු ලෙස තිබෙන්නට ඇති බව පෙනිණි. තවත් කෙළවරක වූ දැව පෙට්ටි එතරම් ස්පර්ශය නොලද ඒවා බව පෙනිණි. සමහර වේවැල් පෙට්ටි හම් පටි වලින් බැඳ දමා තිබිණි.

''එහෙනම්, හදිසි අනතුරක් නැහැ.'' ඇය තමාටම කියා ගත්තාය. ''අර අඳුරු උමග ඇතුළෙන් කවුරු හරි පෙරලිලා ආවෙ නැත්නම් මිස.''

ඇය දොරටුව දෙස බැලුවාය. කිසිවක් සිදු නොවුණි. ''හරි.'' ඇය පැවසුවාය. ''ඊළඟ පියවරඃ බඩු සටහනක් ගන්න.''

ඇයට පාවිච්චි කළ හැක්කේ මොනවද? ඇය ළඟ වතුර බෝතලයක් තිබිණි. ඇයට ළඟා විය හැකි නම් අගලේ තවත් ජලය තිබුණේය. ඇගේ පිහිය තිබිණි. ඇගේ ගමන් මල්ලේ වර්ණවත් නූල් ද ලැප්ටොප් පරිගණකය, ලෝකඩ සිතියම, ගිනි කූරු ස්වල්පයක් සහ හදිසි අවස්ථාවට අමෘතයද බහා තිබිණි.

ආහ්... ඔව් මෙය හදිසි අවස්ථාවක් ලෙස සැලකීම සුදුසුය. ඇය දිව්‍යමය ආහාරය ගෙන එය බිමින් තැබුවාය. සුපුරුදු ලෙසම එය සුවදායී මතකයන් මෙන් රසවත් විය.

අමෘතය ඇගේ මුළු සිරුරම ප්‍රාණවත් කිරීමට සමත් විය. ඇගේ පාදයේ වූ වේදනාව සමනය විය. තම තවමත් සිටින්නේ විශාල ගැටළුවක බව ඇනබෙත් දැන සිටියාය. අමෘතයෙන් පවා බිඳුණු අස්ථි ඒ මොහොතේම සුවපත් කළ නොහැකිය. එයින් ක්‍රියාකාරිත්වය වේගවත් වනු ඇති නමුත්, ඇයට දිනක් හෝ දින කීපයක් යනතුරු තම පය මතට කිසිදු බරක් යෙදවීමට නොහැකි වනු ඇත.

ඇය තම පිහිය වෙත ළං වීමට උත්සාහ කළත් එය තිබුණේ බොහෝ ඈතිනි. ඇය එදෙසට ගමන් කළාය. වේදනාව නැවත ගත

වෙලාගත්තේය. ඇයට දැනුණේ හරියට තම නියපොතු යටි පතුල විනිවිද යනවා වැනි වේදනාවකි. ඇගේ මුහුණ දහදියෙන් පෙඟී ගියේය. එහෙත් තවත් දුරක් ඇවිද යාමෙන් ඇයට කිණිස්ස වෙත ළඟා වීමට හැකි විය.

එය අල්ලා ගැනීමත් සමඟ ඇයට හොඳ හැඟීමක් දැනිණි. ඒ ආලෝකය ලබා ගැනීම සහ ආරක්ෂාව නිසාම පමණක් නොව එය එතරම් හුරුපුරුදු ද නිසාය.

*ඊළඟට මොකක්ද?* ග්‍රැවල්ගේ දිවි රැක ගැනීමේ පන්තියේ - සිටි තැනම සිට ගලවා ගැනීමට එනතෙක් රැඳී සිටීම වැනි යමක් සඳහන් කළේය. එහෙත් එය සිදුවිය නොහැක්කකි. කෙසේ හෝ ඇගේ පියවර අල්ලා ගැනීමට හැකිවුවත් පර්සිට පවා ඇය වෙත පැමිණීමට නොහැකිය. ඒ මිත්‍රාස්ගේ කුටිය කඩා වැටී ඇති හෙයිනි.

ඇය ඩායිඩාලුස්ගේ පරිගණකය හරහා යමෙකු සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ යුතුය. එහෙත් මෙවැනි භූගත ස්ථානයක ඒ සඳහා ප්‍රමාණවත් සංඥා තිබේදැයි ඇයට වූයේ සැකයකි. අනෙක් අතට ඇය කාව අමතන්නද? උදව් ලබා ගැනීමට තරම් සමීප කිසිවෙකුට පණිවුඩ යැවීමට ඇයට නොහැකිය. උප දෙවිවරු කිසිවිටෙක ජංගම දුරකථනය රැගෙන නොයති. ඔවුන්ගේ සංඥා මඟින් ඕනෑවටත් වඩා රාක්ෂයින් ආකර්ෂණය වීමත්, ඇගේ මිතුරන් කිසිවෙකුට තම විද්‍යුත් තැපැල පරීක්ෂා කිරීමට හැකියාවක් නොතිබීමත් එයට හේතුව විය.

අයිරිස්- පණිවුඩයක්? ඇය සතුව ජලය තිබුණත්, දේදුන්නක් සඳහා ප්‍රමාණවත් තරම් ආලෝකයක් තිබේද යන්න ඇයට සැක සහිත විය. ඇය සතුව තිබූ එකම කාසිය වූයේ ඇගේ රිදී ඇතීනියානු ඩ්‍රැච්මාවයි. එය එතරම් විශිෂ්ට පඬුරක් නොවීය.

උදව් පතා ඇමතීමට තවත් ගැටලුවක් තිබිණි. මෙය සැලකුණේ ඒකල ගවේෂණයක් ලෙසිණි. ඇනබෙත්ව බේරා ගැනුණොත්, එය ඇය පරාජය වූවා සේ සැලකීමකි. ඇතීනාගේ සලකුණ තවදුරටත් තමන්ට මඟ නොපෙන්වන බව ඇනබෙත්ට පෙනී ගියාය. සදාකල්හිම ඇයට මෙහි සිටීමට සිදුවනු ඇත. එසේම ඇයට ඇතීනා ප්‍රතිමාව කිසිදා සොයා ගැනීමට නොහැකි වනු ඇත.

එබැවින්... සිටිතැන හිඳිමින්, උදව් ලැබෙන තුරු බලා සිටීම හොඳ අදහසක් නොවීය. එහි අර්ථය වූයේ ඇය තනිවම ගමන් කිරීමට මඟක් සොයාගත යුතු බවයි.

ඇය තම ජල බෝතලය විවර කර පානය කළාය. තමා කෙතරම් පිපාසයෙන් සිටියේද යන්න ඇයට අවබෝධ වී නොතිබිණි. ජල බෝතලය හිස් වෙද්දී ඇය ඇළ මාර්ගයට පැමිණ එය නැවත පුරවා ගත්තාය.

ජලය සිසිල් වූ අතර සෙමින් ගලා ගියේය. එය පානයට සුදුසු තත්ත්වයේ පවතින බවට එය හොඳ ලකුණක් විය. බෝතලය ජලයෙන් පුරවාගත් පසු දෑතට ජලය ස්වල්පයක් ගෙන ඉන් මුහුණ සෝදා ගත්තාය. සැනෙකින් ඇයට වඩාත් පරීක්ෂාකාරී බවක් දැනිණි. නැගී සිටි ඇනබෙත් තම විලුඹ දෙස බැලුවාය.

''ඔයාට කැඩෙන්නයි තිබුණේ.'' ඇය එයට දොස් පැවරුවාය. විලුඹ පිළිතුරු නොදුන්නේය.

තම කිණිස්ස ඔසවා ගත් ඇය නැවත වරක් එහි ආලෝකයෙන් කාමරය පරීක්ෂා කළාය. දැන් ඇය සිටින්නේ විවෘත දොරටුවට සමීපවය. එය අඳුරු නිහඬ කොරිඩෝවකට යොමු වී තිබිණි. වාතය හිස කරකවන ගන්ධයකින් යුක්ත විය. අවාසනාවකට ඇනබෙත්ට යා හැකි වෙනත් කිසිදු මගක් නොතිබිණි.

කොර ගසමින්, දෑසින් කඳුළු වගුරවමින් ඇය පියගැට පෙළේ සුන්බුන් වෙත පැමිණියාය. ඇයට එතැනින් තරමක් හොඳ හැඩයෙන් යුත්, ප්‍රමාණවත් දිගකින් යුත් ලී කැබලි දෙකක් සොයාගැනීමට හැකි විය. ඉන්පසු වේවැල් පෙට්ටි අසලට ගිය ඇය තම පිහියෙන් එහි සම් පටි කපා දමුවාය.

මනසින් තම විලුඹේ වේදනාව අක්‍රිය කිරීමට උත්සාහ දරණ අතරතුර ඇයට එක් ලී පෙට්ටියක සටහන් කර තිබූ වියැකී ගිය වචන පෙළක් දිස්විය. HERMES EXPRESS.

ඇනබෙත් කලබලයෙන් පෙට්ටිය දෙසට ගියාය.

එය මෙතැන කුමක් කරන්නේදැයි යන්න ගැන ඇයට අදහසක් නොතිබුණත් දෙවියන්ට, ආත්මවලට සහ උපදෙව්වරුන්ට පවා සියලු ප්‍රයෝජනවත් දෑ බෙදාහරිනු ලබන්නේ හර්මීස් බව ඇය දැන සිටියාය. සමහරවිට තමා වැනි මෙවැනි ගවේෂණයක යෙදෙන උපදෙව්වරුන් වෙනුවෙන් ඔහු වසර ගණනකට පෙර මේවා මෙහි ගෙනැවිත් තැබුවා විය හැකිය.

ඇය පෙට්ටිය විවර කළ බුබුළු දවටන කීපයක්ම පිටතට ඇද දැමුවත්, එහි තිබුණේ මොනවා වුවත්, දැන් ඒවා දක්නට නොතිබිණි.

''හර්මිස්!'' ඇය කෝපයෙන් පැවසුවාය.

ඇය කේන්තියෙන් බුබුළු දවටන දෙස බැලුවාය. එවිට ඇගේ මනසට යමක් වැටහිණි. ඒ දවටන ත්‍යාගයක් බව ඇයට අවබෝධ විය. ''ආහ්... ඒක නියමයි.''

ඇනබෙත් ඒ බුබුළු දවටන වලින් තම විලුඹ ඔතා ගත්තාය. එයට දැව පතුරු තැබූ ඇය හම් පටිවලින් තදින් ගැට ගැසුවාය.

වරෙක, ප්‍රථමාධාර පුහුණුවකදී ඇය වෙනත් අයකුගේ ව්‍යාජ බිඳුණු පාදයකට පතුරු තබා ගැට ගසා තිබුණාය. එහෙත් එය තමාගේ පාදයක් වෙනුවෙන් තමාටම කර ගැනීමට සිදුවෙතැයි ඇය කිසිවිටෙක නොසිතුවාය.

එය අසීරු, වේදනාකාරී කටයුත්තක් වුවත්, අවසානයේ එය සාර්ථක විය. ඇය නැවත දැව සුන්බුන් ගොඩ පරීක්ෂා කර අඩි හතරක් පමණ දිග ලී දඬුවක් සොයා ගත්තේ කිහිලිකරුවක් ලෙස යොදා ගැනීම සඳහාය. බිත්තියට පිට දුන් ඇය තම හොඳ පාදයට බරදී සෙමින් නැගිට්ටාය.

වේදනාවක් දැනුණත් ඇයට කෙලින් සිටීමට හැකිවිය.

''ඊළඟ වතාවේ,'' ඇය අඳුරු කාමරයට මිමිණුවාය. ''මට සටන් කරන්න රාක්ෂයෙක්ව තියන්න. ඒක ලේසියි.''

විවෘත දොරටුවට ඉහළින්, ආරුක්කුව මත නැවත වතාවක් ඇතීනාගේ සලකුණ දිලිසෙන්නට පටන් ගත්තේය.

ගිනි පැහැ බකමූණා අපේක්ෂා සහගතව ඇය දෙස බලා සිටින බව පෙනිණි. *වෙලාවක් නැහැ. ඔයාට ඕනෙ රාක්ෂයෙක්ද? මේ පැත්තට* එන්න යනුවෙන් එයින් කියැවෙන බව පෙනිණි.

මේ ගිනි ගන්නා සලකුණ සැබෑ පූජනීය බකමූණා මත පදනම් වූවක් දැයි ඇනබෙත් පුදුම විය. එය එසේ නම්, ඇයගේ දිවි රැකුණොත්, ඇය මේ බකමූණා සොයා ගොස් උගේ මූණට දෙකක් අනිනු ඇත.

ඒ සිතුවිල්ල ඇගේ ආත්මය නැංවීමට සමත් විය. අගල හරහා පැන ඇය සෙමින් කොරිඩෝවට ඇතුළු වූවාය.

# 36
# ඇනබෙත්

උමඟ සුමටව සහ ඍජුව විහිදී තිබුණත්, ඇගේ ඇද වැටීමෙන් පසු කිසිදු අවස්ථාවක් නොදීමට ඇනබෙත් තීරණය කළාය. ආධාරකයක් ලෙස බිත්තිය යොදා ගනිමින් ඉදිරියට ඇදුණු ඇය තමා ඉදිරිපිට පොළොවට කිහිලිකරුවෙන් තට්ටු කළේ උගුල් නැති බව සැක හැර දැන ගැනීමටය.

ඇය ඇවිද යද්දී, දුර්වල අම්බිරි ගන්ධය වඩාත් ප්‍රබලව නැගී එමින් ඇගේ ස්නායු උත්තේජනය කළේය. ගලා යන ජලයේ හඬ ඇගේ පිටුපසින් වියැකී යමින් තිබිණි. කුඩා හඬවල් මිලියන ගණනක කෙඳිරීමක් වැනි කටුක සමූහ ගායනයක් ඒ තැන ගත්තේය. ඒවා බිත්ති ඇතුළතින් එන බව පෙනී ගිය අතර, එන්න එන්නම වඩා උස්ව නැගෙන්නට විය.

ඇනබෙත් වේගය වැඩි කිරීමට උත්සාහ කළාය. එහෙත් සමබරතාවය රඳවාගෙන සහ බිඳුනු විලුඹේ වේදනාවත් සමඟ ඇයට එතරම් වේගයෙන් ගමන් කිරීමට නොහැකි විය. යමක් තමා ලුහුබඳින බව ඒත්තු ගනිමින් ඇය කොර ගසමින් ඉදිරියට ඇඳුණාය. කුඩා හඬවල් එක්ව විශාල හඬක් බවට පත්වෙමින් ටිකෙන් ටික ළං වෙමින් තිබුණේය.

ඇය බිත්තිය ස්පර්ශ කළාය. ඇගේ දෑත් මකුළු දැල්වලින් වැසී ගියේය.

ඇයට කෑ ගැසුණාය. ඊළඟට කෑ ගැසීම ගැන තමාටම සාප කර ගත්තාය.

*ඒක මකුළු දැලක් විතරයි,* ඇය තමාටම කියා ගත්තාය. එහෙත් එයින් ඇගේ කන් තුළ නැගෙන ගර්ජනාව නතර නොවීය.

ඇය මකුළුවන්ව බලාපොරොත්තු වූවාය. ඉදිරියෙන් ඇත්තේ කුමක්දැයි ඇය දැන සිටියාය. *වියන්නිය, ස්වාමි දුව, අඳුරෙන් නැගුණු හඬ.* එහෙත් තමා කෙතරම් සමීපව සිටින්නේද යන්න මකුළු දැල්වලින් ඇයට අවබෝධ විය.

ඇය ඒවා ගල්මත පිස දමන විට අගේ දැත් වෙව්ලන්නට විය. *ඇය කුමක් සිතමින් සිටින්නේද?* ඇයට මේ ගවේෂණය තනිව සිදු කළ නොහැකිය. *ප්‍රමාද වැඩියි.* ඇය තමාටම පවසා ගත්තාය. දිගටම යන්න.

වේදනාකාරී පියවර බැගින් ඇය කොරිඩෝවේ ඉදිරියට ගමන් කළාය. ඇගේ පිටුපසින් කෙඳිරුම් හඬ උස්ව ඇසෙන්නට විය. අනතුරුව එය සුළඟට සෙලවෙන වියළි පත්‍ර මිලියන ගණනාවකින් නැගෙන්නා වැනි හඬක් බවට පත් විය. මකුළු දැල් වඩාත් ඝන වෙමින්, උමඟ වසා ගෙන තිබිණි. ඉක්මනින්ම ඇයට ඒවා තම මුහුණෙන් ඉවත් කිරීමට සිදු විය. දැල් තිරයක් මෙන් ඇයව වසාගෙන තිබූ මකුළු දැල් ඉරා දැමීමට සිදුවිය.

ළයෙන් හදවත එළියට පනින තරමට එහි ගැස්ම වැඩි විය. ඇයට දුවන්නට ඕනෑ විය. ඇය තම විලුඹේ වේදනාව අමතක කරමින් තවත් වේගයෙන් ඉදිරියට ගාටන්නට වූවාය.

අවසානයේ දොරටුවකින් කොරිඩෝව අවසන් විය. ඉණ දක්වා උසැති පරණ දැව ගොඩකින් දොරටුව අවහිර කර තිබිණි. යමෙකු දොරටුවට බාධකයක් දැමීමට උත්සාහ කර ඇති බවක් පෙනී ගියේය. එය හොඳින් සවිකර නොතිබුනෙන් ඇනබෙත් තම කිහිලි කරුවෙන්, තමාට හැකි තරම් ලෑලි ඉවතට තල්ලු කර දැමුවාය. ඉතිරි වූ ලෑල්ල මතින් ඇය දොරටුවෙන් ඇතුළු වූයේ තවත් කුඩා ලී කැබලි දුසිම් ගණනක් තම නිදහස් අතින් ඉවත් කරමිනි.

බාධකයට අනෙක් පැත්තේ වූ කුටිය පැසිපන්දු පිටියක් තරම් විශාල විය. ගෙබිම රෝම මොසැයික් වලින් සරසා තිබිණි. දළ රෙදි වල අවශේෂ බිත්තිවල එල්ලී තිබිණි. පන්දම් දෙකක් දෙපස වූ බිත්තිවල පන්දම් රඳවනවල රඳවා තිබිණි. ඒ දෙකම මකුළු දැල්වලින් වැසී ගොස් තිබිණි.

කාමරයේ ඈත අන්තයේ, ඇතීනාගේ සලකුණ තවත් දොරටුවක් මත දිලිසෙමින් තිබිණි. අවාසනාවකට ඇනබෙත් සහ පිටවීමේ දොරටුව අතර ගෙබිම අඩි පණහක් පමණ වූ විවරයකින් දෙකට බෙදී තිබිණි. විවරයේ හරහට එකිනෙකා සමන්තරව පිහිටන සේ දැව බාල්ක දෙකක් යොදා තිබුණත්, දෙපා තැබීමට නොහැකි තරමට ඒවා එකිනෙකට ඇතින් පිහිටා තිබුණේය. එසේම එක් එක් බාල්කය බෙහෙවින් පටු වූ බැවින් ඇනබෙත් කරණම්කාරියක නොවුණහොත් මිස ඒ මතින් ඇවිද යාමට නොහැකි විය.

ඇය පැමිණි කොරිඩෝව පිඟින හඬවල් වලින් පිරී තිබිණි. මුල්ම මකුළුවන් පැමිණෙන විට, මකුළු දැල් නලියන්නට විය. මැලියම් බිංදුවකට වඩා විශාල නොවුණත්. කළු මහත මකුළුවෝ බිත්ති සහ පොළොව මතින් ඇදී ආහ.

*මොන ජාතියෙ මකුළුවොද?* ඇනබෙත් අදහසක් නොතිබිණි. ඇය දැන සිටි එකම දෙය වූයේ ඔවුන් තමන් සොයා පැමිණෙන බව පමණකි. සැලසුම් සිතා බැලීමට ඇයට තිබුණේ තත්පර කීපයකි.

ඇනබෙත්ට ඉකි ගසා හැඬීමට වුවමනා වූවාය. යමෙකු, ඕනෑම කෙනෙකු ඇය වෙනුවෙන් මෙහි සිටිනු දැකීමට ඇයට වුවමනා විය. ගිනි විහිදුවීමේ කුසලතා ඇති ලියෝව ඇයට ඕනෑ විය, නැතිනම් අකුණු මැවිය හැකි ජේසන්ව ඇයට ඕනෑ විය. නැතිනම් උමඟ බිඳ දැමිය හැකි හේසාල්ව වුවමනා විය. ඒ සියල්ලටම වඩා ඇයට පර්සි වුවමනා විය. පර්සි ඇය සමඟ සිටින සැමවිටම ඇයට නිර්භීත හැඟීමක් දැනිණි.

*මම මෙතන මැරෙන්නෙ නැහැ,* ඇය තමාටම පවසා ගත්තාය. මම ආපහු පර්සිව බලන්න යනවා.

මුල්ම මකුළුවෝ දොරටුව අභියසට පැමිණ සිටියහ. ඔවුන්ට පිටුපසින් මකුළු හමුදාවක්ම විය.

එක් බිත්තියක පහන් රඳවනයක් වෙත ගැටු ඇනබෙත් පන්දමක් ගලවා ගත්තාය. දැල්වීම පහසු කිරීමට එහි කෙළවරක ගල්තාර ගල්වා තිබිණි. තම ගමන් මල්ලෙන් ගිනි පෙට්ටිය ගත් ඇය පන්දම දැල් වූවාය.

ඇය එය බාධකය මතට විසි කළාය. පැරණි වියළි දැව ඉක්මනින්ම ගිනි ගත්තේය. මකුළු දැල්වලට පැනගත් ගිනි දළු කොරිඩෝව තුළ ප්‍රබල ගිනි ජාලාවක් ඇති කළේ දහස් ගණනක් මකුළුවන් පුළුස්සා දමමිනි.

ඇනබෙත් තම ගිනි මැලයෙන් පසෙකට වූවාය. ඇය තමාට යම් කාලයක් ලබා ගෙන තිබිණි. එහෙත් තමා සියලු මකුළුවන් මරා

දැමුවේදැයි ඇයට වූයේ සැකයකි. ගින්න නිවී ගිය වහාම, ඔවුන් නැවත එක්වී ආපසු එනු ඇත.

ඇය විවරයේ අද්දරට ගියාය.

ඇයට තම ආලෝකයෙන් වළ ඇතුළත දැකගත හැකි විය. එහෙත් එහි පතුල නොපෙනුණි. එයට පැනීම දිවි නසා ගැනීමක් වනු ඇත. අත් වලින් බාල්කයක එල්ලී අනෙක් පැත්තට යාමට උත්සාහ කළ හැකිය. එහෙත් තම දෑත්වල ශක්තිය ගැන ඇයට විශ්වාසය තැබීමට නොහැකි විය. එසේම ගමන් මල්ල පිටේ එල්ලාගෙන, බිඳුණු පාදයත් සමඟ අනෙක් පැත්තට ළඟා වීම කළ නොහැක්කක් බව ඇයට පෙනී ගියේය.

ඇය පහත් වී බාල්කය පරීක්ෂා කළාය. ඒ එක එකක ඇතුළතින් අඩියක පරතරය සහිතව යකඩ කොකු සවිකර තිබිණි. සමහරවිට පාලමක මෙන් මෙහි දෙපස අත් වැටක් සවිකර තිබෙන්නට ඇත. මැද දැව කොටස් ඉවත් කර හෝ විනාශ වී තිබුණා විය හැකිය. එහෙත් යකඩ කොකු? ඒවා ආධාරක ලෑලි සඳහා විය නොහැකිය. ඒවා වඩාත්ම-

ඇය බිත්ති දෙසට හිස හැරවූවාය. දළ තිර රෙදි එල්ලීමට යොදා ගෙන තිබුණේද ඒ ආකාරයේම කොකුය.

ලෑලි යොදාගෙන තිබුණේ පාලමක් ලෙස නොවන බව ඇයට අවබෝධ විය. ඒවා යම් ආකාරයක රෙදි විවීමේ යන්ත්‍රයකි.

ඇනබෙත් තම පන්දම විවරයේ අනෙක් අන්තයට විසි කළාය. තම සැලැස්ම සාර්ථක වෙතැයි විශ්වාසයක් ඇය තුළ නොතිබුණත්, ඇය තම ගමන් මල්ලේ තිබූ සියලු නූල් පිටතට ගෙන බාල්ක දෙක අතර බළලාගේ තොටිල්ලේ රටාවට කොකු සම්බන්ධ වනසේ පෙළින් පෙළ වියන්නට පටන් ගත්තාය.

ඇගේ දෑත් වේගයෙන් ක්‍රියාත්මක විය. තම කාර්යය ගැන සිතීම නතර කළ ඇය, එය කරගෙන යාමට පමණක් අවධානය යොමු කළාය. ටිකෙන් ටික ඇගේ දැල වළ මතින් දිගු වන්නට විය.

ඇය තම පාදයේ වේදනාව මෙන්ම ඇයට පිටුපසින් දැල්වෙන බාධකය ගැනද අමතක කළාය. අඟලින් අඟල ඇය විවරය මතින් අනෙක් පැත්තට ළං වෙමින් සිටියාය. වියමන ඇගේ බර දරා සිටියේය. ඇයට එය මතක් වීමටත් පෙර ඇය විවරය මතින් අඩක් දුර ගමන් කර තිබිණි.

ඇය මෙය කිරීමට ඉගෙන ගත්තේ කෙසේද?

*ඒ ඇතීනාගෙන්,* ඇය තමාටම පවසා ගත්තාය. *අත්කම් ගැන මගේ අම්මට තිබුණ කුසලතාව.* මේ වනතෙක් විවීමේ ඇති විශේෂිත ප්‍රයෝජනයක් ගැන ඇනෙබෙත්ට වැටහීමක් නොතිබිණි.

ඇය හිස හරවා පිටුපස බැලුවාය. බාධකයේ ගින්න නිවී යමින් තිබිණි. දොරටුව අද්දර මකුළුවන් කීප දෙනෙක් නලියමින් සිටියහ. බලාපොරොත්තු සුන් වීමෙන් ඇය දිගටම විවීම කරගෙන ගියාය. අවසානයේ ඇයට එතෙර වීමට හැකි විය. එහා පැත්තේ තිබූ පන්දම අහුලා ගත් ඇය, එය තමා වියන ලද දැලපාලම මතට විසි කළාය. සැනෙකින් එය ගින්නට හසු විය. කළින් තෙල්වල පොඟවා තිබුණාක් මෙන් පරාල පවා ගිනි ගත්තේය.

මොහොතකට, පාලම දැවී ගියේ පැහැදිලි රටාවකටය. බකමූණන්ට සර්වසම හැඩයකටය. ඇනබෙත් ඇත්තටම ඔවුන්ව තම වියමනේ වියා තිබුණාද, නැතහොත් එය යම් අකාරයක මායාවක්ද? ඇය දැන නොසිටියත්, මකුළුවන් එය හරහා ඒමට උත්සාහ දරත්ම, බාල්ක බිඳී ගොස් වළ තුළට ඇද වැටිණි.

ඇනබෙත් හුස්ම අල්ලා ගත්තාය. සිවිලීමට හෝ බිත්ති මතට නැඟී මකුළුවන් ඇයව හඹා නොඑන්නේ මන්දැයි යන්නට කිසිදු හේතුවක් ඇයට සිතා ගැනීමට නොහැකි විය. ඔවුන් එය කරන්නට පටන් ගතහොත් ඇයට දිව යාමට සිදු වේ. එසේම තමාට එතරම් වේගයෙන් ගමන් කිරීමට නොහැකි බව ඇයට හොඳටම විශ්වාසය.

යම් හේතුවක් නිසා මකුළුවන්, ලුහුබැන්දේ නැත. ඔවුහු විවරයේ ගැටියේ රොක් වී සිටියහ. ඉන්පසු අපේක්ෂා සුන් වීමෙන්, නැවත ගිනිගත් කොරිඩෝවට හැරී ගියහ. තවදුරටත් ඔවුන්ට ඇනබෙත් කෙරෙහි කැමැත්තක් නොමැති බව පෙනී ගියේය.

''එහෙම නැත්නම් මම පරීක්ෂණය සමත් ඇති.'' ඇය හඬ නඟා පැවසුවාය.

ඇගේ පන්දම දැවී අවසන් වූ බැවින් තම කිණිස්සේ ආලෝකය පමණක් ඇයට ඉතිරි විය. තමා කිහිලිකරුව විවරය අනෙක් පැත්තේ දමා විත් ඇති බව ඇයට අවබෝධ විය.

ඇයට වෙහෙසක් දැනිණි. ප්‍රයෝග සියල්ල සිඳී ඇති බවක් දැනිණ. එහෙත් ඇගේ මනස පැහැදිලිව තිබිණි. වියන ලද පාලමක් සමඟ ඇගේ බියද දැවී ගිය බව පෙනිණි.

*වියන්නිය, ඇය සිතුවාය. මම ළඟම ඇති. අඩුගානෙ ඉදිරියේ තියෙන්නෙ මොනවද කියලවත් මම දන්නවා.*

තම බිඳුණු කකුලට බර දරා ගැනීමට හැකි වෙතැයි අපේක්ෂාවෙන් ඇය ඊළඟ කොර්ඩෝවට පිවිසියාය.

ඇයට දුර යාමට අවශ්‍ය නොවීය.

අඩි විස්සකට පසු, උමඟ දේවස්ථානයක් තරම් විශාල ගුහාවකට විවෘත විය. එය කොතරම් මහේශාක්‍ය වීද යත් ඇනබෙත් දුටු සියල්ලක්ම ඇයට ගැටලුවක් විය. මේ පර්සි සිහිනයේදී දුටු කාමරය විය යුතුයැයි ඇය අනුමාන කළාය.  එහෙත් එය අඳුරින් යුක්ත නොවීය. කාමරය වටා පරිධියේ, ඔලිම්පස් කන්දේ දෙවිවරු භාවිත කරන්නා වැනි, මායා ආලෝකයක් විහිදුවන ලෝහමය ගිනි අඟුරු කබල් තබා තිබිණි. එසේම කාමරය වටා අලංකාර තිර රෙදි එල්ලා තිබිණි. ගල් පොළොව අයිස් කුට්ටි මෙන් සිරදූ වී තිබිණි. ඉතා උසින් තිබූ සිවිලිම තට්ටු පිට තට්ටු ලෙස බැඳී තිබූ මකුළු දැල් නිසා අඳුරේ ගිලී තිබුණේය.

කුලුනු තරම් ඝන සේද රැහැන් සිවිලිමේ සිට කාමරය පුරා විහිදී ගොස් බිත්තිවලට සහ පොළොවට සවි වී තිබුණේ එල්ලෙන වැල් පාලමක් මෙනි.

බියකරු ලෙස පූජාසනයේ මැද කොටස ද මකුළු දැල් වලින් වැසීගොස් තිබුණු බැවින් ඇනබෙත්ට දෑස් ඔසවා එදෙස බැලීම ගැටලුවක් විය. අපැහැදිලි ලෙස ඇය ඉදිරියේ දිස් වූයේ අඩි හතළිහක් උස දිදුලන ඇත්දළ සමකින් සහ රන් ඇඳුමින් යුත් ඇතීනාගෙග් ප්‍රතිමාවයි. ඇගේ දෙපසට විහිදුණු දෑත්වල , ඇතීනා නයික් ප්‍රතිමාවක් - පියාපත් සහිත ජයග්‍රහණයේ දෙවඟන- දරා සිටියාය. එතැනට ප්‍රතිමාව කුඩාවට දිස්වුවත්, එය සැබෑ පුද්ගලයකු තරම්ම උසින් යුක්ත විය. ඇගේ අනිත් අතේ වූයේ ප්‍රචාරණ පුවරුවක් තරම් වූ පලිහකි. ඇතීනාව ආරක්ෂා කිරීමට මෙන්, එය පිටුපසින් සර්පයකුගේ කැටයමක් දක්නට ලැබිණි.

දෙවඟනගේ මුහුණ ප්‍රසන්න සහ කාරුණික විය... එසේම එය ඇතීනා වැනි පෙනුමක් ගත්තේය. තම මවට කොහෙත්ම සමාන නොවන ප්‍රතිමා බොහෝමයක් ඇනබෙත් දැක තිබුණාය. එහෙත් වසර දහස් ගණනකට පෙර නිම කළ මේ යෝධ පිටපත දකින විට, එහි කලාකරුවා ඇතීනාව පෞද්ගලිකව හමු වී ඇතැයි ඇනබෙත්ට සිතිණි. ඔහු නියමාකාරයෙන් ඇයව හසුකරගෙන තිබිණි.

''ඇතීනා පාතිනොස්.'' ඇනබෙත් මිමිණුවාය. ''ඒක ඇත්තටම මෙහෙ.''

ඇගේ ජීවිතය පුරාම, ඇයට ඕනෑ කර තිබුණේ පාතිනන් වලට යාමටය. දැන් ඇය දකිමින් තිබෙන්නෙ එහි ප්‍රධාන ආකර්ෂණයයි. එසේම සහශ්‍ර ගණනාවකින් එසේ කළ ඇතීනාගේ පළමු දරුවා වන්නේ ද ඇයයි.

තම මුව විවර වී තිබෙන බව ඇයට අවබෝධ විය. ඇනබෙත්ට ප්‍රතිමාව දෙස බලාගෙන මුළු දවසම සිටගෙන සිටිය හැකි වුවත්, ඇය ඉටුකර තිබුණේ ඇගේ මෙහෙයුමෙන් අඩක් පමණි. ඇයට ඇතීනා පාතිනොස් හමු වී තිබේ. දැන්, ඇය මේ ගුහාවෙන් ගලවා ගන්නේ කෙසේද?

කම්බි දැල් වේදිකාවක් මෙන් මකුළු දැල්වලින් එය වැසී තිබිණි. මේ මකුළු දැල් නොමැති වුවා නම්, ප්‍රතිමාව මීට දිගු කළකට පෙර පොළොවට ඇද වැටෙන බව ඇය සිතුවාය. ඇය කාමරය තුළට පියවර තබන විට, පහළින් වූ පුළුල් පැලුම් ඇයට දැකගත හැකි විය. ඇගේ පාද ඒවා තුළට යාමට හැකියාව තිබිණි. පැලුම්වලට යටින් ඇයට අඳුර හැර වෙනත් කිසිවක් දැක ගැනීමට නොහැකි විය.

වෙව්ලීමක් ඇගේ ගත පුරා හමා ගියේය. *භාරකරුවා කොහේද?* පොළොව බිඳ වැටීම වළක්වා ගනිමින් ඇනබෙත් ප්‍රතිමාව නිදහස් කර ගන්නේ කෙසේද? ඇය පැමිණි කොරිඩෝවෙන් ඇතීනා පාතිනොස් තල්ලු කරගෙන යාමට නොහැකිය.

උදව්වක් ලබාගත හැකි යමක් දැක ගැනීමේ අටියෙන් ඇය ගුහාම පුරා නෙත් යැව්වාය. හදවත කලඹන අලංකාරයෙන් යුත් තිර රෙදි පුරා ඇගේ දෑස් දිව ගියේය. එකක වූයේ ගොපලු දර්ශනයකි. ත්‍රිමාණ වූ බැවින් එය ජනේලයක් විය හැකිය. තවත් එකක දෙවිවරු යෝධයන් සමඟ සටන් කරන දර්ශනයක් දක්විණි. ඇනබෙත්ට පාතාල ලෝකයේ හූ දර්ශනයක් දැකගත හැකි විය. ඊට යාබදව තිබුණේ නූතන රෝමය අහස් රේඛාවයි. එසේම ඇගේ වම්පසින් වූ තිර රෙද්ද-

ඇගේ හුස්ම සිරවිය. එය උප දෙවිවරුන් දෙදෙනෙක් දිය යට සිප ගන්නා සිතුවමකි. ඒ කඳවුරේ පාරු විලේදී යහළුවන් ඇනබෙත්ව සහ පර්සිව විලට ඇද දැමූ දිනයයි. වියන්නිය ජලයට ඔරොත්තු දෙන කැමරාවක් සහිතව එදින එතැන සිටියා දැයි ඇනබෙත් පුදුමයට පත්විය.

''ඒක කොහොමද වෙන්නේ?'' ඇය මිමිණුවාය.

ඇයට ඉහළින් වූ අන්ධකාරයෙන් හඬක් නැගිණි. ''ඔයා එන බව යුග ගාණක්ම මම දැනගෙන හිටියා, මගේ පැටියෝ.''

ඇනබෙත් වෙව්ලා ගියාය. ඒ හඬ පර්සි විස්තර කළ ආකාරයට සමාන විය. විවිධ තාන සහිත කෝපාන්විත පිඹීම. ගැහැනු හඬක් වුවත් මනුෂ්‍යකුගේ නොවේ.

ප්‍රතිමාවට ඉහළ මකුළු දැල් තුළින් යමක් සෙලවිණි- *යම් අඳුරු විශාල දෙයක්.*

''මම ඔයාව මගේ සිහිනවල දැකල තියෙනවා.'' හඬ පැවසුවේය. ''මට ඕනෙ වුණේ ඔයාගෙන් වැඩක් තියෙනවද කියන එක තහවුරු කර ගන්න. ඇතීනාගේ දරුවා මගෙ පරීක්ෂාවෙන්ගෙන් සමත් වන තරමට දක්ෂ ද සහ පණ පිටින් මෙතෙන්ට ළඟා වෙනවද බලන්න. කොහොමවුණත්, ඔයා තමයි ඇයගේ වඩාත් දක්ෂතම දරුවා. ඒකෙන් ඔයාගෙ මරණය මගේ පරණ සතුරාට ගොඩක් වේදනාකාරී වෙයි. ඔයා මුළුමනින්ම අසාර්ථක වුණාම.''

දැන් ඇගේ නහරවල පිරෙමින් තිබෙන සීත අම්ල සමඟ සසඳන විට ඇයට තම විලුඹේ වේදනාව ගණන් ගත යුත්තක් නොවන බව හැඟිණි. ඇයට දිව යාමට අවශ්‍ය විය. ඇයට අනුකම්පාව අයැදීමට වුවමනා විය. එහෙත් ඇයට දැන් දුර්වල බව පෙන්වීමට නොහැකිය.

''ඔයා ඇරැක්නි[1].'' ඇය පැවසුවාය. ''මකුළුවෙක් බවට හරවපු වියන්නිය.''

රූපය පහළට බසිද්දී එය වඩාත් පැහැදිලිව සහ බියකරුව පෙනෙන්නට විය. ''නුඹේ මවගේ සාපයෙන්.'' ඇය පැවසුවාය. ''සැමගේ අවඥාවට ලක්වෙලා සැඟවුණු දෙයක් බවට පත්කළා... මොකද මම තමයි හොඳම වියන්නිය.''

''ඒත් ඔයා තරගය පැරදුණා.'' ඇනබෙත් පැවසුවාය.

''ඒක ජයග්‍රාහකයා විසින් ලියපු කතාවක්.'' ඇරැක්නි කෑ ගැසුවාය.

''බලන්න මගේ වැඩ, ඔයාම දැක ගන්න.''

---

1 ඇතීනාටත් වඩා විවීමේ දක්ෂතාවක් ඇතැයි පැවසෙන වියන්නියකි. මෙය දෙවඟනගේ කෝපයට හේතු වූ අතර ඇය ඇරැක්නිගේ ගෙත්තම් තිර සහ වියන යන්ත්‍ර විනාශ කළාය. ඇරැක්නි ගෙල වැල ලා ගත් නමුත්, ඇතීනා මකුළුවකු ලෙස ඇයට නැවත ජීවය ලබා දුන්නාය.

ඇනබෙත්ට එහි විවාදයක් නොතිබිණි. තිර රෙදි ඇය මෙතෙක් දැක තිබූ හොඳම ඒවා විය. සර්සිස් මායාකාරියටත් වඩා හොඳය. ඔලිම්පස් කන්දේදී ඇය දුටු සමහර වියමන් වලටත් වඩා ඉහළය. සැබැවින්ම ඇගේ මව පරාජය වූවා නම්- ඇය සැඟවුණු ඇරැක්නිව පිටතට ගෙන සත්‍යය නැවත ලිවිය යුතුය. එහෙත් මේ මොහොතේ ප්‍රශ්නය එය නොවේ.

''අතීතයෙ ඉඳලම ඔයා මේ ප්‍රතිමාවේ භාරකාරය වෙලා ඉඳල තියෙනවා.'' ඇනබෙත් අනුමාන කළාය. ''ඒත් ඒක මෙතෙන්ට අයිති නැහැ. මම ඒක ආපහු අරන් යනවා.''

''අහ්.'' ඇරැක්නි පැවසුවාය.

ඇනබෙත්ට පවා තමා පැවසූ දේ විකාරයක් ලෙස පෙනිණි. බුබුළු දවටන වලින් විලුඹ ඔතාගත් එක කෙල්ලක් මේ දැවැන්ත ප්‍රතිමාව එහි භූගත කුටියෙන් කෙසේ ගෙන යන්නද?''

''මට කනගාටුයි, ඔයාට මුළින් මාව පරාජය කරන්න වෙනවා මගේ කෙල්ලෙ.'' ඇරැක්නි පැවසුවාය. ''ඒ වගේම ඒක කරන්න පුළුවන් දෙයක් නෙමෙයි.''

දැල් වියමන තුළින් සත්ත්වයෙක් පෙනී සිටියේය. ඇගේ ගවේෂණය ඵලක් නොවන්නක් බව ඇනබෙත්ට අවබෝධ විය. ඇයට මිය යාමට සිදුවේ.

ඇරැක්නිට තිබුණේ දැවැන්ත කළු වැන්දඹු මකුළු සිරුරකි. උදරය යට විශාල හෝරා බඳුනක රතු පැහැති සලකුණක් විය. පාද අටෙහි ඇනබෙත්ගේ කිණිස්ස තරම් විශාල ඇවුළුම් කටු විය. මකුළුවා සමීපයට පැමිණියොත්, උගේ දුර්ගන්ධයම ඇයව ක්ලාන්ත කිරීමට සමත් වනු ඇත. එහෙත් වඩාත් බියකරු කොටස වූයේ ඇගේ හැඩයක් නැති මුහුණයි.

කලෙක ඇය රූමත් කාන්තාවකව සිටින්නට ඇත. දැන් කළු පැහැති හණුක උපාංග ඇත් දළ මෙන් ඇගේ මුවින් නෙරා තිබේ. ඇගේ අනෙක් දත් සුදු ඉඳිකටු මෙන් වැඩී තිබිණි. අපූරු කළු පැහැති රෝම කම්මුල් වලින් විහිදී තිබිණි. ඇගේ දෑස් විශාල වූ අතර, ඇසි පිය නොමැති ඒවා සම්පූර්ණයෙන් කළු පැහැති විය. කුඩා ඇස් දෙකක් කම්මුල් වලට සවි වී තිබිණි.

සත්ත්වයා ප්‍රචණ්ඩ රිප්- රිප්- රිප් ශබ්දයක් නැඟුවේය. ඌ සිනාසෙන හඬ විය යුතුය.

''දැන් මම උඹව කාලා දානවා කෙල්ලෙ.'' ඇරැක්නි පැවසුවාය. ''ඒත් බය වෙන්න එපා. මම උඹේ මරණය නිරූපණය කරන්න ලස්සන තිර රෙද්දක් වියන්නම්.''

# 37
# ලියෝ

**ලියෝ ප්‍රාර්ථනා කළේ තමන් එතරම් හොඳ නොවුණානම් කියාය.** සැබැවින්ම, සමහර අවස්ථාවල එය ලැජ්ජාවක් විය. යාන්ත්‍රික උපකරණ ගැන ඔහුට එවැනි ඇසක් නොතිබුණා නම්, ඔවුන්ට කිසි විටෙක රහසිගත දෝරුව හමු නොවනු ඇත. පොළොව යට අතරමං වී ලෝහ ජේත්තුකාරයන්ගේ ප්‍රහාරයට ලක් නොවනු ඇත. එහෙත් ඔහුට තමාටම උපකාර කරගැනීමට නොහැකි විය.

එක් පැත්තකින් එය හේසාල්ගේ වරදකි. සුපිරි භූගත සංවේදීතාවක් සහිත කෙල්ලක් වුවත්, ඇය රෝමයට එතරම් හොඳ නොවීය. ඇය ඔවුන්ව නගරය හතර අතේ රැගෙන ගියාය.

''සමාවෙන්න.'' ඇය පැවසුවාය. ''ඒක මේ... මෙහෙ භූගත තැන් ගොඩක් තියෙනවා. තට්ටු ගාණකින් යටවෙලා තියෙනවා. මේක හරියට වාද්‍ය වෘන්දයක මැද හිටගෙන එක සංගීත භාණ්ඩයකට විතරක් අවධානය යොමු කරනවා වගේ. මාව බිහිරි වෙලා.''

එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට රෝමයේ සංචාරය කිරීමට හැකි විය. ෆ්‍රෑන්ක් බැටළුවන් පාලනය කරන බල්ලකු වී ගමන් කිරීමට ප්‍රිය කළේය. (හ්ම්ම්. ලියෝට එවැනි කෙනෙකු බවට පත්වීමට හැකි වුවහොත්, ඔහු තෝරා ගන්නේ අශ්වයෙකි.) එහෙත් ලියෝ නොඉවසිලිමත් වන්නට පටන් ගත්තේය. ඔහුගේ දෙපා රිදුම් දෙන්නට විය. දිවා කාලය හිරු රැසින් නැහැවී අධික උණුසුමක් පැවතිණි. වීථි සංචාරකයන්ගෙන් පිරී පැවතිණි.

විනිශ්චය ශාලාව හොඳින් තිබිණි. එහෙත් එහි වැඩි කොටසක් නටඹුන් වී පඳුරුවලින් සහ ගස්වලින් වැසී තිබුණේය. එය පැරණි රෝමයේ කාර්යබහුල මධ්‍යස්ථානයක් ලෙස පැවතී ඇති බව දුටුමතින්ම පෙනී ගියේය. කැලිෆෝනියාවේදී ඔහු නව රෝමය දැක තිබූ බැවින් පමණක් ඔහුට එය හඳුනාගත හැකි විය.

ඔවුහු විශාල දේවස්ථාන, රැකුලක් නැතිව එසවී තිබූ ආරුක්කු රෙදි සාප්පු සහ ක්ෂණික ආහාර අවන්හල් පසු කළහ. යම් පැරණි රෝම ජේත්තුකාරයකුගේ පිළිරුවක් යාබද මැක්ඩොනල්ඩ්ස් අවන්හල දෙසට යොමු වී පැවතිණි.

''මම කවදාවත් හිතුවෙ නෑ මට රෝමය දකින්න ලැබෙයි කියලා.'' හේසාල් පැවසුවාය. ''මම ජීවතුන් අතර ඉන්න කොට, මම කිව්වේ කළින් වතාවෙ, මෙහෙ පාලකයා වෙලා හිටියෙ මුසොලීනි. අපි යුද්ධයට මුහුණදීල හිටියෙ.''

''මුසොලීනි?'' ලියෝ මුහුණ හැකිලුවේය. ''එයා හිට්ලර් වගේ BFF? නෙමෙයිද?''

ඔහු පිටසක්වළ ජීවියකුයැයි සිතන අයුරින් හේසාල් ඔහු දෙස බැලුවාය.

''BFF?''

''ඒක ගණන් ගන්න එපා.''

''මම ආසයි ට්‍රිවි ජල මල බලන්න.'' ඇය පැවසුවාය.

''හැම පැත්තෙම ජල මල් තියෙනවා.'' ලියෝ ගෙරවූයේය.

''එහෙම නැත්නම් ස්පාඤ්ඤ පඩිපෙල්.'' හේසාල් පැවසුවාය.

''ඇයි ඔයා ස්පාඤ්ඤ පඩිපේළි බලන්න ඉතාලියට එන්නෙ?'' ලියෝ විමසුවේය. ''ඒක හරියට චීනෙට ගිහින් මෙක්සිකානු කෑම හොයනවා වගේනෙ. එහෙම නේද?''

''ඔයාගෙන් වැඩක් නැහැ.'' හේසාල් මැසිවිලි නැඟුවාය.

''ඒක මම කියල තියෙනවනෙ.''

ලියෝ නැවතීමට තීරණය කළාක් මෙන් ඇය ෆ්‍රෑන්ක් දෙසට හැරී ඔහුගේ අත අල්ලා ගත්තාය. ''එන්න. මම හිතන්නෙ අපි යන්න ඕනෙ මේ පාරේ.''

ෆ්‍රැන්ක් ලියෝට ව්‍යාකූල සිනාවක් නැගුවේය. එහෙත් හේසාල් ඔහුව තමා වෙත ඇද ගැනීම ගැන ඔහු සතුටු විය.

සදාකාලික ඇවිදීමකින් පසු, හේසාල් දේවස්ථානයක් ඉදිරිපිට නැවතුණාය. අඩුම ගානේ ලියෝ එය දේවස්ථානයක් ලෙස පිළිගත්තේය. එහි ප්‍රධාන කොටසේ විශාල අර්ධ ගෝලාකාර වහලක් තිබිණි. පිවිසුමේ වූයේ ත්‍රිකෝණාකාර වහලයකි. එතැන නියම රෝම කුලුනු සහ ඒවා මත අක්ෂර කොටා තිබිණි. M. AGRIPPA වැනි යමක් හෝ වෙනත් දෙයක් එහි විය.

''ග්‍රහණය කර ගන්න කියන එක ලතින් වලින්ද?'' ලියෝ විමසුවේය.

''මේක තමයි අපේ හොඳම ඔට්ටුව.'' දවසේ සියලු අවස්ථාවලදීට වඩා හේසාල්ගේ හඬෙහි ස්ථිර බවක් ගැබ්ව තිබුණේය. ''මෙතන ඇතුළේ කොතනක හරි රහසිගත පැසේජයක් තියෙන්න ඕනෙ.''

සංචරක කන්ඩායම් පියගැට පෙළ මත අවුල් වූ ආකාරයෙන් හැසිරෙමින් සිටියහ. මඟපෙන්වන්නේ විවිධ අංක සහිත වර්ණවත් දැන්වීම් පත්‍ර ඔසවාගෙන භාෂා දුසිම් ගණනිකින් දේශනා දෙමින් සිටියේ ඔවුන් යම් ආකාරයක ජාත්‍යන්තර ක්‍රීඩාවක නියැලෙන්නාක් මෙනි.

ලියෝ තත්පර කීපයක් ස්පාඤ්ඤ සංචාරක මඟපෙන්වන්නට සවන් දුන්නේය. ඉන්පසු ඔහු එය තම මිතුරන්ට වාර්තා කළේය. ''මේ තමයි පාතිනොන්. දෙවියන්ට වෙන්වූ සිද්ධස්ථානයක් ලෙසින් මේක මේක මුලින්ම ගොඩනගල තියෙන්නේ මාර්කස් අග්‍රිපා. ඒක දැවී ගියාට පස්සෙ, හැඩ්‍රියන් අධිරාජයා ඒක නැවත ගොඩනැගුවා. මේක වසර දෙදාහක් පැරණියි. ඒ වගේම මේක ලෝකයේ හොඳින්ම ආරක්ෂා වෙලා තියෙන රෝම ගොඩනැගිලි වලින් එකක් විදිහට සැලකෙනවා.''

ෆ්‍රැන්ක් සහ හේසාල් ඔහු දෙස බලාගෙන සිටියහ.

''ඔයා කොහොමද ඒක දන්නෙ?'' හේසාල් විමසුවාය.

''මම සාමාන්‍යයෙන් දක්ෂයෙක්.''

''බයිල තමයි.'' ෆ්‍රැන්ක් පැවසුවේය. ''මෙයා සංචාරක කණ්ඩායමට කරපු කතාව හොරෙන් අහගෙන හිටියා.''

ලියෝ විරිත්තුවේය. ''සමහරවිට. එන්න. අපි ගිහින් රහස් පැසේජය හොයාගමු. මම හිතනවා මෙතන වායු සමීකරණ ඇති කියලා.'' සැබැවින්ම එහි වායුසමීකරණ නොතිබිණි.

හොඳ පැත්ත වූයේ ඔවුන්ට පෝලිමේ සිටින්නට හෝ ඇතුළු වීමේ ගාස්තු ගෙවීමට වුවමනා නොවීමයි. එබැවින් ඔවුන් සංචාරක කණ්ඩායම් පසුකරගෙන ඇතුළට පිවිසියහ.

වසර දෙදහසකට පෙර ඉදිකරන ලද්දක් බව සලකන විට එහි අභ්‍යන්තරය බෙහෙවින් අලංකාර විය. රෝම Tic - Tac -Toe ක්‍රීඩාව මෙන් එහි කිරිගරුඬ පොළොව චතුරශ්‍ර සහ රවුම් වලින් රටා ගන්වා තිබිණි. ප්‍රධාන අවකාශය එක් විශාල කුටියක් වූ අතර එහි මැද වූයේ එක්සත් ජනපදයේ මහා මණ්ත්‍රණ ශාලාව ආකාරයේ කවාකාර ගොඩනැගිල්ලකි. එහෙත් ඇස් ඇද ගන්නා සැබෑ ස්ථානය වූයේ ඉහළින් පිහිටි අර්ධ ගෝලයයි. ගොඩනැගිල්ලට ලැබුණු සියලු ආලෝකය පැමිණියේ මුදුනේ තිබූ එක් කවාකාර විවරයකිනි. දුර්වල මිනිසුන් දවා ලීමට සියුස් විසින් විශාලන කාචයක් අල්ලාගෙන සිටි අයුරින්, හිරු රැස් කදම්භය කවාකාර ගොඩනැගිල්ලට වැටී පොළොව දීප්තිමත් කළේය.

ලියෝ ඇනබෙත් මෙන් ගෘහනිර්මාණ ශිල්පියෙක් නොවුණත්, ඔහුට එහි ඉංජිනේරු ශිල්පය අගය නොකර සිටීමට නොහැකි විය. රෝමවරු විශාල පාෂාණ ඵලකවලින් අර්ධ ගෝලය සැදුවත්, ඔවුන් එය චතුරශ්‍රයක් හැර චතුරශ්‍රයක් ලෙසට කුහර සහිතව නිර්මාණය කළහ. එයින් අර්ධ ගෝලය සැහැල්ලු වන බවත් රැඳවීමට පහසු වන බවත් ලියෝට අවබෝධ විය.

ඔහු එය තම මිතුරන්ට සඳහන් නොකළේය. ඔවුන් එය ගණන් ගනීවිදැයි ඔහුට වූයේ සැකයකි. එහෙත් ඇනබෙත් මෙතැන සිටියා නම්, ඇය ඒ ගැන කතා කිරීමට දවසම වැය කරනු ඇත. ඒ ගැන සිතත්ම ඇය ඇතීනාගේ සලකුණ ගවේෂණය කෙසේ කරන්නට ඇත්දැයි ඔහුට සිහිපත් විය. ඔහුට මෙවැනි හැඟීමක් ඇතිවෙතැයි ලියෝ කිසිවිටෙක නොසිතුවේය. එහෙත් ඔහු අර බියගුළු දුඹුරු හිසකේ ඇති කෙල්ල ගැන කරදර වූයේය.

කාමරය මධ්‍යයේ නැවතුණු හේසාල්, වටයක් කරකැවුණාය.

''මේක හරිම පුදුමාකාරයි. අතීතයේදී, වල්කන්ගේ දරුවෝ රහසේ මෙහාට එන්න ඇති උපදෙවිවරුන්ගේ ආයුධ අභිෂේක කරන්න. මෙතන තමයි රාජකීන් රත්‍රන් ජප කළේ.''

එය කෙසේ සිදුවන්නට ඇත්දැයි ලියෝ පුදුමයට පත් විය. උප දෙවිවරු පිරිසක් කළු ලෝගුවලින් සැරසී, ගෝණුසු බැලිස්ටාවක් ඉදිරි

දොරටුව අතරින් නිහඬව පෙරළාගෙන ඒමට උත්සාහ දරන ආකාරය ඔහුට මැවී පෙනිණි.

''ඒත් අපි මෙතෙන්ට ආවේ ඒ නිසා නෙමෙයි.'' ඔහු අනුමාන කළේය.

''නෑ.'' හේසාල් පැවසුවාය. ''මෙහෙ පිවිසුමක් තියෙනවා- අපිව නිකෝ ඉන්න තැනට ගෙනියන උමඟකට. මට දැනෙනවා ඒක ළඟම තියෙනවා කියලා. මට හරියටම කියන්න බැහැ කොහෙද කියලා.''

ෆ්‍රෑන්ක් ගෙරවූයේය. ''මේ ගොඩනැගිල්ල අවුරුදු දෙදාහක් පරණ නම්, ඒකෙන් හිතාගන්න පුළුවන් රෝම යුගය ඉඳලම මෙතන යම් ආකාරයක රහසිගත පැසේජයක් තිබුණ කියලා.''

ඕනෑවට වඩා හොඳ වූ විට සාමාන්‍යයෙන් ලියෝ කරන වරද ඔහු කළේ මෙවිටය.

ඔහු දේවස්ථානයේ ඇතුළත විපරම් කරමින් සිතුවේය: *රහසිගත පැසේජය සැලසුම් කළේ මම නම්, කොහෙද මම ඒක හදන්නේ?*

යම් යන්ත්‍රයක් ක්‍රියාකරවීමට තම අත තැබිය යුත්තේ කොතැනට දැයි සමහර අවස්ථාවල ඔහුට අවබෝධ කර ගැනීමට පුළුවන් කම තිබුණා විය හැකිය. ඒ ආකාරයට ඔහු හෙලිකොප්ටරයක් පැදවීමට ද ඉගෙන ගෙන තිබිණි. ඔහු ඒ විදිහටම ෆෙස්ටස් මකර ා තැනුවේය. (ෆෙස්ටස් බිම වැටී දැවී යාමට පෙර)

දැන් ඔහු මේ පැරණි ගොඩනැගිල්ල හඳුනාගැනීමට උත්සාහ දරමින් සිටියි. ඔහු රතු කිරිගරුඬ ඇල්ලූ අල්තාරයක පෙනුමින් යුතු දෙය දෙසට හැරුණේය. ඒ මත කන්‍යා මරියතුමියගේ ප්‍රතිමාවක් විය. ''අරෙහෙ.'' ඔහු පැවසුවේය.

ඔහු විශ්වාසයෙන් යුතුව පූජාසනය දෙසට පියවර තැබුවේය. එය ගිනි උඳුනක ආකාරයේ හැඩයෙන් යුක්ත වූ අතර පතුලේ ආරුක්කු පෙළක් තිබිණි. සොහොනේ කොතක මෙන් උඳුනිසෙහි නමක් කොටා තිබිණි.

''පැසේජය තියෙන්නෙ මේ අවටමයි.'' ඔහු පැවසුවේය. ''එක පැත්තකින් මේ හාදයාගේ අවසන් නින්ද සැතපෙන තැන. රැෆායෙල් කවුරුහරි නේද?''

''සුප්‍රකට චිත්‍ර ශිල්පියෙක්, මම හිතන්නේ.'' හේසාල් පැවසුවාය.

ලියෝ දෙවුර සැලුවේය. ඔහුට රූෆායල් යනුවෙන් ඥාතියකු සිටි අතර ඔහු ඒ නම ගැන එතරම් තැකීමක් නොකළේය. තම ඉණ පටියෙන් උපකරණයක් ගෙන ඩයිනමයිට් කූරක් තනා ගැනීමට හැකි නම්, කුඩා පිපිරීමක් කළ හැකිය. එහෙත් මෙම ස්ථනයේ බාරකරුවන් එයට අනුමැතිය නොදෙන බව පෙනිණි.

''ඔහොම ඉන්න...'' ලියෝ වටපිට බැලුවේ ඔවුන් දෙස කවුරුන් හෝ බලා නොසිටිය වග සැකහැර දැනගැනීමටය.

සංචාරක කණ්ඩායම් බොහෝමයක් අර්ධ ගෝලය අබියස මෝඩයන් වී සිටියහ. එහෙත් එක් තුන් කට්ටුවක් ලියෝව අපහසුතාවයට පත් කළේය. අඩි පණහක් පමණ දුරින්, අමෙරිකන් පෙනුමැති මැදිවයසේ අධි බරැති ජේත්තුකාරයන් තිදෙනෙක් වූහ. ඔවූහු අමෙරිකානු උෑරුවට හඬ නගමින් උණුසුම ගැන මැසිවිලි නගමින් සිටියහ. ඔවුන් දිස්වූයේ වෙරළ ඇඳුම් හැඳි මැනටියන් මෙනි-සෙරෙප්පු, කොට කලිසම්, සංචාරක ටී ෂර්ට් සහ නම්‍යශීලී හිස් වැසුම් ඔවුන්ගේ ඇඳුම් ආයිත්තම් විය. ඔවුන්ගේ දෙපා විශාල සහ සුදු මැලි විය. ඔවුන්ගේ හැසිරීම අතිශයින්ම නීරස වූ අතර ඔවුන් අවට කැරකෙන්නේ ඇයි දැයි ලියෝට කුතුහලයක් ඇති විය.

ඒ හාදයින් බලාගෙන සිටියේ ඔවුන් දෙස නොවේ. ඔවුන් තමාව එතරම් අවුලට පත් කරන්නේ ඇයි ද කියා ලියෝට සිතාගත නොහැකි විය. සමහර විට ඒ ඔහු මැනටීස්ලාට අකැමැති නිසා විය හැකිය. *එයාලව අමතක කරන්න*, ලියෝ තමාට පවසා ගත්තේය.

ඔහු සොහොන වටා රවුමක් ගියේය. රෝම කුලුනේ පාදම දක්වා අතගා බැලුවේය. හරියටම පාදමේ කිරිගරුඬ මත රේඛා ගොඩක් කැටයම් කර තිබිණි. ඒ රෝම ඉලක්කම්ය.

''හා.'' ලියෝ පැවසුවේය. එච්චර උදාරම් නැහැ. ඒත් සාර්ථකයි.''

''මොකක්ද?'' ෆ්‍රැන්ක් විමසුවේය.

''අගුල සඳහා සංයෝජනය.'' ඔහු කුලුන පිටුපස තවත් සොයා බැලුවේය. විදුලි පේනුවක් තරම් විශාල චතුරශ්‍රකාර සිදුරක් ඔහුට සොයා ගත හැකි විය. ''යතුරු මූණත ගැලවිලා ගිහින්. සමහරවිට සියවස් ගාණක් තිස්සේ විනාශ වෙලා ඇති. ඒත් මට පුළුවන් වෙයි මේක ඇතුළත යාන්ත්‍රණය පාලනය කරන්න, මට පුළුවන් නම්...''

ලියෝ කිරිගරුඬ පොළොව මත තම අත තැබුවේය. පාෂාණ මතුපිටට පහළින් පරණ ලෝකඩ ගියර පවතින බව ඔහුට දැනිණි. සාමාන්‍ය ලෝකඩ කාලයක් සමඟ විඛාදනය වී දීර්ඝ කාලයක් අස්ථායි තත්ත්වයට විය හැකි වුවත්, එහි වූයේ දිව්‍යමය ලෝකඩය. උප දෙවිවරුන්ගේ අත්වැඩකි. රෝම ඉලක්කම්වල මඟ පෙන්වීම සහිතව කුඩා බලයක් යෙදීමෙන් ලියෝට ඒවා සෙලවීමට හැකි විය. ක්ලික් ක්ලික් ක්ලික් යනුවෙන් සිලින්ඩර හැරිණි. ඉන්පසු නැවතත් ක්ලික්, ක්ලික්.

බිත්තියට යාබදව තිබූ පොළොවේ, කිරිගරුඬ කැටයක් අනෙක මත ලිස්සා ගියේය. එයින් මතු වූයේ රිංගා යාමට අපහසු තරමේ චතුරශ්‍රාකාර අඳුරු විවරයකි.

''රෝමවරු කුඩාවට ඉන්න ඇති.'' ලියෝ ෆ්‍රැන්ක් දෙස බලමින් පැවසුවේය. ''ඔයාට මේකෙන් රිංගන්න නම් මොකක් හරි කෙට්ටු දෙයක් බවට පත් වෙන්න වෙනවා.''

''ඒක හොඳ දෙයක් නෙමෙයි.'' හේසාල් වෙව්ලුවාය.

''මොකක්? හරියට කියන්න.''

''ඒ ගැන කරදර වෙන්න එපා.'' ෆ්‍රැන්ක් පැවසුවේය. ''අපි ගවේෂණය කරන්න කලින් අනිත් අයට කියන්න ඕනෙ- පිපර් එහෙමයි කිව්වේ.''

''නගරෙන් භාගෙක දුර යන්න ඕනෙ.'' ලියෝ ඔහුට මතක් කර දුන්නේය. ''අනෙක් අතට, මට හරියටම කියන්න බෑ මට මේ සිදුර ආපහු වහන්න පුළුවන් වෙයිද කියලා. මේ ගියර් හොඳටම පරණයි.''

''අපුරුයි.'' ෆ්‍රැන්ක් පැවසුවේය. ''අපි කොහොමද දන්නේ මේකෙ පහළ ආරක්ෂිතයිද කියලා?''

හේසාල් දණ ගසා ගත්තාය. උෂ්ණත්වය පරීක්ෂා කිරීමට මෙන් ඇය තම අත ඇතුළට එබුවාය. ''පණ ඇති කිසිම දෙයක් නැහැ... අඩුගානෙ අඩි සිය ගාණක්වත් යනකම්. උමඟ පහළට යොමුවෙන්නෙ, ඊට පස්සෙ පොළොවට සමාන්තරව දකුණට යනවා. මට නම් කිසිම උගුලක් පේන්නෙ නෑ.''

''ඔයා කොහොමද මේ සේරම කියන්නෙ?'' ලියෝ විමසුවේය. ඇය දෙවුර සැලුවාය. ''ඔයා කිරිගරුඬ කුලුනුවල අගුල් හොයා ගත්ත විදිහටම තමයි, මම අනුමාන කළා. ඔයා බැංකු බිඳපු නැති එක ගැන මම සතුටු වෙනවා.''

''අහ්... බැංකු සේප්පු.'' ලියෝ පැවසුවේය. ''කොහෙත්ම ඒ ගැන හිතුණෙ නෑ.''

''මම කියපු දේවල් අමතක කරන්න.'' හේසාල් සුසුමක් හෙලුවාය. ''බලන්න, තවම තුන වෙලා නැහැ. අඩුගානෙ අපිට පුංචි සෝදිසියක්වත් කරන්න පුළුවන්. අනෙක් අයව සම්බන්ධ කරගන්න කලින් නිකෝ ඉන්න තැන ගැන හෝඩුවාවක් හොයාගන්න පුළුවන් වෙයි. කතා කරනකම් ඔය දෙන්න මෙතන ඉන්න. මට ටිකක් පරීක්ෂා කරල බලන්න ඕනෙ උමඟ ගැන. මම පොළොව යටට ගියාම මට තව විස්තර කියන්න පුළුවන් වෙයි.''

ෆ්‍රෑන්ක් රැව්වේය. ''අපිට බැහැ ඔයාට තනියම යන්න ඉඩ දෙන්න. ඔයාට තුවාල වෙන්න පුළුවන්.''

''ෆ්‍රෑන්ක්, මට මා ගැන බලාගන්න පුළුවන්.'' ඇය පැවසුවාය. ''පොළොව යට තියෙන්නෙ මගෙ විශේෂඥතාවය. මම මුළින්ම යනව නම්, ඒක අපි හැමෝටම ආරක්ෂිතයි.''

''ෆ්‍රෑන්ක්ට කොටළුවෙක් හරි තැනිතලා බල්ලෙක් හරි වෙන්න ඕනෙ නැත්නම්...'' ලියෝ පැවසුවේය. ''ඒ දෙකම භයානකයි.''

''කටවහපන්.'' ෆ්‍රෑන්ක් ගිගිරුවේය.

''නැත්නම් බැජර් කෙනෙක් වුණත් හොඳයි.''

ෆ්‍රෑන්ක් තරවටු කරන නියාවෙන් ඇඟිල්ල උරුක් කළේය. ''වැල්ඩෙස්, මම දිවුරුවා.''

''ඔය දෙන්නම සන්සුන් වෙන්න.'' හේසාල් පැවසුවාය. ''මම ඉක්මනට ආපහු එන්නම්. මට විනාඩි දහයක් දෙන්න. ඔයාලට මාව ඇහුණෙ නැතත්... ගණන් ගන්න එපා. මට ප්‍රශ්නයක් වෙන එකක් නෑ. මම පහළට ගියාට පස්සෙ දෙන්න එක්ක මරා ගන්න හදන්න එපා.'' ඇය සිදුරෙන් පහළට බැස්සාය. ලියෝ සහ ෆ්‍රෑන්ක් ඔවුන්ට හැකි උපරිම අයුරින් අනෙක් අයගේ දර්ශනයෙන් ඇයව වසන් කළහ. ඔවූහු උරහිස් ගෑවෙන සේ සිටගෙන සාමාන්‍ය අයුරින් හැසිරීමට උත්සාහ කළහ.

සංචාරක කණ්ඩායම් පැමිණ ගියහ. බොහෝ දෙනෙක් ලියෝ සහ ෆ්‍රෑන්ක් ගැන තැකීමක් නොකළහ. ටික දෙනෙක් ඔවුන් දෙස සැකමුසුව බලා දිගටම ඇවිද ගියහ. සමහරවිට ඔවුන් සන්තෝෂම් ඉල්ලනවා ඇතැයි සංචාරකයන් සිතුවා විය හැකිය. යම් හේතුවක් නිසා, ලියෝ විරිත්තන විට මිනිසුන්ගේ සිත චංචල විය.

අමෙරිකානු මැනෙටියන් තිදෙනා තවමත් කාමරයේ මැද රැඳී සිටියහ. එක් අයෙක් හැඳ සිටි ටී ෂර්ටයේ 'රෝමය' යනුවෙන් සටහන් කර තිබුණේ එය හැඳ නොසිටියානම් ඔහුට තමා සිටින නගරය අමතක වේ යැයි සිතා මෙනි. මොහොතින් මොහොත ඔවුන්ව දැකීම අප්‍රිය වූවා සේ ඔහු ලියෝ සහ ෆ්‍රෑන්ක් දෙස බලන්නට විය.

ඒ හාදයාගේ යමක් ලියෝගේ සිත කරදරයට පත් කළේය. හේසාල් ඉක්මනින් පැමිණෙන්නේ නම් හොඳ යැයි ඔහුට සිතිණි.

''ඇය මට කලින් කතා කළා.'' ෆ්‍රෑන්ක් එක්විටම පැවසුවේය. ''හේසාල් මට කිව්වා ඔයා මගේ ජීවිත රේඛාව විසඳුවා කියලා.''

ලියෝ ගැස්සිණි. ෆ්‍රෑන්ක් තමා අසල සිටගෙන සිටින බව ඔහුට එහෙමපිටින්ම අමතකව ගොස් තිබිණි.

''ඔයාගෙ ජීවන රේඛාව... ඕහ්, දැවෙන කෝටුව. හරි.'' තම අත දවා ගසමින් කෑ ගැසීමට ඇති වූ ආශාව මැඩගන්නට ලියෝට නොහැකි විය. ඒ අදහස විනෝදජනකය. එහෙත් ඔහු ඒ ආකාරයේ කෲර අයකු නොවීය. ''බලන්න, මනුස්සයෝ.'' ඔහු පැවසුවේය. ''මම කවදාවත් ඔයාව අනතුරේ වැටෙන දෙයක් කරන්නෙ නැහැ. අපි එකම කණ්ඩායමේ.''

ෆ්‍රෑන්ක් තම මුළාදෑනි පදක්කම පිරිමැද්දේය.. ''මම හැමතිස්සෙම දැනගෙන හිටියා ගින්දරට මාව මරන්න පුළුවන් කියලා. ඒත් වැන්කුවර්වල මගෙ ආත්තම්මගෙ ගේ ගිනිගත්ත දවසෙ... ඒක ඇත්තකට වඩා දෙයක් බව පෙනුණා.''

ලියෝ හිස සැලුවේය. ඔහුට ෆ්‍රෑන්ක් ගැන දුක සිතිණි. එහෙත් මේ හාදයා ඔහුගේ පවුලේ නිවෙස ගැන කතා කරන විට එය සුළුවෙන් නොතකන බව පෙනුණේය.

''ඔයාගෙ ආත්තම්මා- එයා ඒ ගින්නෙන් මැරුණද? ඔයා ඒක කියල නැහැ.''

''ම- මම දන්නෙ නැහැ. එයා ගොඩක් මහලුයි වගේම අසනීපෙන් හිටියෙ. එයා කිව්වෙ එයා මැරෙන්නෙ එයාට ඕනෙ වෙලාවට, එයාගෙම විදිහකට කියලයි. ඒත් මම හිතන්නෙ එයා ඒක කළේ ගින්නෙන් නෙමෙයි. මම දැක්කා මේ පක්ෂියා ගිනි දැලුවලින් උසට පියාඹනවා.''

ලියෝ ඒ ගැන සිතුවේය. ''එහෙනම් ඔයාගෙ මුළු පවුලටම වෙනත් හැඩ ගන්න පුළුවන්ද?''

''මම අනුමාන කරනවා.'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''මගෙ අම්මා කළා. මගෙ ආත්තම්මා කියපු විදිහට අම්මා ඇෆ්ගනිස්ථානෙ යුද්දෙ දි මැරුණෙ එහෙම තමයි. අම්මා එයාගෙ සගයන්ට උදව් කරන්න හැදුවා... මම දන්නෙ නෑ හරියටම මොකක්ද වුණේ කියලා. ඒක ගිනි බෝම්බයක්.''

ලියෝ කනගාටුවෙන් ඇසිපිය ගැසුවේය. ''එහෙනම් අපි දෙන්නගෙම අම්මල නැති වුණේ ගින්දර වලින්.''

ඔහු එය පැවසීමට සුදාමින් නොසිටියත්, රාත්‍රියේ වැඩපළ තුළ සිටින විට ගයියා ඔහු ඉදිරියේ පෙනී සිටි අයුරුත් ඔහුගේ මව මියගිය අයුරු ගැනත් මුළු කතාවම ෆ්‍රෑන්ක්ට පැවසුවේය.

ෆ්‍රෑන්ක්ගේ දෑස් තෙත් විය. ''මම කොහෙත්ම කැමති නෑ මිනිස්සු මට 'ඔයාගෙ අම්මා ගැන කනගාටුයි' කියනවට.''

''මටත් කවදාවත් ඒක ගැන හොඳක් දැනිල නෑ.''

'ඒත් මට ඔයාගෙ අම්ම ගැන කනගාටුයි.''

''ස්තූතියි.''

හේසාල්ගේ සලකුණක්වත් නොවීය. අමෙරිකානු සංචාරකයෝ තවමත් පාතිනන් අවට කැරකෙමින් සිටියහ. කිසිවකුට නොදැනී රෆායල්ගේ සොහොන සොරකම් කිරීමට මෙන් ඔවුහු, තවත් සමීපයට පැමිණ ඇති බව පෙනිණි.

''ජුපිටර් කඳවුරේදී.'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''අපේ කුටියේ ලාර්, රෙටි කියුලස්, මට කිව්වා මාර්ස්ගෙ පුතා නිසා මට අනෙක් බොහෝ උප දෙවිවරුන්ට වඩා බලයක් තියෙනවා කියලා. ඒ වගේම ස්වරූපය වෙනස් කරගන්න හැකියාව මට අම්මගෙ පැත්තෙන් ඇවිත් තිබුණා. මගේ ජීවිතේ දැවෙන කෝටුවක් එක්ක බැඳිල තියෙන්නෙ ඒ නිසා බවයි එයා කිව්වේ. ඒක සමහර දේවල් සමබර කරන ආකාරයක්. ලොකු දුර්වලකමක්.''

මහා ලවණ විලේදී පළිගැනීමේ දෙවඟන වූ නෙමිසිස් සමඟ වූ සංවාදය ලියෝගේ සිහියට නැගිණි. තරාදි සමතුලිත කිරීමේදී අවශ්‍යවන දේ ගැන එයට සමාන යමක් ඇය පැවසුවාය. *වාසනාව ලැජ්ජාවක්. සැබෑ සාර්ථකත්වයට පරිත්‍යාගය අවශ්‍යයි.*

ඇගේ වාසනාවේ විස්කෝතුව තවමත් ලියෝගේ ඉණ පටියේ විවෘත කරන තුරු බලා සිටියේය. ඔයාට විසඳගන්න බැරි ප්‍රශ්නයක් ආ සැනින්, මට ඔයාට උදව් කරන්න පුළුවන් වෙයි. ඒත් මිලක් විදිහට.

මේ මතකය තම හිසින් ඉවත්ව යන්නේ නම් මැනවැයි ලියෝ සිතුවේය. එසේම එය තම ඉණ පටියෙන් ඉවත් වන්නේ නම් හොඳ බව ඔහු සිතුවේය. එයට පමණට වැඩි ඉඩක් වෙන් වී තිබිණි.

''අපි හැමෝගෙම දුර්වලකම් තියෙනවා.'' ඔහු පැවසුවේය. ''උදාහරණයක් විදිහට, මම. මම කණගාටුදායක විදිහට විනෝදජනක සහ හොඳ පෙනුමක් තියෙන කෙනෙක්.''

ෆ්‍රැන්ක් ගෙරවූයේය. ''ඔයාට දුර්වලතා තියෙන්න පුළුවන්. ඒත් ඔයාගෙ ජීවිතේ දර කැල්ලක් මත රඳා පැවතිලා නැහැ.''

''නෑ.'' ලියෝ පැවසුවේය. ඔහු සිතන්නට පටන් ගත්තේයඃ ෆ්‍රැන්ක්ගේ ප්‍රශ්නය තමාගේ ප්‍රශ්නයක් වූවා නම්, තමා එය විසඳන්නේ කෙසේද? ''මට හිතාගන්න...''

ඔහු කාමරය සිසාර බලා හැකිලුණේය. අමෙරිකානු සංචාරකයන් තිදෙනා ඔවුන් දෙසට එමින් සිටියහ. තව දුරටත් හොරගල් ඇහිලීමක් නොතිබිණි. ඔවූහු කෙළින්ම රූෆායල්ගේ සොහොන දෙසට එමින් සිටි අතර තිදෙනාම ලියෝ දෙස බලාගෙන සිටියහ.

''ආහ්, ෆ්‍රැන්ක්?'' ලියෝ විමසුවේය. ''තාම විනාඩි දහයක් ගියෙ නැද්ද?''

ෆ්‍රැන්ක් ඔහුගේ බැල්ම අනුගමනය කළේය. අමෙරිකානුවන්ගේ මුහුණුවල කෝපයත්, ව්‍යාකූල බවක් සටහන් වී තිබිණි.

''ලියෝ වැල්ඩෙස්.'' 'රෝමය' ටී ෂර්ටය හැඳ සිටි හාදයා පැවසුවේය. ඔහුගේ කටහඬ වෙනස් වී තිබිණි. එහි බොල් හා දැඩි ගතියක් විය. තම දෙවැනි භාෂාව මෙන් ඔහු ඉංග්‍රීසියෙන් කතා කළේය. ''අපි ආයෙත් හමුවුණා.''

සංචාරකයන් තිදෙනා ඇසිපිය ගසන විට ඔවුන්ගේ දෑස් රන් පැහැයට හැරිණි.

ෆ්‍රැන්ක් ගැස්සුණේය. ''එයිඩෝලන් ල!''

මැනටියන්ගේ දෑත් මිට මෙලවිණි. සාමාන්‍යයෙන් වැනෙන තොප්පි ලා ගත් අධිබර හාදයන් අතින් මිය යාම ගැන ලියෝ කරදර නොවූ නමුත්, ඒ සිරුරු වලට වඩා එයිඩෝලන්ලා භයානක බව ඔහු

සැක කළේය. විශේෂයෙන් මේ ආත්ම ඔවුන්ගේ සත්කාරකයාගේ ජීවිතය ගැන තැකීමක් නොකරති.

''එයාලට පහළ සිදුරට එන්න බැහැ.'' ලියෝ පැවසුවේය.

''ඇත්ත.''ෆ්‍රෑන්ක් පැවසුවේය. ''පොළොව යට ඇත්තටම හොඳයි.''

සර්පයකු බවට පත් වූ ඔහු සිදුර දෙසට බඩ ගෑවේය. ආත්ම හඬා එද්දී ලියෝ ෆ්‍රෑන්ක්ට පසු සිදුරට පැන්නේය. ඉහළින් ආත්ම හඬ නගන හඬ ඇසිණි.

''වැල්ඩේස්! වැල්ඩේස් මරනු!''

# 38
# ලියෝ

**එක් ගැටලුවක් විසඳුණේය.** ඔවුන්ගේ ලුහුබඳින්නන් වළක්වා ලමින්, ඉහළින් තිබූ කුරුබිලය ස්වංක්‍රීයව වැසී ගියේය. එසේම එයින් සියලු ආලෝකයද මකා දැමුණත්, ලියෝට සහ ෆ්‍රෑන්ක්ට එයින් ගැටලුවක් නොවුණි. තමන් පැමිණි මඟින්ම ආපසු පිටවීමට සිදු නොවනු ඇතැයි ලියෝ අපේක්ෂා කළේය. යටින් තිබූ කිරිගරුඬ කැටය විවෘත කර ගැනීමට තමාට හැකිවෙතැයි ලියෝ තුළ විශ්වාසයක් නොතිබිණි.

අඩුම වශයෙන් සිරුරු එයිඩෝලන්ලාගේ ග්‍රහණයට නතු වූ මැනරී ජේත්තුකාරයන් දන් සිටිනුයේ අනෙක් පැත්තේය. ලියෝගේ හිසට ඉහළින් කිරිගරුඬ පොළොව දෙදරන්නට විය. තඩි සංචාරකයන් තිදෙනා එයට පයින් ගසනවා විය යුතුය.

ෆ්‍රෑන්ක් නැවත ඔහුගේ මනුෂ්‍ය ස්වරූපයට පැමිණියා විය යුතුය. ලියෝට ඔහු වේගයෙන් හතිලන හඬ අඳුරු තුළින් ඇසුණේය.

''දැන් මොකද කරන්නෙ?'' ෆ්‍රෑන්ක් විමසුවේය.

''හරි, බය වෙන්න එපා.'' ලියෝ පැවසුවේය. ''මම පුංචි ගින්නක් කැඳවන්නයි හදන්නෙ. නිකම් මේ අපිට පේන තරම් එකක්.''

''අනතුරු ඇඟවුවාට ස්තුතියි.''

ලියෝගෙ දබර ඇඟිල්ල උපන්දින ඉටිපන්දමක් මෙන් දැල්විණි. පහත් සිවිලිමක් සහිත පාෂාණ උමඟ ඔවුන් ඉදිරියේ විහිදී තිබුණේ,

හේසාල් පැවසූ පරිද්දෙන්මය. එය පහළට බෑවුම් වී ඉන්පසු, එක මට්ටමට දකුණට විහිදී ගියේය.

''හොඳයි.'' ලියෝ පැවසුවේය. ''ඒක ගිහින් තියෙන්නෙ එක පැත්තකට විතරයි.''

''අපි හේසාල්ව හොයාගමු.'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

ඒ යෝජනාව ගැන ලියෝට විවාදයක් නොතිබිණි. ඔවුහු කොරිඩෝවේ පහළ ගමන් කළහ. ගිනි දැල්ල සමග ලියෝ මුලින් ගමන් කළේය. ෆ්‍රෑන්ක් පිටුපසින් ඒම ගැන ඔහු සතුටු වූයේ යම් හෙයකින් සංචාරකයන් තිදෙනා ඇතුළට පිවිස ඔවුන් හඹා ආවොත්, ෆ්‍රෑන්ක්ට යම් සතකු බවට පත් වී ඔවුන්ව බියගැන්විය හැකි හෙයිනි. එයිඩෝලන්ස්ලා ඒ සිරුරු අතහැර උමගට පිවිස, තමන් දෙදෙනාගෙන් කෙනෙකු අත්කර ගත හොත් කුමක් සිදුවනු ඇත්දැයි ලියෝ බියට පත්විය. ඕහ්, මගේ දවසේ ප්‍රීතිමත් සිතුවිල්ල! ලියෝ තමාටම දොස් පවරා ගත්තේය.

අඩි සියයක් හෝ එවැනි ප්‍රමාණයක් ගමන් කර, කෙළවරකින් හැරුණු විට ඔවුන්ට හේසාල්ව හමුවිය. තම රන් යුද අසිපත් එළියෙන් ඇය දොරක් පරීක්ෂා කරමින් සිටියාය. ඇය කෙතරම් තදින් තම කාර්යයේ යෙදී සිටියේ දැයි කිවහොත්, ලියෝ 'හායි!' යනුවෙන් අමතන තෙක් ඔවුන්ව ඇගේ අවධානයට ලක් වූයේ නැත.

අන්දුන්කුන්දුන් වූ හේසාල් ඇගේ අසිපත වැනීමට උත්සාහ කළාය. ලියෝගේ මුහුණේ වාසනාවට, කොරිඩෝව තුළ හැසිරවීමට නොහැකි තරමටම අසිපත දිගින් වැඩි විය.

''ඔයාල මොනවද මෙතන කරන්නේ?'' හේසාල් විමසුවාය.

ලියෝ තැතනුවේය. ''සමාවෙන්න. අපි කේන්තිකාර සංචාරකයො කීප දෙනෙක්ගෙන් බේරෙන්න දුවන ගමන්.'' ඔහු ඇයට සිද්ධිය විස්තර කළේය.

ඇය නොරිස්සුමෙන් පිම්බාය. ''මට එයිඩෝලන්ස්ලව පේන්න බැහැ. මම හිතුවෙ පිපර් එයාලව පැත්තකට වෙලා ඉන්න පොරොන්දු කර ගත්ත කියලයි.''

''අහ්...'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''පිපර් එයාලව පොරොන්දු කරව ගත්තේ නැවෙන් ඉවත් වෙලා ඉන්නයි, අපෙන් කිසිම කෙනෙක්ව අත් කර ගන්නෙ නෑ කියලා විතරයි. ඒත් එයාල අපි පස්සෙ එනව නම්, අපිට පහර දෙන්න වෙනත් සිරුරු පාවිච්චි කරනවනම්, එහෙම බලනකොට එයාල තාක්ෂණිකව එයාලගෙ පොරොන්දු කඩල නැහැ.''

''නියමයි.'' ලියෝ මිමිණුවේය. ''එයාඩෝලන්ස්ලත් නීතිවේදියෝ. දැන් මට ඇත්තටම ඕනෙ කරල තියෙන්නෙ උන්ව මරන්න.''

''හරි. දැන් එයාලව අමතක කරන්න.'' හේසාල් පැවසුවාය. ''මේ දොර වැහිල තියෙන්නෙ. ලියෝ, මේ අගුල ගැන ඔයාගෙ දක්ෂතාවයෙන් උත්සාහ කරල බලන්න පුළුවන්ද?''

ලියෝ තම ඇඟිලි ගැට කැඩුවේය. කරුණාකරලා පැත්තකට වෙලා, ලොක්කට ඉඩ දෙන්න.''

දොර සිත් ඇදගන්නා සුළු එකකි. එය ඉහළ තිබූ රෝම ඉලක්කම් සංයෝජනයට වඩා සංකීර්ණ එකකි. මුළු දොරම මහේශාඛ්‍ය රන් වලින් ආලේප කර තිබිණි. බෝලින් බෝලයක් තරම් විශාල යාන්ත්‍රික ගෝලය එහි මධ්‍යයට කාවද්දා තිබිණි. ගෝලය නිර්මාණය කර තිබුණේ ඒක කේන්ද්‍රිය වළලු පහකිනි. එක් එක් වළල්ලේ රාශි චක්‍රයේ සලකුණු කොටා තිබිණි. ගවයා, ගෝණුස්සා වැනි සංකේත ඒ අතර විය. එසේම එහි අහඹු අංක සහ අක්ෂර ද තිබෙන බව පෙනිණි.

''අකුරු නම් ග්‍රීක ඒවා.'' ලියෝ පුදුමයෙන් පැවසුවේය.

''ගොඩක් රෝමවරු ග්‍රීක කථා කරනවා.'' හේසාල් පැවසුවාය.

''මම අනුමාන කරනවා.'' ලියෝ පැවසුවේය. ''ඒත් මේ වැඩේ කරල තියෙන විදිහ... කිසිම සැකයක් නෑ ඔයාලගෙ ජුපිටර් කඳවුරේ විදිහ, ඒත් මේක රෝමවරුන්ට ගොඩක් සංකීර්ණයි.''

ෆ්‍රෑන්ක් එරවුයේය. ''අනෙක් අතට ග්‍රීක උඹලත් සංකීර්ණ දේවල් වලට කැමතියිනෙ.''

''හේයි.'' ලියෝ විරෝධය පෑවේය. ''මම කිව්වේ මේ යාන්ත්‍රණය අති දක්ෂයි, විචිත්‍රයි කියල විතරයි. ඒකෙන් මට මතක්වෙනවා...'' ලියෝ ගෝලය දෙස බලමින් තමා එවැනි පැරණි යන්ත්‍රයක් ගැන කියවා තිබුණේ හෝ අසා තිබුණේ කොහෙන්දැයි මතකයට නැගීමට උත්සාහ කළේය. ''ඒක අගුලු වල වඩා උසස් ආකාරයක්.'' ඔහු තීරණය කළේය. ''ඔයා එක් එක් වළලුවල තියෙන සංකේත නිවැරදි අනුපිළිවෙලට සකස් කළාම, දොර විවෘත වෙනවා.''

''ඒත් මොකක්ද නිවැරදි අනුපිළිවෙළ?'' හේසාල් විමසුවාය.

''හොඳ ප්‍රශ්නයක්. ග්‍රීක ගෝල... තාරකා විද්‍යාව, භූගෝල විද්‍යාව...

ලියෝගේ අභ්‍යන්තරයේ උණුසුම් හැඟීමක් ඇති විය. ''ආහ්, ඒක වෙන්න බෑ. මොක්කද පයි (π) වල අගය?''

ෆ්‍රෑන්ක් මුහුණ හැකිළුවේය. මොන විදිහෙ පයි එකක්ද?''

''එයා අදහස් කළේ අංකයක්.'' හේසාල් අනුමාන කළාය. ''මම ඒක ඉස්සර ගණිත පන්තියේදී ඉගෙන ගත්තා, ඒත්...''

''ඒක වෘත්තවල අගය සොයන්න පාවිච්චි කරනවා. '' ලියෝ පැවසුවේය.

''මේ ගෝලය, ඒක හැදුවේ මම හිතමින් ඉන්න හාදයා නම්...''

හේසාල් සහ ෆ්‍රෑන්ක් දෙදෙනාම ඇසිපිය නොසලා ඔහු දෙස බලා සිටියහ.

''ඒ ගැන හිතන්න එපා.'' ලියෝ පැවසුවේය. ''මට හොඳටම විශ්වාසයි පයි කියන්නෙ, අහ්, 3.1415, බ්ලා, බ්ලා, බ්ලා. අංක ටික අනන්තෙටම යනවා. ඒත් ගෝලයට තියෙන්නෙ වළලු පහයි. ඉතිං මම හරිනම්, ඒක ප්‍රමාණවත් වෙන්න ඕනෙ.''

''ඔයා වැරදි නම්?'' ෆ්‍රෑන්ක් විමසුවේය.

''හොඳයි එහෙනම් ලියෝ වැඩේට බහිනවා. අපි හොයලා බලමු.''

ඔහු පිටත සිට පටන් ගෙන වළලු කරකවන්නට විය. ඔහු තාරකා රාශි සංකේත සහ අක්ෂර නොසලකා හරිමින්, පයි හි අගය ලැබෙන තෙක් ඉලක්කම් පෙළ ගස්සවන්නට විය. කිසිවක් සිදු නොවුණි.

''මම මෝඩවුණා.'' ලියෝ මිමිණුවේය. ''පයි පිටපැත්තටත් විහිදෙන්න පුළුවන්, මොකද ඒක අපරිමේය නිසා.''

ඔහු අංකවල අනුපිළිවෙළ මධ්‍යයෙන් පටන් ගෙන පරිධියට එන සේ ප්‍රතිවිරුද්ධ අතට සකස් කළේය. ඔහු අවසන් වළල්ල එක පෙළට ගෙනෙන විට, ගෝලය ඇතුළේ වූ යමක් හඬ නැගුවේය. දොර විවෘත විය.

ලියෝ උජාරුවෙන් තම මිතුරන් දෙස බැලුවේය. ''හොඳ මිනිස්සුනේ, අන්න එහෙමයි අපි ලියෝගෙ ලෝකෙදි වැඩ කරන්නෙ. එන්න ඇතුළට.''

''මම ලියෝ ලෝකයට වෛර කරනවා.'' ෆ්‍රෑන්ක් මිමිනුවේය.

හේසාල් සිනාසුණාය.

ලියෝව වසර ගණනාවක් කාර්යබහුල කරවන තරමට එහි ඇතුළත දේවල් පිරී තිබිණි. කාමරය අර්ධ ලෝහිත කඳවුරේ කම්මල තරම් විශාල වූ අතර බිත්ති දිගට ලෝකඩ මුදුනකින් යුත් වැඩ මේස සවිකර තිබිණි. එසේම එහි බඳුන්වල පැරණි ලෝහ වැඩ උපකරණ පුරවා තිබිණි. කොටස්වලට වෙන්කර විවිධ අදියරවල තිබූ ලෝකඩ සහ රන් ගෝල දුසිම් ගණනක් අවට විසිරී තිබිණි. ලිහිල් ගියර සහ රැහැන් පොළොවේ ඇදී තිබිණි. ඝන ලෝහ කම්බි එක් එක් මේස දෙසින් කාමරයේ පිටුපසට ඇද තිබුණු අතර එතැන නාට්‍යගාරයක ශබ්ද පාලන ස්ථානය මෙන් අවුරන ලද අට්ටාලයක් විය. අට්ටාලයේ දෙපසින් පියගැට පෙළ බැගින් තිබිණි. සියලු රැහැන් ඒ තුළට යොමු වී ඇති බව පෙනී ගියේය. වම් පස පියගැට පෙළ අසල වූ ලාච්චු පෙළ හම් සිලින්ඩර වලින් පිරී පැවතිණි- සමහරවිට ඒවා පැරණි ලියවිලි බාහාලුම් විය හැකිය.

ලියෝ සපත්තු ගැලවෙන තරම් වේගයෙන් තම වම් පසට පනින පිට ඔහු සිටියේ හිස මේසය දෙසට හරවාගෙනය. දොරටුව අබියස සිටියේ ආයුධ සන්නද්ධ කුරුමිට්ටන් දෙදෙනෙකි- ලෝකඩ නලවලින් සෑදු ඇටසැකිලි පඹයන් මෙන් වූ ඔවුන් පූර්ණ රෝම යුද ඇඳුමෙන් සැරසී, අසිපත් සහ පලිහ දරා සිටියහ.

''විකාරයක්.'' ලියෝ එකකු අසලට ගියේය. ''මේවට ඇවිදින්න පුළුවන් නම් අපූරුයි.''

ෆ්‍රෑන්ක් කුරුමිට්ටන් වෙතින් ඉවතට ගැටුවේය. ''මේවට පණ ඇවිත් අපිට පහර දෙයිද?''

ලියෝ සිනාසුණේය. ''අවස්ථාවක්ම නැහැ. ඒවා සම්පූර්ණ නැහැ.'' ඔහු තම අසලම තිබූ කුරුමිට්ටාගෙ ගෙලට තට්ටු කළේය. ළය ඵලකය අස්සෙන් පැමිණ තිබූ තඹ රැහැන් එතැනින් බුරුල් වී එළියට පැන තිබිණි. ''බලන්න, ඔලුවෙ විදුලි සැපයුම විසන්ධි කරලා. ඒ වගේම මෙතන, වැලමිටේදී මේ සන්ධියේ කප්පි පද්ධතිය, එක පෙළට නැහැ. මගේ අනුමානය? රෝමන්වරු ග්‍රීක සැලැස්ම පිටපත් කරන්න උත්සාහ කරල තියෙනවා, ඒත් එයාලට ඒකට නිපුණතාවක් නැහැ.''

හේසාල් ඇහි බැම එසවූවාය. ''සංකීර්ණ දේවල් වලට රෝමවරු දක්ෂ නැහැ කියල මම හිතනවා.''

''එහෙම නැත්නම් අති දක්ෂ,'' ෆ්‍රෑන්ක් එකතු කළේය. ''නැත්නම් විචිත්‍ර.''

''හේයි, මම ඒක කිව්වෙ මම දකපු විදිහටයි.'' ලියෝ කුරුමිට්ටාගේ හිස සොලවමින් පැවසුවේය. ඔහු කුරුමිට්ටාගේ හිස සෙලවූයේ කුරුමිට්ටාද ඔහු පැවසූ දෙයට එකඟ බව පවසන ආකාරයෙනි. ''තවමත්... හොඳ අපූරු උත්සාහයක්. මම පුරාවෘත්තවල අහල තියෙනවා රෝමවරු ආකිමිඩීස්ගෙ[1] ලේඛන රාජ සන්තක කළා කියලා, ඒත්-''

''රාජසන්තක කළා?'' හේසාල් පුදුම වූ බව පෙනිණි. ''එයා පැරණි ගණිතඥයෙක් හරි කවුරුහරි නේද?''

ලියෝ සිනාසුණේය. ''එයා ඊට වඩා ගොඩක් වැඩි කෙනෙක්. එයා තමයි මෙතෙක් ජීවත් වූ හෙපියාස්ටස්ගෙ ප්‍රසිද්ධම පුත්‍රයා.''

ෆ්‍රෑන්ක් තම කන කැසුවේය. ''මම කලින් එයාගෙ නම අහල තියෙනවා, ඒත් ඔයා කොහොමද හරියටම කියන්නේ මේ කුරුමිට්ටෝ එයාගෙ සැලසුමක් කියලා?''

''එහෙම වෙන්න ඕනෙ.'' ලියෝ පැවසුවේය. ''බලන්න, මම ආකිමිඩීස් ගැන හැමදෙයක්ම කියවලා තියෙනවා. කැබින් නමයට එයා වීරයෙක්. මිනිහා ග්‍රීක හරිද? එයා ජීවත් වුණේ දකුණු දිග ඉතාලියෙ එක ග්‍රීක ජනපදයක. රෝමවරු ගිහිල්ල සේරම යටත් කර ගන්න කලින්. අන්තිමේදි රෝමවරු එයාගෙ නගරෙට ගිහිල්ලා ඒකත් විනාශ කළා. රෝම ජෙනරාල්ට ආකිමිඩීස්ව ඕනෙ වුණා, මොකද එයා එච්චරට වටින කෙනෙක් නිසා- හරියට පැරණි ලෝකයට අයින්ස්ටයින් වගෙ- ඒත් එක මෝඩ රෝම සොල්දාදුවෙක් එයාව මරල දැම්මා.''

''ඔයා ආයෙත් එතෙන්ට යනවා.'' හේසාල් මිමිණුවාය. ''මෝඩ සහ රෝමවරු කියන දෙක හැම තිස්සෙම එකට යන්නෙ නෑ, ලියෝ.''

ෆ්‍රෑන්ක් එකඟතාව පල කරන නියායෙන් හිස වැනුවේය. ''කොහොමවුණත්, ඔයා කොහොමද මේ සේරම දේවල් දන්නේ?'' ඔහු විමසුවේය. ''මේ අවට ස්පාඤ්ඤ සංචාරක උපදේශකයෙක්වත් ඉන්නවද?''

''නෑ, මනුස්සයෝ.''ලියෝ පැවසුවේය. ''ආකිමිඩීස් ගැන නොදන ඔයාට යම් යම් දේවල් නිර්මාණය කරන උපදෙවියෙක් වෙන්න බැහැ. ඒ හාදයා ඉතාම උසස් කෙනෙක්. එයා තමයි පයි අගය ගණනය

1 ආකිමිඩීස් ග්‍රීක ගණිතඥයෙක්, භෞතික විද්‍යාඥයෙක්, ඉංජිනේරුවෙක්, නව නිපැයුම්කරුවෙක් සහ තාරකා විද්‍යාඥයෙකි. ක්‍රි.පූ. 287-212 අතර කාලයේජීවත් වූ අතර පැරණි යුගයේ සිටි විශිෂ්ටතම විද්‍යාඥයන් අතුරින් කෙනෙකු ලෙස සැලකෙයි.

කළේ. අපි තවමත් ඉංජිනේරු වැඩවලදී පාවිච්චි කරන සේරම ගණිත කර්ම එයාගෙ සොයා ගැනීම්. එයා හයිඩ්‍රොලික් ඉස්කුරුප්පුව හඳුන්වල දුන්නා. ඒකෙන් තමයි නල දිගේ වතුර ගෙනියන්න පුළුවන් වුණේ.''

හේසාල් මුහුණ හැකිළුවාය. ''හයිඩ්‍රොලික් ඉස්කුරුප්පුව. මට සමාවෙන්න ඒ අනර්ඝ සාර්ථකත්වය ගැන නොදන හිටියට.''

''ඒ වගේම එයා දර්පණ භාවිත කරල සතුරු නැව් විනාශ කරන මාරක කිරණ නිපද වුවා.'' ලියෝ පැවසුවේය. ''ඒ ඇතිද ඔයාට බයවෙන්න!''

''මම ඒ ගැන මොනවහරි ටීවී එකේ දැක්කා.'' ෆ්‍රැන්ක් පැවසුවේය. ''එයාල තහවුරු කළා ඒක හරියන්නෙ නැහැ කියලා.''

''ආහ්, ඒකට හේතුව තමයි නූතන මිනිස්සු දිව්‍යමය ලෝකඩ පාවිච්චි කරන්නෙ කොහොමද කියල නොදන්න එක.'' ලියෝ පැවසුවේය. ''ඒක තමයි ප්‍රධාන දේ. ආකිමිඩිස් විශාල අඬුවකුත් නිර්මාණය කළා. ඒක හරියට දොඹකරයක් වගේ. ඒකෙන් සතුරු නැව් ජලයෙන් ඔසවල ගන්න පුළුවන් කම තිබුණා.''

''හරි, ඒක හරි අපූරුයි.'' ෆ්‍රැන්ක් පැවසුවේය.

''කොහොමවුණත්, එයාගෙ නගරෙ විනාශ කළා. ආකිමිඩිස්ව මරා දැම්මා. පුරාවෘත්ත වලට අනුව, රෝම ජෙනරාල්වරයා එයාගෙ නිපැයුම්වල හොඳ රසිකයෙක්, ඒ නිසා එයා ආකිමිඩිස්ගෙ කම්මලට ගිහින් සිහිවටන ගොඩක් රෝමයට අරගෙන ආවා. ඒවා ඉතිහාසයෙන් අතුරුදහන් වුණා.'' ලියෝ මේසය මත ඇති දෑ දෙසට අත දිගු කළේය. ''මේවා හැර...''

''ලෝහ දැල් පන්දු ද?'' හේසාල් විමසුවාය.

ඔවුන් බලමින් සිටින දේ පිළිගැනීමට නොහැකි වීම ලියෝට විශ්වාස කිරීමට නොහැකි විය. එහෙත් ඔහු නොරිස්සුම සඟවා ගත්තේය. ''හාදයිනේ, ආකිමිඩිස් ගෝල නිර්මාණය කළා. රෝමවරුන්ට ඒව තේරුම් ගන්න බැරි වුණා. එයාල හිතුවේ ඒවා මේ නිකම් කාලය අඟවන දෙයක් හෝ රාශි චක්‍රය අනුගමනය කරමින් හදපු දෙයක් කියලයි. මොකද ඒවා තාරකා සහ ග්‍රහලෝකවල රූපවලින් වැහිල තිබුණා. ඒත් ඒක හරියට රයිෆලයක් හොයාගත්ත කෙනෙක් ඒක හැරමිටියක් කියල හිතුව වගේ.''

''ලියෝ, රෝමවරු උසස් ඉංජිනේරුවෝ.'' හේසාල් ඔහුට සිහිපත් කළාය. ''එයාල වාරිමාර්ග, මහාමාර්ග ඉදි කළා-''

''ඔව්, අපුරුයි.'' ලියෝ පැවසුවේය. ''ආකිමිඩිස් ඉගෙනගත්තෙ තමාගෙන්මයි. එයාගෙ ගෝලවලට හැම දෙයක්ම කරන්න පුළුවන්, කාටවත් විශ්වාස කරන්න බැරි.''

එක්විටම ලියෝට තම නාසය ගිනි ගන්නවා වැනි අරුම පුදුම දැනීමක් ඇති විය. ඔහු හැකි ඉක්මනින් නිමා දමුවේය. එය සිදුවන්නේ ඔහු ලැජ්ජාවට පත් වූ විටය.

ඔහු ලාච්චු පෙළ වෙත දිව ගොස් ලේඛන ආවරණ වල සටහන් පරීක්ෂා කළේය. ''ආහ්, දෙවියනේ, මේ තියෙන්නෙ ඒක!''

ඔහු එක් ලේඛනයක් පිටපත ගත්තේය. ඔහු පැරණි ග්‍රීක භාෂාවේ විශිෂ්ටයකු නොවේ. එහෙත් 'ගෝල නිර්මාණය' යනුවෙන් එහි තිබූ සටහන කියැවීමට ඔහුට හැකියාව තිබිණි.

''හාදයිනේ, මේක තමයි නැතිවුණ පොත.'' ඔහු දැත් වෙව්ලමින් තිබිණි. ''මේක ලිව්වේ ආකිමිඩිස්, එයාගෙ ඉදිකිරීම් ක්‍රම ගැන විස්තර කරලා, ඒත් හැම පිටපතක්ම අතීත කාලයෙදීම නැති වුණා. මට මේක පරිවර්තනය කරන්න පුළුවන් නම්...''

හැකියාවන්වල නිමක් නොවීය. ලියෝගේ පැත්තෙන්, දැන් ගවේෂණය අලුත් මානයකට ගෙන ගොස් තිබිණි. ලියෝ ගෝල සහ ලේඛන ප්‍රවේසමෙන් මෙතැනින් ගෙන යා යුතු විය. මේවා බංකර 9 ට යනතෙක් ඔහු ආරක්ෂා කරනු ඇත. ඉන්පසු ඒවා අධ්‍යයනය කරනු ඇත.

''ආකිමිඩිස්ගේ රහස්.'' ඔහු මිමිණුවේය. ''හාදයිනේ, මේක ඩායිඩාලුස්ගෙ ලැප්ටොප් එකටත් වඩා ලොකුයි. අර්ධ ලෝහිත කඳවුරට රෝම ප්‍රහාරයක් එල්ල වුණොත්, මේ රහස් වලින් කඳවුර බේරගන්න පුළුවන්. සමහරවිට මේවායින් අපිට ගයියාව සහ යෝධයින්ව පරද්දන විදිහකුත් හොයා ගන්න ලැබෙයි.''

හේසාල් සහ ෆ්‍රැන්ක් විස්මිතව එකිනෙකා දෙස බැලූහ.

''හරි.'' හේසාල් පැවසුවාය. ''අපි මෙහෙ ආවෙ ලේඛන හොයාගෙන නෙමෙයි, ඒත් මම හිතනවා අපිට ඒව අරන් යන්න පුළුවන් වෙයි කියලා.''

''පිළිගන්නවා.'' ෆ්‍රැන්ක් පැවසුවේය. ''ඔයා මොකුත් හිතන එකක් නෑ කියලා මේ රහස්, අසංකීර්ණ මෝඩ රෝමවරුන් එක්කත් බෙදා ගන්න එක ගැන.''

''මොකක්?'' ලියෝ ඇසි පිය නොසලා ඔහු දෙස බලාගෙන සිටියේය. ''නෑ, බලන්න, මම අපහාස කරන්න හිතුවෙ නෑ- ඒ ගැන හිතන්න එපා. එකම දේ මේක හොඳ ප්‍රවෘත්තියක් කියන එකයි.''

දින ගණනකට පසු පළමු වරට ලියෝට සැබෑ බලපොරොත්තුවක හැඟීමක් දැනිණි.

වියයුතු ලෙසම, එය සිදු වන්නේ සියලු දේ අයහපත් වූ විටය.

හේසාල් සහ ෆ්‍රැන්ක් අසල මේසය මත, තිබූ ගෝලවලින් එකක් ක්ලික් හඬ නගා, වේගයෙන් කරකැවිණි. කටු සහිත පාද පෙළක් එහි නිරක්ෂයෙන් පිටතට විහිදුනේය. ගෝලය සිට ගත්තේය. ලෝකඩ කම්බි දෙකක් එහි මුදුනෙන් පිටතට නික්මී ටාසර් කම්බි මෙන් හේසාල් සහ ෆ්‍රැන්ක් මත පතිත විය. ලියෝගේ මිතුරන් දෙදෙනා පොළොව මත ඇද වැටිණි.

ලියෝ ඔවුන්ගේ උදව්වට පැමිණීමට සැරසුණත්, සෙලවීමට හැකියාවක් නොමැති බව පෙනුණු කුරුමිට්ටන් දෙදෙනා පණ ලද්දෝය. තම අසිපත් ඔසවා ගත් ඔවූහු ලියෝ දෙසට පැමිණියහ.

වම් පැත්තේ සිටි කුරුමිට්ටා වෘක හිසක් බඳු ඔහුගේ හිස් වැස්ම හැරවූයේය. එහි මුහුණක් කටක් තිබෙන බව නොපෙනුණත් හුරුපුරුදු බොල් හඬක් එහි මුහුණු ආවරණයට පිටු පසින් නැඟී ආවේය.

''උඹට අපෙන් පැනල යන්න බෑ, ලියෝ වැල්ඩේස්.'' එය පැවසුවේය. ''අපි කැමති නෑ යන්ත්‍ර අත් කරගන්න. ඒත් ඒවා සංචාරකයන්ට වඩා හොඳයි.'' උඹට මෙතනින් පණපිටින් යන්න ලැබෙන්නෙ නෑ.''

# 39
# ලියෝ

**එක් දෙයක් ගැන ලියෝ නෙම්සිස් සමඟ එකඟ විය.** වාසනාව රැවටිල්ලකි. අඩු ගානේ එය ලියෝගේ වාසනාවට පැමිණි විට.

පසුගිය සිසිරයේදී එකැස් යෝධ පවුල ජේසන්ව හා පිපර්ව උණු සෝස් සමඟ රෝස්ට් කිරීමට සූදානම් වන අයුරු ලියෝ භීතියෙන් යුතුව බලා සිටියේය. තමාගේම ආකාරයකින් ඔහු තම උපක්‍රමය ක්‍රියාවට නංවා තම මිතුරන් බේරා ගැනීමට සමත් විය. එහෙත් අඩු වශයෙන් ඔහුට කල්පනා කිරීමටවත් කාලයක් ලැබී තිබිණි.

දැන්, එතරම් කාලයක් නැත. එයිඩෝලන් කෙනෙකු සවින් අත්කරගත් බෝලින් බෝලයේ අත් පසුරු පහරට ලක් වූ ෆ්‍රෑන්ක් සහ හේසාල් බිම වැටී සිටියහ. සන්නාහ වලින් සැරසුණු දෙදෙනා ඔවුන්ව මරා දැමීමට සූදානමින් පසුවූහ.

ලියෝට ඔවුන්ව ගින්නෙන් පුපුරුවා හැරීමට නොහැකිය. සන්නාහ ඇඳුමට ඉන් හානියක් කළ නොහැකිය. අනෙක් අතට හේසාල් සහ ෆ්‍රෑන්ක් බෙහෙවින් සමීපව සිටියහ. ඔහුට ඔවුන්ව පුළුස්සා දැමීමට අවශ්‍ය නොවීය. නැතහොත් ෆ්‍රෑන්ක්ගේ ජීවිතය පාලනය කරන දැව කැබැල්ලට අහම්බයකින් හෝ හානි කිරීමට ඔහුට අවශ්‍ය වූයේ නැත.

ලියෝට වම් පසින්, සිංහ හිස්වැස්මක් පැළඳි සන්නාහ ඇඳුමින් සිටින්නා සිහිසුන්ව සිටින හේසාල් සහ ෆ්‍රෑන්ක් දෙසට හිස හැරවූයේය.

*ගැහැනු සහ පිරිමි උපදෙවිවරු,* සිංහ හිස ඇති තැනැත්තා පැවසුවේය. *අනෙක් අය මැරෙනවා නම්, මේක වෙයි.* ඔහුගේ කුහරමය

මුහුණු ආවරණය ලියෝ දෙසට හැරිණි. *අපිට උඹව ඕනෙ නැහැ, ලියෝ වැල්ඩෙස්.*

''ඕහ්, හේයි.'' ලියෝ ජයග්‍රාහී සිනාවක් පෑමට උත්සාහ කළේය. ''ඔයාලට නිතරම ඕනෙ වුණේ ලියෝ වැල්ඩෙස්වනෙ.''

ඔහු තම බිය සහ බලාපොරොත්තු සුන් වූ බව සඟවා ගෙන විශ්වාස වර්ධනය කර ගැනීමට බලාපොරොත්තුවෙන් තම අත් පිරිමැද්දේය. තම කමිසයේ ලියෝ කණ්ඩායම ලෙස සටහන් කිරීමට ප්‍රමාද වැඩි බව ඔහුට සිතිණි.

අවසනාවකට, නාසිසස් මිතුරු සමාජය මෙන් සන්නාහ පැළැඳි දෙදෙනා වසඟ කර ගැනීම පහසු වූයේ නැත.

වෘක හිසැති හිස් වැස්ම පැළඳි කෙනා ගෙරවූයේය. ''මම උඹේ මනස ඇතුළේ ඉඳල තියෙනවා, ලියෝ. යුද්ධයය පටන් ගන්න මම උඹට උදව් කළා.''

අර සංචාරකයන් ගැන තමා කරදර වූයේ ඇයි දැයි දැන් ඔහුට තේරුම් ගියේය. එසේම මොවුන්ගේ හඬ තමාට මෙතරම් හුරුපුරුදු ඇයි දැයි ඔහුට තේරුම් ගියේය. ඔහු එය තම මනස තුළින් අසා තිබිණි ''අර බැලිස්ටාව ක්‍රියාකරවන්න මාව පෙළඹෙව්වෙ උඹද?'' ලියෝ විමසුවේය. ''උඹ ඒකට ද උදව්වක් කියන්නේ?''

''මම දන්නවා උඹ හිතන්නෙ කොහොමද කියලා,'' වෘක හිසැත්තා පැවසුවේය.''මම දන්නවා උඹේ සීමාවන්. උඹ පුංචියි, වගේම තනිවෙලා. උඹට ආරක්ෂාවට යාළුවො අවශ්‍යයි. ඔවුන් නැතිව, උඹට බැහැ මට විරුද්ධව නැගී සිටින්න. මම පොරොන්දු වුණා ආයෙ අත්කර නොගන්න. ඒත් මට තවමත් උඹව මරන්න පුළුවන්.''

සන්නාහ පැළඳි දෙදෙනා ඉදිරියට පියවර තැබූහ. ඔවුන්ගේ අසිපත් තුඩු ලියෝගේ මුහුණ අඟල් කීපයක් මැතින් නලියමින් තිබිණි.

ලියෝගේ බිය එක්වරටම තදබල කෝපයක් බවට පත්විය. වෘක හිස්වැස්ම පැළඳි මේ එයිඩෝලන් ඔහුට නින්දා කළේය. ඔහුව පාලනය කරමින් නව රෝමයට පහර දීමට ඔහුව පෙළඹවූයේය. එයින් තම මිතුරන් අනතුරේ දැමුවා පමණක් නොව ඔවුන්ගේ ගවේෂණයද අසම්පූර්ණ කළේය.

ලියෝ කම්මලේ මේස මත තිබූ අක්‍රිය ගෝල දෙස බැලුවේය. ඔහු තම ඉණෙහි බැඳි උපකරණ පටිය ගැන සලකා බැලුවේය. ඔවුනට

පිටුපසින් තිබූ අට්ටාලය ගැන සිතුවේය. *අබලි කුලුන මෙහෙයුම උපත* ලද්දේය.

''පළවෙනි එකඃ උඹ මා ගැන දන්නෙ නෑ.'' ඔහු වෘක හිසැත්තාට පැවසුවේය. දෙවෙනි එකඃ බායි.''

පියගැට පෙළ වෙත දිව ගිය ඔහු එහි මුදුනට නැග ගත්තේය. සන්නාහ හැඳි දෙදෙනා භයානක වුවත්, එතරම් වේගවත් අය නොවූහ. ලියෝ සැකකළ අයුරින්ම, අට්ටාලයේ එක් එක් පැතිවලින් දොරටු- නැමිය හැකි ලෝහ ගේට්ටු- තිබිණි. මේ මොහොතේ මෙන්, එහි ක්‍රියාකරුවන්ට පාලනයක් නැති, ඔවුන්ගේ නිර්මාණ ආරක්‍ෂා කිරීමට වුවමනා වූවා විය යුතුය. ගේට්ටු දෙකම වසා දමූ ලියෝ ගින්දර කැඳවා, අගුල් වලට ගිනි තැබුවේය.

සන්නාහ පැළඳි දෙදෙනා දෙපැත්තේ සිරවූහ. ඔවූහු ගේට්ටු සොලවමින් ඒවාට කඩු වලින් පහර දුන්හ. ''මේක මෝඩ වැඩක්.'' සිංහ හිසැත්තා පැවසුවේය. ''උඹට පුළුවන් උඹේ මරණය ප්‍රමාද කරගන්න විතරයි.''

''මරණය කල්දැමීම මගෙ ප්‍රියතම විනෝදාංශ වලින් එකක්.'' ලියෝ තම අලුත් නිවස පරීක්‍ෂා කළේය. උඩ සිට බලන විට වැඩපළ පෙනුණේ පාලන පුවරුවක් මෙන් තනි මේසයක් ලෙසිණි. එය අබලි ද්‍රව්‍යවලින් පිරී තිබුණු අතර එතැන බොහෝමයක් ඉක්මනින්ම ලියෝගේ අවධානයෙන් ගිලිහී ගියේය. කිසිදා වැඩ නොකරන මිනිස් කැටපෝලයක රූප සටහනක්, අමුතු කළු අසිපතක් (ලියෝට අසිපත් ගැන හොඳ දැනුමක් නොතිබිණි) විශාල ලෝකඩ කණ්ණාඩියක් (ලියෝගේ ප්‍රතිබිම්බය බියකරු විය) සහ නොරිස්සුම හෝ නුහුරු බව නිසා යමෙකු විසින් කඩා දැමූ උපකරණ කට්ටලයක් ඒ අතර විය.

ඔහු ප්‍රධාන ව්‍යාපෘතිය කෙරෙහි තම අවධානය යොමු කළේය. මේසයේ මැද යමෙකු විසින් ආකිමිඩීස් ගෝලය කැබලි වලට වෙන් කර තිබිණි. ගියර, දුණු, ලීවර සහ දඬු ඒ අවට විසිරී තිබිණි. කාමරයේ යටින් ඇද තිබූ ලෝකඩ රැහැන් සියල්ලම ගෝලයට යටින් වූ ලෝහ තැටියකට සම්බන්ධ විය. හදවතේ සිට යන ධමනි සේ දිව්‍යමය ලෝකඩ වැඩපළ පුරාම දිවගොස් ඇති බව ලියෝ වටහා ගත්තේය. මේ ස්ථානයෙන් මායාමය ශක්තියක් ඇති කිරීමට එය සූදානම් කර තිබිණි. ''එක බාස්කට් බෝලයක් ඔවුන් සියල්ලම පාලනය කරනවා.'' ලියෝ මිමිණුවේය. මේ ගෝලය ප්‍රධාන නියාමකය විය. ඔහු සිටගෙන සිටින්නේ පැරණි රෝම මෙහෙයුම් පාලකයක් ඉදිරියේය.

''ලියෝ වැල්ඩේස්.'' ආත්මය කෑ ගැසුවේය. ''මේ ගේට්ටුව ඇරපන්, නැත්නම් මම උඹව මරනවා.''

''තරමක් හොඳ සහ නිර්ලෝභී අවස්ථාවක්!'' ලියෝ පැවසුවේය. ඔහුගේ දෑස් තවමත් ගෝලය වෙත යොමු වී තිබිණි. ''මට මේක ඉවර කරන්න දීපන්. අවසන් ඉල්ලීම. හරි නේද?''

එයින් ආත්ම ව්‍යාකූල වූ බව පෙනී ගියේ ඔවුන් මොහොතකට ගේට්ටුවලට පහර දීම නැවැත් වූ බැවිණි.

ගැලවූ කොටස් එකලස් කරමින්, ලියෝගේ දෑත් ගෝලය මත දිව ගියේය. *මොන මඟුලකටද රෝමවරු මෙච්චර ලස්සන යන්ත්‍රයක් කෑලි ගැලෙව්වේ?* ඔවුහු ආකිමිඩිස්ව මරා දමූහ, ඔහු සන්තක දෑ සොරකම් කළහ. ඉන්පසු ඔවුන්ට කිසිදා තේරුම්ගත නොහැකි වූ උපකරණ අවුල් ජාලයක් කළහ. තවත් පැත්තකින්, අඩු ගානෙ ලියෝට නැවත සවිකළ හැකි පරිදි ඔවුහු වසර දෙදහසක් පමණ ඒවා සුරැකිව තබා තිබුණහ.

එයිඩෝලන්ස්ලා නැවත ගේට්ටුවලට පහර දීමට පටන් ගත්හ.

''කවුද ඒ?'' ලියෝ විමසුවේය.

''වැල්ඩේස්!'' පහළ සිටි වෘක හිසැත්තා පැවසුවේය.

''වැල්ඩේස් කවුද?'' ලියෝ විමසුවේය.

අවසානයේ තමා උත්සාහය සාර්ථක නොවන බව එයිඩෝලන්ස්ලාට වැටහුණා විය යුතුය. ඉන්පසු, වෘක හිසැත්තා සැබැවින්ම ලියෝගේ සිත දන්නේ නම්, ඔහුගේ සහයෝගයෙන් ලබාගත හැකි වෙනත් ක්‍රම ගැන ඔහු සිතා බලනු ඇත. ලියෝ වේගයෙන් වැඩ කළ යුතුව තිබිණි.

ඔහු ගියර සම්බන්ධ කළේය. එකක් වැරදුණු අතර, නැවත පටන් ගත යුතු විය. හෙපියාස්ටස්ගේ අත් බෝම්බය, මේක අමාරුයි.

අවසානයේ ඔහු අවසන් දුන්න සවි කළේය. ගොං රෝමවරු කම්පන සකසනය මුළුමනින්ම කඩා දමා තිබුණත්, ලියෝ ඔරලෝසු සාදන්නන්ගේ උපකරණයක් ගෙන යම් අවසන් ක්‍රමාංකන කීපයක් සිදු කළේය. මෙය සැබැවින්ම ක්‍රියාත්මක වන බව ඔහුට සහතික විය.

ඔහු ආරම්භක දඟරය එතුවේය. ගියර හැරෙන්නට පටන් ගත්තේය. ගෝලයේ මුදුන වසා දැමූ ලියෝ එහි ඒක කේන්ද්‍රීය රවුම් අධ්‍යයනය කළේය. ඒවා වැඩපළේ දොරට බෙහෙවින් සමාන විය.

''වැල්ඩේස්.'' වෘක හිසැත්තා පැවසුවේය. ''අපේ තුන්වැනි මිත්‍රයා උඹේ යාළුවන්ව මරා දමයි.''

ලියෝ හුස්ම නොහෙලා සාප කළේය. අපේ තුන්වැනි මිත්‍රයා. ඔහු හේසාල්ට සහ ෆ්‍රෑන්ක්ට පහර දුන් කටු සහිත පාද තිබූ ටාසර් බෝලය දෙස බැලුවේය. තුන්වැනි එයිඩෝලන් එය තුළ සැඟවී සිටින බව ඔහු අවබෝධ කර ගත්තේය. එහෙත් තවමත් මේ පාලන ගෝලය ක්‍රියාකරවීම සඳහා ලියෝට නිවැරදි අනුපිළිවෙළ නිගමනය කළ යුතුව තිබිණි.

''ඔව්, හරි.'' ඔහු පැවසුවේය. ''ඔයාල මාව ගත්තා. එක තත්ප...''

''තව තත්පරයක්වත් නැහැ!'' වෘක හිසැත්තා කෑ ගැසුවේය. ''දැන්මම මේ ගේට්ටු ඇරපන්, නැත්නම් උන් මැරෙයි.''

අත්කරගත් ටාසර් බෝලය තම අඬු විහිදුවා තවත් කම්පනයක් හේසාල් සහ ෆ්‍රෑන්ක් වෙත මුදා හැරියේය. ඔවුන්ගේ සිහිසුන් සිරුරු ගැස්සිණි. ඒ ආකාරයේ විද්‍යුත් බලයකින් ඔවුන්ගේ හදවත් නැවතීමට හැකිය.

ලියෝ කඳුළු පිරි දෙනෙතින් බලා සිටියේය. මෙය බෙහෙවින් අසීරුය. ඔහුට එය කළ නොහැකිය.

ඔහු ගෝලයේ මුහුණත දෙස බැලුවේය- වළලු හතයි, සෑම එකක්ම කුඩා ග්‍රීක අක්ෂර, ඉලක්කම් සහ රාශි චක්‍රයේ සංකේත වලින් පිරී තිබිණි. පිළිතුර පයි විය නොහැකිය. ආකිමිඩීස් කිසිවිටෙකත් එකම දේ දෙවරක් නොකරන්නෙකි. අනෙක් අතට, ගෝලය මතට අත තබන විට අනුක්‍රමය අහඹු ලෙස උත්පාදනය වන බව ලියෝට දැනිණි. එය ආකිමිඩීස් පමණක් දැන සිටි යමක් විය යුතුය.

ඔහු ආකිමිඩීස්ගේ අවසන් වදන් බැලුවේය. *මගේ ගෝල වලට බාධා කරන්න එපා.*

කිසිවකු එහි අර්ථය දැන සිටියේ නැත. එහෙත් ලියෝට එය ගෝලයට යෙදවීමේ හැකියාව තිබිණි. අගුල බෙහෙවින් සංකීර්ණ විය. ලියෝට වසර කීපයක් ලැබුණොත්, ඔහුට මේ සලකුණු හඳුනාගෙන නිවැරදි සංයෝජනය සොයා ගැනීමට හැකිවනු ඇත. එහෙත් ඔහුට තත්ත්පර කීපයක්වත් නොතිබිණි.

ඔහුගේ කාලය ගෙවී යමින් තිබිණි. වාසනාව ගෙවී යමින් තිබිණි. එසේම ඔහුගේ මිතුරන් මිය යමින් තිබිණි.

*ප්‍රශ්නය ඔයාට විසඳිය නොහැකියි.* ඔහුගේ සිත තුළින් හඬක් නැගිණි.

නෙම්සිස්... මේ මොහොත අපේක්ෂා කරන ලෙස ඇය ඔහුට පැවසුවාය. තම සාක්කුවට අත දමූ ලියෝ වාසනාවේ විස්කෝතුව අතට ගත්තේය. ඇගේ උපකාරය වෙනුවෙන් විශාල මිලක් අවැසි බවට දෙවඟන ඔහුට අනතුරු අඟවා තිබුණාය. හරියට ඇසක් අහිමි වීම වගේ. එහෙත් ඔහු උත්සාහ නොකළොත් ඔහුගේ මිතුරන් මිය යනු ඇත.

''මට මේ ගෝලයේ කේන්ද්‍රයට ප්‍රවේශ වීම අවශ්‍යයි.'' ඔහු පැවසුවේය. ඔහු විස්කෝතුව කඩා විවෘත කළේය.

# 40
# ලියෝ

**කුඩා කඩදාසි කොළ කැබැල්ල දිග හැරි ලියෝ එහි ලියා තිබූ දේ කියැවීය.**

එය ඔබේ ඉල්ලීමද? බැරෑරුම්ව? (අවසානයි)

එහි පිටුපස මෙසේ ලියැවී තිබිණි.

ඔබේ වාසනාවන්ත අංක- දොළහ, ජුපිටර්, ඔරයන්, ඩෙල්ටා, තුන, තීටා, ඔමේගා (ගයියාගෙන් පළිගන්න, ලියෝ වැල්ඩේස්)

ගැහෙන ඇඟිලිවලින්, ලියෝ වළලු කරකැවූයේය.

ගේට්ටුවලට පිටතින්, වෘක හිසැත්තා නොරිස්සුමෙන් කෑ ගැසුවේය. ''යාළුවො උඹට ප්‍රශ්නයක් නෙමෙයි නම්, සමහරවිට උඹට තව ප්‍රසාද දීමනාවක් ඕනෙ ඇති. සමහරවිට මට ඒ වෙනුවට මේ ලේඛන- ආකිමිඩීස්ගේ මිල කළ නොහැකි කාර්යය- විනාශ කරන්න වෙයි.''

අවසන් වළල්ල නිසි තැනට පැමිණියේය. ගෝලයට බලය ලැබෙමින් සිහින් ශබ්දයක් නිකුත් වන්නට විය. ලියෝ එහි මතුපිට තම අත ගෙන ගියේය, කුඩා බොත්තම් සහ ලීවර ඔහුගේ නියෝග අපේක්ෂාවෙන් පසුවන බව ඔහුට දැනිණි.

ඉන්ද්‍රජාලික සහ විද්‍යුත් කම්පන දිව්‍යමය ලෝකඩ රැහැන් හරහා ලැබෙමින් මුළු කාමරය පුරා ගමන් කළේය.

ලියෝ කෙදිනකවත් සංගීත භාණ්ඩ වාදනය කර නොතිබුණත්, මෙය ඒ ආකාරයේ එකකැයි ඔහු සිතුවේය. තම දෑතින් කරන දේ ගැන එතරම් නොසිතා, තමාට නිර්මාණය කිරීමට අවශ්‍ය කුමන ආකාරයේ ශබ්දයක්ද යන්න ගැන පමණක් සිත යෙදවීම ප්‍රමාණවත් බව ඔහු දැන සිටියේය.

ඔහු සුළුවෙන් පටන් ගත්තේය. ඔහු පහළ ප්‍රධාන කාමරයේ තිබූ රන් ගෝලයට සිත යොමු කළේය. රන් ගෝලය කම්පනය වන්නට විය. පාද තුනක් පිටතට නික්මුණු පසු එය ටාසර් බෝලය මතට ගැටුවේය. රන් ගෝලයේ මුදුනින් කුඩා රවුම් කියතක් පිටතට නික්මුණු අතර එයින් ටාසර් බෝලයේ මොළය කපා දමන්නට විය.

ලියෝ තවත් ගෝලයක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළේය. එම ගෝලය කුඩා හත්තක් වැනි ගින්නක් පිට කරමින් පුපුරා ගියේය.

''උඹ මොනවද කරන්නෙ?'' වෘක හිසැත්තා විමසුවේය. ''උඹේ මෝඩකම් නවත්තලා යටත් වෙයන්.''

''ආහ්, ඔව්, මම යටත් වෙනවා.'' ලියෝ පැවසුවේය. ''මම සම්පූර්ණයෙන් යටත් වෙමින් ඉන්නෙ!''

ඔහු තුන්වැනි ගෝලයේත් පාලනය ගැනීමට උත්සාහ කළේය. එයද කැඩී ගොස් තිබිණි. මේ පැරණි නිපැයුම් නටඹුන් වී යාම ගැන ලියෝ තුළ සතුටක් නොවූ නමුත්, මෙය ජීවිතයත් මරණයත් අතර කාරණයකි. මිනිසුන්ට වඩා යන්ත්‍රවලට සලකතැයි ෆ්‍රැන්ක් ඔහු චෝදනා කළත්, ආරක්ෂා කළ යුත්තේ පැරණි ගෝල ද තම මිතුරන්ද යන කාරණයේදී, එතැන විකල්පයක් නොවීය.

සිවුවැනි උත්සාහය සාර්ථක විය. රතු මැණික් එබ්බවූ ගෝලයේ මුදුන විවර වී හෙලිකොප්ටර් තල දිග හැරෙන්නට විය. බියුෆෝඩ් මේසය මතන නොසිටීම ගැන ලියෝ සතුටු විය- සිටියා නම් ඔහු මෙයට ආදරය කරනු ඇත. රතු මැණික් ගෝලය ගුවනට නැග කෙළින්ම ලාච්චු පෙළ වෙත ගියේය. ගෝලයේ මැදින් සිහින් රන් බාහු නික්මුණු අතර ඒවායින් වටිනා ලේඛන ආවරණ ඩැහැගත්තේය.

''ඇති!'' වෘක හිසැත්තා කෑ ගැසුවේය. ''මම විනාශ කරනවා. ඔය-''

ඔහු ආපසු හැරෙනවිට ලේඛන රැගත් රතු මැණික් ගෝලය ආපසු ඇදෙන අයුරු පෙනිණි. කාමරය හරහා ඇදී ගිය එය එහි කොණක නතර විය.

''මොකක්?'' වෘක හිසැත්තා කෑ ගැසුවාය. ''සිරකරුවන් මරා දමනු!''

ඔහු කතා කරමින් සිටින්නේ ටාසර් බෝලය සමඟ විය යුතුය. අවාසනාවකට ටාසර් බෝලයට එයට එකඟ වීමට තරම් හැඩයක් ඉතිරි වී නොතිබිණි. ලියෝගේ රන් ගෝලය එහි මුදුන කපා විවර කර, එහි ගියර, වයර් ආදිය එළියට අදිමින් සිටියේය.

දෙවියන්ට ස්තූතිවන්ත වන්නට ෆ්‍රැන්ක් සහ හේසාල් සිහි ලබමින් සිටියහ.

සිංහ හිසැත්තා දෙසට හැරුණු වෘක හිසැත්තා ඔහුව ඇමතුවේය. ''එන්න! අපිම ගිහින් උප දෙවිවරු මරල දාමු.''

''මම එහෙම හිතන්නෙ නෑ, හාදයිනේ.'' ලියෝ සිංහ හිසැත්තා දෙසට හැරුණේය. ඔහුගේ දෑත් පාලන ගෝලය මත දිව යනවාත් සමඟ , කම්පන පොළොව තුළින් ඇදී යන අයුරු ඔහුට දැනුණේය.

වෙව්ලා ගිය සිංහ හිසැත්තා තම අසිපත පහත දැමුවේය.

ලියෝ විලිස්සුවේය. ''දැන් උඹලා ඉන්නේ ලියෝ ලෝකයේ.''

ආපසු හැරුණු සිංහ හිසැත්තා වේගයෙන් පඩිපෙළ බැස්සේය. හේසාල් සහ ලියෝ වෙත යනු වෙනුවට, ඔහු විරුද්ධ පැත්තේ පියගැට පෙළට ගොස් තම සගයාට මුහුණ දුන්නේය.

''උඹ මොනවද කරන්නේ?'' වෘක හිසැත්තා විමසුවේය. ''අපිට-''

සිංහ හිසැත්තා තම පලිහෙන් වෘක හිසැත්තාගේ ළයට පහර දුන්නේය. ඔහුගේ කඩු මිට සගයාගේ හිස් වැස්ම මත පතිත විය. වෘක හිසැත්තා පැතලි වී, හැඩය වෙනස් වී ගියේය. ඒ ගැන ඔහු තුළ සතුටක් නොවූ බව පෙනිණි.

''ඕක නවත්තපන්!'' වෘක හිසැත්තා කෑ ගැසුවේය.

''මට බැහැ!'' සිංහ හිසැත්තා පැවසුවේය.

ලියෝ සටන මෙහෙය වීමට පටන් ගත්තේය. ඔහු දෙන්නාගේම සන්නාහ ඇඳුම් ගලවා, කඩු සහ පලිහ ඉවත් කර සටන් වදින ලෙස නියෝග කළේය. ''වැල්ඩේස්!'' වෙව්ලන හඬින් වෘක හිසැත්තා පැවසුවේය. ''උඹ මේ වෙනුවෙන් මැරෙයි.''

''ඔව්.'' ලියෝ පැවසුවේය. ''දැන් කවුරු කාවද අත්කරගෙන ඉන්නෙ, කැස්පර්?''

යන්ත්‍රික මිනිසුන් පඩිපෙළින් පහළට පෙරළී ගියහ. ලියෝ ඔවුන්ට පා පහරක් දී තවත් ඈතට පෙරලා දැමුවේය. ඔවුන්ගේ සන්ධි වලින් දුම් දමන්නට පටන් ගත්තේය. කාමරයේ තිබූ අනෙක් ගෝල වලටද ප්‍රාණය ලැබෙමින් තිබුණේය. ලියෝ අත තිබූ පාලන ගෝලය අසාමාන්‍ය ලෙස රත් වී තිබිණි.

''ෆ්‍රැන්ක්, හේසාල්.'' ලියෝ කෑ ගැසුවේය. ''නැගිටින්න.''

ඔහුගේ මිතුරන් තවමත් අඩ සිහියෙන්, දුම් දමන යාන්ත්‍රික මිනිසුන් දෙස බලාගෙන සිටියත්, ඔවුන්ට ඔහුගේ අනතුරු ඇඟවීම වටහාගත හැකි විය. ෆ්‍රැන්ක් හේසාල්ව අසලම තිබූ මේසය යටට ඇඳගෙන ඇයව ආවරණය කර ගත්තේය.

ගෝලයේ එක් අවසන් හැකිලීමත් සමඟ, ලියෝ පද්ධතිය හරහා තවත් විශාල කම්පනයක් යැවීය. සන්නද්ධ රණ ශූරයයෝ පුපුරා කැබලි වී ගියේය. දඬු, පිස්ටන් සහ ලෝකඩ කැබලි කාමරය පුරා විසිරී ගියේය. සියලු මේස මත තිබූ ගෝල, සෝඩා මෙන් පුපුරා ගියේය. ලියෝගේ රන් ගෝලය ගල් විය. ඔහුගේ පියාඹන රතු මැණික් ගෝලය ලේබන බහාලුම් සමඟ බිම පතිත විය.

ගිනි පුළිඟු නැගෙන හඬ හැරුණු විට කාමරය හදිසි නිහඬතාවක ගැලිණි. වාතය දැවෙන මෝටර් රථ එන්ජිමක ගන්ධයෙන් පිරී ගියේය. ලියෝ පියගැට පෙළ අසලට දිව යන විය, ෆ්‍රැන්ක් සහ හේසාල් නිරුපද්‍රිතව මේසය යට සිටින අයුරු පෙනී ගියේය. ඔවුන් එකිනෙකා වැළඳ ගනු දකීමේ දී ඔහුට මින් පෙර කිසිදු විටෙක මෙවන් සතුටක් දැනී නොතිබිණි.

''ඔයාල පණ පිටින්!'' ඔහු පැවසුවේය.

හේසාල්ගේ වම් ඇස වැසී තිබිණි. සමහරවිට ඒ ටාසර් බෝලයේ කම්පනය නිසා විය හැකිය. ඒ හැරුණු විට ඇය හොඳින් සිටින බව පෙනිණි. ''ආහ්, ඇත්තටම මොකක්ද වුණේ?''

''ආකිමිඩිස් ආවා.'' ලියෝ පැවසුවේය. ''එක අවසන් දර්ශනයකට ප්‍රමාණවත් තරමට බලය අර පරණ යන්ත්‍රවල ඉතුරු වෙලා තිබුණා. මට ප්‍රවේශ කේතය ලැබුණාම, ඒක ලේසි වුණා.''

ඔහු නරක ලෙස දුම් දමමින් තිබූ පාලන ගෝලයට තට්ටුවක් දැම්මේය. එය නැවත සැකසිය හැකි වේදැයි ලියෝ නොදත් නමුත්, මේ

මොහොතේදී ඒ ගැන සිතීමට නොහැකි තරමට ඔහු සැහැල්ලුවෙන් සිටියේය. ''එයිඩෝලන්ස්ලා.'' ෆ්‍රෑන්ක් විමසුවේය. ''එයාල ගිහින්ද?''

ලියෝ විරිත්තුවේය. ''මගේ අවසන් නියෝගය එයාලගේ යතුරු අක්‍රිය කරන තරමට ප්‍රබලයි- මුලිකවම එයාලගෙ පරිපථ සේරම අගුළු වැටිලා හරය උණුවෙනවා.''

ඉංග්‍රීසි වලින්?'' ෆ්‍රෑන්ක් විමසුවේය.

''මම එයිඩෝලන්ලව විදුලි රැහැන්වල සිරකළා.'' ලියෝ පැවසුවේය.

''ඊට පස්සෙ මම එයාලව උණු කරල දැම්මා. ආයෙ එයාල කාටවත් කරදර කරන එකක් නැහැ.''

ලියෝ තම මිතුරන් දෙදෙනාට නැගිටීමට උදව් කළේය.

''ඔයා අපිව බේරගත්තා.'' ෆ්‍රෑන්ක් පැවසුවේය.

''ඔච්චර පුදුම වෙන්න එපා.'' ලියෝ විනාශ වූ වැඩපළ වටා නෙත් යොමු කළේය. ''මේවාට අන්තිම නරක විදිහට හානි වෙලා, ඒත් අඩුමගානෙ මට ලේඛන ටිකවත් බේරගන්න පුළුවන් වුණානෙ. මට ආපහු අර්ධ ලෝහිත කඳවුරට යන්න පුළුවන් වුණොත්, සමහරවිට මට පුළුවන් වෙයි ආකිමිඩිස්ගෙ නිපැයුම් ප්‍රතිනිර්මාණය කරන්නෙ කොහොමද කියල ඉගෙන ගන්න.''

හේසාල් තම හිසේ පැත්තක් පිරිමැද්දාය. ''ඒත් මට තේරුම් ගන්න බැහැ. නිකෝ කොහෙද? මේ උමඟ අපිව නිකෝ ළඟට ගෙනි යයි කියලයි හිතුවේ.''

ඔවුන් මෙතැනට පැමිණි මූලික හේතුව කුමක්දැයි ලියෝට මුළුමනින්ම අමතක වී තිබිණි. නිසැකවම නිකෝ මෙහි නැත. මේ ස්ථානය මෙතැනින් අවසන් ය. එහෙනම් ඇයි...''

''ඕහ්.'' කියත් ගෝලය තම හිස මත සිට තමාගේ වයර් සහ ගියර ඇද දමනවා වැනි හැඟීමක් ඔහුට ඇති විය. ''හේසාල්, ඇත්තටම කොහොමද ඔයා නිකෝ ඉන්න තැන හොයා ගන්නේ? මම කියන්නෙ, එයා ඔයාගෙ සහෝදරයා නිසා, ළඟපාත ඉන්නවනම් ඔයාට දැනෙනවා නේද?''

විද්‍යුත් කම්පන සත්කාරයෙන් තවමත් තෝන්තු වී සිටි අය ඇය මුහුණ හැකිළුවාය. ''සම්පූර්ණයෙන්ම නෙ- නෙමෙයි. සමහරවෙලාවට එයා කිට්ටුවෙන් ඉන්න කොට මට කියන්න පුළුවන්, ඒත් මම කිව්ව

වගේ, රෝමය ගොඩක් අවුල් සහගතයි. උමං සහ ලෙන් නිසා බාධක වැඩියි.''

''ඔයා එයාව හොයාගන්නෙ ඔයාගෙ ලෝහ- සෙවීමේ සංවේදනයෙන්.'' ලියෝ අනුමාන කළේය. ''එයාගෙ කඩුවෙන් නේද?''

ඇය ඇසිපිය ගැසුවාය. ''ඔයා කොහොමද දන්නේ?''

''ඔයා මෙහාට එනවනම් හොඳයි.'' ඔහු හේසාල් සහ ෆ්‍රෑන්ක්ව පාලන කාමරයට ගෙන ගොස් කළු අසිපතක් පෙන්වූයේය.

''ආහ්, නෑ.'' ෆ්‍රෑන්ක් ඇයව අල්ලා නොගත්තනම් ඇය බිම ඇද වැටෙනු නියතය. ''ඒක වෙන්න බැහැ! නිකෝගෙ කඩුව තිබුණෙ ලෝකඩ බඳුනෙ ඇතුළෙ එයා එක්කමයි. පර්සි එයාගෙ සිහිනයෙදි ඒක දැක්කා.''

''එක්කෝ හීනෙ වැරදි ඇති.'' ලියෝ පැවසුවේය. ''නැත්නම්, යෝධයො උගුලක් විදිහට කඩුව මෙතන තියන්න ඇති.''

''එහෙනම් මේක උගුලක්.'' ෆ්‍රෑන්ක් පැවසුවේය. ''අපිව මෙහෙට ගෙන්නගන්න ඇමක්.''

''ඒත් ඇයි?'' හේසාල් කෑ ගැසුවාය. ''මගෙ සහෝදරයා කොහොමද-?''

පිඹින හඬකින් පාලන කුටිය පිරී ගියේය. මුලින්ම ලියෝට සිතුණේ එයිඩෝලන්ලා ආපසු පැමිණ ඇතැයි කියාය. මේසය මත තිබෙන කණ්ණාඩියෙන් දුම් දමමින් තිබෙන බව ඉන්පසු ඔහුට අවබෝධ විය.

''අහෝ, මගේ අසරණ උපදෙව්වරු.'' ගයියාගේ නිදිබර මුහුණ දර්පණය මත දර්ශනය විය. සුපුරුදු ලෙසම, ඇය තම මුව චලනය කිරීමකින් තොරව කථා කළාය. ලියෝ එයට වෛර කළේය.

නුඹලාට, නුඹලාගේ විකල්පයක් තියෙනවා.'' ගයියා පැවසුවාය. ඇගේ හඬ කාමරය පුරා දෝංකාර දුන්නේය. එබැවින් හඬ කණ්ණාඩියෙන් පැමිණෙනවාට වඩා, එහි බිත්ති අතරින් ඇදී එන්නා සේ පෙනිණි.

ඔවුන් අවට සෑම තැනකම ඇය සිටින බව ලියෝ වටහා ගත්තේය. සැබැවින්ම, ඔවුන් සිටියේ මිහිමත ය. ආගෝ II නිර්මාණය කරගෙන ඔවුහු අහසේත්, මුහුදේත් සියලු තැන්හි ගමන් කළත්, ඔවුන්ගේ අවසානය සිදුවන්නේ පොළොවේය.

*මම නුඹලාට ගැලවීමේ අවස්ථාවක් පිරිනමන්න කැමතියි,* ගයියා පැවසුවාය. *නුඹලා ආපසු හැරිය යුතුයි. දැනටත් ඒකට ප්‍රමාද වැඩියි. නුඹලා පැමිණ තිබෙන්නේ මගේ උපරිම ශක්තිය ඇති, මම අවදිවන පැරණි භූමියටයි.*

ලියෝ ඉණ පටියෙන් මිටිය ගත්තේය. ඔහු කණ්ණාඩිය බිඳ දැමුවේය. ලෝහයෙන් තනා තිබූ බැවින් තේ බන්දේසියක් මෙන් යන්තම් තැලී ගියා විනා එයට හානියක් සිදු නොවීය. එහෙත් එයින් ගයියාගේ නාසය මුක්කන් වී පෙනිණි.

''උඹට පේන්න නැතුව ඇති, කිලුටු මූණ.'' ඔහු පැවසුවේය. ''උඹේ පුංචි වටකිරීම අසාර්ථක බව. උඹේ එයිඩෝලන්ල තුන් දෙනා ලෝකඩ ඇතුළෙ උණුවෙලා ගියා. ඒ වගේම අපි හොඳින් ඉන්නවා.''

ගයියා මෘදු සිනාවක් නැඟුවාය. *''ඔහ්, මගේ ආදරණීය ලියෝ, උඹලා තුන්දෙනා, උඹලාගේ මිතුරන්ගෙන් වෙන්වෙලා තියෙනවා. ඒක තමයි ප්‍රධානම දේ. ඒක තමයි ප්‍රධානම දේ.*

වැඩපළේ දොර තදින් වැසී ගියේය.

*උඹලා මගෙ තුරුලෙ සිරවුණා.* ගයියා පැවසුවාය. *මේ අතරෙ ඇනබෙත් චේසි තනියම එයාගෙ මරණයට මුහුණ දීලා, බියකරු මරණයකට, ඇගේ මවගේ ලොකුම හතුරාගේ දෑත් අතර.* කණ්ණාඩියේ දර්ශනය වෙනස් විය. ඇනබෙත් අඳුරු ගුහාවක බිම වැතිරී සිටින අයුරු ලියෝ දුටුවේය. රාක්ෂයින්ගෙන් ආරක්ෂා වීමට මෙන් ඇගේ අතේ ලෝකඩ කිණිස්ස රැඳී තිබිණි. ඇගේ වත වැහැරී තිබිණි. යම් ආකාරයක පතුරකින් ඇගේ පාදයක් වෙලා තිබිණි. ඇය බලමින් සිටින්නේ කුමක් දැයි ලියෝට දැක ගැනීමට නොහැකි වුවත් නිසැකවම එය යම් බියකරු දෙයක් විය යුතුය. ඒ රූපය ව්‍යාජයක් බව විශ්වාස කිරීමට ඔහුට අවශ්‍ය වුවත්, එය සැබෑවක් බවටත් එය දැන් සිදුවෙමින් පවතින්නක් බවටත් නරක හැඟීමක් ඔහු තුළ ඇති විය.

*අනෙක් අය,* ගයියා පැවසුවාය. *ජේසන් ග්‍රේස්, පිපර් මැක්ලියාන් සහ මගේ ආදරණීය මිත්‍රයා පර්සි ජැක්සන්- එයාල තව මිනිත්තුවක් විනාශ වෙයි.* දර්ශනය නැවතත් වෙනස් විය. *පර්සි රිප්ටයිඩය අතැතිව ඉදිරියෙන් ගමන් කළ අතර ජේසන් සහ පිපර් සර්පිලාකාර පියගැට පෙළ ඔස්සේ අන්ධකාරයට බසිමින් සිටියහ.*

*එයාලගෙ බලයන්ම පාවල දෙයි.* ගයියා පැවසුවාය. *එයාලගෙම මූලධාතුවලින් එයාල මිය යයි. මම බලාපොරොත්තු වෙනවා එයාල*

*ජීවිත බේරගනී කියලා. එයාලට ඊට වඩා හොඳ පරිත්‍යාගයක් කරන්න වෙයි. ඒත්, අහෝ, හේසාල් සහ ෆ්‍රෑන්ක්, ඔයාලට ඒක කරන්න වෙනවා. මගේ සැමියා ටික වෙලාවකින් නුඹලාව අරන් යයි. නුඹලාව පැරණි ස්ථානවලට ගෙන යයි. අවසානයේදී නුඹලාගේ රුධිරය මා අවදි කරාවි. එතෙක් නුඹලාගේ මිතුරන්ගේ විනාශය නැරඹීමට මම නුඹලාට ඉඩ දෙනවා. කරුණාකරලා... නුඹලාගේ අසාර්ථක ගවේෂණයේ අවසන් රූප බලා විනෝද වෙන්න."*

ලියෝ්ට එතැන බලා සිටීමට නොහැකි විය. ඔහුගේ අත්ල ධවල උණුසුමකින් දිලිසිණි. ඔහු තම දෑත් කණ්ණාඩියට තබා තද කරන විට ෆ්‍රෑන්ක් සහ හේසාල් පිටුපසට වූහ. එය උණු වී වෑස්සී ගියේය.

ගයියාගේ හඬ නිහඬ වී තිබිණි. ලියෝ්ට ඇසුණේ තම කන් තුළ ඇති රුධිරයේ ගර්ජනාව පමණකි. ඔහු දිගු හුස්මක් ගත්තේය. ''සමාවෙන්න.'' ඔහු තම මිතුරන්ට පැවසුවේය. ''එයා කේන්ති ගැස්සුවා.''

''අපි මොකද කරන්නේ?'' ෆ්‍රෑන්ක් විමසුවේය. ''අපි මෙතනින් පැනගෙන, අනිත් අයට උදව් කරන්න ඕනෙ.''

ලියෝ වැඩපළ පරීක්ෂා කළේය, දැන් එහි ඉතිරිව තිබුණේ ලෝකඩ ගෝලවල දුම් දමන කැබලි පමණකි. ඔහුගේ මිතුරන්ට තවමත් ඔහුව අවශ්‍ය ව තිබිණි. තවමත් මෙය ඔහුගේ සංදර්ශනයකි. ඔහු සතුව උපකරණ රැඳී ඉණ පටිය තිබෙන තාක්, ලියෝ වැල්ඩේස්, අසරණව හිඳිමින් උපදෙව්වරුන්ගේ මරණීය නාලිකාව නරඹමින් නොසිටිනු ඇත. ''මට අදහසක් ආවා.'' ඔහු පැවසුවේය. ''ඒත් ඒක කරන්න වෙන්නෙ අපි තුන්දෙනාටම.''

ඔහු ඔවුන්ට සැලැස්ම විස්තර කිරීමට පටන් ගත්තේය.

# 41
# පිපර්

**පිපර් තත්ත්වය හොඳ අතට හරවා ගැනීමට උත්සාහ කළාය.**

වරෙක ඇය කෝච් හෙජ්ගේ ගීත ගායනයට සවන් දෙමින් ජේසන් සමඟ නැව් තට්ටුව මත ඇවිදීමෙන් වෙහෙසට පත් වූවාය. ඔවුහු ඇවිදීමට උද්‍යානයට යාමට තීරණය කළහ.

හෙජ් අකැමැත්තෙන් අනුමැතිය දුන්නේය. ''මට පේන මානේ ඉන්න ඕනෙ.''

''අපි පොඩි ළමයිද?''ජේසන් විමසුවේය.

හෙජ් ගෙරවූයේය. ''ළමයි කියන්නෙ ළදරු එළුවන්ට. එයාල ලස්සනයි. ඒ වගේම එයාලගෙ සමාජයීය වටිනාකමක් තියෙනවා. නිසැකවම ඔයාල ළමයි නෙමෙයි.''

ඔවුහු පොකුණ අසල තිබූ විලෝ ගසක් යට පොරෝණාවක් අතුරා ගත්හ. තම කෝනුකෝපියාව ගත් පිපර් එයින් කෑම ලබා ගත්තාය. හොඳින් එතූ සැන්ඩ්විච්, ටින් කළ බීම, නැවුම් පළතුරු සහ (යම් හේතුවක් නිසා) දම් පැහැති අයිසින් වලින් සහ ඉටිපන්දම් වලින් වලින් සැරසුණු උපන්දින කේක් ගෙඩියක්ද එතැන තිබිණි.

ඇය මුහුණ හැකිළුවාය. ''කාගෙ හරි උපන් දිනයක්ද?''

ජේසන් ඇසක් ගැසුවේය. ''මම කාටවත් කියන්න ගියේ නැහැ.''

''ජේසන්!''

''ඒක ඕනෑවට වැඩි දෙයක්...'' ඔහු පැවසුවේය. ''සත්තකින්ම... ගිය මාසෙට කලින් වෙනකම් මගෙ උපන්දිනය කවදද කියලවත් මම දැනගෙන හිටියෙ නැහැ. අවසන් වතාවට කඳවුරට ආව වෙලාවෙ තාලියා තමයි ඒක කිව්වෙ.''

තම උපන් දිනය පවා නොදැන සිටීම කෙබඳු වන්නට හැකි දැයි පිපර් සිතුවාය. ජේසන්ට වසර දෙක පිරෙද්දී ඔහුව ලූපා වෘකයාට දෙනු ලැබීය. ඔහු කිසිවිටෙකත් ඔහුගේ මිනිස් මව ගැන නොදැන සිටියේය. ඔහු තම සහෝදරිය සමඟ එක් වූයේද පසුගිය සිසිර සමයේදීය.

''ජූලි පළවෙනිදා?'' පිපර් පැවසුවාය. ''කාලෙන්ඩ් හි ජූලි ''

''ඔව්.'' ජේසන් පැවසුවේය. ''රෝමවරු ඒක සුබ දවසක් කියල හිතුවා- මාසෙ පළවෙනි දවස ජූලියස් සීසර් වෙනුවෙන් නම් කළා. ජුනෝගේ පූජනීය දිනය.''

පිපර්ට ඒ ගැන තවදුරටත් ඇසීමටත්, එය සැමරිය යුතු තරම් දෙයක් නොවන බවට හැඟීමක් ඔහුට ඇත්නම්, එය සැමරීමටවත් වුවමනාවක් නොවීය.

''දාසය ද?'' ඇය විමසුවාය.

''ඔහු හිස සැලුවේය. ''ඕහ්, කොල්ලෝ. මට මගෙ රියදුරු බලපත්‍රය ගන්න පුළුවන්.''

පිපර් සිනාසුණාය. රාක්ෂයන් ගණනාවක් මරා දමා, බොහෝ වතාවක් ලෝකය බේරාගත් ජේසන් දහඩිය දමාගෙන රියදුරු පරීක්ෂණයට පෙනී සිටීම විකාරයක් සේ පෙනිණි. පරණ ලින්කන් රථයක 'ශිෂ්‍ය රියදුරු' ලෙස පදවන ජේසන්ව ඇයට මැවී පෙනිණි.

''එහෙමද?'' ඇය පැවසුවාය. ''ඉටිපන්දම් නිවන්න.''

ජේසන් එසේ කළේය. ඔහු ප්‍රාර්ථනාවක් කරන්නට ඇතැයි ඇය සිතුවාය- ඔහු සහ පිපර් මේ ගවේෂණයෙන් දිවි රැක ගතහොත් සදාකල් එකට ජීවත්වන්නට ඔහු පතන්නට ඇතැයි ඇය සිතුවාය. එහෙත් එය ඔහුගෙන් නොඇසීමට ඇය තීරණය කළාය. ඇයට එම ප්‍රාර්ථනය කොඩිවිනයක් කර ගැනීමට අවැසි වූයේ නැත. ඔහුගේ ප්‍රාර්ථනය වෙනෙකක් වී නම්, නිසැකවම ඇයට එය දැන ගැනීමට අවශ්‍ය නැත.

ඊයේ සවස ඔවුන් හර්කියුලිස්ගේ කුලුනු හැරදා පැමිණි පසු ජේසන් වික්ෂිප්තව පසු වනු පෙනිණි. පිපර්ට ඔහුට දොස් පැවරීමට

නොහැකිය. වැඩුමහල් සහෝදරයා ලෙස හර්කියුලිස් විශාල කලකිරීමක් ඇති කර තිබිණි. මහලු ගංගා දෙවියා ඇචිලස් ජුපිටර්ගේ පුත්‍රයා ගැන අප්‍රසාදය ඇති කරවන දෑ පැවසුවේය.

පිපර් ඇචිලස්ගේ උපදේශය ගැන ද සිතුවාය. ඔබට රෝමයට යන්න ලැබුණොත්, ගංවතුරේ කතාව ඔබට හොඳින්ම ප්‍රයෝජනවත් වනු ඇති. ඔහු පැවසූ කතාව ඇය දැන සිටියාය. එහෙත් එයින් ප්‍රයෝජනයක් වන්නේ කෙසේ දැයි ඇයට තේරුම්ගත නොහැකි විය.

ජේසන් තම කේක් ගෙඩියෙන් නිවී ගිය ඉටි පන්දම් ඉවත් කළේය. ''මම හිතමින් ඉන්නෙ...''

එයින් පිපර් නැවත වර්තමානයට පැමිණියාය. පෙම්වතාගෙන් *මම හිතමින් ඉන්නෙ*, වැනි දෙයක් ඇසීම තරමක් බිය උපදවන දෙයකි. ''මොනව ගැනද?'' ඇය විමසුවාය.

''ජුපිටර් කඳවුර ගැන.'' ඔහු පැවසුවේය. ''අවුරුදු ගාණක්ම මම එහෙ පුහුණු වුණා. හැමවෙලාවෙම අපිව යොමු කළේ කණ්ඩායමක් විදිහට වැඩ කරන්න, ඒකකයක් විදිහට වැඩ කරන්න. මම හිතුවා ඒකෙ තේරුම මම දන්නවා කියලා. ඒත් සත්තකින්ම? මම හැම තිස්සෙම නායකයා වුණා. මම පොඩිම එකා වෙලා ඉන්න කොටත්.''

''ජුපිටර්ගේ පුත්‍රයා කියන්නෙ,'' පිපර් පැවසුවාය.'' ලෙජියන් එකේ ඉන්න වඩාත් බලවත්ම දරුවා. ඔයා තරුවක්.''

ජේසන් අපහසුවට පත් වූ බව පෙනිණි, එහෙත් ඔහු එය ප්‍රතික්ෂේප නොකළේය. ''මේ හත් දෙනාගෙ පිරිස අතරෙ ඉන්න කොට... මොනව කරන්නද කියලා හිතන්නෙ නෑ. මම අසමත් කියල හැඟීමක් දැනෙනවා.''

පිපර් ඔහුගේ අත අල්ලා ගත්තාය. ''ඔයා අසමත් නැහැ.''

''චෙරිසෝර් පහර දීපු වෙලාවෙ සත්තකින්ම එහෙම දැනුණා.'' ජේසන් පැවසුවේය. ''මේ ගමනෙන් වැඩි කාලයක් මම ගත කළේ එක්කො ගුටි කාල නැත්නම් කාටවත් උදව් කරන්න බැරුව.''

''එහෙම හිතන්න එපා.'' ඇය පැවසුවාය. ''වීරයෙක් වෙනව කියන එකේ තේරුම එයා අපරාජිතයි කියන එක නෙමෙයි. වීරයෙක් කියන එකේ තේරුම තමයි නැඟී සිටින්නට තරම් නිර්භීත සහ අවශ්‍ය දේ කරන කෙනෙක් කියන එක.''

''ඉතිං අවශ්‍ය දේ මොකක්ද කියල මම දන්නෙ නැත්නම්?''

''ඒකට තමයි ඔයාගෙ යාළුවො ඉන්නෙ. අපි හැමෝටම එකිනෙකට වෙනස් ශක්තීන් තියෙනවා. එකතු වුණාම, අපිට ඒක හොයා ගන්න පුළුවන්.''

ජේසන් ඇයව අධ්‍යයනය කළේය. තමා පැවසූ දේ ඔහු පිළිගත්තා දැයි ඇයට හරිහැටි විශ්වාසයක් නොතිබුණත්, ඔහු තමාව විශ්වාස කිරීම ගැන ඇය සතුටු වූවාය. ඔහු ස්වයං- සැකයකින් පසු වීම ගැන ඇය සතුටු වූවාය. මේ කාලය පුරාවටම ඔහු සාර්ථක වූයේ නැත. ඇයට මැතදී හමුවන අහස් දෙවියන්ගේ අනෙක් පුත්‍රයා මෙන් යම් වරදක් සිදු වූ සෑම විටම සමාව ගැනීමට තරම් විශ්වාසය ඔහුට ණය නැති බව ඔහු සිතුවේය.

''හර්කියුලිස් දුෂ්ටයෙක්.'' ඇගේ සිතිවිලි කියැවූවාක් මෙන් ඔහු පැවසුවේය. ''මට කොහෙත්ම ඒ වගේ වෙන්න ඕනෙ නෑ. ඒත් ඔයා පෙරමුණ ගන්නෙ නැතිව මට එයාට විරුද්ධව නැගී සිටින්න බැරි වුණා. ඒ වෙලාවෙ ඔයයි වීරයා.''

''අපි මාරුවෙන් මාරුවට එහෙම කරමු.'' ඇය යෝජනා කළාය.

''මට ඔයාව ඒ තැනට දාන්න බැහැ.''

''ඔයාට එහෙම කියන්න ඉඩක් නැහැ.''

''ඇයි නැත්තෙ!''

''ඒක අවසන් කළ යුතු වෙලාවක්. ඔයා ඒක අවසන් නොකළොත්....''

ජේසන් ඉදිරියට නැවී ඇයව සිප ගත්තේය. ලෝකයට ඉහළ අර්ථකථනයක් ලැබුණාක් මෙන් රෝමයේ සන්ධ්‍යාවේ පැහැය එක් විටම තියුණු විය.

''අවසන් කිරීම් නැහැ.'' ඔහු පොරොන්දු විය. ''මම කීප සැරයක්ම මගෙ ඔලුව තුවාල කරගත්තට, මම ඒ වගේ මෝඩයෙක් නෙමෙයි.''

''හොඳයි.'' ඇය පැවසුවාය. ''දැන් කේක් එක ගැන බලමු.''

ඇගේ හඬ වියැකී ගියේය. පර්සි ජැක්සන් ඔවුන් දෙසට දිව එමින් සිටියේය. ඔහුගේ ඉරියව් අනුව ඔහු ගෙන එන ප්‍රවෘත්තිය සුබ දායක නොවන බව ඇය වටහා ගත්තාය.

ඔවුහු නැව් තට්ටුවට රොක් වූ බැවින් කෝච් හෙප්ටත් කතාවට සවන් දීමට හැකි විය. පර්සි කතාව අවසන් කළ විටත්, පිපර්ට එය විශ්වාස කිරීමට නොහැකි විය.

''එහෙනම් ඇනබෙත්ව ස්කූටරයකින් පැහැරගෙන ගියා.'' ඇය පැවසුවාය.

''ග්‍රෙගරි පෙක් සහ අවුඩ්‍රි හෙප්බර්න් දෙන්න.''

''ඇත්තටම පැහැර ගැනීමක්ම නෙමෙයි.'' පර්සි පැවසුවේය. ''ඒත් මට එහෙම නරක හැඟීමක් දැනුණා...'' ඔහු ගැඹුරු හුස්මක් ගත්තේය. ''කොහොම වුණත්, එයා -එයා ගියා. සමහරවිට, මට එයාව නොයවා ඉන්නයි තිබුණේ.''

''ඔයාට එහෙම කරන්න වෙනවා.'' පිපර් පැවසුවාය. ''ඔයා දන්නවා එයා තනියම යා යුතු බව. අනෙක් අතට ඇනබෙත් දැඩියි වගේම දක්ෂයි. එයාට කරදරයක් වෙන එකක් නැහැ.''

පිපර් එය සමනය කිරීමට තම කථාවට වශියක් එකතු කළත්, පර්සිට ඒ ගැන අවධානය යොමු කිරීමට අවශ්‍ය විය. ඔවුන් සටනක යෙදී සිටියේ නම්, ඇනබෙත්ට හානියක් වීමට ඔහු ඉඩ නොදෙනු ඇත. මක්නිසාද යත් ඔහු ඇය ගැන එතරම්ම අවධානයෙන් සිටි බැවිණි.

ඔහුගේ හිත මඳක් සැහැල්ලු විය. ''සමහවිට ඔයා හරි ඇති. කොහොම වුණත්, ග්‍රෙගරි- මම කිව්වෙ ටයිබේරිනස්- කිව්ව විදිහට නම් නිකෝව බේරගන්න තියෙන්නෙ අපි හිතාගෙන හිටියට වඩා අඩු කාලයක්. හේසාලුයි අනිත් හාදයොයි තවම ආවෙ නැද්ද?''

පිපර් පාලන පුවරුවෙන් වෙලාව පරීක්ෂා කළාය. කෙතරම් ප්‍රමාද දැයි අයට සිතාගත නොහැකි විය. ''හවස දෙකයි. අපි කිව්වේ තුනට ආපහු එකතු වෙමු කියලය.''

''අලුත්ම තොරතුරු එක්ක.'' ජේසන් පැවසුවේය.

පර්සි පිපර්ගේ කිණිස්ස පෙන්වූයේය. ''ටයිබේරිනස් කිව්වා නිකෝ ඉන්න තැන හොයාගන්න ඔයාට පුළුවන් වෙයි කියලා... මේකෙන්.''

පිපර් තොල් සපා ගත්තාය. ඇයට කරන්නට වුවමනා වූ අවසන් දෙය වූයේ කැටොප්ට්‍රිස් තලයෙන් තවත් බියකරු රූප නැරඹීමයි.

''මම උත්සාහ කළා.'' ඇය පැවසුවාය. ''කිණිස්ස හැම තිස්සෙම මට දකින්න වුවමනා දේම පෙන්වන්නෙ නැහැ. අනික, වෙන කවරදාටත් වඩා ඒක අමාරුයි.''

''කරුණාකරල.'' පර්සි පැවසුවේය. ''ආයෙත් උත්සාහ කරන්න.''

ලිස්සන සීල් මත්ස්‍ය පැටියෙක් උදව් ඉල්ලන්නාක් මෙන්, ඔහු තම නිල් දෑසින් ආයාචනා කළේය. මේ හාදයා සමඟ වාද කර ඇනබෙත් හැමවිටම දිනන්නේ කෙසේදැයි පිපර් පුදුමයට පත් වූවාය.

''හොඳයි.'' සුසුමක් හෙලූ ඇය කිණිස්ස අතට ගත්තාය.

''ඔයාල ඕක බලන අතරෙ.'' කෝච් හෙජ් පැවසුවේය. ''පොඩ්ඩක් බලන්න අලුත්ම බේස් බෝල් ලකුණුත් ගන්න පුළුවන්ද කියලා.''

''ෂ්... ෂ්... ෂ්...'' පිපර් ලෝකඩ තලය ලෙස දෙස බලාගෙන සිටියාය. ආලෝකයක් දිලිසිණි. උපදෙවිවරුන් පිරි අටලුවක් ඇයට දකින්නට ලැබිණි. සිතියමක් පෙන්වමින් ඔක්ටේවියන් කතා කරන අතරේ තවත් දුසිම් ගණනක් කෑම මේසයක් වටා හිඳගෙන සිටියහ. යාබද ජනේලයක් අසලට ඇවිද ගිය රෙයිනා පහලින් වූ මධ්‍යම උද්‍යානය දෙස බලා සිටියාය.

''ඒක හොඳ දෙයක් නෙමෙයි.'' ජේසන් මිමිණුවේය. ''එයාල දැනටමත් මෑන්හැටන් වල මූලස්ථානයක් පිහිටුවලා.''

''ඒ වගේම අර සිතියමේ තියෙන්නෙ ලෝං දූපත.'' පර්සි පැවසුවේය.

''එයාල භූමිය නිරීක්ෂණය කරනවද.'' ජේසන් අනුමාන කළේය. ''ආක්‍රමණ මාර්ග සාකච්ඡා කරන්න.''

පිපර්ට එය දැකීමට අවශ්‍ය වූයේ නැත. ඇය තදින් සිත එකඟ කළාය. ආලෝක තරංග තලය හරහා ගමන් ගත්තේය. ඇය නටඹුන් දුටුවාය- කැඩී ගිය බිත්ති, තනි කුලුනක්, පාසි සහ මැරුණු වැල්වලින් වැසී ගිය පාෂාණ පොළොව- මේ සියල්ල තැනින් තැන පයින් ගස් වැඩුණු, තෘණ පිරි කඳු පාමුලක පිහිටා තිබිණි.

''මම එතනට ගිහින් තියෙනවා.'' පර්සි පැවසුවේය. ''ඒක තියෙන්නෙ පැරණි විනිශ්චය ශාලාවෙ.''

දර්ශනය විශාලනය විය. පාෂාණ පොළොවේ එක් පැත්තක, පඩිපෙළක් කපා තිබිණි. එය අගුළු දැමූ නූතන යකඩ ගේට්ටුවක් යටින් පහළට විහිදී තිබිණි. තලයේ රූපය කෙළින්ම දොරටුව වෙත නාභිගත විය. පහළ වූයේ සර්පිලාකාර පඩි සහිත අන්ධකාරයේ ගිලුණු ළිඳකි. එය ධාන්‍ය ගබඩාවක අභ්‍යන්තර මෙන් සිලින්ඩරාකාර කුටීරයක් විය.

පිපර් තලය අතහැරියාය.

''මොකද වුණේ?'' ජේසන් විමසුවේය. ''ඒක අපට යමක් පෙනුවමින් හිටියෙ.''

සාගරය මැද බෝට්ටුව පෙරළී ගියාක් වැනි හැඟීමක් ඇයට ඇතිවිය. ''අපිට එතනට යන්න බැහැ.''

පර්සි මුහුණ හැකිළුවේය. ''පිපර්, නිකෝ මිය යමින් ඉන්නෙ. අපි ගිහින් එයාව හොයාගන්න ඕනෙ. රෝමය විනාශ වෙන්න යන එක ගැන කියන්න ඕනෙ නෑනෙ.''

ඇගේ කතාවෙන් පලක් නොවනු ඇත. සිලින්ඩරාකාර කාමරයේ දර්ශනය ගැන ඇයට කතා කිරීමට නොහැකිය. එය පැහැදිලි කළත් ජේසන් හා පර්සිගේ කිසිදු අදහසක් වෙනස් නොවනු ඇතැයි යන බියකරු හැඟීමක් ඇයට ඇතිවිය. සිදුවීමට නියමිත දේ ඇයට නැවැත්විය නොහැකිය.

ඇය නැවත පිහිය අහුලා ගත්තාය. එහි මිට සාමාන්‍ය ප්‍රමාණයට වඩා සිසිල් වී තිබිණි.

ඇය තලය දෙස බලා සිටීමට තම සිත බලෙන් නම්මවා ගත්තාය. සන්නාහවලින් සැරසුණු යෝධයන් දෙදෙනා අති විශාල විනිසුරු අසුන් දෙකක හිඳගෙන සිටින අයුරු ඇයට දැකගත හැකි විය. වැදගත් සටනක් ජයග්‍රහණය කළාක් මෙන් රන් කුසලාන දෙකකින් එකිනෙකා සව්දිය පුරා ගත්හ. ඔවුන් දෙදෙනා අතර විශාල ලෝකඩ බඳුනක් තිබිණි.

දර්ශනය නැවත විශාල විය. බඳුන තුළ වකුටු වී සිටියේ නිකෝ ඩි ආන්ජලෝය. තවදුරටත් ඔහුගේ චලනයක් නොතිබිණි. දෙළුම් ඇට සියල්ල කා දමා තිබිණි.

''අපි පරක්කු වැඩියි.'' ජේසන් පැවසුවේය.

''නෑ.'' පර්සි පැවසුවේය. ''නෑ, මට ඒක විශ්වාස කරන්න බැහැ. සමහරවිට කාලය ගන්න ඕනෙ නිසා එයා ගැඹුරු සමාධියකට ගිහින් ඇති. අපි ඉක්මන් කරන්න ඕනෙ.''

තලයේ මතුපිට අඳුරු වී ගියේය. දැත්වල වෙව්ලීම නතර කර ගැනීමට උත්සාහ දරමින් පිපර් කිණිස්ස එහි කොපුවට දමා ගත්තාය. පර්සි පැවසූ ආකාරයට නිකෝ තවමත් පණ පිටින් සිටිතැයි ඇය අපේක්ෂා කළාය. අනෙක් අතට, ඒ රූපය, ගිලීමේ කාමරය හා සම්බන්ධ වන්නේ කෙසේදැයි ඇයට සිතාගත නොහැකි විය. සමහරවිට යෝධයන් සව්දිය පුරන්නේ තමාත්, පර්සි හා ජේසනුත් මිය ගිය නිසා විය හැකිය. ''අපිට අනෙක් අය එනකම් ඉන්න වෙනවා.'' ඇය පැවසුවාය. ''හේසාල්, ලියෝ සහ ෆ්‍රෑන්ක් ඉක්මනින් එන්න ඕනෙ.''

'අපිට බලා ඉන්න බැහැ.'' පර්සි විරෝධය පෑවේය.

කෝච් හෙජ් ගෙරවූයේය. ''එතන ඉන්නෙ යෝධයො දෙන්නයි. ඔයාලට ඕනෙනම්, මට පුළුවන් උන්ව බිම දාන්න.''

''ආහ්, කෝච්.'' ජේසන් පැවසුවේය. ''ඒක නම් නියම අවස්ථාවක්, ඒත් අපි කැමති ඔයා නැවේ ඉන්නවනම්.''

හෙජ් රැව්වේය. ''ඔයාල තුන්දෙනාට සේරම ජොලිය ගන්න ඇරලද?''

පර්සි නරාශ්වයාගේ අත මිරිකුවේය. ''හේසාල්ටයි, අනිත් අයටයි ඔයාව ඕනෙ වෙනවා. එයාල ආපහු ආවම. එයාලට ඔයාගෙ නායකත්වය ඕනෙ වෙයි. ඔයා තමයි එයාලගෙ හයිය.''

''ඔව්.'' ජේසන් හැකි තරම් ඍජු මුහුණක් සාදා ගැනීමට උත්සාහ කළේය. ''ලියෝ නිතරම කියන්නෙ එයාගෙ හයිය ඔයා කියලයි. ඔයාට පුළුවන් අපි කොහෙටද ගියෙ කියල එයාලට කියන්න. ඒ වගේම විනිශ්චය ශාලාව ළඟදී අපිව හමුවෙන්න නැව අරන් එන්න.''

''මෙන්න.'' කැටොප්ස්ට්‍රිස් පිහිය ගලවා කෝච් හෙජ් අත තබමින් පිපර් පැවසුවාය.

නරාශ්වයාගේ දෑස් විසල් විය. උප දෙවියකු කිසිවිටෙක තම අවිය හැර දමා නොයන බවට මතයක් තිබුණත්, පිපර් යක්ෂ දර්ශනවලින් හෙම්බත්ව සිටියාය. තවත් පූර්ව දර්ශන නොමැතිව ඇය තම මරණයට මුහුණ දීමට කැමති වූවාය.

''පිහි තලයෙන් අපි දිහා ඇහැ ගහගෙන ඉන්න.'' ඇය යෝජනා කළාය. ''ඒ වගේම ඔයාට බේස් බෝල් ලකුණුත් බලාගන්න පුළුවන්.''

එයින් ගනුදෙනුව ස්ථිර විය. ගවේෂණය සඳහා තම කොටස ඉටු කිරීමට හෙජ් හිස සලමින් එකඟ විය.

''සේරම හරි.'' ඔහු පැවසුවේය. ''ඒත් මොකෙක් හරි යෝධයෙක් මෙහෙට ආවොත්.''

''එච්චර හිතන්නෙ නැතුව විනාශ කරල දාන්න.'' ජේසන් පැවසුවේය.

''සංචාරකයන්ට හානියක් වෙයිද?''

''නෑ.'' ඔවුහු සියල්ලෝම එකවිට පැවසූහ.

''අපුරුයි. ඒත් වැඩි වෙලාවක් ගන්න එපා. එහෙම වුණොත් මම බැලස්ටායි එකත් අරන් ඔයාල හොයාගෙන එනවා.''

අතීනාගේ කෙළෙස

# 42
# පිපර්

**තැන සොයා ගැනීම අපහසු නොවීය.** පර්සි හරියටම නියම තැනට ඔවුන්ව කැඳවාගෙන ගියේය. කඳු පාමුල අතහැර දමූ බිම් කඩක නටඹුන් වී ගිය විනිශ්චය ශාලාව පිහිටා තිබිණි.

එයට ඇතුළු වීමද පහසු විය. ජේසන්ගේ රන් අසිපතින් අගුල කපා දමුණු අතර, ලෝහ ගේට්ටුව විවෘත විය. කිසිදු මනුෂ්‍යයකුට ඔවුන්ව දැකගැනීමට නොලැබිණි. අනතුරු අඟවන සංඥා නාද නොවීය. ගල් පඩිපෙළ සර්පිලාකාරව අන්ධකාරයට යොමු වී තිබිණි.

''මම මුලින් යන්නම්.'' ජේසන් පැවසුවේය.

''එපා!'' පිපර් කෑ ගැසුවාය.

කොලුවන් දෙදෙනාම ඇය දෙසට හැරුණාහ.

''පිපර්, ඇයි ඒ?'' ජේසන් විමසුවේය. අර තලයෙන් පෙනුණු රූපය, ඔයා කලින් දැකල තියෙනවද?''

ඇය හිස සැලුවාය. ඇගේ දෑස් දීප්තිමත් වී තිබිණි. ''මට තේරෙන්නෙ නෑ ඔයාලට කොහොම කියන්නද කියලා. මම දැක්කා පහළ වතුරෙන් පිරුණු කාමරයක්. මම දැක්කා අපි තුන්දෙනා ගිලෙනවා.''

පර්සි සහ ජේසන් යන දෙදෙනාම මුහුණු හැකිලූහ.

''මාව ගිලෙන්න බැහැ.'' පර්සි පැවසුවේය. එහෙත් ඔහුගේ ස්වරයෙන් පෙනී ගියේ ඔහු ප්‍රශ්නයක් ඇසූ බවකි.

''සමහරවිට අනාගතය වෙනස් වෙලා ඇති.'' ජේසන් පැවසුවේය. ''ඔයා මේ දැන් අපිට පෙන්නුව රූපයේ කිසිම වතුරක් තිබුණේ නෑ.''

ඔහු නිවැරදි වේවායි පර්සි ප්‍රාර්ථනා කළේය. එහෙත් ඔවුන් එතරම් වාසනාවන්ත වේදැයි ඔහු තුළ වූයේ සැකයකි.

''බලන්න.'' පර්සි පැවසුවේය. ''මම මුලින්ම සෝදිසි කරල බලන්නම්. ඒක හොඳයි නම් ආපහු එන්නම්.''

පිපර් විරුද්ධත්වය පළ කිරීමටත් පෙර, ඔහු පියගැට පෙළ සහිත ළිඳේ පහළට බැස අතුරුදන් විය.

ඔහු ආපසු එනතෙක් ඇය නිහඬව ගණන් කරන්න වූවාය. තිස් පහට පමණ ගණින විට, ඇයට අඩි ශබ්දයක් ඇසුණු අතර, ඔහු මුදුනින් මතුවිය. ඔහුගේ පෙනුමේ සෑහීමකට පත් බවකට වඩා තිබුණේ වඩාත් ව්‍යාකූල පෙනුමකි. ''හොඳ ප්‍රවෘත්තිය- වතුර නෑ.'' ඔහු පැවසුවේය. ''නරක ප්‍රවෘත්තිය- පහළ කිසිම පිටවීමේ තැනක් මම දැක්කෙ නෑ. ඒ වගේම අමුතු ප්‍රවෘත්තිය- ඔයාල මේක බලන්න ඕනෙ.''

කුතුහලයෙන් යුතුව ඔවුහු පහළට බැස්සහ. රිප්ටයිඩයේ ආලෝකයෙන් පර්සි පෙරමුණ ගත්තේය. පිපර් ඔහුව අනුගමනය කළ අතර, ජේසන් පිටුපස ආරක්ෂා කරමින් ඇයට පිටුපසින් ගමන් කළේය. ළිඳේ පියගැට බිත්තියට සවිකර තිබූ අතර, විෂ්කම්භය අඩි හයකට වඩා නොවීය. පර්සි 'සියල්ලම පැහැදිලියි' යනුවෙන් පැවසුවත් පිපර් උගුල් ඇතිදැයි ඇස ගසාගෙන සිටියාය. පඩිපෙළේ සෑම හැරුමකදීම, ඇය වටකර පහර දීමක් අපේක්ෂා කළාය. සම් රැහැනකින් උරහිසේ එල්ලාගෙන තිබූ කෝනුකෝපියාව හැර ඇය සතුව වෙනත් ආයුධයක් නොතිබිණි. නරක තවත් නරක අතට හැරුණොත් මෙවැනි සංවෘත ස්ථානයක කොලුවන් දෙදෙනාගේ අසිපත් වලින් එතරම් ඵලක් නොවනු ඇත. සමහරවිට පිපර්ට අධි වේගයෙන් දුම් දමන හැම් සතුරන් වෙත විදීමට හැකිවනු ඇත.

ඔවුන් කරකැවෙමින් භූගත කාමරයට බසිද්දී, පිපර්ට පාෂාණවල කොටා තිබූ පැරණි අක්ෂර දැක ගැනීමට ලැබිණි. රෝම ඉලක්කම්, නම් සහ ඉතාලි වාක්‍ය ඒ අතර විය. එයින් පැහැදිලි වූයේ රෝම අධිරාජ්‍යයට පසු මෑත යුගයේ වෙනත් මිනිසුන් මෙහි පැමිණ තිබෙන බවය. එහෙත් පිපර්ට එය සහතික කර කීමට නොහැකි විය. පහළ රාක්ෂයින් සිටින්නේ නම්, ඔවුහු මනුෂ්‍යයන් ගැන තැකීමක් නොකොට,

අපූරු යුෂයෙන් පිරි උප දෙවිවරුන් මෙහි පැමිණෙන තුරු බලා සිටිනු ඇත.

අවසානයේ, ඔවුහු පතුලට පැමිණියහ.

පර්සි හැරුණේය. ''මේ අන්තිම පඩිය බලාගෙන.''

ඔහු සිලින්ඩරාකාර කාමරයේ පොළොවට පැන්නේය. එය පිහිටා තිබුණේ පියගැට පෙළට අඩි පහක් පහතිනි. ඇයි කවුරුහරි පියගැට පෙළක් මේ විදිහට සැලසුම් කළේ? පිපර්ට සිතාගත නොහැකි විය. සමහරවිට කාමරය සහ පියගැට පෙළ ඉදිකර ඇත්තේ වෙනස් කාල වකවානු දෙකක විය හැකිය.

ඇයට අවශ්‍ය වූයේ ආපහු හැරී පිටව යාමටය. එහෙත් ඇයට ජේසන් අතහැර යාමට නොහැකිය. එසේම ඇයට පර්සිව ද පහළ තනිකර දමා යාමට නොහැකිය. ඇය පහළට බැස්සාය. ජේසන් ඇය පසුපසින් පහළට බැස්සේය.

කාමරය ඇය කැටොප්ට්‍රිස් තලයෙන් දුටු ආකාරයට හරියටම සමාන විය. එකම වෙනස වූයේ එහි ජලය නොතිබීම පමණකි. චක්‍රාකාර බිත්ති කළෙක සිතුවම් වලින් සැරසී තිබුණ බව පෙනී ගිය අතර, දැන් ඒවායේ වර්ණ වියැකී තැන තැන බදාම ගැලවී ගොස් තිබිණි. අර්ධ ගෝලාකාර සිවිලිම අඩි පණහක් පමණ උසින් පිහිටා තිබිණි.

කාමරයේ පිටුපස පැත්තේ, එනම් පියගැට පෙළට විරුද්ධ පැත්තේ බිත්තිය හාරා කුඩා කොටස් නවයකට වෙන්කර තිබිණි. එක් එක් බිත්ති කුහරයක් පොළොවේ සිට අඩි පහක් උසින් පිහිටා තිබූ අතර මිනිසකු තරම් විශල ප්‍රතිමාවක් තැබීමට තරම් විශාලත්වයෙන් යුක්ත විය. *එහෙත් ඒවා හිස්ව තිබුණේය.*

වාතය සිසිල් සහ වියළි බවක් දැනිණි. පර්සි පැවසූ ලෙසම එහි වෙනත් පිටවීමක් නොතිබිණි.

''සේරම හරි.'' පර්සි තම දෙබැම එසවීය. ''මේ තමයි අමුතුම කොටස. බලන්න.''

ඔහු කාමරයේ මැදට පියවර තැබුවේය.

ක්ෂණිකව කොළ සහ නිල් ආලෝකයෙන් බිත්තිය හරහා තරංග නැගිණි. පිපර්ට වතුර මලක හඬක් ඇසුණත්, එහි ජලය නොතිබිණි. පර්සිගේ සහ ජේසන්ගේ අසිපත්වල ආලෝකය හැරුණු විට එහි වෙනත් ආලෝකයක් ද නොතිබිණි.

''ඔයාලට සාගරයේ ගඳ දැනෙනවද?'' පර්සි විමසුවේය.

මුලදී එය පිපර්ගේ අවධානයට ලක් නොවීය. ඇය සිටගෙන සිටියේ පර්සි අසලය. නිතරම ඔහුගෙන් හමා එන්නේ මුහුදේ ගන්ධයයි. එහෙත් ඔහු නිවරුදිය. ලවණ ජලයේ සහ කුණාටුවේ ගන්ධය ග්‍රීෂ්මයේ ළඟාවන හරිකේන් කුණාටුවක් මෙන් ප්‍රබලව නැගෙමින් තිබිණි.

''හිතේ ඇතිවුණ දෙයක්ද?'' ඇය විමසුවාය. ක්ෂණිකවම ඇයට අත්භූත ලෙස පිපාසයක් දැනුණේය.

''මම දන්නෙ නැහැ.'' පර්සි පැවසුවේය. ''මට දැනෙනවා මෙතන ජලය තියෙනවා කියලා. ගොඩක්. ඒත් මෙතන පොඩ්ඩක්වත් නෑ. මම කවදාවත් මේ වගේ තැනක ඉඳල නෑ.

ජේසන් බිත්ති කුහර අසළට ළං විය. ඔහු තමා අසලම තිබූ කුහරයේ පහළ තට්ටුව අත ගෑවේය. එය ඔහුගේ ඇස් මට්ටමේ පිහිටා තිබිණි. ''මේ පාෂාණය- ඒකෙ බෙලි කටු ඔබ්බවල තියෙනවා. මේක කිඳුරු දේවස්ථානයක්!''

පිපර්ගේ මුව වියළී ගියේය. ''මොකක්?''

''අපිට ජුපිටර් කඳවුරෙත් එකක් තිබුණා.'' ජේසන් පවසුවේය. ''ටෙම්පල් හිල්වල. ඒක කිඳුරන්ගෙ පුජනීය ස්ථානයක්.''

පිපර් තවත් බිත්ති කුහරයක පතුල අත ගා බැලුවාය. ජේසන් නිවැරදිය. කුහරය තුළ කවඩි, හක් ගෙඩි සහ සිප්පි කටු ඔබ්බවා තිබිණි. සැලෙන ආලෝකයේ සිප්පි කටු නර්තනයක යෙදෙන සෙයක් පෙනිණි. අල්ලන විට ඒවා අයිස් මෙන් සිසිල් විය.

පිපර් නිතරම සිතුවේ කිඳුරන් මිත්‍රශීලි ආත්ම බවයි-ඔවුන් මෝඩ, අඟර දඟර පාන, සාමාන්‍යයෙන් හානිකර නොවන අය බවය. ඇෆ්‍රොඩයිට්ගේ දරුවන් සමඟ ඔවුන් හොඳින් කටයුතු කළහ. ඕපාදූපා සහ රූපලාංකරණ ඉඟි හුවමාරු කර ගැනීමට ඔවූහු ප්‍රිය කළහ. එහෙත් මෙතැනදී, අර්ධ ලෝහිත කඳවුරේ පාරු විල මෙන් හැඟීමක් නොදැනෙයි. එසේත් නැතිනම් පිපර් සාමාන්‍යයෙන් කිඳුරියන් හමුවන වන ලැහැබේ දිය කඳුර මෙන් නොදැනෙයි. මේ ස්ථානයෙන් දැනෙන්නේ අස්වාභාවික, සතුරු සහ බෙහෙවින් වියළි ගතියකි.

පියවරක් පසුපසට වූ ජේසන් බිත්ති කුහර පෙළ අධ්‍යයනය කළේය. පැරණි රෝමයේ සෑම තැනකම මෙවැනි පූජනීය ස්ථාන තිබිණි. කිඳුරන්ට වන්දනා කිරීම සඳහා ධනවත් මිනිසුන් එවැනි තැන් තම මන්දිරවලින් පිටත ඉදිකර ගෙන තිබුණේ සැමවිටම නැවුම් ජලය

ලබා ගැනීම සඳහාය. සමහර පූජනීය ස්ථාන ස්වභාවික දිය කඳුරු ආශ්‍රිතව ඉදි කර තිබුණත්, බොහෝ ඒවා මිනිසුන් අතින් නිර්මාණය කළ දිය පහර විය.

''ඉතිං... ඇත්තටම මෙතන කිඳුරියො ජීවත් වෙලා නැනෙ?'' පිපර් බලාපොරොත්තු සහගතව විමසුවාය.

''හරියටම විශ්වාස නැහැ.'' ජේසන් පැවසුවේය. ''අපි මේ හිටගෙන ඉන්න තැන වතුර මලක් තියෙන පොකුණක් වෙන්න පුළුවන්. බොහෝ විට, කිඳුරු දේවස්ථානය උප දෙවියකුට අයිති වෙලා තිබුණ නම්, ඔහු හෝ ඇය කිඳුරියන්ට මෙතන වාසය කරන්න කියල ආරාධනා කරන්න ඇති. ඒ ආත්ම පදිංචි වුණොත්, ඒක සැලකුණේ වාසනාවක් විදිහට.''

''අයිතිකාරයගෙ!'' පර්සි අනුමාන කළේය.'' ඒත් ඒකෙන් කිඳුරියන්ව අලුත් ජල මූලාශ්‍රවලට බන්ධනය වුණා. හිරු රැසින් නැහැවෙන උද්‍යානයක වාරි මාර්ගවලින් නැවුම් ජලය ගලාගෙන එනකොට ඒක හරි අපුරුවට තියෙන්න ඇති.

''ඒත් මෙතන ශතවර්ෂ ගාණක් තිස්සෙම පොළොව යටනෙ.'' පිපර් පැවසුවාය. ''වේලිලා, වැළලිලා ගිහින්. කිඳුරියන්ට මොනව වෙන්න ඇතිද?''

ජලයේ හඬ භූත නාගයෙකුගේ පිඹීමේ ගායනයක් ලෙසට වෙනස් විය. ලා නිල් සහ කොළ පැහැති ආලෝක තරංග දම් සහ දියාරු හුණුවල පැහැයට මාරු විය. ඔවුන්ට ඉහළින් තිබූ බිත්ති කුහර නවය දිලිසෙන්නට විය. ඒවා තවදුරටත් හිස් ව නොතිබිණි.

එක් එක් කුහරය තුළ මැල වී ගිය මහලු කාන්තාවක බැගින් සිටගෙන සිටියේය. ඔවුන්ගේ වියළි සහ දුර්වල බව පිපර්ට මමියක් සිහි ගැනිවිණි. එහෙත් මමි සාමාන්‍යයෙන් සෙලවෙන්නේ නැත. ඔවුන්ගේ දෑස් තද දම් පැහැති බවක් ගත්තේ ඔවුන්ගේ ජීව ප්‍රභවය  වූ පිරිසිදු නිල් ජලය ඔවුන්ගේ අභ්‍යන්තරයේ ඝනීභවනය වී ඇතිවාක් මෙනි. ඔවුන්ගේ සේද ගවුම් දැන් දුර්වර්ණ වී වැරහැලි වී තිබිණි. ඔවුන්ගේ කෙස් වැටි කළෙක බොකුටු වී රෝම රදළ කතුන් මෙන් ආභරණ වලින් සරසා තිබෙන්නට ඇති බව පෙනුණත්, දැන් ඔවුන්ගේ අක්බඹරු කෙස් අවුල් වී, පිදුරු මෙන් වියළී තිබිණි. ජල ම්ලේච්ජයන් සැබැවින්ම සිටින්නේ නම්, ඔවුන්ගේ පෙනුම මෙලෙස වනු ඇතැයි පිපර්ට සිතිණි.

*කිඳුරියන්ට මොනව වෙන්න ඇතිද?* මැද කුහරයේ සිටි සත්ත්වයා පැවසුවේය.

ඇගේ පෙනුම අනෙක් අයටත් අන්ත විය. ඇගේ කොන්ද කෙණ්ඩියක හැඩලය මෙන් වකුටු වී තිබිණි. ඇගේ ඇටකටු අත්වල තිබුණේ සමකට වඩා තුනී කඩදාසි තට්ටුවකැයි කිව හැකිය.

ඇය තම දම් පැහැති දෙනෙතින් පිපර් දෙස බැලුවාය. ''මොනතරම් සිත් ඇඳ ගන්නා ප්‍රශ්නයක්ද, මගෙ පැටියෝ. සමහරවිට කිඳුරියො තවමත් මෙතන ඉන්නව ඇති, පීඩා විඳිමින්, පළිගැනීමට බලා හිඳිමින්.''

ඊළඟ වතාවේ තමාට අවස්ථාවක් ලැබුණොත්, ඇය කැටොප්ට්‍රිස් පිහිය උණුකර පරණ ලෝහවලට විකුණා දමන බවට දිවුරා ගත්තාය. ඒ තකතීරු තලය කිසිවිටෙක ඇයට සම්පූර්ණ කතාව පෙන්වන්නේ නැත. සත්තකින්ම, ඇය තමාව ගිලෙමින් සිටින අයුරු දුටුවාය. එහෙත් වැහැරුණු පිශාච කිඳුරියන් නව දෙනෙක් තමා වෙනුවෙන් බලා හිඳින බව ඇයට අවබෝධ වූවානම් ඇය කිසි විටෙක මෙතැනට බසින්නට නැත.

ඇය පියගැට පෙළ මතට නැගීමට සිතුවාය. එහෙත් ඇය ආපසු හැරී බලන විට දොරටුව අතුරුදහන් වී තිබිණි. වියයුතු ලෙසම. හිස් බිත්තිය හැර දුන් එතැන කිසිවක් නොතිබිණි. එය හුදෙක් දෘෂ්ටි මායාවකැයි පිපර් සැක කළාය. අනෙක් අතට කිඳුරු පිශාචයන් ඔවුන් මතට පැනීමට පෙර කාමරයේ විරුද්ධ පැත්තට යාම කිසිසේත් කළ නොහැක්කකි.

තම අසිපත් සූදානම් කරගෙන ජේසන් සහ පර්සි ඇගේ දෙපසින් සිටගත්හ. ඔවුන් සමීපයේ සිටීම පිපර්ගේ සතුටට හේතු වුවත්, ඔවුන්ගේ ආයුධ වලින් කිසිදු ඵලක් වේ දැයි ඇයට වූයේ සැකයකි. මේ කාමරයේ සිදුවිය හැක්කේ කුමක්දැයි ඇය දැක තිබුණාය. කෙසේ හෝ මොවුන් සැරසෙන්නේ ඔවුන්ව පරාජය කිරීමටය.

''උඹලා කවුද?'' පර්සි විමසුවේය.

මැද සිටි කිඳුරිය ඇගේ හිස හැරවූවාය. ''ආහ්... නම් ද? එක කාලෙක අපිට නම් තිබුණා. මම හැග්නෝ[1], නව දෙනාගෙන් පළවෙනියා.''

---

1 සියුස් දෙවියන් රැකබලා ගත්තේ පැවසෙන අප්සරාවියයි. ආකේඩියාවේ ලයාකායියස් කන්දේ ඇයට පුද කළ ළිඳක් තිබේ.

ඇයට හැග්නෝ වැනි නමක් තිබීම කෲර විහිළුවක් ලෙස පිපර්ට සිතුණත් ඇය එය නොකියා සිටීමට තීරණය කළාය.

''නවය.'' ජේසන් නැවත පැවසුවේය. ''මේ පූජනීය ස්ථානයේ කිඳුරියෝ. නිතරම තියෙන්නෙ කුහර නවයයි.''

''ඇත්තවශයෙන්ම.'' හැග්නෝ ඇගේ දත් පෙනෙන ලෙස දුෂ්ට සිනාවක් පෑවාය. ''ඒත් අපි තමයි මුල්ම නව දෙනා, ජේසන් ග්‍රේස්, ඔබේ පියාගේ උපතට සහභාගී වුණ.''

ජේසන්ගේ කඩුව පහත වැටිණි. ''ඔයා කියන්නේ ජුපිටර් ද? එයා ඉපදෙන කොට ඔයාලත් එතන හිටියද?''

''සියුස්,'' අපි එයාට කිව්වෙ එහෙම.'' හැග්නෝ පැවසුවාය. ''කොච්චර වේදනාකාරී උපතක්ද. අපි රෙහාගේ ප්‍රසව අවස්ථාවට සහභාගී වුණා. ළදරුවා පැමිණියාම, අපි ඔහුව හැංගුවා. ඒ නිසා ඔහුගේ පියා වුණ ක්‍රෝනොස්ට, එයාව කාල දාන්න බැරිවුණා. ආහ්, එයාට පෙනහළු තිබුණා. ඒ ළදරුවා! හඬ නොහැඟෙන්න අපි අපට පුළුවන් සේරම දේවල් කළා. ඉතිං ක්‍රෝනොස්ට ඔහුව සොයා ගන්න බැරි වුණා. සියුස් වැඩෙන කොට, අපිට සදාකාලික ගෞරවය ලබා දෙන බවට පොරොන්දු වුණා. ඒත් ඒ පරණ රටේ දි, ග්‍රීසියෙදි.''

අනෙක් කිඳුරියෝ ඔවුන්ගේ කුහර තුළ සිට විලාප නඟන්නට වූහ. ඔවුන් ඒවා තුළ සිරවී ඇති බව පෙනුණි. ඔවුන්ගේ දෙපා, කවඩි සමඟ පාෂාණයට අලවා ඇති බව පිපර්ට අවබෝධ විය.

''රෝමයේ බලය වැඩිවෙන කොට, අපිට මෙහෙට ආරාධනා කළා.'' හැග්නෝ පැවසුවාය. ජුපිටර්ගේ පුත්‍රයා කරුණාවෙන් අපිව පොළඹවා ගත්තා. අලුත් නිවෙසක්. ඔහු පොරොන්දු වුණා. විශාලම සහ හොඳම එකක්! මූලික ගෙවීම නැහැ. ඒ වගේම විශිෂ්ට අසල්වැසියො. *රෝමය සදාකාලිකව පවතිනු ඇත.*''

''සදාකාලිකව.'' සෙසු කිඳුරියෝ පිඹින්නට වූහ.

''අපිට පෙළඹවීමක් ඇති කළා.'' හැග්නෝ පැවසුවාය. ''අපි ලයිකේයස් කන්දේ තිබුණු අපේ සරල ළිං සහ දිය කඳුරු අතහැරල මෙහෙට ආවා. සියවස් ගාණක්ම අපේ ජීවිත පුදුමාකාරව ගෙවුණා. ප්‍රිය සම්භාෂණ, අපේ ගෞරවයට ලැබුණු පරිත්‍යාගයන්, හැම සතියකම අලුත් ඇඳුම් සහ ආභරණ. රෝමයේ හැම උප දෙවියෙක්ම අපිට අඟර පෑවා, අපිට ගරු කළා.''

කිඳුරිගේ විලාප නඟමින්, සුසුම් හෙළූහ.

''ඒත් රෝමය උත්තරීතර වුණේ නැහැ.'' හැග්නෝ පැවසුවාය. ''වාරි මාර්ග වෙනත් පැතිවලට හැරවුණා. අපේ ස්වාමියන්ගේ මන්දිර අතහැරල දැමුණා. විනාශ වුණා. අපිව අමතක වෙලා ගිහින්, පොළොව යට වැළලුනා. ඒත් අපිට පිටවෙන්න බැහැ. අපේ ජීවන ප්‍රභව මේ ස්ථානයට බන්ධනය වෙලා. අපේ පැරණි ස්වාමිවරු කවදාවත් අපිව නිදහස් කරන්න සූදානම්ව හිටියෙ නැහැ. සියවස් ගාණක්, අපි මේ අන්ධකාරයේ වේලුණා. පිපාසයි, හරිම පිපාසයි.''

අනෙක් අය ඔවුන්ගේ මුව විවර කළහ.

පිපර්ට ඇගේ ගෙල සිරවෙන්නාක් මෙන් දැනිණි.

''මට ඔයාල ගැන කණගාටුයි.'' වශිය යොදා ගනිමින් ඇය කතා කිරීමට උත්සාහ කළාය. ''ඒක හරිම භයානක ඇති. ඒත් අපි ඔයාලගෙ සතුරො නෙමෙයි. අපිට ඔයාලට උදව් කරන්න පුළුවන් නම්.''

''ආහ්, කොච්චර මිහිරි හඬක්ද!'' හැග්නෝ කෑ ගසා පැවසුවාය. ''එච්චර ලස්සනක්. මමත් කාලෙකට ඉස්සර ඔයා වගේම තරුණ වෙලා හිටියා. මගේ හඬ කඳුකර දියදහරක් වගේ වුණා. ඒත් අන්ධකාරයේ සිරවෙලා, වෛරය හැර වෙනත් කෑමක් නැතිව, ප්‍රචණ්ඩකාරී සිතුවිලි හැර වෙනත් බීමක් නැතුව ඉන්න කිඳුරියකගේ හිතට මොනවද වෙන්නෙ කියලා ඔයා දන්නවද? ඔව්, මගේ පැටියෝ, ඔයාලට පුළුවන් අපිට උදව් කරන්න.''

පර්සි තම අත එසවූයේය. ''ආහ්... මම පොසිඩන්ගේ පුත්‍රයා. සමහරවිට මට පුළුවන් වෙයි අලුත් ජල මූලාශ්‍රයක් කැඳවන්න.''

''හා!'' හැග්නෝ කෑ ගැසුවාය, අනෙක් අට දෙනාද ඒ ආකාරයටම කෑ ගැසූහ.

''හා! හා!''

''ඒ වුණත් පොසිඩන්ගේ පුත්‍රයාණෙනි.'' හැග්නෝ පැවසුවාය. ''මම ඔයාගෙ පියාව හොඳට දන්නවා. ඔයාල එන බව එපියාල්ටිස් සහ ඔටිස් සහතික වුණා.''

පිපර් නොවැටී සිටීමට තම අත ජේසන්ගේ උරහිස මත තැබුවාය.

''යෝධයො.'' ඇය පැවසුවාය. ''ඔයාල වැඩකරන්නෙ උන්ටද? ''

''එයාල අපේ අසල්වැසියො.'' හැග්නෝ සිනාසුණාය. ''එයාලගෙ කුටි තියෙන්නෙ මෙතනින් එහා, ක්‍රීඩා සඳහා වාරි ජලය හරවපු තැන. අපි ඔයාල එක්ක ගනුදෙනු බේරගත්තම... ඔයාල අපිට උදව් කළාම... අපි ආයෙ කවදාවත් පීඩාවට පත් නොවන බවට නිවුන්නු සහතික වුණා.''

හැග්නෝ ජේසන් දෙසට හැරුණාය. ''ඔබ, ජුපිටර්ගේ පුත්‍රයා, අපිව මෙහෙට ගෙනාව ඔබගේ පූර්වගාමියාගේ බියකරු පාවදීම වෙනුවෙන්, ඔබ වන්දි ගෙවිය යුතුයි. මම දන්නවා අහස් දෙවියන්ගේ බලය. ළදරුවකුව සිට කාලෙ ඉඳන් මම ඔහුව උස් මහත් කළා. වරක්, කිඳුරු අපි, අපේ ළිංවලට සහ දිය කඳුරු වලට ඉහළින් වැටෙන වර්ෂාව පාලනය කළා. මම නුඹව ඉවරයක් කළාම, අපිට අපේ බලයන් ආයෙ ලැබෙයි. ඒ වගේම පර්සි ජැක්සන්, මුහුදු දෙවියන්ගේ පුත්‍රයා... ඔබගෙන්, අපිට ජලය ලැබෙයි. නොනවතින ජල සැපයුමක් ලැබෙයි.''

''නොනවතින?'' පර්සිගේ දෑස් එක කිඳුරියකගේ සිට අනෙකා වෙතට මාරුවිය.

''ආහ්... බලන්න, මම දන්නෙ නැහැ නොනවතින එකක් ගැන. ඒත් සමහරවිට මට ගැලුම් කීපයක් ලබා දෙන්න පුළුවන් වෙයි.''

''ඒ වගේම පිපර් මැක්ලියාන් ඔබ.'' හැග්නෝගේ දම් දෑස් දිලිසිණි. ''බෙහොම තරුණයි, බොහොම ප්‍රේමණීයයි, බොහොම මිහිරි කටහඬකුත් තියෙනවා. ඔයාගෙන් අපිට ආපහු අපේ රූමත් බව ලැබෙයි. අපි අපේ අන්තිම පණ කෙන්ද බේරගත්තේ අද දවස වෙනුවෙන්. අපිට හරිම තිබහයි. ඔයාල තුන් දෙනාගෙන් අපිට පානය කරන්න ලැබෙයි.''

බිත්ති කුහර නවයම දිලිසෙන්නට විය. කිඳුරන් අතුරුදහන් වූ අතර ඔවුන්ගේ කුහර තුළින් ජලය- තෙල් වැනි කළු පැහැති ජලය- වෑස්සෙන්නට පටන් ගත්තේය.

# 43
# පිපර්

**නිදි යහනේ කතාවක් නොව පිපර්ට අවශ්‍ය වූයේ ප්‍රාතිහාර්යයකි.** එහෙත් කළු ජලය ඇගේ දෙපා අවට ගලා යද්දී, කම්පනයට පත්ව එතැන සිටිගෙන ඇය ඇචිලස් සඳහන් කළ පුරාවෘත්තය මෙනෙහි කළාය. -*ජල ගැල්මේ කතාව.*

නෝවාගේ කතාව නොවුණත්, එය ඇගේ පියා පැවසීමට පුරුදුව සිටි ඇටකටු බල්ලාගේ සහ නටන භූතයන්ගේ චෙරෝකී කතාවේ පිටපතක් විය.

ඇය කුඩා කාලයේදී, ඇය තම පියාගේ විශාල හාන්සි පුටුවේ ඔහුට තුරුළු වී හුන්නාය. ජනේලයෙන් ඇය මාලිබු වෙරළ තීරය දෙස බලා සිටින අතර ඇගේ පියා ඇට කතන්දර කියා දුන්නාය. ඒවා ඔහු ඔක්ලෝහාමාවල ඔහුගේ පියාගෙන් අසා දැනගත් ඒවා විය.

''මේ මිනිහාට බල්ලෙක් හිටියා.'' නිතරම ඇගේ පියා පටන් ගන්නේ එලෙසිණි.

''ඔයාට ඒ විදිහට කතාවක් පටන් ගන්න බැහැ!'' පිපර් විරෝධය පෑවාය. ''ඔයා කියන්න ඕනෙ 'එකමත් එක කාලෙක' කියලයි.''

පියා සිනාසුණේය. ''ඒත් මේක චෙරෝකී කතාවක්. එයාලා ටිකක් සරල අය ඉතිං, කොහොම වුණත්, මේ මිනිහට බල්ලෙක් හිටියා. හැමදාම මේ මිනිහා එයාගෙ බලලත් එක්ක විල අද්දරට යනවා වතුර

ගේන්න. ඒ වගේම විල ළඟදී තදින් බුරනවා හරියට ඌ ඒක දැක්කම පිස්සු වැටුණා වගේ.''

''ඉතිං එයාට පිස්සුද?''

''අහගෙන ඉන්නකො, පැටියෝ. අන්තිමේදි එච්චර බුරන එක ගැන මිනිහට බල්ල එක්ක කේන්ති ගියා. ඔහු බල්ලාට දොස් පැවරුවා. ''නරක බල්ලෝ! වතුරට බුරන එක නවත්වන්න. එතන වතුර විතරයි!'' එයාව පුදුමයට පත් කරමින් බල්ලා ඔහු දෙසට හැරිලා කතා කරන්න පටන් ගත්තා.

''අපේ බල්ලටත් පුළුවන්නේ 'ස්තුතියි' කියල කියන්න. ''ඇය පැවසුවාය. ''ඒ වගේම එයාට බුරන්නත් පුළුවන්.''

''අන්න ඒ වගේ, ඇගේ පියා පැවසුවේය. ''ඒත් මේ බල්ලට සම්පූර්ණ වාක්‍යයම කියන්න පුළුවන්කම තිබුණා. බල්ලා කිව්වා ''ඉක්මනින්ම දවසක, කුණාටුව පැමිණේවි. ජලය ඉහළ නගීවි. හැමෝම ගිලී යාවි. පහුරක් හදාගෙන ඔයාට බේරෙන්න පුළුවන්. ඔයාගෙ පවුලත් බේරගන්න පුළුවන්. ඒත් මුලින්ම ඔයා මාව බිලි දෙන්න ඕනෙ. ඔයා මාව වතුරට විසිකරන්න ඕනෙ.''

''ඒක බියකරුයි.'' පිපර් පැවසුවාය. ''මම නම් කවදාවත් මගේ බල්ලට ගිලෙන්න දෙන්නෙ නෑ.''

''සමහරවිට ඒ මිනිහත් එහෙම කියන්න ඇති. එයා හිතුවෙ බල්ල බොරු කියනවා කියලයි. බල්ලට කතා කරන්න පුළුවන් වීම ගැනත් ඔහු තිගැස්මට පත් වුණා. එයා ඒකට විරුද්ධ වෙනකොට, බල්ලා මෙහෙම කිව්වා. ''ඔයාට මාව විශ්වාස නැත්නම් මගේ බෙල්ලෙ පිටිපස්ස දිහා බලන්න. මම දැනටමත් මැරිලා.''

''ඒක දුක හිතෙන කතාවක්! ඇයි ඔයා මේක මට කියන්නෙ?''

''ඔයා මගෙන් අහපු නිසා.'' ඇගේ පිය ඇයට මතක් කළේය. එසේවුවත් කතාවේ යමක් ඇගේ සිත් ගත්තේය. ඒ කතාව ඇය බොහෝ වතාවක් අසා තිබුණත්, ඇය දිගටම ඒ ගැන සිතුවාය.''

''කොහොම වුණත්.'' ඇගේ පියා පැවසුවේය. ''මිනිසා බල්ලාව ළඟට අරගෙන උගෙ බෙල්ල පිටිපස්සෙ බලනකොට, උගේ සම සහ ලොම් දැනටමත් වෙන් වෙන්න පටන් අරන් කියලා එයාට දැකගන්න පුළුවන් වුණා. ඒකෙ ඇතුළෙන් ඇටකටු හැර වෙනත් කිසිම දෙයක් තිබුණෙ නැහැ. බල්ලා ඇටසැකිල්ලක්.''

''දුකයි.''

''මම එකඟයි. ඉතිං, ඇස්වල කඳුළු පුරවගෙන, මිනිසා බල්ලට සුබ ගමන් ප්‍රාර්ථනා කරල, ඌව වතුරට විසි කළා. ඌව එතනම ගිලුණා. මිනිසා පහුරක් හැදුවා. ජල ගැල්ම ඇති වුණාම එයාටයි, එයාගෙ පවුලෙ අයටයි බේරෙන්න පුළුවන් වුණා.''

''බල්ලා නැතුව.''

''ඔව්. බල්ලා නැතුව. වැස්ස අඩුවෙන කොට පහුර පොළොවට පහත් වුණා. ඒ වෙනකොට පණ පිටින් ඉතිරි වෙලා හිටියෙ එයායි, එයාගෙ පවුලෙ අයයි. විතරයි. කන්දේ අනෙක් පැත්තෙන් මිනිහාට සද්දයක් ඇහෙන්න පටන් ගත්තා. හරියට මිනිස්සු දහස් ගාණක් සිනාසෙමින් නටනවා වගේ. ඒත් එයා කන්ද මුදුනට නැග්ගම එයාට දකින්න ලැබුණේ බිම විසිරිලා තිබුණා ඇටකටු විතරයි. ජල ගැල්ම නිසා මිය ගිය දහස් ගාණක් මිනිස්සුන්ගෙ ඇටකටු එතන විසිරිලා තිබුණා. නටමින් සිටින්නේ මියගිය මිනිසුන්ගේ භූතයන් බව ඔහුට අවබෝධ වුණා. ඒ සද්දෙ තමයි එයාට ඇහිල තිබුණෙ.''

''පිපර් බලා සිටියාය. ''ඒ වගේම?''

''ඒ වගේම මොකුත් නැහැ. ඉවරයි.''

''ඔයාට ඒ විදිහට ඒක ඉවර කරන්න බැහැ! ඇයි භූතයො නටමින් හිටියෙ?''

''මම දන්නෙ නැහැ.'' පියා පැවසුවේය. ඔයාගෙ සීයට කවදාවත් පැහැදිලි කිරීමක් ගැන හැඟීමක් දැනිලා නෑ. සමහරවිට එක පවුලක් හරි බේරුණු එක ගැන භූතයො සතුටු වෙන්න ඇති. සමහරවිට එයාල මරණෙන් පස්සෙ ජීවිතයට සතුටු වෙන්න ඇති. එයාල භූතයොනෙ. කවුද දන්නෙ?''

පිපර් ඒ ගැන තෘප්තිමත් නොවූවාය. ඇයට පිළිතුරු නැති ප්‍රශ්න බොහෝමයක් තිබිණි. ඒ පවුල තවත් බල්ලෙක් සොයා ගත්තාද? නිසැකවම හැම බල්ලෙකුම ගිලෙන්නෙ නැත, මක්නිසාද යත් ඇයටත් බල්ලකු සිටින බැවිනි.

කතාවෙන් ඇයට කම්පාවක් ඇති නොවීය. ඇය කිසිවිටෙකත් බල්ලන් දෙස ඒ ආකාරයෙන් බැලුවේ නැත. ඔවුන් අතරින් එකකු ඇට සැකිල්ලක් වුවත් ඇයට එහි වෙනසක් නොවීය. එසේම තමන්ගේ ජීවිතය බේරා ගැනීමට මිනිසා ඔවුන්ගේ බල්ලව බිලිදුන්නේ ඇයි දැයි

ඇයට තේරුම් ගැනීමට නොහැකි විය. යමෙකු තම පවුල වෙනුවෙන් දිවි පුද කිරීම උසස් දෙයක් සේ පෙනිණි.

දැන්, රෝමයේ කිඳුරු දේවස්ථානයේ සිට, කළු වතුර ඉණ දක්වා නැගෙද්දී, ගංගා දෙවි ඇවිලස් ඒ කතාව සඳහන් කළේ ඇයි දැයි ඇය පුදුමයට පත් වූවාය.

තමාටත් පහුරක් තිබුණා නම් යැයි ඇය සිතුවාය. එහෙත් තමාත් ඇටසැකිලි බල්ලාට සමාන වේයැයි ඇය බියට පත් විය. ඇය දැනටමත් මියගොසිනි.

# 44
# පිපර්

සැලකිය යුතු වේගයකින් කාමරය පිරෙන්නට විය. පිපර්, ජේසන් සහ පර්සි බිත්තිය අත ගාමින් පිටවීමේ මාර්ගයක් සෙව්වත්, එවැන්නක් හමු වූයේ නැත. ඔවුහු බිත්ති කුහර මතට නැගී ජලයෙන් ආරක්ෂා වීමට උත්සාහ කළත්, බිත්ති කුහරවලින් ජලය ගලා එද්දී එතැන සිටගෙන සිටීම දිය ඇල්ලක දාරයේ සිටගෙන සිටීමක් බඳු විය. පිපර් බිත්ති කුහරය මත සිටිද්දී, ඉක්මනින්ම ජල මට්ටම ඇගේ දණහිස් දක්වා නැගිණි. පොළොවේ සිට අඩි අටක් පමණ උසට ජලය පිරී තිබුණ බව පෙනී ගිය අතර, එය තවත් වේගයෙන් ඉහළ නැගෙමින් තිබිණි.

''මම අකුණක් ගේන්න උත්සාහ කරන්නම්.'' ජේසන් පැවසුවේය. ''සමහරවිට වහලෙ පුපුරුවල සිදුරක් හදා ගන්න පුළුවන් වෙයි.''

''එකෙන් වහලෙ කඩාගෙන වැටිල අපි සේරම පොඩි පට්ටම් වෙයි.'' පිපර් පැවසුවාය.

''එහෙහම නැත්නම් අපිට අකුණ වදියි.'' පර්සි පැවසුවේය.

''වෙන විකල්ප නැහැ.'' ජේසන් පැවසුවේය.

''මම පතුල පරීක්ෂා කරල බලන්නම්.'' පර්සි පැවසුවේය. ''මෙතන හදල තියෙන්නෙ වතුර මලක් විදිහට නම්, එතන ගලාගෙන යන විදිහක් තියෙන්න ඕනෙ. ඔයාල බිත්ති කුහරවල රහස් පිටවීමක්

තියෙනවද බලන්න. සමහරවිට සිප්පිකටු දොර අගුලක් වෙන්නත් පුළුවන්.'' එය විකාර අදහසක් වුවත් යමක් කිරීමට පිපර් කැමති වූවාය.

පර්සි ජලයට පැන්නේය. ජේසන් සහ පිපර් බිත්ති කුහරයෙන් කුහරයට නගිමින්, පයින් ගසමින්, සිප්පි කටු කරකවමින් පිටවීමේ ස්ථානයක් සෙව්වත් එයින් ඵලක් නොවිණි.

අපේක්ෂා කළාටත් වැඩි ඉක්මනින්, පර්සි මතුපිටට පැමිණියේය. ඔහු හතිදමන්නට විය. ඇය ඔහුට කුහරයට නැගීමට අත දිගු කළාය. ''හුස්ම ගන්න බැහැ.'' ඔහු කහිමින් පැවසුවේය. ''මේ වතුර... සාමාන්‍ය නැහැ.''

*කිඳුරියන්ගේ ජීව බලය,* පිපර් සිතුවාය. එය බෙහෙවින් විෂ සහිත සහ ද්වේශ සහගතය. මුහුදු දෙවියන්ගේ පුත්‍රයාටවත් එය පාලනය කළ නොහැකිය. ඇය වටා ජලය නගිද්දී, ඇයට එහි බලපෑම දැනෙන බව පිපර්ට වැටහිණි. සැතපුම් ගණනක් දිව ගියා සේ ඇගේ දෙපා ගැහෙන්නට විය. ඇගේ දැත්, රැළි වැටී වියළී ගියේය.

කොලුවන් දෙදෙනා අලසව සෙලවුණහ. ජේසන්ගේ මුහුණ සුදුමැලි වී තිබිණි. තම අසිපත දරා සිටීමත් ඔහුට ප්‍රශ්නයක් වී ඇති බව පෙනිණි. පර්සි දියෙන් පෙඟී වෙව්ලමින් සිටියේය. වර්ණය විරංජනය වී ගියාක් මෙන් ඔහුගේ කෙස්වල තද පැහැය වියැකී ගොස් තිබිණි.

''එයාලා අපේ බලය ගනිමින් සිටිනවා.'' පිපර් පැවසුවාය.

''ජේසන්'' පර්සි පැවසුවේය. ''අකුණක් කැඳවන්න.''

ජේසන් තම අසිපත එසවූයේය. කාමරය දෙදරා ගියත්, අකුණ පැමිණියේ නැත. වහලය බිඳී ගියේ නැත. ඒ වෙනුවට මඳ වැස්සක් කුටියේ මුදුනින් පහළට ඇද හැලෙන්නට විය. වර්ෂාව කඩා වැටීමත් සමඟ පහළ වූ තඩාගය තවත් වේගයෙන් පිරී යන්නට විය. එහෙත් එය සාමාන්‍ය වර්ෂාවක් නොවීය. කඩා හැලුණු වැස්ස තඩාගයේ තිබුණු ජලය තරමටම කළු පැහැති විය. සෑම බිඳුවක්ම පිපර්ගේ සමට වේදනා දුන්නේය.

''මට වුවමනා කළ දේ නෙමෙයි.'' ජේසන් පැවසුවේය.

දැන් ජල මට්ටම ඔවුන්ගේ ගෙල දක්වා නැග තිබිණි. තම ශක්තිය ගෙවී යන බව පිපර්ට දැනුණාය. ජල ම්ලේච්ඡයන් ගැන ටොම් සීයා පැවසූ කතාව සත්‍යයකි. දුෂ්ට කිඳුරියෝ ඇගේ ජීවිතය සොරා ගනු ඇත. ''අපිව බේරෙයි.'' ඇය තමාටම කොඳුරා ගත්තාය. එහෙත් ඇයට ඒ සඳහා ඇගේ වශී කතාව යොදා ගැනීමට නොහැකිය.

ඉක්මනින්ම විෂ ජලය ඔවුන්ගේ හිස් යට කරමින් ඉහළ නගිනු ඇත. ඔවුන්ට පිහිනීමට සිදුවනු ඇත. එහෙත් මේ ජලය දැනටමත් ඔවුන්ව අප්‍රාණික කර තිබිණි.

*ඇය දර්ශනයේ දුටු ආකාරයටම ඔවුන් ගිලී යනු ඇත.*

පර්සි තම අත් වලින් ජලය ඉවත් කිරීමට තැත් කළේය. ''ඒක-ඒක පාලනය කරන්න බැහැ!''

*ඔයාට මාව බිලිදෙන්න වෙනවා,* කතාවේ ඇටසැකිලි බල්ලා පැවසුවේය. *ඔයා මාව වතුරට විසිකළ යුතුයි.*

යමෙකු තම ගෙල විවර කර අස්ථි නිරාවරණය කලාක් මෙන් පිපර්ට දැනිණි. ඇය තම කෝනුකෝපියාව අතට ගත්තාය.

''අපිට මේකත් එක්ක සටන් කරන්න බැහැ.'' ඇය පැවසුවාය. ''මෙහෙම බලාගෙන හිටියොත්, අපිව තවත් දුර්වල වෙයි.''

''ඔයා මොකක්ද කියන්නෙ?'' වර්ෂාව අතරින් ජේසන් කෑ ගසා විමසුවේය. ජල මට්ටම නිකට දක්වා පැමිණ තිබිණි. තවත් අඟල් කීපයකට පසු ඔවුන්ට පිහිනීමට සිදුවේ. එහෙත් ජල මට්ටම තිබුණේ තවමත් සිවිලිමට අඩක් පමණ දුරිනි. එබැවින් ඔවුන්ට යම් කාලයක් ලැබෙනු ඇතැයි පිපර් බලාපොරොත්තු වූවාය.

''අපිට අඟ තියෙනවා.'' ඇය පැවසුවාය. ''අපි නැවුම් ජලයෙන් කිඳුරන්ව යටකර දැමිය යුතුයි. එයාලට පාවිච්චි කරන්න පුළුවන් ප්‍රමාණයට වඩා දිය යුතුයි. අපට මේ විෂ තනුක කරන්න පුළුවන් නම්.''

''ඔයාගෙ අඟට ඒක කරන්න පුළුවන්ද?'' පර්සි තම හිස ජල මට්ටමට ඉහළින් තබා ගැනීමට උත්සාහ දරමින් පැවසුවේය. එය ඔහුට අලුත් අත්දැකීමක් බව පෙනිණි.

''උදව් කළොත් විතරයි.'' අඟ වැඩකරන්නෙ කෙසේදැයි පිපර් තේරුම් ගැනීමට පටන් ගෙන තිබිණි. එයින් නිපදවෙන හොඳ දේවල් කොහෙන්වත් පැමිණෙන ඒවා නොවීය. ඇය ආහාර වලින් හර්කියුලිස්ව යටකර දැම්මේ ජේසන් සමඟ ඇගේ ධනාත්මක අත්දැකීම් සියල්ල සිහිපත් කිරීමෙනි.

මේ කාමරය පිරවීමට ප්‍රමාණවත් තරම් නැවුම් ජලය නිර්මාණය කිරිමට, ඇයට තවත් ගැඹුරට යා යුතු විය. ඇගේ හැඟීම්වලට තවත් තට්ටු කළ යුතුය. අවාසනාවකට, සිත එකඟ කර ගැනීමේ ඇගේ හැකියාව අහිමි වී ගොස් තිබිණි.

''මට ඕනෙ කරනවා ඔයාලට ලබා ගන්න පුළුවන් හැම දෙයක්ම කෝනුකෝපියාවට යොමු කරන්න.'' ඇය පැවසුවාය. ''පර්සි, මුහුද ගැන හිතන්න.''

''ලවණ ජලයද?''

''ඒකෙ ප්‍රශ්නයක් නැහැ! පිරිසිදු නම්. ජේසන් වැහි කුණාටු ගැන හිතන්න. වැඩියෙන්ම වර්ෂාව ගැන. ඔයාල දෙන්නම කෝනුකෝපියාව අල්ල ගන්න.''

ඔවුන් එකට ගුලි වී සිටිද්දී ජලය ඔවුන්ගේ මුව විටට ළඟා විය. දිය මත ලිස්සායාම පටන් ගනිද්දී පිපර්ට ඇගේ පියා දුන් ආරක්ෂිත පාඩම් ඇගේ මතකයට නැගිණි. ගිලෙන කාට හරි උදව් කරන කොට, ඔයාගෙ අත් එයාල පිටිපස්සේ වටේ දාගෙන, ඔයාගෙ ඉස්සරහට කකුල් වලින් ගහන්න. එතකොට ඔයාට පස්සට ඇදෙයි. වෙනත් දෙදෙනකු වෙනුවෙන් ඒ උපක්‍රමය වැඩකරාවිදැයි ඇයට විශ්වාසයක් නොතිබුණත්, ඇය තම දෑත් පර්සි සහ ජේසන් වටා දමාගෙන, කෝනුකෝපියාව අල්ලාගෙන සිටින ඔවුන් දෙදෙනා ජලයේ පා කරවීමට උත්සාහ ගත්තාය.

කිසිවක් සිදු නොවිණි. වර්ෂාව කාමරය තුළට කඩා හැලිණි. එය තවමත් කළු පැහැති සහ ආම්ලික විය.

පිපර්ගේ දෙපා ඊයම් මෙන් බර වී තිබිණි. ඉහළ නගින ජලය සුළියක් වෙමින් ඇයව පතුලට ඇදීමට උත්සාහ කළේය. ඇගේ ශක්තිය හීනවන බව ඇයට දැනිණි.

''හරියන්නෙ නෑ!'' ජේසන් පැවසුවේය.

''ඔයාල දෙන්න එකට වැඩේ කරන්න ඕනෙ.'' පිපර් කෑ ගැසුවාය. ''ඔයාල දෙන්නම පිරිසිදු වතුර ගැන හිතන්න- කුණාටු ජලය. වෙන කිසිම දෙයක් අල්ල ගන්න එපා. ඔයාලගෙ සියලු බලයන් මතක් කර ගන්න. ඔයාලගෙ ඉතිරිවෙල තියෙන සියලු ශක්තිය අරගන්න.''

''ඒක අමාරු නැහැ.'' පර්සි පැවසුවේය.

''ඒත් බලය ඉවරවෙනවා.'' ඇය පැවසුවාය. ''හැමදෙයක්ම පිරිනමන්න- හරියට- හරියට ඔයාල දනටමත් මැරිල වගේ දෙයක්.'' ඔයාලගෙ එකම අරමුණ කිඳුරියන්ට උදව් කිරීම වගේ දෙයක්. ''ඒක ත්‍යාගයක් වෙයි... පරිත්‍යාගයක් වෙයි.''

ඒ වදනින් ඔවුහු නිහඬ වූහ.

''අපි ආයෙත් උත්සාහ කරමු. ජේසන් පැවසුවේය. ''එකට.''

මේ වතාවේ පිපර් ඇගේ සියලු සිතිවිලි සමෘද්ධියේ අඟට යොමු කළාය. කිඳුරියන්ට ඇගේ තාරුණ්‍ය, ඇගේ ජීවිතය, ඇගේ හඬ අවැසි වුවා නොවේද? හොඳයි. ඇය තමාගේ සියලු බලය තමාගෙන් ගලා යෑමට සැලැස්සුවාය.

*මම දැනටමත් මැරිලා,* ඇය තමාටම පවසා ගත්තාය, ඇටසැකිලි බල්ලා කියපු විදිහට. මේක තමයි එකම විදිහ.

දැවැන්ත බලයකින් පිරිසිදු ජලය අඟ තුළින් නික්මිණි. එහි ප්‍රබල වේගයෙන් ඔවුහු බිත්තිය දෙසට විසිවී ගියහ. වර්ෂාව සුදු පැහැයට මාරු වී පැහැදිලි සහ සිසිල් විය.

''ඒක වැඩ කළා.'' ජේසන් පැවසුවේය.

''හොඳ වැඩියි.'' පර්සි පැවසුවේය. ''අපි කාමරය තවත් වේගයෙන් පුරවනවා.'' ඔහු නිවැරදි විය. කාමරය වහලය දක්වා පිරී යාමට තිබුණේ තවත් අඩි කීපයකි පමණි. පිපර්ට ඉහළ නැගී කුඩා වැසි වළාකුළු ඇල්ලීමට පවා හැකි විය.

''නවත්වනන් එපා.'' ඇය පැවසුවාය. ''කිඳුරියො පිරිසිදු වෙනතුරුම අපි විෂ තනුක කරන්න ඕනෙ.''

''එයාලට පිරිසිදු වෙන්න බැරිවුණොත් මොකද වෙන්නෙ?'' ජේසන් විමසුවේය. ''එයාල යක්ෂයෝ වෙලා අවුරුදු දහස් ගාණක්ම මෙතන ඉන්නෙ.''

''ආපහු හැරෙන්න එපා.'' පිපර් පැවසුවාය. ''හැමදෙයක්ම දෙන්න.'' වෙන එකක් තියා ඇගේ හිස ද සිවිලිමේ ගැටිණි. වැසි වළාකුළු දිය වී ජලය බවට පත් විය. සමෘද්ධියේ අඟ දිගටම පිරිසිදු ජලය විහිදන්නට විය.

ජේසන්ව තමා සමීපයට ඇද ගත් පිපර් ඔහුව සිප ගත්තාය.

''මම ඔයාට ආදරෙයි.'' ඇය පැවසුවාය.

ඒ වචන ඇගෙන් පිටවූයේ කෝනුකෝපියාවෙන් ජලය පිටවන්නාක් මෙනි. ඔහුගේ ප්‍රතික්‍රියාව කුමක් වී දැයි ඇයට කිව නොහැකි වූයේ ඒ වනවිට ඔවුන් සිටියේ දිය යට නිසාය.

ඇය තම හුස්ම රඳවා ගත්තාය. ජල තරංග ඇගේ කන්වල ගිගුම් දුන්නේය. ඇය වටා බුබුළු නැගෙන්නට විය. ආලෝකය තවමත්

කාමරය තුළ තරංග නැගිණි. ඇයට එය දැකීමට හැකි වීම පිපර්ගේ පුදුමයට හේතු විය. වතුර පැහැදිලි වෙන්න පටන් අරන් ද?

ඇගේ පෙනහළු පුපුරා යාමට ආසන්න වී තිබිණි. එහෙත් පිපර් තම අවසන් ශක්තිය කෝනුකෝපියාවට යෙදවූවාය. කාමරය සම්පූර්ණයෙන්ම දියෙන් පිරී ගිය අතර එතැන තවදුරටත් කාමරයක් නොතිබිණි. පීඩනය නිසා බිත්ති පුපුරයිද?

පිපර්ගේ දර්ශනය අඳුරු වී ගියේය.

ඇගේ කන් වලට ඇසෙන ගර්ජනය, ඇගේම මියයන හදවතේ ගැස්ම යැයි ඇයට සිතිණි. එවිට කාමරය ගැස්සෙන බව ඇයට අවබෝධ විය. ජලය වේගයෙන් කරකැවෙන්නට විය. පිපර්ට තමා ගිලී යන බව දැනිණි.

තම අවසන් ශක්තිය යොදමින් ඇය උඩට ඒමට පාද ගැසුවාය. ඇගේ හිස ජලයෙන් මතු වූ අතර ඇය ආයාසයෙන් හුස්ම ගත්තාය. කෝනුකෝපියාව නැවතිණි. කාමරය ජලයෙන් පිරුණු තරම් වේගයෙන්ම එය බැස යාමට පටන් ගත්තේය.

අනතුරු ඇඟවීමේ කෑ ගැසීමක් ද සමඟ පර්සිගේ සහ ජේසන්ගේ මුහුණු තවමත් දියයට බව ඇයට අවබෝධ විය. ඇය ඔවුන්ට ඉහළට පැමිණීමට උපකාර කළාය. ක්ෂණිකව පර්සි පිහිනන්නට පටන් ගත් නමුත්, ජේසන් කැඩුණු බෝනික්කකු මෙන් අප්‍රාණිකව සිටියේය.

පිපර් ඔහුව සෙලවූවාය. ඔහුගේ නම කියා කෑ ගැසුවාය. ඔහුගේ මුහුණට ගැසුවාය. ඔවුන්ට තෙත් පොළොවේ ඉතිරි කර ජලය සියල්ල බැස ගොස් තිබුණු බව ඇගේ අවධානයට ලක් නොවීය.

''ජේසන්!'' ඇය උමතුවෙන් සිතන්නට වූවාය. තමා ඔහුව පැත්තකට හැරවිය යුතුද? මුනින් අතට හැරවිය යුතුද?

''පිපර්.'' පර්සි පැවසුවේය. ''මම පුළුවන් උදව් කරන්න.''

ඇය අසලින් දණ නවාගත් පර්සි, ජේසන්ගේ නළල ස්පර්ශ කළේය. ජේසන්ගේ මුවින් වතුර විද්දේය. ඔහුගේ දෑස් විවර විය. අකුණක් වැනි අත් පුඩියකින් පර්සි සහ පිපර් පිටුපසට විසි වූහ.

පිපර්ගේ දර්ශනය පැහැදිළි වෙද්දී, තවමත් හතිලමින් ජේසන් හිඳගෙන සිටිනු පෙනිණි. එහෙත් ඔහුගේ මුහුණේ පැහැය නැවත ලැබී තිබිණි. ''සමාවෙන්න.'' ඔහු කැස්සේය. ''මම අදහස් කළේ නෑ-''

පිපර් ඔහුව වැළඳ ගත්තාය. ඇයට ඔහුව සිප ගැනීමට හැකි වුවත්, ඔහුගේ හුස්ම හිර කිරීමට ඇයට වුවමනා නොවීය.

පර්සි විරිත්තුවේය. ''පුදුම වෙන්න දෙයක් නෑ, ඔයාගෙ පෙනහලුවල තිබුණ පිරිසිදු වතුර. මට කිසි ප්‍රශ්නයක් නැතුව ඒව එළියට ගන්න පුළුවන් වුණා.''

''ස්තුතියි, මනුස්සයෝ.'' ජේසන් දුර්වල ලෙස තම දෑත් පිරිමැද්දේය. ''ඒ මම හිතන්නේ පිපර් තමයි නියම වීරයා. එයා අපි හැමෝම බේර ගත්තා.''

*ඔව්, එයා එහෙම කළා.* හඬක් කාමරය පුරා දෝංකාර දුන්නේය.

බිත්ති කුහර දිලිසිණි. රූප නවය දර්ශනය විය. එහෙත් ඔවුහු තවදුරටත් වියළි ගිය සත්ත්වයින් නොවූහ. ඔවුහු තරුණ වී රූමත් කිඳුරියන් වී සිටියහ. නිල් පැහැති ගවුම් වලින් සැරසී සිටි ඔවුන්ගේ කෝණ්ඩය මත රිදී සහ රන් කටු ගසා තිබිණි. ඔවුන්ගේ දෑස්වල නිල් සහ කොළ මිශ්‍ර වර්ණයක් දක්නට ලැබිණි.

පිපර් බලා සිටිද්දී, කිඳුරියන් අට දෙනෙකු දුමාරයක් බවට පත් වී ඉහළට ඇදී ගියහ. මැද සිටි කිඳුරිය පමණක් ඉතිරි විය.

''හැග්නෝ ද?'' පිලිපා විමසුවාය.

කිඳුරිය සිනාසුණාය. ''ඔව්, මගේ පැටියෝ. මම හිතුවෙ නෑ, එච්චර පරාර්ථකාමී බවක් මිනිසුන්ගෙ ඉතිරි වෙලා ඇති කියලා... විශේෂයෙන් උප දෙවිවරුන්ගේ. කිසිම විරෝධයක් නැහැ.''

පර්සි නැගිට්ටේය. ''අපි කොහොමද විරුද්ධ නොවී ඉන්නෙ? ඔයා අපිව ගිල්ලවලා අපේ ජීවිත උරාගන්න හැදුවෙ.''

හැන්ගෝ සිනාසුණාය. ''ඒ ගැන කණගාටුයි. මම මම වෙලා නෙමෙයි හිටියෙ. ඒත් ඔයාල මට තණ පිටියක දිය කඳුර, හිරු සහ වර්ෂාව මතක් කරල දුන්නා. පර්සි සහ ජැක්සන්, ඔයාලට ස්තුතියි. මට මුහුදයි, අහසයි මතක් වුණා. මම පිරිසිදු වෙලා. ඒත් වැඩියෙන්ම ස්තුතියි පිපර්ට. එයා පිරිසිදු ගලන ජලයට වඩා දෙයක් ලබා දුන්නා.''

හැග්නෝ ඇය දෙසට හැරුණාය. ''ඔයාට හොඳ හැදියාවක් තියෙනවා, පිපර්. ඒ වගේම මම ස්වභාවික ආත්මයක්. මම දන්නවා මම කතා කරන්නෙ මොනවද කියලා.''

හැග්නෝ කාමරයේ අනෙක් පැත්ත පෙන්වූවාය. මතුපිටට යන පියගැට පෙළ නැවත දර්ශනය වෙමින් තිබිණි. හරියටම යටින්,

ජලාපවාහන නලයක් මෙන් වූ කවාකාර විවරයක් පිහිටා තිබිණි. එය ඇතුළට බැසීමට තරම් විශාලත්වයෙන් යුක්ත විය. ජලය බැස ගියේ කෙසේදැයි පිපර්ට පැහැදිලි විය.

''ඔයාල මතුපිටට යාවි.'' හැග්නෝ පැවසුවාය. ''නැත්නම්, ඔයාල ඒකට අකැමැති නම්, ඔයාලට ජල මාර්ගය අනුව යෝධයො ළඟට යන්නත් පුළුවන්. ඒත් ඉක්මනින් තෝරගන්න, මොකද මම ගිය සැනින් දොරටු දෙකම නැතිවෙලා යනවා. ඒ නල සම්බන්ධ වෙන්නෙ පරණ වාරි මාර්ගයට. ඒකෙන් තමයි මේ කිඳුරු දේවස්ථානටයි, යෝධයන්ගෙ නිවස කියන හයිපොජියම් එකටයි ජලය ලැබෙන්නෙ.''

''ආහ්.'' පිපර් තම කම්මුල්වල අත ගසාගත්තාය. ''කරුණාකරල, තවත් නම් සංකීර්ණ වචන එපා.''

''ඕහ්, ගෙදර කියන්නෙ සංකීර්ණ වචනයක් නෙමෙයි.'' හැග්නෝ පැවසුවාය. ''මම ඒ ගැන හිතුව, ඒත් ඔයාල අපිට මෙතනට තිබුණ බන්ධනයෙන් නිදහස් කළා. මගේ සහෝදරියො අලුත් නිවහන් සොයමින් ගියා... කඳුකර දිය කඳුරක්, සමහරවිට, එහෙම නැත්නම් තෘණ පිටියක විලක්. මම එයාල පස්සෙන් යන්න ඕනෙ. මට ආයෙත් වනාන්තර සහ තෘණ භූමි දකිනකම් ඉවසිල්ලක් නැහැ. ඒ වගේම ගලායන පිරිසිදු ජලය.''

''ආහ්.'' පර්සි අපහසුවෙන් පැවසුවේය. ''ගෙවුණු අවුරුදු දහස් ගාණ පුරාම උඩින් තියෙන දේවල් වෙනස් වෙලා.''

''විකාර.'' හැග්නෝ පැවසුවාය. ''ඒක කොච්චර නරක් වෙන්න පුළුවන්ද? ස්වභාවධර්මයට වෙනස්වෙන්න පෑන් ඉඩ දෙන එකක් නැහැ. මට ඔහුව දකිනකම් ඉවසිල්ලක් නෑ.''

පර්සි යමක් පැවසීමට සූදානම් බව පෙනුණත්, ඔහු එය ආයාසයෙන් වළකා ගත්තේය.

''සුබ ගමන්, හැග්නෝ.'' පිපර් පැවසුවාය. ''ඒ වගේම ඔයාට ස්තුතියි.''

අවසන් වරට සිනාසුණ කිඳුරිය වාෂ්ප වූවාය.

කෙටි වේලාවකට කිඳුරු දේවස්ථානය, පුර පෝය දිනයක් මෙන් බැබළිණි. පිපර්ට ඈතින් සංගීතයක් සහ සතුටින් කතා කරන සිනාසෙන හඬක් ඇසිණි. තමාට ඇසෙන්න වසර සියගණනක් තිස්සේ මෙම පූජනීය ස්ථානයේ පැවතුණ උත්සව සහ සැමරුම්වල හඬ යැයි

ඇය අනුමාන කළාය. එය හරියට ආත්මයන් සමඟ මතකයන්ද නිදහස් වූවා වැනි හැඟීමකි.

''ඒ මොකක්ද?'' ජේසන් කලබලයෙන් විමසුවේය.

පිපර් ඔහු මත අත තැබුවාය. ''භූතයෝ නටනවා. එන්න. ඊට වැඩිය හොඳයි අපි ගිහින් යෝධයින්ව හමු වෙන එක.''

අතීතයේ සෙවණැලි

# 45
# පර්සි

**පර්සි ජලයෙන් වෙහෙසට පත්ව සිටියේය.**

ඔහු එය හඬ නගා පැවසුවේ නම්, ඔහුට සිදුවන්නේ පොසිඩන්ගේ කනිෂ්ඨ මුහුදු සේවකයකු ලෙස පල්ලම් බැසීමටය, එහෙත් ඔහු ගණන් ගන්නේ නැත. කිඳුරු දේවස්ථානයෙන් යාන්තමින් පණ බේරාගත් පසු, ඔහුට අවශ්‍ය වූයේ මතුපිටට යාමටය. ඔහුට ඇඟපත වියළාගෙන දිගු වේලාවක් හිරු රැස් තැපීමට අවශ්‍ය විය- ඒ ඇනබෙත් ද සමඟය.

අවාසනාවකට, ඇනබෙත් කොහෙද කියා ඔහු නොදැන සිටියේය. ෆ්‍රෑන්ක්, හේසාල් සහ ලියෝ ක්‍රියාන්විතයෙන් අතුරුදහන්ව සිටියහ. පණ නල රැකී ඇතැයි සිතන නිකෝ ඩී ආන්ජලෝ බේරා ගැනීම තවමත් ප්‍රමුඛ කාර්යයක් වී තිබිණි. එසේම යෝධයන්ගේ පුංචි ස්වාමියන් රෝමය විනාශ කර, ගයියා අවදි කර ලෝකයේ පාලනය අතට ගැනීමද නතර කළ යුතු විය.

බැරෑරුම් ලෙස සලකා බැලූ විට මේ රාක්ෂයන් සහ දෙවියන් වසර දහස් ගණනක් වයසැති අය වූහ. ඔවුන්ව දශක කීපයකට ඉවත් කර තබා පර්සිට ජීවත් විය හැකිද? පෙනෙන ආකාරයට නොහැකිය.

ජලාපවහන නලයට බැසීමෙන් පසු පර්සි පෙරමුණ ගත්තේය. අඩි තිහකට පසු, එය තවත් පුළුල් උමඟකට විවෘත විය. ඔවුන්ගේ වම්පසට වන්නට, ඈත යම් තැනක, පර්සිට ගොරවන සහ බිඳෙන හඬක් ඇසිණි. ඒ හඬ හරියට තෙල් අවශ්‍ය වූ විශාල යන්ත්‍රයක් මෙනි.

ඒ හඬ නගන්නේ කුමක්දැයි සෙවීමේ අභිප්‍රායක් ඔහුට කෙහෙත්ම නොවුවත්, යා යුතු මඟ එය යැයි ඔහු වටහා ගත්තේය.

අඩි සියයක් පමණ ගිය පසු, ඔවුන් උමගේ හැරවුමක් වෙත ළඟා වූහ. පර්සි අතක් ඔසවා ජේසන් සහ පිපර්ට නවතින ලෙස සංඥා කළේය. ඔහු හිස පොවා උමඟ කෙළවර පරීක්ෂා කළේය.

කොරිඩෝව විශාල කාමරයකට විවෘත විය. එහි සිවිලිම අඩි විස්සක් පමණ උසින් යුක්ත වූ අතර, උපකාරක කුලුනු පෙළක්ද පිහිටා තිබිණි. එය පර්සි සිහිනෙන් දුටු නැවැත්වීමේ ගරාජයක් වැනි කොටසට සමාන විය. එහෙත් දැන් එතුළ බෙහෝ දෑ දක්නට ලැබිණි.

පැහැදිලි හේතුවක් නොපෙනුණ නමුත්. එහි පොළොවේ කොටසක් උස් පහත් කිරීම සඳහා යොදා ගත් ලීවර සහ කප්පි පද්ධතියකින් ගෙරවුම් සහ බිඳුම් හඬ නැගී ආවේය. විවෘත අගල්වල ජලය ගලා ගියේ (ඕහ්, නියමයි, තවත් වතුර) සමහර යන්ත්‍ර හැරවීමට අවැසි ජල රෝද වලට බලය සපයමිනි. අනෙක් යන්ත්‍ර විශාල හැම්ස්ටර් රෝදයකට සම්බන්ධ කර තිබිණි. එතුළ දඩයම් බල්ලන් ද වූහ. පර්සිට ඕ' ලෙයරි මහත්මිය මතක් විය. මෙවැන්නක් ඇතුළේ සිරවී සිටීමට ඇය කෙතරම් වෛර කරනු ඇති ද?

සිවිලිමේ එල්ලෙමින් තිබූ කූඩුවල සජීවි සිංහයෙක්, සීබ්‍රාවුන් කීප දෙනෙක් සම්පූර්ණ හයිනා රංචුවක් පමණක් නොව ඔලු අටේ හයිඩ්‍රාවකු ද විය. පැරණි පෙනුමැති ලෝකඩ සහ සම් වාහක පටිය මත ආයුධ මිටි සහ සන්නාහ පෙරළී ගියේය. එය හරියට සියැටල්වල ඇමසන් සමාගමේ බඩු ගබඩාවක් මෙන් වූ අතර ඊට වඩා වෙනස් වූයේ නම් ඒ මෙම ස්ථානය නිසැක ලෙසම වඩා පැරණි වීම සහ හොඳින් සංවිධානය වී නොතිබීම අතින් පමණි.

ලියෝ එයට කැමති වනු ඇතැයි, පිපර් සිතුවේය. මුළු කාමරයම එක් දැවැන්ත, බියජනක, අවිශ්වාස සහගත යන්ත්‍රයක් බවට පත් වී තිබිණි.

''මොකද ඒක?'' පිපර් කෙඳිරුවාය.

පිළිතුරු කෙසේ දිය යුතු දැයි පර්සිටත් සිතා ගත නොහැකි විය. ඔහුට යෝධයන් දැක ගැනීමට නොලැබිණි, ඔහු ඉදිරියට පැමිණ බලන ලෙස තම මිතුරන්ට ඉඟි කළේය.

දොරටුවේ සිට අඩි විස්සක් පමණ ඇතුළත ගෙබිමෙන් ජීවමාන ප්‍රමාණයේ දැව මල්ලවපොර ශූරයෙක් මතු විය. එය වාහක පටිය දිගේ ගොස් කඹයක් ඇමිණී වහලයේ තිබූ සිදුරක් දක්වා එසැවිණි.

ජේසන් මිමිණුවේය. ''මොන විකාරයක්ද?''

ඔහු ඇතුළට පියවර තැබූහ. පර්සි කාමරය පරීක්ෂා කළේය. එහි නැරඹීමට දහස් ගණනක් දෑ වූ අතර, වැඩි ප්‍රමාණයක් චලනය වෙමින් තිබිණි. එහෙත් ADHD වලින් පෙළෙන උප දෙවියෙකුගේ එක් යහපත් ආකාරයක් වූ පර්සි ව්‍යාකූලත්වයෙන් අපහසුවට පත් නොවීය. යාර සියයක් පමණ ඈතින්, බෙහෙවින් විශාල, හිස් වූ විතිසුරු අසුන් දෙකක් සහිත වේදිකාවක් එසවෙනු ඔහුට පෙනිණි. ඒ අසුන් දෙක මැද තිබුණේ කෙනෙකු බහාලීමට තරම් විශාලත්වයෙන් යුත් ලෝකඩ බඳුනකි.

''බලන්න.'' ඔහු අනෙක් මිතුරන්ට එය පෙන්වීය.

පිපර් මුහුණ හැකිලුවාය. ''ඒක හරිම ලේසියි.''

''ඇත්තවශයෙන්ම.'' පර්සි පැවසුවේය.

''ඒත් අපිට වෙන විකල්පයක් නැහැ.'' ජේසන් පැවසුවේය. ''අපි නිකෝව බේර ගන්න ඕනෙ.''

''ඔව්.'' පර්සි කාමරය පුරා නැරඹුවේය. ඔහුගේ දෑස් වාහක පටියට සහ චලනය වන වේදිකාවට යොමු විය.

හැම්ස්ටර් රෝදය තුළ සිටි දඩ බල්ලන් ඔවුන් කෙරෙහි අවධානයක් දක්වන බවක් නොපෙනුණි. ඔවූහු දිව යාමෙනුත්, හති දැමීමෙනුත් හෙම්බත් වී සිටියහ. ඔවුන්ගේ රතු දෑස් විදුලි පහන් සේ දැල්විණි. කූඩුවල සිටි අනෙක් සතුන්ද ඔවුන් දෙස හෙලුවේ උදාසීන බැල්මකි. *මම උඹලව මරණවා, ඒත් ඒට ගොඩක් ශක්තිය වැය වෙයි,* යනුවෙන් පැවසෙන බැල්මක් ඔවුන් තුළ විය.

පර්සි උගුල් ගැන ද ප්‍රවේසම් විය. එහෙත් මෙහි තිබූ සෑම දෙයක්ම උගුලක් බව පෙනිණි. වසර කීපයකට පෙර තමා වංකගිරියක් තුළ කී වතාවක් මරණයේ මුවවිටට ගියේ දැයි පර්සිට සිහිපත් විය. හේසාල් මෙහි සිටියේ නම් කෙතරම් අගනේ දැයි ඔහුට සිතිණි. එසේ වූවා නම් ඇයට තම භූගත කුසලතාවලින් ඔවුන්ට උදව් කිරීමට හැකිවනු ඇත. (එසේම ඇයට තම සෙහොයුරා සමඟ නැවත එක්වීමටද ලැබෙනු ඇත.)

දිය අගල්වලින් එහා පැත්තට පැනගත් ඔවුහු, වෘකයන්ගේ කුඩු පෙළකට යටින් පහත් වූහ. ඔවුන්ට ඉහළින් වූ සිවිලිම විවෘත වන විට, ඔවුන්ට ලෝකඩ බඳුන වෙත තිබුණේ තවත් අඩ දුරක් පමණි. වේදිකාව පහත් විය. නළුවකු මෙන් සිටගෙන, හිසටත් උඩින් අත ඔසවාගෙන එහි සිටියේ දම් පැහැති කෙසින් යුත් එපියාල්ටිස් යෝධයාය.

පර්සි තම සිහිනවලදී දුටු ලෙසටම. යෝධයන්ගේ ප්‍රමාණයට අනුව මහා එෆ් කුඩා ය. අඩි දොළහක් පමණ උසය. එහෙත් ඔහු තම ඇඳුම් පැළඳුම්වලින් එය වසා ගැනීමට උත්සාහ කර තිබුණේය. ඔහු තම මල්ලවපොර සන්නාහාය මාරු කර දූන් හැඳ සිටියේ හවායි කමිසයකි. එහි මියයන වීරයින්, දරුණු වධදීම්, කොලෝසියම තුළදී වහලුන්ව කා දමන සිංහයන් ආදී රූප සිතුවම් තර තිබිණි. යෝධයාගේ කොණ්ඩයේ රිදී සහ රන් කාසි එල්ලා තිබිණි. අඩි දහයක් පමණ උසැති හෙල්ලක් ඔහුගේ පිටේ එල්ලී තිබිණි. එහෙත් එය ඔහුගේ කමිසයට නම් ගැලපෙන විලාසිතාවකැයි කිව නොහැකි විය. සුදු කළිසමකින් සැරසී සිටි ඔහුගේ හම් පාවහන්..., හොඳයි, එහි අඩියක් වෙනුවට තිබුණේ දඟර ගසා ගත් සර්ප හිස් ය. යෝධයාගේ බර දරා ගැනීමට සූදානම් නැති බව පෙන්වීමට මෙන් ඔවුහු තම දිව එළියට දමමින් නලියමින් සිටියහ.

ඔවුන්ව දැකීම ඔහුගේ අතිශය ප්‍රීතියට හේතු වූ බවක් පෙන්වමින් එපියාල්ටිස් උප දෙවියන් වෙත සිනාවක් පෑවේය.

''අන්තිමේදි!'' ඔහු පහතට බැස්සේය. ''හරිම සතුටුයි! ඇත්තටම. මම හිතුවෙ නෑ ඔයාලට කිඳුරියන්ව පහු කරන්න පුළුවන් වෙයි කියලා. ඒත් ඔයාල ඒක බොහොම අපූරුවට කළා. බොහෝම විනෝද ජනක විදිහට. දූන් ඔයාලගෙ ප්‍රධාන සිදුවීමට වෙලාව ඇවිත්.''

ජේසන් සහ පිපර් පර්සිට සමීපයෙන් ඔහුගේ දෙපසට වූහ. ඔවුන් එසේ කළ විට එය ඔහුට යම් පහසු හැඟීමක් ඇති කළේය. මේ යෝධයා ඔහු මුහුණ දී ඇති බොහෝ රාක්ෂයන්ට වඩා කුඩා වූ නමුත්, ඔහු කෙරෙහි වූ යම් දෙයක් පර්සිව අවුල් කරලීමට සමත් විය. එපියාල්ටිස්ගේ දෑස් උමතු දීප්තියකින් නැටවුණේය.

''අපි මෙතන.'' පර්සි පැවසුවේය. එහෙත් ඔහුගේ ස්වරයේ සැබැවින්ම වූයේ *'අපේ යාළුවා නිදහස් කරන්න'* වැනි විධානයකි.

''ඇත්තවශයෙන්ම.'' එපියාල්ටිස් පැවසුවේය. ''ඒ වුණත් මට බය තියෙන්නෙ එයාගෙ කල් ඉකුත්වීමේ දිනය ටිකක් පහුවෙලා නිසයි. ඔටිස්, ඔයා කොහෙද?''

පාෂාණ හතර අත විසි කරමින් පොළොව විවර විය. වේදිකාවක් මතින් අනෙක් යෝධයා ඉහළට පැමිණියේය.

''ඔටිස්, අන්තිමේදි.'' ඔහුගේ සොහොයුරා ප්‍රීතියෙන් කෑ ගැසුවේය.

''ඔයා මම වගේ නෙමෙයි ඇඳුම් ඇඳල තියෙන්නෙ! ඔයා...'' එපියාල්ටිස්ගේ මුහුණ බියකරු ඉරියව්වකට පෙරලිණි. ''මොනවද උඹ ඇඳගෙන ඉන්නෙ?''

ඔටිස් ලොව විශාලතම, නොඉවසිලිවන්තම බැලේ නර්තන ශිල්පියා මෙන් දිස්විය. ඔහු ඇඳ සිටියේ ඇඟට ඇලී ගිය ලා නිල් පැහැති නර්තන ඇඳුමකි. ඔහුගේ දැවැන්ත නර්තන පාවහන් කපා ඉවත් කර තිබූ හෙයින් ඔහුගේ සර්පයන්ට එබී බැලීමට හැකි විය. දියමන්ති ඔටුන්නක් ගිනිකෙළි සමඟ ගෙත්තම් කළ ඔහුගේ කොළ පැහැති, කොණ්ඩය සහිත හිස මත රඳවා තිබිණි. ඔහු නොසතුටු පෙනුමකින් සහ සැලකිය යුතු තරම් අපහසුතාවකින් සිටින බවක් පෙනී ගියේය. එහෙත් ඔහුට නර්තන ශිල්පියාගේ ආචාරය යාන්තමට කර ගත හැකිවිය. සර්ප අඩියත්, විශාල හෙල්ලත් සමඟ එය පහසු කාර්යයක්ද නොවේ.

''දෙවිවරු සහ යෝධයෝ!'' එපියාල්ටිස් කෑ ගැසුවේය. ''දැන් සංදර්ශන වේලාවයි! ඔයාල මොකද හිතන්නේ?''

''මම හිතන්නෙ නෑ මට මල්ලවපොර ශූරයන්ගෙ ඇඳුම් ඕනෙ කියලා.'' ඔටිස් මැසිවිලි නැගුවේය. ''මම තවමත් හිතනවා බැලේ හොඳ වෙයි කියලා, අරගලය යන අතරෙ.'' ඔහු බලාපොරොත්තු සහගතව උප දෙවිවරු දෙස බලා දෙබැම එසැවූයේය. ''මගෙ ළඟ තව අමතර ඇඳුම් තියෙනවා.''

''නෑ!'' එපියාල්ටිස් පැවසුවේය. එකවතාවකට පර්සි එයට එකඟ විය.

දම් පැහැති කෙස් ඇති යෝධයා පර්සි දෙසට හැරුණේය. ඔහු විදුලි සැරයක් වැදුණාක් මෙන් වේදනාකාරී ලෙස විරිත්තුවේය. ''කරුණාකරලා, මට සමාවෙන්න සහෝදරයා.'' ඔහු පැවසුවේය.

''එයාගෙ වේදිකා දර්ශනය  භයානකයි. ඒ වගේම එයාට ශෛලිය ගැන හැඟීමක් නැහැ.''

''හරි.'' පර්සි පැවසුවේය. ඔහු හවායි කමිසය ගැන අදහස් ප්‍රකාශ නොකිරීමට තීරණය කළේය. ''දැන් අපේ මිත්‍රයා ගැන...''

''ආහ්, ඔහුට.'' එපියාල්ටිස් උපහාසයෙන් විරිත්තුවේය. ''අපි එයාව ප්‍රසිද්ධියේ මැරෙන්න අරින්න හිටියෙ, ඒත් එයාගෙ කිසිම විනෝදජනක වටිනාකමක් නැහැ. එයා දවස් ගාණක්ම කළේ වකුටු වෙලා නිදාගන්න එකයි. ඒක මොන තරම් අපූරු දර්ශනයක්ද? ඔටිස්, ජෝගුවෙ පියන අරින්න.''

ඔටිස් ගාටමින් උස් වේදිකාවට ගියේය. ඔහු බඳුනට පහරක් එල්ල කළ අතර, පියන ගැලවී ගොස් නිකෝ ඩි ආන්ජලෝ පිටතට විසි විය. ඔහුගේ මරණීය සුදුමැලි මුහුණත්, කෘෂ සිරුරත් පර්සිගේ හදවත නතර කිරීමට සමත් විය. ඔහු මිය ගොසින්ද නැතිනම් ජීවතුන් අතර දැයි පර්සිට තේරුම් ගත නොහැකි විය. ඔහුට එතැනට ගොස් පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවත් එපියාල්ටිස් ඔහුගේ මඟ අවුරාගෙන සිටියේය.

''දැන් අපි ඉක්මන් කරන්න ඕනෙ.'' මහා F පැවසුවේය. ''අපි ඔයාලගෙ වේදිකා අධ්‍යක්ෂණයට යා යුතුයි. හයිපොජියම් එකේ සේරම ලෑස්තියි.''

මේ යෝධයාව බාගෙට පෙති ගසා එතනින් පිටව යාමට පර්සි සූදානම්ව සිටියත්, ඔටිස් නිකෝ අසල සිටගෙන සිටියේය. ගැටුම ආරම්භ වූයේ නම්, නිකෝ සිටියේ තම ආරක්ෂාව සලසාගත හැකි තත්ත්වයක නොවේ. ඔහුට යථා තත්ත්වයට පත්වීමට පර්සිට තවත් මේ කාලයක් අවැසි විය.

ජේසන් තම රන් අසිපත එසවූයේය. ''අපි කිසිම සංදර්ශනයක කොටස්කාරයෝ වෙන්නෙ නෑ.'' ඔහු පැවසුවේය. ''ඒ වගේම මොකක්ද හයිපො- අර ඔයා කිව්වෙ මොන මගුලක් ගැනද?''

''හයිපෝජියම්!'' එපියාල්ටිස් පැවසුවේය. ''ඔයා රෝම උප දෙවියෙක් නේද? ඔයා දැනගෙන ඉන්න ඕනෙ! ආහ්, ඒත් මම හිතනවා අපි අපේ වැඩේ මෙතන හරියට කළොත්, ඔයාල ඇත්තටම දැනගනී හයිපෝජියම් එකක් තියෙන බව.''

''මම ඒ වචන දන්නවා.'' පිපර් පැවසුවාය. ''ඒක රංග ශාලාවක් යට තියෙන ප්‍රදේශයක්. ඒකෙ තමයි විශේෂ ප්‍රයෝග වලට අවශ්‍ය සියලු යන්ත්‍ර සහ අඩුමකුඩුම තියෙන්නෙ.''

එපියාල්ටිස් සතුටින් අත්පොළසන් නැගුවේය. ''නිසැකවම එහෙම තමයි! ඔයා නෘත්‍යාගාරයක සිසුවියක්ද, මගෙ කෙල්ලේ?''

''ආහ්... මගෙ තාත්තා නළුවෙක්.''

''පුදුමයි!'' එපියාල්ටිස් තම සොහොයුරා දෙසට හැරුණේය. ඔයාට ඒක ඇහුණද, ඔටිස්?''

''නළුවෙක්.''ඔටිස් මිමිණුවේය. ''හැමෝම නළුවෝ. ඕනෙ කෙනෙකුට නටන්න පුළුවන්.''

''ටිකක් විනීත වෙන්න.'' එපියාල්ටිස් දොස් පැවරුවේය. ''මොන විදිහකින් බැලුවත්, මගේ කෙල්ලේ, ඔයා හරියටම හරි. ඒත් මේ හයිපෝජියම් එකේ රංග ශාලාවක වේදිකා කටයුතු වලට වඩා වැඩි දෙයක් තියෙනවා. ඔයා අහල ඇති ඉස්සර කාලෙ සමහර යෝධයන්ව පොළොව යට හිර කරල තිබුණා කියලා, ඒ වගේම කාලෙන් කාලෙට එයාල නිදහස් වෙන්න හදන කොට භූමිකම්පා ඇති වුණා කියල අහල තියෙනවද? හොඳයි, අපි වඩා හොඳට කරල තියෙනවා! මමයි, ඔටිසුයි යුග ගාණක් රෝමය යට සිරවෙලා හිටියා. ඒත් අපි අපේම හයිපෝජියම් එකක් ඉදිකිරීමට කාර්යබහුල වෙලා හිටියා. දැන් අපි ලෑස්තියි රෝමය මෙතෙක් දැකපු ශ්‍රේෂ්ඨතම දර්ශනය ලබා දෙන්න. ඒ වගේම අවසානය.''

ඔටිස්ගේ දෙපා මුල සිට නිකෝ වෙව්ලා ගියේය. තම ළය තුළ තිබූ දඩයම් බල්ලන්ගේ හැම්ස්ටර් රෝදයක් නැවත කරකැවෙන්නට පටන් ගත්තා වැනි හැඟීමක් පර්සිට ඇති විය. අඩුමගානේ නිකෝ ජීවතුන් අතර, දැන් රෝමයේ විනාශය වළක්වා ගැනීම සඳහා ඔවුන්ට යෝධයන් විනාශ කිරීමට සිදු වේ. එසේම තම මිතුරන් ළඟට යාමට ඔවුන්ට යෝධයන් පරාජය කිරීමට සිදු වේ.

''ඉතිං!'' යෝධයන්ගේ අවධානය තමන් වෙත නතුකර ගැනීමේ අටියෙන් පර්සි පැවසුවේය. ''වේදිකා අධ්‍යක්ෂණයක් ගැනද ඔයා කිව්වේ?''

''ඔව්!'' එපියාල්ටිස් පැවසුවේය. ''දැන්, මම දන්නවා ඔයාවයි, ඇනබෙත් කෙල්ලවයි පණ පිටින් ලබා දුන්නම පොරොන්දු වූ තෑග්ග. ඒත්, නිසැකවම, කෙල්ල දැනටමත් ඉවරයි. ඉතිං මම හිතනවා අපි සැලැස්ම ටිකක් වෙනස් කළාට ඔයාල මොකුත් හිතන එකක් නෑ කියලා.''

පර්සිට අපවිත්‍ර කිඳුරු ජලයේ රස දැනිණි. ''දැනටමත් ඉවරයි. ඔයා අදහස් කළේ එයා-''

''මැරිලා කියලද?'' යෝධයා විමසුවේය. ''නෑ. තවම නෑ. ඒත් කරදර වෙන්න එපා! අපි ඔයාලගෙ අනිත් යාළුවෝ හිර කරල තියෙන්නෙ.''

පිපර් අමුතු හඬක් නැගුවාය. ''ලියෝ? හේසාල් සහ ෆ්‍රෑන්ක්?''

''එයාල තමයි.'' එපියාල්ටිස් පැවසුවේය.

''ඉතිං අපිට එයාලව බිලිදෙන්න පුළුවන්. ස්වාමි දුවගෙ සතුට වෙනුවෙන් අපිට ඇතීනා කෙල්ලව මැරෙන්න අරින්න පුළුවන්. ඒ වගේම අපිට ඔයාල තුන් දෙනාව සංදර්ශනේට පාවිච්චි කරන්න පුළුවන්. ගයියා නම් ටිකක් අසතුටු වෙයි, ඒත් ඇත්තටම මේක දිනුමක්. ඔයාලගෙ මරණය බොහොම විනෝදජනක වෙයි.''

ජේසන් ගෙරවූයේය. ''උඹට ඕනෙ විනෝද වෙන්නද? මම උඹට විනෝද කරවන්නම්.''

පිපර් ඉදිරියට පැමිණියාය. කෙසේ හෝ ඇයට මිහිරි සිනාවක් නගා ගැනීමට හැකි වී තිබිණි. ''මට ඊට වඩා හොඳ අදහසක් ආවා.'' ඇය යෝධයන්ට පැවසුවාය. ''ඇයි ඔයාල අපිට යන්න නොදෙන්නෙ? ඒක අදහන්න බැරි හැරවීමක් වෙයි. පුදුමාකාර විනෝදමය වටිනාකමක් තියෙයි. ඒ වගේම ඒකෙන් ඔයාල කොච්චර හොඳ අයද කියල ලෝකෙට තහවුරු වෙයි.''

නිකෝ කෙඳිරි ගෑවේය. ඔටිස් පහත් වී ඔහු දෙස බැලුවේය. ඔහුගේ සර්ප හිස්වල දිවවල් නිකෝගේ හිසට යොමු වී තිබිණි.

''ඒ වගේම!'' පිපර් ක්ෂණිකව පැවසුවාය. ''ඒ වගේම අපි පලායනකොට අපිට යම් විදිහක නර්තන චලනයන් කරන්න පුළුවන්. සමහරවිට බැලේ නර්තනයක්.''

ඔටිස්ට නිකෝ ගැන සම්පූර්ණයෙන්ම අමතක වී ගියේය. ඔහු මඳක් මෑත් වී එපියාල්ටිස්ට ඇඟිල්ල උරුක් කළේය. ''ඔයා දැක්කනෙ? අන්න ඒක තමයි මම ඔයාට කිව්වෙ! ඒක අදහන්න බැරි වෙයි කියලා.''

තත්පරයක් පමණ යනතුරු පර්සි සිතුවෙ පිපර් ජය ගත්තා කියාය. ඔටිස් අයැදින බැල්මකින් තම සොහොයුරා දෙස බලා සිටියේය. ඒ අදහස ගැන සලකා බලන අයුරින් එපියාල්ටිස් තම නිකටට තට්ටු කළේය.

අවසානයේ ඔහු තම හිස සැලුවේය. ''නෑ... නෑ... මට කනගාටුයි ඒක කරන්න බැහැ. ඔයාට පේනවනෙ, මගෙ කෙල්ලෙ, මම ඩියෝනීසස් විරෝධියෙක්. මට ආරක්‍ෂා කරගන්න කීර්තියක් තියෙනවා. ඩියෝනීසස් හිතන්නෙ එයා සම්භාෂණ ගැන දන්නවා කියලද? එයාට වැරදිලා! මට කරන්න පුළුවන් දේත් එක්ක බලකොට එයාගෙ මධු පානෝත්සව නීරස දෙයක්. උදාහරණයක් විදිහට අර අපි කරපු පරණ රූවටිල්ල, ඔලිම්පස් වලට ළඟා වෙන්න කඳු ගොඩ ගහපු එක.''

''මම ඔයාට කිව්ව ඒක කවදාවත් හරියන්නෙ නෑ කියලා.'' ඔටිස් පැවසුවේය. ''ඒ වගේම මගේ සහෝදරයා මාංශවලින් වැහිලා ඩ්‍රැකෝන්වල බාධක මාර්ගයේ දුවන කාලෙ.''

''ඔයා කිව්වා හෙපියාස්ටස් රූපවාහිනිය ප්‍රධාන කාලයෙදි ඒක විකාශන කරයි කියලා.'' ඔටිස් පැවසූවේය. ''කවුරුවත් මාව දැකලවත් නෑ.''

''හොඳයි, මේ දර්ශනය ඊට වඩා හොඳ වෙයි. ''එපියාල්ටිස් සහතික විය.

''රෝමවරුන්ට නිතරම ඕනෙ කරන්නෙ පාන් සහ සර්කස්- ආහාර සහ විනෝදය. අපි එයාලගෙ නගරය විනාශ කරනකොට, මම ඒ දෙකම එයාලට පිරිනමනවා. පොඩ්ඩක් ඉන්න, මේ උදාහරණයක්.''

සිවිලිමෙන් ඇද වැටුණු යමක් පර්සිගේ දෙපා මුල පතිත විය. ඒ රතු සහ කහ පැහැති තිත් සහිත ප්ලාස්ටික් ආවරණයක් සහිත සැන්ඩ්විච් පාන් ගෙඩියකි.

පර්සි එය අහුලා ගත්තේය. ''පුදුම පාන්ද?''

''අතිවිශිෂ්ටයි නේද?'' උමතු කලබලයකින් එපියාල්ටිස්ගේ ඇස නටන්නට විය. ''ඔයාට ඒ පාන් ගෙඩිය තියාගන්න පුළුවන්. මම සැලසුම් කරල තියෙන්නෙ රෝමවරු වනසන කොට එයාලට ඒවා මිලියන ගාණක් බෙදාහරින්න.''

''පුදුම පාන් නියමයි.'' ඔටිස් පැවසුවේය. ''ඒත් රෝමවරු ඒකට නටන්න ඕනෙ.''

පර්සි ඒ වනවිට සෙලවෙමින් සිටි නිකෝ දෙස බැලුවේය. සටන පටන් ගන්නා විට අඩුම වශයෙන් නිකෝට එතැනින් ඉවත් වීට හැකි තරමටවත් සිහියක් ලබා තිබෙනු දැකීමට පර්සිට අවශ්‍ය විය. එසේම ඇනබෙත් ගැනත්, ඔහුගේ අනෙක් මිතුරන් රඳවා තබා ඇත්තේ

කොහේද යන්න ගැනත් තවත් තොරතුරු දැන ගැනීමට ඔහුට අවශ්‍ය විය.

''සමහරවිට.'' පර්සි පැවසුවේය. ''ඔයාල අනෙක් මිත්‍රයින්ව මෙහෙට ගෙනත් ඇති. ඔයාල දන්නවනෙ, විශිෂ්ට මරණය... සිනාවට වැඩි දෙයක් බව.''

''හ්ම්.'' එපියාල්ටිස් තම හවායි කමිසයේ බොත්තමක් දමමින් පැවසුවේය. ''නෑ ඇත්තටම නර්තන තිර රචනය වෙනස් කරන්න ප්‍රමාද වැඩියි. ඒත් කොහෙත්ම බයවෙන්න එපා. සර්කස් එක අපූරු එකක් වෙයි! ආහ්... ඒක නූතන ආකාරයේ සර්කස් එකක් නොවන බව හිතේ තියාගන්න. ඒකට විකටයො ඕනැ වෙනවා. මට විකටයො පේන්න බැහැ.''

''හැමෝම විකටයන්ට වෛර කරනවා.'' ඔටිස් පැවසුවේය. ''අනෙක් විකටයො පවා තවත් විකටයකුට වෛර කරනවා.''

''නිසැකවම.'' ඔහුගේ සොහොයුරා එකඟ විය. ''ඒත් අපිට ඊට වඩා හොඳ විනෝද සැලැස්මක් තියෙනවා. හැම දෙවියකුටම සහ මනුෂ්‍යයකුටම බලන්න පුළුවන්, උඩදි, ඔයාලට වේදනාකාරී මරණයක් අත්වෙයි. ඒත් ඒක හුදෙක් සමාරම්භක උත්සවය විතරයි. ඉස්සර කාලෙ, ක්‍රීඩා දවස් ගණන් සති ගණන් පැවතුණා. අපේ දර්ශනය- රෝමයේ විනාශය- ගයියා අවදිවනතුරු සම්පූර්ණ මාසයක් විතර තියෙයි.''

''පොඩ්ඩක් ඉන්න.'' ජේසන් පැවසුවේය. මාසයකින්, ගයියා අවදි වෙනවද?''

එපියාල්ටිස් අත වනා ප්‍රශ්නය බැහැර කළේය. ''ඔව්, ඔව්. මුළු මානව සංහතියම විනාශ කරන්න හොඳම දවස අගෝස්තු පළවෙනිදා. වැදගත් නෑ! ඇගේ අපරිමිත නුවණින්, පොළෝ මාතාව එකඟ වුණා රෝමය මුලින්ම විනාශ කරන්න. සෙමින් සහ දර්ශනීයව.

''ඉතිං...'' තමා පාන් ගෙඩියක් අතැතිව කතා කරමින් සිටින්නේ ලෝක අවසානයේ මුවවිට සිටගෙන බව පර්සිට විශ්වාස කිරීමට නොහැකි විය. ''ඔයාල තමයි ගයියාගේ අවදි කිරීම කරන්නේ.''

එපියාල්ටිස්ගේ මුහුණ අඳුරු විය. ''මේක අවදි කිරීමක් නෙමෙයි, උප දෙවියො. අපි කැලෑ සත්තුන්ව සහ රාක්ෂයින්ව වීථි වලට නිදහස් කරනවා. අපේ විශේෂ ප්‍රයෝග දෙපාර්තුමේන්තුවෙන් ගින්දර සහ භූමිකම්පා නිර්මාණය කරයි. ඕනෑම තැනක ආවාට සහ ගිනි කඳු ඇතිවෙන්න පුළුවන්. භූතයෝ කෝපයෙන් දිව යාවි.''

''භූත කතාවනම් වැඩ කරන එකක් නැහැ.'' ඔටිස් පැවසුවේය. ''අපේ ඉලක්ක කණ්ඩායම් කියන්නෙ ඒක වැඩක් වෙන එකක් නෑ කියලයි.''

''සැක කරන්නෝ.'' එපියාල්ටිස් පැවසුවේය. ''මේ හයිපොජියමට[1] ඕනෙම දෙයක් වැඩ කරවන්න පුළුවන්.''

එපියාල්ටිස් ළලක වලින් වසා තිබූ විශාල මේසයක් වෙත ගියේය. ඔහු ළලක ඉවත් කළ විට දර්ශනය වූයේ ආගෝ II හි ඇති ලියෝගේ පාලන පුවරුව මෙන් සංකීර්ණ ලීවර සහ බොත්තම් සමූහයකි.

''මේ බොත්තමද?'' එපියාල්ටිස් පැවසුවේය. ''මේකෙන් පිස්සු වෘකයො දුසිම් ගාණක් විනිශ්චය ශාලාවට නිදහස් කරාවි. මේකෙන් ට්‍රිවි ජලමල ළඟදි සංචාරකයො එක්ක සටන් කරන ස්වයංක්‍රීය මල්ලවපොර ශූරයෝ නිදහස් කරාවි. මේ බොත්තමෙන් ටයිබර් ගඟ පිටාර ගලයි. එතකොට අපිට පුළුවන් පීසා නවෝනාවල ආයෙත් නාවුක සටනක් නිරූපණය කරන්න! පර්සි ජැක්සන්, පොසිඩන්ගේ පුත්‍රයා විදිහට ඔයා ඒකට කැමති වෙයි.''

''ආහ්... මම තවමත් හිතනවා අපිට යන්න දෙන අදහස තමයි හොඳම එක කියලා...'' පර්සි පැවසුවේය.

''එයා හරි.'' පිපර් නැවත උත්සාහ කළාය. ''එහෙම නැති වුණොත් මේ මුළු එදිරිවාදී සංවාදයටම අපිව මැදි වෙනවා. අපි ඔයාල එක්ක සටන් කරනවා. අපි ඔයාලගෙ සැලැස්ම බිඳල දානවා. ඔයාල දන්නවනෙ, අපි ඉස්සර යෝධයෝ ගොඩක් දෙනෙක්ව පරාජය කරල තියෙනවා. මම කැමති නෑ මේ දේවල් පාලනයෙන් මිදෙනවට.''

එපියාල්ටිස් කල්පනාකාරිව හිස සැලුවේය ''ඔයා නිවැරදියි.''

පිපර් ඇසිපිය ගැසුවාය. ''මම ද?''

''අපිට මේ දේවල් පාලනයෙන් ගිලිහිලා යන්න දෙන්න බැහැ.'' යෝධයො එකඟ විය. ''හැමදෙයක්ම නියම විදිහට වෙලාවට වෙන්න ඕනෙ. ඒත් කරදර වෙන්න එපා. මම ඔයාලගෙ මරණ තිර රචනය කරල තියෙන්නෙ. ඔයාල ඒකට කැමති වෙයි.''

1 රංග ශාලාවකට යටින්, යාන්ත්‍රික මෙවලම් හා විශේෂ ප්‍රයෝග තබා තිබූ ස්ථානය.

නිකෝ ගොරවමින් ඒමේ අත ඇදෙන්නට විය. පර්සිට අවශ්‍ය වූයේ ඔහු අඩුවෙන් ගොරවමින් ඉක්මනින් ගමන් කරනු දැකීමටය. ඔහු තමා අත තිබූ පුදුම පාන් ගෙඩිය ඔහුට විසි කිරීමට සිතුවේය.

ජේසන් තම අසිපත රැඳි අත සුදානම් කර ගත්තේය. ''අපි ඔයාලගෙ දර්ශනයට සහයෝගය දෙන එක ප්‍රතික්ෂේප කළොත්?''

''හොඳයි, ඔයාලට පුළුවන් අපිව මරන්න.'' එම අදහස විකාරයක් සේ සලකන බව පෙන්වමින් එපියාල්ටිස් සිනාසුණේය. 'ඔයාල එක්ක දෙවියො නෑ. ඒ වගේම ඔයාලට දිනන්න තියෙන එකම විදිහ ඒක විතරයි. ඉතිං ඇත්තටම, ඒක වේදනාවෙන් මැරෙන එකට වඩා හොඳ වෙයි. සමාවෙන්න, ඒත් සංදර්ශනය පවත්වන්න ඕනෙ.''

මේ යෝධයා ඇට්ලන්ටාවල සිටි පෝසයිඩ්ටත් වඩා නරක එකකු බව පර්සි වටහා ගත්තේය. එපියාල්ටිස් එතරම්ම ඩියෝනීසස් විරෝධියකු වීය. ඩියෝනිසස් ස්ටියොරොයිඩ වලින් ඔහුව පිස්සු වැට්ටවීය. නිසැකවම, ඩියෝනීසස් මධුපානෝත්සව වලට අධිපති දෙවියා වූ අතර, සම්භාෂණ පාලනයෙන් තොර ඒවා බවට පත් කරන්නේද ඔහුමය. එහෙත් එපියාල්ටිස් යනු සියලු කලහ ඇති කරන්නා සහ සතුට නැති කරන්නාය.

පර්සි තම මිතුරන් දෙස බැලුවේය. ''මට නම් මේ හාදයගෙ කමිසෙ දැක්කම එපා වෙනවා.''

''සටන් කරන වෙලාවද?'' පිපර් තම සමෘද්ධියේ අඟ අතට ගත්තාය.

''මම පුදුම පාන් වලට වෛර කරනවා.'' ජේසන් පැවසුවේය. ඒකට එක් වී ඔවුහු පහර දුන්හ.

# 46
# පර්සි

**සියල්ල ඉක්මනින්ම නරක අතට හැරුණේය.** යෝධයින් දෙදෙනා දුම්වළාවන් දෙකක් මැද අතුරුදහන් විය. කාමරයේ අඩක පමණ දුරකින් ඔවුන් නැවත දර්ශනය විය. පර්සි එපියාල්ටිස් දෙසට පැන්නත්, පොළොවේ සිදුරක් විවර කරමින් ලෝහ බිත්ති දෙපසට වූයේ ඔහුව තම මිතුරන්ගෙන් වෙන් කර දමමිනි.

දඬු අඬුවක් මෙන් දෙපස බිත්ති යළිත් වැසී යන්නට පටන් ගත්තේය. පර්සි ඉහළට පැන හයිඩ්‍රාගේ කූඩුවේ යට පැත්තේ එල්ලුණේය. පිපර් ගිනි දලු නැගෙන වළවල් මඟ හරිමින් නිකෝ දෙසට දිව යන අයුරු ක්ෂණික බැල්මකින් පර්සිට දැක ගත හැකි විය. නිකෝ නිරායුධව අඩ සිහියෙන් දිවියන් දෙදෙනෙකුට මැදිව සිටියේය.

මේ අතර ජේසන් ඔටිස්ට පහර දුන්නේය. ඔටිස් තම හෙල්ල ගෙන දැඩි වෙර යොදා එය එසවීය. හංස විලේ නර්තනයට වඩා වෙනත් උප දෙවියකු මරා දැමීමේ අරමුණ ඔහු තුළ පැවතිණි.

තත්ත්පරයක් තුළ පර්සි මේ සියල්ල සිතේ ධාරණය කර ගත්තේය. එහෙත් එහි ඔහුට  කළ හැකි යමක් නොතිබිණි. හයිඩ්‍රා ඔහුගේ අත් සපා කෑමට උත්සාහ කළේය. ඔහු කරකැවී බිමට පැන්නේය. ඔහු පතිත වූයේ ප්ලයිවුඩ් වලින් තැනූ ගස් අරඹකටය. ඔහු ඒවා අතරින් දිව යාමට උත්සාහ කරද්දී ගස් පිහිටි ස්ථානය වෙනස් විය. එබැවින් ඔහුට තම රිප්ටයිඩයෙන් ඒවා කපා දැමීමට සිදු විය.

''පුදුමාකාරයි!'' එපියාල්ටිස් කෑ ගැසුවේය. පර්සි සිටි තැනට වම් පසින් අඩි හැටක් පමණ ඈතින් වූ පාලන පුවරුව අසල එලියාල්ටිස් සිටගෙන සිටියේය. ''අපි හිතමු මේක පෙර පුහුණුවක් කියලා. දැන් මට පුළුවන්ද ස්පාඤ්ඤ පියවර උඩට හයිඩ්‍රාව නිදහස් කරන්න?''

ඔහු ලීවරය ඇද්දේය. පර්සි උඩ බැලුවේය. ඔහු එල්ලී සිටි කූඩුව දැන් සිවිලිමේ වූ දෙබෑ දොරක් වෙත එසවෙමින් තිබිණි. තත්පර තුනක් ඇතුළත එය නොපෙනී යනු ඇත. පර්සි යෝධයාට පහර දුන්නොත්, හයිඩ්‍රා නගරයම විනාශ කරනු ඇත.

සාප කරමින්, ඔහු බූමරංගයක් සේ රිප්ටයිඩය දමා ගැසුවේය. අසිපත එවැන්නක් සඳහා සැලසුම් කර නොතිබුණත්, දිව්‍යමය ලෝකඩ තලය හයිඩ්‍රා එල්ලෙමින් සිටි දම්වැල් කපා දැමුවේය. කූඩුව පැත්තකට ඇළ වී ගියේය. දොර බිඳී විවර වූ අතර, රාක්ෂයා හරියටම පර්සි ඉදිරිපිටට ඇද වැටුණේය.

''ඕහ්, ඔයා විනෝදයට බාධා කරනවා. ජැක්සන්!'' එපියාල්ටිස් පැවසුවේය. ''බොහොම හොඳයි, ඔයාට ඕනෙම නම් මෙතන සටන් කරන්න. ඒත් ඔයාගෙ මරණය ඔල්වරසන් නගන පිරිසක් ඉදිරියේ තරම් හොඳ වෙන එකක් නැහැ.''

රාක්ෂයාට මුහුණ දීමට පර්සි ඉදිරියට පැමිණියේය. තම අසිපත විසිකර දැමූ බව ඔහුට අවබෝධ වූයේ එවිට ය. ඔහුගේ පැත්තෙන් එය තරමක් නරක සැලසුම් කිරීමකි.

ඔහු පසෙකට පෙරළී යද්දීම, හයිඩ්‍රාගේ ඔලු අටෙන්ම අම්ල විදිනු ලැබීය. ඔහු සිටගෙන සිටි තැන පොළොවේ පාෂාණ දිය වී දුම් දමන ආවාට රැසක් ඉතිරි විය. පර්සි සැබැවින්ම හයිඩ්‍රාවන්ට වෛර කළේය. ඔහුට අසිපත අහිමි වීම හොඳ දෙයකි. අසිපත ඔහු ළඟ තිබුණානම් ක්ෂණිකව හයිඩ්‍රාගේ ඔලු කැපී යනු ඇත. එසේම තමාගේ අහිමි වී යන එක් හිසක් වෙනුවට තවත් හිස් දෙකක් මවාගැනීමට හයිඩ්‍රාට හැකි වනු ඇත.

අවසන් වරට ඔහු හයිඩ්‍රාවකුට මුහුණ දෙන විට, ඔහුව බේරා ගත්තේ යුද නැවකි. එහි ලෝකඩ කාලතුවක්කු වලින් හයිඩ්‍රාව කෑලි වලට කැඩී යන ලෙස ප්‍රහාර එල්ල විය. ඒ උපක්‍රමයෙන් දැන් ඔහුට පලක් නැතිවනු ඇතිද... නැතිනම් පලක් වනු ඇතිද?

හයිඩ්‍රා ඉදිරියට පැන්නේය. යෝධ හැම්ස්ටර් රෝදය පිටුපස වකුටු වූ පර්සි තමා සිහිනයේදී දුටු පෙට්ටි සොයමින් කාමරය පුරා දෙනෙත් යැව්වේය. රොකට් විදින ගැන යමක් ඔහුගේ මතකයේ තිබිණි.

කුඩා වේදිකාව මත පිපර්, ඉදිරියට එන දිවියන්ගෙන් තිකෝව ආරක්‍ෂා කිරීමේ යෙදී සිටියාය. ඇය තම කෝනුකෝපියාව මානමින් බදින ලද මස් දිවියන්ගේ හිස්වලට විද්දාය. එහි සුවඳ තරමක් හොඳට තිබෙන්නට ඇති බව පෙනී ගියේ, දිවියන් දෙදෙනා ඒවා පසුපස දිවයන බැවිනි.

පිපර්ගේ දකුණු පස, අඩි අටක් පමණ ඈතින් ජේසන්, ඔටිස් සමඟ කඩු හා හෙලි සටනක නිරතව සිටියේය. ඔටිස්ගේ දියමන්ති ඔටුන්න අහිමි වී තිබූ අතර ඔහු ඒ ගැන කෝපයෙන් පසුවන බව පෙනිණි. ඔහුට කීපවතාවක්ම ජේසන්ට ඇන දැමීමට හැකියාව තිබුණු බව පෙනුණත්, යෝධයා සෑම ප්‍රහාරයකදීම භ්‍රමණ නර්තනයේ යෙදීමට අකැමැති විය.

මේ අතර එලියාල්ටිස් සිනාසෙමින් පාලන පුවරුවේ බොත්තම් ඔබමින් වාහක පටියේ වේගය වැඩි කළ අතර තැනින් තැන වූ සත්ත්ව කූඩු ද විවෘත කළේය.

හයිඩ්‍රා හැම්ස්ටර් රෝදය වටා යමින් පහර දුන්නේය. කණුවකට මුවා වූ පර්සි පුදුම පාන්වලින් පිරි කසල බෑගයකින් රාක්‍ෂයාට දමා ගැසුවේය. හයිඩ්‍රා අම්ල විද්දාය. ඒ අත්වැරදීමකි. ගුවනේ පාවී එද්දීම ඒවායේ ප්ලාස්ටික් බෑග් දිය වී ගියේය. ගිනි නිවන පෙණ මෙන් පාන්වලින් අම්ල උරා ගත් අතර ඒවායේ අධි කැලරි සහිත විෂ කැබලි හයිඩ්‍රාගේ සිරුරේ ඇලුණේය.

රාක්‍ෂයා ඔලු සොලවද්දී, උගේ දැස්වලින් අම්ල වැගිරෙද්දී, පර්සි බලාපොරොත්තු සුන්ව වටපිට බැලුවේය. ඔහුට රොකට් විදින පෙට්ටි දක ගැනීමට නොලැබුණත්, පිටුපස බිත්තියට හේත්තු කර තිබුණු චිත්‍ර ශිල්පියකුගේ චිත්‍රාධාරකයක් වැනි අමුතු සුකුරුත්තමක් දක්නට ලැබිණි. එයට සවිකර තිබුණේ මිසයිල් විදින පෙළකි. පර්සිට බැකුසාවක්, ග්‍රෙනේඩ් විදින, යෝධ රෝම ඉටිපන්දමක් සහ තවත් රුදුරු පෙනුමැති ආයුධ දුසිම් ගණනක් දක ගැනීමට ලැබිණි. ඒවා සියල්ලම එකට බැඳ, එකම දිශාවකට යොමු කර, පැත්තක වූ එක් ලෝකඩ ලීවරයකට සම්බන්ධ කර තිබිණි. චිත්‍රාධාරකය මුදුනේ කානේෂන් මල් කළඹක් මැද *'රෝමයට සතුටුදායක විනාශයක්'* යනුවෙන් සටහන් කර තිබිණි.

පර්සි උපකාරකය දෙසට ගෑටුවේය. හයිඩ්‍රා පිඹිමින් ඔහු පසුපස හඹා ආවේය.

''මම දන්නවා.'' එපියාල්ටිස් සතුටින් කෑගැසුවේය. ''අපිට වියා ලැබිකානා[1] වලින් පිපිරුම් පටන් ගන්න පුළුවන්! අපිට අපේ ප්‍රේක්ෂකයන්ව සදාකාලිකව බලා හිඳින්නන් කරන්න ඕනෙ නැහැ.''

චිත්‍රාධාරකය පිටුපසට ගෑටු පර්සි එය එපියාල්ටිස් දෙසට හැරවූයේය. ඔහුට යන්ත්‍ර සම්බන්ධයෙන් ලියෝ සතු දක්ෂතාව නොතිබුණත්, ආයුධයක් ඉලක්ක කරන්නේ කෙසේදැයි ඔහු දැන සිටියේය.

යෝධයාගේ දර්ශනය ඔහුගෙන් අවහිර කරමින් හයිඩ්‍රා ඔහු දෙසට පැමිණියේය. මේ සුකුරුත්තමට ඉලක්ක දෙකම එකවර බිම හෙලිය හැකි ගිනි බලයක් ඇතැයි පර්සි අපේක්ෂා කළේය. පර්සි ලීවරය ඇද්දේය. එය නොසෙල්විණි.

ඔහුව දියකර හැරීමේ සූදානමින් හයිඩ්‍රාගේ ඔලු අටම ඔහු ඉදිරියේ එසැවිණි. ඔහු නැවත ලීවරය ඇද්දේය. මේ වතාවේ චිත්‍රාධාරකය කම්පනය වෙමින් ආයුධ වලින් පිඹින හඬක් නිකුත් විය.

''මුවාවෙලා පහත් වෙන්න.'' තම මිතුරන්ට එය ඇසෙනු ඇතැයි බලාපොරොත්තුවෙන් පර්සි කෑ ගැසුවේය.

චිත්‍රාධාරකය ක්‍රියාත්මක වෙද්දී පර්සි එක් පැත්තකට පැන්නේය. එහි හඬ වෙඩි බෙහෙත් කම්හලක පිපිරුමක් මෙන් නැඟී ආවේය. හයිඩ්‍රා ක්ෂණිකව වාෂ්ප විය. අවාසනාවකට, නැවත සකස් වූ චිත්‍රාධාරකයෙන් තව තවත් ප්‍රහාර කාමරය පුරාම එල්ල විය. බිඳී ගිය සිවිලිම ජල රෝදය මත ඇද වැටිණි. තවත් කූඩුවල දම්වැල් කැඩී යමින් සීබ්‍රාවන් දෙදෙනෙක් සහ හයිනාවන් රැළ නිදහස් විය. ග්‍රෙනේඩයක් එපියාල්ටිස්ගේ හිසට ඉහළින් පුපුරා ගියත් එයින් වූයේ ඔහු බිම ඇදවැටීම පමණි. පාලන පුවරුවට පවා හානියක් වූ බව නොපෙනුණි.

කාමරය හරහා වැලි බෑග් වර්ෂාවක් ඇද හැලුණු අතර ඒවා නිකෝ සහ පිපර් මත ඇද හැලිණි. ආරක්ෂාව සඳහා නිකෝව ඉවතට ඇද ගැනීමට පිපර් උත්සාහ කළත්. එක් බෑගයක් ඇගේ උරහිස මත පතිත වීමෙන් ඇය ඇද වැටුණාය.

1 ඉතාලියේ පැරණි මාර්ගයකි. රෝමයේ නැගෙනහිර - ගිනිකොණ දෙසට විහිදේ.

''පිපර්!'' ජේසන් කෑ ගැසුවේය. තම පිටුපසට හෙල්ල ඉලක්ක කරමින් සිටින ඔටිස්ව සම්පූර්ණයෙන් අමතක කළ ජේසන්, ඇය වෙතට දිව ගියේය.

''බලාගෙන.'' පර්සි කෑ ගැසුවේය.

ජේසන්ගේ ප්‍රතික්‍රියාව වේගවත් විය. ඔටිස් හෙල්ල දමා ගසත්ම, ජේසන් පෙරළී ගියේය. හෙලි තුඩ ඔහු පසුකරත්ම, අත එසවූ ජේසන් සුළං පහරක් කැඳවා හෙල්ලේ දිශාව වෙනස් කළේය. එය කාමරය හරහා ඇදී ගොස් නැගිටීමට වෙර දරන එලියාල්ටිස්ගේ සිරුරේ වැදිණි.

''ඔටිස්!'' පාලන පුවරුවෙන් මෑත් වෙමින්, හෙල්ලය ඇදීමට දඟලමින් ඔහු රාක්ෂ දූවිල්ල අතරට වැදුණේය. ''කරුණාකරලා, මාව මරණ එක නවත්තපං.''

''ඒක මගෙ වැරැද්දක් නෙමෙයි.''

ඔටිස් තම වාක්‍යය අවසන් කරත්ම පර්සිගේ මිසයිල විදිනයෙන් අවසන් රෝම ඉටිපන්දම් හෙල්ල නිකුත් විය. මරණයේ රෝස පැහැති අග්නි බෝලය (සාමාන්‍යයෙන් එය රෝස පැහැතිය) ඔටිස්ට ඉහළ සිවිලිමේ ගැටී පුපුරා ගියේ අලංකාර ආලෝකය වර්ෂාවක් මවමිණි. වර්ණවත් ගිනි පුළිඟු වළල්ලක් යෝධයා වටා භ්‍රමණය වන්නට විය. වහලයේ අඩි දහයක කොටසක් කඩා වැටී ඔහුව සමතලා කර දැමුවේය.

''හොඳින්, මම හොඳින්.'' ඇය අසල සිටි නිකෝ නැගිට්ටේය. ඔහු තමා අවට නැරඹුවේ තමාට සටන මඟ හැරී ගියා සේ සලකමිනි.

කනගාටුදායක ලෙස යෝධයන්ගේ ගමන අවසන් වී නොතිබිණි. එපියාල්ටිස් දැනටමත් ප්‍රති නිර්මාණය වෙමින් සිටියේය. ඔහුගේ හිස සහ උරහිස් දූවිලි ගොඩින් මතුවන්නට විය.

කාමරයේ වූ කුලුනු කැබලි විසුරුවමින් ඔටිස් ද නැගී සිටියේය. ඔහුගේ හිස තරමක් වක්‍ර වී තිබිණි. ඔහුගේ කොණ්ඩයේ තිබූ ගිනි කෙළි සියල්ල පුපුරා ගොස් දුම් දමමින් තිබුණේය. ඔහුගේ සිනිඳු ඇඳුම ඉරී ගොස් තිබිණි.

''පර්සි!'' ජේසන් කෑ ගැසුවේය. ''පාලන පුවරුව!''

පර්සි ක්‍රියාත්මක විය. ඔහුට නැවත තම සාක්කුවෙන් රිප්ටයිඩය සොයාගත හැකි වූ අතර, එය අතට ගත් ඔහු යතුරු පුවරුව වෙත දිව ගියේය. හතර අත ගිනි පුපුරු විහිදුවමින් පාලන පුවරුව කැපී ගියේය.

''එපා!'' එපියාල්ටිස් දැගලුවේය. ''උඹ දර්ශනය කාල දැම්මා!''

පර්සි ඉතා සෙමින් හැරුණේය. එපියාල්ටිස් පිත්තක් සේ තම හෙල්ල ගෙන ඔහුගේ ළයට එල්ල කළේය. ඔහු දනින් වැටිණි. උදරය පිලිස්සී යන වේදනාවක් ඇති විය.

ජේසන් ඔහු සිටි පැත්තට දිව ගියේය. එහෙත් ඔටිස් ඔහු පසුපස ලුහුබැඳ ආවේය. පර්සි නැගිටීමට සමත් වූ අතර ජේසන් ඔහුව උරහිසට හේත්තු කර ගත්තේය. කුඩා වේදිකාව මත, පිපර් තවමත් නිසලව වැතිර සිටියාය. නිකෝ සිටියේ අඩ සිහියෙනි.

යෝධයෝ සුවපත් වෙමින්, මිනිත්තුවෙන් මිනිත්තුව වඩාත් බලවත් වෙමින් සිටියහ. එහෙත් පර්සි තවත් අඩපණ විය.

එපියාල්ටිස් සිනාසුණේය. ''මහන්සිද, පර්සි ජැක්සන්? මම කිව්ව වගේ, උඹලට අපිට මරන්න බැහැ. ඉතිං මම හිතනවා අපි අවුල් ජාලයක ඉන්නෙ කියලා. ඕහ්, ඉන්න... නෑ අපි නෙමෙයි. මොකද අපිට උඹලව මරන්න පුළුවන්.''

''ඒක.'' ඔටිස් තමාගේ හෙල්ලය අහුලා ගනිමින් පැවසුවේය. ''ඒක තමයි අද දවසටම ඔයා කියපු එකම තේරුමක් ඇති දේ. සහෝදරයා.''

යෝධයන් දෙදෙනා තම අවි අමෝරා ගනිමින්, ජේසන් සහ පර්සිගේ ඉරණම විසඳීමට සූදානම් වූහ.

''අපි උත්සාහය අත හරින්නෙ නැහැ.'' ජේසන් ගිගිරුවේය. ''අපි උඹලව කෑලි වලට කපනවා, හරියට ජුපිටර් සෙනසුරුට කළා වගේ.''

''ඒක හරි.'' පර්සි පැවසුවේය. ''උඹල දෙන්නම මැරෙනවා. අපිට දෙවියෙක් හිටියත් එකයි නැතත් එකයි. මට ඒකෙන් වැඩක් නැහැ.''

*''හොඳයි, ඒක නිග්‍රහයක්.''* අලුත් හඬකින් පැවසිණි.

ඔහුගේ දකුණු පැත්තෙන් සිවිලිමේ සිට තවත් වේදිකාවක් පහත් විය. පයින් ගෙඩියක් ගැසූ රිටක් මත දම් පැහැති කඳවුරු කමිසයක් සහ කාකි කොට කලිසමක් හැඳි, සුදු මේස් දමා සෙරෙප්පු පැළඳි මිනිසකු ඉදිරියට නැවී සිටියේය. ඔහු තම පුළුල් වාටියක් සහිත හිස්වැස්ම එසවීය. දම්පැහැති ගින්නක් ඔහුගේ දෑස් තුළ දැල්විණි. ''මම කිසි වැඩකට නැති විශේෂ සංචාරයකට ආව කියල හිතන්න මම කැමති නැහැ.''

# 47
# පර්සි

**ඩී මහතාගෙන් සන්සුන් බලපෑමක් ගැන පර්සි කිසිවිටෙක නොසිතුවත්,** එක්විට හැමදෙයක්ම නිශ්චල විය. යන්ත්‍ර නැවතිණි. වන සතුන්ගේ ගෙරවීම් නැවතිණි.

තවමත් පිපර්ගේ කෝතුකෝපියාවෙන් ලැබුණු මස් රස බලමින් සිටි දිවියන් දෙදෙනා ඔහු වෙත පැමිණ දෙවියාගේ දෙපා මත හොම්බ තැබූහ. ඩී මහතා ඔවුන්ගේ කන් පිරිමැද්දේය.

''ඇත්තටම, එපියාල්ටිස්.'' ඔහු පැවසුවේය. ''උප දෙවිවරුන්ව මරණ එක වෙනම දෙයක්. ඒත් ඔයාගෙ සංදර්ශනයට දිවියන්ව පාවිච්චි කරන එක? ඒක සීමාවෙන් පිට පැනීමක්.''

යෝධයෝ ගොත ගසන්නට වූහ. ''මේ- මේක වෙන්න බැහැ. ඩී-ඩී-

''ඒ බැචස්, ඇත්තටම, මගෙ පරණ යාලුවනේ.'' දෙවියා පැවසුවේය. ''ඒ වගේම, ඇත්තවශයෙන්ම, ඒක වෙන්න බැහැ. කවුරුහරි මට කිව්වා මෙහෙ උත්සවයක් තියෙනවා කියලා.''

ඔහුගේ පෙනුම ඔහු කන්සාස්වල සිටින ආකාරයෙන්ම තිබිණි. එහෙත් පර්සිට බැචස් සහ පරණ සහ එතරමම මිත්‍රයකු නොවන ඩී මහතා ගේ වෙනස්කම් හඳුනාගත නොහැකි විය.

එපියාල්ටිස්ගේ හෙල්ල එසැවිණි. ''උඹලගෙ දෙවිවරු ඉවරයි! ගයියාගේ නාමයෙන් පලයව්.''

''හ්ම්ම්.'' බැචස් නොසතුටින් පැවසුවේය. ''ඔහු නටඹුන් වූ වේදිකා සහ විශේෂ ප්‍රයෝග අතර ඇවිද ගියේය.

''ඇලෙන සුලුයි.'' ඔහු තීන්ත ආලේප කරල ලද දැව මල්ලව පොර ශූරයා ඉදිරියෙන් අත වැනුවේය. ඉන්පසු පිහි සවිකළ දැවැන්ත ඇඹරුම් හෙල්ලයක් මෙන් පෙනුණ යන්ත්‍රය දෙසට හැරුණේය. ''බාලයි, නීරසයි. ඒ වගේම මේක...'' ඔහු රොකට් විදින චිත්‍රාධාරකය පරීක්ෂා කළේය. එයින් තවමත් දුම් දමමින් තිබිණි. ''මේකත් ඒ වගේම තමයි. ඇත්තමයි, එපියාල්ටිස්. ඔයාට විලාසිතා ගැන කිසිම හැඟීමක් නැහැ.'

''විලාසිතා?'' යෝධයාගේ මුහුණ රතු විය. ''මට විලාසිතා කන්දක් තියෙනවා. මම විලාසිතා අර්ථ දක්වනවා. මම-මම.''

''මගේ සහෝරයාගෙන් විලාසිතා වෑස්සෙනවා.'' ඔටිස් පැවසුවේය.

''උඹට ස්තුතියි.'' එපියාල්ටිස් කෑ ගැසුවේය.

බැචස් ඉදිරියට එන විට, යෝධයෝ පිටුපසට වූහ. උඹල දෙන්න කොට වෙලා තියෙනවද?'' දෙවියා ඇසුවේය.

''ආහ්, ඒකයි නීතිය.''එපියාල්ටිස් පැවසුවේය. ''උඹව විනාශ කරන්න තරම් මගෙ උස ඇති, බැචස්! දෙවිවරු වන උඹලා හැම තිස්සෙම ඉන්නෙ උඹලගෙ මනුෂ්‍ය වීරයො, පිටිපස්සෙ හැංගිලා. මේ වගේ ඔලිම්පස්වල ඉරණම විශ්වාස කරන අයගෙ.''

ඔහු පර්සි දෙස බැලුවේය.

ජේසන් තම අසිපත එසවූයේය. ''බැචස් උතුමාණෙනි, අපි මේ යෝධයන්ව මරණවද නැත්නම්?

''හොඳයි, මම එහෙම හිතනවා, නිසැකවම.'' බැචස් පැවසුවේය. ''කරුණාකරලා, කරගෙන යන්න.''

පර්සි ඔහු දෙස බැලුවේය. ''ඔයා මෙහෙ ආවෙ උදව්වට නෙමෙයිද?''

බැචස් දෙවුර සැලුවේය. ''ආහ්, මම පිළිගත්තා මුහුදෙදි කරපු පූජාව. ඩයට් කෝක් එක්ක සම්පූර්ණ නැවක්ම. බොහොම අපූරුයි. ඒත් ඩයට් පෙප්සි තිබුණානම් වැඩිය කැමතියි.''

''ඒ වගේම මිලියන හයක රන් සහ ආභරණ.'' පර්සි මිමිණුවේය.

''ඔව්.'' බැචස් පැවසුවේය. ''ඒත් උපදෙවිවරුන්ගේ සම්භාෂණ පහක් හෝ ඊට වැඩිනම් පාරිතෝෂිකයකුත් ඇතුළත් වෙනවා. ඉතිං ඒක ඕනෙ නෑ.''

''මොකක්ද?''

''ඒ ගැන හිතන්න එපා.'' බැචස් පැවසුවේය. ''කොයි විදිහෙන් බැලුවත්, ඔයාල මගෙ අවධානය දිනා ගත්තා. මම දැන් මෙතන. දැන් මට බලන්න ඕනෙ මගෙ උදව් ලැබීමට ඔයාල සුදුසු ද කියලා. ඉස්සරහට යන්න. සටන් කරන්න. මාව සතුටු කළොත්, මම එනවා අවසන් තරගයට.''

''අපි එකෙකුට හෙල්ලෙන් ඇන්නා.'' පර්සි පැවසුවේය. ''අනික උඩට වහලෙ පාත් කලා. ඔයා සතුටුකරනවා කියල අදහස් කළේ මොකක්ද?''

''ආහ්, හොඳ ප්‍රශ්නයක්...'' බැචස් තම යෂ්ටියට තට්ටු කලේය. ඉන්පසු ඔහු පර්සිව සීතීමට පොළඹවන සිනාවක් පෑවේය. ''සමහරවිට ඔයාලට අවේශයක් අවශ්‍ය වෙයි. මේ වේදිකාව හොඳට සකස් කරල නෑ. ඔයා මේකටද සංදර්ශනය කිව්වෙ, එපියාල්ටිස්? ඒක කොහොමද කරන්නෙ කියල මට පෙන්නන්න ඉඩ දෙන්න.''

දෙවියා දම්පැහැති මීදුමක් බවට පත්විය. පිපර් සහ නිකෝ අතුරුදහන් වූහ.

''පිපර්!'' ජේසන් කෑ ගැසුවේය. ''බැචස්, ඔයා කොහෙද?''

මුළු පොළොවම දෙදරමින් ඉහළට එසවෙන්නට පටන් ගත්තේය. සිවිලිමේ පනේල රාශියක් විවෘත විය. හිරු එළිය ඇතුළට පැමිණියේය. වාතය මිරිඟුවක් මෙන් දිලිසෙන්නට විය. පර්සිට ඔහුට ඉහළින් සිටි ජනයාගේ කෑ ගැසීම ඇසිණි.

අබලන් වූ කුලුණු අතරින් එසැවුණු හයිපෝජියම, නටඹුන් වූ රංග ශාලාව මැදට පැමිණියේය.

පර්සිගේ හදවත පිනුම් ගසන්නට විය. මෙය කිසිදු ආකාරයක රංග ශාලාවක් නොවීය. ඒ විශාල වට රඟමඬලකි. යෝධයන්ගේ විශේෂ ප්‍රයෝග යන්ත්‍ර අතිකාල සඳහා ගොස් තිබූ අතර, වැටී තිබූ ලී කැබලි නටඹුන් වූ ආධාරක බාල්ක හරහා වැටී රඟමඬලේ නියම ගෙබිම නැවත ලැබී තිබිණි. ඒවා සුදු පැහැයෙන් බබලමින් තිබිණි. යෝධ රන් සහ රතු වියන ඉහළින් පැතිරී ගොස් සන්ධ්‍යාවේ හිරු රැසින් සෙවණ ලබා දුන්නේය. අධිරාජයාගේ පෙට්ටිය සේද වලින් එතු

බැනර් සහ ස්වර්ණමය රාජාලින්ගෙන් සරසා තිබිණි. දම් පැහැයෙන් දිලිසෙන භූතයන් දහස් ගණනකගෙන් ඔල්වරසන් හඬ නැගී ආවේය.

පොළොවේ සිදුරු විවෘත වී රඟමඩල පුරා වැලි විසුරුවා හැරියේය. දූවැන්ත ආධාරක දිග හැරිණි. ගරාජයක් තරම් විශාල බදාමයෙන් කළ කඳු, ගල් කුලුනු සහ (යම් හේතුවක් නිසා) ජීවමාන ප්‍රමාණයේ ප්ලාස්ටික් සතුන්ද එහි විය. එක් පැත්තකින් කුඩා විලක් දර්ශනය විය. රඟ මඩලේ බිමෙහි ඒ මේ අතට අගල් පිහිටා තිබිණි. පර්සි සහ ජේසන් යෝධයින් දෙදෙනාට මුහුණ ලා සිටගෙන සිටියහ.

''මේක නියම සංදර්ශනයක්.'' බැචස්ගේ හඬ දෝංකාර දුන්ණේය. ඔහු රන් ලෝරලයකින් සහ දම් පැහැති ලෝගුවකින් සැරසී අධිරාජයාගේ පෙට්ටිය මත හිඳගෙන සිටියේය. ඔහුගේ වම් පසින් නිකෝ සහ පිපර් හිඳ ගෙන සිටියහ. ඇගේ උරහිස හෙදියකගේ නිල ඇඳුමින් සැරසුණු අප්සරාවියක විසින් අල්ලාගෙන සිටියාය. බැචස්ගේ දකුණු පැත්තේ සිටි නරාශ්වයා ඩොරිටොස් සහ මිදි පිරි නැමුවේය. දෙවියා ඩයට් පෙප්සි කෑනය ඔසවන විට ජනයා ගෞරවණීය ලෙස නිහඬ වූහ.

පර්සි හිස ඔසවා ඔහු දෙස බැලුවේය. ''ඔයා ඔතන ඉඳගෙන ඉන්නද හදන්නේ?''

''උප දෙවියා හරි.'' එපියාල්ටිස් පැවසුවේය. ''උඹ අපි එක්ක සටන් කරපන්, නිවටයා! උප දෙවිවරු නැතුව.''

බැචස් අලස ලෙස සිනාසුණේය. ''ජුනෝ කියනවා එයා වැඩකට ඇති උප දෙවිවරු පිරිසක් එකතු කරල තියෙනවා කියලා. ඒක පෙන්වන්න. මාව විනෝද කරවන්න, ඔලිම්පස්වල වීරවරුණි. වැඩියමක් කරන්න මට හේතුවක් පෙන්වන්න. දෙවියකු වීමේ ගෞරවය රකින්න.''

ඔහු තම සෝඩා කෑනයේ පියන විවෘත කරත්ම පිරිස ඔල්වරසන් හඬ නැගුහ.

# 48
# පර්සි

**පර්සි බොහෝ සංග්‍රාමවල සටන් කර තිබුණේය.** ඔහු රංග භූමි කීපයකම සටන් වැද තිබුණත්, මෙවැන්නක සටන් කර තිබුණේ නැත. දූවැන්ත රංග ශාලාවක් තුළ, ඔල්වරසන් නඟන භූතයන් දහස් ගණනක් සමඟ, බැචස් දෙවියා ඔහු දෙස බලා සිටිද්දී, අඩි දොළහක් උස යෝධයන් දෙදෙනෙක් ඉදිරිපිට සිටින විට, පර්සිට තමා මකුණෙකියි යන හැඟීමක් ඇති විය. එසේම ඔහුට දැඩි කෝපයක් ඇති වී තිබිණි.

යෝධයන් සමඟ සටන් කිරීම එක් දෙයකි. එහෙත් බැචස් එය සෙල්ලමකට හැරවීම වෙනත් කතාවකි.

වසර ගණනකට පෙර, පර්සි තමාගේ පළමු ගවේෂණය නිමකර ආපසු පැමිණි විට ලූක් කැස්ටෙලාන් පැවසූ දේ පර්සිගේ මතකයට නැගිණි. *මේ සේරම කොච්චර ඵල රහිත දේවල්ද කියල ඔයාට තේරුණේ නැද්ද? ඔලිම්පියානුවන්ගේ ඉත්තෙක් වීම?*

පර්සි දැන් එවකට ලූක් සිටි වයසටම පැමිණ සිටියේය. ලූක් එතරම් ඊර්ෂ්‍යා සහගත වූයේ කෙසේදැයි පර්සිට තේරුම් ගැනීමට හැකි විය. පසුගිය වසර පහ තුළ, පර්සි බොහෝ වතාවක් ඉත්තකු බවට පත්ව සිටියේය. ඔලිම්පියානුවන් වරින් වර ඔහුව පාවිච්චි කරන බව පෙනිණි.

සමහරවිට දෙවිවරු ටයිටන්ලාට හෝ යෝධයන්ට හෝ ගයියාට වඩා යහපත් අය වීමට පුළුවන. එහෙත් එයින් ඔවුන් හොඳ

හෝ නුවණැති අය වන්නේ නැත. එයින් පර්සිව මේ මෝඩ රඟමඩලේ සටන සඳහා මෙහෙයවිය නොහැකි විය.

අවාසනාවකට, ඔහුට වෙනත් විකල්පයක් නොතිබිණි. ඔහු තම මිතුරන් බේරා ගැනීමට යන්නේ නම්, ඔහුට මේ යෝධයන්ව පරාජය කිරීමට සිදුවනු ඇත. ඔහු තම දිවි රැකගෙන ඇනබෙත්ව සොයා ගත යුතුය.

එපියාල්ටිස් සහ ඔටිස් එක්ව පහරදීමේ තීරණයට පහසුවෙන්ම එළැඹ සිටියහ. ඔවුහු පර්සිගේ නිව්යෝර්ක් නිවෙස තරම් විශාල ව්‍යාජ කන්දක් තෝරාගෙන එය ඔසවා උප දෙවිවරුන්ට පහර දුන්හ.

පර්සි සහ ජේසන් පහත් වූහ. ඔවුන්ට ඉහළින් ඇදී ගිය කන්ද දෙදරා යන විට දෙදෙනාම අසල පිහිටි අගලකට පැන ගත්හ. තියුණු බදාම කැබලි අවට විසිරී ගියේය. ඒවා මාරාන්තික නොවුණත්, උමතුවෙන් මෙන් සිරුරේ ඇනී ගියේය.

පිරිස ලේ පිපාසයෙන් මොර දෙන්නට වූහ. 'සටන් කරනු!'

''මම ආයෙත් ඔටිස් ගැන බලාගන්නම්.'' ජේසන් ඝෝෂාව අතරින් පැවසුවේය. ''නැත්නම් මේ වතාවෙ එයාව ඕනෙ ඔයාටද?''

පර්සි සිතන්නට උත්සාහ කළේය. බෙදීම ස්වභාවික මාර්ගයකි. එක් එක් යෝධයන් සමඟ සටන් කිරීම සුදුසු වුවත්, අවසන් වතාවේ එය එතරම් හොඳින් වැඩ කළේ නැත. ඔවුන් වෙනස් උපක්‍රමයක් අනුගමනය කළ යුතු බව ඔහුට වැටහිණි.

මේ මුළු චාරිකාව පුරාම, නායකත්වයේ සහ තම මිතුරන් ආරක්‍ෂා කිරීමේ වගකීම තමන් සතු බවට හැඟීමක් පර්සි තුළ විය. ජේසන්ටද එවැනිම හැඟීමක් ඇති බව ඔහුට විශ්වාස ය. ඔවුන් කුඩා කණ්ඩායම් වල වැඩ කළේ එය වඩා ආරක්ෂිතය යන බලාපොරොත්තුවෙනි. ඔවුහු තනි තනිව සටන් කළ අතර එක් එක් උපදෙවියා ඔහුට හෝ ඇයට කළ හැකි හොඳම දේ කළේය. එහෙත් හේරා ඔවුන්ව සත් දෙනෙකුගේ කණ්ඩායමක් බවට පත් කළේ හේතුවක් ඇතිවය. පර්සි සහ ජේසන් එක්ව වැඩකළ කීපවතාවේදී- සම්ටාර් කොටුවේදී කුණාටුව කැඳවමින්, හර්කියුලිස්ගේ කුලුන වලින් ආගෝ II ට පළා යාමට උදව් කරමින්, කිඳුරු දේවස්ථානය පුරවමින් පවා- ඔහුව එක්ව වැඩ කළහ. පර්සිගේ විශ්වාසය වර්ධනය විය. ජීවිත කාලය පුරාම එක් ඇසක් සහිත යෝධයකුව සිට එක්වරම ඇස් දෙකක් ලැබුණාක් මෙන් ඔහුට වඩා හොඳින් ප්‍රශ්න විසඳීමට හැකි විය.

''අපි එකට පහර දෙමු.'' ඔහු පැවසුවේය. ''මුලින්ම ඔටිස්ට, මොකද එයා තමයි දුර්වල කෙනා. ඉක්මනින් එයාව ඉවර කරල, එපියාල්ටිස් ළඟට යමු. ලෝකඩ සහ රන් එකතු වුණාම, සමහරවිට එයාලගෙ ප්‍රති නිර්මාණය වීම ටිකක් ප්‍රමාද වෙයි.''

තමා සතුටුදායක ලෙස මරණයට පත් විය හැකි ක්‍රමයක් සොයාගත්තාක් මෙන් ජේසන් වියළි සිනාවක් පෑවේය.

''ඇයි නැත්තේ?'' ඔහු එකඟ විය. ''ඒත් එපියාල්ටිස් එතන හිටගෙන ඉන්න එකක් නැහැ, අපි එයාගෙ සහෝදරයා මරණකම් ඔහේ බලාගෙන. නැත්නම්-''

''අද හොඳට හුළං තියෙනවා.'' පර්සි පැවසුවේය. ''ඒ වගේම රඟ මඬල යටින් ජල නල ඇදල තියෙනවා.''

ජේසන් ක්ෂණිකව වටහා ගත්තේය. ඔහු සිනාසුණු අතර පර්සිට මිත්‍රත්වයේ උණුසුම දැනුණේය. මේ හාදයා බොහෝ දේ ගැන සිතන්නේ ඔහු සිතන ආකාරයටමය.

''තුනට ගනිද්දි?'' ජේසන් පැවසුවේය.

''ඇයි බලාගෙන ඉන්නෙ?''

ඔවුහු ගලෙන් පිටතට පැමිණියහ. පර්සි සැක කළ අයුරින්ම නිවුන්නු දෙදෙනා තවත් බදාම කන්දක් ඔසවාගෙන පැහැදිලි ප්‍රහාරයක් වෙනුවෙන් බලා සිටියහ. යෝධයෝ එය ඔවුන්ගේ හිස්වලින් ඉහළට ඔසවා විසිකිරීමට සූදානම් වූහ. පර්සි ඔහුගේ පාදවලට යටින් පිහිටි ජල නලය පුපුරුවා දමා පොළොව දෙදරවීමට ක්‍රියා කළේය. දම් හිසකේ සහිත යෝධයා පසුපසට විසි වූ අතර, ඔටිස්ගේ ග්‍රහණයෙන් කන්ද ගිලිහී ගියේය. එය ඔහුගේ සහෝදරයා මත ඇද වැටිණි. එපියාල්ටිස්ගේ සර්ප පාද පමණක් පෙනෙන්නට තිබිණි. ඔහුගේ සිරුරේ අනෙක් කොටස කොහේදැයි සොයන්නාක් මෙන් සර්පයන්ගේ හිස් නලියන්නට විය.

පිරිස අනුමැතිය දෙමින් කෑ ගැසූහ. එහෙත් එපියාල්ටිස්ගේ නිසල වීම තාවකාලික වනු ඇතැයි පර්සි සැක කළේය. ඔවුන්ට හොඳම තත්පර කීපයක් ලැබී තිබිණි.

''ඒයි, ඔටිස්.'' කෑ ගැසුවේය.

''ආහ්.'' ඔහු තම හෙල්ලය දමා ගැසුවත්, නිසි එල්ලය ගැනීමට නොහැකි තරමට ඔහු කෝප වී සිටියේය. එය පර්සිගේ හිසට ඉහළින් ඇදී ගොස් විලට වැටිණි.

බැලේ නර්තනයට නිග්‍රහ කරමින් උප දෙවිවරු ජලය දෙසට පසු බැස්සහ. ඔටිස් බැරලයක් මෙන් නිරායුධව ඒ දෙසට දිව ආවේය. එහෙත් ඔහුට කරුණු දෙකක් අමතකව ගොස් තිබිණි. පළමු වැන්න වූයේ ඔහු නිරායුධව සිටින බවය. දෙවැන්න වූයේ පොසිඩන්ගේ පුත්‍රයා සමඟ සටන් කිරීමට විශාල ජල කඳකට පැනීම හොඳ අදහසක් නොවන බවය.

ඔහු නැවතීමට උත්සාහ කළත්, ප්‍රමාද වැඩි විය. උප දෙවිවරු දෙපසට පෙරලී ගිය අතර, ජේසන් සුළඟ කැඳවා යෝධයාගේ මුහුණ ජලය තුළින් දැක ගැනීමට සැලැස්වූයේය. ඔවුහු යෝධයා වෙත පැන ඔවුන්ගේ අසිපත් ඔටිස්ගේ හිසට පහපත් කළහ.

අසරණ හාදයාට කරකැවීමටවත් අවස්ථාවක් නොලැබිණි. දැවැන්ත සිසිල් බීම කුඩු පැකට්ටුවක් මෙන් ඔහු නිල් දියමත පුපුරා කුඩු බවට පත් විය.

පර්සි විලෙහි දිය සුළියක් මැව්වේය. ඔටිස්ගේ පදාර්ථ ප්‍රති නිර්මාණය වීමට උත්සාහ කළත්, ඔහුගේ හිස ජලයෙන් මතුවෙද්දී, ජේසන් අකුණක් කැඳවා එය නැවත පුපුරුවා දැම්මේය.

යම් තරමකට සෑහීමකට පත්විය හැකි වුවත්, ඔවුන්ට සදාකාලිකව ඔටිස් බිම දමා තබාගනු නොහැකිය. පර්සි දැනටමත් තම භූගත සටනින් වෙහෙසට පත්ව සිටියේය. හෙල්ලේ දණ්ඩ වැදීමෙන් ඔහුගේ උදරය තවමත් වේදනා දෙමින් තිබිණි. තම ශක්තිය අනතුරු අඟවන බව ඔහුට දැනුණත්, තවමත් ඔවුන්ට ගනුදෙනු බේරා ගැනීමට තවත් යෝධයෙක් ඉතිරිව සිටියේය.

එයට සාක්ෂි සපයන්නාක් මෙන්, ඔවුන්ට පිටුපසින් වූ බදාම කන්ද පුපුරා හරිමින්, කෝපයෙන් පුපුරන එපියාල්ටිස් නැගී සිටියේය.

ඔහු සමීපයට ගාටන තෙක් ජේසන් සහ පර්සි බලා සිටියහ. ඔහුගේ හෙල්ල අතේ රැඳී තිබිණි. කන්දට යටවීම ඔහුගේ ශක්තිය වැඩි කිරීමට සමත්ව ඇති බව පෙනිණි. ඔහුගේ දෑස් මාරක දීප්තියකින් දිලිසෙන්නට විය. සන්ධ්‍යා හිරු රැසින් ඔහුගේ කාසි එබ්බවූ කොණ්ඩය දිලිසුණේය. ඔහුගේ සර්ප පාද පවා කෝප ගෙන සිටි බව පෙනුණු අතර උන් තම දළ නිරාවරණය කරගෙන පිඹිමින් සිටියහ.

ජේසන් තවත් අකුණක් කැඳවීය. එහෙත් එය තම හෙල්ලට හසු කරගත් එපියාල්ටිස් එය ඉවතට හැරවූයේ ජීවමාන ප්‍රමාණයේ

ප්ලාස්ටික් ගවයකු දියකර හරිමිනි. ගඩොල් කැටයක් විසි කරන තරම් පහසුවෙන් ඔහු තම මඟ අවුරාගෙන සිටි ගල් කුලුනක් විසිකර දැමුවේය.

පර්සි දිය සුළිය දිගටම තබා ගැනීමට උත්සාහ කළේය. ඔටිස් නැගිට විත් මේ සටනට එකතු වනු දැකීමට ඔහුට වුවමනා නොවීය. එහෙත් එපියාල්ටිස් අවසන් පියවර කීපය සමීපයට පැමිණෙත්ම, පර්සිට එයට අවධානය යොමු කිරීමට සිදුවිය.

ජේසන් සහ ඔහු යෝධයන්ගේ ප්‍රහාරයට මුහුණ දුන්හ. ඔවුහු එපියාල්ටිස් වටා යමින් ලෝකඩ සහ රන් අසිපත් පහර එල්ල කළත්. යෝධයා සෑම පහරක්ම වළක්වා ගැනීමට සමත් විය.

''මම යටත් වෙන්නෙ නැහැ.'' එපියාල්ටිස් ගිගිරුවේය. ''උඹලට මගෙ සංදර්ශනය විනාශ කරල දාන්න පුළුවන් ඇති, ඒත් ගයියාට තවමත් උඹලගේ ලෝකය විනාශ කරන්න පුළුවන්.''

පර්සි පරිභව කරමින් යෝධයාගේ හෙල්ලය දෙකට කපා දැමුවේය. එලියාල්ටිස් එයින් සසල වූයේ නැත. යෝධයා පහත් වී එහි මොට කෙළවරින් පර්සි බිම වැටෙන සේ පහරක් දුන්නේය. පර්සි තම කඩුව දරා සිටි අත තදින් ගැටෙන සේ බිම වැටුණේය. රිප්ටයිඩය ඔහුගේ අතින් ගිලිහී ගියේය.

ජේසන් එහි වාසිය ගැනීමට උත්සාහ කළේය. ඔහු පියවරක් ඉදිරියට තබා යෝධයාගේ ළයට ඇන්නේය. එහෙත් කෙසේ හෝ එපියාල්ටිස් ඒ පහර වළකා ගැනීමට සමත් විය. ඔහු තම හෙල්ලයේ තුඩ ඇති කොටසින් ජේසන්ගේ ළයට ඇන්නේය. හෙලි පහරින් ඔහුගේ දම් පැහැති කමිසය ඉරී ගියේය. ජේසන් වකුටු විය. ඔහුගේ උරතලයෙන් සිහින් ලේ දහරාවක් ගලා යන බව ඔහුට පෙනිණි. එපියාල්ටිස් ඔහුව පසුපසට විසිවන සේ පහරක් හැසුවේය.

අධිරාජයාගේ පෙට්ටිය මත හිඳ, පිපර් කෑ ගැසුවාය. එහෙත් රැස්ව සිටි පිරිසේ ඝෝෂාවෙන් ඇගේ හඬ යටපත් වී ගියේය. බැචස් විනෝදකාමී සිනාවකින් බලා සිටියේය.

කැඩුණු හෙල්ලේ කැබලි දෙක ඔවුන්ගේ හිස්වලට ඉහළින් ඔසවාගෙන එපියාල්ටිස් පර්සි සහ ජේසන් දෙසට ගියේය. පර්සිගේ අත හිරිවැටී තිබිණි. ජේසන්ගේ අසිපත රංග භූමියේ ඈතට විසිවී තිබිණි. ඔවුන්ගේ සැලසුම අසාර්ථක වී ඇති බව පෙනී ගියේය.

වැඩකට නැති වයින් දෙවියාට කළයුතු අවසන් සාපය කුමක්දැයි තීරණය කරමින් පර්සි බැචස් දෙස බැලුවේය. එවිට ඔහු

දුටුවේ රංග භූමියට ඉහළ අහසේ වූ හැඩයකි. විශාල කළු පැහැති ඕවලයක් වේගයෙන් පහත් වෙමින් තිබිණි.

විලේ සිට ඔටිස් කෑ ගැසුවේය. ඔහු තම සොහොයුරාට අනතුරු ඇඟවීමට උත්සාහ කළත්, අඩක් දියවූ මුහුණට කළ හැකි වූයේ ගොරවන හඬක් පිටකිරීම පමණකි.

''කරදර වෙන්න එපා, සහෝදරයා.'' තවමත් තම ඇස උප දෙවිවරු වෙත එල්ල කරගෙන සිටි එපියාල්ටිස් පැවසුවේය. ''මම රෑ කෑමට උන්ව හදල ගන්නම්.''

ආගෝ II අහසේ පැත්තකට හැරී බැලිස්ටාවෙන් කොළ පැහැති ගින්නක් නිකුත් කළේය.

''ඇත්තටම.'' පර්සි පැවසුවේය. ''ඔයාගෙ පිටිපස්ස බලන්න.''

එපියාල්ටිස් හැරී විශ්වාස කිරීමට නොහැකි අයුරින් පහත් වන විට පර්සි සහ ජේසන් දෙපසට පෙරලී ගියහ.

රංග භූමිය පුපුරා යනවිට පර්සි අගලකට පැනගත්තේය.

ඔහු නැවත උඩට නගින විට ආගෝ II ගොඩබෑසීමට පැමිණෙමින් තිබිණි. ජේසන් තමාගේ අගනා බෝම්බ ආරක්ෂකයා වූ ප්ලාස්ටික් අශ්වයා පිටුපස සිට එබී බැලුවේය. එපියාල්ටිස් රංග භූමියේ බිම වැතිරී ගොරවමින් සිටියේය. ඔහු වටා වූ වැලි ග්‍රීක ගින්නට රත් වීමෙන් වීදුරු මෙන් රශ්මි මාලාවක් නිර්මාණය කර තිබිණි. ඔටිස් විල් ජලයේ දඟලමින් ප්‍රති නිර්මාණය වීමට උත්සාහ කළත්, දැත්වලින් පහළ මස් කුට්ටියක් ලෙසින් දිස්විය.

ජේසන් වෙත ගිය පර්සි ඔහුගේ උරහිස් වලට තට්ටු කළේය. ආගෝ II එහි නැංගුරම දමා රංග භූමියේ බිම මත ගොඩ බැස්සේය. ලියෝ ඇණිය මත සිටගෙන සිටි අතර හේසාල් සහ ෆ්‍රෑන්ක් ඔහුගේ දෙපසින් වූහ. කෝච් හෙජ් වෙඩි තබන වේදිකාව මත සිට නටමින්, දෑත් මිට මොලවමින් කෑ ගසමින් සිටියේය. ''ඔන්න ඕක තමයි මම කිව්වේ!''

පර්සි අධිරාජයාගේ පෙට්ටිය දෙසට හැරුණේය. ''හොඳයිද?'' ඔහු බැචස්ට කෑ ගැසුවේය. ''දැන්වත් විනෝදවෙලා ඇති වුණාද, වයින් ගඳ ගහන පුංචි -''

''ඒක අවශ්‍ය වෙන්නෙ නැහැ.'' එක්විටම දෙවියා රංග භූමියේ සිට ඔහුගේ දකුණු පැත්තේ පෙනී සිටියේය. ඔහු තම දම් පැහැති

ලෝගුවේ තැවරී තිබූ ඩොරිටෝ කුඩු පිස දැමූවේය. ''ඔයාල මේ සටනෙ වැඩදායක කොටස්කාරයෝ කියල මම තීරණය කළා.''

''කොටස්කාරයො?'' ජේසන් කෝපයෙන් පැවසුවේය. ''ඔයා කරපු දෙයක් නෑනෙ.''

බැචස් විල අද්දරට ඇවිද ගියේය. ජලය ක්ෂණිකව වියළී ගොස් ඔටිස්ගේ හිසේ තලපය පමණක් ඉතිරි විය. බැචස් එහි පතුලට ගොස් ඉහළ සිටින පිරිස දෙස බැලුවේය. ඔහු තම තර්සකාව එසවූයේය.

පිරිස සමච්චල් කළහ. ඔවුන්ගේ මාපට ඇඟිලි පහළට හැරවූහ. එහි අර්ථය ජීවිතයද මරණයද යන්න පර්සිට කොහෙත්ම තේරුම් ගත නොහැකි විය. ඔහුට එය දෙපසින් ඇසුණි.

බැචස් වඩාත් විනෝදාත්මක විකල්පයක් තෝරාගෙන තිබිණි. ඔහු තම පයින් ගෙඩිය සවිකළ යෂ්ටියෙන් ඔටිස්ගේ හිසට පහරක් එල්ල කළ අතර, යෝධයාගේ මස්ගොඩ සම්පූර්ණයෙන්ම කොටස්වලට වෙන් වී ගියේය.

පිරිස වියරු වැටුණහ. විලෙන් ගොඩට පැමිණි බැචස්, දුම් දමමින් නිලසව වැතිර සිටි එෆියාල්ටිස් වෙත පැමිණියේය.

නැවතත්, බැචස් තම තර්සකාව එසවීය.

''ඒක කරන්න!'' පිරිස කෑ ගැසුහ.

''ඒක කරන්න එපා! එෆියාල්ටිස් ආයාචනා කළේය.

බැචස් යෝධයාගේ නාසයට තට්ටු කළ විට, එෆියාල්ටිස් අළු වී ගියේය.

භූතයෝ ඔල්වරසන් නඟමින්, භූතාකාර ආසිරි මල් විසිකරද්දී බැචස් දෑතම ඔසවාගෙන රංග භූමිය වටා ඇවිද ගියේය. ඔහු දෙවිවරුන් දෙස බලා විරිත්තුවේය. ''ඒක තමයි, මගෙ මිත්‍රවරුනි, සංදර්ශනය! ඒ වගේම ඇත්තවශයෙන්ම මම යමක් කළා. මම යෝධයෝ දෙන්නත් මරා දැම්මා.''

පර්සිගේ මිතුරන් නැවෙන් ගොඩබසිද්දී, භූත ජනකාය අතුරුදන් විය. රංග භූමියේ ඉන්ද්‍රජාලික අලුත්වැඩියාවන් මීදුමක් බවට හැරෙද්දී පිපර් සහ නිකෝ අධිරාජයාගේ පෙට්ටියෙන් බැසීමේ අරගලයක නිරතව සිටියහ.

''හොඳයි.'' බැචස් පැවසුවේය. ''ඒක අපූරුයි. ඔයාලට දිගටම ඔයාලගෙ චාරිකාව යන්න මගෙ අවසරය ලැබෙනවා.''

''ඔයාගෙ අවසරය?'' පර්සි පුදුමයෙන් විමසුවේය.

''ඔව්.'' බැචස් තම ඇහිබැම එසවූයේය. ''ඔයාලගෙ චාරිකාව ඔයාල බලාපොරොත්තු වුණාට වඩා අමාරු වෙන්න පුළුවන්, නෙප්චූන්[1] පුත්‍රයාණනි.''

''පොසිඩන්ගේ.'' පර්සි ස්වයංක්‍රීයව ඔහුව නිවැරදි කළේය. ''ඔයා මොනවද මගෙ චාරිකාව ගැන කියන්නෙ?''

''ඔයා එම්මානුවෙල් ගොඩනැගිල්ල පිටිපස්සෙ තියෙන නැවතුම් බිමට උත්සාහ කරන්න ඕනෙ.'' බැචස් පැවසුවේය. ''අවහිර බිඳින්න හොඳම තැනක්. දැන්, සුබ ගමන්, මගේ මිත්‍රවරුනි, ඒ වගේම, ආහ්, අනිත් පුංචි ප්‍රශ්නයත් විසඳගන්න ලැබේවා.''

මිදි යුෂවල සුවඳ යාන්තමට හමා යද්දී, දෙවියා වාෂ්ප වී මීදුමක් බවට පත්විය. ජේසන් පිපර් සහ නිකෝ වෙතට දිව ගියේය.

කෝච් හෙජ් වේගයෙන් පර්සි වෙත ඇවිද ආවේය. ලියෝ, ෆ්‍රෑන්ක්, සහ හේසාල් ඔහුට පිටුපසින් වූහ. ''ඒ ඩියෝනීසස් ද? හෙජ් විමසුවේය. ''මම ඒ හාදයාට කැමතියි.''

''ඔයාල පණපිටින්!'' පර්සි සෙස්සන්ට පැවසුවේය. ''යෝධයෝ කිව්වෙ ඔයාලව අල්ල ගත්ත කියලයි. මොකද වුණේ?''

ලියෝ දෙවුර සැලුවේය. ''ආහ්, ඒක මේ ලියෝ වැල්ඩේස්ගෙ තවත් අපූරු සැලැස්මක්. ආකිමිඩීස්ගෙ ගෝලයෙන් මොනවද කරන්න පුළුවන් කියල අහපුවම ඔයාල පුදුම වෙයි. ඒ වගේම පොළොව යට තියෙන දේවල් ගැන දැනෙන කෙල්ලෙක් සහ මුගටියෙක්.''

''මම තමයි මුගටියා.''

''මූලිකවම.'' ලියෝ පැහැදිලි කළේය. ''මම ආකාමිඩීස්ගෙ උපකරණයත් එක්ක හයිඩ්‍රොලික් ඉස්කුරුප්පුව ක්‍රියාත්මක කළා- මම එහෙම එකක් මගේ නැවෙත් හයි කරනවා. මතුපිටට පැමිණෙන්න පුළුවන් ලේසිම මාර්ගය හඳුනාගන්න හේසාල්ට පුළුවන් වුණා. අපි මුගටියකුට ප්‍රමාණවත් තරම් උමඟක් හැඳුවා. මම හදපු සරල සම්ප්‍රේෂකයත් එක්ක ෆ්‍රෑන්ක් ඉහළට නැඟුණා. ඊට පස්සෙ ඒකට පුළුවන් වුණා කෝච් හෙජ්ගෙ ප්‍රියතම චන්ද්‍රිකා චැනලය අල්ල ගන්න. නැව අරන් ඇවිත් අපිව ගලවගන්න ලෙස අපි එයාට දැනුම් දුන්නා. එයා අපිව ගත්තට පස්සෙ, ඔයාල හොයන එක ලේසි වුණා, අර රංග ශාලාවේ පෙනුණු දිව්‍යමය ආලෝකයට ස්තුතිවන්ත වෙන්න.''

1 මුහුදට අධිපති රෝම දෙවියා. ග්‍රීක ස්වරූපය පොසිඩන් ය.

පර්සිට අවබෝධ වූ ලියෝගේ කතාවෙන් සියයට දහයක් පමණ වුවත්, ඔහුගේ සිතේ තෙරපුණ වඩාත් වැදගත් ප්‍රශ්නයක් තිබුණු බැවින් ඔහු ඒ ප්‍රමාණයෙන් සෑහීමකට පත්විය.

''ඇනබෙත් කොහොමද?''

ලියෝ වේදනාවෙන් හැකිළිණි. ''ඔව්, ඒ ගැන කියනවානම්... එයා තවමත් ඉන්නෙ ප්‍රශ්නයක, අපි හිතන විදිහට. තුවාල වෙලා, කකුළ කැඩිලා, සමහරවිට ගයියා අපිට පෙන්නපු දර්ශනය අනුව නම් එහෙම තමයි. එයාව බේරාගැනීම තමයි ඊළඟ පියවර.''

තත්පර දෙකක් ගතවීමට පෙර, පර්සි බිම වැටීමට සූදානම්ව සිටියේය. දූන් තවත් ඇඩ්‍රිනලීන් දියවැලක් ඔහුගේ සිරුරේ ගලන්නට විය. ආගෝ II මුලින්ම ඇනබෙත්ව බේරා ගැනීමට යාත්‍රා නොකළේ මන්දැයි ලියෝ සමග වාද කිරීමට ඔහුට වුවමනා විය. එහෙත් එය තරමක් අශෝභන යැයි ඔහුට සිතිණි.

''මට ඒ දර්ශනය ගැන කියන්න.'' ඔහු පැවසුවේය. ''මට හැමදේම කියන්න.'' පොළොව දෙදරුවේය. දූව ලැලි අතුරුදහන් වෙන්නට පටන් ගත්තේය. විසිරුණු වැලි හයිපෝජියමේ වූ සිදුරු තුලින් පහළට ඇදිණි.

''අපි නැවට ගිහින් කථා කරමු.'' හේසාල් යෝජනා කළාය. ''මේ පුළුවන් වෙලාවෙ අපි පිටත් වෙන එක වැඩිය හොඳයි.''

ඔවුහු රංග ශාලාවෙන් පිටතට යාත්‍රා කර, රෝමයේ වහල මුදුන් මතින් දකුණු දෙසට ඇදුණාහ.

පියාසා ඩෙල් කොලෝසියෝ හි අවට සෑමතැනකම, රථවාහන නැවතී තිබිණි. මනුෂ්‍ය ජනයා රොක් වී සිටි අතර, ඔවුහු නටබුන් අතරින් ඇදී ආ අමුතු ආලෝක සහ ශබ්ද ගැන පුදුමයට පත් වී සිටින බව පෙනිණි. පර්සිට දැකිය හැකි තරම් දුරට, නම් යෝධයන්ගේ එකදු විනාශකාරී සැලසුමක්වත් සාර්ථකත්වයට පැමිණ ඇති බවක් නොපෙනුණි. නගරය පෙර පැවති අයුරින්ම පෙනිණි. අහසට නගින යෝධ යුද නැව කිසිවකුගේ අවධානයට පත් වූ බවක් නොපෙනුණි.

උප දෙවිවරු ඇණිය අවට එක් වූහ. ජේසන් පිපර්ගේ උරහිස්වලට වෙලුම්පටි දමන අතරේ, හේසාල් අවරයේ සිට නිකෝට අමෘතය කැව්වාය. හේඩීස්ගේ පුත්‍රයාට හිස එසවීමට හැකි වූයේ යාන්තමිණි. ඔහුගේ හඬ කෙතරම් සිහින් වීද යත්, ඔහු කතා කළ සැමවිටෙකම එය ඇසීමට හේසාල්ට ඉදිරියට නැවීමට සිදුවිය.

ෆ්‍රැන්ක් සහ ලියෝ ආකිමිඩිස්ගේ ගෝලය සමඟ කාමරයේදී සිදු වූ දේ නැවත ආවර්ජනය කළ අතර, ලෝකඩ කණ්ණාඩිය තුළින් ගයියා පෙන්වූ දර්ශනය ගැනද පැවසූහ. ඇනබෙත් සොයා ගැනීම ඔවුන්ගේ ප්‍රමුඛ කාර්යයක් විය යුතු බවට බැචස් දුන්නේ ගුප්ත උපදේශයක් බව ඔවුන්ගේ තීරණය විය. *එම්මානුවෙල් ගොඩනැගිල්ල, එය කුමක් වුවත්,* ෆ්‍රැන්ක් ඇණියේ තිබූ පරිගණකය ක්‍රියාත්මක කරන අතරේ ලියෝ කඩිමුඩියේ පාලන පුවරුවේ බොත්තම් ඔබන්නට විය. ඒ අතර ඔහු එම්මානුවෙල් ගොඩනැගිල්ල, එම්මානුවෙල් ගොඩනැගිල්ල යනුවෙන් මිමිණුවේය. කෝච් හෙජ් මල්ලවපොර වලින් උදව් කිරීමට උත්සාහ කළේ රෝමයේ වීථි සිතියම උඩ යට මාරු කරමිනි.

පර්සි, ජේසන් සහ පිපර් අසල දණ ගසා ගත්තේය. ''උරහිස්සට කොහොමද?'' පිපර් සිනාසුණාය. ''ඒක හොඳ වෙයි. ඔය දෙන්නම හොඳට සටන් කළා.'' ජේසන් පර්සිට ඇන්නේය. ''ඔයයි, මමයි නරක කණ්ඩායමක් නෙමෙයි.''

''කන්සාස්වල ඉරිඟු යායේ සටන් කළාට වැඩිය හොඳයි.'' පර්සි එකඟ විය.

''මෙන්න ඒක.'' ලියෝ තිරයට ඇඟිල්ල තබාගෙන කෑ ගැසුවේය. ''ෆ්‍රැන්ක් ඔයා නම් පුදුමයක්. මම පාර හරිගස්සන්නම්.''

ෆ්‍රැන්ක් ඔහුගේ උරහිසට අත තැබුවේය. ''මම තිරයෙන් නම කියෙව්ව විතරයි. සමහර චීන සංචාරකයෝ ඒක ගූගල් සිතියම්වල සටහන් කරල තියෙනවා.''

ලියෝ අනෙක් පිරිස දෙස බලා විරිත්තුවේය. ''එයා චීන කියවනවා.''

''ටිකක් විතර.'' ෆ්‍රැන්ක් පැවසුවේය.

''හාදයිනේ.'' හේසාල් බාධා කළාය ''මම ඔයාලගෙ අගය කිරීමේ සැසියට බාධා කරන්න කැමති නැහැ. ඒත් ඔයාල මේක අහන්න ඕනෙ.''

ඇය නිකෝට සිට ගැනීමට උදව් කළාය. ඔහු නිතරම සුදුමැලිව සිට අයකු වුවත් දැන් ඔහුගේ සම කිරිපිටි මෙන් සුදු වී තිබිණි. ඔහුගේ ගිලුණු අඳුරු ඇස් පර්සිට යුද්ධයේ නිදහස් වූ සිරකරුවන්ගේ ඡායාරූප සිහි ගැන්විය.

''ස්තුතියි.'' නිකෝ පැවසුවේය. ඔහුගේ දෑස් කලබලයෙන් කණ්ඩායම වෙත යොමු විය. ''මම බලාපොරොත්තු අත හැරල හිටියෙ.''

ගෙවුණු සතියේ හෝ එවැනි කාලයක පර්සිට නිකෝ හමුවූ විට තමා කියනු ඇතැයි සිතුණු රුදුරු වදන් සිහිපත් විය. එහෙත් මෙතරම් දුබල සහ දුක්මුසු හාදයව දකිනවිට පර්සිට එසේ කේන්ති ගැනීමට නොහැකි විය.

''ඔයා කඳවුරු දෙක ගැනම දැනගෙන හිටියා.'' පර්සි පැවසුවේය. ''මම ජුපිටර් කඳවුරට ආව පළවෙනි දවසෙම මම කවුද කියල ඔයාට කියන්න තිබුණ. ඔයා එහෙම කළේ නැහැ.''

නිකෝ ඇණිය මත වැටුණේය. ''පර්සි, මට සමාවෙන්න. මම ජුපිටර් කඳවුර ගවේෂණය කළේ ගිය අවුරුද්දෙ. මගේ තාත්තා මාව එහාට යැව්වට මම දැනගෙන හිටියෙ නෑ ඒ ඇයි කියලා. දෙවිවරු සියවස් ගාණක්ම කඳවුරු දෙක වෙන් කරල තියාගත්ත කියල එයා මට කිව්වා. ඒක මට වෙන කාටවත් කියන්න බැහැ. ඒකට කාලය එළඹිලා තිබුණෙ නෑ. ඒත් මම ඒක දැනගන්න එක වැදගත් බව එයා කිව්වා... ඔහු ආයාසයෙන් කැස්සේය.

ඔහුට නැවත සිටගැනීමට හැකිවන තුරු හේසාල් ඔහුගේ උරහිස් වලින් අල්ලාගෙන සිටියාය.

''මම හිතුවා තාත්තා එහෙම කියන්නෙ හේසාල් නිසා කියලා. ''නිකෝ නැවත පැවසුවේය. ''මට ඇයව තියන්න ආරක්ෂිත ස්ථානයක් ඕනෙ වුණා. ඒත් දැන් මම හිතනවා තාත්තට ඕනෙ වුණේ මම කඳවුරු දෙකම ගැන දැනගන්නවා දකින්නයි කියලා. එතකොට මම තේරුම්ගත්තා ඔයාලගෙ ගවේෂණය කොච්චර වැදගත් එකක් ද කියල වගේම මම මරණයේ දොරටුව සොයාගත යුතු වුණා.''

''ඔයාට දොරටු හමුවුණාද?'' පර්සි විමසුවේය.

නිකෝ හිස සැලුවේය. ''මම මෝඩ වුණා. මම හිතාගෙන හිටියෙ මට පාතාල ලෝකෙ ඕනෙම තැනක යන්න පුළුවන් කියලයි. ඒත් මම ඇවිදගෙන ගියෙ හරියටම ගයියාගේ උගුලට. ඊට වඩා ලේසියෙන් මට කළු කුහරයකින් පැනල එන්න පුළුවන් වෙයි.''

''හ්ම්...'' ෆ්‍රෑන්ක් තොල් හැපුවේය. ''මොන විදිහෙ කළු කුහරයක් ගැනද ඔයා කියන්නෙ?''

නිකෝ කතා කිරීමට පටන්ගත්තේය. එහෙත් ඔහුට කීමට අවැසිව තිබූ දේ කුමක් වුවත් එය බෙහෙවින් බියකරු දෙයක් බව පෙනිණි. ඔහු හේසාල් දෙසට හැරුණේය.

ඇය තම සොයුරාගේ අත අල්ලා ගත්තාය. ''නිකෝ මට කිව්වා මරණයේ දොරටුවල පැති දෙකක් තියෙනවා කියලා- එකක් මනුෂ්‍ය ලෝකයේ. අනික පාතාල ලෝකයේ. ද්වාරයේ මනුෂ්‍ය පැත්ත ග්‍රීසිය. ඒක ගයියාගෙ හමුදාව විසින් තදින් ආරක්ෂා කරනවා. එතනින් තමයි එයාල නිකෝව ආපහු ඉහළ ලෝකයට ගෙනාවෙ. ඊට පස්සෙ එයාල නිකෝව රෝමයට අරන් ආවා.''

පිපර්ගේ කෝනුකෝපියාවෙන් චීස් බර්ගරයක් නිකුත් වීම නිසා ඇය කලබලයට පත් වුවා විය යුතුය. ''හරියටම ග්‍රීසියෙ කොතනද මේ දොරටුව තියන්නෙ?''

නිකෝ ආයාසයෙන් හුස්මක් ගත්තේය. ''හේඩිස් මන්දිරයෙ. ඒක එපිරස්වල[1] තියෙන භූගත දේවස්ථානයක්. මට ඒක සිතියමේ ලකුණු කරන්න පුළුවන්. ඒත්- ඒත් ද්වාරයේ මනුෂ්‍ය පැත්ත නෙමෙයි ගැටලුව. පාතාල ලෝකයේ, මරණයේ දොරටු වලින්...''

පර්සිගේ පිට කොන්ද සීතල වී යන්නාක් මෙන් දැනිණි.

*කළු කුහරයක්.* නිකෝ ඩි ආන්ජලෝට පවා යා නොහැකි, පාතාල ලෝකයේ පිට වී යා නොහැකි කොටස. පර්සිට මීට පෙර මේ ගැන නොසිතුණේ ඇයි? ඔහු මේ ස්ථානය අද්දරටම ගොස් තිබිණි. ඔහුට තවමත් ඒ ගැන බියකරු සිහින පෙනිණි.

''ටාටරස්.'' ඔහු අනුමාන කළේය. ''පාතාල ලෝකයේ ගැඹුරුම කොටස.''

නිකෝ හිස සැලුවේය. ''එයාල මාව වලට තල්ලු කළා, පර්සි ඒකෙ පහළදි මම දැකපු දේවල්...'' ඔහුගේ හඬ බිඳිණි.

හේසල් ඇගේ තොල් සපාගත්තාය. ''කිසිම මනුෂ්‍යයෙක් කවදාවත් ටාටරස්වලට ගිහින් නැහැ. ''ඇය පැහැදිලි කළාය. ''අඩු ගානෙ කිසිකෙනෙක් කවදාවත් ගිහින් නෑ වගේම පණපිටින් ආපහු ඇවිල්ලත් නැහැ. ඒක හේඩිස්වල අධි ආරක්ෂිත සිරගෙයක්, එතන තමයි මහලු ටයිටන්ලාව සහ දෙවියන්ගේ වෙනත් සතුරන්ව බන්ධනය කරල තියෙන්නෙ. පෘථිවියෙදි මිය ගියාට පස්සෙ හැම රාක්ෂයෙක්ම යන්නෙ එතෙන්ට. ඒක... කවුරුවත්ම දන්නෙ නෑ ඒක මොන වගේද කියලා.''

1 වර්තමාන ඊසානදිග ග්‍රීසිය සහ දකුණුදිග ඇල්බේනියාව අයත් ප්‍රදේශය

ඇගේ දෑස් සොහොයුරා වෙතට යොමුවිය. ඇගේ ඉතිරි සිතිවිලි වචන වලට පෙරලීමට අවශ්‍ය නොවීය. *නිකෝ හැරුණුවිට වෙන කවුරුවත්.* හේසාල් ඔහුගේ කළු අසිපත අත තැබුවාය.

මහලු මිනිසකුගේ සැරයටියක් මෙන් නිකෝ එය වාරු කර ගත්තයේ. ''දැන් මට තේරෙනවා හේඩිස්ලට දොරටු වහල තියන්න බැරි ඇයි කියලා.'' ඔහු පැවසුවේය. ''දෙවිවරු පවා ටාටරස්වලට යන්නෙ නැහැ. මරණයේ දෙවියා, තනාටොස් පවා, ඒ කිට්ටුවටවත් යන එකක් නැහැ.''

ලියෝ සුක්කානම අසල සිට හැරී බැලුවේය. ''එහෙනම් මම අනුමාන කරන විදිහට, අපිට එහෙට යන්න වෙනවා.''

නිකෝ හිස සැලුවේය. ''ඒක කරන්න බැහැ.'' මම හේඩිස්ගේ පුත්‍රයා, මමත් පණ බේරගත්තෙ යාන්තමින්. ගයියාගේ හමුදාව ක්ෂණිකව මාව යටත් කරගත්තා. එයාල එහෙදි ඉතාම බලවත්... උප දෙවියකුට කිසිම අවස්ථාවක් ලැබෙන එකක් නැහැ. මාව සම්පූර්ණයෙන්ම වගේ උමතු වුණා.''

නිකෝගේ දෑස් බිඳී ගිය වීදුරුවක් මෙන් පෙනිණි. ඔහුගේ අභ්‍යන්තරය තුළ සදාකාලික බිඳුණු යමක් ඇතැයි පර්සි දුක්විය.

''එහෙනම් අපි එපිරස් වලට යමු.'' පර්සි පැවසුවේය. අපි මේ පැත්තෙ දොරටු වහල දාමු.''

''මම ප්‍රාර්ථනා කරනවා ඒක ලේසි වුණානම් හොඳයි කියලා.'' නිකෝ පැවසුවේය. ''දොරටු වහන්න නම් ඒක දෙපැත්තෙන්ම පාලනය කරන්න ඕනෙ. ඒක හරියට ද්විත්ව මුද්‍රකයක් වගේ. සමහරවිට, ඔයාල හත් දෙනාම එකට එකතු වුණොත් මනුෂ්‍ය පැත්තෙ ඉන්න ගයියාගේ හමුදාව පරාජය කරන්න පුළුවන් වෙයි. හේඩිස් මන්දිරයේදි. ඒත් ඔයාලගෙ කණ්ඩායම එහෙම නොකර එකවිටම ටාටරස් පැත්තෙ සටන් කළොත්, කණ්ඩායමේ බලය ප්‍රමාණවත් වෙයි, රාක්ෂයන්ගෙ හමුදාව එයාලගෙම භූමියෙදි පරාජය කරන්න.''

''ඒකට විදිහක් තියෙන්න ඕනෙ.'' ජේසන් පැවසුවේය.

කිසිවකු කිසිදු අදහසක් සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් නොවීය.

පර්සිගේ උදරය ගිලී යන්නා සේ දැනිණි. මුළු නැවම විශාල ගොඩනැගිල්ලක් බඳු ස්ථානයකට පහත් වන බව එවිට ඔහුට අවබෝධ විය.

ඇනබෙත් නිකෝගේ ප්‍රවෘත්තිය නිසා ඇය තවමත් අනතුරේ සිටින බව ඔහුට මොහොතකට අමතක වී තිබිණි. එය ඔහුට දැඩි වරදකාරී හැඟීමක් ඇති කිරීමට සමත් විය.

''අපි ටාටරස් ප්‍රශ්නය පස්සෙ විසඳගමු.'' ඔහු පැවසුවේය. ''මේකද එම්මානුවෙල් ගොඩනැගිල්ල?''

ලියෝ හිස සැලුවේය. ''බැචස් පිටිපස්සෙ තියෙන රථ ගාලක් ගැන මොනවහරි කිව්වනෙ? මේ තියෙන්නෙ ඒක. දැන් මොකද කරන්නෙ?''

පර්සිට තමා සිහිනයෙන් දුටු අඳුරු කුටිය සිහිපත් විය. ස්වාමිදුව ලෙස හැඳින්වූ රාක්ෂයාගේ දුෂ්ට හඬ සිහිපත් විය. සම්ටාර් කොටුවේදී මකුළුවන් හමු වූ පසු ඇනබෙත් කෙතරම් බියට පත් වී සිටියා දැයි ඔහුට සිහිපත් විය. පහළ දේවස්ථානයේ කුමක් තිබිය හැකි දැයි පර්සි සැක කළේය... පැවසෙන ආකාරයට නම් ඇය සියලු මකුළුවන් මව යි. ඔහු නිවැරදි නම් ඇනබෙත් පැය ගණනක් එහි සිරවී සිටිනවා විය හැකිය... ඇගේ පාදය බිඳී ඇත. මේ මොහොතේදී ඇගේ ගවේෂණය තනිව සිදු කළ යුතුය ද නැද්ද යන්න ගැන ඔහු නොසිතුවේය.

''අපි එයාව එළියට ගන්න ඕනෙ.'' ඔහු පැවසුවේය.

''හොඳයි, ඔව්.'' ලියෝ එකඟ විය. ''ඒත්...''

එහෙත් ඔහුට පැවසීමට වුවමනා වූයේ වෙනත් දෙයක් බව පෙනිණි. *අපි ප්‍රමාද වැඩිනම් මොකද කරන්නේ?*

නුවණක්කාර ලෙස ඔහු කථාව වෙනස් කළේය. ''මෙතන රථ ගාලක් තියෙනවා.''

පර්සි කෝච් හෙජ් දෙස බැලුවේය. ''බැචස් බිඳගෙන යන දෙයක් ගැන කිව්වා. කෝච් ඔයා ළඟ මේ බැලිස්ටාවට තවම උණ්ඩ තියෙනවද?''

නරාශ්වයා කැලෑ එළුවකු සේ විරිත්තුවේය. ''මම හිතුවෙ ඔයා කවදාවත් අහන එකක් නෑ කියලා.''

# 49
# ඇනබෙත්

**ඇනබෙත් ඇගේ ත්‍රාසයේ උපරිම සීමාවට පැමිණ තිබුණාය.**

ඇය ස්වෝත්තමවාදී භූතයන්ගේ ප්‍රහාරයට ලක්ව සිටියාය. ඇගේ වළලුකර බිඳී තිබිණි. ඇය පොළෝ කුහරයේදී මකුළු හමුදාවේ ලුහුබැඳීමට ලක්වූවාය. දැන්, වේදනාවෙන් මිරිකෙමින්, ලී පතුරු තබා බුබුළු දවටනවලින් ඔතාගත් වළලුකර සමඟ, කිණිස්ස හැර වෙනත් ආයුධයක් නොමැතිව, ඇයව මරා දමා, අනුස්මරණීය ගෙත්තම් තිරයක් සෑදීමට අවශ්‍යව සිටින ඇරැක්නී නැමැති අර්ධ මකුළු රාක්ෂියට මුහුණ දී සිටියාය.

ගෙවුණු පැය කීපයේදී, ඇනබෙත් වෙව්ලුවාය, දහදිය වැගිරුවාය. බියෙන් හැඬුවාය. *හරි, සමාවෙන්න. දැන් මම බයවෙලා ඉන්න තරමට වඩා මට බයවෙන්න බැහැ* වැනි දෙයක් ඇගේ සිත පැවසුවේය.

එබැවින් ඒ වෙනුවට ඇනබෙත් සිතන්නට පටන් ගත්තාය.

රාක්ෂමය සත්ත්වයා මකුළු දැලින් වැසී ගිය ප්‍රතිමාව මුදුනේ සිට පහළට බැස්සාය. ඇය සතුටින් පිඹිමින් මකුළු හූයෙන් හුය පහළට බසින විට ඇගේ දෑස් අඳුරේ දිලිසිණි. එක්කෝ ඇයට හදිසියක් නොතිබිණි. නැත්නම් ඇය මන්දගාමී එකියක වූවාය.

ඇය මන්දගාමී එකියක වනු ඇතැයි ඇනබෙත් අපේක්ෂා කළාය.

එහි ගැටලුවක් නොතිබිණි. ඇනබෙත් දිව යාමට හැකි තත්ත්වයක නොසිටියාය. එසේම ඇය සටනකට සුදුසු අවස්ථාවක නොසිටියාය. ඇරැක්නි රාත්තල් සියයක් පමණ බර බව පෙනිණි. ඒ කටු සහිත පාද ගොදුරක් අල්ලාගෙන මරා දැමීමට කදිමට සැකසී තිබිණි. අනෙක් අතට ඇරැක්නිට විෂ සහිත දෂ්ඨනය, පැරණි ග්‍රීක මකුළු මිනිසා මෙන් මකුළු දැල් විදීමේ හැකියාව වැනි තවත් භයානක හැකියාවක් තිබුණු බව පෙනී ගියේය.

නෑ. පිළිතුර සටන් කිරීමේ නොවේ.

එයට යොදාගත යුත්තේ කපටිකම සහ මොළයයි.

පැරණි පුරාවෘත්තවල සඳහන් වූයේ ඇරැක්නි අහංකාරය හේතුවෙන් ප්‍රශ්නයක් ඇති කර ගත් බවය. ඇය තම ගෙත්තම් තිර ඇතීනාගේ ඒවාට වඩා උසස් යැයි පුරසාරම් දෙඩුවාය. ඒ ඔලිම්පස් කන්දේ පළමු රියැලිටි ටී.වී වැඩසටහනකදීය. *එහෙනම් නුඹ හිතන්නේ නුඹට දෙවඟනටත් වඩා හොඳට වියන්න පුළුවන් කියලද?* ඇරැක්නි විශාල පරාජයක් ලැබුවාය.

අහංකාර වීම ගැන යමක් ඇනබෙත් දැන සිටියාය. එය ඇයගේද මාරාන්තික දුර්වලතාවයක් විය. හැමදේම තනිව කළ නොහැකි බව ඇය නිතරම තමාටම සිහිපත් කර ගත්තාය. සෑම කාර්යයක් සඳහාම ඇය නිතරම හොඳම කෙනා නොවීය. සමහර අවස්ථාවල ඇයට තිබුණේ පටු දෘෂ්ඨියකි. එසේම අන් අයගේ, පර්සිගේ පවා, අවශ්‍යතා මොනවද යන්න ඇය අමතක කළාය. එසේම ඇගේ ප්‍රියතම විෂයයන් ගැන කතා කරද්දී ඇය පහසුවෙන් වික්ෂිප්ත කිරීමට හැකි විය.

එහෙත් ඒ දුර්වලතා මකුළුවකුට එරෙහිව පාවිච්චි කිරීමට ඇයට හැකිවෙයිද? සමහරවිට ඇයට කාලය නතර කර ගැනීමට හැකි වුහොත්... එසේ වුවත් එයින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ කෙසේදැයි ඇයට විශ්වාසයක් නොතිබිණි. ඇගේ මිතුරන්ට ඔවුන් කොහේ යා යුතුදැයි දැන සිටියත්, ඇය වෙත ළං වීමට නොහැකි වනු ඇත. සන්නද්ධ බලකාය නොඑනු ඇත. තවමත් කල් ගැනීම මිය යනවාට වඩා හොඳය.

බිඳුණු පාදය සමඟ පහසු කටයුත්තක් නොවුණත්, ඇය තම ඉරියව් සන්සුන්ව තබා ගැනීමට උත්සාහ කළාය. ඇය සමීපයේ පිහිටි පැරණි රෝම නගරය දක්වෙන ගෙත්තම් තිරයක් ළඟට ගැටුවාය.

''හරිම අපූරුයි.'' ඇය පැවසුවාය. ''මට මේ ගෙත්තම් තිරය ගැන කියනවද?''

ඇරැක්නිගේ තොල් ඇගේ අධෝහණුවට ඉහළින් වක් විය. ''ඇයි නුඹ ඒ ගැන හිතන්නෙ? උඹ මැරෙන්න ඉන්නෙ.''

''හොඳයි, ඔව්.'' ඇනබෙත් පැවසුවාය. ''ඒත් ඔයා ආලෝකය ග්‍රහණය කරගෙන තියෙන විදිහ අපූරුයි. ඔයා හිරු කිරණ වලට යොදාගෙන තියෙන්නෙ ඇත්තම රන් කෙඳි ද?''

වියමන සැබැවින්ම අලංකාර විය. ඇනබෙත් එය අගය කළේ බොරුවට නොවේ.

ඇරැක්නි තෘප්තිමත් සිනාවක් නැගුවාය. ''නෑ, දරුවා, රත්‍රන් නෙමෙයි. මම වර්ණ මිශ්‍ර කළා, තද කහ පාටයි තද පාටවලුයි. ඒකෙන් තමයි මේ ත්‍රිමාණ පෙනීම ඇවිත් තියෙන්නෙ.''

''ලස්සනයි.'' ඇනබෙත්ගේ මනස එකිනෙකට වෙනස් මට්ටම් දෙකකට බෙදී ගියේය. එක් කොටසකින් සංවාදය කරගෙන ගිය අතර, අනික් කොටසින් පණ බේරා ගැනීමේ ක්‍රමයක් සොයන්නට විය. එහෙත් ඇයට කිසිදු අදහසක් නොලැබිණි. ඇරැක්නිව පරාජය කර තිබුණේ එක් වරක් පමණි. ඒ ඇතීනා විසිනි. ඒ දිව්‍යමය මායාවක් සහ විවීමේ තරගයක ඇදහිය නොහැකි කුසලතාවද සමඟිනි. ''එහෙනම්...'' ඇය පැවසුවාය. ''ඔයා මේ දර්ශනය හැබෑවට දැකල තියෙනවද?''

ඇරැක්නි පිම්බාය. ඇගේ මුවින් එතරම් සිත් නොගන්නා සුළු අයුරකින් පෙන වැගිරුණේය. ''උඹ උත්සාහ කරන්නෙ උඹගේ මරණය ප්‍රමාද කර ගැනීමට. ඒකෙන් වැඩක් වෙන එකක් නැහැ.''

''නෑ, නෑ.'' ඇනබෙත් එරෙහි වූවාය. ''මෙච්චර ලස්සන ගෙත්තමක් හැමෝටම දකින්න බැරිවීම ලැජ්ජාවක් වගේ පේන්නෙ. මේක කෞතුකාගාරෙකට අයිති වුණා නම්, එහෙම නැත්නම්.''

''නැත්නම් මොකක්ද?'' ඇරැක්නි විමසුවාය.

හොඳින් නිර්මාණය වූ උමතු අදහසක් ඇනබෙත්ගේ සිතට ඇතුළු විය. හරියට ඇගේ මව සියුස්ගේ ලී භාජනයෙන් පැන්නාක් මෙනි. එහෙත් ඇයට එය සාර්ථක කර ගැනීමට හැකි වෙයිද?

''මොකුත් නෑ.'' ඇය උකටලීව සුසුමක් හෙලුවාය. ''ඒක මෝඩ සිතුවිල්ලක්. අන්තිම නරකයි.''

දෙවඟනගේ පලිහ මුදුනට එන තෙක් ඇරැක්නි ප්‍රතිමාවේ පහළට ගැටුවාය. එතරම් දුරින් සිට වුවද, ඇනබෙත්ට බේකරියක මාස ගණනක් නරක් වූ පේස්ට්‍රි සේ මකුළුවාගේ ගඳ දැනිණි.

''මොකක්ද?'' මකුළුවා දැඩි හඬින් විමසුවාය. ''මොකක්ද මෝඩ සිතිවිල්ල?''

ආපසු පලා යාම ඇනබෙත් ආයාසයෙන් වළකා ගත්තාය. බිඳුණු පාදය හෝ ඇගේ සිරුරේ බියෙන් කම්පනයට පත් සියලු ස්නායු ඇයට පවසා සිටියේ ඇයට ඉහළින් සක්මන් කරන දැවැන්ත මකුළුවාගෙන් පළා යන ලෙසය.

''ඕහ්... ඒක මේ... මම ඔලිම්පස් කන්දේ ප්‍රතිසැලසුම් ප්‍රධානියා විදිහට පත් කළා.'' ඇය පැවසුවාය. ''ඔයා දන්නවද, ටයිටන් යුද්දයෙන් පස්සෙ: මට ඉවර කරන්න වැඩගොඩක් තිබුණා. ඒත් අපිට ඉහළ තත්ත්වයේ සිතුවම් ඕනෙ වෙලා තිබුණා. උදාහරණයක් විදිහට දෙවියන්ගේ රාජකීය ශාලාවට... මම හිතන්නෙ ඔයාගෙ වැඩ එතන ප්‍රදර්ශනයට නියමෙට ගැලපෙනවා. අන්තිමට ඔලිම්පියානුවෝ දකියි ඔයා කොච්චර දක්ෂද කියලා. මම කිව්ව වගේම ඒක මෝඩ සිතුවිල්ලක්.''

ඇරැක්නිගේ ලෝම පිරුණු උදරය පිම්බිණි. ඇගේ ඇස් හතර දිලිසුණේ එක් එක් ඇස පිටුපස ඇති වූ වෙනස් සිතිවිලි එකම ජාලයකට ගැනීමට උත්සාහ කරන්නක් මෙනි.

''ඔයා ඔලිස්පස් කන්ද ප්‍රතිසැලසුම් කරනවා.'' ඇය පැවසුවාය. ''මගේ වැඩ... රාජකීය කාමරයට?''

''ඔව්, අනෙක් තැන් වලටත්.'' ඇනබෙත් පැවසුවාය. ''ප්‍රධාන මණ්ඩපයට මේවයින් කීපයක් පාවිච්චි කරන්න පුළුවන්. අර ග්‍රීක භූ දර්ශනය තියෙන එක -කාව්‍ය දෙවඟනන් නවදෙනා - ඒකට කැමති වෙයි. මට හොඳටම විශ්වාසයි අනෙක් දෙවිවරු ඔයාගෙ නිර්මාණවලට රණ්ඩු වෙයි කියලා. ඔයාගෙ ගෙත්තම් තිර එයාලගෙ මාලිගාවලට ගන්න එයාල තරග කරයි. මම හිතනවා, ඇතීනා හැරුණු විට, වෙන කිසිම දෙවි කෙනෙක් ඔයාගෙ නිර්මාණ දැකල නැතුව ඇති කියලා.''

ඇරැක්නි තම හණු එකට තද කළාය. ''මමත් හිතන්නේ නෑ, ඒ දවස්වල ඇතීන මගේ හොඳම නිර්මාණ ඉරල දැම්මා. මගේ නිර්මාණවලින් දෙවිවරු නිරූපණය වුණේ එච්චරටම ප්‍රශංසනීය ආකාරයට නෙමෙයි. ඔයාටම පේනවනෙ. ඔයාගෙ අම්මා ඒක පිළිගත්තෙ නැහැ.''

''තරමක කුහකකමක්.'' ඇනබෙත් පැවසුවාය. ''හැමදාම දෙවිවරු එකිනෙකා සමඟ විනෝද වුණා. මම හිතන්නෙ උපක්‍රමය වුණේ එක දෙවියෙක් අනෙකාට එරෙහි වීම. උදාහරණයක් විදිහට

ඒරිස්[1], ගෙත්තම් තිරවලට ප්‍රිය කිරීම මගෙ අම්මාට විනෝදයක් වුණා. ඔහු නිතරම ඇතීනව අප්‍රිය කළා.''

ඇරැක්නිගේ හිස අසාමාන්‍ය තරමට ඇල විය. ''ඔයා ඔයාගෙම අම්මට එරෙහිවද වැඩ කරන්නෙ?''

''මම ඔයාට කිව්වෙ ඒරිස් මොනවට කැමති වෙයිද කියල විතරයි.'' ඇනබෙත් පැවසුවාය. ''ඒ වගේම සියුස්, පොසිඩන්ව විනෝදයට පත් කරන දෙයකට කැමති වෙයි. ඕන්, ඔලිම්පියානුවො ඔයාගෙ නිර්මාණ දැක්කොත්, ඔයා කොච්චර පුදුම කෙනෙක්ද කියල අවබෝධ කරගන්න බව මට විශ්වාසයි. ඒ වගේම ලංසු තැබීමේ යුද්ධයෙදී මම තැරැව්කාරියක් වෙලා හිටියා. මගේ අම්මට එරෙහිව වැඩ කරන්න තියෙනවනම්, ඇයි මම එහෙම නොකරන්නෙ? එයා මාව මැරෙන්න මෙහාට එව්වා. නිව්යෝර්ක්වලදී මම ඇයව දැකපු අන්තිම වතාවෙදි, ඇය මාව සහමුලින්ම අතහැරියා.''

ඇනබෙත් ඇගේ කතාව පැවසුවාය. ඇය තම දුක සහ කනස්සල්ල බෙදා ගත්තාය. එහි ව්‍යාජයක් නොතිබිණි. මකුළුවා කඩා පැන්නේ නැත. ''මේ ඇතීනාගේ ස්වභාවය.'' ඇරැක්නි පිම්බේය. ''එයා එයාගෙම දියණිය පවා ඉවතට දැම්මා. දෙවඟන කවදාවත් මගෙ නිර්මාණ දෙවිවරුන්ගේ මාලිගාවල ප්‍රදර්ශනය කරන්න ඉඩ දුන්නෙ නෑ. එයා නිතරම හිටියෙ මා ගැන ඊර්ෂ්‍යාවෙන්.''

''ඒත් හිතන්න, ඔයාට පුළුවන්නම් අන්තිමේදි පළිය ගන්න.''

''ඔයාව මරා දැමීමෙන්.''

''මම හිතනවා.'' ඇනබෙත් ඔලුව කැසුවාය. ''නැත්නම්... මාව ඔයාගෙ නියෝජිතයෙක් විදිහට යැවීමෙන්. මට පුළුවන් ඔයාගෙ නිර්මාණ ඔලිම්පස් කන්දට අරන් යන්න. මට පුළුවන් අනෙක් දෙවිවරුන් වෙනුවෙන් ප්‍රදර්ශනයක් ලෑස්ති කරන්න. මගෙ අම්ම ඒක දැනගන්න කොට, ප්‍රමාද වැඩියි. අන්තිමේදි ඔපිම්පියානුවන්ට පෙනෙයි ඔයාගෙ නිර්මාණ තමයි හොඳම කියලා.''

''එහෙනම් ඔයා ඒක පිළිගන්නවා.'' ඇරැක්නි කෑ ගැසුවාය. ''ඇතීනාගේ දියණිය පිළිගත්තා මම තමයි හොඳම කියලා! ඕන්, ඒක මගෙ කන්වලට මිහිරක්.''

1 යුද්ධයට අධිපති ග්‍රීක දෙවිඳුන්ය. සියුස්ගේ සහ හේරාගේ පුත්‍රයා වන අතර, ඇතීනාගේ අර්ධ සොහොයුරාය. රෝම ස්වරූපය මාර්ස් ය.

''ඒත් ඔයා ඒක කළොත් ගොඩක් හොඳයි.'' ඈනබෙත් පැවසුවාය. ''මාව මෙතන මැරුණොත්, ඔයාට අන්ධකාරයේම ජීවත් වෙන්න වෙයි. ගයියා දෙවිවරුන්ව විනාශ කරයි. එතකොට ඔයා තමයි හොඳම වියන්නිය කියල එයාලට කවදාවත් අවබෝධ කරගන්න බැරිවෙයි.''

මකුළුවා පිම්බාය.

තම මව එක්වරම පෙනී සිට තමාට සාප කරනු ඇතැයි ඈනබෙත් බියට පත් වූවාය. ඇතීනාගේ සෑම දරුවකුම මුලින්ම ඉගෙන ගත් පාඩමක් විය. *හැමදේකින්ම හොඳම දේ අම්මාය. ඔබ කිසිවිටෙකත්. කෙදිනකවත් අනෙකක් යෝජනා නොකළ යුතුය.*

එහෙත් කිසිදු නරකක් සිදු නොවීය. සමහරවිට ඈනබෙත් මේවා පවසන්නට ඇත්තේ ඇගේ ජීවිතය බේරා ගැනීමට බව ඇතීනා තේරුම් ගන්නට ඇත. නැතිනම් සමහරවිට ග්‍රීක හා රෝම පෞර්ෂයන් දෙකකට වෙන් වී නරක හැඩයක් ගෙන සිටින ඇයට මේ ගැන අවධානය දැක්වීමටවත් නොහැකිව සිටිනවා විය හැකිය.

''මේක කෙරෙන එකක් නැහැ.'' ඇරැක්නි පැවසුවාය. ''මට ඒකට ඉඩ දෙන්න බැහැ.''

''හොඳයි...'' ඈනබෙත් තම බිඳුණු පාදයට බර නොදී සිටීමට උත්සාහ දරමින් පැවසුවාය. අලුත් බිඳුම් හඬක් පොළොවෙන් නැගී ආ අතර ඇය පසුපසට විසිවූවාය.

''ප්‍රවේසමෙන්.'' ඇරැක්නි පැවසුවාය. ''මේ දේවස්ථානයේ අත්තිවාරම් සියවස් ගාණක් තිස්සේ කා දමල තියෙන්නේ.''

ඈනබෙත්ගේ හද ගැස්ම නැවතිණි. ''කා දමල?''

''අපිට යටින් කොයිතරම් වෛරයක් කැකෑරෙනවද කියන එක ඔයාට හිතා ගන්නවත් බැහැ.'' මකුළුවා පැවසුවාය. ''ඊර්ෂ්‍යාසහගත සිතුවිලි පිරුණු රාක්ෂයෝ බොහෝ දෙනෙක් ඇතීනා පාතිනන්වලට ළං වෙලා ඒක විනාශ කරන්න උත්සාහ කරනවා. මේ කාමරය එකට එකතු කරල තියාගෙන ඉන්න එකම දේ මගේ වියමන් විතරයි, කෙල්ලේ! එක වැරදි පියවරකින්, ඔයාව ටාටරස් වලට යන මාර්ගයට ඇද වැටෙයි. මාව විශ්වාස කරන්න, මරණයේ දොරටු වගේ නෙමෙයි, මේක එක මඟක ගමනක් වෙයි, හරිම දැඩි ඇද වැටීමක්. මගෙ අත්කම් ගැන ඔයාගෙ සැලසුම කියන්න කළින් මම ඔයාට මැරෙන්න දෙන එකක් නැහැ.''

ඇනබෙත්ට මලකඩ රසයක් දැනිණි. *ටාටරස් වලට මාර්ගය?*

ඇය අවධානය තබා ගැනීමට උත්සාහ කළත්, ගෙබිමේ බිඳුණු ගල් කැබලි පහළ වූ රික්තයට වැටෙන හඬ ඇසෙද්දී එය පහසු කරුණක් නොවීය. ''හරි, සැලසුම.'' ඇනබෙත් පැවසුවාය. ''ම්... මම කිව්ව විදිහට, මම කැමතියි ඔයාගෙ ගෙත්තම් තිර ඔලිම්පස් වලට අරන් ගිහින් හැමතැනම එල්ලන්න. ඔයාට පුළුවන් සදාකල්ම ඔයාගෙ අත්කම් ශිල්පයෙන් ඇතීනාගේ නහය පිරිමදින්න. ඒත් මට ඒක කරන්න පුළුවන් එකම එක ක්‍රමය... නෑ. ඒක හරි අමාරුයි. ඔයාට පුළුවන් කිව්ව වගේ මාව මරන්න.''

''නෑ!''ඇරැක්නි කෑ ගැසුවාය. ''ඒක පිළිගන්න බෑ. තවදුරටත් ඒ ගැන මගෙ සතුටක් නෑ. මට මගෙ අත්කම් ඔලිම්පස් කන්දට ගෙන යන්න ඕනෙ! මම මොනවද කරන්න ඕනෙ?''

ඇනබෙත් හිස සැලුවාය. ''සමාවෙන්න, මම කිසිදෙයක් නොකිය ඉන්නයි තිබුණෙ. මාව ඔය ටාටරස් හරි මොකක් හරි එකට තල්ලු කරල දාන්න.''

''මම ප්‍රතික්ෂේප කරනවා.''

''විහිලුවක් වෙන්න එපාඃ මාව මරන්න.''

''මම ඔයාගෙන් නියෝග ගන්නෙ නෑ!'' මට කියන්න මම මොනවද කරන්න ඕනෙ! නැත්නම්... නැත්නම්.''

''නැත්නම් ඔයා මාව මරයිනෙ?''

''ඔව්! නෑ!'' මකුළුවා ඇගේ ඉදිරි ගාත් තම හිස මත තැබුවාය. ''මම මගේ අත්කම් ඔලිම්පස් කන්දට පෙන්විය යුතුයි.''

ඇනබෙත් ඇගේ තැතිගැන්ම සඟවා ගැනීමට උත්සාහ කළාය. ඇගේ සැලසුම සැබැවින්ම වැඩ කරනු ඇති බව පෙනී ගියේය... එහෙත් ඇය තවමත් ඇරැක්නිට කළ නොහැකි යමක් ඒත්තු ගැන්විය යුතුය. ෆ්‍රැන්ක් ෂැන්ග් ඇයට ලබා දුන් හොඳ උපදේශයක් ඇගේ මතකයට නැගිණි. *ඒක සරලව ගන්න.*

''මම හිතනවා, මට කෙඳි ටිකක් ඇදගන්න පුළුවන් වෙයි කියලා.'' ඇය පැවසුවාය.

''මම කෙඳි ඇදීමේ විශිෂ්ටයෙක්.'' ඇරැක්නි පැවසුවාය. ''මම මකුළුවෙක්!''

''ඔව්, ඒත් ඔයාගෙ නිර්මාණ ඔලිම්පස් කන්දට ගෙනියන්න, අපිට හොඳ කුසලතා පරීක්ෂණයක් ඕනෙ වෙනවා. මම සැලසුමයි, යෝජනාවයි එකතු කරලා ලිපි ගොනුවක් හදන්න ඕනෙ. හ්ම්ම්... ඔයා ළඟ මොනවහරි වැදගත් දෙයක් තියෙනවද?''

''වැදගත් දෙයක්?''

''ආහ්, එච්චර හිතන්න එපා. කුසලතා පරීක්ෂණය ඉතාම වැදගත් දෙයක්. මේ ගෙත්තම් තිර අති විශිෂ්ටයි. ඒත් දෙවිවරුන්ට මොනවහරි ඇත්තටම විශේෂ දෙයක් ඕනෙ වෙයි, ඔයා අතිශය දක්ෂයෙක් කියල පෙන්වන්න.''

ඇරැක්නි ගෙරවූවාය. ''ඔයා කියන්නෙ මේවා මගෙ හොඳම නිර්මාණ නෙමෙයි කියලද? ඔයා මට තරගයකට අභියෝග කරනවද?''

''අපොයි නැහැ.'' ඇනබෙත් සිනාසුණාය. ''මාත් එක්ක? නෑ. ඔයා ඊට වැඩිය ගොඩක් හොඳයි. ඒක ඔයත් එක්කම තියෙන තරගයක් විතරයි. ඔයා ඔලිම්පස් කන්දෙදි පෙන්වන දේ මොකක්ද කියල ඇත්තටම බලාගන්න.''

''ඇත්තවශයෙන්ම මම කරනවා.''

''හොඳයි, නිසැකවම එහෙම හිතනවා. ඒත් කුසලතා පරීක්ෂණය, ඔයා දන්නවද, ඒක චාරිත්‍රයක්. මට කනගාටුයි ඒක ගොඩක් අමාරු වෙයි. ඔයාට විශ්වාසද ඔයාට මාව මරන්න ඕනෙ නැහැ කියලා.''

''ඔය කියවිල්ල නවත්වන්න.'' ඇරැක්නි ගිගිරුවාය. ''මම මොකක්ද නිර්මාණය කරන්න ඕනෙ?''

''මම ඔයාට පෙන්වන්නම්.'' ඇනබෙත් ඇගේ ගමන් මල්ල විවර කළාය. ඩායිඩාලුස්ගේ පරිගණකය අතට ගත් ඇය එය විවෘත කළාය. ඩෙල්ටා සලකුණ අඳුරේ දිලිසිණි.

''ඒ මොකක්ද?'' ඇරැක්නි විමසුවාය. ''යම් ආකාරයක වියන යන්ත්‍රයක්ද?''

''එක විදිහකට.'' ඇනබෙත් පැවසුවාය. ''ඒක තියෙන්නෙ විවීමේ අදහස් ගන්න. ඔයා නිර්මාණය කළ යුතු රූප සටහන තමයි ඒකෙ තියෙන්නෙ.''

ඇගේ අතැඟිලි යතුරු පුවරුව මත දිව ගියේය. ඇරැක්නි පහළට පැමිණ ඇනබෙත්ගේ උරහිස් වලට උඩින් එබීගෙන සිටියාය.

ඉඳිකටුවැනි ඒ දත්වලට ඇගේ ගෙල කෙතරම් පහසුවෙන් සිදුරු කළ හැකිද්දැයි යන්න ඇනබෙත්ට නොසිතා සිටීමට නොහැකි විය.

ඇය ත්‍රිමාණ රූප සකසන වැඩසටහන විවෘත කළාය. ඇගේ අවසන් සැලසුම තවමත් එහි දක්නට ලැබිණි. එය ඇනබෙත්ගේ සැලසුමේ ප්‍රධාන තුරුම්පුව විය.

ඇනබෙත් ඉක්මන් ගණනය කිරීම් කීපයක් සිදු කළාය. ඇය ආකෘතියේ පරිමාණය වැඩි කළ අතර, එවිට ඇරැක්නිට එය නිර්මාණය කළ යුත්තේ කෙසේදැයි පෙන්නුම් කෙරිණි. ද්‍රව්‍යයේ කෙඳි තීරු ලෙස වියා තිබූ අතර ඉන්පසු එය දිගු සිලින්ඩරයක් ලෙස ගෙත්තම් කර තිබුණේය.

තිරයේ රන්වන් පැහැයෙන් මකුළුවාගේ මුහුණ දිලිසිණි. ''ඔයාට ඕනෙ මම මේක නිර්මාණය කරන්නද? ඒත් මේක මහ ලොකු දෙයක් නෙමෙයි. බොහොම පුංචියි. සරලයි.''

''නියම ප්‍රමාණය ගොඩක් විශාල වෙයි.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයාට මේ මිනුම් පේනවද? ස්වභාවිකවම ඒක දෙවියන්ව පුදුම කරවන තරමට විශාල වෙයි. පෙනුමට ඒක සරල වෙන්න පුළුවන්, ඒත් මේ ව්‍යුහයේ ඇදහිය නොහැකි ගුණ තියෙනවා. ඔයාගෙ මකුළු සේද තමයි ගැලපෙනම අමුද්‍රව්‍ය- මෘදුයි වගේම නම්‍යශීලියි, තවමත් වානේ තරම් ශක්තිමත්.''

''මට තේරෙනවා...'' ඇරැක්නි මුහුණ හැකිළුවාය. ''ඒත් මේක ගෙත්තම් තිරයක් නෙමෙයි.''

''ඒක නිසාම තමයි මේක අභියෝගයක් වෙන්නෙ.'' ඒක ඔයාට හුරුපුරුදු දෙයින් බැහැර දෙයක්- භාවාත්මත මූර්තියක් තමයි දෙවිවරු සොයන්නෙ. ඒක ඔලිම්පියානුවන්ගෙ රාජකීය ශාලාවෙ පිවිසුම අසල තියන්න පුළුවන්, අමුත්තො හැමෝටම පේන්න. ඔයා සඳහටම ජනප්‍රිය වෙයි.''

ඇරැක්නි ඇගේ උගුරෙන් අසන්තෝෂය හඟවන හඬක් නැඟුවාය. ඇය එම අදහස පිළිනොගත් බව ඇනබෙත් වටහා ගත්තාය. ඇගේ දෑත් සීතල වී දහදිය දමනු දැනිණි.

''මේකට මකුළු දැල් ගොඩක් ඕනෙ වෙයි.'' මකුළුවා මැසිවිලි නැඟුවාය. ''මට අවුරුද්දකට වඩා ගතවෙයි.''

ඇනබෙත් බලාපොරොත්තු වූයේද එයමය. ඇය ඒ අනුව ස්කන්ධය හා විශාලත්වය ගණනය කළාය. ''ඔයාට ප්‍රතිමාව අවුල් ඇරගන්න වෙනවා.'' ඇය පැවසුවාය. ''ඒ කෙඳි පාවිච්චි කරන්න.''

ඇරැකිනි විරෝධය පාන බව පෙනුණත්, එහි ගතයුත්තක් නැතැයි හඟවන්නාක් මෙන් ඇනබෙත් ඇතීනා පාතිනන් දෙස බලා අත වැනුවාය. ''මොකක්ද වඩා වැදගත්- පරණ ප්‍රතිමාවක් වහල තියෙන එකද, ඔයාගෙ නිර්මාණය කරන එකද? ඇත්තවශයෙන්, ඔයාට බෙහොම ප්‍රවේසම් වෙන්න වෙනවා. මේ කාමරය එකතු කරල තියාගන්න ඔයාට මකුළු දැල් ඉතිරි කරගන්න ඕනෙ. ඒ වගේම ඔයා හිතනවනම් ඒක හරිම අමාරුයි කියලා.''

''මම එහෙම කිව්වෙ නෑනෙ.''

''හරි, ඒක නිකං... ඇතීනා කිව්වේ මේ ව්‍යුහය ඕනෑම වියන්නියකට කරන්න බැරිවෙයි කියලා. එයාට පවා. ඉතිං ඔයා හිතනවනම් ඔයාට පුළුවන් කියලා.''

''ඇතීනා එහෙම කිව්වද?''

''ඔව්.''

''විකාර, මට ඒක කරන්න පුළුවන්.''

''විශිෂ්ටයි! ඒත් ඔලිම්පියන්ස්ලා වෙනත් කලාකරුවෙක් එයාලගෙ වැඩවලට තෝර ගන්න කලින්, ඔයාට වැඩේ පටන් ගන්න වෙනවා.''

ඇරැක්නි ගෙරවූවාය. ''ඔයා මාව රවට්ටනවනම්, කෙල්ලෙ.''

''ප්‍රාණ ඇපකරුවෙක් විදිහට ඔයාට මාව මෙතන තියාගන්න පුළුවන්.'' ඇනබෙත් ඇයට සිහිපත් කළාය. ''මට කොහේවත් යන්න බැරි විදිහට. මේ නිර්මාණය සම්පූර්ණ කළාට පස්සෙ, ඒක ඔයා අතින් මෙතෙක් නිර්මාණය වුණ හොඳම එක බව ඔයාටත් පිළිනොගෙන ඉන්න බැරි වෙයි. එහෙම නොවුණොත්, මම මැරෙන්න ලෑස්තියි.''

ඇරැක්නි හැකිළුණාය. ''අපූරුයි.'' ඇය පැවසුවාය. ''මටම එරෙහිව අවසන් අභියෝගය.''

දැලට නැගුණු ඇරැක්නි ඇතීනා පාතිනන් වසා තිබූ මකුළු දැල් ලිහන්නට පටන් ගත්තාය.

# 50
# ඇනබෙත්

**ඇනබෙත්ට කාලයේ සලකුණු අහිමි විය.**

තම පාදයට ප්‍රතිකාර කරද්දී, තමා ආහාරයට ගත් අමෘතයේ රසය ඇයට දැනුණත්, එහි වේදනාව තවමත් දැනෙමින් එය ඇගේ ගෙල දක්වාම පැතිර යමින් තිබිණි. හතරවටේ, බිත්ති පුරාම අන්ධකාරය තුළ කුඩා මකුළුවෝ ඇදෙමින් සිටියේ ඔවුන්ගේ ස්වාමි දුවගේ නියෝග අපේක්ෂාවෙන් මෙනි. ඔවුන් දහස් ගණනක් ගෙත්තම් තිර පිටුපස සක්මන් කරන විට, ගෙත්තම් තිර සුළඟට සැලෙන්නාක් මෙන් ලෙල දුණි.

කැබලි වූ පොළොව මත හිඳගත් ඇනබෙත්, ඇගේ ශක්තිය ඉතිරි කර ගැනීමට උත්සාහ කළාය. ඇරැක්නි ඇය දෙස නොබලන මොහොතේ, තම මිතුරන් සම්බන්ධ කර ගැනීමට ඩායිඩාලුස්ගේ පරිගණකයෙන් යම් සංඥාවක් යැවීමට ඇය උත්සාහ කළත් එය සාර්ථක වූයේ නැත. එබැවින් පුදුමය හා බිය මිශ්‍ර දෑසින් ඇරැක්නිගේ කාර්යය දෙස බලා සිටිනු හැර ඇයට කළ හැකි අන් යමක් නොතිබිණි. ඇරැක්නීගේ පාද අටම ඇදහිය නොහැකි වේගයෙන් ක්‍රියාත්මක වූ අතර, සෙමින් සෙමින් ප්‍රතිමාව වසාගෙන තිබූ මකුළු දැල් ගැලවී යන්නට විය.

එහි රන් පැහැති ඇඳුම් සහ දිලිසෙන ඇත්දළ මුහුණ නිසා ඇතීනා පාතිනන් ඇරැක්නීටත් වඩා බියකරු පෙනුමක් ගෙන තිබිණි. ඇගේ බැල්ම පහතට යොමු වී තිබුණේ: *මට රසවත් පානයක් හෝ*

වෙනත් දෙයක් ගෙන එනු. වැනි යමක් පවසන්නාක් මෙනි. පැරණි ග්‍රීසියේ මිනිසුන් පාතිනන් වෙත ගොස් මේ දැවැන්ත ප්‍රතිමාව දකින අයුරු ඇයට මැවී පෙනිණි. ඕනෑම මනුෂ්‍යයකු බියපත් කිරීමට එහි පෙනුම ප්‍රමාණවත් විය.

ඊටත් වඩා, ප්‍රතිමාව බලය පැතිරවීය. ඇතීනාගේ මකුළු දැල් ගැලවී යත්ම, ඇය අවට වාතය උණුසුම් වන්නට විය. ඇගේ ඇත්දළ සම ජීවයෙන් දිලිසෙන්නට විය. කාමරය පුරා සිටි කුඩා මකුළුවෝ ඇවිස්සෙන්නට වූ අතර ඔවුහු ආපසු කොරිඩෝව දෙසට ගියහ.

ඇරැක්නීගේ මකුළු දැල්වලින් ප්‍රතිමාවේ බලය මේ ආකාරයකින් ආවරණය කර තිබූ බව ඇනබෙත් අනුමාන කළාය. දැන් එය නිදහස් ය. ඇතීනා පාතිනන් ඉන්ද්‍රජාලික ශක්තියකින් කුටිය පිරවූවාය. සියවස් ගණනක මනුෂ්‍ය බැතිමතුන්ගෙන් පුද පූජාවන්ගෙන් එහි පෙනුම සැදී තිබිණි. එය වැඩියෙන් අවධානය දිනා ගනු ඇත.

''ඔය නිර්මාණය.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයා ඉක්මන් කරන්න ඕනෙ.''

ඇය ඇරැක්නීට සැලසුම දැක ගත හැකි වන පරිදි පරිගණකයේ තිරය එසවුවත්, ඇරැක්නි බාධා කළාය. ''මම ඒක මතක තියාගත්තා, ළමයෝ. මට විස්තර මතක තියාගන්න පුළුවන් කලාත්මක ඇහැක් තියෙනවා.''

''ඇත්තවශයෙන්ම ඔයාට පුළුවන්. ඒත් අපි ඉක්මන් කළ යුතුයි.''

''ඇයි?''

''එතකොට අපිට ඔයාගෙ නිර්මාණය ලෝකෙට හඳුන්වලා දෙන්න පුළුවන්නෙ.''

''හ්ම්. බොහොම හොඳයි.''

ඇරැක්නි විවීම පටන් ගත්තාය. සේද කෙඳි දිගු තීරු රෙද්දක් බවට හැරවීම සෙමින් සිදුවන කාර්යයක් විය. කුටිය දෙදරන්න විය. ඇනබෙත්ගේ දෙපා අසල වූ පැලුම් පුළුල් වන්නට විය.

එය ඇරැක්නිගේ අවධානයට ලක්වුවත්, ඇය එය ගණන් ගත් බවක් නෙපෙනුණි. කෙසේ හෝ මකුළුවා වලකට තල්ලු කර දැමීමට ඇනබෙත් සිතුවත්, ඇය ඒ අදහස අතහැර දැමුවාය. එතරම් විශාල සිදුරක් එහි නොතිබුණ අතර අනෙක් අතට ඇරැක්නිට ඇගේ

මකුළු දැල්වල එල්ලී පලායාමට හැකියාව තිබිණි. ඒ අතර ඇනබෙත්ට සහ ප්‍රතිමාවට ටාටරස් වෙත ගැටීමට සිදුවනු ඇත.

සෙමින් සෙමින් දිගු තීරු වියා නිම කළ ඇරැක්නි, ඒවා එකට විවීමට පටන් ගත්තාය. ඇගේ කුසලතාව අද්විතීය විය. ඇනබෙත්ට ඒ ගැන පුදුම නොවී සිටීමට නොහැකි විය. ඇයට තම මව ගැන ඇති වූයේද සැකයකි. *ඇරැක්නි, ඇතීනාට වඩා හොඳ වියන්නියක වූවා නම් කුමක් වනු ඇතිද?*

එහෙත් ගැටලුව තිබුණේ ඇරැක්නිගේ කුසලතාවයේ නොවේ. ඇය දඬුවමට ලක් වූයේ ඇගේ අහංකාරය සහ කෲරත්වය නිසාය. යමෙකු දෙවියන්ට නිග්‍රහ කරන්නේ නම් ඔහුගේ හෝ ඇයගේ අද්විතීය බවින් පලක් වන්නේ නැත. යමෙකු ඔබට වඩා සැමවිටම හොඳ බවත් එබැවින් 'අලි ඔලුවෙන්' නොසිටිය යුතු බවත් ඔලිම්පියානුවෝ සිහිපත් කර සිටිති. ඒ රාක්‍ෂමය අමරණීය මකුළුවකු බවට පත් වීම කුරිරු දඬුවමක් බව පෙන්වමිනි.

කෙඳි එකට එකතු කරමින් ඇරැක්නි, වඩා වේගයෙන් වැඩ කරමින් සිටියාය. ඉක්මනින්ම, ව්‍යුහය අවසන් විය. ප්‍රතිමාවේ පාමුල වැතිරී වැතිරී තිබුණේ සේද පටිවලින් ගෙත්තම් කරන ලද සිලින්ඩරයකි. අඩි පහක විෂ්කම්භයෙන් යුත් එය අඩි දහයක පමණ දිගින් යුක්ත විය. එහි මතුපිට මුහුදු බෙලි කටුවක් මෙන් දිලිසුණත්, ඇනබෙත්ට එහි අලංකාරයක් නොපෙනුණි. එය හුදෙක් ඇතීනාගේ බලය සිතට කා වැද්දීමක් විය.

එය අරැක්නිගේ අවධානයට ලක් වූ බවක් නොපෙනුණි. ඇය තමාටම මුමුණාගනිමින්, කෙඳි යාර ගණිමින්, තම ව්‍යාපෘතියට අවශ්‍ය කෙඳි ප්‍රමාණය ගණනය කරමින් සිටියාය. ඇය හැකිළුණ වාරයක් පාසා ඇනබෙත් ඇයව දිරිමත් කළ අතර, ඔලිම්පස් කන්දේදී ඇගේ ගෙත්තම් තිර දර්ශනය වීම කෙතරම් පුදුම සහගත වනු ඇද්දැයි සිහිපත් කළාය.

ප්‍රතිමාව තව තවත් උණුසුම් වෙමින් ඇනබෙත්ට දේවස්ථානය තුළ තව විස්තරාත්මකව දැක ගත හැකි තරමට දීප්තිය වැඩි විය. එහි රෝම බදාම කළෙක සුදු පැහැයෙන් තිබෙන්නට ඇත. ඇරැක්නිගේ අතීත ගොදුරුවල ඇටකටු යැයි සිතිය හැකි අස්ථි මකුළු දැල්වල රැඳී තිබිණි. දවැන්ත මකුළු දැල් රැහැන් පොළොවේ සිට සිවිලිමට සම්බන්ධ වී තිබිණි. තමා පය තබා සිටින පොළොව කෙතරම් බිඳෙන සුළු දැයි දැන් ඇනබෙත්ට දැක ගැනීමට හැකි විය. බිඳුණු කණ්ණාඩියක් දැලකින් එකට රඳවා තබන්නාක් මෙන් ගෙබිම ද අපූරු මකුළු දැල් තට්ටුවකින් වැසී

තිබුණේය. ඇතීනා පාතිනන් යාන්තමින් හෝ සෙලවෙන සෑමවිටෙකම, පැලුම් තවත් වැඩිවෙමින් පොළොවේ විවර තවත් පුළුල් විය. සමහර තැන්වල මනුබිල් පියන් තරම් විශාල සිදුරු දක්නට ලැබිණි. කාමරය නැවත සම්පූර්ණයෙන් අඳුරු වුවානම් මැනැවැයි ඇනබෙත්ට සිතිණි. ඇගේ සැලසුම සාර්ථක වී, ඇරැක්නිව පරාජය කිරීමට හැකි වුවත් මේ කුටියෙන් පිටවෙන්නේ කෙසේදැයි ඇයට සිතාගත නොහැකි විය.

''ඕනෙ තරම් කෙඳි තියෙනවා.'' ඇරැක්නි මිමිණුවාය. ''මට ගෙත්තම් තිර විස්සක් වුණත් හදන්න පුළුවන්.''

''කරගෙන යන්න.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයා අපූරු වැඩක් කරන්නෙ.''

ඇරැක්නි දිගටම තම කාර්යයේ යෙදුණාය. දිලිසෙන කන්දක් සේ මකුළු දැල් ප්‍රතිමාවේ පාමුල ගොඩ ගැසී තිබිණි. කාමරයේ බිත්ති තවමත් මකුළු දැල්වලින් වැසී තිබිණි. කාමරය එකට රඳවාගෙන තිබූ ආධාරක රැහැන්වලට බාධාවක් නොවීය. එහෙත් ඇතීනා පාතිනන් නිදහස් වී තිබිණි.

*කරුණාකරල අවදි වෙන්න,* ඇනබෙත් ප්‍රතිමාවෙන් අයැද සිටියාය. *අම්මේ, මට උදව් කරන්න.*

කිසිවක් සිදු නොවුණත්, ගෙබිම පුරා වූ පැළුම් තවත් වේගයෙන් පැතිරී යන බව පෙනිණි. ඇරැක්නි පැවසූ ආකාරයට, රාක්ෂයන්ගේ දුෂ්ට සිතිවිලි විසින් සියවස් ගණනාවක් පුරා දේවස්ථානයේ අත්තිවාරම් කා දමා තිබුණේය. එය සැබෑවක් නම්, දැන් නිදහස් ව සිටින ඇතීනා පාතිනන්, ටාටරස් හි රාක්ෂයන්ගේ වැඩක් පමණකි. උගුලකි. එය අලංකාර වන්නේ එය වැඩකළොත් පමණි.

ඇරැක්නි ඇය දෙසට හැරී කෑදර සිනාවක් පෑවාය. ''ඉවරයි!'' දැන්, මගේ ත්‍යාගය. ඔයාගෙ පොරොන්දුව ගෙන යන්න පුළුවන් කියල මට ඔප්පු කරන්න.

ඇනබෙත් උගුල අධ්‍යයනය කළාය. ඇය මුහුණ හකුළුවාගෙන, එය වටා යමින් සෑම කෝණයකින්ම වියමන පරීක්ෂා කළාය. ඉන්පසු තම බිඳුණු පාදය ප්‍රවේසම් කර ගනිමින්, පහත් වී, එතුළට දණ ගෑවාය. ඇය එහි මිනුම් හිසේ රඳවාගෙන සිටියාය. ඇයට වැරදි ඇත්නම්, ඇගේ සැලසුමද අසාර්ථක වනු ඇත. එහෙත් ඇය එහි පැති ස්පර්ශ නොකරමින් සේද උමගෙන් ඇතුළට ගැටුවාය. මකුළු දැල ඇලෙන සුළු

වූ නමුත්, එය එසේ විය නොහැකි දෙයක් නොවීය. අනෙක් අන්තයෙන් පිටතට පැමිණි ඇය හිස සැලුවාය.

''ඒකෙ වැරැද්දක් තියෙනවා.'' ඇය පැවසුවාය.

''මොකක්ද?'' ඇරැක්නි කෑ ගැසුවාය. ''ඒක වෙන්න බැහැ! මම අනුගමනය කළේ ඔයාගෙ උපදෙස්.''

''ඇතුළේ.'' ඇනබෙත් පැවසුවාය. ''ඇතුළට ගිහින් ඔයාම බලන්න. හරියටම ඒකෙ මැද- වියමනේ දෝෂයක්.''

ඇරැක්නිගේ මුවින් පෙණ වැගිරිණි. තමාව ඔසවා තදින් තල්ලු කර දමතැයි ඇනබෙත් බියපත් වූවාය. එසේ වුවහොත් ඇයටත් සිදුවන්නේ මකුළු දැලක තවත් ඇට සැකිල්ලක් වීමටය.

ඒ වෙනුවට ඇරැක්නි තම පාද අට නොරිස්සුම් සහගත අයුරින් ලෙලවූවාය. ''මම වැරදි කරන්නෙ නැහැ.''

''ආහ්, ඒක පොඩි දෙයක්.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයාට ඒක හදන්න පුළුවන් වෙයි. ඒත් ඔයාගෙ හොඳම නිර්මාණය මිසක් අඩුපාඩු ඇති දෙයක් මට දෙවියන්ට පෙන්වන්න ඕනෙ නැහැ. බලන්න, ඇතුළට ගිහින් පරීක්ෂා කරන්න. ඔයාට ඒක හදන්න පුළුවන් නම්, අපි ඒක ඔලිම්පියානුවන්ට පෙන්වමු. ඔයා මෙතෙක් හිටපු හොඳම කලාකාරිය වෙයි. සමහරවිට එයාල කලා දෙවඟනන් නව දෙනා ඉවත් කරලා සියලුම කලාවන් පාලනයට ඔයාව කැඳවයි. ඇරැක්නී දෙවඟන... ඔව්, මම ඒ ගැන පුදුම වෙන්නෙ නැහැ.''

''දෙවඟන...'' ඇරැක්නීගේ හුස්ම ගැනීම නැවතිණි. ''ඔව්, ඔව් මම මේ වැරැද්ද හදන්නම්.''

ඇය උමඟ තුළට තම හිස එබුවාය. ''කොහොමද ඒක?''

''හරියටම මැද.'' ඇනබෙත් පැවසුවාය. ''ඉස්සරහට යන්න. එතන ඔයාට නම් ටිකක් ඉඩ මදි වෙයි.''

''මට ප්‍රශ්නයක් නෑ.'' ඇය ඇතුළට වැදුණාය.

ඇනබෙත් බලාපොරොත්තු වූ ආකාරයටම, මකුළුවාගේ උදරයට එය ගැලපිණි. එහෙත් ඒ යාන්තමිණි. ඇය ඇතුළට ගාටද්දී, ගෙත්තම් කළ පටි ඇයට ඉඩදීම සඳහා ප්‍රසාරණය විය. ඇරැක්නි මුළු සිරුරම ඇතුළු කර ගත්තාය.

''මට කිසිම වැරැද්දක් පේන්නෙ නැහැ!'' ඇය පැවසුවාය.

''ඇත්තද?'' ඇනබෙත් පැවසුවාය. ''හොඳයි. ඒක අමුතුයි. එළියට එන්න. මම ආයෙත් සැරයක් බලන්නම්.''

*සත්‍යයේ මොහොත.* ඇරැක්නි නලියමින් පසුපසට ඒමට උත්සාහ කළාය. වියන ලද උමඟ, ඇය වටා හැකිලෙමින්, ඇයව රඳවා ගත්තේය. ඇය දඟලමින් ඉදිරියට යාමට උත්සාහ කළාය. එහෙත් උගුල දැනටමත් ඇගේ උදරයේ ඇලී තිබිණි. ඇයට ඉදිරියටවත්, පිටුපසටවත් යාමට නොහැකි විය. මකුළුවාගේ කටු සහිත පාද වලින් සේද වියමන සිඳුරු වෙතැයි ඇනබෙත් බියපත් වුවත්, ඇරැක්නිගේ පාද ඇගේ සිරුරට තදින් තෙරපී තිබුණු බැවින් ඇයට ඒවා සෙලවිය හැකි වූයේ යාන්තමිණි.

''මොකක්- මොකක්ද මේක?'' ඇය කෑ ගැසුවාය. ''මාව ඇලිලා.''

''ආහ්.'' ඇනබෙත් පැවසුවාය. ''ඔයාට කියන්න අමතක වුණා. මේ කලා කෘතියට කියන්නේ චීන මාංචුව කියලා. අඩුගානෙ ඒකෙ විශාල පිටපතක් කියන්න පුළුවන්. මම ඒකට කියන්නම් චීන මකුළුකුට්ටම කියලා.''

''ද්‍රෝහීකමක්!'' අරැක්නී දඟලමින් පෙරළීමට උත්සාහ කළත්, ඇයව තදින් සිරකරගෙන තිබිණි.

''ඒක පණ රැක ගැනීම පිළිබඳ ප්‍රශ්නයක්.'' ඇනබෙත් නිවැරදි කළාය. ''කොයි විදිහකින් හරි ඔයා මාව මරන්නයි හැදුවේ. මම උදව් කළත් නැතත්, එහෙම නේද?''

''හොඳයි, ඇත්තවශයෙන්ම, උඹ ඇතීනාගේ දරුවෙක්.'' උගුල නිශ්චල විය. ''මම අදහස් කළේ... නෑ, ඇත්තටම නෑ! මම මගේ පොරොන්දුව රකිනවා.''

''ආහ්.'' ඇනබෙත් පසුපසට පියවර තබත්ම, සිලින්ඩරය නැවත නලියන්නට විය. ''සාමාන්‍යයෙන් මේ උගුල් හදන්නේ වියන ලද උණ ලී වලින්, ඒත් මකුළු දැලුත් වඩා හොඳයි. ඒකෙන් ඔයාව වේගයෙන් අල්ල ගනියි. ඒ වගේම ඒක කඩන්න බැරි තරමට ශක්තිමත්- ඔයාටවත් බැහැ.''

''ෂ්...ෂ්...ෂ්...'' ඇරැක්නි පෙරලෙමින්, ඇඹරෙන්නට වූවාය. එහෙත් ඇනබෙත් ඒ මාර්ගයෙන් ඉවතට වූවාය. බිඳුණු පාදය සමඟින් වුවත් ඇය මකුළුවාගේ නිය උගුල්වලින් බේරීමට සමත් විය.

''මම උඹව විනාශ කරනවා.'' ඇරැක්නි සපථ කළාය. ''මම කිව්වේ... නෑ, මම උඹට ගොඩක් කාරුණික වෙනවා. මාව එළියට ගන්නව නම්.''

''මම ඔයා වුණා නම්, මම මගෙ ශක්තිය ඉතුරු කර ගන්නවා.'' පැය ගාණකට පසුව දනුණු සැහැල්ලුව විඳ ගැනීමට ඇනබෙත් ගැඹුරු හුස්මක් ගත්තාය.

''මම මගෙ යාලුවන්ට කතා කරන්න යනවා.''

''ඔයා- ඔයා එයාලට මගෙ නිර්මාණය ගැනද කියන්න යන්නෙ?'' ඇරැක්නි බලාපොරොත්තු සහගතව විමසුවාය.

ඇනබෙත් කාමරය පරීක්ෂා කළාය. ආගෝ IIට අයිරිස්- පණිවුඩයක් යැවීමට ක්‍රමයක් එහි තිබිය යුතුය. ඇගේ බෝතලයේ වතුර ස්වල්පයක් ඉතිරිව තිබුණත්, අඳුරු ගුහාවක් තුළ දේදුන්නක් සකසා ගැනීමට තරම් ආලෝකයක් සහ මීදුමක් සාදා ගන්නේ කෙසේද?

ඇරැක්නි නැවත පෙරළීමට පටන් ගත්තාය. ''ඔයා යාළුවන්ට කතා කරන්නේ මාව මරන්නද?'' ඇය කෑ ගැසුවාය. ''මම මැරෙන්නෙ නැහැ. මේ විදිහට මැරෙන්නෙ නැහැ!''

''සන්සුන් වෙන්න.'' ඇනබෙත් පැවසුවාය. ''අපි ඔයාව මරන්නෙ නැහැ. අපිට ඕනෙ ප්‍රතිමාව විතරයි.''

''ප්‍රතිමාව!''

''ඔව්.'' ඇනබෙත් එය ඉතිරි කළ යුතුව තිබිණි. එහෙත් ඇගේ බිය කෝපයට හැරී තිබිණි. ''අර මම පෙන්නපු නිර්මාණය ඔලිම්පස් කන්දේ බොහොම ප්‍රමුඛ එකක් නේ? ඒක ඔයාගෙ වෙන්න බැහැ. ඇතීනා පාතිනොන් අයිති එයාට. දෙවියන්ගේ මධ්‍යම උද්‍යානයට.''

''නෑ! නෑ ඒක භයානකයි!''

''ඕහ්, ඒක එහෙම වෙන එකක් නැහැ.'' ඇනබෙත් පැවසුවාය. ''මුලින්ම අපි ප්‍රතිමාව අපිත් එක්ක ග්‍රීසියට අරන් යනවා. අනාවැකියෙන් කියවුණේ ඒකට යෝධයෝ පරාජය කරන්න උදව් වෙන බලයක් තියෙනවා කියලයි. ඊට පස්සෙ... හොඳයි, අපිට නිකම්ම ඒක පාතිනන්වල පිහිටුවන්න බැහැ. ඒකෙන් තව ප්‍රශ්න ගොඩක් මතුවෙයි. ඒක ඔලිම්පස් කන්දේ තියන එක ආරක්ෂිතයි. ඒකෙන් ඇතීනාගේ

දරුවෝ එක්සත් වෙලා, රෝමවරුන්ට සහ ග්‍රීකයන්ට සාමය ගෙන ඒවි. මේ ශතවර්ෂ ගණනාව පුරාම ඒක ප්‍රවේසමෙන් බලාගත්තට ස්තුතියි. ඔයා ඇතීනාට ලොකු සේවයක් කරල තියෙන්නෙ.''

ඇරැක්නි බෙරිහන් දුන්නාය. රාක්ෂියගේ දළ වලින් නිකුත් වූ සේද කෙඳි ඈත බිත්තියේ ගෙත්තම් තිරයේ ඇලුණේය. ඇය දිගටම කෙඳි විදිමින්, ඒවා වියමින් පෙරලෙන්නට පටන් ගත්තාය. ඒ අතර ඇය මායා ගින්නක් නිකුත් කළාය. කුටිය සෙලවෙන්නට විය. ගෙත්තම් තිර ගිනි ගත්තේය.

''ඕක නවත්තන්න.'' ඈනබෙත් මකුළු කෙඳිවලින් ඉවත් වීමට උත්සාහ දරමින් පැවසුවාය. ඔයා මුළු කාමරයම කඩා දාල අපි දෙන්නවම මරන්න හදන්නෙ.''

''උඹ දිනනව දකිනවට වඩා ඒක හොඳයි.'' ඇරැක්නි කෑ ගැසුවාය. ''මගේ දරුවනේ, මට උදව් කරන්න!''

අහ්, නියමයි. ප්‍රතිමාවේ සුළු රශ්මි මාලාවෙන් කුඩා මකුළුවන් පලවා හරිනු ඇතැයි ඇය සිතුවත්, ඇරැක්නි දිගටම කෑ ගසමින් ඔවුන්ගේ උපකාර පැතුවාය. මකුළු ගැහැනියගේ කට වැසීමට ඇයව මරා දැමීමට ඈනබෙත් කල්පනා කළාය. දැන් ඇගේ පිහිය පාවිච්චි කිරීම ද පහසුය. එහෙත් අසරණව සිටින විට කිසිදු රාක්ෂයකු මරා දැමීමට ඇය පැකිළුණාය. අනෙක් අතට ඇය ගෙත්තම් කළ සේද උගුල අතරින් අනින විට එය ගැලවී යාමේ හැකියාවක්ද තිබිණි. එවිට ඈනබෙත් ඇයව ඉවර කර දැමීමට පෙර ඇයට නිදහස් වීමේ හැකියාව ලැබේ.

මේ සියලු සිතිවිලි පැමිණෙන විට ප්‍රමාද වැඩි වී තිබිණි. මකුළුවෝ බඩගාමින් කුටිය තුළට ඇදෙමින් සිටියහ. ඇතීනා ප්‍රතිමාව දීප්තිමත් වන්නට විය. මකුළුවන්ට පැහැදිලිවම ළං වීමට වුවමනාවක් නොතිබුණත්, තම ධෛර්යය වැඩි කර ගැනීමට මෙන් ඔවූහු කුටිය අද්දර රැස්වී සිටියහ. ඔවුන්ගේ මව උදව් පතා කෑ ගසමින් සිටියාය. අවසානයේ එයට සවන් දුන් ඔවූහු, ඈනබෙත් දෙසට පැමිණෙන්නට වූහ.

''ඇරැක්නි, ඒක නවත්තන්න.'' ඇය කෑ ගැසුවාය. ''මම.''

කෙසේ හෝ ඇරැක්නි තම සිර මැදිරිය තුළ කැරකීමට සමත්ව තිබුණාය. ඈනබෙත්ගේ හඬ ඇදී ආ දෙසට තම උදරය හැරවූ ඇය සේද කෙන්දක් ඈනබෙත්ගේ ළයට විද්දාය.

ඇනබෙත් ඇද වැටුණාය. ඇගේ පාදය රිදුම් දුන්නේය. ඇරැක්නි ඇයව තමා දෙසට අදින විට ඇනබෙත් තම කිණිස්ස අතට ගැනීමට උත්සාහ කළාය.

ඇනබෙත් මකුළු හුය කපා දමා පසෙකට පෙරළීමට සමත් වුවත්, කුඩා මකුළුවෝ ඇය සමීපයට පැමිණෙමින් සිටියහ.

තම හොඳම උත්සාහයෙන් ප්‍රමාණවත් නැති බව ඇයට අවබෝධ විය. ඇයට මෙතැනින් ගැලවී යාමට නොහැකිය. ඇරැක්නිගේ දරුවෝ තම මවගේ ප්‍රතිමාව ඉදිරිපිටදීම ඇය මරා දමනු ඇත. *පර්සි,* ඇය සිතුවාය. *මට සමාවෙන්න.*

ඒ මොහොතේදී, කුටිය දෙදරා ගිය අතර. කුටියේ සිවිලිම ගිනි බෝලයක්ද සමඟ පුපුරා ගියේය.

# 51
# ඇනබෙත්

**ඇනබෙත් මීට පෙර සමහර අත්භූත දේවල් දැක තිබුණත්, ඇය කෙදිනකවත් කාර් වැස්සක් දැක නොතිබුණාය.**

කාමරයේ වහලය කඩා වැටෙද්දී, හිරු එළියෙන් ඇගේ දෑස් නොපෙනී ගියේය. ක්ෂණික බැල්මකින් ආගෝ II ඉහළ කැරකෙන බව ඇයට දක්නට ලැබිණි. වහලය පුපුරුවා හැරීම සඳහා එය බැලිස්ටාව යොදා ගන්නට ඇත.

ගරාජයක දොරටු ද සමඟ ඉතාලි මෝටර් රථ හයක් හෝ හතක් ඇතුළට කඩා වැටිණි. ඉන් එකකින් ඇතීනා පාතිනන් පොඩි පට්ටම් වී යාමට ආසන්න වූ නමුත් ප්‍රතිමාවේ දිලිසෙන රශ්මි මාලාව බල ක්ෂේත්‍රයක් සේ ක්‍රියාකර මෝටර් රථය ඉවතට විසිකර දැමුවේය. අවාසනාවකට, එය කෙළින්ම ඇනබෙත් දෙසට පෙරළී ආවේය.

බිඳුණු කකුල අද්දවමින් ඇය එක් පැත්තකට පැන්නාය. සිහිය නැතිවන තරම් වේදනාවක් සිරුර පුරා පැතිර ගියේය. එහෙත් නියම වේලාවට ඇය පසුපසට පැන ගැනීමට සමත් වූවාය. එවිට ඇය දුටුවේ තද රතු ෆියට් 500 රථයක් ඇරැක්නිගේ සේද උගුල මත කඩා වැටී කාමරයේ පොළොව ද සිදුරු කරගෙන චීන මාංචුවත් සමඟ අතුරුදහන වන ආකාරයයි.

ආරැක්නිගේ වැටීමත් සමඟ, ඇය බෙරිහන් දුන්නාය. එහෙත් ඇගේ විලාපය වේගයෙන් හීන වී ගියේය. ඇය අවට සෑම තැනකම සුන්බුන් පිරී තිබුණු අතර, පොළොව සිදුරු වී ගොස් තිබිණි.

ඇතීනා පාතිනන් ප්‍රතිමාවට හානියක් සිදු වී නොතිබිණි. එහෙත් එහි පාදස්ථලයට යටින් තිබූ කිරිගරුඬ ඉරි තැලීමට පටන්ගෙන තිබිණි. ඇනබෙත් මකුළු දැල්වලින් වැසී සිටියාය. ඇගේ දෑත් සහ දෙපාවල ඉතිරිව තිබූ මකුළු කෙඳි රූකඩයක සවිකල නූල් මෙන් දිස්විය. එහෙත්, කෙසේ හෝ ප්‍රාතිහාර්යයකින් මෙන්, සුන්බුන් කිසිවක් ඇගේ සිරුරේ ගැටී නොතිබිණි. ප්‍රතිමාව විසින් ඇයව ආරක්ෂා කළ බව සිතීමට ඇයට අවශ්‍ය වූ නමුත්, වාසනාව නිසා හැර එයින් ආරක්ෂාව වූ බවට ඇය තුළ වූයේ සැකයකි.

මකුළු හමුදාව අතුරුවදහන්ව සිටියහ. එක්කෝ ඔවුන් ආපසු අඳුරට යන්නට ඇත. එසේත් නැතිනම් විවරයට ඇද වැටෙන්නට ඇත. දිවා ආලෝකය ගුහාව තුළට ඇදී එව විට, ඇරක්නියේ ගෙත්තම් තිර සහිත බිත්ති දුවිලි බවට හැරී තිබිණි. ඇනබෙත්ට ඒ දෙස බැලීම පවා අසීරු විය. *විශේෂයෙන් ඇයත්, පර්සිත් නිරූපණය කළ ගෙත්තම් තිරය.*

එහෙත් ඉහළ සිට පර්සිගේ හඬ ඇසෙන විට, ඇයට ඒ කිසිවක් ප්‍රශ්ණයක් වූයේ නැත. ''ඇනබෙත්.''

''මෙහේ!'' ඇයට ඉකි ගැසිණි.

එක් දවැන්ත ඉඟියකින් ඇගේ සියලු බිය පහව ගියා සේ පෙනිණි. ආගෝ II පහත් වෙද්දී, අත්වැටට වාරු වී එබී බලන පර්සිව ඇයට දැකගැනීමට ලැබිණි. ඔහුගේ සිනහව ඇය මෙතෙක් දුටු කිසිදු ගෙත්තම් තිරයකට වඩා හොඳ විය.

කාමරය දිගටම ගැහෙමින් තිබුණත්, ඇනබෙත් නොවැටී සිටීමට සමත් වූවාය. ඇගේ පා යටින් තිබූ පොළොව මොහොතකට පමණක් ස්ථාවර බව පෙනී ගියේය. ඇගේ ගමන් මල්ල නැති වී තිබුණේ ඩායිඩාලුස්ගේ පරිගණකයද සමඟ ය. හත් හැවිරිදි වියේ සිට ඈ සතුව තිබූ ලෝකඩ පිහිය ද නැති වී තිබිණි. ඒවා වල තුළට වැටී ඇති බව පෙනී ගියේය. එහෙත් ඇයට එහි වගක් නොවීය. ඇය ජීවතුන් අතර සිටියාය.

ඇය ෆියට් 500 රථයෙන් සැදුණු සිදුර සමීපයට ගියාය. කැඩුණු පාෂාණ බිත්ති ඇයට දැකිය හැකි තරම් දුරකට ඇද වැටිණි. කුඩා ගල් කැබලි කීපයක් අතනින් මෙතනින් උඩට නෙරා තිබිණි. එහෙත් ඇනබෙත්ට වෙනත් කිසිවක් දැක ගැනීමට හැකි වූයේ නැත.

විවරය ගැන ඇරැක්නි පැවසුවේ සත්‍යයක් දැයි ඇනබෙත් පුදුමයට පත් වූවාය. මකුළුවා ඇද වැටුණේ ටාටරස් වලටද? ඒ අදහසින් සෑහීමකට පත් හැඟීමක් ඇති කරගන්නට ඇය උත්සාහ දැරුවාය. එහෙත් එයින් ඇයට ඇතිවූයේ කනගාටුවකි. ඇරැක්නි යම් අලංකාර දේවල් නිර්මාණය කර තිබුණාය. දැනටමත් ඇය යුග ගණනාවක් පීඩාවට පත්ව සිටියාය. දැන් ඇගේ අවසන් ගෙත්තම් තිරය කැබලි වී තිබේ. ඒ සියල්ලටම පසු, ටාටරස් වෙත ඇද වැටීම, බෙහෙවින් කටුක අවසානයක් වැනිය.

පොළොවට අඩි හතළිහක් පමණ ඉහළින් ආගෝ II නවතිනු ඇනබෙත්ට පෙනුණේ යාන්තමිණි. එයින් ලණු ඉනිමගක් පහත් වුවත්, ඇනබෙත් අඩ සිහියෙන් අන්ධකාරය දෙස බලාගෙන සිටියාය. ඉන්පසු එක්විටම ඇය අසලට පැමිණ පර්සි ඇගේ ඇඟිලි අල්ලා ගත්තේය.

ඔහු සෙමින් ඇයව වල අසලින් ඉවත් කර, ඇයගේ බඳ වටා අත දමා ගත්තේය. ඇය ඔහුගේ ළයේ මුහුණ හොවා ගෙන කඳුළු සලන්නට වූවාය.

''දැන් සේරම හරි.'' ඔහු පැවසුවේය. ''අපි එකතු වුණා.''

ඔයා හොඳින් යැයි ඔහු නොපැවසුවේය. නැතිනම් අපි ජීවතුන් අතර යැයි ඔහු නොපැවසුවේය. සේරටමත් වඩා ගෙවුණු වසර තුළ දැනගත් වැදගත්ම දෙය වූයේ ඔවුන් එක්ව සිටීමයි. ඔහු එසේ පවසනු ඇසීමට ඇය ප්‍රිය කළාය.

ඔවුන්ගේ මිතුරන් ඔවුන් වටා රොක් වූහ. නිකෝ ඩී ආන්ජලෝ එහි සිටියත්, ඇනබෙත්ගේ සිතුවිලි බෙහෙවින් ව්‍යාකූල වූ හෙයින් ඇයට එය පුදුමයක් වූ බව නොපෙනුණි.

''ඔයාගෙ කකුල.'' පිපර් ඇය අසල දණ ගසාගෙන, බුබුළු දිවටන එතූ කකුල පරීක්ෂා කළාය. ''ඕහ්, ඇනබෙත්, මොකද වුණේ?''

ඇය පැහැදිලි කිරීම පටන් ගත්තාය. කථා කිරීම අසීරු වුවත්, තරමක් දුරට යනවිට පහසුවෙන වචන ගලා එන්නට විය. පර්සි ඇගේ අත අත නොහැරියේය. එයින් ඇයට වඩාත් විශ්වාසදායී හැඟීමක් දැනිණි. ඇය කතාව අවසන් කරන විට මිතුරන්ගේ මුහුණු පුදුමයෙන් පිරී ගොස් තිබිණි.

''ඔලිම්පස්හි දෙවියනි.'' ජේසන් පැවසුවේය. කැඩුණු කකුලකුත් එක්ක ඔයා මේ සේරම තනියම කරලා.''

''හොඳයි... ඒවයින් සමහර ඒවා කැඩුණු කකුලත් එක්ක.''

පර්සි විරිත්තුවේය. ''ඔයා ඇරැක්නිව එයාගෙම උගුල වියන්න පෙළඹෙව්වා ද? මම දන්නවා ඔයා හොඳ බව, ඒත් ශුද්ධ වූ හේරාගේ නාමයෙන්- ඇනබෙත් ඔයා ඒක කළා. ඇතීනාගේ දරුවෝ පරම්පරා ගණනක් උත්සාහ කරල අසාර්ථක වුණා. ඔයා ඇතීනා පාතිනන් හොයාගත්තා.''

සියල්ලෝම ප්‍රතිමාව දෙස බැලූහ.

''අපි මොනවද ඒකට කරන්නෙ?'' ෆ්‍රෑන්ක් විමසුවේය. ''ඒක විශාලයිනෙ.''

''අපි ඒක ග්‍රීසියට ගෙන යන්න ඕනෙ.'' ඇනබෙත් පැවසුවාය. ''ප්‍රතිමාව බලවත්. ඒකෙ තියෙන යම් බලයක් අපිට යෝධයන්ව නවත්තන්න උදව් කරයි.''

''යෝධයන්ගේ නපුර දරා සිටින රත් වියැකෙයි.'' හේසාල් උපුටා දැක්වූවාය. ''වේදනාව සමඟ වියන ලද සිරගෙයින් ජය ලබන්න.'' ඇය අගයන අයුරින් ඇනබෙත් දෙස බැලුවාය. ''ඒ ඇරැක්නිගේ සිරගෙය. ඔයා එයාව ඒක වියන විදිහට රැවැට්ටුවා.

*බොහෝ වේදනා සමඟ,* ඇනබෙත් සිතුවාය.

ලියෝ දැත් එසවූයේය. ඔහු ඇඟිලිවලින් ඇතීනා පාතිනන් වටා රූප රාමුවක් ඇඳ පෙන්වූයේ ඔහු එහි මිනුම් ගත් බව කියා පෑමට මෙනි. ''හොඳයි, ඒක ප්‍රති සැකසීමක් ඕනෙ වෙයි. ඒත් මම හිතනවා අපිට ඒක ඉස්තාලෙ ඇතුළට දාන්න පුළුවන් වෙයි කියලා. එයාගෙ කෙළවරක් එළියට පැන්නොත්, මට එයාගෙ කකුල්වල හෝ යම් තැනක කොඩියක් එල්ලන්න වෙනවා.''

ඇනබෙත් වෙව්ලුවාය. ඔවුන්ගේ යුද නැව තුළ සිටින ඇතීනා ප්‍රතිමාවේ පාදස්ථලයේ, 'විශාල බරක්' යනුවෙන් සදහන් සලකුණක් එල්ලා තිබෙනු ඇය සිතින් මවා ගත්තාය.

ඉන්පසු ඇය අනාවැකියේ අනෙක් පේළි ගැන සිතුවාය. නිමක් නැති මරණයේ යතුර දරා සිටින දෙවඟනගේ සුසුමින් නිවුන්නන් නික්මෙයි. ''ඔයාල ගැන කොහොමද හාදයිනේ?'' ඇය විමසුවාය. ''යෝධයො එක්ක මොකද වුණේ?''

නිකෝ බේරාගැනීම ගැනත්, බැචස්ගේ දර්ශනය වීම සහ රංග ශාලාවේදී නිවුන්නන් සමඟ වූ සටන ගැනත් පර්සි ඇයට පැවසුවේය. නිකෝ වැඩි යමක් කතා නොකළේය. අසරණ හාදයා මුඩු බිමක සති හයක් ඇවිද ගියාක් මෙන් පෙනිණි. නිකෝ මරණයේ දොරටු ගැන

සොයාගත් දේත්, ඔවුන් එහි දෙපසින්ම වසා දැමිය යුත්තේ කෙසේද යන්නත් පර්සි පැහැදිලි කළේය. ඉහළින් හිරු එළිය වැටුණත්, පර්සිගේ ප්‍රවෘත්තියෙන් ගුහාව නැවත අඳුරු වූ බව පෙනිණි.

''එහෙනම් මනුෂ්‍ය පැත්ත තියෙන්නෙ එපිරස්වල නම්.'' ඇය පැවසුවේය. ''අඩු ගානෙ ඒ අපිට ළං වෙන්නවත් පුළුවන් තැනකනෙ.''

නිකෝ සුදුමැලි විය. ''ඒත් අනිත් පැත්ත තමයි ප්‍රශ්නෙ. ටාටරස්.''

එම වදන් කුටිය පුරා දෝංකාර දුන්නේය. ඔවුන් පිටුපසින් වූ වලෙන් සීත සුළං පහරක් විද්දේය. ඒවන විට ඇනබෙත් නිශ්චිතවම දැන සිටියාය. විවරය කෙළින්ම වැටී ඇත්තේ පාතාල ලෝකයටය.

පර්සිටද එය දැනුණා විය යුතුය. ඔහු ඇයව දාරයෙන් මඳක් ඈතට රැගෙන ගියේය. මනාලියකගේ වේලය මෙන් ඇගේ දෑත්වලත්, දෙපා වලත් මකුළු දැල් පැටලී තිබිණි. තම කිණිස්ස තිබුණානම් ඒවා කපා දැමිය හැකිව තිබිණැයි ඇයට සිතිණි. පර්සිට ඔහුගේ රිප්ටයිඩයෙන් එය කරන්නැයි පැවසීමට සූදානම් වුවත්, ඇය එසේ කිරීමට පෙර ඔහු කට හඬ අවදි කළේය. ''මගෙ චාරිකාව අපේක්ෂා කළාට වඩා අසීරුයි වගේ දෙයක් බැචස් සඳහන් කළා. ඒ ඇයි කියල හිතාගන්න බැහැ.''

කුටිය ගෙරවීය. ඇතීනා පාතිනන් පසෙකට ඇලවී ගියේය. එහි හිස ඇරැක්නිගේ ආධාරක රැහැනක රැඳිණි. එහෙත් පාදස්ථලයට යටින් තිබූ කිරිගරුඬ පාදම, කැඩී ගියේය.

ඇනබෙත්ගේ ගත හිරි වැටී ගියේය. ප්‍රතිමාව විරය තුළට ඇද වැටුණේනම් ඇගේ සියලු ප්‍රයත්නයන් අපතේ යන්නේය. ඔවුන්ගේ ගවේෂණය අසාර්ථක වනු ඇත.

''ඒක ආරක්ෂා කරන්න!'' ඇනබෙත් කෑ ගැසුවාය.

ඇගේ මිතුරෝ සැනෙකින් තේරුම් ගත්හ.

''ෂැන්ග්!'' ලියෝ කෑ ගැසුවේය. ''මාව ඉක්මනට ඇණියට ගෙනියන්න! කෝච් තනියම උඩ ඉන්නෙ.''

ෆ්‍රෑන්ක් යෝධ රාජාලියකු බවට පත් විය. ඔවුන් දෙදෙනා නැව දෙසට ඇදී ගියහ.

ජේසන් තම අත පිපර්ගේ බඳ වටා යැව්වේය. ඔහු පර්සි දෙසට හැරුණේය. ''තත්පරයෙන් ආපසු එන්නම්.'' සුළඟ කැඳවූ ඔහු අහසට නැගුණේය.

''මේ පොළොව එච්චර වෙලා තියෙන්නෙ නෑ!'' හේසාල් අනතුරු ඇඟවූවාය. ''අපි සේරම ඉනිමඟට නගින්න ඕනෙ.''

දූවිලි සහ මකුළු දැල් පොළොවේ සිදුරුවලින් පහළට වැටිණි. දැවැන්ත ගිටාරයක තත් මෙන් ආධාරක රැහැන් කම්පනය වෙමින් බිඳී ගියේය. ලණු ඉනිමඟ වෙත දිව ගමට සැරසුණ හේසාල් නිකෝට පසුපස එන ලෙස සංඥා කළාය. එහෙත් නිකෝ දිවීමට හැකි තත්ත්වයක නොසිටියේය.

පර්සි ඇනබෙත්ගේ අත තදින් අල්ලා ගත්තේය. ''ඒක හරියයි.'' ඔහු මිමිණුවේය.

උඩ බලන විට, නැවෙන් පහළට වැටුණු රැහැන් ප්‍රතිමාව වටා එතෙන අයුරු ඇයට දක්නට ලැබිණි. එක් රැහැනක් තොණ්ඩුවක් මෙන් ඇතීනාගේ ගෙලට සිරවිය. ලියෝ විධාන දෙන විට ෆ්‍රෑන්ක් සහ ජේසන් රැහැනින් රැහැනට පැන ඒවා සුරක්ෂිත කළහ.

ඇනබෙත්ගේ බිඳුණු පාදයෙන් තියුණු වේදනාවක් දැනෙන විට නිකෝ ඉනිමඟ අසපට පැමිණ සිටියේය.

''ඒ මොකක්ද?'' පර්සි විමසුවේය.

ඇය ඉනිමඟ අසලට ගැටීමට උත්සාහ කළාය. ඒ වෙනුවට ඇයව පසුපසට ඇදෙන්නේ ඇයි? ඇගේ පාද ලිස්සා යන විට මුනින් ඇද වැටුණාය.

''එයාගෙ වළලුකර!'' හේසාල් ඉනිමඟේ සිට කෑ ගැසුවාය. ''ඒක කපන්න! කපන්න!''

වේදනාව හේතුවෙන් ඇනබෙත්ගේ සිහිය විකල් වී තිබිණි. *ඇගේ වළලුකර කපන්න?*

හේසාල් පැවසූ දේ පර්සිටත් අවබෝධ වූ බවක් නොපෙනුණි. එවිට යමක් ඇනබෙත්ට පසුපසට ඇද, ඇයව වළ දෙසට ඇදීමට උත්සාහ දැරුවේය. පර්සි ඉදිරියට පැන ඇගේ අත අල්ලා ගත්තේය. එහෙත් ඔහුවත් ඒ දෙසටම ඇදී ගියේය.

''එයාලට උදව් කරන්න!'' හේසාල් කෑ ගැසුවාය.

නිකෝ ඔවුන් දෙසට අමාරුවෙන් ඇවිද එනු ඇනබෙත් දුටුවාය. හේසාල් ලණු ඉනිමඟේ සිට ඇගේ කඩුව ගැනීමට උත්සාහ කළාය. ඔවුන්ගේ අනෙක් මිතුරෝ තවමත් ප්‍රතිමාවට අවධානය යොමු

කරමින් සිටි අතර, සාමාන්‍ය ශබ්ද හමුවේ හේසාල්ගේ කෑ ගැසීම යටපත් වී ගියේය.

වලෙහි දාරයේ වදින විට ඇනබෙත්ට ඉකි ගැසිණි. ඇගේ පාද පැත්තකට ගියේය. සිදුවෙමින් තිබෙන දේ අවබෝධ කරගන්නා විට ඇය ප්‍රමාද වැඩි වී තිබිණි. ඇය මකුළු දැලක පැටලී සිටියාය. ඇය ඉක්මනින්ම එය කපා ඉවත් කළ යුතුව ඇත. එය හුදෙක් ලිහිල් රැහැනක් බව ඇය සිතුවත්, ගෙබිම පුරා මකුළු දැලින් වැසී තිබුණු අවස්ථාවක, ඇයට ඇගේ පාදයේ එතුණු එක් හුයක් ගැන අවධානයක් නොතිබිණි. එසේම එහි අනෙක් කෙළවර තිබුණේ වල තුළ බවද ඇය නොදැන සිටියාය. එය වල තුළ වූ යම් බරැති දෙයකට සම්බන්ධ වී තිබිණි. ඇයව වලට අදිමින් තිබුණේ ඒ බරැති දෙයයි.

''නෑ.'' පර්සි මිමිණුවේය. ''මගෙ කඩුව...''

එහෙත් ඇනබෙත්ගේ අත අත නොහැර ඔහුට රිප්ටයිඩය වෙත ළං වීමට නොහැකි විය. ඇනබෙත්ගේ ශක්තිය වියැකී ගොස් තිබිණි. ඇය ගැටිය දෙසට ලිස්සා ගියාය. පර්සිද ඇය සමඟ වැටුණේය.

ඇගේ සිරුර යමක ගැටුණේය. වේදනාව නිසා යම් තරමකින් ඇගේ පෙනීම අහිමිව තිබිණි. ඇයට නැවත පෙනීම ලැබෙන විට ඇය අඩක් වල තුළ ගිලී, පිටතට ඒමට දඟලමින් සිටියාය. විවරය මුදුනට අඩි පහළොවක් පමණ පහතින් ගැටියක් අල්ලා ගැනීමට පර්සි සමත් විය. ඔහු එක් අතකින් ගැටියේ එල්ලී, අනෙක් අත ඇනබෙත්ගේ ඉණ වටා දවටාගෙන සිටියේය. එහෙත් ඇනබෙත්ගේ පාදයෙන් ඇදීම බෙහෙවින් ප්‍රබල විය.

*පැනල යන්න බැහැ,* පහළ අන්ධකාරයෙන් හඬක් නැඟිණි. *මම ටාටරස් වලට යනවා වගේම උඹත් මා එක්ක එනවා.*

ඇයට ඇසුණේ සැබැවින්ම ඇරැක්නිගේ හඬ දැයි ඇනබෙත්ට හරිහැටි විශ්වාසයක් නොතිබිණි. නැතහොත් එය ඇගේ සිත තුළ ඇති වූ හඬක් විය හැකිය.

වල කම්පනය විය. ඇය වැටීමෙන් වලකාගත හැකි එකම දෙය වූයේ පර්සි පමණි. පොත් රාක්කයක් තරම් වූ ගැටිය ඔහු අල්ලාගෙන සිටියේ අසීරුවෙනි.

නිකෝ ගැටිය අසලින් විවරයට එබුණේය. ඔහු තම අත දිගු කළත් ඔහු සිටියේ උදව් කළ හැකි දුරට වඩා බොහෝ ඈතිනි. හේසාල්

අනෙක් අයට කෑ ගැසුවාය. එහෙත් ඔවුන්ට ඇගේ හඬ ඇසුණත් වේලාවට ඔවුන්ට පැමිණීමට නොහැකිය.

ඇනබෙත්ට තම පාදය ගැලවී යන්නට ආසන්න බව දැනිණි. වේදනාව ගත හිරිවට්ටා තිබිණි. අඳුරු ගුරුත්වාකර්ෂණයක් මෙන් පාතාල ලෝකයේ බලය ඇයව අදිමින් සිටියේය. ඇයට සටන් වැදීමට ශක්තියක් නොතිබිණි. තමා සිටින්නේ බේරා ගැනීමට නොහැකි තරම් පහළින් බව ඇය දැන සිටියාය. ''පර්සි, මාව අත අරින්න.'' ඇය පැවසුවාය. ''ඔයාට මාව ඇදල ගන්න බැහැ.''

ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබිණි. එය ඵලරහිත වැඩක් බව ඔහු දැන සිටින බව ඇයට ඔහුගේ දෑස්වලින් පෙනී ගියේය. ''කොහෙත්ම නෑ.'' ඔහු පැවසුවේය. ඔහු උඩ සිටි නිකෝ දෙස බැලුවේය. ''අනෙක් පැත්ත, නිකෝ! අපි ඔයාව එහෙදි හමුවෙන්නම්. තේරුණාද?''

නිකෝගේ දෑස් විසල් විය. ''ඒත්.''

''එයාලව එහෙට එක්ක එන්න!'' පර්සි කෑ ගැසුවේය. ''මට පොරොන්දු වෙන්න''

''මම පොරොන්දු වෙන්නම්.''

ඔහුට පහළින් වූ හඬ සිනාසුණේය. *පරිත්‍යාගයක්. දෙවඟන අවදි කිරීමට අපූරු පරිත්‍යාගයක්.*

පර්සි ඇනබෙත්ගේ ඉන වටා වූ ග්‍රහණය දැඩි කළේය. ඔහුගේ ගතේ දූවිලි තැවරී, හිස මකුළු දැල් වලින් වැසී තිබිණි. එහෙත් ඔහු ඇගේ දෑස් දෙස බලා සිටින විට ඔහු කෙදිනකවත් මෙතරම් කඩවසම් සිට නැතැයි ඇයට සිතිණි.

''අපි එකටම ඉමු.'' ඔහු පොරොන්දු විය. ''ඔයා මගෙන් ඈත් වෙන්නෙ නෑ.. ආයෙ කවදාවත් නැහැ.''

සිදුවන්නට යන්නේ කුමක්දැයි ඇයට අවබෝධ වූයේ එවිටය. *ඒක මාර්ගික ගමනක්. ඉතා අසීරු වැටීමක්.*

''අපි එකට ඉන්න තාක්කල්.'' ඇය පැවසුවාය.

නිකෝ සහ හේසාල් තවමත් උදව් පතා කෑ ගසන හඬ ඇයට ඇසිණි. ඈත ඉහළ හිරු එළිය ඇයට පෙනිණි. සමහරවිට මේ ඇය දකින් අවසන් හිරු කිරණ විය හැකිය.

ඉන්පසු පර්සි ගැටිය අතහැරියේය. ඔවුහු දැත් අල්ලා ගත්හ. පර්සි සහ ඇනබෙත් නිමක් නොමැති අන්ධකාරයට ඇද වැටුණෝය.

# 52
# ලියෝ

**ලියෝ තවමත් සිටියේ කම්පනයට පත්ව ය.**

සෑම දෙයක්ම බොහෝ ඉක්මනින් සිදු විය. අවසන් ආධාරක කුලුන කැඩී, පොළොව ගිලා බසින විටත් ඔවුන් සිටියේ ඇතීනා ප්‍රතිමාව රැහැන්වලින් ඔසවමිනි. ජේසන් සහ ෆ්‍රෑන්ක් අනෙක් අයව බේරා ගැනීමට දිව ගියත්, ඔවුන්ට දක්නට ලැබුණේ ලෑණු ඉනිමගේ එල්ලී සිටින නිකෝ සහ හේසාල් පමණි. පර්සි සහ ඇනබෙත් යන්නට ගොසිනි. ටාටරස්වලට යන විවරය ටොන් ගණනක සුන්බුන්වලින් වැසී තිබිණි. මුළු ගොඩනැගිල්ලම කඩා වැටීමට තත්ත්පරයකට පෙර ලියෝ ආගෝ II ඉවතට ගත්තේය.

ආගෝ II දැන නවතා තිබුණේ මුළු නගරයම දර්ශනය වන කඳු ගැටයක් මතය. හේසාල්, ෆ්‍රෑන්ක් සහ ජේසන් විනාශය සිදු වූ තැනට ගියේ පර්සි සහ ඇනබෙත් ගලවා ගැනීමට හැකි මාර්ගයක් සොයා බැලීමට වුවත් අධෛර්යයට පත් වූ ඔවුන්ට ආපසු පැමිණීමට සිදු විය. ගුහාව විනාශ වී තිබිණි. පොලිසිය සහ ගලවාගැනීමේ පිරිස් එතැන රැඳී සිටියහ. මිනිසුන්ට හානියක් වී නොතිබුණත්, ඉතාලියානුවන්ට මාස ගණනක් හිස කසන්නට සිදුව තිබිණි. ඒ ඔවුන්ගේ වටිනා මෝටර් රථ දුසිම් ගණනක් දැවැන්ත සිදුර විසින් ගිලගෙන තිබුණු නිසාය.

කම්පනයෙන් යුතුව, ලියෝ සහ අනෙක් පිරිස ඇතීනා පාතිනන් ප්‍රවේසමෙන් නැවට පැටවූහ. නැවේ හයිඩ්‍රොලික් තිරිංග යොදා ගනිමින්, අර්ධ කාලීනව අලියකු බවට පත්වූ ෆ්‍රෑන්ක් ෂැන්ගේද

උපකාර ඇතිව එය නැවට ඇතුළු කිරීමට ඔවුන්ට හැකි විය. ප්‍රතිමාව නැව තුළට දැමීමට හැකි වුවත්, එයින් කුමක් කරන්නට යන්නේ දැයි ලියෝට අදහසක් නොතිබිණි.

කෝච් හෙජ් උදව් කිරීමට නොහැකි තරම් දුක්බිත තත්ත්වයකට පත්ව සිටියේය. කඳුළු පිරි දෙනෙතින් නැව් තට්ටුව මත ඇවිදමින් ඔහු තනිව කොඳුරන්නට විය. *මට එයාලව බේරගන්න තිබුණා!*

අවසානයේ ලියෝ ඔහුට පහළ තට්ටුවට ගොස්, පිටත්වීම සඳහා සියල්ල ආරක්ෂිත දැයි පරීක්ෂා කරන ලෙස පැවසුවේය.

නැව් තට්ටුව මැදට රොක් වූ උප දෙවිවරුන් හය දෙනා, කඩා වැටීම සිදු වූ ස්ථානයෙන් තවමත් ඉහළ නගින දූවිලි කඳ දෙස බලා සිටියහ.

ලියෝ ආකිමිඩිස් ගෝලය මත අත තැබුවේය. දැන් එය ඇණිය මත තබා, සවි කිරීමට සූදානම්ව තිබිණි. ඔහු තෘප්තිමත් පත්ව සිටියේය. එය ඔහුගේ ජීවිතයේ දැවැන්තම සොයාගැනීම ය- එය 9 බංකරයටත් වඩා විශාල සොයාගැනීමකි. ඔහුට ආකිමිඩිස්ගේ ලේඛන තේරුම් ගැනීමට හැකි වුවහොත්, ඔහුට අරුම පුදුම දෑ කළ හැකි වනු ඇත. ඔහු බලාපොරොත්තු තබා ගැනීමට බිය වුවත් ඔහුට තම මකර යහළුවා සඳහා පාලන තැටියක් පවා නිර්මාණය කිරීමට හැකි වනු ඇත. තවමත්, ගෙවිය යුතු මිල බෙහෙවින් අධික වී තිබිණි.

ඔහුට නෙම්සිස්ගේ සිනාව ඇසිණි. *මම ඔයාට කිව්වා අපිට ගනුදෙනුවක් කරන්න පුළුවන් කියලා. ලියෝ වැල්ඩේස්.*

ඔහු වාසනාවේ විස්කෝතුව විවෘත කළේය. ඔහුට ගෝලයේ ප්‍රවේශ කේතය ලැබුණු අතර, ෆ්‍රෑන්ක් සහ හේසාල් බේරා ගැනීමට හැකි විය. එහෙත් පරිත්‍යාගය කර තිබුණේ පර්සි සහ ඇනබෙත්ය. ලියෝට එය විශ්වාසය.

''ඒක මගෙ වැරැද්ද.'' ඔහු කනගාටුවෙන් පැවසුවේය.

සෙස්සෝ ඔහු දෙස බැලූහ. හේසාල්ට පමණක් එය තේරුම් ගැනීමට හැකි වූ බව පෙනිණි. මහා ලවණ විලේදී ඇය ඔහු අසල සිටියේය.

''නෑ.'' ඇය විරෝධය පෑවාය. ''නෑ, මේක ගයියාගේ වරදක්. ඔයාට ඒකට කරන්න දෙයක් නැහැ.''

ලියෝ එය විශ්වාස කිරීමට අවශ්‍ය වුවත්, ඔහුට එය කළ නොහැකි විය. ඔවුන් මේ චාරිකාව ආරම්භ කළේ ලියෝගේ අත්වැරැද්දෙන් නව රෝමයේදී සිදු වූ ප්‍රහාරයක් සමඟිනි. ඔවුන් අවසන් කළේ පරණ රෝමයේදී වාසනාවේ විස්කෝතුව කඩා ඇසකටත් වඩා වැඩි මිලක් ගෙවන්නට සිදු කරමිනි.

''ලියෝ, මම කියන දේ අහන්න.'' හේසාල් ඔහුගේ අත අල්ලා ගත්තාය. ''ඔයා වරද පවරගන්න එකට මට ඉඩ දෙන්න බැහැ. මට ඉවසන්න බැහැ, සැමීගෙන් පස්සෙ...

ඇය වචන ගිල ගත්තාය. එහෙත් ඇය අදහස් කළේ කුමක් දැයි ලියෝ දැන සිටියේය. ඔහුගේ ලොකු සීයා, හේසාල්ගේ අතුරුදහන් වීම ගැන තමාට දොස් පවරාගත්තේය. සැමී හොඳ ජීවිතයක් ගත කළත්, ඔහු මරණයට පත් වූයේ තමා සාපලත් දියමන්තිය විකිණූ නිසා හේසාල්ගේ ආදරය අහිමි වූ බව විශ්වාස කරමිනි.

නැවත වරක් හේසාල්ව දුකට පත් කිරීමට ලියෝට වුවමනා නොවීය. එහෙත් මෙය වෙනස් කතාවකි. නියම සාර්ථකත්වයට පරිත්‍යාගය අවශ්‍ය වේ. ලියෝ ඒ විස්කෝතුව කැඩීම තෝරා ගත්තේය. පර්සි සහ ඇනබෙත් ටාටරස් වෙත ඇද වැටිණි. එය අහඹු දෙයක් විය නොහැකිය.

නිකෝ තම රළු අසිපතට වාරු වෙමින්, කකුල් අද්දවමින් පැමිණියේය. ''ලියෝ, එයාල මැරුණේ නැහැ. ඒක එහෙම වුණා නම්, මට ඒක දැනගන්න පුළුවන්.''

''ඔයා කොහොමද විශ්වාසයෙන් කියන්නෙ?'' ලියෝ විමසුවේය. ''ඒ වල ඇත්තටම යන්නේ... ඔයා දන්නවනෙ... ඔයාට කොහොමද එච්චර ඈත තියෙන දෙයක් දැනෙන්නේ?''

නිකෝ සහ හේසාල් බැල්මක් හුවමාරු කර ගත්හ. සමහරවිට ඔවුන්ගේ හේඩිස්/ප්ලුටෝ මරණ රේඩාරයේ සටහන් සසඳමින් විය හැකිය. ලියෝ වෙව්ලා ගියේය. ඔහුට හේසාල්ව කිසිවිටෙක පාතාල ලෝකයේ දරුවකු ලෙස නොපෙනුණි. එහෙත් නිකෝ ඩී ආන්ජලෝ, ඒ හාදයා නම් ඇඟ හිරිවට්ටන කෙනෙකි.

''අපිට සියයට සීයක් විශ්වාසය තියන්න බැහැ.'' හේසාල් පැවසුවාය. ''ඒත් මමත් හිතනවා නිකෝ හරි කියලා. පර්සි සහ ඇනබෙත් තවමත් ජීවතුන් අතර... අඩුගානෙ තරමක් දුරට.''

ජේසන් මිට මෙලවූ අතින් අත් වැටට පහරක් දුන්නේය. ''මට අවධානයෙන් ඉන්න තිබුණා. මට පහළට පාවෙලා ගිහින් එයාලව බේරගන්න තිබුණා.''

''මටත්.'' ෆ්‍රෑන්ක් පැවසුවේය. දැවැන්ත හාදයාගේ දෙනෙත් වලින් කඳුළු වැගිරුණේය.

පිපර් ජේසන්ගේ උරහිස මත අත තැබුවාය. ''ඒක ඔයාගෙ වරදක් නෙමෙයි, ඔය දෙන්නගෙම නෙමෙයි. ඔයාල ප්‍රතිමාව බේරගන්න උත්සාහ කරමින් හිටියෙ.''

''ඇය හරි.'' නිකෝ පැවසුවේය. ''විවරය වැළලිලා නොගියත් ඔයාට ඒක ඇතුළට යන්න බැහැ. පහළට ඇදගන්නවා. මම විතරයි ඇත්තටම ටාටරස්වලට ගිහින් තියෙන්නෙ. එතන කොච්චර බලවත් තැනක්ද කියන එක විස්තර කරන්න අමාරුයි. ඔයා ළඟට ගියොත්, ඒක ඔයාට ඇතුළට ඇදල ගන්නවා. මට කොහෙත්ම අවස්ථාවක් ලැබුණෙ නැහැ.''

''එහෙනම් පර්සිටයි, ඇනබෙත්ටයි දෙන්නටත් අවස්ථාවක් ලැබෙන එකක් නැහැ නේද?''

නිකෝ තම රිදී හිස්කබල සහිත මුදුව කරකැවීය. ''මට මෙතෙක් හමුවුණ බලවත්ම උප දෙවියා තමයි පර්සි. ඔයාලව පහත් කරනවා නෙමෙයි, ඒත් ඇත්ත ඒකයි. කාටහරි පණ බේර ගන්න පුළුවන් නම්, ඒ එයාටම තමයි. විශේෂයෙන් ඇනබෙත් එයා එක්ක ඉන්නකොට. එයාල ටාටරස් වලින් එන්න විදිහක් හොයා ගනී.''

ජේසන් හැරුණේය. ''මරණයේ දොරටු වෙතට, ඔයා ඒකද කියන්නෙ? ඒත් ඔයා අපිට කිව්වෙ ගයියාගේ බලවත්ම හමුදාව එතන ආරක්ෂා කරනවා කියලනෙ. කොහොමද උප දෙවිවරු දෙන්නෙක්ට ඒක?''

''මම දන්නෙ නැහැ.'' නිකෝ පැවසුවේය. ''ඒත් පර්සි මට කිව්වා ඔයාලව එපිරස්වලට අරන් එන්න කියලා. ඒ කියන්නෙ දොරටුවේ මනුෂ්‍ය පැත්තට. එයා සැලසුම් කරන්නෙ අපිව එතනදි හමුවෙන්න. හේඩිස් මන්දිරයෙන් අපිට ජීවත් වෙන්න ලැබුණොත්, ගයියාගේ හමුදාව එක්ක සටන් කළොත්, එතකොට සමහරවිට අපිට පර්සි සහ ඇනබෙත් එක්ක එකතු වෙලා මරණයේ දොරටු දෙපැත්තෙන්ම මුද්‍රා තියන්න පුළුවන් වෙයි.''

''ඒ වගේම ඇනබෙත්වයි, පර්සිවයි ආරක්ෂිතව ගන්න පුළුවන්ද? '' ලියෝ විමසුවේය.

''සමහරවිට.''

නිකෝ ඒ ආකාරයෙන් පිළිතුරු දීම ගැන ලියෝ සතුටු නොවීය. ඔහු තමන් තුළ ඇති සැකයන් සියල්ල එළි නොකරන බව පෙනිණි. අනෙක් අතට ලියෝ දොරවල් සහ අගුල් ගැන දැන සිටියේය. මරණයේ දොරටු දෙපැත්තෙන්ම මුද්‍රා තැබිය යුතුනම්, යමෙකු පාතාල ලෝකයේ සිර නොවී ඔවුන් එය කරන්නේ කෙසේද?''

නිකෝ ගැඹුරු හුස්මක් ගත්තේය. ''මම දන්නෙ නෑ එයාල කොහොම ඒක කරයිද කියලා, ඒත්, පර්සි සහ ඇනබෙත් ක්‍රමයක් හොයා ගනියි. එයාලා ටාටරස් අතරින් ගිහින් මරණයේ දොරටු සොයාගනී. එයාල ඒක කරනකොට, අපි ලෑස්තිවෙලා ඉන්න ඕනෙ.''

''ඒක ලේසි වෙන එක්ක නැහැ.'' හේසාල් පැවසුවාය. ''අපි එපිරස්වලට යන එක වළක්වන්න ගයියා එයාට පුළුවන් හැමදෙයක්ම කරයි.''

''ඒක අලුත් දෙයක්ද?'' ජේසන් සුසුමක් හෙලුවේය.

පිපර් හිස සැලුවාය. ''අපිට වෙන විකල්පයක් නැහැ. යෝධයෝ ගයියාව නැගිටුවන්න කලින් අපිට මරණයේ දොරටු මුද්‍රා තියන්න වෙනවා. එහෙම නොවුණොත් එයාගෙ හමුදා කොහෙත්ම මැරෙන එකක් නැහැ. ඒ වගේම අපි ඉක්මන් කරන්න ඕනෙ. රෝමවරු ඉක්මනින්ම නිව්යෝර්ක් වලට යයි. එයාලා අර්ධ ලෝහිත කඳවුරට යයි.''

''අපිට මාසයක් තියෙනවා.'' ජේසන් පැවසුවේය. ''එපියාල්ටිස් කිව්වා ගයියා අවදි වෙන්නෙ හරියටම මාසයකින් කියලා.''

ලියෝ නැගිට්ටේය. ''අපිට ඒක කරන්න පුළුවන්.''

සියල්ලෝම ඔහු දෙස බැලූහ.

''ආකිමිඩිස් ගෝලයෙන් නැව වැඩිදියුණු කරන්න පුළුවන්.'' තමා නිවැරදිය යන බලාපොරොත්තුවෙන් ඔහු පැවසුවේය. ''මම අපි ගෙනාව පැරණි ලේඛන අධ්‍යයනය කරන්නයි යන්නෙ. ඒකෙ තියෙන හැම ආකාරයකම අලුත් ආයුධ මට හදන්න පුළුවන්. අපි ගයියාගේ හමුදාවට ඒවායින් පහර දෙමු.''

ජේසන් සිනාසුණේය. ඔහු ලියෝගේ උරහිස්සට තට්ටු කළේය.

''ජේන විදිහට සැලැස්මක් වගේ, අද්මිරාල්. ඔයාට මාර්ගය සකස් කරන්න ඕනෙද?'

ඔවුහු ඔහුට විහිළු කළහ. අද්මිරාල් යනුවෙන් ඇමතූහ. එහෙත් ලියෝ ඒ තනතුර බාර ගත්තේය. මේ ඔහුගේ නැවයි. ඔහු නවතින්නට මෙතරම් දුරක් එන්නෙ නැත.

ඔවුන්ට මේ හේඩිස් මන්දිරය[1] සොයා ගැනීමට හැකිවනු ඇත. ඔවුන් මරණයේ දොරටු වෙත පිවිසෙනු ඇත. ලියෝට පර්සි සහ ඇනබෙත්ව ටාටරස් වලින් ඇද ගැනීමට තරම් දිග ඩැහි හස්තයක් නිර්මාණය කිරීමට හැකිවුවහොත්, එය ඔහුට කළ හැකි වනු ඇත.

නෙම්සිස්ට අවශ්‍ය ඔහු ගයියාගෙන් පළිගනු දැකීමටද? ලියෝ එයට උපකාර කිරීමට කැමති වනු ඇත. ඔහු ගයියාව දුකට පත් කිරීමට සූදානම්ය.

''ඔව්.'' ඔහු අවසන් වතාවට බැස යන හිරුගෙන් ලේ රත් පැහැයට හැරී තිබුණු රෝමය දෙස බැලුවේය. ''ෆෙස්ටස්, රුවල් ඔසවන්න. අපිට යාළුවෝ වගයක් බේරගන්න තියෙනවා.''

1 ග්‍රීසියේ එපිරස්වල භූගත දේවස්ථානයක් වන මෙය හේඩිස් සහ පර්සිපෝන් වෙනුවෙන් පූජා කරන ලද්දකි. සමහර අවස්ථාවල මෙය මරණයේ දිවැස් දෙවොල ලෙසද හැඳින්විණි. පාතාල ලෝකයට යන එක් පිවිසුමක් එහි සටහන් කර ඇතැයි පැරණි ග්‍රීසියෝ විශ්වාස කළ අතර මියගියවුන් හා සංවාදයේ යෙදීමට එතැනින් ඇතුළු විය යුතු බව සැලකිණි.